# පටිච්ච සමුප්පාද විවරණය

## නිර්වාණ විස්තරයකින් යුක්තයි.

(දාහතර වන මුද්‍රණය)


මහාචාර්ය

**රේරුකානේ චන්දවිමල**

(සාහිත්‍ය චක්‍රවර්ති, පණ්ඩිත, ප්‍රවචන විශාරද,

අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන, ශ්‍රී සද්ධර්ම ශිරෝමණී)

**මහානායක ස්වාමිපාදයන් වහන්සේ විසින්**

සම්පාදිතයි.



2551

2008



*Non-commercial distribution*

## ලේකම්ගේ සටහන්...

භව සන්තතිය පිළිබඳ විචාර සමාජයේ බොහෝ දෙනා තුළ පැතිර පවතී. බුදු සසුනේ විවිධ නිකායයන් ද මේ ගැන සාකච්ඡා කර ඇති අතර, එවැනි අදහස් කියවා ඇති ථෙරවාදී භික්ෂූන් වහන්සේ ද 'අන්තරා භවය' පිළිබඳ මතිමතාන්තර දේශනා කළහ.

භවයේ මුල, මැද, අග සොයන සමහරු ද මේ ගැන තර්ක කරති. එවැනි තර්ක නොසිතිය යුතු කරුණු සේ බැහැර කළ බුදුන් වහන්සේ දුකින් මිදීමේ, සසරෙන් ඉවත්වීමේ මග හා ඊට වෙර වැඩිය යුතු බව ම අවධාරණය කරති.

පටිච්ච සමුප්පාදය ගැන එවැනි මිථ්‍යා මත ඔස්සේ මනස අවුල් කරගත් ඇතැම් විදර්ශනාලාභීන් හා යෝගාවචරයන් යයි තමන් හඳුන්වා ගන්නා පුද්ගලයින් මේ පොත ගැන විවිධ අදහස් අපට ලියා එවූහ. එහෙත් නාහිමියන්ගේ පොත නැවත මුද්‍රණය කිරීම පමණක් අපේ කාර්යයයි. නාහිමියන් ධර්මය තේරුම් කළේ ත්‍රිපිටකය හා අටුවා ටීකා පදනම් කරගෙන පමණක් මිස නිකායාන්තරික අදහස් හෝ මනස්ගාත ගැන පදනම් කර නොගෙන බව අපි දන්නෙමු.

කර්ම-ඵල අදහන සැදැහැවත් බොදුනුවන්ගේ සත්පුරුෂ සමාගමය නිසා ම රේරුකානේ නාහිමිපාණන් ගේ බුදුදහම පිළිබඳ නිවැරදි හා සරල දහම් පොත් සමූහය තවදුරටත් අවම මිලක් යටතේ ඔබ අත පත් කරන්නට ශ්‍රී චන්‍ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය සමත් වෙයි. ඒ අවබෝධයෙන් හා පුනරුප්පත්තිය පිළිබඳ විශ්වාසයෙන්, මෙලොව සැපසම්පතින් කොටසක් සසරට නිදන් කරනා පින්වතුන්ට අපගේ කෘතවේදිත්වය පළ කරමු.

සෝදුපත් සැසඳීමේදී සහාය වූ දයාවතී අබේසිංහ මහත්මිය, සංශෝධිත පරිඝණක වර්ණ සටහන් යෙදූ හොරණ රූ-මායා ග්‍රැෆික්ස් හි සාලිය ජයකොඩි මහතා, මුද්‍රණයෙන් දයක වූ ගිහාන් අනුරංග ජයවර්ධන මහතා ඇතුළු කාර්යමණ්ඩලය, මණ්ඩලයේ කටයුතු සඳහා නිබඳ අවධානය යොමු කරන පූජ්‍ය කිරිඔරුවේ ධම්මානන්ද හිමිපාණන් සහ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා නිසා ම මේ පොත් පැවැත්වීමේ වගකීම ලිහිල් වී ඇති බව සිහි කරන්නේ සතුටිනි.

**තිසරණ සරණයි!**

**සී. තනිප්පුලි ආරච්චි**
ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්මපුස්තක
සංරක්ෂණ මණ්ඩලය

2008 ජනවාරි 25 වන දින,
පොකුණුවිටදී ය.

*Non-commercial distribution*

## දහම් පොත් සංරක්ෂණ මණ්ඩලයෙන් ප්‍රකාශිත
# රේරුකානේ නාහිමියන්ගේ පොත් සහ වෙනත් පොත්

**විනය ග්‍රන්ථ**

ශාසනාවතරණය
විනය කර්ම පොත
උපසම්පදා ශීලය
උභය ප්‍රාතිමෝක්ෂය (අනුවාද සහිත)

**අභිධර්ම ග්‍රන්ථ**

අභිධර්ම මාර්ගය
අභිධර්මයේ මූලික කරුණු
පට්ඨාන මහා ප්‍රකරණ සන්නය
අනුවාද සහිත අභිධර්මාර්ථ සංග්‍රහය

**භාවනා ග්‍රන්ථ**

විදර්ශනා භාවනා ක්‍රමය
පෞරාණික සතිපට්ඨාන භාවනා ක්‍රමය
චත්තාලීසාකාර මහා විපස්සනා භාවනාව
සතිපට්ඨාන භාවනා විවේචනය හා වෙනත් කෘති

**ධර්ම ග්‍රන්ථ**

චතුරාර්‍ය්‍ය සත්‍යය
පාරමිතා ප්‍රකරණය
බෝධිපාක්ෂික ධර්ම විස්තරය
පටිච්ච සමුප්පාද විවරණය
ධර්ම විනිශ්චය
බෞද්ධයාගේ අත් පොත
මංගල ධර්ම විස්තරය
පුණ්‍යෝපදේශය
සූවිසි මහා ගුණය
පොහොය දිනය
කෙලෙස් එක්දහස් පන්සියය
චතුෂ්චක්‍ර ධර්ම හා චිත්තෝපක්ලේශ ධර්ම
බුද්ධනීති සංග්‍රහය
නිර්වාණ විනිශ්චය හා පුනරුප්පත්ති ක්‍රමය
බෝධි පූජාව
Four Noble Truths (චතුරාර්‍ය්‍ය සත්‍යය පරිවර්තනය.)

**වෙනත්**

මෙකල තිවුණු ඇත්තෝ
(නාහිමි චරිත වත හා අනුමෙවෙනි දම් දෙසුම් 15 ක්.)
සුරාධූර්තය හෙවත් මද්‍යලෝලය (වෛද්‍ය නීල් කෙසල් - පරිවර්තන)
බුදුසසුන පුබුදු කළ ශ්‍රී ලංකා ශ්වේජින් නිකාය සියවස (ශාස්ත්‍රීය සමරු කලාපය)

---

විමසීම් :- ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය,
ශ්‍රී විනයාලංකාරාරාමය, පොකුණුවිට.
දුරකථනය : 034-2263958, (2263979) ෆැක්ස් : 034-2265251

Non-commercial distribution

# පටුන


| | |
|---|---|
| | පිට |
| සංඥපනය | 9 |
| ආරම්භය | 15 |
| පටිච්චසමුප්පාද පාළිය | 16 |
| පටිච්චසමුප්පාද යන්නෙහි තේරුම | 16 |
| පටිච්චසමුප්පාදය නො දැනීමේ දෝෂය | 18 |
| පටිච්චසමුප්පාදය දැනීමේ අනුසස් | 20 |
| අවිජ්ජාපච්චයා සංඛාරා | 24 |
| අවිද්‍යාව නිසා සංස්කාර ඇතිවන සැටි | 29 |
| සංඛාරපච්චයා විඤ්ඤාණං | 33 |
| පුනරුත්පත්තිය සිදුවන සැටි | 38 |
| විඤ්ඤාණපච්චයා නාමරූපං | 45 |
| නාමරූපපච්චයා සළායතනං | 52 |
| සළායතනපච්චයා ඵස්සො | 57 |
| ඵස්සපච්චයා වේදනා | 59 |
| වේදනාපච්චයා තණ්හා | 61 |
| තණ්හාපච්චයා උපාදානං | 67 |
| උපාදානපච්චයා භවො | 75 |
| භවපච්චයා ජාති | 82 |
| ජාතිපච්චයා ජරාමරණං | 85 |
| පටිච්චසමුප්පාදයේ භවත්‍රයේ සම්බන්ධය | 96 |
| අඞ්ග දෙළොස | 96 |
| සන්ධි තුන | 96 |
| සන්ධිත්‍රයේ සටහන | 97 |
| සංග්‍රහ සතර | 98 |
| විංශත්‍යාකාරයෝ | 98 |
| සංසාර චක්‍රය | 101 |
| කර්ම විපාක චක්‍රය | 102 |
| ත්‍රි වෘත්තය | 102 |
| ත්‍රි වෘත්ත චක්‍රය | 103 |
| මූල දෙක | 104 |
| ද්විමූල චක්‍රය | 105 |
| පටිච්චසමුප්පාදය සත්‍යයන්ගේ වශයෙන් දැක්වීම | 106 |


Non-commercial distribution

පටිච්චසමුප්පාදය කෘත්‍යය වශයෙන් දක්වීම 107
දෘෂ්ටි නිවාරණය 109
පටිච්චසමුප්පාදය උපමාවෙන් දක්වීම 110
සතර ආකාර ගැඹුරු බව 113
පටිච්චසමුප්පාදයේ නය සතර 119
ප්‍රතිලෝම ප්‍රතීත්‍යසමුත්පාදය හෙවත්
සංසාරචක්‍රයාගේ නිරෝධය 122
ද්විවිධ නිරෝධය 123
ද්විවිධ සුඛය 127
නිවන් තතු දක්වෙන ගාථා පෙළක් 134
නිවන දක්වෙන ගාථා දෙකක් 137
නිර්වාණ කීර්තන උදනය (1) 142
නිවන හා සත්ත්වයා 144
නිවනේ ප්‍රයෝජනය 144
නිර්වාණ කීර්තන උදනය (2) 145
විභඞ්ගයේ නිවන විස්තර කර ඇති ආකාරය 150
අටුවාවේ දක්වෙන නිර්වාණ වාදය 151
ආර්‍ය්‍ය සත්‍ය දේශනයේ නිවන 153
නිවන පිහිටි තැන 155
නිර්වාණය සාක්ෂාත් කරන ප්‍රශ්නය 157
නිවන් දක්නා පුද්ගලයා 160
දුක්ඛස්කන්ධයෙන් මිදීමේ ප්‍රතිපත්ති ක්‍රමය 165
චතුරාර්‍ය්‍ය සත්‍යය සංක්ෂේපයෙන් දක්වීම 167
විද්‍යාව ඉපදවීමේ කාලය 175
සංසාරයේ මුල 178
අනේකප්‍රකාර ප්‍රතීත්‍යසමුත්පාද දේශනා 181
දශබල සූත්‍රය 182
දශබල සූත්‍රයේ භාවය 184
දශබල සූත්‍රයේ විස්තරය 186
දශබල ඥාන 187
දශබල ඥානය දක්වෙන ගාථා 188
බ්‍රහ්මචක්‍රය 193
චතුර්වෛශාරද්‍ය ඥානය 193
පඤ්චස්කන්ධය 196
ආහාර සූත්‍රය 206
ආහාර සූත්‍රයේ තේරුම 208
ආහාර සතර 210
ඥතික සූත්‍රය 215
ඥතික සූත්‍රයේ භාවය 216
Non-commercial distribution

චේතනා සූත්‍රය 220

චේතනා සූත්‍රයේ අදහස 220

චේතනා සූත්‍රයේ විස්තරය 221

චේතනා සූත්‍රයේ සැටියට සංසාර චක්‍රය 223

උපාදන සූත්‍රය 224

උපාදන සූත්‍රයේ තේරුම 226

උපාදන සූත්‍රය ගැන දතයුතු කරුණු 226

දෘෂ්ටි නිවාරණ දේශනා 227

ප්‍රතීත්‍යසමුත්පාද සූත්‍රය 228

අචේලකාශ්‍යප සූත්‍රය 231

උපනිසා සූත්‍රය 235

ධර්ම කථික සූත්‍රය 238

ශාස්තෘ පර්යේෂණ සූත්‍රය 247

පටිච්චසමුප්පාදය හා අන්තරාභවය 249

අන්තරා භව වාදය 253

සූත්‍රපිටකය හා අභිධර්ම පිටකය 253

ධර්මය අවලංගු කිරීමේ පාපය 255

සුවාසූ දහසක් ධර්මස්කන්ධය 257

*Non-commercial distribution*

"සබ්බදානං ධම්මදානං ජිනාති"

# දහම් පොත් මුද්‍රණයට සහාය වූ අභිනව සාමාජිකයෝ

| | | |
|---|---|---|
| එම්.බී. පෙරේරා මයා | බණ්ඩාරගම | රු.50,000.00 |
| ඕ.වී. සමන්ත අනුස්මරණ පදනම - | ශ්‍රී ජයවර්ධනපුර වි.වි. | රු.50,000.00 |
| ජයවීර කටුවාවල මයා | පිළියන්දල | රු.30,000.00 |
| වෛද්‍ය එල්.ඩී. දයානන්ද මයා | මහවැව | රු. 5,000.00 |
| ඒ.එස්. අබේසිංහ මයා | හොරණ | රු. 4,000.00 |
| බී.එච්. ලක්ෂ්මන් ගුණසිරි මෙන්ඩිස් / බී.ඒ. තේජා පද්මාංගනි යුවල | පානදුර | රු. 3500.00 |
| යූ.ඒ.ටී.එම්. අභයවර්ධන මයා | දොම්පේ | රු. 2,000.00 |
| කපිල සමරනායක මයා | මොරටුව | රු. 2000.00 |
| තුසිත ප්‍රියන්ත වල්පිට මයා | කුඩාඋඩුව | රු. 1500.00 |
| චාන්දනී ප්‍රනාන්දු මිය (දෙමාපියන්ට පිං පිණිස) | පානදුර | රු. 1500.00 |
| කාන්ති මීපාගම මිය | පන්නිපිටිය | රු. 1220.00 |
| ඉන්ද්‍රා දසනායක මිය | මහනුවර | රු. 1014.00 |
| එච්.බී. රත්නායක මයා | කොස්වත්ත | රු. 1000.00 |
| ආර්.එම්. පොඩිඅප්පුහාමි මයා | කහපත්වල | රු. 1000.00 |
| එස්.පී.බී. ඉලංගසිංහ මයා | අනුරාධපුර | රු. 1000.00 |
| ග්‍රේස් බී. මුණසිංහ මිය | බණ්ඩාරවෙල | රු. 1000.00 |
| හරීන්ද්‍ර අමරපාල මයා | බණ්ඩාරගම | රු. 1000.00 |
| චන්ද්‍රිකා එදිරිසිංහ මිය | බෙලිඅත්ත | රු. 1000.00 |
| අරුණ රත්නායක මයා | නුගේගොඩ | රු. 1000.00 |
| මධුෂානී කළුවැව මිය - | පේරාදෙණිය සම්පත් බැංකුව | රු. 500.00 |

අනික් පොත් හා සසඳන විට කාලීනව අඩු මිලකට මේ පොත් සැපයිය හැකිව ඇත්තේ ධර්මදානමය කුශලයේ වටිනාකම අවබෝධ කරගත් සැදැහැවතුන් නිසාය.

එක් මුද්‍රණයක් විකිණීමෙන් ලැබෙන මුදලත්, ඊළඟ මුද්‍රණයේ මුද්‍රණ වියදමත් අතර පරතරය පියවා ගැනීමට මේ ආධාර උපයෝගී වේ.

ඔබට ද මේ සඳහා සහභාගි විය හැකිය.

Non-commercial distribution

# සංඥපනය

ලොවුතුරා බුදුබවට පැමිණෙන්නා වූ සකල මහා බෝධිසත්ත්වයන් ම ආනාපාන චතුර්ථධ්‍යානයට සමවැදී, නුවණ දියුණු - තියුණු කොට ගෙන, එසේ තියුණු කරගත් නුවණ ප්‍රතීත්‍යසමුත්පාදධර්මයට යොමු කොට එය අනුලෝම - ප්‍රතිලෝම වශයෙන් සම්මර්ශනය කොට සංසාර චක්‍රයේ සැටි නිවැරදි ලෙස තේරුම් ගෙන, අරහත්මාර්ගඥානය උපදවා සංසාර ප්‍රවෘත්තියට හේතු වන අවිද්‍යා - තෘෂ්ණා ප්‍රධාන එක්දහස් පන්සියයක් කෙලෙස් සතුරන්, මතු කිසි කලෙක නැඟී නො එන පරිදි සම්පූර්ණයෙන් නසා ලොවුතුරා බුදුබවට පැමිණෙන බව **"සබ්බ බෝධිසත්තාහි ආනාපානචතුත්ථජ්ඣානතො වුට්ඨාය පච්චයාකාරෙ ඤාණං ඔතාරෙත්වා තං අනුලෝම-පටිලෝමං සම්මසිත්වා බුද්ධා හොන්ති"** යනුවෙන් සංයුත්තනිකායට්ඨකථාවෙහි දක්වා තිබේ. මේ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය ලොවුතුරා බුදුබවට පැමිණි පසු ද උන්වහන්සේලා නිතර සිහිකිරීම් වශයෙන් භාවිත කෙරෙති.

අප බුදුරජාණන් වහන්සේ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය සම්මර්ශනය කොට පැමිණි වදාළ අරහත්ඵල සමාපත්තියට සමවැදී බෝමුල ඒ අස්නෙහි ම සතියක් වැඩ සිට ඒ සමාපත්තියෙන් නැඟී, ප්‍රථමයෙන් කරන්නට යෙදුනේ ද ප්‍රතීත්‍යසමුත්පාදය සිහිකිරීම ම ය. උන්වහන්සේ බුදු වීමෙන් සත්වනද රාත්‍රියේ ප්‍රථමයාමය අනුලෝම වශයෙන් ප්‍රතීත්‍යසමුත්පාදය සම්මර්ශනය කිරීමෙනුත් මධ්‍යමයාමය ප්‍රතිලෝම වශයෙන් ප්‍රතීත්‍යසමුත්පාදය සම්මර්ශනය කිරීමෙනුත් පශ්චිමයාමය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ප්‍රතීත්‍යසමුත්පාදය සම්මර්ශනය කිරීමෙනුත් ගතකළ බව උදාන පාළියේ දක්වා තිබේ. මෙසේ ලොවුතුරා බුදුබවට පැමිණීමට උපකාර වන්නාවූත් ලොවුතුරා බුදුවරයන් වහන්සේලා නො හැර භාවිත කරන්නාවූත් ධර්මයක් වන බැවින් මේ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය බුදුසසුනෙහි උසස්

Non-commercial distribution

ධර්මයක් බව කිය යුතු ය. ඉතා උසස් ධර්මයක් වූ මේ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය ඉතා ගැඹුරු ය. එය මහා බෝධිසත්ත්වයන් හා ප්‍රත්‍යෙක බෝධිසත්ත්වයන් හැර, අන්කිසිවකු ස්වශක්තියෙන් නිරවුල් කර තේරුම්කර ගැනීමට සමත් නො වන බව **"ඨපෙත්වා පන ද්වේ බෝධිසත්තෙ අඤ්ඤො සත්තා අත්තනො ධම්මතාය පච්චයාකාරං උජුං කාතුං සමත්ථා නාම නත්ථි"** යනුවෙන් මහානිදාන සූත්‍ර අටුවාවෙහි දක්වා තිබේ.

ප්‍රතීත්‍යසමුත්පාද සංඛ්‍යාත මේ හේතුඵල ධර්මය සොයාගැනීමේ දුෂ්කරත්වය නිසා ම බුදුසසුනේ පිහිටෙන් තොරව ස්වශක්තියෙන් ම ලෝ තතු සෙවූවෝ නොයෙක් අයුරින් නො මඟ ගියහ. ඇතමෙක් "ලෝකයත් සත්ත්වයාත් දෙවියකු විසින් මවන ලද්දේය. මේ සත්ත්වයෝ ඒ මැවුම්කාර දෙවියාගේ කැමැත්ත පරිදි සැපදුක් ලබන්නාහ. මැවුම්කාර දෙවියාගේ කැමැත්ත පරිදි ම සත්ත්වයෝ මරණින් මතු සුගතියට හෝ දුගතියට යන්නාහ" යි ගත්හ. ඇතමෙක් "මැවුම්කරුවකු නැතිව පඨවි - ආපෝ - තේජෝ - වායෝ යන ධාතූන්ගෙන් සත්ත්වයා ඇතිවූයේය"යි ගත්හ. ඇතමෙක් "ආත්මයත් ශරීරයත් එකයයි" ගත්හ. ඇතමෙක් "ආත්මය අනිකෙක, ශරීරය අනිකකැ"යි ගත්හ.

ආත්මයත් ශරීරයත් එකයයි ගත්තෝ "ශරීරය විනාශ වීමෙන් ආත්මයත් විනාශ වන්නේය, එබැවින් මරණින් මතු සත්ත්වයා නූපදින්නේය යි ද, පින් පව්වලින් සත්ත්වයාට වන දෙයක් නැත්තේය" යි ද කියති. ශරීරය අනිකෙක ආත්මය අනිකෙකැයි ගත්තෝ "ශරීරය සේ ආත්මය නැසෙන දෙයක් නො වේ. ආත්මය කවදවත් නො මැරෙන්නේය. ඒ ආත්මය ශරීරය බිඳෙන කල්හි කූඩුවකින් පක්ෂියකු බැහැර යන්නාක් මෙන් පුරාණ ශරීරයෙන් බැහැරව අලුත් ශරීරයකට යන්නේ ය" යි කියති.

ඇතැමෙක් "පෙර කළ පින් පව් අනුවම සත්ත්වයෝ සැප දුක් ලබති" යි ගත්හ. ඇතමෙක් "කර්මවිපාකය සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කෙරෙති." ඇතමෙක් "පින්පව් කළ තැනැත්තාම එහි විපාකය විඳීය"යි ගත්හ. ඇතමෙක් "අනිකකු කළ කර්මයේ ඵලය

Non-commercial distribution

අතිකෙක් විඳීය''යි ගත්හ. ඇතමෙක් '' මේ සත්ත්වයා අතීතයේත් වීය''යි ගත්හ. ඇතමෙක් ''මේ සත්ත්වයා අතීතයෙහි නො වූයේ ය, අලුතෙන් ඇති වූවෙකැයි'' යි ගත්හ.

තථාගතයන් වහන්සේගේ ප්‍රතීත්‍යසමුත්පාද දේශනය වනාහි මෙහි කී නොකී එකම දෘෂ්ටියකටවත් නො වැටෙන හේතුඵල ක්‍රමයක් දක්වෙන දේශනයෙකි. ඒ හේතුඵල ධර්මය සොයාගන්නට නුපුළුවන්වීම නිසා මෙසේ සත්ත්වයන් නොයෙක් දෘෂ්ටිගෙන අවුලෙන් අවුලට පත්ව, නැවත නැවත අපායට පැමිණෙන්නට සිදුවන මේ සංසාරය ඉක්මවිය නොහැකිව දුකෙහිම ගැලී ඉන්නා බව **''එතස්ස ආනන්ද! ධම්මස්ස අනනුබොධා අප්පටිවෙධා එවමයං පජා තන්තාකුලකජාතා ගුළාගුණ්ඨිකජාතා මුඤ්ජබබ්බජභූතා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තන්ති''** යනුවෙන් තථාගතයන් වහන්සේ විසින් මහානිදාන සූත්‍රයෙහි වදාරා තිබේ.

මේ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය දැන ඉගෙන දෘෂ්ටි ජාලයෙන් මිදී සත්‍යය අවබෝධ කරගන්නා තුරු සත්ත්වයා දුකින් නො මිදේ. එබැවින් **දුකින් මිදීම බලාපොරොත්තුවන සැමදෙනා විසින් ම** බුදු සස්නෙහි ඉතා උසස් තැනක් ගන්නා මේ ප්‍රතීත්‍ය-සමුත්පාද ධර්මය ගැන තරමක් දුරටවත් දැනගැනීමක් ඇතිකර ගැනීමට උත්සාහ කළ යුතු ය. මේ උසස් ධර්මය දත හැක්කේ ද බුද්ධෝත්පාද කාලයෙහිම ය. බුද්ධශූන්‍ය කාලවලදී මේ ධර්මය ඇති බවවත් දැන ගැනීමට ක්‍රමයක් නැත. දැනට පැමිණ ඇත්තේ මේ උසස් ධර්මය දැන ගැනීමට, ඉගෙන ගැනීමට ඉඩ ඇති යහපත් කාලයකි.

එහෙත් දැනට ඇති බෞද්ධයන්ගෙන් ඉතා වැඩි දෙනෙක් ම මේ උසස් ධර්මය ගැන කිසිවක් දන්නෝ නො වෙති. එබැවින් ඔවුහු තමන් ලබා සිටින මේ උත්තම බුද්ධෝත්පාදක්ෂණයෙන් ගන්නට ඇති උසස් ප්‍රයෝජනය නො ලබති. **බෞද්ධයම්හ යි ප්‍රතිඥකර ගෙන ඉන්නා අයගෙන් ඇතමෙක්'** මේ ධර්මය නො දන්නා නිසාම ''මරණින් මතු ඉපදීමක් නැත, පින් පව්වල

Non-commercial distribution

විපාකයක් නැත" යනාදීන් මිථ්‍යා දෘෂ්ටියට බැස සිටිති. ඒ තත්ත්වයට පැමිණ සිටින පැවිද්දෝ ද නැත්තාහු නො වෙති. ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය නො දැනීම නිසා නොමහට වැටී ඉන්නා ජනයාගේ යහපත සඳහා අප විසින් මේ ග්‍රන්ථය සම්පාදනය කරන ලදී.

පාළි පොත්වලින් පටිච්චසමුප්පාදය පිළිබඳ විස්තරයක් ඇත්තේ **සම්මෝහවිනෝදනී** නම් වූ විභංග අටුවාවෙහි හා **විශුද්ධිමාර්‍ගයෙහිත්** ය. ඒ පොත් දෙක්හි එන පටිච්චසමුප්පාද විස්තරය එකිනෙකට වැඩි වෙනසක් නැත. ඒ පොත්වල එන පටිච්චසමුප්පාද විස්තරය ඉතා වැදගත්ය. ඒවායේ පටිච්චසමුත්පාදය විස්තර කර තිබෙන්නේ ක්‍රමානුකූලව ධර්‍මය ඉගෙන ගන්නා වූ ද, ඉගෙන ගත්තා වූ ද තැනැත්තන්ට සුදුසු වන පරිදිය. මෙකල පවත්නා අධ්‍යාපනයේ හැටියට පාළි පොත් හත අටකින් කොටස් පමණක් උගෙනීම ලැබූවන්ටත්, ධර්මය පිළිබඳ උගෙනීමක් නො ලැබූ සාමාන්‍ය ජනයාටත්, ඉහත කී පොත් දෙකේ එන ප්‍රතීත්‍යසමුත්පාද වර්‍ණනාවෙන් ප්‍රයෝජනයක් නොලැබිය හැකිය. රසයක් නො ලැබිය හැකිය. අප විසින් මේ පටිච්චසමුප්පාද විවරණය සම්පාදනය කරන ලද්දේ ධර්මය පිළිබඳ ක්‍රමානුකූල ඉගෙනුමක් ලබා නැති සාමාන්‍ය ජනතාව දෙස බලා ගෙනය. එබැවින් අටුවාවල එන ප්‍රතීත්‍යසමුත්පාද වර්‍ණනා ක්‍රමය අනුගමනය නො කොට, අපට වැටහෙන පරිද්දෙන් මේ ග්‍රන්ථය සම්පාදනය කරන ලදී.

සිංහලෙන් පටිච්චසමුප්පාදය විස්තර කර ඇති පොත් කීපයක් අපට කියවන්නට ලැබිණ. ඒ පොත් අප සිත් නො ගත් බැවින් පටිච්චසමුප්පාද විවරණය නමැති මේ ග්‍රන්ථය සම්පාදනය කිරීමට අදහස් කෙළෙමු. අතිශයින් ගැඹුරු වූ මේ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය, කියවන්නවුන්ට තේරුම් ගත හැකි වන පරිදි විස්තර කර ග්‍රන්ථයක් සම්පාදනය කිරීම පහසු වැඩක් නොවේ. අඩුපාඩුවක් වරදක් ඉතිරි නො වන පරිදි මේ ගැඹුරු ධර්මය විස්තර කිරීමට සමත් බවක් අපට නැත. අප විසින් මෙය කරන ලද්දේ "මහජනයාට තේරුම් ගත හැකි වන පරිද්දෙන් සැපයූ පටිච්චසමුප්පාද

Non-commercial distribution

වණ්නාවක් කොහෙත්ම නැතුවාට වඩා මේ පොතවත් තිබීම හොඳය" යන අදහසිනි.

**අනුලෝම - ප්‍රතිලෝම ප්‍රතීත්‍යසමුත්පාද දේශනා දෙකින් වඩාත් ගැඹුරු ධම්ය වන්නේ ප්‍රතිලෝම ප්‍රතීත්‍යසමුත්පාද දේශනය** ය. එයින් දක්වෙන්නේ නිවනය. පෘථග්ජනයන්ට අවිෂය වූ ඒ නිවන අපගේ අදහසේ හැටියට විස්තර කරනවාට වඩා නිවන පිළිබඳව තථාගතයන් වහන්සේ විසින් දේශිත ධර්ම දක්වීම් වශයෙන් නිර්වාණය විස්තර කිරීම වඩා හොඳ ක්‍රමය වන බැවින් තථාගතයන් වහන්සේ විසින් නිර්වාණය සම්බන්ධයෙන් වදාළ සූත්‍ර කීපයක් මෙහි විස්තර කර ඇත. ඒවා කියවීමෙන් නිර්වාණ තත්ත්වයත් බොහෝ දුරට තේරුම් ගත හැකි වනු ඇත.

මේ ග්‍රන්ථයෙහි අනුලෝම ප්‍රතීත්‍යසමුත්පාදය විස්තර කරන පූර්වභාගය අප විසින් ලියන ලදුයේ ලක්දිව අභිධර්මය උගත් කාන්තාවක් වන කොළඹ හැව්ලොක් ටවුන්හි ලෙයාර්ඩ් මාවතෙහි අංක 18 දරණ මන්දිරයෙහි වෙසෙන සෝමාවතී මුණසිංහ මැතිනියගේ ආරාධනාවෙන් බුද්ධවර්ෂයෙන් 2492 වැන්නෙහිදීය. ඒ කොටස ඇගේ වියදමින් ඒ කාලයේදී මුද්‍රණය කරවා ධර්මදාන වශයෙන් බෙදා දෙන ලදී. දෙදහස් පන්සිය වැනි වසට කලින් මේ පොත සම්පූර්ණකොට මුද්‍රණය කරවන බලාපොරොත්තුවෙන් සිටි මුත් පැමිණියා වූ යම් යම් අපහසුකම් නිසා බලාපොරොත්තු කාලයේදී මෙය කරන්නට නොලැබිණ. නොයෙක් අපහසුකම් මධ්‍යයේ අප ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් මේ බුද්ධ ජයන්ති වර්ෂය තුළදීම මේ ග්‍රන්ථයත් මහජනයා අතට පැමිණ විය හැකි විය.

**මේ සම්බුද්ධ ජයන්ති ධම් පුස්තක පංතියේ අටවන දහම් පොතය. මෙයින් මේ දහම්පොත් පෙළ අවසන් කරනු ලැබේ**. කිසි ශෝභාවක් නොකොට, කිසිවකුගෙන් ආධාරයක් නො ගෙන, අමාරුවෙන් ආරම්භ කරන ලද මේ ධර්මපුස්තක ප්‍රචාරය අප බලාපොරොත්තු වූවාට වඩා බොහෝ සාර්ථක වූ බව ප්‍රීතියෙන් සඳහන් කරමු. අපගේ මේ ධර්මපුස්තක ප්‍රචාරය සාර්ථක

Non-commercial distribution

වූවාක් මෙන් හැම දෙනා ගේ සියලුම යහපත් වැඩ සාර්ථක වේවායි පතමු. මේ ධර්මපුස්තක ව්‍යාපාරය කරදරයක් නැතිව පවත්වාගත හැකිවූයේ ධර්මකාමීන් විසින් මේ පොත් කලට වේලාවට මිලයට ගත් නිසාය. අපේ දහම් පොත් ගත් ගිහි පැවිදි සැමදෙනාම මේ ධර්මපුස්තක ව්‍යාපාරයේ ආධාරකාරයෝ ය. හැම දෙනාට ම පින්සිදු වේවා!

(මේ ග්‍රන්ථය මුද්‍රණයේදී සෝදුපත් බැලීම් ආදි වැඩ සියල්ල අපගේ ශිෂ්‍ය හේන්ගොඩ කල්‍යාණධම්ම නම කිරිඹරුවේ ධම්මානන්ද නම සමග කරන ලද බව ද ස්තුති පූර්වකව සඳහන් කරමු.)

ධර්මය ලොවෙහි බැබලේවා

මීට
ශාසනප්‍රීතිකාමී
**රේරුකානේ චන්දවිමල මහනායක ස්ථවිර**

ශ්‍රී බු. ව. $\frac{2500}{1957}$ මාර්තු 01 දින
ශ්‍රී විනයාලංකාරාරාමය
පොකුණුවිට.

විමසීම් :- ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්‍ෂණ මණ්ඩලය,
ශ්‍රී විනයාලංකාරාරාමය,
පොකුණුවිට.
දුරකථනය : 034-2263958, (2263979)

Non-commercial distribution

# පටිච්ච සමුප්පාද විවරණය

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

චතුරසඞ්ඛ්‍යකල්ප ලක්‍ෂසඞ්ඛ්‍යාතාතිදීර්ඝ කාලය මුළුල්ලෙහි පිරූ සමතිස් පෙරුම් දහම් බෙලෙන් ශ්‍රී මහා බෝධිද්‍රැම මූලයේ දී, ශීල නමැති පෘථිවියෙහි වීර්‍ය්‍ය නමැති පාදයුග්මයෙන් සිට, සමාධි නමැති ශිලාතලයෙහි මුවහත් කරන ලද කර්මක්ෂය-කරඥාන නමැති පොරොව ශ්‍රද්ධා නමැති අතින් ගෙන අතීතාදි කාලත්‍රයක් හා අවිද්‍යාදි ද්වාදශාඞ්ගයක් හා, විංශත්‍යාකාරයක් හා සන්ධිත්‍රයක් හා සතර රාශියක් හා ත්‍රිවෘත්තයක් හා මූලද්වයක් ද ඇත්තා වූ ප්‍රතීත්‍යසමුත්පාද සඞ්ඛ්‍යාත අනාදිකාලප්‍රවෘත්ත සංසාරචක්‍රය සිඳ සර්වඥ පද ප්‍රාප්ත වූ, මාගේ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ගේ ශ්‍රී පාදයුග්මය අතිශය භක්තියෙන් හා ගෞරවයෙන් වැඳ, ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශිත පරම ගම්භීර ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය සසර දුකින් මිදී නිවන් සුවය ලබනු රිසි ධර්ම කාමී සත්පුරුෂ ජනයාට නිවන් මඟ දක්වනු පිණිස මාගේ නැණ පමණින් හෙළ බසින් වර්ණනා කරනු ලැබේ. ආදරයෙන් මෙය කියවා ගම්භීර ධර්මය තේරුම් ගෙන නිවන් පසක් කිරීමට උත්සාහ කෙරෙත්වා!!

Non-commercial distribution

# පටිච්චසමුප්පාද පාළිය

**“අවිජ්ජා පච්චයා සඞ්ඛාරා,සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සෝ, ඵස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණං සෝක පරිදේවදුක්ඛදෝමනස්සු-පායාසා සම්භවන්ති. ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති.”**

මේ විභංග ප්‍රකරණයේ පටිච්චසමුප්පාද විභංගයේ එන අනේක ප්‍රකාර ප්‍රතීත්‍ය සමුත්පාද දේශනයන් අතුරෙන් පළමු වන ප්‍රතීත්‍ය සමුත්පාද දේශනය ය. මේ ගම්භීර ධර්මය දැන ගනු කැමතියන් විසින් පළමු කොට මේ පාඨය පාඩම් කරගෙන ඉදිරියට පොත කියවිය යුතු ය. එහි තේරුම මෙසේ ය :–

අවිද්‍යා නමැති හේතුව නිසා සංස්කාරයෝ හටගනිති,

සංස්කාරයන් නිසා විඥානය හට ගනී,
විඥානය නිසා නාමරූපය හටගනී,
නාමරූපය නිසා ෂඩායතනය හටගනී,
ෂඩායතනය නිසා ස්පර්ශය හටගනී,
ස්පර්ශය නිසා වේදනාව හටගනී,
වේදනාව නිසා තෘෂ්ණාව හටගනී,
තෘෂ්ණාව නිසා උපාදානය හටගනී,
උපාදානය නිසා භවය හටගනී,
භවය නිසා ජාතිය වේ,
ජාතිය නිසා ජරා,මරණ, සෝක, පරිදේව, දුඃඛ, දෞර්මනස්‍ය, උපායාසයෝ වෙති.

මෙසේ මේ සකල දුඃඛස්කන්ධයාගේ පහළ වීම වේ.

**පටිච්චසමුප්පාද**
**යන්නෙහි තේරුම**

ගින්න නිසා දුම ඇති වන්නාක් මෙන් ද ගස නිසා ගෙඩිය ඇති වන්නාක් මෙන් ද තමා නිසා පෙර නො තුබූ අන් දෙයක් ඇති

Non-commercial distribution

වීමට හේතු වන්නා වූ දෙයට හෙවත් ධර්මයට "පටිච්චසමුප්පාදය" යි කියනු ලැබේ.

අවිද්‍යාව ඇති කල්හි ඒ අවිද්‍යාව නිසා පුණ්‍යාභිසංස්කාරාදි ත්‍රිවිධ සංස්කාරයෝ හටගනිති. එබැවින් සංස්කාරයන්ට හේතු වූ අවිද්‍යාව පටිච්චසමුප්පාදයකි. අවිද්‍යාව නිසා හටගන්නා වූ සංස්කාරයන් නිසා ද විඥානය ඇති වේ. එබැවින් සංස්කාරයෝ ද පටිච්ච සමුප්පාදයකි. සංස්කාර හේතුවෙන් හටගත් විඥානය නිසා නාමරූප හටගනී. එබැවින් විඥානය ද පටිච්චසමුප්පාදයකි. විඥානය නිසා හටගත් නාමරූපය නිසා ෂඩායතනය පහළ වේ. එබැවින් ෂඩායතනයට හේතු වූ නාම රූපය ද පටිච්ච-සමුප්පාදයකි. මෙසේ ස්පර්ශය ඇති වීමට හේතු වන බැවින් ෂඩායතනය ද පටිච්චසමුප්පාදයකි. වේදනාව ඇති වීමට හේතු වන බැවින් ස්පර්ශය ද පටිච්චසමුප්පාදයකි. තෘෂ්ණාව ඇති වීමට හේතු වන බැවින් වේදනාව ද පටිච්චසමුප්පාදයකි. උපාදනය ඇති වීමට හේතු වන බැවින් තෘෂ්ණාව ද පටිච්චසමුප්පාදයකි. භවය ඇති වීමට හේතු වන බැවින් උපාදානය ද පටිච්චසමුප්පාදයකි. ජාතිය ඇති වීමට හේතු වන බැවින් භවය ද පටිච්චසමුප්පාදයකි. ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍යෝපායාසයන් ඇති වීමට හේතු වන බැවින් ජාතිය ද පටිච්චසමුප්පාදයකි. ජරාමරණාදිය ද අවිද්‍යා තෘෂ්ණාවන්ට හේතු වන බැවින් පටිච්චසමුප්පාදයකි.

මෙසේ අවිද්‍යාවේ පටන් ජරා මරණය දක්වා ඇති මේ ධර්ම සියල්ල ම එකිනෙකට හේතු වන බැවින් පටිච්චසමුප්පාද නම් වේ. ඒ පටිච්චසමුප්පාදය ප්‍රකාශ කරන්නා වූ "අවිජ්ජා පච්චයා සංඛාරා" යනාදි පාඨයට ද ඒ නම කියනු ලැබේ.

එක් ගලක් මත එය හා බැඳී සිටින සේ අනෙක් ගලක් ද, ඒ ගල මත එය හා බැඳී සිටින සේ අනෙක් ගලක් ද, එය මත අනෙක් ගලක් ද යි මෙසේ උස් වී සිටින සේ එකින් එක මත තබන ලද ගල් සමූහයට වෙන් වෙන් වූ ගල් ගැන අපේක්ෂාවක් නො කොට කථා කරන කල්හි කුලුන ය යි ද කණුව ය යි ද කියනු ලැබේ.

Non-commercial distribution

එහෙත් එකක් උඩ එකක් පිහිටා තිබෙන ගල් සමූහය හැර එහි කුලුනය කියා අමුතු දෙයක් නැත. සත්‍ය වශයෙන් එහි ඇත්තේ ගල් සමූහය පමණකි. එ මෙන් එකක් නිසා එය හා බැඳී පවත්නා සේ තවත් ධර්මයක් ඇති වීම් වශයෙන් නො සිඳී පැවතී ගෙන යන්නා වූ අවිද්‍යාදි ධර්ම පරම්පරාවන්ට, ධර්ම සමූහයන්ට වෙන් වෙන් වූ ධර්ම ගැන අපේක්‍ෂාවක් නැති ව කථා කරන කල්හි ස්ත්‍රිය ය, පුරුෂයා ය, දෙවියා ය යනාදි නම් කියනු ලැබේ. එහෙත් ධර්ම සමූහ - ධර්ම පරම්පරා මිස සත්‍ය වශයෙන් ඇති ස්ත්‍රියක් පුරුෂයෙක් සත්ත්වයෙක් පුද්ගලයෙක් නැත.

කුලුනය යි කී කල්හි සත්‍ය වශයෙන් කුලුනක් නො ලැබී එක පිට එක පිහිටි ගල් සමූහයක් ලැබෙන්නාක් මෙන් ස්ත්‍රිය ය කියා හෝ පුරුෂයා ය කියා හෝ මිනිසා ය දෙවියා ය සත්ත්වයා ය කියා හෝ කී කල්හි සත්‍ය වශයෙන් එක් එක් ධර්මයක් නිසා ඇති වන්නා වූ ධර්ම සමූහයක් ම ලැබේ. ස්ත්‍රී පුරුෂාදීහු නො ලැබෙත්. පටිච්චසමුප්පාදය යි කියනුයේ එක එකක් නිසා පවත්නා වූ ඒ ධර්ම සමූහයට ය. එබැවින් පටිච්චසමුප්පාදය අපෙන් ඈත අන් තැනක - අන් ලොවක ඇතියක් නොවේ, අප ම බව හෙවත් සත්ත්වයන් පුද්ගලයන් සැටියට ව්‍යවහාර කරන දෙය ම බව දත යුතු ය. පටිච්චසමුප්පාදය අප ම වුව ද එය සත්ත්ව පුද්ගල කථාවෙන් අපට වැසී තිබේ. වැසී තිබෙන බැවින් තේරුම් ගැනීමට - දැන ගැනීමට දුෂ්කර ගැඹුරු ධර්මයක් වී තිබේ.

**පටිච්චසමුප්පාදය**
**නො දැනීමේ දෝෂය.**

පටිච්චසමුප්පාදය මහා දුක්ඛස්කන්ධයකි. දුඃඛ චක්‍රයකි. එයට හසු වී සිටින්නා වූ සත්ත්වයෝ ජාති - ජරා - ව්‍යාධි - මරණාදි දුඃඛයන්ට හා ආපායික දුඃඛයන්ට ද නැවත නැවත හසු වෙමින් සෙක්කුවේ බඳින ලදු ව එය වටේ කැරකෙන ගවයන් මෙන් භවත්‍රයෙහි කැරකෙති. රෝගයක් ඇති කෙනකුට ඒ රෝගය හොඳින් හැඳින ගන්නා තුරු එයට සෑහෙන ප්‍රතිකාරයක් කරගෙන එයින් මිදිය නො හෙන්නාක් මෙන් ප්‍රතීත්‍යසමුත්පාද සංඛ්‍යාත දුඃඛ චක්‍රය හෙවත් සංසාර චක්‍රය හොඳින් හැඳින ගන්නා තුරු අවිද්‍යා

Non-commercial distribution

තෘෂ්ණා සංඛ්‍යාත සංසාර චක්‍රයේ මූලධර්මයන් ප්‍රහාණය කොට එය සිඳ එයින් මිදී නිවනට නො පැමිණිය හැකිය. එ බැවින් තථාගතයන් වහන්සේ විසින් ආනන්ද ස්ථවිරයන් වහන්සේට -

**"ඒතස්ස ආනන්ද, ධම්මස්ස අඤ්ඤාණා අනනුබෝධා අප්පටිවේධා ඒවමයං පජා තන්තාකුලකජාතා ගුලාගුණ්ඨිකජාතා මුඤ්ජබබ්බජභූතා අපායං දුග්ගතිං විනිපාතං සංසාරං නාතිවත්තන්ති"** යි වදාරන ලදී.

"ආනන්දය, මේ ප්‍රතීත්‍යසමුප්පාද ධර්මය නො දැනීම නිසා, අවබෝධ නො කිරීම නිසා, ප්‍රතිවේධ නො කිරීම නිසා මේ සත්ත්වයෝ (මීයන් කැපූ) නූල් පන්දුවක් ·සේ අවුල් වූවාහු රෙදි වියන්නන්ගේ නූල් පන්දුවක් මෙන් අවුල් වූවාහු මුඤ්ජබබ්බජ නම් වූ තණවලින් ඇඹරූ දිරා කැඩී ගිය කඹයක තණකෙඳි මෙන් අවුල් වූවාහු සැපයෙන් පහ වූ දුක්ඛයා ගේ පැවැත්ම ඇත්තා වූ අපාය හා සංසාරය නො ඉක්මවත්" යනු එහි තේරුම ය.

තව ද පටිච්චසමුප්පාදය නො දත් තැනැත්තා නියම ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු නො වන බව ද ප්‍රත්‍යක්ෂාත්ම-භාවයේ ම ලෝකෝත්තර මාර්ගයට පැමිණෙන්නකු නො වන බව ද තථාගතයන් වහන්සේ මෙසේ වදාළ සේක.

**"යේහි කේචි භික්ඛවේ, සමණා වා බ්‍රාහ්මණා වා ජරාමරණං නප්පජානන්ති, ජරාමරණ සමුදයං නප්පජානන්ති, ජරාමරණ නිරෝධං නප්පජානන්ති, ජරාමරණ නිරෝධගාමිනිං පටිපදං නප්පජානන්ති, - පෙ - න මේතේ භික්ඛවේ,සමණා වා බ්‍රාහ්මණා වා සමණේසු වා සමණ සම්මතා, බ්‍රාහ්මණේසු වා බ්‍රාහ්මණ සම්මතා, න ච පන තේ ආයස්මන්තෝ සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සන්ති."**

"මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ ජරාමරණය නො දනිත් ද, ජරාමරණ හේතුව නො දනිත් ද, ජරාමරණ නිරෝධය නො දනිත් ද, ජරාමරණ නිරෝධයට පැමිණෙන්නා වූ ප්‍රතිපත්තිය නො දනිත් ද - පෙ - මහණෙනි, ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ශ්‍රමණයන් අතර ශ්‍රමණය යි සම්මත වූවෝ ද නො වෙති. බ්‍රාහ්මණයන් අතර බ්‍රාහ්මණය යි සම්මත වූවෝ හෝ නො වෙති. ඒ ආයුෂ්මත්හු ලෝකෝත්තර

Non-commercial distribution

මාර්ගය වර්තමාන ජාතියේ දී තමන් ම විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට එයට පැමිණ වාසය කරන්නෝ නො වන්නාහු ය” යනු එහි තේරුම යි.

**පටිච්චසමුප්පාදය**
**දැනීමේ අනුසස්.**

සම්‍යක් සම්බෝධිය ය, ප්‍රත්‍යෙක සම්බෝධිය ය, ශ්‍රාවක බෝධිය ය යන තුන්තරා බෝධියෙන් එකකට පැමිණ සියලු කෙලෙසුන් නසා සංසාර චක්‍රය සිඳ නිවනට පැමිණීම පටිච්චසමුප්පාදය දැන ගැනීමේ ආනිසංසය ය. පටිච්චසමුප්පාදය දැන ගැනීමේ අනුසස් දක්වනු පිණිස තථාගතයන් වහන්සේ මෙසේ වදාළ සේක.

**“යතෝ බෝ භික්ඛවේ! අරියසාවකෝ ඒවං පච්චයං පජානාති, පච්චයසමුදයං පජානාති, පච්චය නිරෝධං පජානාති, පච්චයනිරෝධගාමනිං පටිපදං පජානාති, අයං වුච්චති භික්ඛවේ! අරියසාවකෝ දිට්ඨිසම්පන්නෝ ඉතිපි, දස්සනසම්පන්නෝ ඉතිපි, ආගතෝ ඉමං සද්ධම්මං ඉතිපි, සේඛේන ඤාණේන සමන්නාගතෝ ඉතිපි, සේඛාය විජ්ජාය සමන්නාගතෝ ඉතිපි, ධම්මසෝතං සමාපන්නෝ ඉතිපි, අරියෝ නිබ්බේධික පඤ්ඤෝ ඉතිපි, අමතද්වාරං ආහච්ච තිට්ඨති ඉතිපීති.”**

“මහණෙනි, යම් හෙයකින් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ මෙසේ අවිද්‍යාදි ප්‍රත්‍යය දනී ද, ප්‍රත්‍යයන් ගේ උත්පත්ති හේතුව දනී ද, ප්‍රත්‍යයන් ගේ නිරෝධය දනී ද, ප්‍රත්‍යය නිරෝධයට පැමිණෙන ප්‍රතිපත්තිය දනීද මහණෙනි, මේ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ මේ කාරණයෙන් මාර්ගඥාන සංඛ්‍යාත දෘෂ්ටියෙන් යුක්ත වූයේ ය යි ද, මේ කාරණයෙන් මාර්ගඥාන සංඛ්‍යාත දර්ශනයෙන් යුක්ත වූයේ ය යි ද, මේ කාරණයෙන් ලෝකෝත්තර මාර්ග සංඛ්‍යාත සද්ධර්මයට ආයේ ය යි ද, මේ කාරණයෙන් ශෛක්‍ෂ වූ ඥානයෙන් යුක්ත වූයේ ය යි ද, මේ කාරණයෙන් ශෛක්ෂ වූ විද්‍යාවෙන් යුක්ත වූයේ ය යි ද, මේ කාරණයෙන් මාර්ග සංඛ්‍යාත ධර්ම ශ්‍රෝතසට පැමිණියේ ය යි ද, මේ කාරණයෙන් ආර්‍ය්‍ය වූ, තෘෂ්ණාව දුරු කරන ප්‍රඥාව ඇත්තේ ය යි ද, මේ කාරණයෙන් නිවන් දෙරට පැමිණ සිටී ය යි ද කියනු ලැබේය” යනු එහි තේරුමයි.

Non-commercial distribution

සියලු ම මහා බෝධිසත්ත්වයන් වහන්සේලා ලොවුතුරා බුදු බවට පැමිණියේ ද ආනාපාන චතුර්ත්ථ ධ්‍යානයෙන් නැගී සිට ඥානය පටිච්චසමුප්පාදයට යවා පටිච්චසමුප්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් වටහා ගෙන විදර්ශනා කිරීමෙනි. මහාබෝධිසත්ත්වයන් වහන්සේලා ගේ චාරිත්‍ර ධර්මය වූ පරිදි අප මහ බෝසතාණන් වහන්සේ ද ශ්‍රී මහාබෝධිමූලයේ වැඩ සිට, ආනාපානස්මෘති භාවනාවේ යෙදී ධ්‍යාන උපදවා චතුර්ත්ථ ධ්‍යානයෙන් නැඟී සිට උන් වහන්සේ ගේ ඥානය පටිච්චසමුප්පාදයට යැවූ හ. එහි පිළිවෙළ මෙසේය.

"අහෝ! මේ සත්ත්ව සමූහය දුකට පැමිණියේ ය. මේ සත්ත්වයෝ උපදින්නාහු ද වෙති, දිරන්නාහු ද වෙති, මැරෙන්නාහු ද වෙති, නැවත නැවත මැරෙන්නාහු ද වෙති, නැවත නැවත උපදින්නාහු ද වෙති. එහෙත් ඔවුහු ජරා මරණයෙන් මිදීමක් නො දකිති. කවදා මේ ජරාමරණ සංඛ්‍යාත දුඃඛයෙන් මිදීමක් පෙනෙන්නේ ද, කුමක් ඇති කල්හි කිනම් හේතුවක් නිසා ජරාමරණය වේ ද" යි උන්වහන්සේ නුවණින් විමසන්නට බලන්නට වූහ. එකල්හි ඉපදීම ඇති කල්හි ඉපදීම නිසා ජරා මරණය වන බව උන් වහන්සේ ගේ නුවණට පෙනිණ.

ඉක්බිති බෝසතාණන් වහන්සේ කුමක් ඇති කල්හි කිනම් හේතුවකින් ජාතිය ඇති වේ ද යි කල්පනා කළහ. උන් වහන්සේ ගේ නුවණට භවය ඇති කල්හි භවය හේතු කොට ඉපදීම ඇති බව පෙනිණ.

ඉක්බිති බෝසතාණන් වහන්සේ කුමක් ඇති කල්හි කුමක් හේතු කොට භවය ඇති වේ ද යි කල්පනා කළහ. එකල්හි උන් වහන්සේ ගේ නුවණට උපාදානය ඇති කල්හි උපාදානය නිසා භවය ඇති වේ ය යි පෙනිණ.

ඉක්බිති බෝසතාණෝ කුමක් ඇති කල්හි කුමක් හේතු කොට උපාදානය ඇති වේ ද යි කල්පනා කළහ. උන් වහන්සේ ගේ නුවණට තෘෂ්ණාව ඇති කල්හි තෘෂ්ණාව නිසා උපාදානය ඇති වන බව පෙනිණ.

Non-commercial distribution

ඉක්බිති බෝසතාණන් වහන්සේ කුමක් ඇති කල්හි කුමක් නිසා තෘෂ්ණාව ඇති වේ ද යි කල්පනා කළහ. උන් වහන්සේ ගේ නුවණට වේදනාව ඇති කල්හි වේදනාව නිසා තෘෂ්ණාව ඇති වන බව පෙනිණ.

ඉක්බිති මහබෝසතාණෝ කුමක් ඇති කල්හි කුමක් නිසා වේදනාව ඇති වේ ද යි කල්පනා කළහ. උන් වහන්සේ ගේ නුවණට ස්පර්ශය ඇති කල්හි ස්පර්ශය හේතු කොට වේදනාව ඇති වන බව පෙනිණ.

ඉක්බිති මහබෝසතාණෝ කුමක් ඇති කල්හි කුමක් නිසා ස්පර්ශය ඇති වේ ද යි කල්පනා කළහ. උන් වහන්සේ ගේ නුවණට ෂඩායතනය ඇති කල්හි ෂඩායතනය හේතු කොට ස්පර්ශය ඇති වන බව පෙනිණ.

ඉක්බිති මහබෝසතාණෝ කුමක් ඇති කල්හි කුමක් හේතු කොට ෂඩායතනය ඇති වේ ද යි කල්පනා කළහ. උන් වහන්සේ ගේ නුවණට නාමරූපය ඇති කල්හි නාමරූපය නිසා ෂඩායතනය ඇති වන බව පෙනිණ.

ඉක්බිති මහබෝසතාණෝ කුමක් ඇති කල්හි කුමක් නිසා නාමරූපය ඇති වේ දයි කල්පනා කළහ. උන් වහන්සේ ගේ නුවණට විඥානය ඇති කල්හි විඥානය නිසා නාමරූපය ඇති වන බව පෙනිණ.

ඉක්බිති මහබෝසතාණෝ කුමක් ඇති කල්හි කුමක් නිසා විඥානය ඇති වේ ද යි කල්පනා කළහ. උන් වහන්සේ ගේ නුවණට සංස්කාරය ඇති කල්හි සංස්කාරය හේතු කොට විඥානය ඇති වන බව පෙනිණ.

ඉක්බිති මහබෝසතාණෝ කුමක් ඇති කල්හි කුමක් හේතු කොට සංස්කාරයෝ ඇති වෙත් ද යි කල්පනා කළහ. උන් වහන්සේ ගේ නුවණට අවිද්‍යාව ඇති කල්හි අවිද්‍යාව හේතු කොට සංස්කාරයන් ඇති වන බව පෙනිණ.

මෙසේ මහබෝසතාණන් වහන්සේට එසමයෙහි චතුරසංඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි පිරූ පාරමිතා කුශල

Non-commercial distribution

බලයෙන් **"අවිද්‍යාව හේතු කොට සංස්කාරයෝ වෙත්ය. සංස්කාරයන් හේතුකොට විඥනය වේ ය. විඥනය හේතු කොට නාමරූපය වේ ය. නාමරූපය හේතු කොට ෂඩායතනය වේය. ෂඩායතනය හේතුකොට ස්පර්ශය වේය. ස්පර්ශය හේතු කොට වේදනාව වේ ය. වේදනාව හේතු කොට තෘෂ්ණාව වේ ය. තෘෂ්ණාව හේතු කොට උපාදනය වේ ය. උපාදනය හේතු කොට භවය වේ ය. භවය හේතු කොට ජාතිය වේ ය. ජාතිය හේතු කොට ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්ස්‍ය උපායාසයෝ වෙත් ය" යි පෙර නො ඇසූ විරූ මේ ප්‍රතීත්‍යසමුත්පාද පිළිබඳ වූ ප්‍රඥ චක්ෂුස උපන. ඥනය උපන. ප්‍රඥව උපන. විද්‍යාව උපන. ආලෝකය උපන.**

ඉක්බිති මහබෝසතාණෝ කුමක් නැති කල්හි ජරා මරණය නො වේ ද, කුමක් නිරුද්ධ කල්හි ජරා මරණ නිරෝධය වේ ද යි කල්පනා කළහ. උන් වහන්සේ ගේ නුවණට ජාතිය නැති කල්හි ජරා මරණය නො වන බව හා ජාති නිරෝධයෙන් ජරා මරණ නිරෝධය වන බව පෙනිණ. මෙසේ එකින් එකේ නිරෝධය නුවණින් බැලූ බෝසතාණන් වහන්සේට සියල්ලේ ම නිරෝධය ද පෙනිණ. මෙසේ මහ බෝසතාණන් වහන්සේට :–

**අවිද්‍යාවගේ ම නිරවශේෂ නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ ය. සංස්කාර නිරෝධයෙන් විඥන නිරෝධය වේ ය. විඥන නිරෝධයෙන් නාමරූප නිරෝධය වේ ය. නාමරූප නිරෝධයෙන් ෂඩායතන නිරෝධය වේ ය. ෂඩායතන නිරෝධයෙන් ස්පර්ශ නිරෝධය වේ ය. ස්පර්ශ නිරෝධයෙන් වේදනා නිරෝධය වේ ය. වේදනා නිරෝධයෙන් තෘෂ්ණා නිරෝධය වේ ය. තෘෂ්ණා නිරෝධයෙන් උපාදන නිරෝධය වේ ය. උපාදන නිරෝධයෙන් භව නිරෝධය වේ ය. භව නිරෝධයෙන් ජාති නිරෝධය වේ ය. ජාති නිරෝධයෙන් ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍යෝපායාසයෝ නිරුද්ධ වෙත් ය. මෙසේ මේ සකල දුඃඛස්කන්ධයා ගේ නිරෝධය වේ ය යි පෙර නො ඇසූ විරූ මේ ධර්මය පිළිබඳ ප්‍රඥ චක්ෂුස උපන. ඥනය උපන. ප්‍රඥව උපන. විද්‍යාව උපන. ආලෝකය උපන.**

මෙසේ දක්නා ලද ප්‍රතීත්‍යසමුත්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් සම්මර්ශනය කොට පිළිවෙළින් සෝවාන් සකෘදගාමි අනාගාමි අර්හත් යන සතර මාර්ග සතර ඵලයට පැමිණ සංසාර

Non-commercial distribution

චක්‍රය සිඳ උන් වහන්සේ ලොවුතුරා බුදුබවට පැමිණ වදළසේක. සංසාර චක්‍රය සිඳලීමේ ප්‍රීතිය කරණ කොට ගෙන එද අරුණෝදය වේලාවෙහිදී ඒ භාග්‍යවතුන් වහන්සේ පෙර බුදුවරයන් වහන්සේලා ගේ චාරිත්‍ර ධර්මය අනුව මේ ගාථාව වදළ සේක.

**අනේක ජාති සංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං**
**ගහකාරකං ගවේසන්තෝ දුක්ඛාජාති පුනප්පුනං**
**ගහකාරක දිට්ඨෝසි පුන ගෙහං න කාහසි.**
**සබ්බා තේ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං**
**විසංඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගා**

“නැවත නැවත ඉපදීම දුකෙක, සසර නැවත නැවත ඉපදීම් වශයෙන් පඤ්චස්කන්ධ සංඛ්‍යාත ගෘහය නැවත නැවත තනන්නා වූ තෘෂ්ණා නමැති වඩුවා සොයමින් ඔහු අල්ලා ගත නො හැකිව නොයෙක් සිය දහස් ගණන් ජාතියෙහි සසර ඒ මේ අත දිවූයෙමි. ස්කන්ධ සංඛ්‍යාත ගෘහය තනන්නා වූ එම්බා තෘෂ්ණා නමැති වඩුව, තා මම දුටුවෙමි. මින් මතු තෝ මට ගෙවල් නො තනන්නෙහි ය. තා ගේ සහකාර කෙලෙස් නමැති පරාල සියල්ල මා විසින් සිඳින ලද්දේ ය. ස්කන්ධ ගෘහයා ගේ මුදුන වූ අවිද්‍යාව මා විසින් නසන ලද්දේ ය. මාගේ සිත අරමුණු කිරීම් වශයෙන් නිවනට පැමිණියේ ය. තෘෂ්ණාවන්ගේ ක්ෂයය වූ අර්හත්වයට මම පැමිණියේ වෙමි ය” යනු එහි අදහස යි.

බුදුබව පවා සිදු කර දෙන ප්‍රතීත්‍යසමුත්පාදය පිළිබඳ දැනුම ඇති කරගත් තැනැත්තාට කිනම් බෝධියකින් වුව ද නිවන් දැකිය හැකි වන බැවින් නිවන් පතන සියල්ලෝ ම මේ ධර්මය දැනගැනීමට උත්සාහ කෙරෙත්වා! මෙතැන් පටන් පිළිවෙළින් පටිච්චසමුප්පාදය විස්තර කරනු ලැබේ.

# අවිජ්ජාපච්චයා සංඛාරා

දැනීම වනාහි ඇති සැටියට ම දැනීම ය, වරදවා දැනීම ය යි දෙවැදෑරුම් වේ. තණපත් ආදියෙන් කළ මිනිස් රුවක් දැක එය සැබෑ මිනිසකු වශයෙන් නොව මිනිස් රුවක් සැටියට ම දැනීම

Non-commercial distribution

ඇති සිටියට දැනීම ය. තණපත් ආදියෙන් කළ මිනිස් රුව දෙස දුරින් බලා එය මිනිසෙකැයි සිතා ගැනීම වරදවා දැනීමය. මේ දෙවැදෑරුම් දැනුම අතුරෙන් ඇති සැටියට නො වරදවා දැනීම ‘විද්‍යා’ නම් වේ. ඇති සැටිය හැර අන් ආකාරයකින් වරදවා දැනීම ‘අවිද්‍යා’ නම් වේ. මෝහය යනු ද එට නමෙකි. තත්ත්වාකාරයෙන් දැනුම වූ විද්‍යාවට විරුද්ධ බැවින් වරදවා දැනුමට නො දැනීම ය යි ද කියනු ලැබේ. අවිද්‍යාව කවරක් ද යන බව විභංග පාළියේ දක්වෙන්නේ මෙසේය :–

**“තත්ථ කතමා අවිජ්ජා? දුක්ඛේ අඤ්ඤාණං, දුක්ඛ සමුදයේ අඤ්ඤාණං, දුක්ඛ නිරෝධේ අඤ්ඤාණං, දුක්ඛ නිරෝධගාමිනියා පටිපදය අඤ්ඤාණං, අයං වුච්චති අවිජ්ජා”**

දුක නො දැනීම ය, දුක් ඇති වීමේ හේතුව නො දැනීම ය, දුඃඛ නිරෝධය නො දැනීම ය, දුඃඛ නිරෝධයට පැමිණීමේ ප්‍රතිපදව නො දැනීම ය යන කරුණු සතර අවිද්‍යාව බව එයින් දක්විණ.

රිදුමය යි කියනු ලබන දුඃඛ වේදනාව සියල්ලෝ ම දනිති. එය නො හඳුනන තිරිසනකුදු නැත. මෙහි දුක නො දැනීම ය යි කියනුයේ එයට නොවේ. ජාති - ජරා - ව්‍යාධි - මරණ - ශෝක - පරිදේවාදීන් ගෙන් යුක්ත බැවින් ද, සංස්කාර දුඃඛ ය, විපරිණාම දුඃඛ ය, දුඃඛ දුඃඛය යන තෙවැදෑරුම් දුඃඛයෙන් පෙළනු ලබන බැවින් ද පඤ්චස්කන්ධය ම දුඃඛයකි. එහෙත් ඒ බව සත්ත්වයෝ නො දනිති. එබැවින් ඔවුහු ඒ පඤ්චස්කන්ධය ඉතා හොඳ දෙයක් කොට මිහිරි දෙයක් කොට සලකති. මෙහි දුක නො දැනීම ය යි කියනුයේ පඤ්චස්කන්ධය ම දුක් රැසක් බව නො දැනීමට ය.

දුඃඛ වේදනාව ඇති වීමේ හේතු බොහෝ ය. ශරීරයෙහි වූ වාතාදිය ද දුඃඛ වේදනාවට හේතු ය. ගල් මුල් ආදිය හා තදින් හැපීම වැටීම පහර ලැබීම යන ආදිය ද දුඃඛ වේදනාවට හේතු ය. දුඃඛ වේදනාව හඳුනන්නාක් මෙන් ම සියලු සත්ත්වයෝ ම එහි හේතුන් ද දනිති. මෙහි දුක් ඇති වීමේ හේතුව නො දැනීමය යි කියනුයේ දුඃඛ වේදනාවේ හේතු නො දැනීමට නොවේ.

Non-commercial distribution

සත්ත්වයෝ පඤ්චස්කන්ධය පඤ්චස්කන්ධයක් සැටියට නො ගෙන, මමය - මවය - පියාය - සහෝදරයාය - සහෝදරීය - නෑයාය - මිතුරාය - ස්ත්‍රිය - පුරුෂයාය යනාදීන් ආත්ම වශයෙන් වරදවා ගෙන පඤ්චස්කන්ධයට ඇලුම් කරති. මම ය යි ගෙන ඇලුම් කරන ස්කන්ධ පඤ්චකය ඉදිරියට පවත්වා ගැනීමේ බලවත් ආශාව නිසා මරණයෙන් ද ස්කන්ධ පරම්පරාව නො සිඳී, සත්ත්ව තෙමේ නැවත නැවතත් ඉපදීම් වශයෙන් අපාය ලෝක මනුෂ්‍ය ලෝක දිව්‍ය ලෝක බ්‍රහ්ම ලෝකයන්හි ඉපදී අභිනව ස්කන්ධ නැවත නැවත ඒ තෘෂ්ණාව පවත්නා තුරු ලබන්නේය. එ බැවින් පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුඃඛයේ හේතුව තෘෂ්ණාව බව තථාගතයන් වහන්සේ වදළ සේක. සත්ත්වයෝ ඒ තෘෂ්ණාව දුක් ලැබීමේ හේතුවක් සැටියට නොව සත්ත්වයකුට තිබිය යුතු ම දෙයක් සැටියට මනා දෙයක් සැටියට ගෙන ඒ ආශාව නො හැර ම පවත්වා ගෙන යති. එය දුක් ඉපදීමේ හේතුවක් බව ඔවුහු නො දනිති. මෙහි දුක් ඇති වීමේ හේතුව නො දැනීම ය යි කියන ලදුයේ ඒ තෘෂ්ණාවේ දුක් ඉපදීමට හේතු වන බව නො දැනීමට ය.

යමක් දුක නම් එහි නැති බව සුවයෙකි. දුක යම් පමණ මහත් නම් එහි නැති බව වූ සුවයත් එ පමණට ම මහත් බව කිය යුතු ය. මහත් ම දුක නම් පඤ්චස්කන්ධය නමැති දුක ය. එයට වඩා මහත් දුකක් තවත් නැත. එ බැවින් පඤ්චස්කන්ධයාගේ නිරෝධය මහත් ම සුවය යි. එයට වඩා මහත් වූ එයට වඩා වටිනා වූ තවත් සුවයක් නැත. එහෙත් සත්ත්වයෝ ඒ බව නො දනිති. ඔවුනට වැටහෙනුයේ පඤ්චස්කන්ධය නැති වීම ඉතාම හානිය - ඉතාම නපුර - මහත් ම දුක සැටියට ය. එ බැවින් ඔවුහු ඒ පඤ්චස්කන්ධ නිරෝධයට අන් හැමටම වඩා බිය වෙති. මෙහි දුඃඛ නිරෝධය නො දැනීම ය යි කියනුයේ පඤ්චස්කන්ධ නිරෝධයාගේ උතුම් බව - සුවයක් බව නො දැනීමට ය.

දුඃඛ නිරෝධ සංඛ්‍යාත නිර්වාණයට පැමිණීමේ නො වරදින මාර්ගය වූ ශීල සමාධි ප්‍රඥා සංඛ්‍යාත ත්‍රිශික්ෂා පරිපූරණය සත්ත්වයාට වැටහෙනුයේ සැපයට පැමිණීමේ මාර්ගයක් සැටියට නොව, දුකක් හා දුකට පැමිණීමේ මාර්ගයක් ලෙසට ය. ශීල

Non-commercial distribution

පරිපූරණය සඳහා ගිහි ගෙය හැර, නෑයන් මිතුරන් හැර, පැවිදි වීම ඔහුට පෙනෙන්නේ මහත් වූ දුකක් ලෙසට ය. එය මතුවට ද බොහෝ දුක් ඇති වීමේ හේතුවක් ලෙසට ය. එබැවින් සත්ත්වයෝ නිර්වාණ ගාමිනී ප්‍රතිපදවට බිය වෙති. එය නො පුරති. පිරීම ම අනුවණ කමක් සේ සිතති. ප්‍රාණඝාතාදිය ම සැපයට පැමිණීමේ සැපය ලැබීමේ මාර්ගය ය යි සිතා ඒවා ඉතා ඕනෑකමින් කරති. මෙහි දුක්ඛනිරෝධයට පැමිණීමේ මාර්ගය නො දැනීම ය යි කියන ලදුයේ සැපය ලැබීමේ සැපයට පැමිණීමේ මාර්ගය පිළිබඳ වූ මේ වැරදි හැඟීම්වලට ය.

**'සංඛාර'** යනු අර්ථ කීපයක යෙදෙන වචනයෙකි. **"අනිච්චා වත සංඛාරා"** යන්නෙහි සංඛාරය යි කියනුයේ ප්‍රත්‍යයන් විසින් ඇති කරන ලද ධර්මයන්ට ය. **"අවිජ්ජා පච්චයා සංඛාරා"** යන මෙහි සංඛාරය යි කියනුයේ පින් - පව්වලට ය. තවත් ක්‍රමයකින් කියතහොත් සත්ත්වයන්ගේ කැරුම් කියුම් සිතුම් සංඛාරයෝ ය. ඒවාට සංඛාරය යි කියනුයේ මතු විපාකයක් ඇති කරන ධර්මයෝ ය යන අර්ථයෙනි. විභංග පාළියෙහි වනාහි :-

**"තත්ථ කතමේ අවිජ්ජා පච්චයා සංඛාරා? පුඤ්ඤාභිසංඛාරෝ, අපුඤ්ඤාභිසංඛාරෝ, ආනෙඤ්ජාභි සංඛාරෝ, කායසංඛාරෝ, වචීසංඛාරෝ, චිත්ත සංඛාරෝ"** යි.

එක් ක්‍රමයකින් පුඤ්ඤාභිසංඛාරය, අපුඤ්ඤාභි සංඛාරය, ආනෙඤ්ජාභිසංඛාරය යන තුන ද, තවත් ක්‍රමයකින් කායසංඛාරය, වචීසංඛාරය, චිත්තසංඛාරය යන තුන ද අවිද්‍යාව නිසා හටගන්නා වූ සංඛාරයෝ ය යි දක්වන ලදී. එහි දානමය වූ ද ශීලමය වූ ද භාවනාමය වූ ද කාමාවචර කුශල චේතනාව හා භාවනාමය වූ රූපාවචර කුසල චේතනාව ද පුඤ්ඤාභිසංඛාර නම්. කාමාවචර වූ අකුශල චේතනාව අපුඤ්ඤාභිසංඛාර නම්. අරූපාවචර කුශල චේතනාව ආනෙඤ්ජාභිසංඛාර නම්.

**'ආනෙඤ්ජ'** යන වචනයේ තේරුම නො සැලෙන දෙය යනු යි. රූපාවචර කුශලය වනාහි සමාධියට සතුරු වූ ධර්මයන්ට සමීප වූවකි. අරූපාවචර කුශලය වනාහි සමාධියට සතුරු වූ කාමච්ඡන්දදීන් කෙරෙන් ඉතා දුරට ගිය ධර්මයෙකි. එය

Non-commercial distribution

කාමච්ඡන්දදීන් විසින් පහසුවෙන් සෙලවිය හැකි නො වේ. ඒ අරූප කුශලයෙන් උපදවන භවය ද කිසිවෙක නො සැපෙන අතිසූක්ෂ්ම භවයක් වූයෙන් කිසිවක් නිසා නො සැලෙන භවයකි. අරූපාවචර කුශලය වනාහි තමා නො සැලෙන බැවින් හා නො සැලෙන භවයක් ඇති කරන බැවින් ද ආනෙඤ්ජාභි සංඛාර නම් වේ.

කායසංඛාරාදි තුන අතුරෙන් ශරීරය උපකරණයක් කොට ගෙන එහි ආධාරයෙන් කර්මය සිදු කරන කුශලාකුශල චේතනාව කායසංඛාර නම් වේ. මලක් පුදන තැනැත්තා එය සිදු කරනුයේ මල අතින් ගෙන පූජාසනයෙහි තැබීමෙනි. අතේ උපකාරය නැතිව මල් පිදීමේ චේතනාවට පමණක් එය නො කළ හැකි ය. එබැවින් අතින් ගෙන මල් පුදන්නා වූ කුශල චේතනාව කාය සංඛාරයකි. සතකු මරන තැනැත්තා එය කරනුයේ අතින් හෝ අතින් ගත් ආයුධයකිනි. ශරීරයේ ආධාරය නැතිව චේතනාවට ම ප්‍රාණවධය නො කළ හැකි ය. එබැවින් සතකු මරන්නා වූ ප්‍රාණඝාත චේතනාව කායසංඛාරයකි. වචනය උපකරණයක් කොට ගෙන එහි ආධාරයෙන් කාර්‍ය්‍යය සිදු කරන චේතනාව වචීසංඛාර නම්. කථා කිරීමේ මාර්ගයෙන් ක්‍රියා සිද්ධිය කරන චේතනාවෝ වචීසංඛාරයෝ ය. කයේ හෝ වචනයේ හෝ උපකාරයක් වුවමනා නැති, මෙත් කිරීම් ද්වේෂ කිරීම් ආදි වශයෙන් පවත්නා කුශලාකුශල චේතනාවෝ චිත්තසංඛාරයෝ ය.

මෙසේ අවිද්‍යා ප්‍රත්‍යයෙන් හටගන්නා සංඛාරය දෙයාකාරයකින් දක්වන ලද නමුත් ධර්ම වශයෙන් ඒවායේ වෙනසක් නැත. පුඤ්ඤාභිසංඛාර අපුඤ්ඤාභිසංඛාර ආනෙඤ්ජාභිසංඛාර ය යි කී කල්හි ද සංඛාර සියල්ල ම ගැනෙන්නේ ය. කායසංඛාර වචීසංඛාර චිත්තසංඛාරය යි කී කල්හි ද සංඛාර සියල්ල ම ගැනෙන්නේ ය. ශරීරයේ ආධාරයෙන් ක්‍රියා සිද්ධිය කරන පුඤ්ඤාභිසංඛාර අපුඤ්ඤාභිසංඛාරයෝ කායසංඛාරයෝ ය. කථාකිරීමෙන් ක්‍රියා සිද්ධිය කරන පුඤ්ඤාභිසංඛාර අපුඤ්ඤාභිසංඛාරයෝ වචීසංඛාරයෝ ය. ක්‍රියා සිඩිය සඳහා ශරීරයේ හා කථාවේ ද උපකාරයක් උවමනා නො වන පුඤ්ඤාභිසංඛාර අපුඤ්ඤාභිසංඛාරයන් හා ආනෙඤ්ජාභිසංඛාරයෝ චිත්ත සංඛාරයෝ ය.

Non-commercial distribution

**අවිද්‍යාව නිසා**
**සංස්කාර ඇතිවන සැටි.**

සත්‍යය වසන්නා වූ ස්වභාවයෙන් අවිද්‍යාව අන්ධකාරයක් වැනි ය. කාරණය වරදවා දක්වන්නා වූ ස්වභාවයෙන් පාට කන්නාඩියක් වැනි ය. නිල් කන්නාඩියකින් ලෝකය බලන්නා හට හැම දෙයක් ම නිල් පැහැයට පෙනේ. එමෙන් අවිද්‍යාසහගත සිතින් තමාගේ පඤ්චස්කන්ධය හා බාහිර ලෝකයත් බලන්නා වූ හෙවත් සිතන්නා වූ තැනැත්තාට ඇති සැටියට නොව අවිද්‍යාපටලයේ සැටියට ඒවා අන් ආකාරයකට පෙනේ. දුඃඛ සත්‍යය වසන අවිද්‍යාවෙන් යුක්ත වූ සිතින් තමා ගේ හා අනුන් ගේ ස්කන්ධයන් බලන්නා වූ තැනැත්තා හට, ජාති ජරා ව්‍යාධි මරණාදි ගිනිවලින් වෙළී ඒ ගිනිදැල් මැද ගිනි පෙනෙල්ලක් සේ පවත්නා වූ, කිසිම හරයක් නැත්තා වූ, නිතර ම දුක් ගෙන දෙන්නා වූ පඤ්චස්කන්ධය, පරම සුන්දර දෙයක් ලෙස පෙනෙන්නේ ය. ලෝකයෙහි ඇති ඉතා ම උතුම් දෙය ඉතා ම වටිනා දෙය සැටියට පෙනෙන්නේය. එසේ පෙනීමෙන් ඔහුට ස්වකීය පඤ්චස්කන්ධය කෙරෙහි මහත් ඇල්මක් ඇති වේ. අන්‍ය ඇතැම් පුද්ගලයන්ගේ පඤ්චස්කන්ධයන් පිළිබඳව ද එයට දෙවැනි තරමේ හෝ ඒ තරමේ ම හෝ ඇල්මක් ඇති වේ.

සමුදය සත්‍ය වසන මෝහය අප්‍රහීණ බැවින් ඔහුට ඒ ඇල්ම දුක් ඇතිවීමේ හේතුව බව නො පෙනෙන්නේ ය. ඔහුට පෙනෙන්නේ ඒ ඇල්ම සැපයට හේතුවක් ලෙසය. ඒ ඇල්ම උතුම් කොට ගන්නා වූ තැනැත්තේ සමහරවිට එයින්, “ මම දරුවන්ට ආලය ඇත්තා වූ නෑයන්ට - මිතුරන්ට - රටට - ජාතියට ආලය ඇත්තා වූ කෙනෙක් වෙමිය ” යි තමා ගැන ආඩම්බර ද වෙයි. ආලයක් නැතියවුන් පහත් කොට ද සිතයි. දුඃඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යය ප්‍රතිච්ඡාදනය කරන අවිද්‍යාවෙන් වැසීම නිසා සත්ත්වයා හට ඒ දුක් ගොඩක් වූ පඤ්චස්කන්ධයාගේ පැවැත්ම ම සුවයක් සැටියට පෙනේ.

දුඃඛනිරෝධගාමිනී ප්‍රතිපද ආර්‍ය්‍යසත්‍යය වසන අවිද්‍යාව නිසා සත්ත්වයා හට, ඒ පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුඃඛස්කන්ධය

Non-commercial distribution

පවත්වා ගැනීම සඳහා ද, සුවපත් කරනු සඳහා ද, මතු මතු ද, පඤ්චස්කන්ධය ලැබීම සඳහා ද, කරන්නා වූ ක්‍රියා රාශිය, සැපය ඇතිකර ගැනීමේ මාර්ගය සැටියට පෙනෙන්නේ ය. අවිද්‍යාව නිසා සිදුවන මේ වැරදි හැඟීම් නිසා සත්ත්ව තෙමේ වර්තමාන ස්කන්ධ පඤ්චකය පෝෂණය කිරීම සඳහා ද ආරක්‍ෂා කිරීම සඳහා ද ක්‍රියා කරන්නට වන්නේය. ඒ ක්‍රියා අවිද්‍යාව නිසා ඇතිවන සංස්කාරයෝ ය.

අවිද්‍යාවෙන් මුළා වූ සත්ත්ව තෙමේ තමාගේ පඤ්චස්කන්ධය පෝෂණය කිරීම හා සුවපත් කරනු පිණිස ද, පුත්‍රදාරාදි අන්‍යයන් පෝෂණය කිරීම හා සැපවත් කරනු පිණිස ද, සමහර විට එළුවන්, කුකුළන්, මසුන් ආදි සතුන් මරයි. සමහර විට සොරකම් කරයි. අනුන් අයත් දෑ බලයෙන් ගනියි. වඤ්චා කොට ගනියි. සමහර විට පරදර සේවනය කෙරෙයි. බොරු කියයි. සුරාපානය කරයි. කේලාම් කියා ඔවුනොවුන් බිඳවයි. අහිතයන්ට පරුෂ වචනයෙන් බණී. පලක් නැති කථා කරයි. අනුන් ගේ සම්පතට ආශා කරයි. මිථ්‍යාදෘෂ්ටි ගනී. **මේ අවිද්‍යාව හේතු කොට වර්තමාන ස්කන්ධයන් සම්බන්ධයෙන් අපුඤ්ඤාභි සංඛාරය ඇති වන ආකාරය යි.**

සමහර විට සත්ත්ව තෙමේ මෙලොව යහපත සඳහා දෙවියන් සතුටු කිරීම පිණිස පින් කරයි. අන්‍යයන් සතුටු කිරීම පිණිස ද දනාදි පින්කම් කරයි. ග්‍රහදෝෂාදිය දුරුවන්නට සිතා පින්කම් කරයි. ප්‍රාණඝාතාදියෙන් වැළකෙයි. මෙත් වැඩීම් ආදි භාවනා කෙරෙයි. **මේ වර්තමාන පඤ්චස්කන්ධය සම්බන්ධයෙන් පුඤ්ඤාභිසංඛාරය ඇති වන ආකාරය යි.**

වඩාත් මුළාවට පැමිණි තැනැත්තේ අනාගතයෙහි පොහොසතකු වීමේ සිටුවරයකු වීමේ රජකු වීමේ දෙවියකු වීමේ බ්‍රහ්මයකු වීමේ බලාපොරොත්තුවෙන් සමහර විට සතුන් මරා දෙවියන් පුදයි. බොහෝ සතුන් මරා මහා යාග පවත්වයි. ගෝශීල ගෝව්‍රත කුක්කුරශීල කුක්කුරව්‍රතාදි මිථ්‍යා ශීල ව්‍රතයන් පුරයි. **මේ අනාගතස්කන්ධ සම්බන්ධයෙන් අපුඤ්ඤාභිසංඛාරය ඇති වන ආකාරය යි.**

*Non-commercial distribution*

සද්ධර්ම ශ්‍රවණ සත්පුරුෂ සේවනාදියෙන් දනාදි පින්කම් කොට මතු දෙව් මිනිස් සැප ලැබිය හැකි බව දත් තැනැත්තෝ දෙව් මිනිස් සැප සඳහා දන් දෙති. ප්‍රාණඝාතාදි පාපයෙන් වළකිති. මාපියාදීන්ට සත්කාර කරති. මෛත්‍රී ආදි භාවනා කරති. රූපාරූප බ්‍රහ්ම සම්පත්තිය ගැන ඇසුවෝ ධ්‍යාන භාවනා කරති. **මේ අනාගත ස්කන්ධයන් සම්බන්ධයෙන් අවිද්‍යාව නිසා පුඤ්ඤාභිසංඛාර ආනෙඤ්ජාභිසංඛාර දෙක ඇති වන ආකාරය යි**.

අවිද්‍යාව හේතු කොට සංස්කාර හටගැනේය යි කීමෙන් අවිද්‍යාව සංස්කාරයන්ට ම මිස අනිකකට හේතු නො වන්නේය යි ද, සංස්කාරය ඇතිවන්නේ අවිද්‍යාව නමැති එක ම හේතුවෙනැයි ද නො ගත යුතු ය. සංස්කාරයන් ගෙන් අන්‍ය වූ තවත් බොහෝ ඵල අවිද්‍යාවෙන් ඇති කරනු ලැබේ. සංස්කාරයන් ඇතිවීමට ද අවිද්‍යාවෙන් අන්‍ය බොහෝ හේතු ද ඇත්තේ ය. සංස්කාරාදි ඵල ධර්මයන් ඇතිවීමට තිබිය යුතු සියලු ම හේතු දක්වා පටිච්චසමුප්පාදය දේශනා කළ හොත් එය ඉතා දීර්ඝ වූ ද හුණපඳුරක් සේ අතිශයින් අවුල් වූ ද, ලෙහෙසියෙන් තේරුම් ගත නො හෙන්නා වූ ද දේශනයක් වන්නේ ය. එබැවින් තථාගතයන් වහන්සේ විසින් ප්‍රධාන වූ ද, ප්‍රකට වූ ද, එක් එක් හේතුව බැගින් ගෙන පටිච්චසමුප්පාදය දේශනා කරන ලදී.

පිසන තැනැත්තාය - ලිපය - දරය - ගිනිය - සැළියය යන මේවා බත ඇති වීමේ හේතු ය. පිසන තැනැත්තකු ඇත ද ලිපක් ඇත ද දර ඇත ද ගිනි ඇත ද සැළිය ඇත ද ගොවියා ගොවිකම් කොට සහල් නො නිපදවන ලද නම්, පිසන තැනැත්තා ආදි හේතුන්ට බත ඇති කළ හැකි නො වේ. එබැවින් ගොවියා ගේ ගොවිකම් කිරීම බත ඇතිවීමේ ප්‍රධාන හේතුව බව කිය යුතු ය. එමෙන් සත්පුරුෂ සේවන - අසත්පුරුෂ සේවන - සද්ධර්ම ශ්‍රවණ - අසද්ධර්ම ශ්‍රවණ - යෝනිසෝමනස්කාර - අයෝනිසෝමනස්කාර - වස්තු - ආරම්මණාදි බොහෝ සංස්කාර හේතුන් ඇත ද, අවිද්‍යාව ප්‍රහීණ නම් ඒ හේතුහු සංස්කාරයන් ඉපදවීමට සමත් නො වෙති. තිබිය යුතු අන්‍ය හේතුන් ගෙන් සමහරක් අඩු වුව ද අවිද්‍යාව ඇතහොත් සංස්කාරය ද ඇති වන්නේ ය. එබැවින් අවිද්‍යාව සංස්කාරයන්ගේ ප්‍රධාන හේතුව ද වේ. ප්‍රකට හේතුව ද වේ.

Non-commercial distribution

විඥානාදීන්ගේ හේතුඵල තත්ත්වය ද මෙසේ ම සලකා ගත යුතුය. මෙසේ ප්‍රධාන වූ ද ප්‍රකට වූ ද හේතූන් පමණක් ගෙන දේශනා කරන කල්හි පටිච්චසමුප්පාදය සංක්ෂේප වූ ද නිරවුල් වූ ද ශ්‍රාවකයන්ට පහසුවෙන් තේරුම් ගත හැකි වූ ද දැරියහැකි වූ ද දේශනයක් වන්නේ ය.

අවිද්‍යාව අකුශලයකි. ඒකාන්තයෙන් අනිෂ්ට ඵලයක් ඇති කරන්නකි. කුශලයට විරුද්ධ වූවකි. කුශලයට විරුද්ධ වූ අවිද්‍යාව තමාට සමාන වූ අකුශලයකට මිස තමා හා විරුද්ධ වූ පුණ්‍යාභිසංඛාර ආනෙඤ්ජාභිසංස්කාරයන්ට හේතු වන්නේ කෙසේ ද? යන ප්‍රශ්නය මෙහි දී නැගිය හැකි ය.

ලෝකයෙහි හේතුව වනාහි සැම කල්හි තමාට සමාන වූ තමාට අවිරුද්ධ වූ ඵලයක් ම උපදවන්නක් නො වේ. සමහර විට හේතුව තමාට සම වූ තමාට මිත්‍ර වූ ඵලයක් උපදවයි. සමහර විට තමාට නො සම වූ ද තමාට විරුද්ධ වූ ද ඵලයක් උපදවයි. දුර්වර්ණ වූ ද දුර්ගන්ධ වූ ද අපවිත්‍ර වූ ද මඩින්, වර්ණවත් වූ ද සුගන්ධවත් වූ ද පවිත්‍ර වූ ද පද්මය උපදවයි. දරයෙන් එයම නසන්නා වූ එයට පරම සතුරු වූ ගින්න උපදවයි. එහෙයින් අවිද්‍යාව නිසා එය හා නො සම වූ එයට විරුද්ධ වූ පුණ්‍යාභි-සංඛාරය හා ආනෙඤ්ජාභිසංඛාරය ඇති වේ ය යි කීමෙහි දෝෂයක් නැති බව දත යුතු ය.

මේ පටිච්චසමුප්පාදය අවිද්‍යාව මුල් කොට දේශනා කර තිබෙනුයේ ප්‍රකෘතිවාදීන් කියන ප්‍රකෘතිය මෙන් ද, දේවවාදීන් කියන මැවුම්කාර දෙවියා මෙන් ද, අවිද්‍යාව යම්කිසි හේතුවක් නැතිව ඉබේ ම හටගත් ධර්මයක් නිසා නො වේ. චක්‍රයක් සේ සෑදී තිබෙන ධර්ම සමූහයක් ගැන කියන කල්හි කොතැනකින් වුව ද පටන් ගෙන කිය හැකි ය. පටිච්චසමුප්පාදය ද චක්‍රයක් වී තිබෙන ධර්ම පරම්පරාවකි. එබැවින් එය කොතැනකින් වුව ද පටන් ගෙන නොකිය හැකි නොවේ. පටිච්චසමුප්පාද දේශනා ඇත්තේ ද එකක් ම නොවේ. තථාගතයන් වහන්සේ විසින් **පටිච්චසමුප්පාදය දේශිත සූත්‍ර ධම් නිදානවග්ගසංයුත්තකයේම සිය ගණනෙකි. විභංග පාළියේ ද පටිච්චසමුප්පාද දේශනා බොහෝ ගණනෙකි.** තවත් නොයෙක් තැන්වල නොයෙක් අයුරින්

Non-commercial distribution

පටිච්චසමුප්පාදය දේශනා කර තිබේ. මෙහි දක්වන ලදුයේ විභංගප්‍රකරණයේ එන අවිද්‍යාමූලික ප්‍රතීත්‍යසමුත්පාදයකි.

ප්‍රතීත්‍යසමුත්පාදංගයන් අතුරෙන් අවිද්‍යා - තෘෂ්ණා දෙක මූල ධර්ම දෙකකි. ප්‍රධාන ධර්ම දෙකකි. සුරාපානයෙන් මත් වූ තැනැත්තා විසින් තමාට අහිත වූ දෑ කරන්නාක් මෙන් අවිද්‍යාවෙන් මූඪ වූ සත්ත්ව තෙමේ තමාට අහිත වන්නා වූ ද ප්‍රාණඝාතාදි පාපකර්මයන් කරන බැවින් අවිද්‍යාව දුර්ගතිගාමී කර්මයට විශේෂ හේතුවක් වේ. භවතෘෂ්ණාවෙන් මඩනා ලද සත්ත්ව තෙමේ මතු සුගතියෙහි ඉපදීමට පින් කරන බැවින් තෘෂ්ණාව සුගතිගාමී කර්මයට විශේෂයෙන් හේතුවෙයි. මෙසේ දුර්ගති - සුගතිගාමී කර්මයන්ට විශේෂයෙන් හේතු වන බැවින් අවිද්‍යා තෘෂ්ණා දෙක මූල ධර්ම දෙකකැ යි ද ප්‍රධාන ධර්ම දෙකකැ යි ද කියනු ලැබේ.

අවිද්‍යා - තෘෂ්ණා දෙක මෙසේ මූල ධර්ම වශයෙන් හා ප්‍රධාන ධර්ම වශයෙන් සැලකිය යුතු බැවින් තථාගතයන් වහන්සේ සමහර තැනක දී අවිද්‍යාවෙන් පටන් ගෙන ද, සමහර තැනක දී තෘෂ්ණාවෙන් පටන් ගෙන ද, පටිච්චසමුප්පාදය දේශනා කළ සේක. එයින් අවිද්‍යාවේ හෝ තෘෂ්ණාවේ අහේතුක බවක් හෝ ලෝක-යෙහි මුලින් ම ඇති වූ බවක් හෝ අදහස් කරනු නො ලැබේ. ඒවා සංස්කාරාදීන් මෙන් ම· හේතුවෙන් හට ගන්නා ධර්මයෝ ය. මේ සංසාර චක්‍රය සිඳ දුකින් මිදී නිවනට පැමිණීමට කළ යුත්තේ ද අවිද්‍යා තෘෂ්ණා දෙක ප්‍රහාණය කිරීම ය. ඒ දෙක ප්‍රහාණය කළ කල්හි සංසාර චක්‍රය සිඳේ. එය ද ඒ දෙක මුල් කොට දේශනා කිරීමේ එක් කාරණයකි.

## සංඛාරපච්චයා විඤ්ඤාණං

**“තත්ථ කතමං සංඛාරපච්චයා විඤ්ඤාණං? චක්ඛු-විඤ්ඤාණං, සෝතවිඤ්ඤාණං, ඝාණවිඤ්ඤාණං, ජිව්හාවිඤ්ඤාණං, කායවිඤ්ඤාණං, මනෝවිඤ්ඤාණං ඉදං වුච්චති සංඛාරපච්චයා විඤ්ඤාණං.”**

යනුවෙන් විභංග පාළියෙහි චක්ඛුවිඤ්ඤාණය, සෝත-විඤ්ඤාණය, ඝාණවිඤ්ඤාණය, ජිව්හාවිඤ්ඤාණය, කායවිඤ්ඤාණය,

Non-commercial distribution

මනෝවිඤ්ඤාණය යන මේ සය සංස්කාර හේතුවෙන් හටගන්නා වූ විඤ්ඤාණය යි දක්විණ. 'විඤ්ඤාණය' යනු දැනීම හෙවත් සිත ය. සයක් වූ විඤ්ඤාණයන්ගෙන් චක්ඛුවිඤ්ඤාණයට පෙනීම ය යි ද, සෝතවිඤ්ඤාණයට ඇසීම ය යි ද කියනු ලැබේ. විඤ්ඤාණය සාමාන්‍යයෙන් එකක් වුව ද කුශලාකුශලාව්‍යාකෘත වශයෙන් තෙවැදෑරුම් වේ. එයින් මෙහි ගනු ලබනුයේ අව්‍යාකෘත විඤ්ඤාණය යි. එ ද විපාක ක්‍රියා වශයෙන් දෙවදෑරුම් වේ. මෙහි ගනු ලබනුයේ විපාක විඤ්ඤාණය යි.

චතුරාර්‍ය්‍ය සත්‍යය නො දැනීම වූ අවිද්‍යාව නිසා සංස්කාර සංඛ්‍යාත කුශලාකුශල කර්මයන් රැස් කළ තැනැත්තා මළ කල්හි එයට අනතුරුව ම එළඹ සිටි කර්මයක් හේතු කොට ඒ කර්මයට අනුරූප වන පරිදි යම්කිසි ස්ථානයක මනෝවිඤ්ඤාණයක් පහළ වේ. භවයක දී පළමුවෙන් ම පහළ වන ඒ මනෝ විඤ්ඤාණයට ප්‍රතිසන්ධි විඤ්ඤාණය යි කියනු ලැබේ. එය පහළ වීමෙන් සත්ත්වයා දෙවන භවයට පැමිණියේ ය යි ද දෙවන භවයෙහි උපන්නේ ය යි ද කියනු ලැබේ. අතීත කර්ම හේතුවෙන් අන් තැනක විඤ්ඤාණයක් පහළ වීමෙන් සිදු වන සත්ත්වයාගේ නැවත නැවත ඉපදීම, අවබෝධ කර ගැනීමට ඉතා දුෂ්කර වූ - ගැඹුරු වූ කරුණකි. පටිච්චසමුප්පාදය ද ඉතා ගැඹුරු ධර්මයකි.

එක් දවසක් **ආනන්ද** ස්ථවිරයන් වහන්සේ තථාගතයන් වහන්සේ වෙත ගොස් "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! මේ ප්‍රතීත්‍යසමුත්පාදය ඉතා ගැඹුරුය, ඉතා ගැඹුරු සේ පෙනෙන්නේ ය. ස්වාමීනි! ආශ්චර්‍ය්‍යයෙකි. මට නම් එය නො ගැඹුරු දෙයක් සේ පෙනේය" යි සැල කළ සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ **"මා හෙවං ආනන්ද! අවච, මා හෙවං ආනන්ද! අවච"** යනුවෙන් "ආනන්ද! එසේ නො කියව" යි දෙවරක් ම වළක්වා, "ආනන්දය! මේ පටිච්චසමුප්පාදය ගැඹුරු ම ය. ගැඹුරක් සේ ම පෙනෙන්නේ ය. මේ ධර්මය අවබෝධ කර ගත නුහුණු බැවින් සත්ත්වයෝ අවුලෙන් අවුලට පත්ව, දුර්ගතිය ඉක්මවිය නො හැකිව, සසර ඉක්මවිය නො හැකිව සිටිති" යි වදාළ සේක.

මෙසේ ගැඹුරු වූ පටිච්චසමුප්පාදයෙහි ද මෙය ඉතා ගැඹුරු තැන ය. විමසන්නා වූ තැනැත්තා හට ලෙහෙසියෙන්

Non-commercial distribution

නො වැටහෙන කරුණකට, ගැඹුරු කරුණ ය යි කියනු ලැබේ. සත්ත්වයා නැවත උපදී ද? නැතහොත් මරණයෙන් කෙළවර වේ ද යි සිතන්නකුට නැවත නැවත උපදනා බව ලෙහෙසියෙන් දැකිය හැකි නො වේ. මෙය ඉතා ගැඹුරු කරුණකැ යි කියන ලදුයේ එහෙයිනි.

ලෝකයෙහි කලාතුරකින් කෙනකුට තමන් ගේ අතීත ජාතිය සිහි කළ හැකි ශක්තියක් උත්පත්තියෙන් ම ලැබේ. ඔවුනට එයින් ම නැවත නැවත උත්පත්තියක් ඇති බව දනේ. සමහරුන්ට තමන් ගේ කාලක්‍රියා කළ ඥතීහු අමනුෂ්‍යයන් වී පැමිණ කරදර කරන්නට පටන් ගනිති. සමහරුන්ට උපකාර කරන්නට ද පටන් ගනිති. එවැනි සිදුවීම් ඇති වූවන්ට ඒවායින් සත්ත්වයා ගේ නැවත උත්පත්තිය ඇති බව පැහැදිලි වේ. ධ්‍යාන භාවනා කොට පූර්වේනිවාසානුස්මෘති ඥාන, පරචිත්තවිජානන ඥානාදි විශේෂ ඥානයන් ලබා ගත් යෝගීන්ට නැවත උත්පත්තිය ප්‍රත්‍යක්ෂ වශයෙන් ම පෙනේ. සියල්ල දත් ලොවුතුරා බුදුවරයන් වහන්සේලා ගේ දිවැසට එය මැනවින් පෙනේ.

එබැවින් :–

**"සෙය්‍යථාපි භික්ඛවේ! ද්වේ අගාරා සද්වාරා තත්ථ චක්ඛුමා පුරිසෝ මජ්ඣෙ ඨිතෝ පස්සෙය්‍ය, මනුස්සේ ගේහං පවිසන්තේපි නික්ඛමන්තේපි අනුසඤ්චරන්තේපි අනුවිචරන්තේපි. ඒවමේව ඛෝ අහං භික්ඛවේ! දිබ්බේන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකේන සත්තේ පස්සාමි, චවමානේ උප්පජ්ජමානේ හීනේ පණීතේ සුවණ්ණේ දුබ්බණ්ණේ සුගතේ දුග්ගතේ යථාකම්මූපගේ සත්තේ පජානාමි"**

යනු වදරන ලදී. "එකිනෙකට මුහුණ ලා පිහිටි ගෙවල් දෙකක මැද, බලා සිටින්නා වූ ඇස් ඇති පුරුෂ තෙමේ ඒ ගෙවල් දෙකට ඇතුළු වන්නා වූ ද, ඒවායින් පිට වන්නා වූ ද, ඒ ගෙයින් මේ ගෙට යන්නා වූ ද, මේ ගෙයින් ඒ ගෙට යන්නා වූ ද, මිනිසුන් යම් සේ දකී ද, මහණෙනි! එ පරිද්දෙන් ම මම මිනිසුන් ගේ ඇස ඉක්ම සිටියා වූ පිරිසිදු වූ දිවැසින්, මැරෙන්නා වූ ද උපදනා වූ ද උසස් වූ ද පහත් වූ ද මනා වර්ණ ඇත්තා වූ ද දුර්වර්ණ වූ ද සුගතියට ගියා වූ ද දුගතියට ගියා වූ ද කර්මය වූ පරිද්දෙන් ඒ ඒ තැනට ගිය සත්ත්වයන් දකිමි" යනු එහි තේරුම යි. සැම

Non-commercial distribution

දෙනාට ම නො දැනෙන නො පෙනෙන මෙ බඳු ගුප්ත කරුණු සාමාන්‍ය ජනයා විසින් ස්වකීය ශාස්තෘවරයා කෙරෙහි විශ්වාසය තබා පිළිගත යුතු ය. වෙන කරන්නට දෙයක් ඔවුනට නැත.

"අනුන්ට පෙනෙන දැනෙන යමක් ඇති නම් ඒ සියල්ල තමන්ටත් පෙනෙන්නට - දැනෙන්නට ඕනෑය" යන පුහු මානය නිසා ඇතැමෙක් ශාස්තෘන් වහන්සේ කෙරෙහිදු විශ්වාසය තබන්නට අකමැති වෙති. ඔවුහු තමනට නො පෙනෙන බැවින් ම පුනරුත්පත්තියක් නැතය යි මිසදිටු ගනිති. ලෝකයට ශාස්තෘවරයන් ගුරුවරයන් වුවමනා වන්නේ සැම දෙනා විසින් ම සියල්ල නො දැකිය හැකි හෙයිනි. තමනට නො පෙනෙන අනුන් ගේ කීම් අසා දතයුතු මෙබඳු කරුණු සම්බන්ධයෙන් සැක ඇතිවීම නම් නො වැළැක්විය හැකි කරුණකි. ඒ සැකය එතරම් අනර්ථ දයක නො වේ. සැකයෙන් පමණක් නො නැවතී තමාට නො දැනෙන - නො පෙනෙන කරුණු එ පමණකින් ම ප්‍රතික්ෂේප කිරීම අනුවණ කමෙකි. මෙ බඳු කරුණු දැනීමට බොහෝ වෙහෙසී ලබාගත යුතු විශිෂ්ට ඥානයක් වුවමනා වෙතත්, 'නැතය' යි ප්‍රතික්ෂේප කිරීමට වුවමනා, මානයත් මෝඩකමත් පමණෙකි.

සත්ත්වයන්ගේ නැවත නැවත උත්පත්තියක් ඇතය යන බුදුන් වහන්සේගේ වචනය ගෞරවයෙන් පිළිගෙන ලෝකය දෙස බලන්නාහට එය සත්‍ය බවට නොයෙක් විට නොයෙක් සාක්ෂ්‍ය ලෝකයෙන් ලැබේ. ඒවායින් ඔහුගේ සැකය දුරු වේ. බුදුන් වහන්සේගේ වචනයට ගරු නො කර තමාට නො පෙනෙන නො දැනෙන පමණින් ම මතු ඉපදීමක් නැතය යන උච්ඡේද දෘෂ්ටිය ගෙන එහි පිහිටා ලෝකය දෙස බලන්නා වූ තැනැත්තාහට පෙනෙනුයේ මතු උත්පත්තියක් නැති බවට සාක්ෂ්‍යයෝ ම ය. ඇති බවට ඇති සාක්ෂ්‍යවලින් එකකුදු ඔහුට නො පෙනේ. එය සිතේ ඇති එක්තරා ගුප්තස්වභාවයකි. ඒ ස්වභාවය නිසා වරක් උච්ඡේද දෘෂ්ටිය ගත් තැනැත්තා එය තව තවත් දැඩි කොට ගන්නේය.

"අනුන් කියනු ඇසූ පමණින් ම යමක් නො පිළිගෙන තමන් ගේ නුවණින් ද විමසා, සත්‍යය යි වැටහුණ හොත් පමණක් පිළිගත යුතු ය" යනු යහපත් උපදෙසක් වන නමුත් එය සැම දෙනා

Non-commercial distribution

ගේ ම කියුම් සම්බන්ධයෙන් හා හැම කරුණක් ම සම්බන්ධයෙන් ද යෙදිය යුත්තක් නොවේ. රෝගියකුට වෛද්‍යවරයා විසින් නියම කළ බෙහෙත ඒ රෝගයට ගුණ වන්නක් ද අගුණ වන්නක් ද ගුණාගුණ දෙක ම නො වන්නක්ද යි විමසා දැන ගෙන ම බෙහෙත වළඳන්නට සිටිය හොත් ඔහුට මිය යන්නට මිස බෙහෙත් වළඳ රෝගය සුව කරගන්නට කලක් නො ලැබෙන්නේ ය. සැම දෙන ම එසේ කරන්නට සිතුව හොත් වෛද්‍යවරයකුට මිස අනෙකකුට බෙහෙතක් වළඳන්නට සිදු නො වන්නේ ය. එමෙන් ශාස්තෲන් වහන්සේගේ වචනය විමසා සත්‍යා සත්‍යතාව අවබෝධ කරගෙන ම ආගම අදහන්නට සිටිය හොත් ශාස්තෲන් වහන්සේ වැනියකුට මිස අනෙකකුට ආගම ඇදහීමට සිදු නො වන්නේ ය.

වෛද්‍යවරයා නියම කරන බෙහෙත විමසා දැන ගෙන වළඳන්නට සිටීම අනුවණ කමක් වන්නාක් මෙන් ම සැම දෙනාට ම නො දැකිය හැකි කරුණක් වූ නැවත නැවත උත්පත්තිය විමසා, තමන් දුටු විටෙක පිළිගන්නට සිටීම අනුවණ කමෙකි. මෙබඳු ගැඹුරු කරුණු සාමාන්‍ය ජනයා විසින් ශාස්තෲවරයා කෙරෙහි විශ්වාසය තබා පිළිගත යුතු ය. ආගමෙහි ශ්‍රද්ධාව උතුම් ධර්මයක් කොට උගන්වන්නේ ද හැම දෙනාට ම හැම දෙය ම නො දැකිය හැකි හෙයිනි. හැම දෙනාට ම හැම දෙය ම දැකිය හැකි නම් ශ්‍රද්ධාවෙන් ඇති වැඩෙක් ද නැත. තමනට නො පෙනෙතත් සත්‍ය වශයෙන් නැවත ඉපදීමක් ඇති බව බුදුන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව පිහිටුවා ගෙන සැම දෙනා විසින්ම පිළිගෙන තම තමන්ගේ දෙලෝ වැඩ සාද ගත යුතු ය.

කවර ආකාරයකින් හෝ දැන නැවත ඉපදීමක් ඇති බව පිළිගන්නවුන්ට ද එය සිදු වන ආකාරය නිවැරදිව දැන ගැනීමට අතිශයින් දුෂ්කර ය. එබැවින් ඔවුන් ගෙන් ඇතැමෙක් ප්‍රාණය නම් වූ දෙයක් ඇති සැටියට සිතින් සලකා ගෙන එය එක් ශරීරයකින් අනෙක් ශරීරයකට යාමෙන් නැවත උත්පත්තිය සිදු වෙතැ යි ගත්හ. ඇතැමෙක් ආත්ම නම් වූ දෙයක් සිතින් මවාගෙන එය එක් ශරීරයකින් අනෙක් ශරීරයකට යාමෙන් නැවත ඉපදීම සිදු වෙතැයි ගත්හ. ඇතැමෙක් නිත්‍යව පවත්නා විඥානයක් සිතින් ඇති කර ගෙන එය එක් ශරීරයකින් තවත් ශරීරයකට යාමෙන්

Non-commercial distribution

නැවත නැවත ඉපදීම වෙතැ යි ගත්හ. මේ ශරීරයෙහි දෙවන භවයකට යන යම්කිසිවක් ඇතය යි ගැනීම ශාශ්වත දෘෂ්ටිය ය. මතු ඉපදීමක් නැතය යි ගැනීම උච්ඡේද දෘෂ්ටිය ය. ශාශ්වත දෘෂ්ටිය උච්ඡේද දෘෂ්ටිය සේ අනර්ත්ථ දයක නොවේ. එය තිබීමෙන් මරණින් මතු සුගතියට යාමට බාධාවක් නො වේ. තථාගතයන් වහන්සේ විසින් දක්වන ක්‍රමය ඒ දෘෂ්ටි දෙකින් එකකට වත් හසු නොවන ක්‍රමයකි. ඒ බැවින් තථාගතයන් වහන්සේ මෙසේ වදළ සේක.

**"සබ්බමත්ථීති ඛෝ කච්චාන! අයමේකෝ අන්තෝ, සබ්බං නත්ථීති අයං දුතියෝ අන්තෝ, ඒතේ ඛෝ කච්චාන! උභෝ අන්තේ අනුපගම්ම මජ්ඣෙන තථාගතෝ ධම්මං දේසේති"**

"**කච්චානය!** සියල්ල ඇතය යන ශාශ්වත දෘෂ්ටිය එක් අන්තයෙක, සියල්ල නැත ය යන උච්ඡේද දෘෂ්ටිය දෙවන අන්තය ය. **කච්චානය!** ඒ අන්ත දෙකට නො ගොස් තථාගත තෙමේ මධ්‍යයෙන් ධර්මය දේශනා කෙරේය" යනු එහි තේරුමයි. තථාගතයන් වහන්සේ විසින් දේශිත ක්‍රමයේ සැටියට වර්තමාන සත්ත්වයාගෙන් කිසි ම කොටසක් අනාගත භවයට නො යන්නේ ය. එහෙත් නැවත ඉපදීම සිදුවන්නේ ය. වර්තමාන භවයෙන් කිසිවක් නො ගොස් සිදුවන්නා වූ ඒ ඉපදීම පහසුවෙන් ම තේරුම් ගත හැකි කරුණක් නොවේ. එය තේරුම් ගැනීමට උත්සාහ කළ යුතු ය. තේරුම් ගත් කල්හි හෙතෙමේ හොඳම බෞද්ධයෙක් වන්නේ ය. අපගේ ශක්තියේ සැටියට මෙහි එය පිළිබඳ විස්තරයක් කරනු ලැබේ.

### පුනරුත්පත්තිය සිදුවන හැටි

සිත ය, කය ය කියා සත්ත්වයකුගේ කොටස් දෙකකි. එයින් සිත, කය ඇසුරු කොට කයෙහි පිහිටා පවත්නකි. කය, සිත නිසා සිතට අනුව පවත්නකි. ඒ දෙකින් සිත යම් කිසි වස්තුවක් නොව ක්‍රියාවකි. එබැවින් සෑම සිතක් ම ඇසිපිය හෙළන්නට ගතවන කාලය පමණ වත් නො පැවතී උපන් සැටියේ ම බිඳෙන්නේ ය. බිඳීමය යි කියනුයේ එහි නැති වී යාමට ය. උපන්නා වූ සිත බිඳෙනු සමග ම "ගලා බස්නා ගංගාවක එක තැනක ජලය පහළට

Non-commercial distribution

බසිනු සමඟ ම සිස් බවක් - අතරක් නො පෙනෙන ලෙස එ තැනට උඩින් තුබූ ජලය පැමිණෙන්නාක් මෙන් '' එ තැනට අලුත් සිතක් පහළ වේ. මෙසේ එකක් බිඳෙනු සමග ම පරතරයක් හෙවත් සිස් කාලයක් නො පෙනෙන ලෙස නැවත සිතක් පහළවීම සිතෙහි ඇති එක්තරා සෘද්ධි විශේෂයකි. එබැවින් සිත් පරම්පරාව දීර්ඝ වූ වැලක් සේ නො සිඳී නිවනට පැමිණෙන තුරු පවතී.

එක් සිතක් නිරුද්ධ වූ පසු එකවර සිත් කීපයක් ඇතිවී අතු බෙදී යන ස්වභාවයක් ද එහි නැත. එබැවින් එක් සත්ත්වයෙක් එක් සත්ත්වයෙක් ලෙස ම සිටිනු මිස කිසි කලෙක බෙදී දෙදෙනෙක් නො වන්නේ ය. නැවත නැවත ජාතියෙන් ජාතිය උපදනා සත්ත්වයා ගේ ශරීරවල එකිනෙකට සම්බන්ධයක් නැත. සිත් පරම්පරාව පමණක් එකක් වේ. මිනිසකු මැරී දෙව්ලොව උපන් කල්හි දෙව්ලොව උපන්නේ ඒ මිනිසා ය කියනුයේ, දැන් ඒ දෙවියා ගේ ශරීරය ඇසුරු කොට පවත්නේ මිනිසා ගේ ශරීරයෙහි පැවති චිත්ත පරම්පරාව ම නිසා ය.

**වර්තමාන ශරීරයෙන් කිසිවක් අනාගත භවයට නො පැමිණ ඉපදීමේ ක්‍රමය** මෙසේය. සත්ත්ව ශරීරයේ හෘදය කෝෂය ඇතුළත පවත්නා ලෙය ඇසුරු කොට පවත්නා වූ විඥාන ධාතුවට ආධාරස්ථානය වන එක්තරා ධාතු කොටසක් ඇත්තේ ය. එයට අභිධර්ම ප්‍රකරණවල වස්තුරූපය යන නම හා හෘදයවස්තුව යන නම ද ව්‍යවහාර කොට තිබේ. ඒ වස්තුරූපය විඥාන ධාතුව සේ ම බිඳි බිඳී නැවත නැවත උපදමින් පරම්පරා වශයෙන් පවත්නකි. හෘදය කෝෂය තුළ නිතර පවත්නා ලෙයක් නැත. නිතර ම එක් තැනකින් ලෙය එයට ඇතුළු ව තවත් තැනකින් බැහැර ව යන්නේ ය. එහෙත් හෘදය රූපය යි කියන ලද ධාතු විශේෂය හෘදය කෝෂයෙහි වූ ලෙය සමඟ ම පවතිනවා මිස ඉන් බැහැර වන ලෙය හා එක් වී පිට වී නොයයි. එබැවින් වස්තුරූපය හෘදය කෝෂය තුළ ම පවත්නේ ය යි කියනු ලැබේ. සත්ත්වයා ගේ සිත් පරම්පරාව පවත්නේ ඒ වස්තුරූපයෙහි ය.

හෘදය කෝෂය වනාහි පරණ ලෙය බැහැර කරනු පිණිස හා අලුත් ලේ ගැනීම පිණිස ද නිතර ක්‍රියා කරන්නේ ය. යම් කිසි

Non-commercial distribution

හේතුවකින් හෘදය වස්තුව ක්‍රියා විරහිත වුව හොත් එහි ලෙය විකෘතියට පැමිණේ. ඉන් පසු ඒ ලෙයෙහි විඥන ධාතුවට නිඃශ්‍රය වන හෘදය රූප නම් වූ ධාතු කොටසට නො පැවතිය හැකි වේ. එය අනුක්‍රමයෙන් හීන වී ගොස් අන්තිමට කිසිවක් ඉතිරි නොවී අභාවප්‍රාප්ත වේ. ඉන් පසු ශරීරයේ සිත් ඉපදීමට සුදුසු තැනක් නැති වේ. ඒ ශරීරයෙහි උපදනා අන්තිම සිත නිරුද්ධ වූ කල්හි සත්ත්වයා මළේ ය යි කියනු ලැබේ. හෘදය ක්‍රියා කිරීම නැවතී කොපමණ වේලාවකින් අන්තිම සිතේ නිරෝධය වූ මේ මරණය සිදුවේ ද යන්න නිශ්චය වශයෙන් නො ,කිය හැකි ය. එහෙත් එයට වැඩි කලක් ගත නො වන බව කිය හැකි ය.

හෘදය රූපය ඇසට නො පෙනෙන සියුම් ධාතු විශේෂයකි. එහි ඇති නැති බව නිසා ලෙයෙහි අමුත්තක් ද නො පෙනේ. විඥනයට නිඃශ්‍රය වන දෙයක් මේ ශරීරයෙහි නැති වුව ද, විඥන පරම්පරාවෙහි එක් විඥානයක් නිරුද්ධවීම සමග ම, අතරක් නො දක්වා තවත් විඥනයක් ඉපදීමේ ශක්තිය නො නැසුණු බැවින්, එක් ශරීරයක් ඇසුරු කොට උපදනා අන්තිම විඥනය නිරුද්ධ වනු සමග ම, ඒ පරම්පරාවෙහි ඒ විඥනයට අනතුරු ව ඉපදිය යුතු විඥනය කොහි හෝ යම්කිසි අන් තැනක උපදනේ ය. එක් ශරීරයක අන්තිමට නිරුද්ධ වන විඥනයට **ච්‍යුති චිත්තය** යි ද එයට අනතුරු ව අන් තැනක උපදනා ඒ පරම්පරාවට අයත් චිත්තයට **ප්‍රතිසන්ධි චිත්තය** යි ද කියනු ලැබේ.

සිතක් යම් තැනක උපන හොත් එය එ තැන ම අතුරු දහන් වනු මිස අන් තැනකට නො යේ. මේ ශරීරය ඇසුරු කොට මෙහි පහළ වූ සිත් සියල්ල මෙහි ම නිරුද්ධ ය. ප්‍රතිසන්ධි චිත්තය යි කියනු ලබන අනාගත භවයා ගේ පළමු වන සිත මෙහෙන් නො ගොස් එහි ම පහළ වූවකි. එහෙත් එය මේ භවයේ සිත් පරම්පරාවට ම අයත් ය. සත්ත්වයකු ගේ එක් භවයක සිට අනෙක් භවයකට යාමක් සත්‍ය වශයෙන් නැත ද මේ පරම්පරා සම්බන්ධය නිසා ලෝකව්‍යවහාරයේ සැටියට මේ සත්ත්වයා ම අපායට ගියේය යි ද, දෙව්ලොවට ගියේය යි ද කියනු ලැබේ.

සිත පරම්පරා වශයෙන් නො සිඳී ඇති වන්නේ ය යි කියන ලද නමුත්, සෑම සිතක් ම උපදිනුයේ ඒ ඒ සිත ඇතිවීමට සුදුසු වූ

Non-commercial distribution

හේතුන්ගෙනි. හේතුවකින් තොර ව ඉබේ ම උපදනා එක සිතකුදු සිත් පරම්පරාවෙහි නැත. ප්‍රතිසන්ධි චිත්තය යි කියනු ලබන හවයක ප්‍රථමයෙන් උපදනා විඤ්ඤාණය, සංස්කාරය යි කියන ලද කුශලාකුශල කර්මයන් අතුරෙන් යම්කිසිවක් නිසා උපදින්නකි. එහි පිළිවෙළ මෙසේ ය.

මරණාසන්න සත්ත්වයා ගේ චිත්තසන්තානයට **කර්මය**, **කර්මනිමිත්තය**, **ගතිනිමිත්තය** යන තුනෙන් එකක් එළඹ සිටින්නේ ය. එහි **කර්මය** යනු මැරෙන්නා වූ සත්ත්වයා විසින් ඒ හවයෙහි කළා වූ ද එයට පෙර හවවල දී කළා වූ ද කුශලාකුශල කර්මයෝ ය. මරණාසන්න සත්ත්වයා හට තමා කරන ලද කුශලාකුශල කර්මයන් අතුරෙන් යම්කිසිවක් ඒ අවස්ථාවේ දී සිහි වේ. එය කර්මය එළඹ සිටීම ය.

**කර්මනිමිත්තය** යනු කර්මය සිදු කිරීමට උපකරණ වූ වස්තූන් හා පුද්ගලයෝ ය. සමහර විට මරණාසන්න සත්ත්වයා ගේ සිතට කර්මය එළඹ නො සිට කර්මනිමිත්ත එළඹ සිටින්නේ ය. ප්‍රාණඝාතය කළවුන්ට මරනු ලැබූ සත්තු හෝ ඔවුන් ගේ මස් හෝ ප්‍රාණඝාතයට වුවමනා උපකරණ හෝ එයට සහාය වූ පුද්ගලයෝ හෝ පෙනෙත්. දන්දුන් තැනැත්තා හට ආහාරපානාදි දන වස්තු හෝ ප්‍රතිග්‍රාහකයෝ හෝ සහාය වූ පුද්ගලයෝ හෝ පෙනෙත්. වන්දනා කළ තැනැත්තා හට, විහාර චෛත්‍ය-මල්-පහන් ආදි වස්තු පෙනෙන්නේ ය. ඒවා තමා ගේ සමීපයේ ම තිබීනම් කර්ම නිමිත්ත වශයෙන් ඇසට ම පෙනෙන්නේ ය. පුරාණ කර්මයන් ගේ නිමිති සිහින පෙනෙන්නාක් මෙන් සිතට ම පෙනෙන්නේ ය.

**ගතිනිමිත්තය** යනු කර්මය හේතු කොට මතු උපදින ස්ථානයේ ඇති දෙයකි. සමහර කෙනකුට මරණාසන්නයේ දී ගතිනිමිත්ත පෙනෙන්නේ ය. නරකයේ උපදනා සත්ත්වයනට ගිනිජාලා යමපල්ලු ආදි භයංකර දේ ගතිනිමිත්ත වශයෙන් දර්ශනය වේ. ප්‍රේත ව උපදිනුවන්ට ප්‍රේතයන් ගේ වාසස්ථානාදිය දර්ශනය වේ. මවු කුසයක උපදිනුවන්ට රතුරෙද්දක් සේ ඒ මවු කුසයම දර්ශනය වේ. මේවා දර්ශනය වන්නේ ද සිහින පෙනෙන්නාක් සේ සිතට ය. කලාතුරකින් කෙනකුට ගතිනිමිත්ත ඇසට නො

Non-commercial distribution

පෙනෙන්නේ නො වේ. මරණාසන්නයෙහි මේ තුන අතුරෙන් එළඹ සිටි දෙයක් අරමුණු කරමින් මැරෙන සත්ත්වයා ගේ චිත්ත සන්තතිය පවත්නේ ය.

මේ අවස්ථාවේ අනුශය වශයෙන් පවත්නා වූ අවිද්‍යාව නිසා සත්ත්වයා හට යා යුතු භවයේ ආදීනවය වැසේ. අනුශය වශයෙන් පවත්නා තෘෂ්ණාව නිසා චිත්තසන්තතිය කර්මයට අනුරූප පරිදි පැමිණිය යුතු අභිනව භවය දෙසට බර වේ, හෙවත් නැමේ. මෙසේ මැරෙන සත්ත්වයාගේ චිත්තසන්තතිය (සිත්පෙළ) අභිනව භවයට නැමී බර වී පවත්නා කල්හි, වර්තමාන ශරීරය ඇසුරු කොට උපදනා අවසාන සිත ඉපද නිරුද්ධ වූ පසු ඒ සිත් වැලෙහි එයට අනතුරුව ඉපදිය යුතු සිත, එළඹසිටියා වූ කර්මාදි ආරම්මණය ම අරමුණු කොට කර්මානුරූප පරිදි ඉපදිය යුතු ස්ථානයේ ඒ කර්මය ම විපාකත්වයට පැමිණීම් වශයෙන් උපදනේ ය. ඒ සිත උපන් පසු සත්ත්වයා අභිනව භවයට පැමිණියේ ය යි කියනු ලැබේ.

සත්ත්වයා ගේ සිත් වැලෙහි අතීත භවයට අයත් ශරීරයේ අවසාන වශයෙන් පහළ වූ සිතට ච්‍යුතිචිත්තය යි ද, අභිනව භවයේ ආදියෙහි ම පහළ වූ සිතට ප්‍රතිසන්ධිචිත්තය යි ද කියනු ලැබේ. ප්‍රතිසන්ධිචිත්තය පහළවීම සමග ම හෝ පහළවීමෙන් පසු ක්‍රමයෙන් හෝ කර්මයට හා ඒ ඒ සත්ත්වජාතියට ද අනුරූප වන පරිදි ශරීරයක් ද ඇති වේ. ඒ ශරීරය අතීත ජාතියේ ශරීරය හා සම්බන්ධයක් නැත. සිත පමණක් අතීත ජාතියේ සිත් පරම්පරාවට සම්බන්ධය. ප්‍රතිසන්ධි චිත්තය යි කියන ලද භවයෙහි ප්‍රථමයෙන් පහළවන්නා වූ සිත අන් සිතක් නැති සෑම අවස්ථාවේ ම නැවත නැවත ඉපදීම් වශයෙන් ඒ භවය මුළුල්លෙහි ම පවත්නේ ය. චිත්ත පරම්පරාව නො සිඳී පැවැත්මට එය හේතු වේ. එබැවින් නැවත නැවතත් පහළ වන්නා වූ ඒ සිතට **භවංග චිත්තය** යි කියනු ලැබේ. සත්ත්වයාගේ ප්‍රකෘති සිත එය ය. ඒ සිත ඇති බව දැනගැනීම නම් අපහසු ය.

ශරීරය පහළ වී චක්ෂුරාදි ඉන්ද්‍රියයන් හා රූපාදීන් ගැටුණු කල්හි කුශලාකුශල සංඛ්‍යාත සංස්කාර හේතුවෙන්

Non-commercial distribution

චක්ෂුර්විඥානාදි විඥානයෝ පහළ වෙති. කුශලාකුශල සංඛ්‍යාත සංස්කාරය නැතහොත් සත්ත්වයාගේ චිත්ත පරම්පරාව මරණයෙන් සිඳෙනු මිස අනාගත භවයට නො පැමිණෙන්නේ ය. එබැවින් කර්මයෙන් සත්ත්වයා ඒ ඒ ජාතිවලට පමුණුවනු ලැබේය යි කියනු ලැබේ. කර්මය ඇත ද අවිද්‍යා තෘෂ්ණා දෙක නැතහොත් ඒ කර්මය සත්ත්වයා ඒ ඒ භවයන්ට යැවීමට සමත් නො වේ. අවිද්‍යා තෘෂ්ණාවෝ ද කර්මය නැති කල්හි සත්ත්වයා ඒ ඒ භවයට පැමිණවීමට අපොහොසත් වෙති. එබැවින් කර්ම ඇතත් අවිද්‍යා තෘෂ්ණාවන් ප්‍රහාණය කළ රහත්හු නැවත නූපදිති.

නැවත නැවත උත්පත්තියට අවිද්‍යා - තෘෂ්ණා - කර්ම යන තුන ම බලවත් හේතු ය. එයිනුදු තෘෂ්ණා කර්ම දෙක වඩාත් ප්‍රධාන ය. විඥානයට තෘෂ්ණාව බලවත් හේතුවක් වතුදු, හේතුඵල පරම්පරා ක්‍රමයක් දක්වන මේ ප්‍රතීත්‍ය සමුත්පාද දේශනයෙහි තෘෂ්ණාවේ විඥාන හේතුත්වය දක්වන්නට ගිය හොත් දේශනා ක්‍රමය අවුල් වන බැවින් මෙහි විඥාන හේතුත්වයෙන් තෘෂ්ණාව නො ගන්නා ලදී. මේ එක් දේශනා ක්‍රමයකි. **ආර්‍ය්‍යසත්‍ය දේශනාවෙහි වනාහි සත්ත්වයා ගේ නැවත නැවත ඉපදීමේ හේතුව වශයෙන් දක්වා තිබෙන්නේ කර්මය නොව තෘෂ්ණාව ය**. ඒ එක දේශනා ක්‍රමයකි. ක්‍රම දෙක අවුල් කර නො ගෙන වෙන් වෙන් වූ ක්‍රම දෙකක් සැටියට සලකා ගත යුතු ය.

මිනිසෙක් මැරී දෙවියෙක් ව උපන්නේය යි කියන කල්හි මනුෂ්‍ය ශරීරයෙන් කිසිවක් නො ගොස් දෙව්ලොව උපන් දෙවියා ඒ මිනිසාම ද? නැතහොත් අනෙකෙක් ද? යනු මෙහිදී නැගිය හැකි ප්‍රශ්නයකි. මිනිසා ගේ ශරීරයෙන් පැමිණි කිසිවක් ඒ දෙවියා ගේ සන්තානයෙහි නැති බැවින් දෙවියා මිනිසා ද නො වේ. දෙවියා ගේ ශරීරය ඇසුරු කරමින් පවත්නේ මිනිසා ගේ ශරීරය ඇසුරු කරමින් පෙර පැවති සිත් පරම්පරාව ම බැවින් දෙවියා ඒ මිනිසා ගෙන් අනෙකෙක් ද නොවේ.

සත්‍ය වශයෙන් ලැබෙන සත්ත්වයාය කියා දෙයක් නැත. එය නාමරූප පරම්පරාවන්ට ම ව්‍යවහාර කරන නමකි.

Non-commercial distribution

මනුෂ්‍යයකු ගේ සන්තානයෙහි ඉපදීමේ පටන් මරණය දක්වා නො නැසී පවත්නා කිසිම දෙයක් නැත. ඇත්තේ චිත්ත චෛතසික පරම්පරාවක් හා රූප පරම්පරාවෙකි. ඒ පරම්පරාව පරම්පරාවක් බව නො පෙනෙන නිසා සිතින් එකක් කොට වරදවා ගෙන කලක් ජීවත් වන මනුෂ්‍යයෙක් හෙවත් සත්ත්වයෙක් ඇතය යි සලකනු ලැබේ. චිත්ත චෛතසික පරම්පරාව හා රූප පරම්පරාවක් මිස සත්ත්වයෙක් කියා කලක් පවත්නා දෙයක් නැති බව තේරුම් ගතහොත් මේ සත්ත්වයා ම ජාතියෙන් ජාතියට යන්නේ ද? නො යන්නේ ද? වර්තමාන භවයෙන් කිසිවක් නො ගොස් අනාගත භවයෙහි අලුතෙන් ම උපන් සත්ත්වයා අතීත ජාතියේ විසූ සත්ත්වයා ද? අනෙකෙක් ද? යන මේ ප්‍රශ්න ලෙහෙසියෙන් ම විසඳෙන්නේ ය. මෙය පිළිබඳව අවුල ඇති වන්නේ සත්‍ය වශයෙන් නැති සත්ත්වයකු මේ නාමරූප පරම්පරාවට ආරූඪ කරගෙන එයට අනුව සිතීම නිසා ය.

එක් මිනිස් ජීවිතයක අවස්ථා බොහෝ ගණනක් ඇත්තේ ය. එයින් ළදරු අවස්ථාවය, තරුණ අවස්ථාවය, මහලු අවස්ථාවය යන තුන ප්‍රධාන අවස්ථාවෝ ය. ළදරුවකු තරුණයකු වූ කල්හි තරුණයාට ඇත්තේ ළදරු ශරීරයට වඩා සර්වප්‍රකාරයෙන් වෙනස් වූ ශරීරයකි. දැන් ඔහුට ළදරු ශරීරයක් නැත. ඔහු ගේ සිතුම් පැතුම් ඕනෑ එපා කම් ළදරු සිතුම් පැතුම් ඕනෑ එපාකම් වලට සර්වප්‍රකාරයෙන් වෙනස් ය. ඔහුට දැන් ළදරු සිතුම් පැතුම් ඕනෑ එපාකම් ඇත්තේ ම නැත. වයස අවුරුදු අසූවක් අනූවක් වී තරුණයා මහලු වූ කල්හි ඔහුට ඇත්තේ තරුණ ශරීරයට සර්වප්‍රකාරයෙන් වෙනස් ශරීරයකි. ඔහුට ඇත්තේ ළදරුවාගේ ද තරුණයාගේ ද සිතුම් පැතුම් ඕනෑ එපාකම් වලට සර්වප්‍රකාරයෙන් වෙනස් වූ සිතුම් පැතුම් ඕනෑ එපාකම් ය.

ශරීරයෙන් හා සිතුම් පැතුම්වලින් ඔවුනොවුන්ට සර්වප්‍රකාරයෙන් වෙනස් වූ බාලයාය - තරුණයාය - මහල්ලාය යන මේ තිදෙනා එක්කෙනෙකැ යි කියත හොත් ළදරුවාට ම තරුණයාය යි ද, මහල්ලාය යි ද, කියන්නට වීමෙන් මහ අවුලක් ද වනු ඇත. ළදරුවාය තරුණයාය මහල්ලාය යන තිදෙනා එක් කෙනකු

Non-commercial distribution

නොව තිදෙනෙකැ යි කියතහොත් ළදරුවා ගේ අයිතිවාසිකම් හා නැකම් තරුණයාට අහිමි වන්නේ ය. තරුණයා ගේ අයිතිවාසිකම් නැකම් මහල්ලාට අහිමි වන්නේ ය. එයින් ද වන්නේ මහ අවුලකි.

බාලයා ගේ ශරීරයේ රූපකලාප (කුඩා කොටස්) නැති වෙවී ඒවා වෙනුවට මදක් මේරූ රූප පහළ වන්නේ ය. ඒවා ද නැති වී, ඒවාට වඩා මදක් මේරූ රූප පහළ වන්නේ ය. මෙසේ වාර බොහෝ ගණනක් වූ පසු බාලයා තරුණයෙක් වෙයි. බාල කල පැවති රූපයන් ගෙන් අල්පමාත්‍රයකුදු තරුණ ශරීරයේ නැත. සිතුම් පැතුම් නැති බව ගැන කියනු ම කිම? බාලයා ගේ බාල ශරීරය තිබිය දී නම් ඔහුට කිසි කලෙක තරුණයකු නො විය හැකි ය. තරුණ ශරීරය පසු කලකදී ඇති වූවක් බැවින් ද බාලයා ගේ ශරීරයෙන් කිසිවක් ඉතිරි ව තරුණ ශරීරයට එකතු වී නැති බැවින් ද, තරුණයා බාලයා ගෙන් අනෙකෙකැ යි ද, තරුණ ශරීරයේ රූප බාල ශරීරයේ රූපයන් ගේ පරම්පරාවට අයත් වන බැවින් තරුණයා බාලයාගෙන් අනෙකෙක් නො වේ ය යි ද කිය යුතු ය. මෙසේ ගත් කල්හි බාලයා හා තරුණයා ඒකත්වයෙන් ගැනීමෙන් වන අවුල ද නො වන්නේ ය. අනේකත්වයෙන් ගැනීමෙන් වන අවුල ද නො වන්නේ ය.

එසේ ම මිනිසා දෙවියකු වූ කල්හි මිනිසා ගේ සිරුරෙන් දෙව් ලොවට ගිය දෙයක් දෙවියා කෙරෙහි නැති බැවින් දෙවියා මිනිසා ගෙන් අනෙකෙකැයි ද, දෙවියා ඇති වූයේ මිනිසා ගේ සිත් පරම්පරාවෙන් බැවින් ඔහු මිනිසා ගෙන් අනෙකෙක් නොවේ ය යි ද ගත් කල්හි කිසිදු අවුලක් නො වන්නේ ය. බාලයා ගේ අයිතිකම් නැකම් තරුණයාට හිමි වන්නාක් මෙන් ද, තරුණයාගේ අයිතිකම් නැකම් මහල්ලාට හිමි වන්නාක් මෙන් ද, මිනිසා ගේ පින් පව් දෙවියාට හිමි වන්නේ ය. අනෙකකු ගේ පින් පව් වල ඵලය අනෙකකුට වන්නේ ය යන්නක් කිය යුතු නො වන්නේ ය.

## විඤ්ඤාණපච්චයා නාමරූපං

**"තත්ථ කතමං විඤ්ඤාණපච්චයා නාමරූපං? අත්ථි නාමං, අත්ථි රූපං, තත්ථ කතමං නාමං? වේදනාක්ඛන්ධෝ, සඤ්ඤාක්ඛන්ධෝ, සංඛාරක්ඛන්ධෝ ඉදං වුච්චති නාමං, තත්ථ**

Non-commercial distribution

**කතමං රූපං? චත්තාරෝ ච මහාභූතා චතුන්නඤ්ච මහා භූතානං උපාදය රූපං. ඉදං වුච්චති රූපං. ඉති ඉදඤ්ච නාමං ඉදඤ්ච රූපං ඉදං වුච්චති විඤ්ඤාණපච්චයා නාම රූපං."**

යන විභංග පාඨයෙන් වේදනාස්කන්ධය සංඥස්කන්ධය සංස්කාරස්කන්ධය යන මේ ස්කන්ධ තුන නාමය යි ද, සතර මහා භූතයන් හා ඒවා නිසා පවත්නා රූප ද යන මෙය රූපය යි ද, මේ නාමය හා රූපය විඥන හේතුවෙන් හටගන්නා නාමරූපය යි ද දක්විණ.

එක් සත්ත්වයකුට නාමකාය ය, රූපකාය ය යි දෙ කයක් ඇත්තේ ය. සත්ත්වයා අයත් චිත්ත චෛතසික පරම්පරාවට නාමකාය යයි කියනු ලැබේ. ඇසට පෙනෙන්නට තිබෙන ශරීරයට රූපකාය ය යි කියනු ලැබේ. චිත්ත චෛතසික පරම්පරාවට නාම ය යි කියනුයේ ශරීරය සේ ඇසින් බලා හෝ අතින් අල්ලා හෝ දත හැක්කක් නොව, නම අසා නමට අනුව ම දත යුතු බැවිනි. නාමය ස්කන්ධ වශයෙන් වේදනාස්කන්ධය, සංඥස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥන ස්කන්ධය යි සතරක් වේ. විඥනස්කන්ධය හැර ඉතිරි ස්කන්ධ තුන විඥනය නිසා හටගන්නා නාමය යි. රූපය භූතරූපය උපාදයරූපය යි දෙ වැදෑරුම් වේ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ප්‍රධාන රූප සතර භූත රූප නම් වේ. ඒ රූප සතර නිසා පවත්නා වූ වර්ණ ගන්ධ රසාදි අප්‍රධාන රූප සූවිස්ස උපාදය රූප නම් වේ. රූප සියල්ල ම අට විස්සකි.

රූප කය පාලනය කරනු ලබන්නේ නාම කයිනි. නාම කය නැති වුව හොත් රූප කයෙන් වැඩෙක් නැත. එය වළලා දැමිය යුත්තක් වේ. එ බැවින් දෙකයින් නාම කය ප්‍රධාන වේ. නාම කයට අයත් ස්කන්ධ සතරෙන් ද විඥනස්කන්ධය ප්‍රධාන වේ. වේදනාදි චෛතසික ස්කන්ධ තුන විඤ්ඤාණ ස්කන්ධය නිසා පවත්නා බැවින් අප්‍රධාන ය. අඳුරු තැනෙක පහනක් දල්වූ කල්හි ගින්න පහළ වනු සමග ම ඒ ගින්න නිසා අවට උණුසුමක් හා ආලෝකයක් ද පහළ වන්නාක් මෙන් අතීත කර්ම හේතුවෙන් විඥන සංඛ්‍යාත ප්‍රධාන ධර්මය පහළ වන කල්හි එය හා බැඳී චෛතසික සංඛ්‍යාත නාමයෝ ද පහළ වෙති. ඒ නාමයන් නිසා විඥනය

Non-commercial distribution

විසිතුරු වේ. අරූප ලෝකය හැර අන් තැන්වල ඒ ඒ භවයට අනුරූප වන පරිදි විඥනයා ගේ පිහිටීමට හා පැවැත්මට ද වර්ධනයට ද උපකාරවන රූපයෝ ද ඒ විඥනය නිසා පහළ වෙති.

චක්ෂුර්විඥනාදීන් ගේ වශයෙන් සවැදෑරුම් වූ විඥනය පහළ වී පරම්පරා වශයෙන් වැඩෙන කල්හි, ගසක් වැඩෙන කල්හි එයට අනුව පෙර නො තුබූ බොහෝ අතු රිකිලි කොළ මල් අලුතෙන් ඇති වන්නාක් මෙන් සිතට අනුව එය හා බැඳී බොහෝ චෛතසික ධර්මයෝ පහළ වෙති. යම්කිසි වස්තුවක් හෝ පුද්ගලයකු දැකීම චක්ෂුර්විඥනය ඉපදීම ය. දක්නා ලද්ද සුන්දර දෙයක් නම් දුටු තැනැත්තා හට එයින් ආස්වාදයක් ඇති වේ. සතුටක් ද ඇති වේ. එය ම හෝ එබඳු අනෙකක් ලබා ගැනීමේ ආශාව ඇති වේ. නැවත නැවත දැකීමේ ආශාව ඇති වේ. සමහර විට එය අනුන් අයිති දෙයක් වී නම් තමාට අයිති කර ගැනීමේ ආශාව ඇති වේ. එය අනුන්ට අයිති ව තිබීම නො ඉවසිය හැකි ස්වභාවයක් හෝ ඇති වේ. එනම් ඊර්ෂ්‍යාව ය. එය තමා ගේ දෙයක් නම් අනුන්ට අයිති වීමට හෝ අනුන් ප්‍රයෝජන ලබනවාට හෝ නො කැමති බවක් ඇති වේ. එය මාත්සර්‍ය්‍ය යි. සමහර විට ඒ දක්නා ලද්ද නිසා තමා උසස් කොට ගැනීමක් ද ඇති වේ. සමහර විට එය කරණකොට ගෙන අනුන් පහත් කොට හෝ සම කොට ගැනුමක් ද ඇති වේ. සමහර විට මුළාවක් ද ඇති වේ. සමහර විට එබඳු දෑ ලැබීමට ක්‍රියා කිරීම පිළිබඳ වූ ද, ලැබූ දෑ ආරක්ෂා කිරීම පිළිබඳ වූ ද වීර්‍ය්‍යයක් ඇති වේ. සමහර විට දක්නා ලද වස්තුවේ තත්ත්වය දක්නා ඥනය ඇති වේ. දක්නා ලද්ද නො මනා දෙයක් වී නම් එය පිළිබඳ ව නො සතුටක් ඇති වේ. සමහර විට පිළිකුලක් හෝ බියක් ඇති වේ. සත්ත්වයන් පුද්ගලයන් දක්නා කල්හි දක්නා ලද තැනැත්තා ප්‍රියංකර වූ පුද්ගලයකු වී නම් එකල්හි සතුට ඇති වේ. ආදරයක් ද ඇති වේ. සමහර විට රාගය ඇති වේ. සමහර විට ශ්‍රද්ධාව ද කරුණාව ද මෛත්‍රිය ද ප්‍රඥව ද වීර්‍ය්‍ය ද ඇති වේ. දක්නා ලද තැනැත්තා සතුරකු වී නම් ක්‍රෝධය හෝ බිය හෝ ඇති වේ. අශෝභන පුද්ගලයකු වී නම් පිළිකුලක් ඇති වේ. මෙසේ චක්ෂුර්විඥනය ඇති වූ කල්හි එය නිසා බොහෝ චෛතසික ධර්මයෝ උපදිති. ශ්‍රෝත විඥනාදි පස නිසා ද මෙසේ බොහෝ

Non-commercial distribution

චෛතසික ධර්මයන් උපදනා සැටි කියන ලද්දට අනුව සලකා ගත යුතු ය. මේ විඥානය නිසා නානාප්‍රකාර නාමයන් උපදනා ආකාරය යි.

**විඥානය නිසා රූපයන් උපදනා පරිදි මෙසේ දත යුතු ය. අණ්ඩජ ය, ජලාබුජ ය, සංසේදජ ය,ඕපපාතික ය යි** සත්ත්ව ජාති සතරෙකි. පක්ෂි සර්ප මත්ස්‍යාදි බිජුවටින් උපදනා සත්ත්වයෝ අණ්ඩජ සත්ත්වයෝ ය. මව්කුස වැදෑමස ය යි කියන සම් කොපුවෙහි උපදනා මනුෂ්‍ය ගව මහිෂාදි සත්ත්වයෝ ජලාබුජ සත්ත්වයෝ ය. කුණුමස් කුණුමාලු ආදි ඇතැම් ද්‍රව්‍යයන්හි උපදනා සත්ත්වයෝ සංසේදජ සත්ත්වයෝ ය. කැටපත් ආදියෙහි පහළවන ඡායාවන් මෙන් සර්වාංග ප්‍රත්‍යංග පරිපූර්ණත්වයෙන් පහළ වීම් වශයෙන් උපදනා සත්ත්වයෝ ඕපපාතිකයෝ ය. නරකයෙහි ද නිජ්ඣාමතණ්හික නම් වූ ප්‍රේතයෝනියෙහි ද දිව්‍යබ්‍රහ්ම ලෝකවල ද උපදින්නෝ ඕපපාතික වශයෙන් ම උපදිති. රූපයන් ගේ පහළවීම වනුයේ ඒ ඒ සත්ත්ව යෝනිවල නොයෙක් ආකාරයෙනි.

රූපයන් උපදිනුයේ ද සමූහ වශයෙනි. සමූහයකට සම්බන්ධ නොවී තනි ව රූපයකට නො ඉපදිය හැකි ය. එක් ව උපදින රූප සමූහයන්ට රූප කලාප ය යි කියනු ලැබේ. පඨවිරූපය, ආපෝරූපය, තේජෝරූපය, වායෝරූපය, වර්ණරූපය, ගන්ධරූපය, රසරූපය, ඕජාරූපය යන මේ අට එකිනෙක ගැටී සම්බන්ධ වී එක් පිණ්ඩයක් වී උපදී. ඒ පිණ්ඩයට ශුද්ධාෂ්ටක කලාපය යි කියනු ලැබේ. ඒ රූප අට සියලු ම කලාපයන්හි ඇත්තේ ය. ඒ අටට ජීවිත රූප චක්ෂුඃප්‍රසාද රූප ශ්‍රෝත්‍රප්‍රසාද රූප ඝ්‍රාණප්‍රසාද රූප ජිහ්වාප්‍රසාද රූප කායප්‍රසාද රූපාදීන් ගෙන් ඇතැම් රූප එක්වීමෙන් රූප නවය දශය එකොළොස දෙළොස තෙළෙස බැගින් ඇත්තා වූ කලාපයෝ ද වෙති. තෙළෙසකට අධික රූප ඇති කලාප ද නො ලැබේ. රූපකලාපය ලෝකයේ ඇති ඉතා ම කුඩා දෙය ය. එයට වඩා කුඩා දෙයක් නැත්තේ ය. ලෝකයා විසින් ඉතා ම කුඩා දෙය සැටියට සලකන පරමාණුව රූප කලාපයට වඩා බොහෝ මහත් දෙයකි. පරමාණුවක රූප කලාප බොහෝ ගණනක් ඇත්තේ ය. සත්ත්ව ශරීරය හටගන්නේ මේ රූප කලාප වලිනි.

Non-commercial distribution

**කර්මය, චිත්තය, ඍතුවය, ආහාරය යි රූප හට ගැනීමට හේතු සතරකි**. සත්ත්වසන්තානයෙන් පිටත ඇත්තේ ඍතුවෙන් හට-ගන්නා රූප පමණෙකි. ඍතුව නම් ශීතෝෂ්ණ දෙක ය. සත්ත්ව සන්තානයෙහි වනාහි කර්මාදි හේතු සතරෙන් ම හටගන්නා රූප ඇත්තේ ය. රූප කර්මාදි හේතුන් ගෙන් හට ගන්නවුන් වුවද අතීත කර්ම හේතුවෙන් භවයෙහි ප්‍රතිසන්ධි විඥනය පහළ නුවුව හොත් ඒවා නො හටගන්නා බැවින්, විඥනය හේතු සතරින් ම හට ගන්නා රූපයන්ට විශේෂ හේතුවකි. **'විඤ්ඤාණ පච්චයා නාම රූපං'** යි වදළේ එහෙයිනි. විපාක විඥන හේතුවෙන් අරූප භවයෙහි නාමය පමණක් හටගනී. අසංඥ භවයෙහි විපාක විඥනයක් ද නැත. එහි අතීත කර්ම විඥනය හේතු කොට රූප පමණක් ඇති වේ. ඉතිරි භවවල විඥන හේතුවෙන් නාම රූප දෙක ම ඇති වේ. 'විඤ්ඤාණ පච්චයා නාම රූපං' යනු සර්වසංග්‍රාහික දේශනයකි. එහි අර්ථය කියන ලද පරිදි තුන් ආකාරයෙන් ම ගත යුතු ය.

අතීත කර්ම හේතුවෙන් හටගන්නා වූ ප්‍රතිසන්ධි විඥනය සමග ම අණ්ඩජ ජලාබුජ යෝනි දෙකට අයත් සත්ත්වයන්ට කායදශකය, භාවදශකය,' වස්තු දශකය යන රූපකලාප තුන පහළ වේ. එයිනුදු සමහර සත්ත්වයකුට භාවදශකය පහළ නො වේ. භාවදශකය පහළ නො වූවෝ නපුංසකයෝ ය. ඔවුන් ගේ ඉපදීම සිදුවන්නේ කලාතුරකිනි. රූපකලාප දෙකකින් හෝ තුනකින් හෝ යුක්ත වූ විඥනය සහිත වූ ඒ රූප පිණ්ඩයට 'කලල රූපය' යි කියනු ලැබේ. කලල රූපයෙහි රූප කලාප දෙකක් හෝ තුනකැයි කියනුයේ ජාති වශයෙනි. එක් එක් ජාතියකට අයිති කලාප බොහෝ ගණනක් එහි ඇත්තේ ය. මඳක් මෝරන කල්හි එයට චිත්තජ ඍතුජ කලාපයෝ ද එක් වෙති. කලල රූපයෙහි පටන් මනුෂ්‍යයා ගේ වැඩීමේ පිළිවෙළ තථාගතයන් වහන්සේ විසින් යක්ෂ සංයුත්තකයෙහි මෙසේ වදරා තිබේ.

**"පඨමං කලලං හෝති කලලා හෝති අබ්බුදං**
**අබ්බුදා ජායතේ පෙසි පෙසි නිබ්බත්තතේ ඝනෝ**
**ඝනා පසාඛා ජායන්ති කේසා ලෝමා නඛා පිච."**

*Non-commercial distribution*

"පළමු කොට මාතෘගර්භයේ කලල රූපය හට ගන්නේ ය. ඒ කලල රූපයෙන් අබ්බුදය(පෙණපිඩ) හට ගන්නේ ය. අබ්බුදයෙන් පේශිය හට ගන්නේ ය. පේශියෙන් ඝනය හට ගන්නේ ය. ඝනයෙහි අතු පසක් ද කෙස් ලොම් නිය ද හට ගන්නේ ය" යනු එහි තේරුමයි.

**"තිලතේලස්ස යථා බින්දු සප්පි මණ්ඩො අනාවිලෝ.**
**ඒවං වණ්ණ පටිභාගං කලලන්ති පවුච්චති"**

"තලතෙල් බින්දුවක් යම් බඳු ද, පිරිසිදු ගිතෙල් බින්දුවක් යම් බඳු ද, එබඳු පැහැය හා සටහන ඇති දෙයකට 'කලලය' යි කියනු ලැබේ ය" යනු එහි තේරුම යි. එයින් කලල රූපයාගේ පැහැය හා ආකාරය දක්වන ලදී. තෙල් බිඳක් වැනි වූ ඒ කලල රූපය ප්‍රමාණයෙන් ඉතා කුඩා ය. එහි ප්‍රමාණය සංයුත් අටුවාවෙහි **"තිහි ජාති උණ්ණාංසූහි කතසුත්තග්ගේ සණ්ඨිත තේලබින්දු පමාණං"** යනුවෙන් හිමාලයෙහි වෙසෙන ඉතා සිහින් ලොම් ඇති **ජාතිඋණ්ණා** නම් වූ එළුවන්ගේ ලොම් තුනකින් කළ හුයෙහි අගට එන තෙල් බින්දුව පමණයයි දක්වා තිබේ.

විභංග අටුවාවෙහි වනාහි **"ජාති උණ්ණා නාම සුඛුමා. තස්සා ඒකංසුනෝ පසන්න තිල තේලේ පක්ඛිපිත්වා උද්ධටස්ස පග්ඝරිත්වා අග්ගේ ඨිතබින්දු මත්තං"** යනුවෙන් **ජාතිඋණ්ණා** නම් වූ සිහින් එළු ලෝමයක් පිරිසිදු තලතෙලෙහි ලා ගත් කල්හි එහි අග සිටින තෙල් බින්දුව පමණ ය යි කියා තිබේ.

**"සත්තාහං කලලං හෝති පරිපක්කං සමූහකං"**
**විවට්ටමානං තබ්භාවං අබ්බුදං නාම ජායති."**

"කලලය සතියක් පවතී. එය මෝරා සමූහාකාර වී කලලාකාරය අත් හැර අබ්බුද නම් දෙය වන්නේ ය" යනු එහි තේරුම යි.

**"සත්තාහං අබ්බුදං හෝති පරිපක්කං සමූහකං"**
**විවට්ටමානං තබ්භාවං පේසි නාම ච ජායති"**

"සතියක් අබ්බුදය පවතී. එය මෝරා සමූහාකාර වූයේ ඒ ස්වභාවය අත් හරින්නේ පේශි නම් දෙය වන්නේ ය" යනු එහි තේරුම යි.

Non-commercial distribution

**"සත්තාහං පේසි භවති පරිපක්කං සමූහකං,**
**විවට්ටමානං තබ්භාවං ඝනොති නාම ජායති."**

"පේශිය සතියක් පවතී. එය මෝරා සමූහාකාර වූයේ ඒ ස්වභාවය හරින්නේ ඝන නම් දෙය වන්නේ ය" යනු එහි තේරුම යි.

**"යථා කුක්කුටියා අණ්ඩං සමන්තා පරිමණ්ඩලං,**
**ඒවං ඝනස්ස සණ්ඨානං නිබ්බත්තං කම්මපච්චයා."**

"යම් සේ කිකිළියකගේ බිත්තරය හාත්පසින් වට වේ ද, කර්ම හේතුවෙන් උපන්නා වූ ඝනයාගේ සටහන ද එසේ ය" යනු එහි තේරුම යි.

සතර වන සතියෙහි හටගන්නා වූ කුකුළු බිත්තරයක් වැනි වූ ඝනය මේරීමට පැමිණි කල්හි පස් වන සතියෙහි ඒ ඝනයෙහි හිස හටගන්නා තැන එක් බුබුලක් ද, අත් හටගන්නා දෙතැන බුබුළු දෙකක් ද, පා හටගන්නා දෙතැන බුබුළු දෙකක් ද යි බුබුළු පසක් පහළ වේ. ඒ බුබුළු ක්‍රමයෙන් වැඩී ඇස් කන් ආදිය හා කෙස් ලොම් නිය ද පහළ වේ.

මෙසේ අතීත කර්ම හේතුවෙන් මවුකුස උපන්නා වූ සත්ත්වයා ගේ සන්තානයෙහි ප්‍රතිසන්ධි චිත්තය නිරුද්ධ වන්නට මත්තෙන් ම ඍතුජ රූපයෝ පහළ වෙති, ප්‍රතිසන්ධි චිත්තයට අනතුරුව උපදනා දෙවන සිත ඉපදීමේ පටන් චිත්තජරූපයෝ පහළ වෙති. ආහාරජ රූපයන් පහළ වන අවස්ථාව නියම වශයෙන් දක්වා නැත. මවු කුස වෙසෙන දරුවා ආහාර අනුභවයක් නො කරන්නේ ය. ඔහු යැපෙන්නේ ද මව අනුභව කරන ආහාරයෙනි. එබැවින් යක්ඛසංයුත්තකයෙහි:–

**"යං තස්ස භුඤ්ජතේ මාතා අන්නං පානං ච භෝජනං,**
**තේන සෝ තත්ථ යාපේති මාතුකුච්ඡිගතෝ නරෝ"**

යනු වදරන ලදී. "ඒ දරුවා ගේ මව යම් ආහාර පාන භෝජනයක් වළඳ ද, මව් කුසයට පැමිණියා වූ සත්ත්ව තෙමේ එයින් යැපේ ය" යනු එහි තේරුමයි. කලලාවස්ථාවෙහි හෝ වේවා

*Non-commercial distribution*

අබ්බුදදි අවස්ථාවක දී හෝ වේවා මවු වැළඳූ ආහාරස්නේහය දරුවා ගේ කයට පැමිණෙන්නට පටන් ගත් තැන සිට ඒ ශරීර යෙහි ආහාරජ රූපයෝ ද උපදනාහු ය.

කාම භවයෙහි සම්පූර්ණයෙන් රූප පහළවීම ඇත්තා වූ සංසේදජ සත්ත්වයන්ට ප්‍රතිසන්ධි විඥනය සමග චක්ෂුර් දශකය - ශ්‍රෝත්‍ර දශකය - ඝ්‍රාණ දශකය - ජිහ්වා දශකය - කාය දශකය - භාව දශකය - වස්තු දශකය යන රූප කලාප සතක් විඥනය නිසා පහළ වේ. ප්‍රතිසන්ධියෙන් පසු චිත්තජ ඍතුජාහාරජ රූපයන් ද ඒවාට එකතු වීමෙන් අනුක්‍රමයෙන් ඒ සත්ත්වයා ගේ ශරීරය සම්පූර්ණ වේ. කාමභවයෙහි සම්පූර්ණයෙන් රූප ලැබෙන ඕපපාතික සත්ත්වයන්ට ප්‍රතිසන්ධි චිත්තය සමඟ චක්ෂුර්දශකය, ශ්‍රෝත්‍රදශකය, ඝ්‍රාණ දශකය, ජිහ්වා දශකය, කාය දශකය, භාව දශකය, වස්තු දශකය යන දශක කලාප සත පහළ වේ. ඉන්පසු ඍතුජ ආහාරජ කලාපයෝ එයට එක් වෙති.

රූපලෝකයෙහි බ්‍රහ්මයන්ට ඝ්‍රාණ - ජිහ්වා - කාය භාවදශක කලාපයෝ නො ලැබෙති. ආහාරජ කලාපයෝ ද නො ලැබෙති. විඥනයක් සර්වාකාරයෙන් නො ලැබෙන අසංඥ භවයෙහි, රූපය ම ප්‍රතිසන්ධිය වේ. එහි ප්‍රථමයෙන් උපදනා අවස්ථාවේදී විඥනයක් නැති බැවින් අතීත වූ කර්ම විඥනය හේතුකොට ජීවිත නවක කලාපයන්ගෙන් ශරීරයක් නිර්මිත ·වේ. පසු ව ශබ්දය හැර ඉතිරි ඍතුජ රූපයෝ ද එයට එකතු වෙති. මෙසේ ඒ ඒ භවයෙහි පහළවන නාම රූපයන් විඥනය පහළ නොවී නම්, පහළ නොවන බැවින් විඥනය නිසා නාමරූපය පහළ වේ ය යි කියනු ලැබේ.

## නාමරූපපච්චයා සළායතනං

**තත්ථ කතමං නාමරූපපච්චයා සළායතනං? චක්ඛායතනං, සෝතායතනං, ඝාණායතනං, ජිව්හායතනං, කායායතනං, මනායතනං ඉදං වුච්චති නාම රූප පච්චයා සළායතනං"**

යනුවෙන් විභංගපාළියෙහි චක්ඛායතනය, සෝතායතනය, ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය

Non-commercial distribution

යන මේ සය නාමරූපයන් නිසා හට ගන්නා වූ ආයතන සය ය යි දක්වන ලදී.

එහි චක්ෂුර්විඥානය යි කියනු ලබන රූප දක්නා සිතට උත්පත්තිස්ථාන වන්නා වූ ඇසෙහි පිහිටි ඔපය චක්ඛායතනය යි. ශ්‍රෝත්‍රවිඥානය යි කියනු ලබන හඬ දැනගන්නා වූ සිතට උත්පත්තිස්ථාන වූ කනෙහි පිහිටි ඔපය සෝතායතනය යි. ඝ්‍රාණවිඥානය යි කියනු ලබන ගඳ දැනගන්නා වූ සිතට උත්පත්තිස්ථානය වූ නාසය තුළ පිහිටි ඔපය ඝාණායතනය යි. ජිහ්වා විඥානය යි කියනු ලබන රස දන්නා වූ සිතට උත්පත්තිස්ථාන වන දිවෙහි පිහිටි ඔපය ජිව්හායතනය යි. කායවිඥානය යි කියනු ලබන තද බැව් සිසිල් බැව් උණුසුම් බැව් ආදිය දන්නා සිතට උත්පත්තිස්ථාන වන ශරීරයේ ඇතුළත පිටත දෙක්හි පිහිටි ඔපය කායායතනය යි. චක්ෂුඃප්‍රසාද ශ්‍රෝත්‍රප්‍රසාද ඝ්‍රාණප්‍රසාද ජිහ්වාප්‍රසාද කායප්‍රසාදය යි කියනුයේ ද මේ පසටම ය. රූප ශබ්දදි හැම අරමුණු ම දැනගන්නා වූ විඥානය මනායතනය යි.

ආයතනය යි කියනු ලබන මේ චක්ෂුරාදීහු රූපාදි අරමුණු ගැනීමට උපකාර වී බොහෝ චිත්ත චෛතසිකයන් ඇති කිරීමෙන් සංසාරය දික් කෙරෙති, එබැවින් ඒවාට ආයතනයෝ ය යි කියනු ලැබේ. නාමරූපයන් නිසා ආයතන සය වේ ය යි කියනුයේ, ඒවා නාමරූපයන් ඇති කල්හි ම උපදනා බැවිනි. නාමරූප නැතහොත් ආයතනයන්ට නො පහළ විය හැකිය.

නාමරූපයන් හේතු කොට කාමලෝකයෙහි ආයතන සය ම පහළ වේ. රූපලෝකයෙහි චක්ඛායතනය සෝතායතනය මනායතනය යන තුන පමණක් පහළ වේ. අරූපලෝකයෙහි මනායතනය පමණක් පහළ වේ. නාම රූප දෙකින් නාමය අරූප භවයෙහි මනායතනයට පමණක් හේතු වේ. කාම රූප භව දෙක්හි නාම රූප දෙක ම ෂඩායතනයට හේතු වේ.

ෂඩායතනය අතුරෙන් චක්ෂුරාදි ආයතන පස "විඤ්ඤාණ පච්චයා නාමරූපං" යනුවෙන් විඥාන හේතුවෙන් හටගන්නාහුය යි කියන ලද අටවිසි රූපයන්ගෙන් රූප පසකි. ඒවා වරක් විඥාන හේතුවෙන් හටගන්නා ධර්ම බව කියා නැවත නාමරූප හේතුවෙන්

Non-commercial distribution

හටගන්නා බව කීම කෙසේ යෙදේද? යන ප්‍රශ්නය මෙහි ඇති වේ. කඳ අතු රිකිලි කොළ මල් යන සියල්ලට ගසය යි කියනු ලැබේ. ඇටයෙන් ගස හටගන්නේ ය යි කී කල්හි ගසට අයත් ඒ සියල්ල ම ඇටයේ ඵල වශයෙන් කියැවේ.

එහෙත් ඇටය නිසා ගස හටගන්නේ ය, ගස නිසා අතු හටගන්නේ ය, අතු නිසා රිකිලි හටගන්නේ ය, රිකිලි නිසා මල් හටගන්නේ ය, මල් නිසා ගෙඩි හටගන්නේය යි කීමද වරදක් නොවේ. ගසේ හටගන්නා ගෙඩිවලට මුලින් රෝපණය කළ ඇටය ද හේතු වේ. පසුව ඒ ඇටය නිසා හටගන්නා වූ අතු හා මල් ද හේතු වේ. එමෙන් විඥනය රූප අට විස්සට ම හේතු වේ. නැවත ඒවා චක්ෂුරාදි ආයතන පසට ද හේතු වේ. එබැවින් නාමරූපයන් හේතු කොට චක්ෂුරාදි ආයතන පස වේය යි කීමේ දෝෂයක් නැත.

ආයතනයන්ගෙන් සය වැන්න වූ මනායතනය නම්, නාම රූපයන් ගේ හේතුව වශයෙන් කියන ලද විඥනයම ය. විඥනය නිසා ඇතිවන නාමරූපය නිසා නැවත විඥනයම ඇති වන බව කීම, මව් නිසා දරුවා ඇති වේය යි කියා නැවත දරුවා නිසා මව ඇති වේය යි කීම වැනි නො ගැළපෙන කියුමක් නොවේ ද? යන ප්‍රශ්නයක් ද මෙහි ඇති වේ. එය ද නො ගැළපෙන කියුමක් නො වේ. එය ගෙඩිය නිසා ගස ඇති වී නැවත ගස නිසා ගෙඩි ඇති වීම සේ තේරුම් ගත යුතු ය. මතු ද මෙ බඳු තැන්වල යෙදෙන සැටි කියන ලද්දට අනුව සලකා ගත යුතු.

වරක් කියන ලද ෂඩායතනය මෙහි නැවතත් ගන්නා ලද්දේ කරුණු දෙකක් නිසා ය. නාමරූපය ඒවාට හේතු වන බව එක් කරුණකි. මතු කිය යුතු ඵස්ස වේදනාදි පටිච්චසමුප්පාදාංගයන්ට විශේෂයෙන් ෂඩායතනය හේතු වන බව එක් කරුණකි.

නාමරූපයන් නිසා ෂඩායතනය හටගන්නා ආකාරය මෙසේ ය. අණ්ඩජය ජලාබුජය යි කියන මව්කුස උපදනා සත්ත්වයනට ප්‍රතිසන්ධිය සමග ම කායායතන මනායතන දෙක පහළ වේ. ප්‍රතිසන්ධිය සමග පහළ වූ කුඩා රූප පිණ්ඩය ක්‍රමයෙන් වැඩෙන්නට පටන් ගනී. වැඩීම නිසා කල් යාමෙන් ඇස්, කන්, නාසා, දිව යන මේ අවයවයෝ පහළ වෙති. ඒවා පහළ වූ කල්හි

Non-commercial distribution

ඒ ඒ තැන්වල චක්ඛායතන සෝතායතන ඝාණායතන ජිව්හායතන යන ආයතන සතර පහළ වේ. ඒවාට ස්ථානය වූ ඇස, කණ, නාසය, දිව යන මේවා පහළ නො වී නම් චක්ඛායතනාදියට පහළ විය හැකි බවක් නැති බැවින්, රූපය ඒ ආයතන සතර ඇතිවීමට හේතුව ය.

කලින් මදුළු හා ඇට නැත්තා වූ කුඩා කොස් ගැටය වැඩීමෙන් එය තුළ කොස් මදුළු කොස් ඇට පහළවීම මෙන් ද, කලින් කටුවය මදය කියා කිසිවක් නැති ඇට්ටිගෙඩිය වැඩීමෙන් පොල්කටුව හා පොල් මද පහළ වීම මෙන් ද, ප්‍රතිසන්ධිය සමග පහළ වූ රූපයන් වැඩීමෙන් චක්ඛාදි ආයතන සතර පහළවීම සලකා ගත යුතු ය. ප්‍රතිසන්ධිය සමග කායායතනය ඇති වුව ද රූපයන් වැඩෙන කල්හි ඒ වැඩීම අනුව පසුව ශරීරය පුරා බොහෝ කායායතනයෝ පහළ වෙති. ඒ කායායතනයන් පහළ වනුයේ වැඩෙන්නා වූ රූපයන් නිසා ය. එබැවින් උත්පත්තිය සමග ම කායායතනයක් පහළ වුව ද රූප නිසා කායායතනය පහළ වේය යි කියන ලදී. සංසේදජ ඕපපාතික සත්ත්වයන්ට වනාහි උත්පත්තිය සමග ම සියලු ම ආයතනයෝ පහළ වෙති. ඉන්පසු නාම රූපයන් නිසා පරම්පරා වශයෙන් ඒවා ජීවත් වන කාලය මුළුල්ලෙහි නැවත නැවත පහළ වේ.

ෂඩායතනයන්ට හේතු භාවයෙන් කියන ලද නාමය නම් දෙපනස් චෛතසිකයෝ ය. චිත්ත චෛතසික දෙකින් සිත ප්‍රධාන වුව ද යම්කිසි චෛතසික ධර්මයක් වරක් අධික වීර්‍ය්‍යයෙන් අධික වේගයෙන් උත්සන්නත්වයෙන් උපන් කල්හි, ඒ චෛතසිකය නිසා ලක්ෂ ගණන් සිත් උපදී. සත්ත්වයන්ට හමු වන්නාවූ ඇතැම් අරමුණු නිසා ද, සිදුවන්නා වූ ඇතැම් කරුණු නිසා ද, සමහර විට අධික වීර්‍ය්‍යයෙන් යුක්ත ව බලවත් ව ලෝභය ද උපදී, ද්වේෂය ද උපදී, මානය ද උපදී, ඊර්ෂ්‍යාව ද උපදී, මෛත්‍රිය ද උපදී, කරුණාව ද උපදී, ශ්‍රද්ධාව ද උපදී, ප්‍රඥාව ද උපදී, ප්‍රීතිය ද උපදී, තවත් චෛතසිකයෝ ද උපදිති. රාගය යනු ද ලෝභ චෛතසිකයම ය.

පුරුෂයකු විසින් ශෝභන කාන්තාවක් දුටු කල්හි සමහර විට ඒ කාන්තාව සම්බන්ධයෙන් බලවත් රාගයක් ඇති වේ.

Non-commercial distribution

වරක් බලවත් ව උපන් ඒ රාගය නිසා ඉන්පසු ඒ පුරුෂයා කෙරෙහි දුටු ස්ත්‍රිය සම්බන්ධයෙන් රාග සහගත සිත්, සමහර විට දින ගණනක් මුළුල්ලේ ඇති වේ. සමහරවිට මාස ගණනක්, වර්ෂ ගණනක් මුළුල්ලෙහි ද ඇති වේ. පසුව ඇති වන්නාවූ ඒ සිත් රාග සංඛ්‍යාත නාමය නිසා ඇති වූ මනායතනයෝ ය. යම්කිසි කරුණක් නිසා වරක් බලවත් ව කෝපය ඇති වුවහොත් ඒ නිසා පසුව සමහරවිට මාස ගණනක්, වර්ෂ ගණනක් ගතවන තුරු ද ද්වේෂ සහගත සිත් පහළ වේ. පසුව පහළ වන්නා වූ ඒ ද්වේෂ සහගත චිත්තයෝ උත්පන්න භාවයෙන් ඇති වූ ක්‍රෝධ සංඛ්‍යාත නාමය නිසා පහළ වන්නා වූ මනායතනයෝ ය. යම්කිසි කරුණක් ගැන වරක් ප්‍රීතිය බලවත් ව පහළ වුවහොත්, ඉන්පසු ඒ ප්‍රීතිය නිසා ප්‍රීතියට හේතු වූ දෙය අරමුණු කොට බොහෝ චිත්තයෝ පහළ වෙති. ඒවා ප්‍රීති සංඛ්‍යාත නාමය නිසා උපදනා මනායතනයෝ ය. මෙසේ උත්පන්න භාවයෙන් පහළ වන්නා වූ සෑම චෛතසිකයක් ම නිසා මනායතනය ඇති වන සැටි සලකා ගත යුතුය.

ගෙයක ඇතුළේ වෙසෙන්නවුන් විසින් පිටත බලන්නාවූ ද, පිටත ඇති වස්තූන් හා පුද්ගලයන් ගෙට ඇතුළු කරගන්නාවූ ද, ඇතුළෙහි වූ දෑ බැහැර කරන්නාවූ ද ස්ථානයන්ට **ද්වාරය** යි කියනු ලැබේ. චක්ෂුරාදි ආයතන සය ද පිටත පිහිටි රූප ශබ්දාදි අරමුණු ගැනීමට උපකාර වන ස්ථාන වූයෙන් ද්වාරයන් වැනි නිසා ඒවාට ද්වාරයයි ද කියනු ලැබේ. ශරීරය ද්වාර සයක් ඇති ගෙයක් වැනි ය. ශරීරය සැරසී තිබෙන්නේ මේ ආයතන ද්වාර සයෙනි. එය වටිනා කමක් ඇති ඇලුම් කළ යුතු දෙයක් වී තිබෙන්නේ ද ආයතන ද්වාර නිසා ය. ආයතන ද්වාර නැති කල්හි ශරීරය ක්‍රියා විරහිත වන්නේ ය. මේ ආයතනයන් එකිනෙකට සම්බන්ධයක් නැති, වෙන් වෙන් වූ ධර්ම කොටසක් සැටියට තේරුම් නො ගෙන, ශරීරය හා එක් කොට එකම දෙයක් වශයෙන් වරදවා ගැනීම නිසා භූතෝපාදය රූපයන්ගෙන් නිර්මිත වූ මේ ශරීරය මමය - නුඹය - දෙවියා ය - මිනිසාය කියා ගැනීමෙන් නිවනට යා නො හැකි වන සේ සත්ත්වයන් සසර බැඳ තබන්නා වූ සත්කාය දෘෂ්ටිය ඇති වේ.

Non-commercial distribution

චක්ඛායතනය නිසා 'මම දකිමි' යි සත්කාය දෘෂ්ටිය ඇති වේ. සෝතායතනය නිසා 'මම අසමි' යි සත්කාය දෘෂ්ටිය උපදී. ඝාණායතනය නිසා 'මම ආඝ්‍රාණය කරමි' යි සත්කාය දෘෂ්ටිය උපදී. ජිව්හායතනය නිසා 'මම රස විඳිමි' යි සත්කාය දෘෂ්ටිය උපදී. කායායතනය නිසා 'මම සුවදුක් විඳිමි' යි සත්කාය දෘෂ්ටිය උපදී. මනායතනය නිසා 'මම දනිමි' යි සත්කාය දෘෂ්ටිය උපදී. ආයතනයන් ආයතන සැටියට දැන ගැනීම අපාය බීජය වූ, සංසාර බීජය වූ සත්කාය දෘෂ්ටිය දුරුකර ගැනීමට උපකාර වේ.

## සළායතනපච්චයා ඵස්සෝ

ෂඩායතනය නිසා පහළ වන්නාවූ ඵස්සය විභංග පාළියේ දක්වෙන්නේ -

**"තත්ථ කතමෝ සළායතනපච්චයා ඵස්සෝ? චක්ඛුසම්ඵස්සෝ, සෝතසම්ඵස්සෝ, ඝාණසම්ඵස්සෝ, ජිව්හාසම්ඵස්සෝ, කායසම්ඵස්සෝ, මනෝසම්ඵස්සෝ, අයං වුච්චති සළායතන පච්චයා ඵස්සෝ"** යනුවෙනි.

(1) චක්ඛුසම්ඵස්සය,
(2) සෝතසම්ඵස්සය,
(3) ඝාණසම්ඵස්සය,
(4) ජිව්හාසම්ඵස්සය,
(5) කායසම්ඵස්සය,
(6) මනෝසම්ඵස්සය,

යන සය ෂඩායතනය නිසා පහළ වන ඵස්සය යි එයින් දක්විණ. 'නාමරූප පච්චයා සළායතනං' යනුවෙන් ආයතන සයක් පමණක් දක්වන ලද නමුත් ආයතන දෙළොසක් ඇත්තේ ය. එයින් කියන ලද චක්ඛායතනාදි සයට ආධ්‍යාත්මිකායතනය යි කියනු ලැබේ. රූපායතනය, සද්දායතනය,ගන්ධායතනය, රසායතනය, ඵොට්ඨබ්බායතනය, ධම්මායතනය යි චක්ඛායතනාදියෙහි ගැටෙන ආයතන සයක් ද වේ. ඒවාට බාහිරායතනය යි කියනු ලැබේ. **'නාමරූප පච්චයා සළායතනං'** යන තන්හි දක්වෙන ආධ්‍යාත්මිකායතන පමණක් ම ස්පර්ශය ඇති කිරීමෙහි සමත් නො වේ. ස්පර්ශය හටගන්නේ ආධ්‍යාත්මිකායතන බාහිරායතන

Non-commercial distribution

දෙපක්ෂයේ ම සහයෝගයෙනි. එහෙයින් නිදානවග්ගසංයුත්තයෙහි **“චක්ඛුං ච පටිච්ච රූපේ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සෝ”** යි වදාරන ලදී. ඇසත් රූපයත් නිසා චක්ෂුර් විඥනය උපදනේය. ඇසය, රූපය, චක්ෂුර්විඥනය යන තිදෙනා ගේ එක්වීම ඵස්සය ය යනු එහි තේරුම යි. ඵස්සය ඇති වීමට බාහිරායතනයන් ගේ ද සහයෝගය ලැබිය යුතු බැවින් ස්පර්ශයා ගේ ප්‍රත්‍යය සැටියට ආධ්‍යාත්මිකායතන සයය, බාහිරායතන සයය යන දෙළස ම ගත යුතු ය.

කැටපත්-දිය ආදි ඔපය ඇති වස්තූන්හි ඉදිරියට පැමිණි වස්තුවේ ඡායාව තමන් තුළට ගන්නා ස්වභාවයක් ඇතුවාක් මෙන් චක්ඛායතනය යි කියන ලද චක්ෂුඃප්‍රසාදයෙහි ඉදිරියට පැමිණි වස්තුවේ ඡායාව තමන් තුළට ගන්නා ස්වභාවයක් ඇත්තේ ය. එයට ප්‍රසාදය යි කියනුයේ ද එහෙයිනි. ප්‍රසාද යන වචනයේ තේරුම ඔපය යනු යි. ඇසෙහි පිහිටි ඔපය නොහොත් ඇස නමැති ඔපය චක්ෂුඃප්‍රසාදය යි. රූපයෙහි මෙන් ම ශබ්දයෙහි ද ඡායාවක් ඇත්තේ ය. එය රූපච්ඡායාව මෙන් ඇසට පෙනෙන දෙයක් නො වේ. සෝතායතනය යි කියනු ලබන ශ්‍රෝත්‍ර ප්‍රසාදයෙහි තමා තුළට ශබ්දච්ඡායාව ගන්නා ස්වභාවයක් ඇත්තේ ය. ඝාණ ජිව්හා කායායතනයන්හි ද ගන්ධ රස ස්පර්ශයන් ගන්නා ස්වභාවයක් ඇත්තේය. මනායතනයෙහි බාහිරායතන සයම ගන්නා ස්වභාවයක් ඇත්තේ ය.

චක්ෂුඃප්‍රසාදයට රූපච්ඡායාවක් වැටීම ඒ වස්තූන් ගේ සැටියට තද ඝට්ටනයකි. ශෝත්‍රප්‍රසාදදියෙහි ශබ්දදීන් ගේ ගැටීම ද එසේ ය. බෙර ඇසත් අතත් දෙක එකට ගැටුණු කල්හි ශබ්දයක් පහළ කරවන ශක්තියක් ඒ දෙක්හි ඇතුවාක් මෙන්ද, ගිනිකූරක් හා ගිනිපෙට්ටියක් එකට ගැටුණු කල්හි ගින්නක් ඇති කරවන ශක්තියක් ඒ දෙක්හි ඇතුවාක් මෙන් ද, ආයතනයන්හි ඔවුනොවුන් එක්වීම් වශයෙන් ගැටුණු කල්හි විඥනයක් පහළ කරවීමේ ශක්තියක් ඇත්තේ ය. චක්ඛායතනයෙහි රූපායතනය පැමිණ ගැටුණු කල්හි චක්ෂුර්විඥනය පහළ වේ. සෝතායතනයෙහි ශබ්දයතනය ගැටුණු කල්හි සෝතවිඤ්ඤාණය පහළ වේ. ඝාණායතනයෙහි ගන්ධායතනය ගැටුණු කල්හි ඝ්‍රාණ විඥනය

Non-commercial distribution

පහළ වේ. ජිව්හායතනයෙහි රසායතනය ගැටුණු කල්හි ජිව්හාවිඥනය පහළ වේ. කායායතනයෙහි පොට්ඨබ්බායතනය ගැටුණු කල්හි කායවිඥනය පහළ වේ. මනායතනයෙහි ධම්මායතනය ගැටුණු කල්හි මනෝවිඥනය පහළ වේ. මනායතනයෙහි චක්ඛායතනාදි පස ගැටීමෙන් ද මනෝවිඥනය පහළ වේ.

චක්ඛායතනය, රූපායතනය, චක්ෂුර්විඥන සංඛ්‍යාත මනායතනය යන ධර්ම තුන එක් වූ කල්හි **චක්ඛුසම්ඵස්සය** ඇති වේ. චක්ඛුසම්ඵස්සය යනු එකිනෙක වෙන් නො කළ හැකි සේ චක්ෂුර් විඥනය හා සැදී, එහි ම අංගයක් ව චක්ඛායතනය ඇසුරු කොට, රූපායතනය අරමුණු කොට උපදනා වූ එක්තරා චෛතසික ධර්මයකි. "තිණ්ණං සංගති ඵස්සෝ" යි චක්ඛායතන රූපායතන චක්ඛුවිඤ්ඤාණයන් ගේ එක්වීම ඵස්සය යි වදරා තිබීම පර්‍යාය කථාවෙකි. එය සෞත්‍රාන්තික දේශනාවේ ස්වභාවයකි. කාරණය ගැන නො සලකා වචනයෙහි පමණක් එල්ලී අර්ථය ගන්නට ගියහොත් එ බඳු තැන්වල දී වැරදීම් සිදු වේ. වචනය අනුව ම සිතා ව්‍යඤ්ජනච්ඡායාවට රැවටී එක් වීම් මාත්‍රය ම ඵස්සය යි වරදවා නොගත යුතු ය.

සෝතායතනය සද්දායතනය සෝතවිඤ්ඤාණය යන තුන එක් වූ කල්හි වෙන් නො කළ හැකි සේ සෝත විඤ්ඤාණය හා බැඳී, සෝතවිඤ්ඤාණයාගේ අවයවයක් වැනි වී සෝතායතනය ඇසුරු කොට, සද්දායතනය අරමුණු කොට සෝතසම්ඵස්සය ඇති වේ. ඝාණසම්ඵස්සාදි සතර ඇති වන සැටි ද, කියන ලද්දට අනුව තේරුම් ගත යුතු ය. යම් කිසි සත්ත්වයකුට චක්ෂුරාදි ආයතන පහළ වී නිරුපද්‍රිතව පැවතුණ හොත් ඒවායේ රූපාදි අරමුණු සැපී විඥන ඇති වී ඵස්සයන් ද ඇති වීම ඒකාන්තයෙන් සිදුවන්නකි. **'සළායතන පච්චයා ඵස්සෝ'** යි වදළේ එහෙයිනි.

## ඵස්සපච්චයා වේදනා

**"තත්ථ කතමා ඵස්සපච්චයා වේදනා? චක්ඛු සම්ඵස්සජා වේදනා, සෝතසම්ඵස්සජා වේදනා, ඝාණ සම්ඵස්සජා වේදනා, ජිව්හාසම්ඵස්සජා වේදනා, කාය සම්ඵස්සජා වේදනා, මනෝ-සම්ඵස්සජා වේදනා, අයං වුච්චති ඵස්ස පච්චයා වේදනා"**

Non-commercial distribution

යනුවෙන් විභංගපාළියෙහි චක්ඛුසම්ඵස්සජ වේදනා ය, සෝත සම්ඵස්සජ වේදනා ය, ඝාණසම්ඵස්සජ වේදනා ය, ජිව්හා සම්ඵස්සජ වේදනා ය, කායසම්ඵස්සජ වේදනා ය, මනෝසම්ඵස්සජ වේදනා ය යන වේදනා සය ස්පර්ශය නිසා හටගන්නා වේදනාව ය යි දක්වන ලදී. රස විඳීමේ ආකාරයෙන් වනාහි සුඛ වේදනාවය දුඃඛ වේදනාවය, උපේක්‍ෂා වේදනාව ය යි ස්පර්ශය නිසා හටගන්නා වූ වේදනාව තුන් ආකාර වේ.

විඥානය කරණ කොට ගෙන දැනගන්නා වූ දේවලට ආරම්මණය යි කියනු ලැබේ. අරමුණුවල හොඳ බවක් හෝ නරක බවක් හෝ මධ්‍යස්ථ බවක් හෝ ඇත්තේ ය. අරමුණුවල ඇති ඒ ස්වභාව තුනට ආරම්මණරසය යි කියනු ලැබේ. ආරම්මණය අනෙකකි. ආරම්මණරසය අනෙකකි. ඒ දෙක එකක් කොට නො සැලකිය යුතුය. රසය ආරම්මණයේ ගුණ විශේෂයකි. විඥානයෙන් ආරම්මණය දැනගනී. එහෙත් එහි රසය විඥානයට නො දැනේ. යම් කිසිවක් අරමුණු කොට විඥානය උපදනා කල්හි එය හා සමග ස්පර්ශ චෛතසිකය ද උපදී. ස්පර්ශයෙන් තොර ව කිසිකලෙක විඥානයක් නූපදී. ස්පර්ශය විඥානයට අරමුණ ගැනීමට උපකාර වේ. ස්පර්ශය නිසා ආරම්මණයේ රසය මතු වෙයි. ආරම්මණ රසය මතුකිරීම ස්පර්ශයා ගේ විශේෂ කෘත්‍යයකි.

ආරම්මණ රසය මතු කර දෙන්නා වූ ඒ ස්පර්ශ චෛතසිකය යූෂය බැහැර කරනු පිණිස දෙහි ගෙඩියක් දෙඩම් ගෙඩියක් මිරිකන්නා වූ අත මෙන් ද රසය දිවට ලබා දීම සඳහා ආහාරය තළන්නා වූ සුණු කරන්නා වූ දත් පෙළ මෙන් ද දත යුතු ය. ස්පර්ශය ආරම්මණ රසය මතු කරන නමුත් රසය නො දනී. ස්පර්ශයෙන් ආරම්මණ රසය මතු කළ කල්හි ඒ රසය ගන්නා වූ විඳින්නා වූ ස්වභාවයක් ඇති වේ. මෙහි වේදනාව ය යි කියනු ලබනුයේ ඒ රසය ගන්නා වූ ස්වභාවයට ය. එය විඥාන ස්පර්ශ දෙකින් අන්‍ය වූ චෛතසික ධර්මයකි. ලෝකයෙහි වේදනාව ය යි කියනුයේ දුකට ය. මෙහි වේදනාව ය යි කියනුයේ සැපය දුකය මධ්‍යස්ථභාවය යන තුනට ම ය.

හොඳ අරමුණක හොඳ බව ස්පර්ශයෙන් මතු කළ කල්හි එය ගන්නා වූ විඳින්නා වූ ස්වභාවයට සුඛවේදනාව ය යි ද සෝමනස්ස

Non-commercial distribution

වේදනාව ය යි ද කියනු ලැබේ. නපුරු බව ඇති අරමුණක නපුරු බව ගන්නා වූ විඳින්නා වූ ස්වභාවයට දුඃඛ වේදනාව ය යි ද, දෝමනස්ස වේදනාව ය යි ද කියනු ලැබේ. මධ්‍යම අරමුණක මධ්‍යම බව ගන්නා වූ විඳින්නා වූ ස්වභාවයට අදුක්ඛමසුඛ වේදනාවය යි ද, උපේක්ෂා වේදනාව ය යි ද කියනු ලැබේ. ආරම්මණයන් ගේ නිශ්චිත හොඳ නරක බවක් නැත. කෙනකුට සුන්දර දෙය කෙනකුට නපුරකි. කෙනකුට නපුරු දෙය කෙනකුට සුන්දර දෙයකි. සර්පයාට සැපින්න පරම සුන්දර අරමුණකි. මැඩියාට නම් නපුරකි. කාල දේශ ද්වාරාදි වශයෙන් ද ආරම්මණයන්ගේ ඉටු අනිටු බව කිය යුතු ය.

විඥාන - වේදනා දෙක්හි ම බලාබල බව ස්පර්ශයට අනුව සිදු වේ. දුර තිබෙන දෙයක් සම්බන්ධයෙන් ඇති වන්නේ මන්දස්පර්ශයකි. එබැවින් එය දක්නා තැනැත්තාට එය සම්බන්ධයෙන් ඇති වන්නේ ආරම්මණ තත්ත්වාකාරයෙන් ගැනීමට අසමර්ථ වූ දුබල විඥානයකි. ඒ විඥානය සමග උපදිනුයේ ද ආරම්මණ රසය මනා කොට නො ලබන්නා වූ නො විඳින්නාවූ දුබල වේදනාවකි. අරමුණ සියුම් වන කල්හි ද ස්පර්ශය දුබල වීමෙන් දුබල විඥාන - වේදනාවෝ උපදිති. යම් කිසි කරුණකින් ස්පර්ශය දුබල වූ කල්හි සුඛ සෝමනස්ස වේදනාවන්ට නිසි ඉටු අරමුණ සම්බන්ධයෙන් ද උපේක්ෂා වේදනාවම වේ. දෝමනස්ස වේදනාවට නිසි අනිටු අරමුණු සම්බන්ධයෙන් ද උපේක්ෂා වේදනාව වේ. කවර ආකාරයකින් හෝ ස්පර්ශය ඇති වුව හොත් වේදනාව ඇති වීමට කිසි බාධාවක් නැත. වේදනාවගේ උත්පත්තිය වැළැක්වීමට සමර්ථ බලයක් හෝ පුද්ගලයෙක් ද නැත. ස්පර්ශය ඇති වුවහොත් එයට අනුව වේදනාව ද ඇතිවන්නේම ය. එබැවින් තථාගතයන් වහන්සේ **'ඵස්සපච්චයා වේදනා'** යනු වදාළ සේක.

## වේදනාපච්චයා තණ්හා

සසර සැරිසරන පෘථග්ජන සත්ත්වයන් විසින් ඉතා ම උසස් කොට සලකන දෙය සුඛ වේදනා, සෝමනස්ස වේදනාය යි කියනු ලබන සැපය ය. ඔවුන් සසර නො කලකිරෙන්නේ, මේ මහා දුඃඛස්කන්ධය ඔවුනට එපා නොවන්නේ, අතර අතර වත් ඇති

Non-commercial distribution

වන්නා වූ මේ සැපය නිසා ය. අඹු - දරු - නෑ - මිතුරු ආදීන් උතුම් කොට සලකනුයේ ද සැපය ලබාගැනීමට උපකාර වන පුද්ගලයන් නිසා ය. ආහාර පාන වස්ත්‍ර ගෘහාදිය උතුම් කොට සලකනුයේ ද සැපය ලැබීමට උපකාර වන නිසා ය. උසස් කොට සලකන අඹු දරු ආදීන් නැති ව වස්තූන් නැති ව ඒ සැපය නිකම්ම ලැබේ නම් කිසිවෙක් පුත්‍ර කලත්‍රාදීන් උසස් කොට නො සලකන්නාහ, ඔවුන්ට ඇලුම් නො කරන්නා හ. ආහාර පාන මිලමුදල් ආදිය උසස් කොට නො සලකන්නාහ. ඕවාට ඇලුම් නො කරන්නාහ. මෙසේ සත්ත්වයන් ඒ සැපය උසස් කොට සලකන බැවින් එය සඳහා ඔවුන් නොකරන දෙයක් නැත. නො ගන්නා දුකක් නැත.

සත්ත්වයන් විසින් ඉතා ම නපුරු කොට සලකන බිය වන දෙය නම් දුක්ඛ වේදනා, දෝමනස්ස වේදනාය යි කියනු ලබන දුකය. සත්ත්වයෝ යමක් කෙරෙත් නම් ඒ සියල්ල ම කරනුයේ සැප ලැබීම ය, දුක දුරු කර ගැනීම ය යන මේ දෙ කරුණ සඳහා ය. වේදයිත සුඛය උතුම් කාට ගන්නා වූ පෘථග්ජනයාහට ඉෂ්ට රූපාදීන් ගේ ස්පර්ශයෙන් සුඛ වේදනාව හෝ සෝමනස්ස වේදනාව හෝ ඇති වූ කල්හි "බොහෝ සැපය, බොහෝ ප්‍රණීත ය, ඉතා හොඳ ය" යනාදීන් සුඛ සෝමනස්ස වේදනා පිළිබඳ තෘෂ්ණාව ඇති වේ.

අනිෂ්ටාරම්මණයන්ගේ ස්පර්ශයෙන් දුඃඛ දෞර්මනස්‍ය වේදනාවන් ඇති වී එයින් පීඩිත කල්හි "සුවය ඕනෑ ය, සුවය ඕනෑ ය, සුවය කෙසේ ලබම් ද" යි සුවය පිළිබඳ තෘෂ්ණාව ඇති වේ. දුඃඛයෙන් පීඩිත සත්ත්වයා හට සැපයක් නුවූයේ ද උපේක්ෂා වේදනාව මුත් ඇති වුවහොත් "මෙයත් ඇත, මෙයත් සැනසිල්ලෙක, මෙයත් සැපයකැ" යි උපේක්ෂා වේදනා පිළිබඳ ව ද තෘෂ්ණාව උපදී. මෙසේ සුඛදුඃඛෝපේක්ෂා සංඛ්‍යාත ත්‍රිවිධ වේදනාව ම නිසා තෘෂ්ණාව උපදනා බැවින් තථාගතයන් වහන්සේ **"වේදනා පච්චයා තණ්හා"** යි වේදනාව නිසා තෘෂ්ණාව උපදීය යි වදළ සේක. වේදනා ප්‍රත්‍යයෙන් හටගන්නා වූ තෘෂ්ණාව කවරෙක් ද යන බව දක්වීම පිණිස විභංගපාළියෙහි මෙසේ වදළ සේක.

Non-commercial distribution

**"තත්ථ කතමා වේදනාපච්චයා තණ්හා? රූප තණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා පොට්ඨබ්බ තණ්හා ධම්මතණ්හා. අයං වුච්චති වේදනා පච්චයා තණ්හා."**

"රූප තෘෂ්ණාවය, ශබ්ද තෘෂ්ණාවය, ගන්ධ තෘෂ්ණාවය, රස තෘෂ්ණාවය, ස්ප්‍රෂ්ටව්‍ය තෘෂ්ණාවය, ධර්ම තෘෂ්ණාවය යන මේ වේදනා ප්‍රත්‍යයෙන් හටගන්නා තෘෂ්ණාව ය" යි එයින් දැක්වේ.

චක්ඛායතන මනායතන දෙක්හි ස්පර්ශ වන රූපය පිළිබඳ තෘෂ්ණාව රූපතෘෂ්ණාව ය. සෝතායතන මනායතන දෙක්හි ස්පර්ශ වන ශබ්දය පිළිබඳ තෘෂ්ණාව ශබ්ද තෘෂ්ණාව ය. ඝාණායතන මනායතන දෙක්හි ස්පර්ශ වන ගන්ධය පිළිබඳ වූ තෘෂ්ණාව ගන්ධ තෘෂ්ණාව ය. ජිව්හායතන මනායතන දෙක්හි ස්පර්ශ වන රසය පිළිබඳවූ තෘෂ්ණාව රස තෘෂ්ණාවය. කායායතන, මනායතන දෙක්හි ස්පර්ශ වන ස්ප්‍රෂ්ටව්‍යය පිළිබඳ තෘෂ්ණාව ස්ප්‍රෂ්ටව්‍ය තෘෂ්ණාව ය. මනායතනයෙහි පමණක් ස්පර්ශ වන ධම්මාරම්මණය පිළිබඳ තෘෂ්ණාව ධර්ම තෘෂ්ණාව ය.

**වේදනාව නිසා සවැදෑරුම් තෘෂ්ණාව ඇති වන වැඩෙන සැටි මෙසේ දත යුතුය.** ඉතා උස් නො වූ ඉතා මිටි නො වූ ඉතා කළු නො වූ ඉතා සුදු නො වූ ඉතා ස්ථූල නො වූ ඉතා කෘශ නො වූ මනා හැඩහුරුකම ඇත්තා වූ තරුණ වියෙහි වූ කාන්තාවකගේ ශරීරයෙහි, දුටුවන් ගේ සිත් නෙත් පිනවන්නා වූ ඇදගන්නා වූ ප්‍රබෝධ කරන්නා වූ සිත් නෙත්වලට සුව එළවන්නා වූ කාමුක පුරුෂයන්ගේ සිත් අවුල් කරන්නා වූ එක්තරා ස්වභාවයක් ඇත්තේ ය. එයට රූපරසය ය යි කියනු ලැබේ. ඒ කාන්තාව පුරුෂයකු ගේ නෙතට හමුවන කල්හි ඒ පුරුෂයා කෙරෙහි චක්ඛු සම්ඵස්සය හා මනෝ සම්ඵස්සය ඇති වේ. ඒ ස්පර්ශයෙන් පුරුෂයා ගේ සිතට කාන්තාව ගේ රූප රසය මතුකර දෙනු ලැබේ. ඒ හේතුවෙන් පුරුෂයා ගේ සන්තානයෙහි "මේ කාන්තාව බොහොම හොඳය, බොහොම ලස්සන ය" යි රූප රසය ගන්නා වූ විඳින්නා වූ වේදනාව ඇති වේ. ඒ වේදනාව නිසා පුරුෂයා ගේ සිත පිනා යේ. හිරු රැස් පහස ලත් පද්මයක් සේ ප්‍රබෝධ වේ. සිතට අනුව ඔහු ගේ මුහුණ ද ප්‍රබෝධ වේ. පැහැපත් වේ. එබැවින් පුරුෂයාට ඒ

Non-commercial distribution

වේදනාව ඉතා අගය ඇති දෙයකි. ඉතා රස ඇති දෙයකි. ඉතා මිහිරි දෙයකි. එබැවින් ඒ පුරුෂයාට "බොහො ම සැප ය, බොහො ම හොඳ ය, බොහො ම මිහිරිය" යි වේදනාව පිළිබඳ තෘෂ්ණාවක් ඇති වේ.

වේදනාව එක්තරා ධර්මයකි. එබැවින් වේදනාව සම්බන්ධයෙන් උපදනා වූ තෘෂ්ණාවට ධර්මතෘෂ්ණාව ය යි කියනු ලැබේ. මිහිරි වූ ඒ සෞමනස්ස වේදනාව ඇති වූයේ කාන්තාවක ගේ රූප රසය නිසා ය. එබැවින් මිහිරි වූ ඒ සෞමනස්ස වේදනාවට හේතු වන රූප රසය පිළිබඳව ද "බොහො ම ලස්සන ය, බොහො ම හොඳ ය" කියා තෘෂ්ණාව ඇති වේ. රූප රසය නිසා හටගන්නා වූ ඒ තෘෂ්ණාවට රූප තෘෂ්ණාව ය යි කියනු ලැබේ.

ගිනිකූරක හටගත්තා වූ කුඩා ගිනි පුපුර වියළි කොළ ගොඩකට පිදුරු ගොඩකට පැමිණ මහ ගිනි කඳක් වන්නාක් මෙන් රූප රසය නිසා වරක් හටගත්තා වූ ඒ තෘෂ්ණාව රූප රසය හා සම්බන්ධ ඒ ඒ දෙයට පැමිණ මහා තෘෂ්ණා ස්කන්ධයක් වේ. ඒ මෙසේය :–

රූප රසයට ඇලුම් කරන තැනැත්තේ, ඒ රූප රසය නිසා රූපරසය ඇති වස්තුව වූ ඒ ස්ත්‍රී ශරීරයට, 'මේ ස්ත්‍රිය බොහොම ලස්සනය, බොහොම හොඳය, බොහොම ප්‍රියංකරය' යි ඇලුම් කරයි. ශරීරය පිළිබඳ ඇල්ම නිසා ඒ ශරීරය සරසන්නා වූ වස්ත්‍රාභරණ සුවඳ විලවුන් ආදිය ගැන ඇල්ම ඇති වේ. ඒ ස්ත්‍රිය තමා අයත් කර ගැනීමේ ආශාව ඇති වේ. ඉන්පසු ඇගේ ඥතීන් පිළිබඳ තෘෂ්ණාව ඇති වේ. ඇය පෝෂණය කිරීමට වුවමනා ආහාර පාන ඇඳ පුටු මේස යාන වාහනාදිය පිළිබඳ තෘෂ්ණාව ඇති වේ. ඉඩකඩම් ගෙවල් පිළිබඳ තෘෂ්ණාව ඇති වේ. උවමනා දෑ ලබා ගැනීමට තිබිය යුතු මිල මුදල් පිළිබඳව තෘෂ්ණාව ඇති වේ. මෙසේ ඒ රූපතෘෂ්ණාව එකින් එකට පැමිණෙමින් මහා තෘෂ්ණාස්කන්ධයක් වන්නේ ය. ඒ තෘෂ්ණාව රූප ශබ්දදීන් අතුරෙන් කවරකට පැමිණ වැඩුනේ වී නමුත් රූපරසය මුල් කොට ඇති බැවින් එයට රූපතෘෂ්ණාව ය යි කියනු ලැබේ.

Non-commercial distribution

මේ තෘෂ්ණාස්කන්ධයෙන් දීර්ඝ කාලයක් පුද්ගලයා දවනු තවනු ලැබේ. මේ කියන ලදුයේ ස්ත්‍රී රූපයක් සම්බන්ධයෙන් තෘෂ්ණාව ඇති වන ආකාරය යි. මෙසේ රූපතෘෂ්ණාව උපදිනුයේ ස්ත්‍රී රූපය සම්බන්ධයෙන් පමණක් නොවේ. රූප රසය ඇත්තා වූ පණ ඇති නැති වස්තූහු ලෝකයෙහි ඉතා බොහෝය. රූපරසය ආස්වාදනය කරන වේදනාව ඇති වුවහොත් කවර රූපයක් සම්බන්ධයෙන් වුව ද රූපතෘෂ්ණාව ඇති වී වැඩෙන්නේ ය. ඒවා ඇත් වී වැඩෙන සැටි එකින් එක කියතහොත් කෙළවරක් දකීම දුෂ්කරය. කියන ලද්ද අනුව නො කී රූපයන් සම්බන්ධයෙන් තෘෂ්ණාව ඉපද වැඩෙන සැටි සලකා ගත යුතු ය.

ශබ්දයන්හි ඇත්තා වූ මිහිරි බව ශබ්ද රසය යි. තරුණ තරුණියන් ගේ හඬෙහි ද, ළමා හඬෙහි ද, තූර්‍ය්‍ය භාණ්ඩයන් ගේ හඬෙහි ද එය වඩාත් ඇත්තේ ය. ගන්ධයන්හි ඇති මිහිරි බව ගන්ධ රසය යි. ආහාර පානයන්හි ඇති පැණි රස - තිත්ත රස - ලුණු රස - ඇඹුල් රස - කසට රස - කටුක රස යන මේවායේ ඇති මනෝඥ භාවය රස රසය යි. ශරීරයෙහි සැපෙන තද බව - මොළොක් බව - සිහින් බව - මහත් බව - සිසිල් බව - උණුසුම් බව යන ආදියෙහි ඇත්තා වූ ප්‍රියංකර ස්වභාවය ස්ප්‍රෂ්ටව්‍ය රසය යි. ශබ්ද රසාදි මේ රස සතර නිසා ශබ්දතෘෂ්ණාදි තෘෂ්ණා සතර ඉපදී මහ ගිනි කඳු සේ වැඩී සත්ත්වසන්තානය දවන තවන ආකාරය රූපතෘෂ්ණාව සම්බන්ධයෙන් කී කරුණු අනුව සලකා ගත යුතුය. දීර්ඝ වන බැවින් මෙහි නො දක්වනු ලැබේ.

රූප - ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍ය යන පසෙන් අන්‍ය වූ සියල්ලට ම කියන සාමාන්‍ය නාමය **'ධම්'** යනු යි. එකිනෙක වෙන් වශයෙන් කියත හොත් ධර්ම බොහෝ ය. අනේක ප්‍රභේද වූ ඒ ධර්මයන් කෙරෙහි ද අනේකාකාර මනෝඥ ස්වභාවයෝ වෙති. සාමාන්‍යයෙන් ඒ සියල්ලට ම ධර්ම රසයයි කියනු ලැබේ. ධර්ම රසය විඳින වේදනාව නිසා ධර්ම රසය සම්බන්ධයෙන් හටගන්නා වූ තෘෂ්ණාවට ධර්ම තෘෂ්ණාව ය යි කියනු ලැබේ.

ජීවිතය, චක්ෂුරාදි ඉන්ද්‍රිය, ශරීර ශක්තිය, කීමෙහි දක්‍ෂ බව, වැඩ කිරීමෙහි දක්‍ෂ බව, වීර්‍ය්‍යය, නිර්භීත බව, ශූර බව, නුවණ,

Non-commercial distribution

කරුණාව, මෛත්‍රිය, ශ්‍රද්ධාව, පවට ලජ්ජාව, පවට බිය, ලෝභය, දෘෂ්ටිය, මානය, ද්වේෂය, ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මෘෂාවාදය, සුරාපානය, දානය, ශීලය, භාවනාව, සමාධිය යන මේවා තෘෂ්ණාවට හේතුවන ධර්මරසය ඇත්තා වූ අරමුණුවලින් සමහරෙකි. මේවායින් එක එකක් නිසා ධර්ම තෘෂ්ණාව ඇති වී වැඩෙන සැටි දක්වන්නට ගිය හොත් ග්‍රන්ථය ඉතා දීර්ඝ වන බැවින් ක්‍රමය තේරුම් ගත හැකි වනු පිණිස කරුණු දෙක තුනක් නිසා ධර්ම තෘෂ්ණාව ඇති වන සැටි පමණක් මෙහි දක්වනු ලැබේ.

යම් කිසි පිය කෙනකුට වීයඝීවත් දරුවෙක් ඇත්තේ ය. වීයඝීය අර්ථදයක එක්තරා ධර්මයකි. එබැවින් පුතා ගේ වීයඝීය අරමුණු වන කල්හි පියා ගේ සිතෙහි ප්‍රබෝධයක් සුඛස්වභාවයක් ප්‍රීතියක් ඇති වේ. පුතා ගේ වීයඝීයෙහි ඇති පියා ගේ සිත ප්‍රබෝධ කළ හැකි ප්‍රීතිමත් කළ හැකි ස්වභාවය වීයඝී සංඛ්‍යාත ධර්මයා ගේ රසය යි. පුත්‍රයාගේ වීයඝීය පියා ගේ සිතට අරමුණු වන කල්හි ඇතිවන්නා වූ ස්පර්ශයෙන් වීයඝී සංඛ්‍යාත ධර්මයා ගේ රසය මතු වෙයි. ඒ හේතුවෙන් ‘මේ වීයඝීය බොහො ම හොඳ ය, බොහොම උතුම්ය’ යි ඒ රසය විඳින්නා වූ සෝමනස්ස වේදනාව පහළ වේ. ඒ වේදනාව නිසා පුත්‍රයා ගේ වීයඝීය ඉතා යහපතැ යි තෘෂ්ණාව හටගන්නේ ය. පළමුකොට වීයඝීය සම්බන්ධයෙන් හටගත්තා වූ ඒ තෘෂ්ණාව ‘මගේ පුතා බොහොම හොඳය’ යි පුත්‍රයා ගේ සම්පූර්ණ පඤ්චස්කන්ධයට පැමිණ මහත් වෙයි. පුත්‍රයා හට වුවමනා තවත් නොයෙක් දෙයට පැමිණ තවත් මහත් වෙයි.

**ප්‍රේමය යනු ලෝභයට ම නමෙකි**. තරුණියක් තරුණයකුට ප්‍රේම කරයි. ප්‍රේමය යි කියන ලෝභය තරුණයා ගේ සිත්හි ස්පර්ශ වූ කල්හි එහි ඇති ඉෂ්ටාකාරය වූ ධර්මරසය විඳින සෝමනස්ස වේදනාව තරුණයා කෙරෙහි ඇති වෙයි. ඒ සෝමනස්සය නිසා තරුණයා ගේ සන්තානයෙහි ඒ ප්‍රේමය ගැන තෘෂ්ණාවක් ඇති වෙයි. ඉක්බිති “මැය මාහට ප්‍රේම කරන්නියකැ” යි ඇගේ පඤ්චස්කන්ධයට ම ඒ තෘෂ්ණාව පැමිණ මහත් වෙයි. ඉන්පසු ඒ ස්ත්‍රිය සතුටු කරවීමට උවමනා නොයෙක් දෙයට පැමිණ ඒ තෘෂ්ණා නමැති වෘක්ෂය අතුපතරින් වැඩේ. මෙසේ කෙනකු

Non-commercial distribution

ගේ සන්තානයෙහි හටගත් ලෝභය නිසා තවත් කෙනකුගේ සන්තානයෙහි තෘෂ්ණා ස්කන්ධයක් පහළ වේ. සමහර විට තමා තුළ හටගත්තා වූ එක් තෘෂ්ණාවක් අරමුණු කොට ද එසේම තෘෂ්ණා ස්කන්ධයක් පහළ වේ.

යම් කිසිවෙක් ඇතකු සිංහයකු ව්‍යාඝ්‍රයකු වැනි නපුරු සතකු මරයි. පසු ව ඔහුට 'මහ සපන් කමක් කෙළෙමි' යි ප්‍රාණඝාතයේ රසය විඳින සෝමනස්ස වේදනාවක් ඇති වේ. ඉක්බිති ප්‍රාණඝාතය නමැති තමා කළ දස්කම පිළිබඳ ව තෘෂ්ණාව හටගනී. පසුව එය මානාදියට ද එක් වී මහත් වේ. තමන් ගේ සේවකයන් දරුවන් ආදීන් ගෙන් කෙනකු එබඳු ක්‍රියාවක් කළ අවස්ථාවල දී අනුන් කළ ප්‍රාණඝාතය නිසා ද තෘෂ්ණා ස්කන්ධයක් ඇති වේ. නො කියන ලද කරුණු සම්බන්ධයෙන් ද ධර්ම තෘෂ්ණාව ඇති වී වැඩෙන සැටි කල්පනා කළ යුතු. මේ සවැදෑරුම් තෘෂ්ණාවන් අතුරෙන් එක එකක් කාම තෘෂ්ණාව ය, භව තෘෂ්ණාව ය, විභව තෘෂ්ණාව ය යි තුන් ආකාර වන බව ද දක්වා තිබේ.

## තණ්හාපච්චයා උපාදානං

**"තත්ථ කතමං තණ්හාපච්චයා උපාදානං? කාමුපාදානං, දිට්ඨුපාදානං, සීලබ්බතුපාදානං, අත්තවාදුපාදානං ඉදං වුච්චති තණ්හාපච්චයා උපාදානං"** යනුවෙන් කාමුපාදානය, දිට්ඨුපාදානය, සීලබ්බතුපාදානය, අත්තවාදුපාදානය යන සතර; තෘෂ්ණා හේතුවෙන් හටගන්නා උපාදානය යි ප්‍රකාශිත ය.

**ආදාන** යන වචනයේ තේරුම ගැනීම යනු යි. සර්පයකු විසින් මැඩියකු ගන්නාක් මෙන් ද, කබරගොයකු විසින් සර්පයකු ගන්නාක් මෙන් ද ලෙහෙසියෙන් නො හරින පරිද්දෙන් තදින් ගැනීමට උපාදානය යි කියනු ලැබේ. සිත්හි හටගන්නා යම් ධර්මයක් තෙමේ අරමුණ එසේ තදින් ගැනීම කෙරේද, ඒ ධර්මයට ද උපාදානය යි කියනු ලැබේ. මෙහි උපාදානය යි කියනුයේ අරමුණ එසේ තදින් ගැනීම කරන චෛතසික ධර්මයන්ට ය. ඔවුහු කියන ලද සතර දෙන ය. සංක්ෂේපයෙන් කියත හොත් උපාදාන යනු තෘෂ්ණා දෘෂ්ටි යන ධර්ම දෙක ය.

Non-commercial distribution

කාමුපාදනය කවරේ දයි කොටින් කියත හොත් ප්‍රිය කරන්නා වූ අඹු - දරු - නෑ - මිතුරු ආදි පුද්ගලයන් හා ඇත් - අස් - ගව - ආහාර - පාන - ගෙවල් - වස්ත්‍ර - රන් - රිදී - මුතු - මැණික් - කෙත් - වතු - මිල - මුදල් ආදි පණ ඇති නැති වස්තූන් ද ඕනෑම ය කියා තදින් ගන්නා වූ ද, අයත් කරගන්නා වූ ද, මිදවීමට පහසු නො වූ නැවත නැවත ඇති වීමෙන් කල් පැවතීමෙන් වැඩුනා වූ ද ලෝභය කාමුපාදන ය යි කිය යුතු ය.

**"කාම"** යන වචනයෙන් කැමති විය යුතු වස්තුය, ඒවාට කැමති වන්නා වූ තෘෂ්ණාවය යන අර්ථ දෙක ම ලැබෙන්නේ ය. **'කාම'** යන වචනයේ අර්ථය කැමති විය යුතු - ඇලුම් කළ යුතු දෙය ය යි ගන්නා කල්හි, කැමති විය යුතු වස්තු වූ කාමය තදින් ගන්නා වූ ධර්මය කාමුපාදන නම් වේ. 'කාම' යන වචනයෙන් ඇලුම් කරන තෘෂ්ණාවය යන අර්ථය ගන්නා කල්හි තෘෂ්ණා සංඛ්‍යාත තදින් ගැනීම හෙවත් තදින් ගැනීම කරන තෘෂ්ණාව **කාමුපාදන** නම් වේ.

ඇටයෙන් පැළ වූ සැටියේ ම ගස ඉතා දුබලය. එය පහසුවෙන් නැසිය හැකි ය. තිබෙන තැනින් පහ කළ හැකි ය. වර්ෂ ගණනක් ගතවීමෙන් ඒ පැළය විශාල ප්‍රදේශයක් වසා සිටින අතු පතර ඇති පොළොවේ බොහෝ යටට කා වැදුණු බොහෝ දුර පැතිර ගිය බොහෝ ලොකු කුඩා මුල් ඇති, අලියකු විසින් ද නො සෙල්විය හැකි ලෙහෙසියෙන් නො නැසිය හැකි ලෙහෙසියෙන් තිබෙන තැනින් නො පහ කළ හැකි මහ ගසක් වන්නේ ය. එකල්හි එය පැළයක් නො වේ. එමෙන් යම් කිසි අරමුණෙක ප්‍රථම කොට දුබල තෘෂ්ණාවක් උපදී. එය මහ ගසක් නොවී නැසී යන පැළයක් මෙන් සමහර විට ඉබේම ද දුරුවන්නේ ය.දුරු කිරීමට උත්සාහ කළහොත් පහසුවෙන් ම දුරු කළ හැකි වන්නේ ය. මුලදීම දුරු නො වී ඒ අරමුණෙහි නැවත නැවත ඒ තෘෂ්ණාව උපදින්නට පටන් ගත හොත් නැවත නැවත ඉපදීම් වශයෙන් පරණ වුව හොත් පැළය සේම වැඩී අන්තිමේ දී ලෙහෙසියෙන් නො නැසෙන දුරළීමට අතිශයින් දුෂ්කර වූ බලවත් තෘෂ්ණාවක් වන්නේ ය. බලවත් වූ ඒ තෘෂ්ණාවට **කාමුපාදනය** යි කියනු ලැබේ.

Non-commercial distribution

උපාදනත්වයට පැමිණි තෘෂ්ණාවක් දුරු කරවීම බුදු වරයකුට වුව ද පහසු නැත. තමන් වහන්සේ ගේ සස්නෙහි පැවිදි වූ **නන්ද** කුමාරයන් ගේ තෘෂ්ණාව දුරු කරවීමට හා පන්සියයක් **ශාක්‍ය-කෝලිය** කුමාර වරුන් ගේ තෘෂ්ණාව දුරු කරවීමටත් තථාගතයන් වහන්සේට බොහෝ වෙහෙසෙන්නට සිදු වූයේ එහෙයිනි. වැඩුණු තෘෂ්ණාව ය, නො වැඩුණු තෘෂ්ණාව ය යන දෙක ධර්ම වශයෙන් සම වුව ද, පැළය හා මහ ගස මෙන් එකිනෙකට තත්ත්වයෙන් ඉතා වෙනස්ය. යම්කිසි අරමුණක නැවත නැවත තෘෂ්ණාව උපන හොත් එය වැඩී බලවත් වීම ඒකාන්තයෙන් ම සිදු වන්නකි.

යම්කිසි භාණ්ඩයක් ප්‍රථමයෙන් දුටු කල්හි එය හොඳ ය ලස්සනය යි පළමුකොට තෘෂ්ණාව උපදී. එය නැවත නැවතත් උපදනා කල්හි ඒ බඩුව තමන් අයිති දෙයක් කර ගැනීමේ ආශාව ඇති වේ. අයිති කරගත් පසු නැවත අන්‍යයකුට අයත් නො වන සැටියට, නො නැසෙන සැටියට, ආරක්‍ෂා කිරීමේ ආශාව ඇති වේ. මෙසේ තෘෂ්ණාව ක්‍රමයෙන් වැඩීමට පැමිණේ. ස්ත්‍රී පුරුෂයන් සම්බන්ධයෙන් උපදනා වූ ද ඇතැම් ආහාරයන් සම්බන්ධයෙන් උපදනා වූ ද, මත්ස්‍ය මාංශ සම්බන්ධයෙන් උපදනා වූ ද, මද්‍යයන් සම්බන්ධයෙන් උපදනා වූ ද, මෛථුනය සම්බන්ධයෙන් උපදනා වූ ද, සූදුව සම්බන්ධයෙන් උපදනා වූ ද, මිල මුදල් සම්බන්ධයෙන් උපදනා වූ ද තෘෂ්ණාව, විශේෂයෙන් ම වැඩී උපාදනත්වයට පැමිණෙන්නේ ය. '**වේදනාපච්චයා තණ්හා**' යන තන්හි දක්වෙනුයේ නො වැඩුණු දුබල තණ්හාව ය. "**තණ්හා පච්චයා උපාදනං**" යන මෙහි ගැනෙනුයේ වැඩීමෙන් බලවත් වූ තෘෂ්ණාව ය. රූපාදි ආරම්මණ විෂයෙහි වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව නූපන හොත් උපාදන නම් වූ දෘඪතෘෂ්ණාව නූපදනේ ය. එය උපදිනුයේ පළමු දුබල තෘෂ්ණාව උපන හොත් පමණෙකි. තෘෂ්ණාව නිසා උපාදනය වේ ය යි වදළේ එහෙයිනි.

දිට්ඨුපාදන - සීලබ්බතුපාදන -අත්තවාදුපාදන යන තුන ගන්නා ආකාරයන් ගේ වශයෙන් තුනක් වතු දු ධර්ම වශයෙන් එකක් වූ දෘෂ්ටිය ම ය. දකීමට - දනීමට - පිළිගැනීමට දිට්ඨිය යි කියනු ලැබේ. එය ද සම්මාදිට්ඨි - මිච්ඡාදිට්ඨිය යි දෙවදෑරුම්

Non-commercial distribution

වේ. යම් කිසිවක ඇති සැටිය - සිදුවන සැටිය - නිවැරදි ව දැකීම සම්මාදිට්ඨිය යි. යම් කිසිවක් ඇති සැටියෙන් අන්‍යාකාරයකට දැකීම හා යම්කිසි හේතුවකින් සිදු වන්නක් එයින් අන්‍ය හේතුවකින් සිදුවන සැටියට හෝ ඉබේ ම සිදුවන සැටියට හෝ දැකීමත්, නැති දෙයක් ඇති සැටියට දැකීමත්, ඇති දෙයක් නැති සැටියට දැකීමත් මිථ්‍යා දෘෂ්ටිය යි.අකුශල කථා විෂයෙහි මිථ්‍යාදෘෂ්ටිය දක්වීමට නොයෙක් විට දිට්ඨි යන්න පමණක්ම ද යොදනු ලැබේ. දිට්ඨුපාදාන යනු ද එ බඳු තැනකි. දිට්ඨි උපාදනාදි උපාදන තුන විස්තර කිරීමේ දී අන්තිම උපාදනය වූ අත්තවාදුපාදනයේ පටන් විස්තර කළ කල්හි අවබෝධ කර ගැනීම පහසු ය. එබැවින් එසේ කරනු ලැබේ.

වැරදි හැඟීම් නිසා සත්‍ය වශයෙන් නැත්තා වූ මම ය කියා දෙයක් ඇති සැටියට ගෙන "මම ය, මම ය" යි කථා කෙරෙත් ද, ඒ මම ය යි කියනු ලබන දෙය ඇති සැටියට තදින් ගැනීම, නො හොත් තදින් ගන්නා ස්වභාවය **අත්තවාදුපාදනය** යි. සැපදුක් විඳිමින් සිතමින් කියමින් වැඩ කරමින් සිත කය දෙකට අධිපතිකම් කරමින් එක් එක් සන්තානයක් පාසා පවත්නාවූ ප්‍රධාන දෙයකට ලෝකයෙහි ආත්මය යි කියනු ලැබේ. ඒ ඒ තැනැත්තා විසින් එයට කියනුයේ මම ය කියා ය. කෙනකු විසින් මම ය යි කියන දෙයට අන්‍යයෝ නුඹ ය යි ද, තමුසේ ය යි ද, අප්පුහාමි රාළහාමි ය යි ද, හාමුදුරුවෝ ය යි ද, ජේම්ස් අප්පු, ජුවානිස් අප්පු, කරෝලිස් අප්පුය යි ද, මව ය, පියා ය, සහෝදරයා ය, සහෝදරිය යි ද සමහර විට මුදලිතුමා මුහන්දිරම් තුමා රජතුමා ය යි ද කියති.

නුඹ - තමුසේ - අප්පුහාමි - රාළහාමි යනාදි වචන වලින් කියැවෙන දෙය හා මමය යන වචනයෙන් කියැවෙන දෙය එකක් ම බව දත යුතු. මමය යන වචනයෙන් කියැවෙන, ආත්මය කියවෙන වචන පමණ, අන් කිසි ම අර්ථයක් කියවෙන වචන කිසිම භාෂාවක නැත. ඒ අර්ථය දක්වීමට භාෂාවල එපමණ මහත් රාශියක් වචන ඇත්තේ ලෝකයා විසින් එය අන් හැම දෙයට ම වඩා උසස් කොට ප්‍රධාන කොට ගන්නා බැවිනි. ඒ ආත්මය මම ය නුඹ ය යනාදීන් කොතෙක් මහත්කොට - කොතෙක් උසස් කොට ගන්නා ලද්දක් වුවද එය මිනිසුන් ගේ සිත්වල මිස සත්‍ය වශයෙන් ඇතියක් නම්

Non-commercial distribution

නො වේ. එය කල්පනා මාත්‍රයක් මිස, සත්‍ය වශයෙන් ඇතියක් නොවන බව, ලෙහෙසියෙන් තේරුම්ගත නො හැක්කේ ද, ආත්මයක් ඇතය යන හැඟීම උපාදනයක් වී තිබෙන හෙයිනි.

තුඹ ය - මම ය යනාදි වචනවලින් කියවෙන ආත්මය සත්‍ය වශයෙන් නො ලැබෙන්නක් බව දත හැකි වනුයේ, තුඹ සේ මම සේ සත්ත්වයන් පුද්ගලයන් සේ පෙනෙන, නාම රූප ධර්ම සමූහයන් මැනවින් බෙද ඒවා ඇති වන නැති වන සැටිද බැලීමෙනි. ගඟක් ඇති සැටියට ලෝකයා සලකති. ඒ ගඟ කුමක්ද? ජලය ගඟ නම් කළයේ වතුර ද ගඟ විය යුතුය. ජලය ගලායන බිම ගඟ නම් ජලය නැති කල්හි ද ඒ බිම ගඟ විය යුතු ය. එසේ ද නො වේ. එගොඩ ඉවුර හෝ මෙගොඩ ඉවුර හෝ ගඟ යයි කියත හොත් ජලය නැති බිමත් ගඟ විය යුතු වේ. ජලයත් ගලායන බිමත් ඉවුරු දෙකත් හැර ගඟක් ද නැත. මෙසේ වෙන්කර බලන කල්හි ගඟ නො ලැබෙන්නේ, එය මිනිසුන් ගේ සිත්හි මිස අන් තැනක සත්‍ය වශයෙන් නැති බැවිනි.

ගඟ මෙන් ම මමය - තුඹය යනාදීන් සලකන දෙය වූ ආත්මය ද, සත්‍ය වශයෙන් නො ලැබෙන්නක් බැවින්, ආත්ම වශයෙන් සලකන නාමරූප ධර්ම සමූහයක් බෙද බැලූ කල්හි නැති වන්නේ ය. අතුරුදහන් වන්නේ ය. ඒවායේ ඉපදීම් බිඳීම් දෙක ගැන පරීක්‍ෂා කළ හොත් වඩාත් කාරණය පැහැදිලි වන්නේ ය.

බැලීම - ඇසීම - කෑම - බීම - කථාකිරීම යනාදිය සිදු කරන කර්තෘ කෙනකු ඇති විය යුතු ය. 'ආත්මය ඒ කර්තෘය' යනු බොහෝ දෙනා ගේ හැඟීම ය. ඒ හැඟීම ඇති වන්නේ බැලීම් ඇසීම් ආදිය සිදු වන සැටි නො දනීම නිසා ය. මෙය තේරුම් ගැනීමට ඒවා සිදු වන සැටිය ගැන කල්පනා කළ යුතු ය. බෙරයට අතින් ගසන කල ගැසීමට අනුව කුඩා වූ හෝ මහත් වූ හෝ හඬක් නැඟේ. ගැසිය හැකි බව මිස හඬ නංවන ශක්තියක් අතට නැත. පහර ඉසිලීමේ ශක්තිය මිස හඬ නැඟිය හැකි ශක්තියක් හෝ හඬ නැඟීමේ අදහසක් හෝ බෙරයෙහි ද නැත. ඒ හඬ බෙරයත් අතත් දෙකේ ගැටීම නිසා තෙමේ ම හටගත් දෙයකි. එහෙත් බෙරය හඬ නගති යි ලෝකයා සිතති. එමෙන් ඇසෙහි රූපච්ඡායා ගැටුණු කල්හි ඒ හේතුවෙන් ගැටුණු රූපයාගේ ආකාරය ගන්නා විඥනයක් පහළ

Non-commercial distribution

වේ. එයින් ඒ රූපය දනෙයි. පෙනීම ය යි කියනුයේ ද ඒ විඥනය පහළ වීමට ය. බෙර හඬ එකෙණෙහි නැති වන්නාක් මෙන් දකීම නම් වූ ඒ විඥනය එකෙණෙහි ම නිරුද්ධ වන්නේ ය.

ඇසට බැලීමේ අදහසක් හෝ බැලිය හැකි ශක්තියක් හෝ නැත. ඇස බලන්නේ ද නැත. දකීමය යි කියන විඥනයට ද ඇසෙහි රූප නො ගැටුණ හොත් ඉපදිය හැකි ශක්තියක් නැත. ඒ දකීම නම් ඇසත් රූපත් අතර සිදු වන ගැටීම නිසා ඉබේ ම සිදු වන්නකි. මේ සිදුවීමේ ආකාරය නොදනීම නිසා, “මම බලමි ය, මම දකිමි ය” යන හැඟීම ඇති වේ. දක්නා විඥනය පහළ වනුයේ ද ගැටීම සිදු වන සැටියට ය. වඩා දුර නො වූ ද වඩා ළං නො වූ ද තැනෙක තිබෙන, වඩාම කුඩා නො වූ ද රූපයක් ඇසෙහි ගැටුණ හොත් ඒ වස්තුවේ ආකාරය ඉතා හොඳින් ගන්නා වූ බලවත් වූ විඥනයක් පහළ වේ. ආලෝකය මඳ වුවහොත් ඒ ඒ පමණට දුබල වූ පෙනීමක් වේ. දුර වන කල්හි ද එසේම ය. අරමුණ ඉතා දුර වී නම් පෙනීම වනුයේ ඒ වස්තුවේ නියම ආකාරයට බොහෝ වෙනස් ආකාරයකිනි. අහසේ දුර තිබෙන ඉර හඳ තරුවල සැබෑ තත්ත්වය නො දත හැක්කේ එහෙයිනි.

අභ්‍යන්තරයෙහි බැලීම් කරන, බැලිය හැකි ශක්තියක් ඇති, මම ය කියා කෙනකු හෙවත් ආත්මය කියා දෙයක් ඇති නම් සෑම කල්හි ම ඒ ආත්මයට ඒ ඒ වස්තූන් ඇති සැටියට ම බැලිය හැකි විය යුතු ය. එසේ නොහැකි වනුයේ, ඇසේ හොඳ නොහොඳ බවේ සැටියටත්, ආලෝකයේ අඩු වැඩි කමේ සැටියටත් වස්තුව දුර වීම් ළං වීම් දෙකේ සැටියටත් නොයෙක් ආකාරයෙන් සිදු වන්නා වූ එය, ඉබේ ම සිදුවන්නක් මිස කෙනකු විසින් කරන්නක් නො වන බැවිනි. ඇසීම සිතීම කථා කිරීම වැඩ කිරීම යනාදිය සිදු වන්නේ ද පෙනීම සිදු වන ලෙස කරන කෙනකු නැතිවම ය. කරුණු මෙසේ හෙයින් පෘථග්ජන ලෝකයා සලකන සැටියට සත්‍ය වශයෙන් ලැබෙන මම ය - නුඹ ය - ආත්මය කියා දෙයක් නැති බව දත යුතු ය. නැත්තා වූ ආත්මයක් ඇති සැටියට ගැනීම මිථ්‍යා දෘෂ්ටියකි. **අත්තවාදුපාදනය** යනු දඩි වූ ඒ දෘෂ්ටිය ය.

Non-commercial distribution

හිමියකු නැති දෙයක් දුටු කල්හි එයට ආශාව ඇති වූ තැනැත්තේ ම එය අයිති කර ගනී. ආශාව ඇති නො වූ තැනැත්තේ ම එය හැර යයි. එමෙන් පඤ්චස්කන්ධය හොඳ ය කියා එය ගැන තෘෂ්ණාවක් ඇති වුවහොත් ඒ පඤ්චස්කන්ධය මම ය - ආත්මය ය කියා තදින් ගනී. තෘෂ්ණාව නූපන්න හොත් ඒ ගැනීම නො කරයි. තෘෂ්ණාව ඇති වුවහොත් ඒ ගැනීම සිදුවන බැවින් මේ පටිච්චසමුප්පාද දේශනයෙහි තෘෂ්ණාව නිසා අත්තවාදුපාදනය වන බව ද වදළ සේක. දෘෂ්ටීන් අතුරෙන් ප්‍රධාන කොට සැලකිය යුතු දෘෂ්ටිය අත්තවාදුපාදන නම් වූ මේ ස්වකාය දෘෂ්ටිය ය. එය නැති කර ගතහොත් එයින් ම දෘෂ්ටි සියල්ල ම දුරු වන්නේ ය. හැම දෘෂ්ටියක් ම නැඟ එන්නේ මේ ස්වකාය දෘෂ්ටියේ සම්බන්ධය ඇති ව එහි ශාඛාවක් වශයෙනි. ස්වකාය දෘෂ්ටිය ප්‍රධානය යි කියනුයේ එ හෙයිනි.

උපාදන සතර අතුරෙන් කාමුපාදන අත්තවාදුපාදන දෙක බෞද්ධාබෞද්ධ සැමට ම සාධාරණ වශයෙන් ඇති වන්නේ ය. දිට්ඨුපාදන සීලබ්බතුපාදන දෙක ඇතිවනුයේ අබෞද්ධයන්ට පමණකි. ඒකාන්තයෙන් සසර දුකින් එතර කොට නිවනට පැමිණවීමේ සත්‍ය මාර්ගය දක්වන්නා වූ තථාගතයන් වහන්සේ ගේ අත්‍යුත්තම ධර්මය නො ඇසූ නොම දත් ඇතැම්හු, අලුත් පව් කිරීම නවත්වා, දුක් විඳීමෙන් කළ පව් ගෙවා අවසන් කොට ශුද්ධියට පැමිණෙන්නට සිතූහ. තිරිසන් සතුන් හැසිරෙන සේ හැසිරීම ඔවුන් ගෙන් සමහරකු එය සඳහා ගත් මග ය. ගවයා ගේ ප්‍රකෘති චාරිත්‍රය **ගෝශීල** නම්. එනම් සතර පයින් යාම, සතර පයින් සිටීම, බිමම හිඳීම හා නිදීම, අතින් නො ගෙන බිම තිබෙන දෙය මුවෙන් ම කෑම, මලමූත්‍ර කොට පවිත්‍ර කර නො ගැනීම, නො බිනීම යන මේවා ගවයා ගේ ප්‍රකෘති චාරිත්‍රයෝ ය.

සර්වසම්පූර්ණත්වයෙන් හෝ ඒක දේශයකින් හෝ සමාදන් වූවහුගේ ඒ ප්‍රතිපත්තිය **ගෝව්‍රත** නම්. බල්ලා ගේ ප්‍රකෘති චාරිත්‍රය **කුක්කුරශීල** නම් වේ. එය සමාදන් වූවහුගේ ප්‍රතිපත්තිය **කුක්කුරව්‍රත** නම්. බොහෝ දුක් ගෙන මේ ව්‍රතයන් රක්‍ෂා කළේ වී නමුත් එයින් ඔවුන් අදහස් කරන ශුද්ධිය හෝ දේවත්වය-බ්‍රහ්මත්වය

Non-commercial distribution

හෝ කිසි කලෙක ඔවුනට නො ලැබෙන්නේ ය. කුක්කුරව්‍රතය සමාදන් ව රක්‍ෂාකළ **කෝරක්ඛත්තිය** නම් නිගණ්ඨයා සතර අපායෙන් එකකට අයත් වූ කාළකඤ්ජික අසුර නිකායෙහි උපන් බව **'දීඝනිකායේ'** පාථික සූත්‍රයෙහි දක්වා තිබේ.

මේ ගෝශීල ගෝව්‍රතාදියෙන් මරණින් මතු නරකයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ උපදනා බව **'මජ්ඣිම නිකායේ'** කුක්කුරවතිය සූත්‍රයෙහි ද වදරා තිබේ. ගෝශීල ගෝව්‍රතාදියෙන් ශුද්ධියක් ලැබේය යි ගැනීම වැරදි ගැනීමක් බැවින් මිථ්‍යාදෘෂ්ටියකි. ගෝශීල ගෝව්‍රත කුක්කුරශීල කුක්කුරව්‍රතාදියෙන් ශුද්ධියක් වන බව පරම සත්‍යයක් කොට තදින් ගැනීම නැතහොත් එසේ ගන්නා වූ මිථ්‍යා දෘෂ්ටිය **සීලබ්බතුපාදානය** යි. පඤ්චස්කන්ධයට ඇලුම් නො කරන්නකුට මෙම දෘෂ්ටිය ඇති නො වේ. ඇති වනුයේ පඤ්චස්කන්ධයට ඇලුම් කොට එය ආත්ම වශයෙන් ගෙන ඒ ආත්මය සැපයෙන් යුක්තකිරීමේ ක්‍රම නුනුවණින් සොයන්නහුට ය. තෘෂ්ණාව නිසා සීලබ්බතුපාදානය ඇති වන බව වදළේ එහෙයිනි.

ලෝකයේ බොහෝ දෘෂ්ටීහු ඇතහ. බ්‍රහ්මජාල සූත්‍රයෙහි දෘෂ්ටි දෙසැටක් දක්වා තිබේ. අත්තවාදුපාදාන සීලබ්බතුපාදාන දෙකට නො ගැනෙන්නා වූ, 'කිසිදු සැකයක් නැතිව, අන් ඒවා හිස් ය, මෙය ම පරම සත්‍යය' යි දැඩි කොට ගන්නා වූ සකල දෘෂ්ටීහු ම දිට්ඨුපාදාන නම් වේ. මෙය ම සත්‍යය යි දැඩි කොට ගැනීමක් නැති වැරදි හැඟීම්, දෘෂ්ටි වුව ද උපාදාන සංඛ්‍යාවට නො ගැනෙයි.

ධම්මසංගණී ප්‍රකරණයෙහි :–

**තත්ථ කතමං දිට්ඨුපාදානං? නත්ථි දින්නං, නත්ථි යිට්ඨං, නත්ථි හුතං, නත්ථි සුකටදුක්කටානං කම්මානං ඵලං විපාකෝ, නත්ථි අයං ලෝකෝ, නත්ථි පරෝ ලෝකෝ, නත්ථි මාතා, නත්ථි පිතා, නත්ථි සත්තා ඕපපාතිකා, නත්ථි ලෝකේ සමණබ්‍රාහ්මණා සමග්ගතා සම්මා පටිපන්නා යෙ ඉමඤ්ච ලෝකං පරඤ්ච ලෝකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදෙන්ති.**

යනාදීන් මිථ්‍යාදෘෂ්ටි දශයක් දිට්ඨුපාදානය දක්වන තන්හි ස්වරූපයෙන් උද්ධරණය කොට දක්වා තිබේ.

Non-commercial distribution

ඒ දශය නම් :–

1. ‘දීමෙන් ඵලයක් නැත ය’ යනු එකකි.
2. ‘යිට්ඨ නම් වූ මහාදන මහා පූජාවන්ගෙන් ඵලයක් නැත ය’ යනු එකකි.
3. ‘හුත නම් වූ ප්‍රතිග්‍රාහකයන් කැඳවා දෙන දනය, පැමිණියා වූ ආගන්තුකයනට දෙන දනය, ආවාහ විවාහාදියෙහි මංගලය පිණිස දෙන දනය යන මේවායේ ඵලයක් නැත ය’ යනු එකකි.
4. ‘දශ කුශලය දශ අකුසලය යන හොඳ නරක දෙකින් වන ඵලයක් නැත ය’ යනු එකකි.
5. ‘පරලොව්හි සිටින්නවුන්ට නැවත පැමිණීමට මෙලොවක් නැත ය’ යනු එකකි.
6. ‘මෙලොව සිටින්නවුන්ට මරණින් මතු යාමට පරලොවක් නැත ය’ යනු එකකි.
7. ‘මවට කරන හොඳ නරකකින් වන ඵලයක් නැත ය’ යනු එකකි.
8. ‘පියාට කරන හොඳ නරකකින් වන ඵලයක් නැත ය’ යනු එකකි.
9. ‘නැවත නැවත මැරී මැරී උපදනා සත්ත්වයෝ නැත ය’ යනු එකකි.
10. ‘යම්කිසි ප්‍රතිපත්තියක බලයෙන් මෙලොව පරලොව දෙක ඇති බව හරියට ම දැන ප්‍රකාශ කරන ශ්‍රමණබ්‍රාහ්මණ කෙනෙක් නැත ය’ යනු එකකි.

මෙම දෘෂ්ටි සියල්ල ම ඇතිවන්නේ පඤ්චස්කන්ධයට ඇළුම් කොට තුනුවණින් එය සැපවත් කිරීමේ ක්‍රම සොයන කල්හි ය. එබැවින් තෘෂ්ණාව නිසා දිට්ඨුපාදනය ද ඇති වේය යි කියනු ලැබේ.

## උපාදන පච්චයා භවෝ

**“තත්ථ කතමෝ උපාදනපච්චයා භවෝ? භවෝ දුවිධේන, අත්ථි කම්මභවෝ, අත්ථි උපපත්තිභවෝ, තත්ථ කතමෝ කම්මභවෝ? පුඤ්ඤාභිසංඛාරෝ අපුඤ්ඤාභිසංඛාරෝ ආනෙඤ්ජාභිසංඛාරෝ, අයං**

Non-commercial distribution

**වුච්චති කම්මභවෝ. සබ්බම්පි භවගාමිකම්මං කම්මභවෝ. තත්ථ කතමෝ උපපත්තිභවෝ? කාමභවෝ රූපභවෝ අරූපභවෝ. සඤ්ඤාභවෝ අසඤ්ඤාභවෝ නේවසඤ්ඤානාසඤ්ඤාභවෝ. ඒකවෝකාරභවෝ. චතුවෝකාරභවෝ. පඤ්චවෝකාරභවෝ. අයං වුච්චති උපපත්තිභවෝ. අයං වුච්චති උපාදානපච්චයා භවෝ."**

**මෙහි තේරුම මෙසේය** :-

"උපාදන හේතුවෙන් හටගන්නා භවය කවරේද? භවය දෙපරිද්දකින් දත යුතු ය. කර්මභවයෙක් ද ඇත. උපපත්තිභවයෙක් ද ඇත. එහි කර්මභවය කවරේ ද? පුණ්‍යාභිසංස්කාරය අපුණ්‍යාභිසංස්කාරය ආනෙඤ්ජාභිසංස්කාරය යන මෙය කර්මභවය යි කියනු ලැබේ. සකල භවගාමීකර්මය කර්මභවය ය. එහි උපපත්තිභවය කවරේ ද? කාමභවය, රූපභවය, අරූපභවය, සංඥභවය, අසංඥභවය, නේවසංඥනාසංඥභවය, ඒකවෝකාර භවය, චතුවෝකාරභවය, පඤ්චවෝකාරභවය යන මෙය උපපත්ති-භවය යි කියනු ලැබේ. මෙය උපාදන හේතුවෙන් හටගන්නා භවය" යි කියනු ලැබේ.

කියන ලදුයේ උපාදන ප්‍රත්‍යයෙන් වන්නා වූ භවය **විභංගපාළියෙහි** දක්වුණු ආකාරය යි. ඒ භවය කොටින් සලකා ගත යුත්තේ මෙසේ ය. සත්ත්වසන්තානයෙහි උපාදනයන් ඇති වී ඒවා ලියලන්නට වැඩෙන්නට වූ කල්හි ඒවා නිසා තවත් දෙයක ඇති වීමක් වැඩීමක් වන්නේ ය. උපාදනයන් නිසා ඇති වන ඒ දෙය භව නම් වේ. එනම් ප්‍රාණඝාතාදි වශයෙන් දශප්‍රභේද වූ අකුශලය ය, දනාදි වශයෙන් දශප්‍රභේද වූ කුශලය ය, කුශලාකුශලයන් නිසා මතු ඒ ඒ භූමිවල හටගන්නා ස්කන්ධයෝය යන මොවුහු ය. එයින් 'දශප්‍රභේද වූ අකුශලය, දශප්‍රභේද වූ ලෞකික කුශලය' යි කියනු ලබන පින් පව් දෙකට 'කර්‍මභවය' යි කියනු ලැබේ. ඒ කර්මයන් කළ නිසා ඇතිවන්නා වූ සත්ත්වසන්තානයන්ට අයත් වූ ස්කන්ධයන්ට 'උපපත්තිභවය' යි කියනු ලැබේ.

උපපත්තිභවයඃ කාමභවය - රූපභවය - අරූපභවය යි තෙවැදෑරුම් වේ. සංඥභවය, අසංඥභවය, නේවසංඥනාසංඥභවය යි තවත් ආකාරයකින් තෙවැදෑරුම් වේ. ඒකවෝකාරභවය,

Non-commercial distribution

චතුවෝකාරභවය, පඤ්චවෝකාර භවය යි තවත් ආකාරයකින් තෙවැදෑරුම් වේ. මේ තුන් ආකාරයෙන් බෙදී යන භව සියල්ල එක් කොට ගත්විට භව නවයක් වේ.

අපාය සතරය, මිනිස් ලොවය, දෙව්ලොව සයය යන එකොළොස් භූමියෙහි උපදනා සත්ත්වයන් ගේ උපාදින්නස්කන්ධයෝ **කාමභව** නම් වෙති. සොළොස් රූපභූමියෙහි උපදනා සත්ත්වයන් ගේ උපාදින්නස්කන්ධයෝ **රූපභව** නම් වෙති. අරූතල සතරෙහි හැසිරෙන සත්ත්වයන්ගේ උපාදින්නස්කන්ධයෝ **අරූපභව** නම් වෙති. කාමභූමි එකොළොසය, අසංඥභූමිය හැර ඉතිරි රූපාවචර භූමි පසළොසය, යට අරූපභූමි තුනය යන මේ භූමීන්හි උපදනා සත්ත්වයන් ගේ උපාදින්නස්කන්ධයෝ **සංඥභව** නම් වෙති. අසංඥභූමියෙහි උපදින්නවුන් ගේ උපාදින්නස්කන්ධයෝ **අසංඥභව** නම් වෙති. භවාග්‍රය යි කියනු ලබන අන්තිම අරූපභූමියෙහි උපදින්නවුන් ගේ උපාදින්නස්කන්ධයෝ **නේවසංඥානාසංඥාභව** නම් වෙති.

**'වෝකාර'** යනු ස්කන්ධයන්ට ම නමෙකි. අසංඥභූමියෙහි ඇත්තේ රූපස්කන්ධය පමණෙකි. එබැවින් එහි සත්ත්වයන් ගේ උපාදින්නස්කන්ධයෝ **ඒකවෝකාර භව** නම් වෙති. අරූප භූමීන්හි ඇත්තේ නාමස්කන්ධ සතර පමණෙකි. එබැවින් ඒවායේ සත්ත්වයන් ගේ උපාදින්නස්කන්ධයෝ **චතුවෝකාරභව** නම් වෙති. පඤ්චස්කන්ධය ඇති ඉතිරි භූමීන්හි සත්ත්වයන් ගේ උපාදින්නස්කන්ධයෝ **පඤ්චවෝකාර භව** නම් වෙති. සත්ත්වසන්තානයට අයත් ස්කන්ධයන් අතර කර්මයෙන් හටගන්නා කොටසක් හා අන්‍ය හේතුන්ගෙන් හටගන්නා කොටසක් ද ඇත්තේ ය. **උපාදින්නස්කන්ධයයි** කියන ලදුයේ කර්මයෙන් හට ගන්නා ස්කන්ධයන්ට ය. **'උපාදානපච්චයා භවෝ'** යන මෙහි ගනු ලබනුවෝ කර්මයෙන් හටගන්නා ස්කන්ධයෝ ය.

උපාදානයන් නිසා භවය ඇතිවන සැටි මතු දක්වන පරිදි දත යුතු ය. කර්මභව උපපත්තිභව දෙකින් කර්ම භවය අකුශලකර්මභවය කුශලකර්ම භවය යි දෙවැදෑරුම් වේ. තෘෂ්ණාව රූපතෘෂ්ණාදි වශයෙන් සවැදෑරුම් වන්නාසේ ම කාමුපාදානය ද, රූපකාමුපාදානාදි

Non-commercial distribution

වශයෙන් සවැදෑරුම් වන බව ද සැලකිය යුතුය. මස් රසයට ලොල් වූ තැනැත්තා හට නිතරම එය අනුභව කරන්නට සිත් වෙයි. ඔහු ඒ නිසා ඌරු - කුකුළු - ගවාදි සතුන් මරන්නටත් මරවන්නටත් පටන්ගනී. මස් රසයට ආශාව කාමුපාදනය යි. ඔහු ගේ සතුන් මැරීම මැරවීම ඒ කාමුපාදනයේ මෙහෙයීමෙන් සිදු වන්නකි. ඇතැම්හු තමන් ගේ ගොවිතැන් පාලු කරන සතුන් ද, තවත් තමන් ඇලුම් කරන වස්තුන් නසන සතුන් ද මරා දමති. සමහරු තමන් ඇලුම් කරන වස්තූන් ලබාගනු පිණිස මුදල් සැපයීම සඳහා සතුන් මරති. සමහරු අඹුදරුවන් රකිනු සඳහා සතුන් මරති. ඒ ප්‍රාණඝාත කර්ම සියල්ල ම සිදු වන්නේ කාමුපාදනය නිසා ය.

ඇතැම් මිථ්‍යාදෘෂ්ටිකයෝ දෙවියන් සතුටුකොට දෙව්ලොව යන බලාපොරොත්තුවෙන් දෙවියන් පිදීම සඳහා සතුන් මරති. ඇතැම්හු දෙවියන් සතුටු කරවනු පිණිස දන්දීම සඳහා සතුන් මරති. ඇතැම්හු 'සත්ත්වයෝ මනුෂ්‍යයා ගේ ප්‍රයෝජනය පිණිස දෙවියන් විසින් මවන ලද්දෝ ය' යි සලකා ගෙන සතුන් මරති. ඇතැම්හු මහායාග පවත්වනු පිණිස බොහෝ සතුන් මරති. මරවති. මේ දිට්ඨුපාදනය නිසා ප්‍රාණඝාත කර්මය සිදුවන සැටි ය.

ඇතැම්හු ආත්මය කල් පැවැත්ම සඳහා, නිරෝග කරනු සඳහා, බලවත් කරනු සඳහා සතුන් ගේ බිත්තර කති. කුකුළු - වටු ආදි සතුන් මරා කති. මරවා ගනිති. ආත්මය ආරක්ෂා කරනු පිණිස උකුණන් මකුණන් මැස්සන් මදුරුවන් මරති. බල්ලන් සර්පයන් මරති. තවත් සතුන් ද මරති. අඹුදරුවන් ගේ ආත්මාරක්ෂාව සඳහා ද එසේ කරති. ඒ අත්තවාදුපාදනය නිසා ප්‍රාණඝාතකර්මය සිදුවන ආකාරයයි. මෙසේ උපාදනයන් ගේ මෙහෙයීමෙන් සත්ත්වයා විසින් ප්‍රාණඝාත කර්මය කරනු ලැබේ. අදත්තාදනාදි අකුශලයන්, උපාදනයන් නිසා කරන සැටි ද, කියන ලද්දට අනුව කල්පනා කර ගත යුතු ය. ග්‍රන්ථය මහත් වන බැවින් මෙහි නො දක්වනු ලැබේ. අකුශලකර්මදශය අතුරෙන් කාමමිථ්‍යාචාරය හා අවිද්‍යාව කාමුපාදනය නිසාම සිදුවන බව ද, මිථ්‍යාදෘෂ්ටි කර්මය ඉතිරි උපාදන තුන නිසා සිදු වන බව ද මෙහි ලා විශේෂයෙන් සැලකිය යුතු ය.

දන් දීමෙන් මිනිස්ලොව පොහොසත් පවුල්වල - සිටු පවුල්වල - රජ පවුල්වල ඉපද ප්‍රණීත ආහාරපාන - වස්ත්‍ර - යාන - වාහන

Non-commercial distribution

වාසස්ථානාදිය ලැබිය හැකි බව හා දෙව්ලොව ඉපද එයටත් වඩා ප්‍රණීත කාමසම්පත් ලැබිය හැකි බව ද අසන කල්හි; බෙර හඬ ඇසෙන කල්හි පිස්සුව ඇවිස්සෙන්නාක් මෙන්, කාමුපාදනය ඇති තැනැත්තා කෙරෙහි ඒ කාමුපාදනය නැඟ නැඟ එන්නට පටන්ගනී. ගින්නකට තෙල් ඉසින කල්හි එය බුර බුරා නැඟ එන්නාක් මෙන්, කාමුපාදන ගින්න බුර බුරා නඟින්නට පටන් ගනී. එයින් මෙහෙයන ලද තැනැත්තා මිනිස් ලොව හා දෙව්ලොව කාමයන් ලබනු පිණිස ආහාර පාන වස්ත්‍රාදිය දන් දෙයි. මල්පූජා පහන් පූජාදිය කරයි. වතු කුඹුරු ආදිය පුදයි. විහාර - දාගැබ් - සංඝාවාස - පාසල් - අම්බලම් - ළිං - පොකුණු ආදිය කරවයි. සිල් රැකි කල්හි ඒ පිනෙන් ඒවා ලැබිය හැකි බව ඇසූ කල්හි, කාමුපාදනය නැඟී එයින් මෙහෙයන ලදුව, පන්සිල් අටසිල් දසසිල් ආදි සිල් රකී. සමහරවිට පැවිදිව ද සිල් රකී. භාවනාමය කුශලයෙන් ඒවා ලැබිය හැකි බව ඇසූ කල්හි, භාවනාවෙහි යෙදෙයි. මේ කාමුපාදනය නිසා දාන ශීල භාවනාමය කුශලයන් ඇති වන ආකාරය යි.

දානාදි පින්කම්වලින් දෙවියන් සතුටු කරවීමෙන් කියන ලද සම්පත් ලැබිය හැකිය යන දෘෂ්ටිය ඇත්තෝ කාමුපාදන දිට්ඨුපාදන දෙකින් ම මෙහෙයන ලදුව දන් දීම් සිල් රැකීම් භාවනාවෙහි යෙදීම් කරති. ඒ කාමුපාදන දිට්ඨුපාදන දෙක නිසා දාන ශීල භාවනා සංඛ්‍යාත කුශල කර්මභවය ඇති වන ආකාරය යි.

දන්දීම් ආදි පින්වලින් දිව්‍යලෝක - මනුෂ්‍යලෝක දෙක්හි, දීර්ඝායු ඇති, වර්ණසම්පත්තිය ඇති, නිරෝග බව ඇති, තේජස් ඇති, අධිපති බව ඇති, මනා නුවණ ඇති, සිහිය ඇති, ධෛර්‍ය්‍ය ඇති, උසස් ආත්මයන් ලැබිය හැකි බව ඇසූ කල්හි, අත්තවාදුපාදන ගින්න නගින්නට පටන් ගනී. එයින් මෙහෙයන ලද තැනැත්තා උසස් ආත්මයන් ලබනු සඳහා දන්දීම කරයි. සිල් රැකීම කරයි. භාවනා කරයි. රූපාරූප බ්‍රහ්මයන් ගේ ආත්මභාව සම්පත්තිය ඇසූ කල්හි එයට පැමිණීම සඳහා ගිහිගෙය හැර පැවිදිව සිල් රකියි. ධ්‍යාන වඩයි. මේ අත්තවාදුපාදනය නිසා දාන ශීල භාවනා සංඛ්‍යාත කුශලකර්මභවය ඇති වන ආකාරය යි.

Non-commercial distribution

මෙහි දක්වන ලදුයේ ඒ ඒ උපාදනයන් නිසා ඒ ඒ කුශලාකුශල කර්‍මයන් බොහෝ සෙයින් ඇති වන ආකාරය යි. පෘථග්ජන පුද්ගලයා පිස්සකු වැනි ය. ඔහු කවර උපාදනයක් නිසා වුව ද, පින්පව්වලින් කවරක් වුව ද නො කරන්නේ නො වේ. එබැවින් උපාදන සතර ම නිසා කුසල් වූ ද අකුසල් වූ ද සැම කර්‍මයක් ම සිදු විය හැකි බව සාමාන්‍යයෙන් කිය යුතු ය.

කුඹුරක හටගන්නා වී වලින් එක් කොටසක් බොල් වේ. කොටසක් මතු ගොයම ඇති කිරීමේ ශක්තිය වූ බීජශක්තිය ඇත්තා වූ යහපත් වී වේ. එමෙන් උපාදනයන් නිසා සත්ත්වයන් විසින් කරන කර්මයන් ගෙන් එක් කොටසක් මතු උත්පත්තියක් ඇති කිරීමෙහි සමත් බවක් නැත්තා වූ දුබල කර්මයෝ වෙති. කොටසක් අනාගතයෙහි සත්ත්වයා ඒ ඒ භවයට පැමිණවීමේ ශක්තියෙන් යුක්ත වූ බලවත් කර්මයෝ වෙති. දුබල පින් පව්වලට කර්මය යි ද, අනාගතයෙහි ප්‍රතිසන්ධි දනයට සමත් වූ බලවත් කර්‍මයන්ට **කම්පථය** යි ද කියනු ලැබේ. දුබල කර්මයෝ අභාවප්‍රාප්ත වෙති. බලවත් කර්මයෝ විපාක බවට පැමිණීම් වශයෙන් අනාගතයෙහි සත්ත්වයන් ඒ ඒ භවයට පමුණුවති. එහෙයින් කාමභවයෙහි ඉපදීමට හේතුවන කර්මයෙන් කාමභවය ඇති කරනු ලැබේ. රූපභවයෙහි ඉපදීමට හේතුවන කර්මයෙන් රූපභවය ඇති කරනු ලැබේ. අරූපභවයෙහි ඉපදීමට හේතු වන කර්මයෙන් අරූපභවය ඇති කරනු ලැබේ. සංඥභවාදීහු කියන ලද භවයන්ගේ ම ප්‍රභේදයෝ ය. මෙසේ උපාදන හේතුවෙන් ඇතිවන කර්මභවය නිසා නව වැදෑරුම් උපපත්තිභවය නැවත නැවතත් ඇති වේ.

උපපත්තිභවය කර්ම හේතුවෙන් හටගන්නා කල්හි **“උපාදනපච්චයා භවො”** යි ‘කර්මභව උපපත්තිභව දෙක ම උපාදන හේතුවෙන් වේ ය’ යි වදළේ කුමක් නිසා ද? යන ප්‍රශ්නය මෙ තැන්හි පහළ වේ. එහි කාරණය මෙසේ දත යුතු.

ක්ලේශයෝ වනාහි සා පිපාසාවන් මෙන් සත්ත්ව සන්තානය දවන්නා වූ තවන්නා වූ ස්වභාවයෝ ය. සාගින්න නිවාගැනීමට ආහාරය ද, පිපාසය නිවා ගැනීමට පානවර්ග ද ඇතුවාක් මෙන් ඒ ඒ ක්ලේශයන් නිසා වන දැවිල්ල තැවිල්ල සන්සිඳවා ගැනීමට

Non-commercial distribution

වුවමනා ක්ලේශාහාර කොටසක් ද ඇත්තේ ය. උපාදනයෝ ද අන් නමකින් කියන ක්ලේශයෝ ය. ඒවායේ ද සන්තානය දවන තවන ස්වභාවය ඇත්තේ ය. කාමුපාදනය යනු රූපශබ්දදි කාමවස්තූන් පැතීම ය. එය එක්තරා දැවීමකි, තැවීමකි. ඒ දැවිල්ල නො ඉවසිය හැකි බැවින් සන්තානයෙහි කාමුපාදනය නැගී සිටි සත්ත්වයා එය නිවාගනු පිණිස කාමවස්තූන් සොයන්නේ ය. කාමුපාදන ගින්න නිවන, සන්සිඳවන දෙය නම් කාමවස්තූහු ය. කාමවස්තු කාමුපාදනයේ ආහාරය යි.

අත්තවාදුපාදනය භවසම්පත්තිය පිළිබඳ වූවකි. ඒ අත්තවාදුපාදන ගින්නට ආහාරය භවසම්පත්තිය ය. එබැවින් උපාදනයන් නැගී අවුත් ඒ ගින්නෙන් දැවෙන තැවෙන සත්ත්වයා සොයන පතන දෙය නම් කාම වස්තු හා භව සම්පත්තිය ය. ඔහු කාමවස්තූන් හා භවය ලබාගැනීමට, ඇතිකර ගැනීමට උත්සාහ කරයි. කර්මභවය යනු ඒ කරන උත්සාහය යි. එය අප්‍රධාන දෙයකි. උපාදනයන්ට ප්‍රධාන වශයෙන් වුවමනා දෙය භව සම්පත්තිය වූ උපපත්ති භවය යි. කර්මය උපපත්ති භවයට හේතු වතුදු උපාදනය ම උපපත්ති භවය ඇති වීමේ මූලික හේතුව වේ. එබැවින් උපාදනය නිසා කර්මභව උපපත්තිභව දෙක ම ඇති වේ ය යි කීම යුක්ති යුක්තය.

**'අවිජ්ජාපච්චයා සංඛාරා'** යනුවෙන් වරක් දක්වන ලද කර්මය ම නැවත උපාදනයන් ගේ ඵල වශයෙන් දැක්වීම නිරර්ථක නො වේ ද? යනු මෙහි ඇති වන තවත් ප්‍රශ්නයකි. මේ පටිච්චසමුප්පාද දේශනය ජාති තුනක් හා සම්බන්ධය. "අවිජ්ජාපච්චයා සංඛාරා" යන තන්හි දක්වන ලද කර්මය අතීත ජාතියට අයත් වූ වර්තමාන භවය ඇතිවීමට හේතු වූ කර්මය යි. "උපාදනපච්චයා භවො" යන මෙහි දක්වන කර්මය වර්තමාන භවයට අයත් වූ අනාගත භවයට හේතු වන කර්මය යි. අතීත භවයෙන් වර්තමාන භවයට පැමිණීම හා වර්තමාන භවයෙන් අනාගත භවයට පැමිණීමත් දක්වන මේ දේශනයෙහි දෙතැනක කර්මය දැක්වීම කළ යුතු ම ය. එබැවින් කර්මය දෙතැනක දැක්වීම නිෂ්ඵල නො වන බව දත යුතු ය.

Non-commercial distribution

# භවපච්චයා ජාති

**"තත්ථ කතමා භවපච්චයා ජාති? යා තේසං තේසං සත්තානං තම්හි තම්හි සත්තනිකායේ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභවෝ ආයතනානං පටිලාභෝ. අයං වුච්චති භවපච්චයා ජාති."**

මේ **විභංගප්‍රකරණයෙහි** භවප්‍රත්‍යයෙන් හටගන්නා ජාතිය විස්තර කර තිබෙන ආකාරය යි. එහි තේරුම :– "එහි ජාතිය කවරේ ද? ඒ ඒ සත්ත්වයන් ගේ ඒ ඒ සත්ත්ව නිකායයෙහි යම් පළමු කොට ඉපදීමක් වේ ද, සම්පූර්ණ ඉපදීමක් වේ ද, මවු කුසයට ඇතුළු වීමක් වේ ද, ප්‍රකටව ඉපදීමක් වේ ද, ස්කන්ධයන් ගේ පහළ වීමක් වේ ද, ආයතනයන් ගේ පහළවීම් වශයෙන් ලැබීමක් වේ ද, මෙය භව ප්‍රත්‍යයෙන් වන්නා වූ ජාතිය යි කියනු ලැබේ ය" යනු යි. මෙහි කෙටි තේරුම, ඒ ඒ භවයෙහි උපදනා සත්ත්වයන් ගේ පළමු කොට ඉපදීම ජාතියය යනු යි. තවත් ක්‍රමයකින් කියතහොත් ඒ ඒ භවවල පළමු කොට ස්කන්ධයන් පහළවීම ජාතියය යනු යි. මේ පළමු කොට ඉපදීම සම්බන්ධයෙන් කිය යුතු විස්තරය, "සංඛාරපච්චයා විඤ්ඤාණං" යන්න විස්තර කිරීමේ දී කියන ලදී.

භවප්‍රත්‍යයෙන් වන්නා වූ මේ ජාතිය උපපත්තිභවයේ ම කොටසකි. එබැවින් ජාතියේ හේතුව වශයෙන් උපපත්තිභවය නො ගත යුතු ය. භව දෙකින් ජාතියට හේතුවන්නේ කර්ම භවය පමණෙකි. එබැවින් "උපාදාන පච්චයා භවො" යන තන්හි එන භව ශබ්දයෙන් මෙන් භව පච්චයා ජාති යන තන්හි භව ශබ්දයෙන් භව දෙක ම නො ගනු ලැබේ. එයින් ගනු ලබන්නේ කර්ම භවය පමණකි.

උපාදානයන් නිසා කුශලාකුශල කර්ම කළ කල්හි ඒ ඒ කර්මයන් ගේ ශක්තියේ හා ස්වභාවයේ සැටියට කාමභවාදි ඒ ඒ භවයෙහි සත්ත්වයාගේ නැවත නැවත ඉපදීම වූ ජාතිය වේ. සත්ත්වයාගේ උත්පත්තියට පූර්ව භවයේ කළ කර්මය හේතුවන බව වනාහි සාමාන්‍ය ලෝකයාට නො පෙනෙන ගුප්ත කරුණකි. සාමාන්‍ය ජනයා හට එය සිතා ගත හැක්කේ අනුමානයෙනි.

සත්ත්වෝත්පත්තියට කර්මය හේතු වන බව අනුමානයෙන් සලකා ගැනීමට ඇති කරුණු අතුරෙන් සත්ත්වයන් ගේ නානත්ත්වය

Non-commercial distribution

ප්‍රධාන කරුණෙකි. මේ සත්ත්වයන් ගෙන් ඇතමකුට ලෝභය උත්සන්න ය. ඇතමකුට ද්වේෂය උත්සන්නය, ඇතමකුට මෝහය උත්සන්නය, ඇතමකුට මෛත්‍රිය උත්සන්නය, ඇතමකුට ඥානය උත්සන්න ය. මෙසේ උත්සන්න වන්නාවූ ද හීන වන්නා වූ ද චෛතසික ධර්මයන් ගේ වශයෙන් සත්ත්වයන් අතර බොහෝ වෙනස් කම් දක්නා ලැබේ. ආයුෂය ධනය සැපදුක්ය යනාදියෙන් සත්ත්වයන් අතර බොහෝ වෙනස්කම් දක්නා ලැබේ. සත්ත්වයාගේ උත්පත්තියට හා වැඩීමට ද ජීවත්වීමට ද හොඳ නරක ගති ගුණ ඇති වීමට ද තිබිය යුතු ප්‍රකට හේතු වූ, මවුපියන් ගේ ශුක්‍රශ්‍රෝණිත ධාතු - ඍතු - ආහාර - ව්‍යායාම - උගෙනීම - අවවාදනුශාසනා යන මේවායේ වෙනස්කම් ඇති තන්හි වන වෙනස්කම් ගැන කිය යුත්තක් නැත. ඒවා සම වූ සත්ත්වයන් අතර ද වෙනස් කම් අඩුවක් නැතිව ම දක්නා ලැබේ.

එක පියකුට දාව එක මවක කුසයෙහි එකවර පිළිසිඳ ගෙන එකවර උපන්, එක ම ආහාරයකින් එක ම ගෙයක වැඩුණු, එක ම උගෙනීමක් එක ම අනුශාසනයක් ලත්, එක ම පුද්ගල කොටසක් ඇසුරු කළ නිඹුල් දරු දෙදෙනා අතර වුව ද කියන ලද වෙනස්කම් දක්නා ලැබේ. ඒ කාරණයට අනුව සිතා බලන කල්හි සත්ත්වයාගේ උත්පත්තියට, දක්නා ලැබෙන හේතුන්ගෙන් අන්‍ය වූ නො පෙනෙන තවත් හේතුවක් තිබිය යුතු බව දත හැකි ය. පිළිගත හැකි ය. ඒ නො පෙනෙන හේතුව අනෙකක් නොව පූර්ව ජන්මවල දී කළ කර්මයෝ ය. **සිත ඉතා විචිත්‍ර ය. ලොව ඇති අන් සැම දෙයටම වඩා විචිත්‍රය**. කර්මය ද සිත පිළිබඳ වූවකි. එබැවින් චිත්තවිචිත්‍රත්ත්වයා ගේ වශයෙන් කර්මය විචිත්‍ර වේ. උත්පත්තියට හේතු වූ කර්මයා ගේ විචිත්‍රත්ත්වයෙන් සත්ත්වයන් ගේ විචිත්‍ර බව වේ.

ඒ මෙසේ ය :–

යම් කිසිවකු ගේ සන්තානයෙහි උත්පත්තියට හේතු වන කර්මයක් කරන අවස්ථාවේ දී ලෝභය බලවත් වේ ද, අලෝභය දුබල වේ ද, අද්වේෂාමෝහයෝ බලවත් වෙත් ද, ද්වේෂ මෝහයෝ දුබල වෙත් ද ඔහුගේ දුබල අලෝභය බලවත් ලෝභය මැඩපැවැත්වීමට නො සමත් වේ. බලවත් ද්වේෂ මෝහයන් මැඩ පැවැත්වීමට

Non-commercial distribution

සමත් වෙති. ලෝභය මැඩලීමට නො සමත් දුබල අලෝභ හේතුවෙන් යුක්ත වූ ඒ කර්මයෙන් ඒ පුද්ගලයා යම්කිසි භවයක උපන් කල්හි මෛත්‍රිය ඇති ක්‍රෝධ කිරීම් අඩු වූ තියුණු නුවණ ඇත්තා වූ ලෝභය අධික පුද්ගලයෙක් වේ. එ බඳු කර්මයකින් උත්පත්තිය ලැබූ පුද්ගලයෝ ධර්මශාස්ත්‍ර උගෙනීමෙහි සමත්හු වෙති. පණ්ඩිත වෙති. එහෙත් ඔවුහු කිසිවකුට කිසිවක් නො දෙන නිතර ම රැස්කිරීමට, අනුන්ගෙන් ගැනීමට ම උත්සාහ කරන ලෝභීහු වෙති.

යමකු හට කර්මය කරන අවස්ථාවේදී ලෝභ ද්වේෂ දෙක බලවත් වේ ද, අලෝභාද්වේෂයෝ දුබල වෙත් ද, ප්‍රඥාව බලවත් වේ ද, මෝහය දුබල වේ ද, ඔහු ඒ කර්මයෙන් යම්කිසි තැනක උපන් කල්හි ලෝභී වූ ද කෲර වූ ද තියුණු නුවණ ඇත්තා වූ ද පුද්ගලයෙක් වේ. එබඳු පුද්ගලයෝ ධර්මශාස්ත්‍රයන් උගෙන පණ්ඩිත වුව ද ඒ ගති පවත්වති, ලාභයක් ලැබිය හැකි කල්හි කොතෙක් මහත් අපරාධයක් වුව ද කරන්නට මැලි නො වෙති.

යමකුට කර්මය රැස් කරන කල්හි ලෝභ මෝහ යන දෙක බලවත් වේ ද, අලෝභාමෝහ දෙක දුබල වේ ද අද්වේෂය බලවත් වේ ද ද්වේෂය මඳ වේ ද, ඒ තැනැත්තා ඒ කර්මයෙන් උපන් කල්හි ලෝභී වූ ද මෝඩ වූ ද මෘදු ගති ඇති පුද්ගලයෙක් වේ.

යමකුට කර්මය කරන අවස්ථාවේදී ලෝභ ද්වේෂ මෝහ තුන ම බලවත් වේ ද, අලෝභය අද්වේෂය අමෝහය යන තුන දුබල වේද, හෙතෙමේ ඒ කර්මයෙන් උපන් කල්හි ලෝභී වූ ද නපුරු වූ ද මෝඩයෙක් වේ. ලෝකයෙහි හොඳට ම නරක මිනිසුන් වන්නේ එබඳු කර්මවලින් උපන් පුද්ගලයෝ ය.

යමකුට කර්මය කරන කල්හි අලෝභය හා ද්වේෂ මෝහ දෙක බලවත් වේ ද, ලෝභය හා අද්වේෂ අමෝහ දෙක දුබල වේද, ඒ පුද්ගලයා ඒ කර්මයෙන් උපන් කල්හි දිව්‍යමය ආරම්මණයක් දුටු කල්හි දු කලබල නො වන්නා වූ විකෘතියට නො පැමිණෙන්-නාවූ රාගය මඳ වූ කිපෙන සුළු වූ මෝඩ පුද්ගලයෙක් වේ.

යමකුට කර්මය කරන කල්හි අලෝභය අද්වේෂය යන කුසල් මුල් දෙක හා මෝහය ද බලවත් වේ ද, ලෝභය ද්වේෂය අමෝහය

Non-commercial distribution

යන තුන දුබල වේ ද, හෙතෙමේ ඒ කර්මයෙන් උපන් කල්හි දෙන ස්වභාවය හා නො රැස් කරන ස්වභාවය ද ඇති මෘදු ද වූ නුවණ මඳ වූ පුද්ගලයෙක් වේ.

යමකුට කර්මය කරන කල්හි අලෝභය ද්වේෂය අමෝහය යන මේවා බලවත් වේ ද ලෝභය අද්වේෂය මෝහය යන මේවා දුබල වේ ද, ඒ තැනැත්තා ඒ කර්මයෙන් උපන් කල්හි නිර්ලෝභ වූ ද නුවණැත්තා වූ ද කිපෙන සුළු වූ ද පුද්ගලයෙක් වේ.

යමකුට කර්මය කරන අවස්ථාවේ දී අලෝභාද්වේෂාමෝහ තුන ම බලවත් වේ ද, ලෝභය ද්වේෂය මෝහය යන මේවා දුබල වේ ද, ඒ තැනැත්තා ඒ කර්මයෙන් උපන් කල්හි නිර්ලෝභී වූ ද මෘදු වූ ද තියුණු නුවණ ඇත්තා වූ ද, ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් වේ. එබඳු පුද්ගලයෝ ලෝකයෙහි දුර්ලභය හ. තවත් නොයෙක් ආකාරවලට සත්ත්වයන් කර්ම හේතුවෙන් බෙදෙන සැටි **චූලකම්ම විභංග** සූත්‍රාදියෙන් දත යුතු.

## ජාතිපච්චයා ජරාමරණං සෝක පරිදේවදුක්ඛදෝමනස්සුපායාසා සම්භවන්ති.

ජාතිප්‍රත්‍යයෙන් හටගන්නා වූ ජරාමරණාදි දුක් සත විභංග ප්‍රකරණයේ දක්වා තිබෙන්නේ මෙසේය.

**“තත්ථ කතමං ජාතිපච්චයා ජරාමරණං? අත්ථි ජරා, අත්ථි මරණං, තත්ථ කතමා ජරා? යා තේසං තේසං සත්තානං තම්හි තම්හි සත්තනිකායේ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනෝ සංහානි ඉන්ද්‍රියානං පරිපාකෝ අයං වුච්චති ජරා. තත්ථ කතමං මරණං? යා තේසං තේසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භේදෝ අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භේදෝ කළේබරස්ස නික්ඛේපෝ ජීවිතින්ද්‍රියස්ස උපච්ඡේදෝ ඉදං වුච්චති මරණං, ඉති අයං ච ජරා ඉදං ච මරණං, ඉදං වුච්චති ජාතිපච්චයා ජරා මරණං”**

තේරුම :–

“එහි ජාතිය නිසා වන්නා වූ ජරාමරණය කවරේද යත්?

Non-commercial distribution

ජරාවක් ඇත, මරණයක් ඇත, එහි ජරාව කවරේද යත්? ඒ ඒ සත්ත්වයන් ගේ ඒ ඒ සත්ත්වනිකායයෙහි යම් ජරාවක් දිරන බවක් කඩතොලු බවක් පැසුණු බවක් සම රැලි වැටෙන බවක් ආයුෂයා ගේ හානියක් ඉන්ද්‍රියයන් ගේ මේරීමක් වේ ද මෙය ජරාව ය යි කියනු ලැබේ. එහි මරණය කවරේ ද යත්? ඒ ඒ සත්ත්වනිකායයෙන් යම් පහවීමක් පහවන බවක් බිඳීමක් අතුරුදහන්වීමක් මච්චුය යි කියන ලද මරණයක් මරහු ගේ ක්‍රියාවක් ස්කන්ධයා ගේ බිඳීමක් මළසිරුර තැබීමක් ජීවිතේන්ද්‍රියයා ගේ සිඳීමක් වේ ද මෙය මරණය ය යි කියනු ලැබේ. මෙසේ මේ ජරාව ද මේ මරණය ද යන මෙය ජාතිය නිසා වන්නා වූ ජරාමරණය යි කියනු ලැබේ ය" යනු යි.

**"තත්ථ කතමෝ සෝකෝ? ඤාතිබ්‍යසනේන වා ඵුට්ඨස්ස භෝගබ්‍යසනේන වා ඵුට්ඨස්ස රෝගබ්‍යසනේන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනේන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනේන වා ඵුට්ඨස්ස අඤ්ඤ-තරඤ්ඤතරේන ව්‍යසනේන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරේන දුක්ඛධම්මේන ඵුට්ඨස්ස සෝකෝ සෝචනා සෝචිතත්තං අන්තෝ සෝකෝ අන්තෝ පරිසෝකෝ චේතසෝ පරිජ්ඣායනා දෝමනස්සං සෝකසල්ලං. අයං වුච්චති සෝකෝ."**

**තේරුම** :–

"එහි ශෝකය කවරේ ද යත්? ඥාතිව්‍යසනයෙන් හෝ මඩනා ලද්දහු ගේ, භෝගව්‍යසනයෙන් හෝ මඩනා ලද්දහු ගේ, රෝග ව්‍යසනයෙන් හෝ මඩනා ලද්දහු ගේ, ශීලව්‍යසනයෙන් හෝ මඩනා ලද්දහු ගේ, දෘෂ්ටිව්‍යසනයෙන් හෝ මඩනා ලද්දහු ගේ එක්තරා එක්තරා ව්‍යසනයකින් යුක්ත වූවහු ගේ, එක්තරා එක්තරා දුඃඛ ධර්මයකින් මඩනා ලද්දහුගේ යම් ශෝකයක් ශෝක කරන ආකාරයක් ශෝක කරන බවක් අභ්‍යන්තරයෙහි ශෝකයක්-චිත්තයා ගේ දැවෙන ආකාරයක් දුඃඛිත සිත් ඇති බවක් ශෝක නමැති හුලක් වේ ද, මෙය ශෝකය" යි කියනු ලැබේය යනුයි.

**"තත්ථ කතමෝ පරිදේවෝ? ඤාතිබ්‍යසනේන වා ඵුට්ඨස්ස භෝගබ්‍යසනේන වා ඵුට්ඨස්ස රෝගබ්‍යසනේන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනේන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනේන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරේන බ්‍යසනේන සමන්නාගතස්ස අඤ්ඤත-**

Non-commercial distribution

**රක්ඛදතරේන දුක්ඛ ධම්මේන ඵුට්ඨස්ස ආදේවෝ පරිදේවෝ ආදේවනා පරිදේවනා ආදේවිතත්තං පරිදේවිතත්තං වාචා විප්පලාපො පලාපො ලාලප්පනා ලාලප්පිතත්තං අයං වුච්චති පරිදේවෝ"**

තේරුම :-

"එහි පරිදේවය කෙසේද යත්? ඥාතිව්‍යසනයෙන් හෝ පීඩිත වූවහු ගේ භෝගව්‍යසනයෙන් හෝ පීඩිත වූවහු ගේ රෝගව්‍යසනයෙන් හෝ පීඩිත වූවහු ගේ ශීලව්‍යසනයෙන් හෝ පීඩිත වූවහු ගේ දෘෂ්ටිව්‍යසනයෙන් හෝ පීඩිත වූවහු ගේ එක්තරා එක්තරා ව්‍යසනයකින් යුක්ත වූවහු ගේ එක්තරා එක්තරා දුක්ඛ ධර්මයකින් මඩනා ලද්දහු ගේ මේ මගේ පුතා මගේ දූ ය යි කිය කියා හැඬීමක්, ගුණ කිය කියා හැඬීමක් මගේ පුතා මගේ පුතා ය යි කිය කියා අඬන ආකාරයක් ගුණ කිය කියා අඬන ආකාරයක්, මගේ පුතා මගේ දූ ය යි කියා අඬන බවක් ගුණ කිය කියා අඬන බවක්, කීමක් නිරර්ථක වචන කීමක් නැවත නැවත කීමක් නැවත නැවත කියන ආකාරයක් නැවත නැවත කියන බවක් වේ ද, මෙය පරිදේවය" යි කියනු ලැබේය යනුයි.

**"තත්ථ කතමං දුක්ඛං? යං කායිකං අසාතං කායිකං දුක්ඛං කායසම්ඵස්සජං අසාතං දුක්ඛං වේදයිතං කායසම්ඵස්සජා අසාතා දුක්ඛා වේදනා ඉදං වුච්චති දුක්ඛං."**

තේරුම :-

"එහි දුක්ඛය කවරේ ද යත්? යම් කායික වූ අමිහිරක් කායික වූ දුකක් කයෙහි ස්පර්ශයෙන් හටගන්නා අමිහිරි වූ දුක් වූ වේදයිතයක් කයෙහි ස්පර්ශයෙන් හටගන්නා වූ නො මිහිරි වූ වේදනාවක් වේ ද මෙය දුඃඛය"යි කියනු ලැබේ.

**"තත්ථ කතමං දෝමනස්සං? යං චේතසිකං අසාතං චේතසිකං දුක්ඛං චේතෝසම්ඵස්සජං අසාතං දුක්ඛං වේදයිතං චෙතෝසම්පස්සජා අසාතා දුක්ඛා වේදනා ඉදං වුච්චති දෝමනස්සං."**

තේරුම :-

"එහි දෞර්මනස්‍යය කවරේ ද යත්? යම් සිතෙහි වූ නො මිහිරක් සිතෙහි වූ දුකක් සිතෙහි ස්පර්ශයෙන් හටගන්නා වූ නො

Non-commercial distribution

මිහිරි වූ දුක් වූ වේදයිතයක් සිතෙහි ස්පර්ශයෙන් හටගන්නා වූ නො මිහිරි වූ දුක් වූ වේදනාවක් වේ ද, මෙය දෞර්මනස්‍යය"යි කියනු ලැබේය යනුයි.

**"තත්ථ කතමෝ උපායාසෝ? ඤාතිව්‍යසනේන වා ඵුට්ඨස්ස භෝගව්‍යසනේන වා ඵුට්ඨස්ස රෝගව්‍යසනේන වා ඵුට්ඨස්ස සීලව්‍යසනේන වා ඵුට්ඨස්ස දිට්ඨිව්‍යසනේන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරේන ව්‍යසනේන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරේන දුක්ඛධම්මේන ඵුට්ඨස්ස ආයාසො උපායාසො ආයාසිතත්තං උපායාසිතත්තං. අයං වුච්චති උපායාසො."**

තේරුම :–

"එහි උපායාසය කවරේ ද යත්? ඤාතිව්‍යසනයෙන් හෝ පීඩිත වූවහු ගේ භෝගව්‍යසනයෙන් හෝ පීඩිත වූවහු ගේ රෝගව්‍යසනයෙන් හෝ පීඩිත වූවහු ගේ ශීලව්‍යසනයෙන් හෝ පීඩිත වූවහු ගේ දෘෂ්ටි ව්‍යසනයෙන් හෝ පීඩිත වූවහු ගේ එක්තරා එක්තරා ව්‍යසනයකින් යුක්ත වූවහු ගේ එක්තරා එක්තරා දුඃඛ ධර්මයකින් පීඩිත වූවහු ගේ සිතෙහි වෙහෙසක් සිතෙහි බලවත් වෙහෙසක් වෙහෙසුණු සිත් ඇති බවක් බොහෝ වෙහෙසුණු සිත් ඇති බවක් වේ ද, මෙය උපායාසය" යි කියනු ලැබේය යනුයි.

කාම රූප අරූප සංඛ්‍යාත භවත්‍රයෙහි කොතැනක වුව ද ඉපදීමක් වුවහොත් උපන් සත්ත්වයාට ජරා මරණ දෙක ඒකාන්තයෙන් ඇති වන්නේය. සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස යන පස ඇතැම් සත්ත්වයෝ බහුල වශයෙන් ද ඇතැම් සත්ත්වයෝ අල්ප වශයෙන් ද ලබති. රූපාරූප ලෝකවල සත්ත්වයෝ ඒවා නො ලබති. ජරා මරණාදි සියල්ලම සෑම සත්ත්වයන් විසින් ම නො ලබතත් යමෙක් යමෙක් ලබත් නම් ඔවුන් ඒවා ලබනුයේ උපන් නිසාම ය. නූපන හොත් නො ලබති. එබැවින් ජාතිය නිසා ජරා මරණාදීහු වෙතැ යි කියනු ලැබේ.

නාමරූප ධර්මයන් ගේ හෙවත් සංස්කාර ධර්මයන් ගේ මෝරන පැසෙන දිරන ස්වභාවය ජරාව ය. තමා විසින් වැළඳ ගන්නා ලද අභ්‍යන්තරයට වැද ගන්නා ලද දෙය දවා දුබල කොට විනාශය කරා ගෙනයාම ගින්නේ ස්වභාවය ය. ජරාවේ ස්වභාවය

Non-commercial distribution

ද එයම ය. ගලක් අහසට ගැසූ කල්හි එහි නැවතීමක් නො වෙත හොත් එය අහසෙහි ම යනු මිස නැවත කිසි කලෙක පොළොවට නො පැමිණේ. එය නැවත පොළොවට වැටෙනුයේ අහසෙහි නැවතීම සිදුවන නිසාය. ගල අහසට නැගෙන්නේ නවතින ස්වභාවයත් අරගෙනම ය. එබැවින් එය මඳක් ගොස් අහසේ නැවතී නැවතුණු තැන් පටන් බිමට බසින්නට පටන් ගනී. එමෙන් උපදනා වූ සංස්කාරය ඉපදීමේ වේගයෙන් ම පවතිත හොත් එය කිසිකලෙක භංගයට නො පැමිණේ. භංගයට පැමිණෙන්නේ ඉපදීමේ වේගය නැවතීම නිසා ය. ඉපදීමේ වේගය සිඳෙන්නේ ජරාව නිසා ය. ජරාවෙන් ඉපදීමේ වේගය සිඳිනු ලබූ කල්හි ඒ සංස්කාරය භංගයට හෙවත් අභාවයට පැමිණේ.

මෙසේ ගින්නක් මෙන් උපදින සංස්කාරය දුබල කොට විනාශ මුඛයට ගෙන යන බැවින් ජරාවට ජරාගින්නය යි කියනු ලැබේ. ජරාගින්න තමන් ගේ අභ්‍යන්තරයට පිවිසෙනු වළක්වාලිය හැකි ශක්තියක්, ජරාගින්නට තමන් වැළඳ ගන්නට නො හැකි වන ආනුභාවයක්, ලෞකික වූ හෝ ලෝකෝත්තර වූ හෝ කිසිම සංස්කාරයකට නැත. සකල සංස්කාරයෝම ජරාගින්නෙන් දැවී විනාශයට යෙති. ජරාවට නො පැමිණ බිඳෙන සංස්කාරයක් නැත. එසේ ම ජරාවට නො පැමිණ මියන සත්ත්වයෙක් ද නැත. මව්කුස තුළ දී මිය යන සත්ත්වයා මිය යන්නේ ද ජරාගින්නෙන් දවනු ලැබීමෙනි. බිහි වූ සත්ත්වයාගේ මරණය ගැන කියනු ම කිම?

ජරාව ඇසට පෙනෙන දෙයක් නො වේ. ඇසට පෙනෙනුයේ සත්ත්ව සන්තානය ජරා ගින්නෙන් දවනු ලැබීම නිසා පහළ වූ ලකුණු පමණෙකි. දත් නැති බව, කෙස් ලොම් පැසුණු බව, ඇඟ රැලි වැටුණු බව, කුදු ගැසුණු බව යනාදිය ඒ ලකුණු ය. ඒ ලකුණු ජරාව නොව ජරාවේ ඵලයෝ ය. ඒවා ජලස්කන්ධයක් ගලාගිය තැන දක්නට ලැබෙන්නා වූ ද, ලැව්ගින්නක් ඇවිළුණු තැනක දක්නට ලැබෙන්නා වූ ද, සැඩ සුළඟක් හමාගිය පෙදෙසක දක්නට ලැබෙන්නා වූ ද සලකුණු සේ දත යුතු ය.

ජරා ගින්නෙන් දවනු ලැබූ ලකුණු සෑම වස්තුවකම සෑම ශරීරයකම සම කාලයකින් පහළ වන්නේ නො වේ. ඒ ඒ

Non-commercial distribution

වස්තුවල ශරීරවල ශක්තියේ සැටියට ලකුණු පහළවීමේ කාලය වෙනස් වේ. බුරුල් බිමක මිනිසුන් ගමන් කළහොත් මාර්ග සලකුණු ඉක්මනින් පෙනෙන්නට වේ. තද බිමක ගමන් කළහොත් සලකුණු පෙනෙන්නට ඊට වඩා දීර්ඝ කාලයක් ගත වේ. ගලක් උඩින් ගමන් කළහොත් මහ සලකුණු පෙනෙන්නට ඉතා දීර්ඝ කාලයක් ගත වේ. එමෙන් දුබල වස්තු දුබල ශරීරවල ජරාවෙන් දවුණු ලකුණු කෙටිකලෙකින් පෙනෙන්නට වේ. බලවත් වස්තුවල හා බලවත් පුද්ගලයන් ගේ ශරීරවල ඒ ලකුණු පෙනෙන්නට වැඩි කාලයක් ගත වේ. දිව්‍යබ්‍රහ්මයන් ගේ ශරීරවල ජරාවෙන් දැවීම ඇත ද ලකුණු පහළ නො වේ.

සත්ත්වයා භවයෙහි පිළිසිඳ ගත් තැන පටන් ම සත්ත්වසන්තානයට ජරාගින්න වැද, එයින් සන්තානය වැළඳ ගෙන දවන්නට පටන් ගන්නේ ය. පිළිසිඳ ගැන්මෙහි පටන් ම ඒ සන්තානයට කර්ම - චිත්ත - ඍතු - ආහාර යන හේතුන්ගෙන් උපදනා අලුත් රූප එක් වීමෙන් එහි වැඩිවීමක් ද වේ. උපන් සත්ත්වයාගේ සන්තානය ජරාවෙන් දවා දුබල කිරීම මරණය කරා ගෙන යාම එක් කරුණෙකි. කර්මාදි ප්‍රත්‍යයෙන් හටගන්නා අභිනව රූප එක්වී වැඩීම අනෙක් කරුණෙකි. බාල කාලයේ දී සත්ත්වසන්තානයට බහුල වශයෙන් එකතු වන අභිනව රූපයන්ගෙන් පරණ රූප දිරා දුබලවීමේ ලකුණු වැසේ. එබැවින් බාලකාලයේ දී ජරාව ප්‍රකට නො වේ. ශරීරය වැඩී සම්පූර්ණ වූ පසු අභිනව රූප පරම්පරාවන් එයට එක්වීම මඳ වේ. එකල්හි ජරා ලකුණු ප්‍රකටව පෙනෙන්නට වන්නේ ය.

අභිනව රූප පරම්පරාව එක්වීමෙන් ශරීරයේ වැඩීමය, උපන් සැම සංස්කාරයක් ම ජරාවෙන් දවන බවය යන මේ දෙකරුණ දෙකරුණක් සැටියට - දෙමහක් සැටියට තේරුම් ගත් කල්හි බාලකාලයේ පටන් ම ජරාවට පැමිණෙන බව හා ජරාවට නො පැමිණ නො මියන බව ද, තේරුම් ගත හැකි වනු ඇත. ජරාව ඇත්තේ රූප කයට පමණක්ම නො වේ. චිත්ත චෛතසික සංඛ්‍යාත නාම ධර්මයන්ට ද එය ඇත. එබැවින් ජරාව රූපී සත්ත්වයන්ට පමණක් නොව අරූපී සත්ත්වයන්ට ද ඇති බව දත යුතු ය.

Non-commercial distribution

**ආයු පරිච්ඡේද ජරාව ය, සන්තති ජරාවය, ක්ෂණික ජරාවය යි ජරාව** ත්‍රිවිධ වේ. සත්ත්වයන් ගේ ජීවන කාලය පිරිසිඳින ජරාව ආයු පරිච්ඡේද ජරා නම්. වියළි කොළයක් ගින්නට දමුව හොත් සැණෙකින් අලු වේ. අමු කොළය එයට වඩා මඳක් ගින්නට ඔරොත්තු දෙයි. වියළි ලී කැබෙල්ල එයට වඩා මඳක් ඔරොත්තු දෙයි, අමු ලී කැබෙල්ල එයට වඩා මඳක් ඔරොත්තු දෙයි. යකඩ කැබෙල්ල එයට වඩා බොහෝ කලක් ගින්නට ඔරොත්තු දෙයි. තඹ කැබෙල්ල එයට ද වඩා කලක් ඔරොත්තු දෙයි. එමෙන් දුබල වූ කර්මාදි හේතුන්ගෙන් උපන්, උකුණු - මකුණු - මැසි - මදුරු ආදි ඇතැම් කුඩා සත්ත්ව කෙනෙක් ජරාවෙන් දවා දුබල කරනු ලැබ සතියකින් මිය යෙති. මඳක් බලවත් වූ කර්මාදි ප්‍රත්‍යයන් නිසා උපන්නාවූ ඇතැම් සත්ත්ව කෙනෙක් ජරාගින්නට උකුණු මකුණු ආදීන්ට වඩා දීර්ඝ කාලයක් ඔරොත්තු දෙති. දැවීම උසුලා සිටීමට සමත් වෙති. බලවත් කර්මාදි හේතුන් නිසා උපන් සත්ත්වයෝ බොහෝ කල් ජරා ගින්නෙන් දැවීම උසුලන්නට සමත් වෙති. වැඩි කල් ඒ දැවීමට ඔරොත්තු දෙන්නා වූ සන්තාන ඇති සත්ත්වයෝ බොහෝ කල් ජීවත් වන්නාහු ය.

උකුණු මකුණු ආදි දුබල කුඩා සතුන් ගේ ජීවන කාලය සතියක් වන්නේ ඉදිරියට ජීවත් නො විය හැකි පමණට ඒ සන්තානයන් ජරාගින්නෙන් සතියක් තුළදීම දවන නිසා ය. මතුවට ජීවත් නො විය හැකි පමණට සත්ත්වසන්තානයක් ජරාව විසින් දවා දුබල කරන්නට ගතවන්නා වූ කාලය ඒ ඒ සත්ත්වයන් ගේ පරමායුෂය ය. සත්ත්වයන් ගේ ආයු නියමය ජරාව පිළිබඳ වූවකි. ජරාගින්නට අඩුව මසකින් මතු ජීවත් විය නොහෙන පමණට ශරීරය දුබල කළ හැකි සත්ත්වයා ගේ පරමායුෂ මසෙකි. ජරාගින්නට වර්ෂයකින් මතු ජීවත්වීමේ ශක්තිය නැති වන ලෙස දුබල කළ හැකි සත්ත්වයා ගේ පරමායුෂ වර්ෂයකි. බලවත් කර්මයෙන් ජනිත ප්‍රණීත රූපයන්ගෙන් නිර්මිත දේව බ්‍රහ්මයන් ගේ ශරීරයන් දවා දුබල කිරීමට ජරාගින්නට බොහෝ කලක් ගත වේ. එබැවින් ඔවුහු දීර්ඝායුෂ්කයෝ ය.

Non-commercial distribution

මෙසේ ඒ ඒ සත්ත්ව ජාතීන් ගේ ආයුෂ පිරිසිඳින ජරාව **ආයු-පරිච්ඡේද ජරාව ය**.

එක් එක් සත්ත්ව ශරීරයක මරණය තෙක් නො පවත්නා වූ වරින් වර චිත්ත - ඍතු - ආහාරයන්ගෙන් ඇති වන්නා වූ ආගන්තුක රූප පරම්පරාවෝ ද වෙති. අනේක හේතුන්ගෙන් හටගැනී එක්තරා කාලයක් පැවැතී සිඳී යන ආගන්තුක චිත්තපරම්පරාවෝ ද වෙති. ආහාරයක් නො ලද කල්හි ශරීරය දුබල ව පවතී. ආහාර නො ලැබූ තැනැත්තා ගේ හිසද ඔසවා කෙළින් තබා ගත හැකි සැටියට පණ නැත. උගුරෙහි හා කටෙහි තෙත් ගතිය නැත. කෙළින් තබා ගෙන සිටීමට කඳ පණ නැත. වැඩක් කිරීමට අත් පණ නැත. ගමන් කිරීමට පා පණ නැත. මෙසේ දුබල ව සිටින තැනැත්තා ගේ ශරීරයට ආහාර-යක් වැටුණු පසු ඔහු ගේ අත් පාවලට නැවත පණ එන්නේ ය. ඔහු ගේ උගුර කට නැවත තෙත් වන්නේ ය. එසේ වන්නේ ආහාරය නිසා අලුත් රූප කොටසක් ඔහු ගේ ශරීරයේ පැතිර පහළ වීමෙනි.

ආහාරයෙන් නිපන් ඒ ආගන්තුක රූපයෝ ද ජරාවෙන් තොර වූවාහු නො වෙති. ජරාව ඒවා සමග ඇති වී ඒවා වියළවන්නට දවන්නට දුබල කරන්නට පටන් ගන්නේ ය. ඒ හේතුවෙන් පැය ගණනක් තුළ දී හිසෙහි පහළ වූ ආහාරජ රූප පරම්පරාවෝ හිසෙහි ම සිඳී යෙති. කඳෙහි පැවති රූප පරම්පරාවෝ කඳෙහිම සිඳී යෙති. අත්පාවල පැවති රූප පරම්පරාවෝ අත්පාවලම සිඳී යෙති. පැය ගණනකින් පසු සත්ත්වයා නැවතත් දුබල බවට පත් වන්නේ එහෙයිනි. මෙසේ පහළ වන්නා වූ ආගන්තුක රූප පරම්පරාවන් ගේ දිරීම **සන්තතිජරාව** ය. ඒවායේ සිඳී යාම **සන්තතිමරණය** යි. ශීතය උෂ්ණය ධාතු කෝපය නානාප්‍රකාර සිතිවිලිය යන ආදියෙන් සත්ත්වසන්තානයෙහි මෙසේ නොයෙක් විට නානාවිධ රූපසන්තතීහු පහළ වී දිරා සිඳී යති. ඒ සියල්ලේ ම දිරීම සන්තතිජරාව ය. සිඳීම සන්තති මරණය ය.

සත්ත්වසන්තානයෙහි සමහර අවස්ථාවල දී යම් කිසි ඉෂ්ටාරම්මණයක ප්‍රතිලාභයෙන් ප්‍රීති සහගත සිතිවිලි පරම්පරාවෝ

Non-commercial distribution

පහළ වෙති. සමහර අවස්ථාවල දී ශෝක සහගත සිතිවිලි පරම්පරාවෝ පහළ වෙති. සමහර අවස්ථාවල දී භයසහගත සිතිවිලි පරම්පරාවෝ පහළ වෙති. සමහර අවස්ථාවල දී ක්‍රෝධසහගත සිතිවිලි පරම්පරාවෝ ද, ඊෂ්‍යාසහගත සිතිවිලි පරම්පරාවෝ ද, ලෝභසහගත සිතිවිලි පරම්පරාවෝ ද, කරුණාසහගත සිතිවිලි පරම්පරාවෝ ද, මෛත්‍රීසහගත සිතිවිලි පරම්පරාවෝ ද පහළ වෙති. තවත් නොයෙක් ආකාර සිතිවිලි පරම්පරාවෝ ද පහළ වෙති. මම මෙතෙක් කල් ප්‍රීතියෙන් විසුවෙමි යි කියනුයේ ප්‍රීති සහගත චිත්තපරම්පරාව පැවති බව ගැන ය. මෙතෙක් කල් ශෝකයෙන් සිටියෙමි ය යි කියනුයේ ශෝකසහගත චිත්තපරම්පරාව පැවති බව ගැන ය. මෙතෙක් කල් බියෙන් සිටියෙමි ය, කෝපයෙන් සිටියෙමි ය යනාදිය කියනුයේ ද ඒ ඒ සිත් පරම්පරාවල පැවති කාලය ගැන ය.

ප්‍රීතිසහගත චිත්තපරම්පරාවක් ඇති වන්නට පටන් ගත් කල්හි පටන් ගැන්මේ සිට ම එය ජරාවෙන් දුබල කරන්නට වන්නේ ය. එයින් කල් යත් යත් ප්‍රීතිය මඳ වෙවී ගොස් අන්තිමට සම්පූර්ණයෙන් ම සිඳී යන්නේ ය. පළමුවෙන් ඉතා මිහිරි බවක් දැනෙන ලෙසට ඉතා බලවත් ලෙසට පටන් ගත් ප්‍රීතිය කෙමෙන් හීන වනුයේ මඳ වූවා සේ දැනෙනුයේ දිරීමෙන් එය දුබල වන බැවිනි. එසේ කෙමෙන් ජරාවෙන් දුබල වී ගොස් අන්තිමට ඒ ප්‍රීතිය සර්වාකාරයෙන් නැති වන්නේ ය. පටන්ගත් ප්‍රීතිය කෙමෙන් දුබලවීම **සන්තතිජරාව** ය. අන්තිමේ දි සර්වාකාර යෙන් ප්‍රීතිය සිඳී යාම **සන්තති මරණය** ය.

යම් කිසි කරුණක් නිසා උග්‍ර කෝපයක් පහළ වූ කල්හි ජරාව එය දුබල කරන්නට පටන් ගනී. තරමක් කාලය ගත වූ පසු කෝපය මඳ වූවා සේ දැනෙනුයේ ඒ දුබල වීම නිසා ය. කෙමෙන් දුබල වී ගොස් අන්තිමේ දී කෝපය නැති වී යයි. එකල්හි කෝපය සන්සිඳුණේ යයි කියනු ලැබේ. කෝපය සන්සිඳීමය යි කියනුයේ ක්‍රෝධ සහගත සිත් පරම්පරාවේ **සන්තති මරණයට ය**. කෙමෙන් සන්සිඳීම නම් **සන්තති ජරාවය**. මෙසේ චිත්ත පරම්පරාවන් ගේ සන්තති ජරා මරණ දෙක සලකා ගත යුතු ය.

Non-commercial distribution

එක් නාමරූප ධර්මයකට ඇත්තා වූ ජීවන කාලය හෙවත් පවත්නා කාලය ඉතා කෙටි කාලයකි. ඒ කාලය උත්පාදය - ස්ථිතිය - භඞ්ගය යි තුනට බෙදනු ලැබේ. ඒ තුන් කාලයෙන් එක් එක් කාලයක් ඇසි පිය හෙලන කාලයෙන් ලක්‍ෂයෙන් පංගුවක් පමණ වත් දිග නැත. පෙර නො තුබුණා වූ යම්කිසි නාම රූප ධර්මයක පැන නැඟීම, මතු වීම,· පහළ වීම එක්තරා වේගයකි. උත්පාදය යි කියනුයේ ඒ වේගයට ය. ඒ වේගය ජරාවට පැමිණීමෙන් සිටී. නවතී. වේගය නැවතී පවත්නා අවස්ථාවට ස්ථිතිය යි කියනු ලැබේ. ඉපදීමේ වේගය සන්සිඳෙනු සමඟ ම එය බිඳ වැටේ. එයට භඞ්ගය යි කියනු ලැබේ.

ඉපදීමේ වේගය නවත්වා උපන් ධර්මය බිඳ වැටීමට යොමු කර දෙන්නා වූ සංස්කාරයන් ගේ මේරීම පැසීම වූ ස්ථිතිය **ක්‍ෂණික ජරාව** ය. එය නිසා වන්නා වූ සංස්කාරයන්ගේ බිඳ වැටීම අතුරුදහන් වීම **ක්‍ෂණික මරණය** යි. ක්ෂණික ජරා මරණ දෙක අභිධර්මය උගත හොත් හොඳින් වැටහෙනු ඇත. ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාස යන මේ පස පටිච්චසමුප්පාදයේ අංග නො වන නිසා ද තේරුම් ගැනීමට අපහසු නො වන නිසා ද ඒවා ගැන විස්තරයක් නො කරනු ලැබේ.

මෙම ප්‍රතීත්‍යසමුප්පාද දේශනය අවිද්‍යාවෙන් පටන් ගෙන තිබෙනුයේ අවිද්‍යාව අහේතුක ව ඇති වන්නක් නිසා හෝ අන් සැමට පළමුව ලෝකයෙහි එය ඇති වූ නිසා හෝ නො වන බව පෙර කියා ඇත. **"ජාතිපච්චයා ජරාමරණං, සෝකපරිදේවදුක්ඛදෝමනස්සුපායාසා සම්භවන්ති"** යි ප්‍රතීත්‍යසමුප්පාද දේශනය අවසන් කර තිබෙනුයේ ද ජරා මරණයෙන් මේ හේතු ඵල පරම්පරාව කෙළවර වී යන නිසා නො වේ. අවිද්‍යා තෘෂ්ණා ප්‍රහාණයෙන් මේ චක්‍රය අර්හත්මාර්ගඥානය නමැති කඩුවෙන් සිඳින තුරු කාල නියමයක් නැති ව මේ හේතු ඵල පරම්පරාව ඉදිරියට නො සිඳී පවත්නේ ය. එසේ පවත්නා බව දක්වීම පිණිස මෙහි පටන් ගැනීමේ දී දක් වූ අවිද්‍යාව නැවතත් දක්විය යුතු ය.

Non-commercial distribution

ඒ අවිද්‍යාව නැවත දේශනය නො කරන ලදුයේ යම්කිසි කරුණක් නිසා ය. එනම් - ජරා - මරණ ශෝක පරිදේව-දුඃඛ - දෞර්මනස්‍ය - උපායාසයෝ ද මේ සංසාර චක්‍රයට ඇතුළු කොට දක්විය යුතු ම ය. මේ හේතුඵල පරම්පරාව පිළිබඳ සෙවිය යුත්තේ ද, මෙය දතයුත්තේ ද ජරා මරණාදි දුක් රැස ඇති නිසා ය. ජාතියට අනතුරු ව මේ ස්ථානයේ දී ජරා මරණාදිය නො දක්වා මුලට සම්බන්ධ කිරීමට **"ජාතිපච්චයා අවිජ්ජා"** යි අවිද්‍යාව දක්වත හොත් ජරාමරණාදිය දක්වන්නට තැනක් නො ලැබේ.

එබැවින් තථාගතයන් වහන්සේ වරක් වදළ අවිද්‍යාව නැවත නො ගෙන **"ජාතිපච්චයා ජරාමරණං"** යි වදළ සේක. ජරා මරණයන් වදරා, **ජරාමරණ පච්චයා අවිජ්ජා** යි දේශනය කළත් යෙදෙන්නේ නො වේ. එබැවින් එසේ ද නොවදළ සේක. ශෝක - පරිදේව දුඃඛ - දෞර්මනස්‍ය - උපායාසයෝ අවි-ද්‍යාවෙන් වෙන් නො වන අවිද්‍යාව හා බැඳී උපදනා ධර්මයෝ ය. එබැවින් ශෝකාදිය වදළ කල්හි අවිද්‍යාව ද දැක්වූයේ වන්නේ ය. ජාතිය නිසා ඇති වන්නේ ජරාමරණාදි ධර්ම සත පමණක් ම නො වේ. සත්ත්වයකු ගේ ඉපදීමේ පටන් මරණය දක්වා කාලය තුළ සත්ත්ව සන්තානයෙහි යම් යම් ධර්ම කෙනෙක් ඇති වෙත් නම් ජාතිය ඒ සියල්ලටම හේතු වේ. නූපන්නා නම් ඒවා ඇති නො වන බැවිනි.

සත්ත්වයකු උපනහොත් ඔහුට ස්වසන්තානයට අයත් ස්කන්ධයන් නිසා ද, ඔහුගේ ඉන්ද්‍රියයන්ට හමු වන රූප ශබ්දාදි ආරම්මණයන් නිසා ද, අවිද්‍යාව ඒකාන්තයෙන් ඇති වන්නේ ය. එබැවින් දේශනා භේදය වන නිසා තථාගතයන් වහන්සේ විසින් නමින් ගෙන අවිද්‍යාව නො වදළේ වී නමුත් මෙහි අවිද්‍යාව ද ගැනෙන බව දත යුතු ය. අවිද්‍යාව ඇති වූ කල්හි නැවතත් කර්ම රැස්කරන බැවින් කර්ම නිසා නැවත උපදින බැවින් මේ හේතුඵල පරම්පරාව නො සිඳී පවතින්නේ ය යි දත යුතු. එහි මුලක් ද නැත්තේ ය. ප්‍රතීත්‍යසමුප්පාද දේශනය ජාති තුනකට සම්බන්ධව පවත්නා සැටි මේ සටහන බලා දත යුතු.

Non-commercial distribution

# පටිච්ච සමුප්පාදය

| | |
|---|---|
| අතීත භවය | අවිජ්ජාපච්චයා සංඛාරා<br>සංඛාර පච්චයා |
| වර්තමාන භවය | - විඤ්ඤාණං<br>විඤ්ඤාණපච්චයා නාමරූපං<br>නාමරූප පච්චයා සළායතනං<br>සළායතනපච්චයා ඵස්සෝ<br>ඵස්සපච්චයා වේදනා<br>වෙදනාපච්චයා තණ්හා<br>තණ්හාපච්චයා උපාදනං<br>උපාදනපච්චයා භවො: භවපච්චයා |
| අනාගත භවය. | - ජාති<br>ජාතිපච්චයා ජරා මරණං, සෝකපරිදේව<br>දුක්ඛදෝමනස්සුපායාසා සම්භවන්ති |

## අංග දෙළොස

මෙහි අංග දෙළොසෙකි. එනම් :- අවිජ්ජා, සංඛාර, විඤ්ඤණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදන, භව, ජාති, ජරාමරණ යන මේ දෙළොස ය, ශෝකාදිය අංගභාවයෙන් ගණන් නො ගනු ලැබේ. මේවායින් අවිද්‍යා සංඛාර දෙක අතීතාංගයෝ ය. ජාති ජරාමරණ දෙක අනාගතාංගයෝ ය. විඥනාදි මැද අට වර්තමානාංගයෝ ය.

## සන්ධි තුන

චක්‍රයක් වී පවතින්නා වූ මේ ධර්ම පරම්පරාවෙහි හේතු ඵල සන්ධිය ය, ඵල හේතු සන්ධිය ය, තවත් හේතු ඵල සන්ධියකැ යි සන්ධි තුනක් වේ. අවිද්‍යා සංස්කාර දෙක අතීත භවයේ හේතූහු ය. අතීත සංස්කාරය නිසා වර්තමාන භවයේ ප්‍රතිසන්ධි

Non-commercial distribution

විඥානය පහළ වේ. එහි සංස්කාරය අතීත භවයටත් විඥානය වර්තමාන භවයටත් අයත් ය. එබැවින් ඒ දෙක අතර එක් හේතු ඵල සන්ධියකි. වර්තමාන භවයෙහි හටගන්නා විඤ්ඤාණ නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන මේ අංග පසම අවිද්‍යා සංස්කාර සංඛ්‍යාත අතීත හේතු දෙදෙනා ගේ ඵල වූ අංගයෝ ය. ඒ ඵල ධර්ම පස නිසා නැවත ඒ සත්ත්වයාහට අනාගත භවයෙහි ඉපදීමට හේතු වන්නා වූ තණ්හා - උපාදාන - භව යන අංගයෝ පහළ වෙති.

වර්තමාන භවයට අයත් අංග අට අතුරෙන් විඤ්ඤාණාදි පස අතීත හේතුන් ගේ ඵලත් තණ්හාදි තුන අනාගත භවයට පැමිණීමට කරුණු වන වර්තමාන හේතුන් බැවින් ඒ ධර්ම අට ඵල හේතු වශයෙන් දෙකකට බෙදේ. එසේ බෙදෙන බැවින් වර්තමාන ඵලයන් ගේ අන්තිම ධර්මය වූ වේදනාව ගේ හා වර්තමාන හේතුන් ගේ පළමුවන ධර්මය වූ තෘෂ්ණාවත් අතර එක් ඵල හේතු සන්ධියකි. තෘෂ්ණා උපාදාන භව සංඛ්‍යාත වර්තමාන භවයේ හේතු, නිසා අනාගත භවයෙහි ජාති ජරා මරණ යන ඵලයෝ වෙති. එබැවින් වර්තමාන ජාතියට අයත් වූ කර්මභවයට හා අනාගත භවයට අයත් වූ ජාතියට ද අතර එක් හේතු ඵල සන්ධියකි. මෙසේ මේ ප්‍රතීත්‍ය සමුද්පාදය සන්ධිත්‍රයකින් යුක්ත වේ.

**සන්ධිත්‍රය මේ සටහනින් බලා ගත යුතු**

අවිජ්ජාපච්චයා සඞ්ඛාරා

හේතු ඵල සඞ්ඛාරපච්චයා

සන්ධිය ——————— O

විඤ්ඤාණං

විඤ්ඤාණපච්චයා නාමරූපං

නාමරූපපච්චයා සලායතනං

සළායතනපච්චයා පස්සෝ

ඵස්සපච්චයා වේදනා

Non-commercial distribution

ඵල හේතු වේදනාපච්චයා
සන්ධිය ———————— ο
තණ්හා

තණ්හාපච්චයා උපාදානං
උපාදානපච්චයා භවො
හේතු ඵල භවපච්චයා
සන්ධිය ———————— ο
ජාති

ජාතිපච්චයා ජරාමරණං සෝක
පරිදේවදුක්ඛදෝමනස්සුපායාසා
සම්භවන්ති

## සංග්‍රහ සතර

පටිච්චසමුප්පාදංග දෙළොස සන්ධි වන ස්ථානයන් ගෙන් වෙන්කර ගන්නා කල්හි ධර්ම කොටස් සතරක් වේ. එයින් එක් කොටසක් එක් සමූහයකි. ඒ රාශි සතරට සංග්‍රහ සතරය යි කියනු ලැබේ. එහි **අවිජ්ජා සංඛාර** දෙක පළමු වන රාශිය ය. **විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වේදනා** යන අංග පස දෙවන රාශිය ය. **තණ්හා උපාදාන භව** යන තුන තුන්වන රාශිය යි. **ජාති ජරාමරණ** යන දෙක සතර වන රාශිය යි.

## විංශත්‍යාකාරයෝ

**"අතීතේ හේතවෝ පඤ්ච ඉදානි ඵල පඤ්චකං**
**ඉදානි හේතවෝ පඤ්ච ආයතිං ඵල පඤ්චකං"**

යනුවෙන් දැක්වෙන පරිදි මේ භව චක්‍රයෙහි අතීත හේතු පසක් ද, වර්තමාන ඵල පසක් ද, වර්තමාන හේතු පසක් ද, අනාගත ඵල පසක් දැ යි අංග විස්සක් වේ. පටිච්චසමුප්පාද පාළියෙහි අතීත හේතු වශයෙන් ස්වරූපයෙන් දැක්වෙන්නේ අවිද්‍යා සංස්කාර දෙක ය.

Non-commercial distribution

අවිද්‍යාවෙන් මඩනා ලද තැනැත්තේ ස්වකීය ස්කන්ධයන්ට හා බාහිර රූපශබ්දාදියට ද ආශා කරයි. ආශා කළ තැනැත්තේ මම ය මාගේ ය යනාදීන් ඒවා තදින් ගනී. තදින් ගත් තැනැත්තේ ඒවා නිසා පින් පව් කරයි. එබැවින් අතීත හේතු වශයෙන් අවිද්‍යා සංස්කාර දෙක ගත් කල්හි තෘෂ්ණා උපාදාන භවයෝ ද ගන්නා ලද්දාහු වෙති. එබැවින් ස්වරූප වශයෙන් දැක්වූ **අවිද්‍යා සංස්කාර** දෙක ය, ඒ දෙක ගන්නා කල්හි ගැනෙන **තණ්හා උපාදාන කම්මභව** යන තුන ය යි අතීත හේතු පසක් වේ.

මෙහි පූර්ව චේතනාව සංස්කාරය යි ද, නිෂ්ඨාපන චේතනාව කර්මභවය යි ද ගත යුතු. පින් වූ හෝ පව් වූ හෝ යම්කිසි ක්‍රියාවක් කරන්නට දින ගණනක් හෝ සති ගණනක් හෝ මාස ගණනක් හෝ වර්ෂ ගණනක් හෝ කල්පනා කරමින් ගත කරන්නහු ගේ ඒ චේතනා රාශිය පූර්ව චේතනාය යි දත යුතු. කල්පනා කළ පරිදි සිතූ පරිදි ඒ ක්‍රියාව සිදුකරන්නා වූ චේතනාව නිෂ්ඨාපන චේතනාව ය. යමක් කරන්නට කොතෙක් කල් සිතුවත් එය සිදුකරන්නට නුපුළුවන් වූවහොත් ඒ චේතනා මතු උත්පත්තියක් ඇති කරලීමට තරම් බලවත් නොවෙති. මතු උත්පත්තික් ඇති කිරීමට තරම් බලවත් වනුයේ නිෂ්ඨාපන චේතනාව ය. නිෂ්ඨාපන චේතනාව ඇති වී කර්මය සිදු වුව හොත් එයින් පූර්ව චේතනා රාශිය ද බලවත් වේ. දුබල පූර්ව චේතනා මතු උත්පත්තියක් ඇති කිරීමට අසමර්ථය යි කී නමුත් ඒවා සර්වප්‍රකාරයෙන් ම ප්‍රතිසන්ධියක් ගෙන නො දෙන්නාහු ද නො වෙති. සමහර විට ඒවා ද ප්‍රතිසන්ධියට හේතු වේ.

තවත් ක්‍රමයකින් එක් එක් ජීවන වාරයක පූර්ව ජවන සයෙහි චේතනාව සංස්කාරය යි ද, සප්තම ජවන චේතනාව කර්ම භවය යි ද කියනු ලැබේ. දෙවන ජාතියෙහි ප්‍රතිසන්ධිය සප්තම ජවන චේතනාවෙන් ඇති කරනු ලැබේ. **විඤ්ඤාණ, නාමරූප, ෂඩායතන, ස්පර්ශ, වේදනා** යන මේ අංග පස අතීත හේතු පස නිසා ඇති වන වර්තමාන ඵල පස ය. පටිච්චසමුප්පාද පාළියෙහි ස්වරූපයෙන් උද්ධරණය කොට දක්වා

Non-commercial distribution

තිබෙනුයේ **තෘෂ්ණා - උපාදාන - භව** යන වර්තමාන හේතු තුන පමණෙකි. එහෙත් තෘෂ්ණා උපාදානයන් අවිද්‍යාව සමග ම මිස අවිද්‍යාවෙන් වෙන් ව කිසි කලෙක ඇති නො වන බැවින් ඒ දෙක ගත් කල්හි අවිද්‍යාව ද ගැනෙන්නේ ය. කර්මභවය යි කියනු ලබන නිෂ්ඨාපන චේතනාව හෝ සප්තම ජවන චේතනාව පූර්ව චේතනාවන් ගෙන් තොරව ඇති නො වන බැවින් කර්මභවය ගැනීමෙන් සංස්කාරය ද ගැනෙන්නේය. එබැවින් ස්වරූපයෙන් දේශිත **තෘෂ්ණා - උපාදාන - භව** යන අංග තුන ය, ඒවා ගැනීමෙන් ගැනෙන **අවිද්‍යා - සංස්කාර** යන අංග දෙක ය යි වර්තමාන භවයෙහි හේතු පසක් වේ.

අනාගත ඵල වශයෙන් පාළියෙහි දැක්වෙන්නේ **ජාතිය හා ජරාමරණය ය**. ජාතිය කියා අමුතු දෙයක් නැත. එය නම් විඤ්ඤාණාදි ඵල පඤ්චකය ය. ජරාමරණ යනු ද ඒවායේ ම දිරීම් - බිඳීම් දෙක ය. එබැවින් ජාති ජරාමරණයන් කීමෙන් කියැවෙන්නේ විඤ්ඤාණාදි ඵල පඤ්චකයම ය. එබැවින් **විඥාන - නාමරූප - ෂඩායතන - ස්පර්ශ - වේදනා** යන මේ පස අනාගත ඵල පඤ්චකය යි දත යුතු.

අතීත හේතු පස

**අවිජ්ජා, සංඛාර, තණ්හා, උපාදාන, භව.**

වර්තමාන ඵල පස

**විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා.**


වර්තමාන හේතු පස

**තණ්හා, උපාදාන, භව, අවිජ්ජා, සංඛාර.**

අනාගත ඵල පස


**විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා.**

Non-commercial distribution




අවයව පස බැගින් ඇති රාශි සතරකින් යුක්ත මේ ධර්ම පරම්පරාව ගරාදි විස්සක් ඇති කරත්ත රෝදයක් වැනි ය. බිම පෙරළෙමින් යන රෝදය වරක් බිමට සිටි තැන උඩට හැරී ගොස්, නැවතත් බිමට පැමිණෙමින් කොතෙක් දුර වුවත් පෙරළෙන්නාක් මෙන්, හේතුවෙන් ඵලයත් නැවත ඵලයෙන් හේතුවත් ඒ හේතුවෙන් නැවත ඵලයත් ඇතිවෙමින් ඉමක් කොණක් නැති ව මෙම හේතු ඵල පරම්පරාව පෙරළෙමින් පවත්නේ ය. මෙය චක්‍රයක් වැනිය යි කියන ලදුයේ එහෙයිනි.

Non-commercial distribution




මේ හේතු ඵල පරම්පරාව කර්ම විපාක වශයෙන් ද චක්‍රයකි. මෙහි අතීත හේතු පස කර්ම කොට්ඨාසයට ඇතුළත් ය. වර්තමාන ඵල පස විපාක කොට්ඨාසයට ඇතුළත් ය. වර්තමාන හේතු පස කර්ම කොට්ඨාසයට ඇතුළත් ය. අනාගත ඵල පස විපාක කොට්ඨාසයට ඇතුළත් ය. කර්මය නිසා විපාක ඇති වීමෙන් ද, විපාකය නිසා නැවත කර්මය ඇති වීමෙන් ද, මේ චක්‍රය කර්මක්ෂයකරඥානයෙන් කර්මයන් ක්ෂය කරන තුරු නැවත නැවතත් පෙරළෙමින් පවත්නේ ය.


## ත්‍රි වෘත්තය

පටිච්චසමුප්පාදඞ්ග දෙළොසෙන් කොටසක් ක්ලේශයෝ ය. කොටසක් කර්මයෝ ය. කොටසක් විපාකයෝ ය. ක්ලේශයන් නිසා සත්ත්වයෝ කර්ම කෙරෙති. කර්මය නිසා විපාකය වේ. විපාකය නිසා නැවතත් ක්ලේශයෝ පහළ වෙති. ක්ලේශයන්ගෙන් පටන් ගත්

Non-commercial distribution

ධර්ම පරම්පරාවෙහි නැවතත් ක්ලේශයන් ඇතිවීම, පටන්ගත් තැනට ම පැමිණීම ය. යම්කිසි ධර්ම පරම්පරාක නැවත පටන් ගත් තැනට ම පැමිණීම වේ නම් ඒ ධර්ම පරම්පරාවට චක්‍රයකැ යි කියනු ලැබේ.

ක්ලේශයන් ගෙන් පටන් ගෙන කර්ම හා විපාක ඇති වී නැවත ද ක්ලේශයන් ඇති වීමෙන් මුලට එන බැවින් මෙය චක්‍රයකි. ක්ලේශ කර්ම විපාක වශයෙන් මේ චක්‍රය මාර්ගඥානයෙන් කෙලෙසුන් නසන තුරු නො සිඳී පවත්නේ ය.




මෙහි අවිද්‍යා තෘෂ්ණා උපාදනයෝ ක්ලේශයෝ ය. කර්මභවය හා සංස්කාරයෝ කර්මයෝ ය. විඥ්ඥාණ - නාමරූප - සළායතන - ඵස්ස - වේදනා - උපපත්තිභව - ජාති - ජරා - මරණ යන

Non-commercial distribution


මොවුහු විපාකයෝ ය. **නැවත නැවත මතු වී එන්නා වූ ධර්මයන්ට වෘත්තය යි ද කියනු ලැබේ. නැවත නැවත එන්නා වූ අර්ථයෙන් ක්ලේශයෝ ක්ලේශවෘත්ත නම් වෙති. කර්මයෝ කර්ම වෘත්ත නම් වෙති. විපාකයෝ විපාක වෘත්ත නම් වෙති.**

## මූල දෙක

මේ සංසාර චක්‍රයෙහි පූර්වාර්ධය අපරාර්ධය යි කොටස් දෙකකි. අවිජ්ජා - සංඛාර - විඤ්ඤාණ - නාමරූප - සළායතන - ඵස්ස - වේදනා යන මේ ධර්ම සමූහය පූර්වාර්ධය යි. තණ්හා - උපාදන භව - ජාති ජරාමරණය මේ ධර්ම සමූහය අපරාර්ධය යි. පූර්වාර්ධය පටන් ගැනෙනුයේ අවිද්‍යාවෙනි. අපරාර්ධය පටන් ගැනෙනුයේ තෘෂ්ණාවෙනි. එබැවින් අවිද්‍යා තෘෂ්ණා දෙක මෙහි මූල ධර්මයෝ ය. මූල යයි කියනුයේ ඒ ඒ අර්ධයේ ඉතිරි ධර්ම ඒ දෙක නිසා ඇති වන බැවිනි. ඒ දෙක නිසා ඇති වේය යි කියනුයේ ඒ දෙක නැසූ කල්හි ඉතිරි ඒවා පහළ නො වන බැවිනි. මූල ධර්ම දෙක නැසීමෙන් මිස අන් ක්‍රමයකින් ඒ ධර්ම නො නැසිය හැකි ය.

මේ සංසාර චක්‍රය දිග ලණුවක් නැවත නැවත දරණ ගසා තැනූ වළල්ලක් හෙවත් චක්‍රයක් වැනි ය. බොහෝ පටවල් ඇත්තා වූ ඒ වළල්ල එක් වළල්ල කැයි ද ගත හැකි ය. බොහෝ පටවල් නිසා වළලු බොහෝ ගණනකැයි ද ගත හැකි ය. එමෙන් බොහෝ ධර්මයන් ඇත්තා වූ පඹ වළල්ලක් මෙන් අවුල් වූ මේ සංසාර චක්‍රය එක චක්‍රයක් සැටියට ද කිය හැකි ය. චක්‍ර බොහෝ ගණනක් සැටියට ද කිය හැකිය. **හේතුඵල චක්‍රය, කර්මවිපාක චක්‍රය, ක්ලේශ කර්ම විපාක චක්‍රය** යන මේවා කියන ලදුයේ එහෙයිනි. අවිද්‍යාව නිසා සංස්කාරයෝ ද, සංස්කාරයන් නිසා විඥානය ද, ඉක්බිති නාමරූප ෂඩායතන ස්පර්ශ වේදනාවෝ ද, උපදිති. වේදනාව නිසා නැවත පටන් ගත් ධර්මය වූ අවිද්‍යාව ම ඇතිවන බැවින් පූර්වාර්ධය ද එක් භව චක්‍රයකි. තෘෂ්ණාව නිසා උපාදනය ද, උපාදනය නිසා භවය ද, භවය නිසා ජාතිය ද, ජාතිය නිසා ජරාමරණය ද වී නැවත මූල ධර්මය වූ තෘෂ්ණාව ම ඇතිවන බැවින් අපරාර්ධය ද එක් චක්‍රයක් වේ.

Non-commercial distribution




මෙසේ චක්‍ර දෙකක් වෙතත් මේ දෙක පුද්ගලයන් දෙදෙනකු පිළිබඳ චක්‍ර දෙකක් නො වේ. මේ චක්‍ර දෙක ම පවත්නේ සැම කල්හි ම එකටම ය. තෘෂ්ණාව ඇතිවීමේ ප්‍රධාන හේතුව වේදනාව ය. වේදනාව වැනි තවත් ආහාරයක් තෘෂ්ණාවට නැත. එබැවින් "වේදනා පච්චයා තණ්හා" යි වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වන බව වදාළ සේක. තෘෂ්ණාව අවිද්‍යාවෙන් තොරව කිසි කලෙක ඇතිවන්නක් නො වේ. තෘෂ්ණාව උපදිතොත් සැමකල්හි එය සමග අවිද්‍යා ද උපදනේය. එතැන දී අවිද්‍යාව සංස්කාරයන්ට හේතු වීමෙන් සංස්කාර නිසා විඥනාදිය වීමෙන් පූර්වාර්ධ චක්‍රය වේ. තෘෂ්ණාව උපාදනයන්ට හේතු වීමෙන් අපරාර්ධ චක්‍රය වේ: මෙය තේරුම් ගැනීම අපහසු අවුල් තැනකි. නැවත නැවත සිතා බලා කාරණය තේරුම් ගනිත්වා.

**"තත්ථ පුරිමං දිට්ඨිචරිතවසේන වුත්තං. පච්ඡිමං තණ්හා-චරිතවසේන"** යනුවෙන් මේ චක්‍ර දෙකින් පූර්ව වූ අවිද්‍යා මූලික චක්‍රය දෘෂ්ටිචරිතයා ගේ වශයෙන් ද තෘෂ්ණා මූලික පශ්චිම චක්‍රය, තෘෂ්ණා චරිතයා ගේ වශයෙන් ද දේශනය කරන ලදැ යි අටුවාවෙහි කීහ. එයට හේතු වශයෙන් දෘෂ්ටිචරිතයා ගේ සංසාර ප්‍රවෘත්තිය කරන ධර්මය අවිද්‍යාව බවත් තෘෂ්ණා චරිතයා ගේ සංසාරය පවත්වන ධර්මය තෘෂ්ණාව බවත් දැක්විණ.

තවද :- **"උච්ඡේදදිට්ඨිසමුග්ඝාතාය වා පඨමං, ඵලුප්පත්තියා හේතූනං අනුපච්ඡේදප්පකාසනතෝ. සස්සත දිට්ඨිසමුග්ඝාතාය වා දුතියං, උප්පන්නානං ජරා මරණප්පකාසනතෝ"** යි ඵලය ඉපදීමෙහි

Non-commercial distribution

හේතුන් ගේ නො සිද පැවැත්ම දක්වන බැවින් පළමුවන චක්‍රය උච්ඡේද දෘෂ්ටිය දුරුකිරීම පිණිස වදළහ යි ද, උපන් ධර්මයන් ගේ ජරාමරණය ප්‍රකාශ කරන හෙයින් දෙවන චක්‍රය ශාශ්වතදෘෂ්ටිය නැසීම පිණිස වදළහ යි ද දැක්විණි.

තවද:- **"ගබ්භසෙය්‍යකවසේන පුරිමං, අනුපුබ්බප්පවත්ති දීපනතෝ, ඕපපාතිකවසේන පච්ඡිමං, සහුප්පත්ති දීපනතො"** යි පිළිවෙලින් පැවැත්ම දක්වන බැවින් පූර්ව චක්‍රය මවුකුස උපදනා සත්ත්වයන් ගේ වශයෙන් ද, එකවර පහළවීම දක්වන බැවින් දෙවැන්න ඕපපාතික සත්ත්වයන් ගේ වශයෙන් ද වදළහ යි දැක්විණ.

**"සච්චප්පභවතෝ කිච්චා වාරණා උපමාහි ච,**
**ගම්භීර නය භේද ච විඤ්ඤාතබ්බං යථාරහං"**

යනුවෙන් දැක්වෙන පරිදි මේ භව චක්‍රය ඒ ඒ අංගය ඇති කරන්නා වූ සත්‍යයන් ගේ වශයෙන් ද, කෘත්‍ය වශයෙන් ද, දෘෂ්ටිනිවාරණයා ගේ වශයෙන් ද, උපමා වශයෙන් ද, ගම්භීර භාවයා ගේ වශයෙන් ද, නය ප්‍රභේද වශයෙන් ද දත යුතු ය.

**"තණ්හා ච අවසේසා ච කිලේසා අවසේසා ච අකුසලා ධම්මා තීණි ච කුසලමූලානි සාසවානි අවසේසවා ච සාසවා කුසලා ධම්මා අයං වුච්චති දුක්ඛසමුදයෝ"** යනුවෙන් තෘෂ්ණාව ද, අවශේෂ ක්ලේශයෝ ද, අවශේෂාකුශල ධර්මයෝ ද, සාශ්‍රව කුශල මූලයෝ තිදෙන ද, අවශේෂාශ්‍රව කුශල ධර්මයෝ ද යන මෙය දුඃඛසමුදය සත්‍යය යි විභංග පාළියෙහි වදළ ක්‍රමයෙන් මේ භව චක්‍රයට අයත් ධර්මයන්ගෙන් කර්ම පක්‍ෂයට හා ක්ලේශ පක්‍ෂයට අයත් අංගයෝ සමුදය සත්‍යයට අයත් වන්නාහ. ඉතිරි ධර්මයෝ දුඃඛ සත්‍යයට අයත් වන්නාහ.

ද්වාදශාංගයන් අතුරෙන් අවිද්‍යාව ක්ලේශයක් හෙයින් කියන ලද ක්‍රමයේ සැටියට සමුදය සත්‍යයට අයත් ය. අවිද්‍යා හේතුවෙන් හටගන්නා වූ සංස්කාරය ද, සමුදය සත්‍යයට ම අයත් ය. එබැවින් සංස්කාරය අවිද්‍යා සංඛ්‍යාත සමුදය සත්‍යයෙන් පටන් ගැනෙන්නා වූ ගළා එන්නා වූ සමුදය සත්‍යයකි. විඥානය සංස්කාර සංඛ්‍යාත සමුදය සත්‍යයෙන් ගළා එන්නා වූ දුඃඛසත්‍යය යි. ෂඩායතනය නාම රූප සංඛ්‍යාත දුඃඛසත්‍යයෙන් එන්නා වූ දුක්ඛ සත්‍යය යි. ස්පර්ශය

Non-commercial distribution

ෂඩායතන සංඛ්‍යාත දුඃඛ සත්‍යයෙන් එන්නා වූ දුඃඛසත්‍යය යි. වේදනාව ස්පර්ශ සංඛ්‍යාත දුඃඛසත්‍යයෙන් එන්නා වූ දුක්ඛසත්‍යය යි. තෘෂ්ණාව වේදනා සංඛ්‍යාත දුඃඛසත්‍යයෙන් එන්නා වූ සමුදය සත්‍යය යි. උපාදනය තෘෂ්ණා සංඛ්‍යාත සමුදය සත්‍යයෙන් එන්නා වූ සමුදය සත්‍යය යි. භවය උපාදන සංඛ්‍යාත සමුදය සත්‍යයෙන් එන්නා වූ සමුදය දුඃඛ සත්‍යය දෙක ය. ජාතිය කර්මභව සංඛ්‍යාත සමුදය සත්‍යයෙන් එන්නා වූ දුඃඛසත්‍යය යි. ජරා මරණය ජාති සංඛ්‍යාත දුඃඛසත්‍යයෙන් එන්නා වූ දුඃඛසත්‍යය යි. මෙසේ මේ භවචක්‍රය සත්‍ය වශයෙන් දත යුතු ය. පහසුවෙන් තේරුම් ගැනීමට මෙම සටහන බලනු.

| | | |
|---|---|---|
| 1. | අවිජ්ජා | සමුදය සච්ච |
| 2. | සංඛාර | සමුදය සච්ච |
| 3. | විඤ්ඤාණ | දුක්ඛ සච්ච |
| 4. | නාමරූප | දුක්ඛ සච්ච |
| 5. | සළායතන | දුක්ඛ සච්ච |
| 6. | ඵස්ස | දුක්ඛ සච්ච |
| 7. | වේදනා | දුක්ඛ සච්ච |
| 8. | තණ්හා | සමුදය සච්ච |
| 9. | උපාදන | සමුදය සච්ච |
| 10. | භව | සමුදය, දුක්ඛ සච්ච |
| 11. | ජාති | දුක්ඛ සච්ච |
| 12. | ජරාමරණ | දුක්ඛ සච්ච |

අවිද්‍යාදීන් ගේ කෘත්‍යයෝ මෙසේ දත යුතු. රූපාදි ආරම්මණ විෂයෙහි සත්ත්වයන් මුළා කරවීම හා සංස්කාරයන් පහළ කරවීම **අවිද්‍යාව ගේ** කෘත්‍ය යි. කුසලාකුසල ක්‍රියා සිදුකිරීම හා විපාක විඥනයන් පහළ කරවීම **සංස්කාරයන් ගේ** කෘත්‍යයයි. රූපාදිය දැන ගැනීම හා නාමරූප පහළ කරවීම **විඥනයා ගේ** කෘත්‍යය යි. ඔවුනොවුන්ට උපකාරීවීම හා ෂඩායතනය පහළ කරවීම **නාමරූපයා ගේ** කෘත්‍යය යි. රූපාදි අරමුණු පිළිගැනීම හා ස්පර්ශය ඇති කිරීම **ෂඩායතනයා ගේ** කෘත්‍යය යි. අරමුණු ස්පර්ෂ කිරීම හා වේදනාව පහළ කරවීම **ස්පර්ශයා ගේ** කෘත්‍යය යි. ආරම්මණ රසය විඳීම හා තෘෂ්ණාව ඇති කරවීම **වේදනාව ගේ** කෘත්‍යය යි. ඇලුම් කළ

Non-commercial distribution

යුත්තෙහි ඇලීම හා උපාදනය පහළ කරවීම **තෘෂ්ණාව ගේ** කෘත්‍යය යි. ආත්මාදි වශයෙන් තදින් ගැනීම හා භවය පහළ කරවීම **උපාදනයා ගේ** කෘත්‍යය යි. නානා ගතීන්ට පැමිණවීම හා ජාතියට ප්‍රත්‍යවීම **භවයා ගේ** කෘත්‍යය යි. ස්කන්ධයන් පහල කරවීම හා ජරා මරණයට ප්‍රත්‍යයවීම **ජාතිය ගේ** කෘත්‍යය යි. ස්කන්ධයන් ගේ දිරීම් බිඳීම් දෙක සිදුකිරීම හා ශෝකාදියට ස්ථාන වී භවාන්තරයන් ඇති කිරීම **ජරාමරණයා** ගේ කෘත්‍යය යි.

මෙසේ කෘත්‍යයන් ගේ වශයෙන් ද අවිද්‍යාදීහු දත යුත්තාහු ය. හුදෙක් ආත්ම නො වන්නා වූ සත්ත්ව පුද්ගල නො වන්නා වූ ශුද්ධ වූ ධර්මයන් නිසා තවත් ධර්මයන් ඇතිවීමෙන් මෙම සංසාර චක්‍රය පවත්නේ ය. මෙහි ඒ ඒ ක්‍රියා සිදු කරන්නා වූ සැපදුක් විඳවන්නා වූ අධිපතියෙක් ද නැත. කරන්නා වූ විඳින්නා වූ අන් කෙනෙක් ද නැත.

(1) **ඒවං සමුප්පන්නමිදං සහේතුකං**
**දුක්ඛං අනිච්චං චලමිත්තරද්ධුවං**
**ධම්මෙහි ධම්මා පභවන්ති හේතුසෝ**
**නහෙත්ථ අත්තා ච පරෝ ච විජ්ජති.**

(2) **ධම්මා ධම්මේ සඤ්ජනෙන්ති හේතුසම්භාර පච්චයා**
**හේතුනඤ්ච නිරෝධාය ධම්මෝ බුද්ධේන දේසිතෝ**
**හේතූසු උපරුද්ධෙසු ඡින්නං වට්ටං න වට්ටති.**

(3) **ඒවං දුක්ඛංන්තකිරියාය බ්‍රහ්මචරියීධ විජ්ජති.**
**සත්තේ ච නූපලබ්භන්තේ නෙවුච්ඡේදෝ න සස්සතං**

(විභංගට්ඨ කථා)

**තේරුම:-**

(1) මෙසේ .හටගන්නා වූ මේ භව චක්‍රය හේතූන් නිසා පවත්නේ ය. මෙම භව චක්‍රය දුකය, අනිත්‍ය ය, සෙලවෙන සුලුය, වෙනස්වන සුලුය, අස්ථිරය, හේතු වූ ධර්මයන් නිසා ධර්මයෝ ම පහළ වන්නා හ. මෙහි තෙමේ ය කියා හෝ අනෙකෙක්ය කියා හෝ කිසිවෙක් නැත්තේ ය.

Non-commercial distribution

(2) (එකිනෙකට හේතුවීමෙන්) ධර්මයෝ ම ධර්මයන් උපදවති. හේතූන් ගේ නිරෝධය පිණිස බුදුන් වහන්සේ විසින් ධර්මය දේශනා කරන ලද්දේ ය. හේතූන් නිරුද්ධ කල්හි ලෝකෝත්තර මාර්ගඥනයෙන් සිඳින ලද සංසාර වෘත්තය මතු නො පවතී.

(3) මෙසේ දුක් කෙළවර කිරීම පිණිස මේ සස්නෙහි බ්‍රහ්මචය්‍ර්‍යය ඇත්තේ ය. සත්ත්වයකු නො ලැබෙන කල්හි මුල පටන් ම නැත්තා වූ සත්ත්වයා ගේ මරණයෙන් සිඳීමෙක් හෝ ජාතියෙන් ජාතියට යෙමින් නො නැසී විසීමෙක් හෝ කොයින් ද?

## දෘෂ්ටි නිවාරණය.

සංසාර චක්‍රයා ගේ තත්ත්වය නො දැනීම නිසා ඇති වන්නා වූ වැරදි හැඟීම් දෘෂ්ටි නම් වෙති. මේ පටිච්චසමුප්පාදයේ සැම වැකියකින් ම යම් කිසි වැරදි හැඟීමක් වළක්වනු ලැබේ. **අවිජ්ජාපච්චයා සංඛාරා** යන මෙයින් පින් පව් කරන්නකු නැතිව අවිද්‍යාව නිසා "පින් පව් ඇති වන බව දැක්වීමෙන් පින් පව් කරන කෙනකු ඇතය" යන වැරදි හැඟීම (ආත්ම දෘෂ්ටිය) වළක්වනු ලැබේ.

**සංඛාරපච්චයා විඤ්ඤාණං** යන මෙයින් වර්තමාන භවයෙන් අනාගත භවයට කිසිවක් නො ගොස් පින් පව් නිසා අනාගත භවයේ අභිනව විඥනයක් පහළ වීම දැක්වීමෙන් "ආත්මය එක් ජාතියකින් අන් ජාතියකට යේ ය" යන වැරදි හැඟීම දුරු කරනු ලැබේ.

**විඤ්ඤාණපච්චයා නාමරූපං** යන මෙයින් විඥනය නිසා නාම රූප වශයෙන් ධර්ම දෙකොටසක් හට ගන්නා බව දැක්වීමෙන් "නාමරූප සියල්ල සත්ත්වයා වූ එක් දෙයක් ලෙස ගන්නා වැරදි හැඟීම" (ඝනසංඥව) වළක්වනු ලැබේ.

**නාමරූපපච්චයා සළායතනං** යන්නෙන් රූපාදි අරමුණු ගන්නා වූ ආයතන සය දැක්වීමෙන් "ආත්මය තෙමේ ලෝකය දන්නේය, ශබ්ද අසන්නේය, ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය ධර්මයන් දන්නේ ය" යන වැරදි හැඟීම වළක්වනු ලැබේ.

Non-commercial distribution

**සළායතනපච්චයා ඵස්සෝ** යන්නෙන් ස්පර්ශය එක්තරා ධර්මයක් බව දැක්වීමෙන් "ආත්මය තෙමේ ස්පර්ශ කරන්නේ ය" යන වැරදි හැඟීම වළක්වනු ලැබේ.

**ඵස්සපච්චයා වේදනා** යන්නෙන් සැප දුක් දෙක ස්පර්ශය නිසා වන්නා වූ ධර්මයක් බව දැක්වීමෙන් "ආත්මය සුව දුක් විඳී ය" යන වැරදි හැඟීම වළක්වනු ලැබේ.

**වේදනාපච්චයා තණ්හා** යනුවෙන් තෘෂ්ණාව වේදනාව නිසා ඇති වන ධර්මයක් බව දැක්වීමෙන් "ආත්මය තෙමේ රූපාදියට ඇලුම් කෙරේය" යන වැරදි හැඟීම වළක්වනු ලැබේ.

**තණ්හාපච්චයා උපාදානං** යනුවෙන් උපාදානය තෘෂ්ණාව නිසා ඇති වන්නක් බව දැක්වීමෙන් "සත්ත්වයා රූපාදිය දැඩි සේ ගන්නේ ය. අයත්කර ගන්නේ ය" යන වැරදි හැඟීම වළක්වනු ලැබේ.

**උපාදානපච්චයා භවො** යනුවෙන් "ආත්මය පින් පව් කරන්නේ ය, ඒ ඒ භවයට යන්නේ ය" යන වැරදි හැඟීම වළක්වනු ලැබේ.

**භවපච්චයා ජාති** යනුවෙන් "සත්ත්වයා උපදින්නේය" යන වැරදි හැඟීම වළක්වනු ලැබේ.

**ජාතිපච්චයා ජරාමරණං** යනුවෙන් "ආත්මය දිරන්නේ ය මැරෙන්නේ ය යන වැරදි හැඟීම" වළක්වනු ලැබේ. මෙසේ දෘෂ්ටි-නිවාරණයා ගේ වශයෙන් ද ප්‍රතීත්‍යසමුත්පාද දේශනය දත යුතු ය.

## පටිච්චසමුප්පාදය උපමාවෙන් දැක්වීම.

උපමාවකින් දැක්වූ කල්හි අප්‍රකටාර්ථය පහසුවෙන් අවබෝධ වේ. එබැවින් පණ්ඩිතයෝ අප්‍රකටාර්ථයන් ප්‍රකාශ කිරීමේ දී නොයෙක් උපමා දක්වති. එය ගුප්තාර්ථයන් ප්‍රකට කිරීමට ඇති ඉතා හොඳ ක්‍රමයකි. සමහර අප්‍රකටාර්ථයන් දැක්වීමට උපමා ද නැත. උපමා සොයා ගත හැක්කේ අප්‍රකටාර්ථයන්ගෙන් සමහරක් පමණක් ප්‍රකට කිරීමටය. ප්‍රතීත්‍යසමුත්පාදය ඉතා ගැඹුරු ධර්මයකි. එකකින් ම එය අවබෝධ කරවීමට සෑහෙන උපමාවක් සොයා ගෙන නැත. පූර්වචාර්‍ය්‍යවරයෝ පටිච්චසමුප්පාදය දැක්වීමට **අන්ධෝපමාවක්**

Non-commercial distribution

ගත්හ. එයින් ද පටිච්චසමුප්පාදය ප්‍රකට කළ හැක්කේ ඉතා මඳ වශයෙනි. එපමණට වත් එයට සුදුසු වන අන් උපමාවක් නුදුටු බැවින් මෙහි ද එය ම දක්වනු ලැබේ. ඒ මෙසේ ය.

එක ගමක අන්ධයෙක් විය. නො පෙනී ඒ මේ අත යන්නා වූ ඔහුගේ පය දිනක් මුලක පැකිළිණ. එයින් හෙතෙමේ බිම ඇද වැටිණ. එයින් ඔහුගේ දණහිසෙහි මහ ගෙඩියක් මතු විය. ගෙඩිය මෝරා පැසවා ගෙන එන කල්හි සිදුරු වුණ තැන්වල කුඩා බිබිලි සයක් මතු විය. ඒ බිබිලි ද ගසක සැපිණ. එයින් බලවත් වේදනාවක් හටගත. ඔහුට වේදනාවට ප්‍රතිකාරයක් ගැනීමේ ආශාව ඇති විය. ඔහු වෙදකු වෙත ගොස් නො මනා බෙහෙතක් ගති. නො මනා බෙහෙත ගෙඩියෙහි ගැල්විය. එයින් ගෙඩියෙහි තවත් නපුරු ලකුණු පහළ විය. එයින් ගෙඩිය නපුරු ලෙස පුපුරා අන්ධයා තවත් දුකට පත් විය. මේ අන්ධෝපමාව ය.

චතුරාර්‍ය්‍ය සත්‍යය හා ධර්මයන් ගේ අනිත්‍යාදි සාමාන්‍ය ලක්‍ෂණ හා ඒ ඒ ධර්මයට පමණක් අයත් විශේෂ ලක්‍ෂණ ද නො දක්නා බැවින් අවිද්‍යාව අන්ධයා වැනි ය.

අන්ධයා නො මහ ගොස් මුලේ පැටළෙන්නේ නො පෙනීම නිසා ය. එමෙන් ආර්‍ය්‍යසත්‍යයන් නො පෙනෙන බැවින් සත්ත්වයා පැමිණ තිබෙන දුකින් මිදීමේ හා සැපය ලැබීමේ ද බලාපොරොත්තුවෙන් තවත් දුක් ඇති වීමට තවත් සසර දික් වීමට හේතු වූ කර්ම කරන්නේ ය. කර්ම නම් අවිද්‍යා හේතුවෙන් වන්නා වූ සංස්කාරයෝ ය. නො දැනීම නිසා වන ඒ **සංස්කාරයෝ අන්ධයා ගේ පැකිළීම වැනි ය**.

පැකිළීමෙන් වනුයේ බිම ඇද වැටීම ය. සංස්කාර සංඛ්‍යාත පින් පව් කිරීමෙන් වනුයේ ද සුගති දුර්ගති දෙකට වැටීම ය. සුගති දුර්ගතීන්ට වැටීම නම් සංස්කාර හේතුවෙන් විඥානය පහළ වීම ය. එබැවින් සංස්කාර හේතුවෙන් පහළ වන **විඥානය, අන්ධයා ගේ බිම ඇද වැටීම වැනි ය**.

නාමරූපය වනුයේ භවයට වැටීම වූ විඥානය නිසා ය. එබැවින් **නාමරූපය**, වැටීම නිසා **අන්ධයා ගේ දණහිසැ මතු වූ ගෙඩිය වැනිය**.

Non-commercial distribution

ගෙඩියක් මෝරන කල්හි එහි රැස් වුණු ලේ සැරව පිට කරන සිදුරු සෑදෙන ස්ථානයන්හි පළමුවෙන් කුඩා බිබිලි මතු වේ. බිබිලි පුපුරා සිදුරු වී ඒ තැන්වලින් ලේ සැරව ගලන්නට පටන් ගනී. නාමරූපය මෝරන කල්හි එය හා බැඳී ෂඩායතනයෝ පහළ වෙති. ඒවායින් කැරෙනුයේ ද ගෙඩියෙන් ලේ සැරව ගලන්නාක් මෙන් රූප ශබ්දාදි ආරම්මණ විෂයෙහි ලෝභාදි කෙලෙස් සැරව ගැලීම ය. එබැවින් **ෂඩායතනය, අන්ධයා ගේ බිබිලි සය වැනි ය**.

අන්ධයා හට යම්කිසිවක නො සැපෙන සේ ගෙඩිය නො රැකිය හැකි ය. එය කවද හෝ යම් කිසිවක සැපෙන්නේය. එමෙන් රූපාදිය හා ගැටීමට සුදුසු පරිදි පහළ වූ ෂඩායතනය කවර අවස්ථාවකදී හෝ රූපාදීන් හා ගැටෙන්නේ ය. අන්ධයා ගේ බිබිලි ගසේ සැපීම වේදනාව ඇතිවීමට හේතුව වන්නාක් මෙන් ෂඩායතනයන් ගේ රූපාදිය හා ගැටීම ද වේදනාවට හේතුවක් වන බැවින් ෂඩායතන හේතුවෙන් වන **ඵස්ස ය, අන්ධයා ගේ ගෙඩියේ බිබිලි ගසේ සැපීම වැනි ය**.

අන්ධයාට ඇති වූ වේදනාව සැපීම නිසා ඇති වූවකි. එමෙන් ස්පර්ශ නිසා ඇතිවන **වේදනාව** ද ෂඩායතනය රූපාදියෙහි ගැටීමෙන් අතිවන්නක් බැවින් **අන්ධයා ගේ වේදනාව වැනි ය**.

වේදනාවෙන් පීඩිත අන්ධයාහට එය නො ඉවසිය හැකි බැවින් එයට බෙහෙතක් සොයා ගැනීමේ ආශාව ඇති වේ. එමෙන් ෂඩායතනයෙහි රූපාදිය සැපුණු කල්හි ඇති වූ වේදනාව නිසා සත්ත්වයාට ඒ රූපාදිය පිළිබඳව තෘෂ්ණාවක් ඇති වේ. ඒ **තෘෂ්ණාව** වේදනාවෙන් කෙරෙන පීඩනයට ප්‍රතිකාර සෙවීමක් වැනි බැවින් **අන්ධයා ගේ බෙහෙත් සොයා ගැනීමේ ආශාව වැනි ය**.

තෘෂ්ණා ඇති වූ කල්හි සත්ත්වයා තමාට හොඳක් කර ගන්නා අටියෙන් තෘෂ්ණාව ඇති වූ දෙයු ලබා ගෙන අයත් කරගෙන තවත් තෘෂ්ණාව දැඩි කර ගනී. රූපාදිය ආත්ම වශයෙන් ද දැඩි කොට ගනී. ඒ ගැනීම උපාදානය යි. හොඳක් කරගන්නා අටියෙන් එසේ කළත් එයින් වන්නේ වඩාත් නපුරකි. එබැවින් **උපාදානය අන්ධයා ගේ නොමනා බෙහෙත ගැනීම වැනි ය**.

රූපාදිය ආත්ම වශයෙන් හා ආත්මයට අයත් දේ වශයෙනුත් දැඩි කොට ගත් සත්ත්ව තෙමේ ඒවා ආරක්ෂාකර ගැනීම පිණිසත්

Non-commercial distribution

නැවත නැවත ලබා ගනු පිණිසත් භවගාමි කර්මයන් කරයි. අන්ධයා විසින් නො මනා බෙහෙත ගෙඩියෙහි ගැල්වීම තවත් දුක් ඇති වීමට හේතු වන්නාක් මෙන් කර්ම රැස් කිරීම තවත් දුක් ඇති වීමේ හේතුවක් වන බැවින් උපාදන ප්‍රත්‍යයෙන් වන්නා වූ **කර්ම සංඛ්‍යාත භවය අන්ධයා ගේ නො මනා බෙහෙත ගැල්වීම වැනි ය**.

කර්මභවය නිසා නැවත ද භවයක ඉපදීම වූ **ජාතිය** නො මනා බෙහෙත ගැල්වීමෙන් අන්ධයාගේ ගෙඩියට අළුතෙන් එක් වූ **ලේසැරව වැනි ය**.

ජාතිය නිසා හටගන්නා වූ **ජරාමරණය** වඩ වඩා ලේ සැරව එක්වීමෙන් අන්ධයා ගේ **ගෙඩිය පුපුරා යාම වැනි ය**. මෙසේ අන්ධෝපමාවෙන් පටිච්චසමුප්පාදය දත යුතු ය.

## සතර ආකාර ගැඹුරු බව

මේ පටිච්චසමුප්පාදය අර්ථ වශයෙන් ද, ධර්ම වශයෙන් ද, දේශනා වශයෙන් ද, ප්‍රතිවේධ වශයෙන් ද ඉතා ගැඹුරු ය. පත්ල නො සෙවිය හැකි පමණට ගැඹුරු ය.

අර්ථ යන මේ වචනය නොයෙක් අර්ථයන් දැක්වීමට ව්‍යවහාර කරන වචනයකි. මෙ තන්හි අර්ථය යි කියනුයේ **හේතුවේ ඵලයට ය**. පටිච්චසමුප්පාදය හේතුඵල පරම්පරාවකි. ජරාමරණය එහි එක් ඵල ධර්මයකි. එහි හේතුව ජාතිය ය. ජාතිය වුව හොත් ජරාමරණය නො වන්නේ නොවේ. ජාතියෙන් ම මිස අනෙකකින් ජරාමරණ වන්නේ ද නො වේ. එහෙත් ජාතිය නිසා ජරාමරණය ඇතිවන සැටි අවබෝධ කර ගැනීම දුෂ්කර ය. එබැවින් ජරා මරණයාගේ ජාතිය නිසා ඇති වූ බව, ජාතියෙන් ආ බව ගැඹුරු ය.

ජාතිය ද කර්මභවය ගේ ඵලයෙකි. කර්මභවය ඇති කල්හි අප්‍රහීණ ක්ලේශයන් ඇති සත්ත්වයා හට ජාතිය නො වන්නේ ද නො වේ. කර්මභවය නැති කල්හි ඒ ජාතිය අන් හේතුවකින් වන්නේ ද නොවේ. භවය ඇති කල්හි භවය නිසා ඒ ජාතිය මේ ආකාරයෙන් වේය යන්න අවබෝධ කර ගැනුම අපහසු බැවන් ජාතියගේ භවය නිසා ඇති වූ බව, පහළ වී ආ බව ගැඹුරු ය.

Non-commercial distribution

හවය උපාදනයාගේ ඵලයෙකි. උපාදනය ඇති වුව හොත් හවය නො වී නවතින්නේ ද නො වේ. උපාදනයා ගේ හේතුත්ත්වය නො ලබා අනෙකකින් හවය වන්නේ ද නො වේ. හවයාගේ මේ උපාදන හේතුවෙන් හටගන්නා වූ ආකාරය අවබෝධ කිරීමට අපහසු ය. එබැවින් හවයාගේ උපාදනය නිසා හටගත් බව, උපාදනය නිසා පහල වී ආ බව ගැඹුරු ය.

උපාදනය තෘෂ්ණාවේ ඵලයකි. තෘෂ්ණාව ඇති වුවහොත් උපාදන නො පහළ වන්නේ නො වේ. උපාදනය ද තෘෂ්ණාව නැති ව අන් හේතුවකින් පහල වන්නේ ද නො වේ. උපාදනයා ගේ තෘෂ්ණා හේතුවෙන් ඇති වන්නා වූ ආකාරය දුරවබෝධ ය. එබැවින් උපාදනයාගේ තෘෂ්ණා හේතුවෙන් හටගත් බව ගැඹුරු ය.

තෘෂ්ණාව වේදනාවගේ ඵලයෙකි. වේදනාව ස්පර්ශයාගේ ඵලයකි. ස්ඵර්ශය ෂඩායතනයාගේ ඵලයෙකි. ෂඩායතනය නාම රූපයාගේ ඵලයෙකි. නාමරූපය විඥනයාගේ ඵලයකි. විඥනය සංස්කාරයන්ගේ ඵලයකි. සංස්කාරය අවිද්‍යාවගේ ඵලයකි. මේ ඵල ධර්මයන්ගේ ගැඹුරු බව ද කියන ලද ඒවාට අනුව සිතා ගත යුතු ය. මෙසේ මේ පටිච්චසමුප්පාදය අර්ථ වශයෙන් ගැඹුරු වේ.

ධර්ම යනු ද නොයෙක් අර්ථයන්හි යෙදෙන වචනයකි. මේ ගම්භීර කථාවෙහි ධර්මය යි කියනුයේ හේතුවට ය. පටිච්චසමුප්පාදංගයෝ දෙළොස් දෙන ම ඵල පමණක් නොව හේතුහු ද වෙති. හේතුව පිළිබඳ වූ දුරවබෝධත්වය ධර්ම ගම්භීරත්වය යි. අවිද්‍යාව සංස්කාරයන්ගේ හේතුව ය. එය කවර ආකාරයකින් කවර අවස්ථාවක දී සංස්කාරයන්ට හේතු වේ ද යන බව තේරුම් ගැනීමට අපහසු ය. එබැවින් අවිද්‍යාවගේ සංස්කාරයන්ට ප්‍රත්‍යය වන බව ගැඹුරු ය. එසේ ම සංස්කාරාදීන් ගේ විඥනාදි ඵලයන්ට ප්‍රත්‍යය වන සැටි ද ගැඹුරු ය. මේ පටිච්චසමුප්පාදයාගේ ධර්මගම්භීරත්වය යි.

**පරම ගම්භීර ධර්මයක් වූ මේ ප්‍රතීත්‍යසමුත්පාදය දේශනා කිරීම ද පහසු කාර්‍ය්‍යයක් නො වේ**. බුදුවරයන්ගෙන් අන්‍යයන් පටිච්චසමුප්පාදය දේශනා කරනුයේ බුදුන් වහන්සේ දෙසූ පරිද්දෙනි. ප්‍රථමයෙන්ම මෙය සොයාගෙන දේශනා කළ හැක්කේ බුදුවරයන්ට

Non-commercial distribution

පමණෙකි. බුදුන් වහන්සේ විසින් දේශිත පටිච්චසමුප්පාදය විස්තර කිරීම වුව ද අන්‍යයන්ට ලෙහෙසි වැඩක් නො වේ. එබැවින් **බුදුගොස් මාහිමියෝ** පටිච්චසමුප්පාදය වර්ණනා කිරීමට පටන් ගන්නා අවස්ථාවේ දී මෙසේ පැවසූ හ.

**"වත්තුකාමො අහං අජ්ජ පච්චයාකාර වණ්ණනං**
**පතිට්ඨං නාධිගච්ඡාමි අජ්ඣොගාළ්හො ව සාගරං"**

"ප්‍රතීත්‍යසමුත්පාද වර්ණනාව කියනු කැමති මම අද මහමුහුදට වැටුණු එකකු සේ පිහිටක් නො ලබමිය" යනු එහි තේරුම යි. ත්‍රිපිටක ධර්ම විෂයෙහි සුනිපුන බුද්ධියක් ඇත්තා වූ අර්ථකථාචාර්යයන් වහන්සේ එසේ කීයේ එහි ඇති දුෂ්කරත්වය නිසාම ය.

බුදුන් වහන්සේ විසින් මේ ගම්භීර ධර්මය ඒ ඒ ආකාරයෙන් දෙසූ කල්හි අවබෝධ කරන්නා වූ සත්ත්වයනට අනුරූප පරිදි සමහර සූත්‍රයක දී මුල පටන් අග දක්වා ද, සමහර සූත්‍රයක දී අග පටන් මුල දක්වා ද, සමහර සූත්‍රයක දී ඒ දෙපරිද්දෙන්ම ද, සමහර සූත්‍රයකදී ත්‍රිසන්ධියකින් හා රාශි සතරකින් යුක්ත කොට ද, සමහර සූත්‍රයක දී සන්ධි දෙකකින් හා රාශි තුනකින් යුක්ත කොට ද, සමහර සූත්‍රයක දී එක් සන්ධියකින් හා රාශි දෙකින් යුක්ත කොට ද දේශනය කළ සේක. නානා ආකාරයෙන් පටිච්චසමුප්පාදය දක්වා දේශිත සූත්‍ර බොහෝ ගණනක් **නිදාන වග්ග සංයුත්තකයෙහි** ඇත්තේ ය. **විභංගපාළියේ** පටිච්චසමුප්පාද විභංගයෙහි අනේකාකාර පටිච්චසමුප්පාද දේශනා සිය ගණනෙකි. මෙසේ පටිච්චසමුප්පාදය පිළිබඳ වූ තථාගතයන් වහන්සේ ගේ දේශනය ද අනේකාකාර විචිත්‍ර බැවින් ගැඹුරු ය.

**ප්‍රතිවේධ වශයෙන් ගැඹුරු බව මෙසේ දත යුතු**. ඥානය වනාහි අනුමාන ඥානය - ප්‍රත්‍යක්ෂ ඥනයි දෙවැදෑරුම් වේ. ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නා ලද්දට අනුව නො දක්නා ලද්ද ද තේරුම් ගන්නා ඥනය අනුමාන ඥනය යි. ගින්නේ දුම් නගින බව ප්‍රත්‍යක්ෂ වශයෙන් දක්නා ලද්දකි. දුර දුමක් පෙනෙන කල්හි එහි ද ගින්නක් ඇතය යි දක්නා ලද්දට අනුව සිතා ගත හැකි ය. එය අනුමාන ඥනය යි. එය සමහර විට සත්‍ය ද වෙයි. සමහර විට අසත්‍ය ද වෙයි.

Non-commercial distribution

ඇසින් දක්නාක් මෙන් ම ඇසට නො පෙනෙන දෙය ද තත්වාකාරයෙන් දැකිය හැකි ඥානය ප්‍රත්‍යක්ෂ ඥානය යි. ප්‍රතිවේධය යි කියනුයේ ද ඒ ප්‍රත්‍යක්ෂ ඥානයට ය. අනුමාන ඥානය වනාහි අඳුරෙහි දී දුටු දෙයක් පිළිබඳව ඇති දැනුම වැනි ය. ප්‍රතිවේධ ඥානය සූර්‍ය්‍යාලෝකයේ දී දුටු දෙයක් පිළිබඳව ඇති දැනුම වැනි ය. ප්‍රතිවේධ සංඛ්‍යාත විශිෂ්ට ඥානය පියවි ඇසට නො පෙනෙන දෑ පෙන්වන කන්නාඩියක් වැනිය යි ද කිය යුතු ය. ඇසට හා අනුමාන ඥානයට හසු නො වන ඉතා අප්‍රකට කරුණු දත හැක්කේ ප්‍රතිවේධය යි කියන විශිෂ්ට ඥානයෙනි.

සාමාන්‍ය ඥානයට හසු නො වන විශිෂ්ට ඥානයෙන් දතයුතු වූ අප්‍රකට දේවලට ද **ප්‍රතිවේධ** යන නාමය කියනු ලැබේ. මෙම ගම්භීරභාව කථාවෙහි ප්‍රතිවේධ යන වචනයෙන් අදහස් කරනුයේ විශිෂ්ට ඥානයෙන් ම දතයුතු ස්වභාවයෝ ය.

පටිච්චසමුප්පාදයට අයත් වූ අවිද්‍යාදි ධර්මයන් ගේ සාමාන්‍ය ඥානයට හසු නොවන බොහෝ දුරවබෝධ ස්වභාවයෝ ඇත්තාහ. ඒවා ඉතා ගැඹුරු ය. පටිච්චසමුප්පාදයෙහි ප්‍රතිවේධ ගම්භීර භාවය නම් ඒ ස්වභාවයන් ගේ ගැඹුරු බව ය. ඒ ඒ පටිච්චසමුප්පාදංගයන්හි ඇති ගම්භීරත්වය විභංග අටුවාවෙහි දැක්වූ ආකාරය මෙසේ යඃ

**"අවිජ්ජාය අඤ්ඤාණ දස්සනසච්චා සංපටිවේධට්ඨෝ ගම්භීරෝ"**

තේරුමඃ-

අවිද්‍යාව ගේ ඥානයට ප්‍රතිපක්ෂ බව වූ නොදැනීමය, අරමුණුවල තත්ත්වාකාරය දැකීමට ප්‍රතිපක්ෂ බව වූ නො දක්නා ස්වභාවය ය, චතුරාර්‍ය්‍යසත්‍යය දක්නට නො දී වසා ගෙන සිටින ස්වභාවය ය යන මේවා ගැඹුරු ය.

**"සංඛාරානං අභිසංඛරණායූහනසරාගවිරාගට්ඨෝ (ගම්භීරෝ)"**

සංස්කාරයන්ගේ ස්කන්ධයන් ඇති කරන බව ය, ප්‍රාණඝාතාදි වූ ද දානාදි වූ ද ක්‍රියා සිදු කරන බව ය, රාගයට අනුකූල බවය, රාගයට ප්‍රතිපක්ෂ බවය යන මේ ස්වභාවයෝ ගැඹුරු ය.

Non-commercial distribution

**"විඤ්ඤාණස්ස සුඤ්ඤත අව්‍යාපාර අසංකන්ති පටිසන්ධි පාතුභාවට්ඨෝ** (ගම්භීරෝ)"

විඥානයාගේ ආත්ම ස්වභාවයෙන් හිස් බව ය, දැනගැනීම සුවදුක් විඳීම භවයෙන් භවයට යාම යනාදිය පිළිබඳ ව්‍යාපාරයක් නැති බව ය, නො ගොස් ම ප්‍රතිසන්ධිය ඇති වන බව ය යන මේ ස්වභාවයෝ ගැඹුරු ය.

**"නාමරූපස්ස ඒකුප්පාද විනිබ්භෝගා විනිබ්භෝ-ගමනරුප්පනට්ඨෝ** (ගම්භීරෝ)"

නාමරූපයා ගේ එකට උපදනා බවය, අමිශ්‍ර ව පවත්නා බවය, මිශ්‍ර ව පවත්නා බවය, නැමෙන බවය, විකාරයට පැමිණෙන බවය යන මේ ස්වභාවයෝ ගැඹුරු ය.

**"සළායතනස්ස අධිපතිලෝකද්වාරඛෙත්තවිසය විසිභාවට්ඨෝ** (ගම්භීරෝ)"

ෂඩායතනයා ගේ දර්ශනාදියෙහි අධිපති භාවය, ලෝක භාවය, ද්වාර භාවය ය, ක්ෂේත්‍රභාවය ය, විෂය භාවය ය, විෂයීභාවය ය යන මේ ස්වභාවයෝ ගැඹුරු ය.

**"ඵස්සස්ස ඵුසනසංඝට්ටන සංගතිසන්නිපාතට්ඨෝ** (ගම්භීරෝ)"

අරමුණු ස්පර්ශ කරන බවය, අරමුණෙහි ගැටෙන බවය, වස්ත්වාරම්මණ චිත්තයන්ගේ එක් වන බවය, එක් තැනකට වැටෙන බවය යන මේ ස්පර්ශයා ගේ ස්වභාවයෝ ගැඹුරු ය.

**"වේදනාය ආරම්මණරසානුභවනසුකදුක්ඛමජ්ඣත්තභාව නිජ්ජ් වේදයිතට්ඨෝ** (ගම්භීරෝ)"

වේදනාවගේ අරමුණු රසය වළඳන ස්වභාවය ය, සුඛදුඃඛමධ්‍යස්ථස්වභාවය ය, සත්ත්වයකු නො වී අරමුණු රස විඳින ස්වභාවය ය යන මේවා ගැඹුරු ය.

**"තණ්හාය අභිනන්දිතජ්ඣෝසාන සරිතාලතානදී තණ්හාසමුද්ද දුප්පූරණට්ඨෝ** (ගම්භීරෝ)"

Non-commercial distribution

තෘෂ්ණාවගේ අරමුණ හොඳ සැටියට ගන්නා බවය, ගිලගන්නාක් මෙන් තදින් අයිති කර ගැනීම් වශයෙන් අරමුණ ගන්නා බවය, අරමුණුවලට යන බවය, අරමුණුවල වෙළෙන බැවින් වැලක් වැනි බවය, දිගට යන බැවින් ගංගාවක් වැනි බවය, තෘෂ්ණා සාගරයක් බවය, පිරවීම දුෂ්කර බවය යන මේ ස්වභාවයෝ ගැඹුරු ය.

"**උපාදානස්ස ආදානගහනාභිනිවේසපරාමාස දුරතික්ක-මනට්ඨෝ** (ගම්භීරෝ)"

උපාදානයාගේ රූපාදිය තදින් ගන්නා බවය, කැමතිවීම් මාත්‍රයෙන් ගන්නා බවය, නිත්‍ය සුඛ ශුභාදි වශයෙන් සලකා ඒ ඒ ආරම්මණයට බැස ගන්නා බවය, නිත්‍යාදි වශයෙන් වරදවා ගන්නා බවය, ඉක්මවීමට දුෂ්කර බවය යන මේ ස්වභාවයෝ ගැඹුරු ය.

"**භවස්ස ආයූහනාභිසංඛරණ යෝනිගතිඨිති නිවාසේසු ඛිපනට්ඨෝ** (ගම්භීරෝ)"

භවයාගේ දානාදි ක්‍රියා සිදුකරන බවය, ස්කන්ධයන් ඇති කරන බවය, යෝනි ගති ඨිති නිවාසයන්හි බහාලන බවය යන ස්වභාවයෝ ගැඹුරු ය.

"**ජාතියා ජාති සඤ්ජාති ඔක්කන්ති නිබ්බත්ති පාතුභාවට්ඨෝ**. (ගම්භීරෝ)"

ජාතියගේ අපරිපූර්ණත්වයෙන් උපදනා බවය, පරිපූර්ණත්වයෙන් උපදනා බවය, ප්‍රවේශ වන්නාක් මෙන් උපදනා බවය, පහළවීම් වශයෙන් උපදනා බවය, ස්කන්ධයන් පහළ වන බවය යන මේ ස්වභාවයෝ ගැඹුරු ය.

"**ජරාමරණස්ස ඛයවයභේදවිපරිණාමට්ඨෝ** (ගම්භීරෝ)"

ජරාමරණයා ගේ අඩුවන බවය, නැති වන බවය, බිඳෙන බවය, අන් ආකාරයකට පැමිණෙන බවය යන මේ ස්වභාවයෝ ගැඹුරු ය.

Non-commercial distribution

# පටිච්චසමුප්පාදයේ නය සතර

ඒකත්ත නයය, නානත්ත නයය, අව්‍යාපාර නයය, එවංධම්මතා නයයයි අර්ථ නයය සතරෙක් වේ. භව චක්‍රය පිළිබඳ මනා දැනුම ඇති වනුයේ ඒ නය සතර ද මැනවින් තේරුම් ගත් කල්හි ය.

**ඒකත්ත නය.**

සහලෙන් බත ඇති වේ. සහල කෑමට නුසුදුසු තද දෙයකි. බත කෑමට සුදුසු මෘදු දෙයකි. සහල හා බත ලක්‍ෂණ වශයෙන් එකිනෙකට ඉතා වෙනස් ය. එකිනෙකට වෙනස් වූ සහල හා බත දෙකක් ද? එකක් ද? යනු විසඳා ගත යුත්තකි. බතෙහි සහල් ලක්‍ෂණයත් සහල්වල බතේ ලක්‍ෂණයත් නැති බැවින් ඒ දෙක එකකැ යි නො කිය හැකි ය. ඉදින් ඒ දෙක දෙකක් ම ය යි ගත හොත් සහල් හිමියාට බත අහිමි වීමෙන් අවුලක් වේ. එබඳු අවුලක් නො වන්නට නම් සහල හා බත ඒකත්වයෙන් ද පිළිගත යුතු ය. ඒ ඒකත්වය නම් පරම්පරා සම්බන්ධය යි. එමෙන් අවිද්‍යාවෙන් හටගන්නා සංස්කාරය අවිද්‍යාවට ඉතා වෙනස් වූ අන්‍ය ධර්මයකි. සංස්කාරයෙන් හටගන්නා විඥානය අවිද්‍යා සංස්කාර දෙකටම ලක්ෂණ වශයෙන් වෙනස් වූ ධර්මයෙකි. එහෙත් එක ම පරම්පරාවකට අයත් වීම් වශයෙන් ඒවායේ ඒකත්වයක් ද ඇත්තේ ය.

පටිච්චසමුප්පාදයේ **ඒකත්තනය** ය යි කියනුයේ ඒ ඒකත්වයට ය. මේ එකත්තනය මැනවින් දත් කල්හි "මැරෙන්නේ අනෙකෙක, උපදින්නේ අනෙකෙක, පින් පව් කරන්නේ අනෙකෙක, සුවදුක් විඳින්නේ අනෙකෙකැ"යි ගන්නා වූ **උච්ඡේද දෘෂ්ටිය** දුරු වේ. ඒකත්තනය වරදවා තේරුම් ගත් කල්හි ලක්‍ෂණ වශයෙන් එකිනෙකට වෙනස් වූ අවිද්‍යාදි ධර්ම සමූහය එක් කොට එක් දෙයක් සැටියට හෙවත් එක් සත්ත්වයකු සැටියට ගෙන **"සෝ කරෝති සෝ පටිසංවේදේති"** යනාදීන් දැක්වෙන පින් පව් කරන තැනැත්තා ම සුව දුක් විඳින්නේ ය, මේ සත්ත්වයා ම පරලොව යන්නේ ය යි **ශාශ්වත දෘෂ්ටිය** ගනී.

Non-commercial distribution

**නානත්ත නය**

අවිද්‍යාදි ධර්ම සමූහය ඒකත්වයෙන් දත යුතුවාක් මෙන් ම නානත්වයෙන් ද දත යුතු ය. එක් දෙයක් එක් සත්ත්වයකු එක් පුද්ගලයකු වශයෙන් පෙනෙන සේ සන්තති ප්‍රඥප්තියෙන් වැසී තිබෙන මේ ධර්ම සමූහය හේතු ඵල වශයෙන් හා ඒ ඒ ධර්මයට අයත් ලක්‍ෂණයන්ගේ වශයෙන් ද කාල වශයෙන් ද වෙන් වෙන් වූ ධර්මයන් ගේ සමූහයකි. අවිද්‍යාදීන් ගේ ඒ නානත්වය හෙවත් ධර්ම බොහෝ ගණනක් බව පටිච්චසමුප්පාදයාගේ **නානත්ත නයයි**.

මෙය මනාකොට දක්නා තැනැත්තා හට පරණ පරණ වූ සංස්කාරයන් ගේ බිඳී යාම හා අලුත් අලුත් සංස්කාරයන් පහළ වන බවත් අවබෝධ වීමෙන් භවයෙන් භවයට යෙමින් සුව දුක් විඳින සත්ත්වයකු ඇතය යි ගන්නා **ශාශ්වත දෘෂ්ටිය** දුරු වේ. වරදවා ගත් තැනැත්තා එක සන්තානයකට අයත් ධර්මයන් වෙන් වෙන් වූ සන්තානයන්ට අයත් ධර්ම සේ පමණ ඉක්මවා නානත්වයෙන් ගෙන අනෙකෙක් මැරෙන්නේ ය, අනෙකෙක් උපදින්නේ ය. අනෙකෙක් කර්ම කරන්නේ ය, අනෙකෙක් සුව දුක් විඳින්නේ යයි **උච්ඡේද දෘෂ්ටිය ගනී**.

**අව්‍යාපාර නය**

සංස්කාරාදි ඵල ධර්මන් ඇති වීමට අවිද්‍යාදි හේතු ධර්මයන් ප්‍රත්‍යය වෙතත්, සංස්කාරාදිය ඉපදවීමේ උත්සාහයක් හෝ ඕනෑ කමක් අවිද්‍යාදියට නැත. අවිද්‍යාදි හේතුන් ගේ ඵල ඇති කිරීමේ උත්සාහයක් නැති බව **අව්‍යාපාර නය යි**. මෙය මනා කොට දුටු කල්හි කර්ම කරන්නා වූ කෙනකු නැති බව හා ජාතියෙන් ජාතියට භවයෙන් භවයට යන්නකු නැති බව ද වේදනාව හැර සුව දුක් විඳින්නකු නැති බව ද අවබෝධ වී ආත්මය පින් පව් කරන්නේ ය, ආත්මය භවයෙන් භවයට යන්නේ ය, ආත්මය සුව දුක් විඳින්නේ ය යන **ආත්ම දෘෂ්ටිය** දුරුවේ.

අව්‍යාපාර නය වරදවා ගත් තැනැත්තේ කිසිවෙකු ගේ විධානයක් නැති ව, ගින්න උඩ බලා යන්නාක් මෙන් ද, සුළඟ සරසට යන්නාක් මෙන් ද, ගං - හෝ මුහුදු බලා ගලන්නාක් මෙන්

Non-commercial distribution

ද, සියල්ල ඉබේ ම සිදු වන්නේ ය. කෙනකු ගේ ක්‍රියාවකින් සිදුවන කිසිවක් නැත ය යි පවින් වැළකීමෙන් හා පින් කිරීමෙන් ද වන ඵලයක් නැතය යන **අක්‍රිය දෘෂ්ටිය** ගන්නේ ය.

**එවං ධම්මතා නය**

සංස්කාරාදි ඵල ඉපදවීමේ උත්සාහයක් අවිද්‍යාදි හේතු ධර්මයන් කෙරෙහි නැත ද, අඹගසින් කොස් ගෙඩි පොල් ගෙඩි නූපදවා අඹ ගෙඩි ම උපදවන්නාක් මෙන් ද, පොල්ගස අඹගෙඩි කොස්ගෙඩි නූපදවා පොල් ගෙඩි ම උපදවන්නාක් මෙන් ද, සහල වැලි හෝ සූකිරි හෝ නූපදවා බත ම උපදවන්නාක් මෙන් ද, අවිද්‍යාදි ධර්මයෝ නියමයක් නැති යම්කිසි ඵලයක් ඇති නො කොට ඒ ඒ හේතු ධර්මයට අනුකූල වූ පරිදි සංස්කාරාදි ඵලයන් ම උපදවති. අවිද්‍යාදීන් ගේ ඒ හේතුවට අනුකූල ඵලය ම උපදවන බව පටිච්චසමුප්පාදයේ **එවංධම්මතා නය** යි.

මේ නයය මනා කොට දක්නා තැනැත්තේ සියල්ලෙන් ම සියල්ල ම නො හට ගන්නේ වී නමුත් තලවලින් තෙල් ද සහලෙන් බත් ද දෙනගෙන් කිරි ද උක්දඬුයෙන් පැණි ද හටගන්නාක් මෙන් ප්‍රත්‍යයට අනුරූප ඵලය හටගන්නා බව අවබෝධ කර ගැනීමෙන් කිසිවකින් කිසිවක් නො හටගන්නේය යන අහේතුක දෘෂ්ටිය දුර ලන්නේ ය. "ක්‍රියාවෙන් සිදුවන ඵලයක් නැති බැවින් පවින් වැළකීමෙන් හෝ පින් කිරීමෙන් ද වැඩක් නැතය යි" ගන්නා වූ **අක්‍රිය දෘෂ්ටිය** ද දුර ලන්නේ ය.

එවං ධම්මතා නය නො දක්නා තැනැත්තේ එක් දෙයකින් එයට වෙනස් වූ අන් දෙයක් ඇති වෙත හොත් වැල්ලෙන් තෙල් ද උක්දඬුයෙන් කිරි ද කොසඹ රුකින් පැණිද ඇති නො වන්නේ මන් දැ යි ප්‍රශ්න කරමින් කිසිවකින් කිසිවක් ඇති නො වන්නේ ය යන **අහේතුක දෘෂ්ටිය** ද ගනී. අන්කිසි හේතුවක් නැත ද තලවලින් තෙල් ද දෙනගෙන් කිරි ද ශුක්‍රශෝණිතයෙන් ශරීරය ද ඇතිවන්නාක් මෙන් නියමය වූ පරිදි සියල්ල ඉබේ ම සිදුවේ ය යන **නියතිවාදය** ද ගන්නේ ය.

**අනුලෝම ප්‍රතීත්‍යසමුත්පාද විස්තරය**
**මෙතෙකින් අවසන් කරන ලදී.**

Non-commercial distribution

## ප්‍රතිලෝම ප්‍රතීත්‍යසමුත්පාදය

## හෙවත්

# සංසාර චක්‍රයාගේ නිරෝධය

**අවිජ්ජායත්වේව අසේසවිරාග නිරෝධා සංඛාර නිරෝධෝ**

**සංඛාර නිරෝධා විඤ්ඤාණ නිරෝධෝ.**
**විඤ්ඤාණ නිරෝධා නාමරූප නිරෝධෝ.**
**නාමරූප නිරෝධා සළායතන නිරෝධෝ.**
**සළායතන නිරෝධා ඵස්ස නිරෝධෝ**
**ඵස්ස නිරෝධා වේදනා නිරෝධෝ.**
**වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ.**
**තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ.**
**උපාදාන නිරෝධා භව නිරෝධෝ.**
**භව නිරෝධා ජාති නිරෝධෝ.**

**ජාති නිරෝධා - ජරාමරණං සෝකපරිදේවදුක්ඛ දෝමනස්සුපායාසා නිරුජ්ඣන්ති.**

**ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධෝ හෝති.**

මේ ප්‍රතිලෝම ප්‍රතීත්‍යසමුත්පාද දේශනා පාළිය ය.

**තේරුම:-**

ලෝකෝත්තර මාර්ගඥාන සංඛ්‍යාත විද්‍යාව කරණ කොට ගෙන අවිද්‍යාවගේ නිරවශේෂ නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ.

සංස්කාර නිරෝධයෙන් ප්‍රතිසන්ධි විඥානයේ නිරෝධය වේ.

ප්‍රතිසන්ධි විඥාන නිරෝධයෙන් නාමරූප නිරෝධය වේ.

නාමරූප නිරෝධයෙන් චක්ඛායතනාදි ආයතන සයේ නිරෝධය වේ.

ආයතන සයේ නිරෝධයෙන් චක්ඛුසම්ඵස්සාදි ඵස්ස සයේ නිරෝධය වේ.

Non-commercial distribution

ඵස්ස නිරෝධයෙන් චක්ඛුසම්ඵස්සජ වේදනාදි වේදනා සයේ නිරෝධය වේ.

වේදනා සයේ නිරෝධයෙන් රූප තණ්හා සයේ නිරෝධය වේ.

තණ්හා සයේ නිරෝධයෙන් උපාදනයන් ගේ නිරෝධය වේ.

උපාදන නිරෝධයෙන් කර්‍මභවය උපපත්තිභවය යන භවයන්ගේ නිරෝධය වේ.

භවයන්ගේ නිරෝධයෙන් ජාති නිරෝධය හෙවත් නැවත ඉපදීමේ නිරෝධය වේ.

ජාති නිරෝධයෙන් ජරාමරණශෝකපරිදේව දුඃඛදෞර්මනස්‍ය-උපායාසයෝ නො වෙත්.

මෙසේ මේ සකල දුඃඛස්කන්ධයා ගේ නිරෝධය වේ.

“අවිජ්ජාපච්චයා සංඛාරා” යනාදි දේශනය අනුලෝම පටිච්චසමුප්පාද නම් වේ. “අවිජ්ජායත්වේව අසේසවිරාග නිරෝධා සංඛාරනිරොධො” යනාදි දේශනය පටිලෝම පටිච්චසමුප්පාද නම් වේ. අනුලෝම පටිච්චසමුප්පාද දේශනයෙන් දැක්වෙන්නේ සංසාරචක්‍රය ය. ඒ සංසාර චක්‍රයට ද පටිච්චසමුප්පාද යන නම කියනු ලැබේ. ප්‍රතිලෝම ප්‍රතීත්‍ය සමුත්පාද දේශනයෙන් දැක්වෙන්නේ සංසාරචක්‍රයාගේ නිරෝධය වූ නිර්වාණය ය.

**නිරෝධය** යන වචනය ඇසෙන කල්හි සාමාන්‍ය ජනයාගේ සිතට දැනෙන නිරෝධය අනෙකකි, ප්‍රතිලෝම ප්‍රතීත්‍යසමුත්පාද දේශනයෙන් දැක්වෙන නිරෝධය ඉතා ගැඹුරු කරුණෙකි. එය තේරුම් ගත හැකිවීම පිණිස නිරෝධය යන වචනයෙන් කියැවෙන අර්ථ දෙක හෙවත් නිරෝධ දෙක පළමුවෙන් දත යුතුය.

## ද්විවිධ නිරෝධය.

යමකට ගැසූ කල්හි ඇතිවන හඬ සැණෙකින් ම නැති වන්නාක් මෙන්, අහසෙහි හටගන්නා විදුලිය සැණෙකින් නැතිවන්නාක් මෙන්, උපදින උපදින සංස්කාර සියල්ල කිසිවක් ඉතිරි නො වන පරිදි ඒ ඒ වේලාවේදී ම අභාවප්‍රාප්ත වේ. එය සකල සංස්කාරයන්ගේ ම

Non-commercial distribution

ස්වභාවය ය. උපදින සංස්කාරයන් ගේ ඒ අභාවප්‍රාප්තියට හෙවත් නැති වී යාමට ද නිරෝධ ය යි කියනු ලැබේ. නිරෝධ යන වචනය ඇසෙන කල්හි සාමාන්‍ය ජනයාගේ සිතට එන්නේ ඒ ඇති වූ සංස්කාරයන් ගේ නැති වී යාම ය. ඇති වූ සංස්කාරයන්ගේ නැති වී යාම වූ නිරෝධය ඒ ඒ ධර්මය පිළිබඳ අභාව මාත්‍රය ය. එය සිස් බවකි. එහි කිසි වටිනාකමක් ඇති ගුණ විශේෂයක් නැත්තේ ය.

උපදින සෑම අවිද්‍යාවක් ම එකෙණෙහිම නිරුද්ධ වන්නේ ය, සෑම සංස්කාරයක් ම - සෑම විඤ්ඤාණයක්ම - සෑම නාමයක් ම - සෑම රූපයක් ම ඒ මොහොතේදීම නිරුද්ධ වන්නේ ය. අවිද්‍යාදීන් ගේ ඒ නිරෝධය ස්වාභාවික නිරෝධය ය. එයට ක්ෂණික නිරෝධය යි ද කියනු ලැබේ. සංසාර චක්‍රයට අයත් ධර්මයන් ක්ෂණික නිරෝධයෙන් කොතෙක් නිරුද්ධ වුවත් අලුත් අලුත් ධර්ම ඉදිරියට ඇතිවීම් වශයෙන් සංසාරචක්‍රයාගේ කරකැවීම සිදු වෙනවා මිස නැවතීමක් නො වේ. සංසාරචක්‍රයා ගේ නැවැත්ම වන්නේ ඉදිරියට ඇතිවිය හැකි අවිද්‍යා සංස්කාරාදි හේතුඵල ධර්මයන් ගේ ඇති නොවීමෙනි.

ප්‍රතිලෝම ප්‍රතීත්‍යසමුත්පාද දේශනයෙහි නිරෝධ යනුවෙන් දැක්වෙන්නේ සත්ත්වයාගේ සන්තානයෙහි ඇති වූ අවිද්‍යාදීන්ගේ ක්ෂණික නිරෝධය නොව, එතෙක් ඇති නො වූ මතු ඇතිවිය හැකිව තිබෙන්නා වූ අවිද්‍යා සංස්කාරාදීන්ගේ මතු කවර කලෙකවත් නූපදනා ස්වභාවය ය. එයට අනුත්පාද නිරෝධය යි කියනු ලැබේ. ක්ෂණික නිරෝධ - අනුත්පාද නිරෝධ දෙක්හි වෙනස සිත්හි තබා ගෙන ම මේ ධර්මය ගැන කල්පනා කරත්වා.

සංසාර චක්‍රය සිඳ දුක්ඛස්කන්ධයෙන් මිදී නිවන් සුවය ලබනු කැමැතියන්හට ඒ සඳහා කරන්නට ඇත්තේ එකම දෙයකි. එනම් අවිද්‍යාව නැති කිරීමය. යම් ප්‍රතිපත්තියකින් අවිද්‍යාව නැති වේ නම් ඒ ප්‍රතිපත්තිය පිරීමය. අවිද්‍යා නිරෝධය වුවහොත් සංස්කාරාදි සකල ප්‍රතීත්‍යසමුත්පාදාංගයන්ගේ ම නිරෝධය සිද්ධය. අවිද්‍යා සංස්කාරාදීන් පිළිබඳ වෙන් වෙන් වූ නිරෝධ, ව්‍යවහාරයෙහි ඇති මුත් ධර්ම වශයෙන් නොලැබේ.

Non-commercial distribution

සංසාර චක්‍රයෙහි අවිද්‍යාව නිසා එයට පසු ව සංස්කාරය ඇති වේ. සංස්කාරය නිසා එයට පසුව විඤ්ඤාණය ඇති වේ. විඤ්ඤාණය නිසා එයට පසුව නාමරූප ඇති වේ. පළමුවෙන් අවිද්‍යාව නිරුද්ධ-වීම නිසා ඊට පසු සංස්කාර නිරුද්ධ වීමය, සංස්කාර නිරුද්ධ වීම ඊට පසු විඤ්ඤාණ නිරුද්ධ වීමය කියා, නිරුද්ධවීමේ පටිපාටියක් නැත්තේ ය. නිරුද්ධ වීමේ පටිපාටිය ලැබෙන්නේ කීමට පමණය.

උපන් අවිද්‍යාදි ධර්මයන්හි එකිනෙකට වෙන් බවක් ඇත්තේ ය. වෙන් ව ලැබෙන්නා වූ ඒ ධර්මයන් ගේ උත්පාද - නිරෝධ ද වෙන් වෙන් වශයෙන් ලැබෙන්නේ ය. ප්‍රතිලෝම ප්‍රතීත්‍යසමුත්පාද දේශනයේ දැක්වෙන අවිද්‍යාදීන්ගේ අනුත්පාද නිරෝධය එතෙක් නූපන් ධර්මයන් පිළිබඳ වූ නිරෝධයෙකි. නූපන්නා වූ අවිද්‍යාදි ධර්ම එකිනෙක වෙන් ව ඇත්තාහු නො වෙති. ඒ අවිද්‍යාදිය පවා වෙන් වෙන් ව නො ලැබෙන කල්හි ඒවා පිළිබඳ එකිනෙකට වෙන් වූ නිරෝධ බොහෝ ගණනක් කෙසේ ලැබිය හැකි ද? නොලැබේම ය. අවිද්‍යා නිරෝධය වෙතොත් ඒ සමග එකට බැඳී සංස්කාරාදීන් ගේ නිරෝධය ද වේ. අවිද්‍යා නිරෝධය අනිකක් ය, සංස්කාර නිරෝධය අනිකක් ය, විඤ්ඤාණ නිරෝධය අනිකක්ය කියා වෙන් බවක් නො ලැබේ.

අඹ ඇටය නිසා අඹ ගස ඇති වේ. අඹ ගස නිසා අඹ මල ඇති වේ. අඹ මල නිසා අඹ ගෙඩිය ඇති වේ. අඹ ගෙඩිය නිසා නැවත අඹ ඇටය ඇති වේ. අඹ ඇටය නිසා නැවත අඹ ගසක් ඇති වේ. මෙසේ අඹ ගස් පරම්පරාව නො සිඳී පවතී. ගින්නෙන් දවා අඹ ඇටය අළුකර දැමුව හොත් අඹ ඇටය නැති වනු සමග ම ඒ අඹ ඇටයේ පරම්පරාවෙහි මතු ඇතිවිය හැකි අඹගස් අඹ මල් අඹ ගෙඩි අඹ ඇට හා පසුව ඇතිවිය හැකි අඹ ගස් පරම්පරාව ද නැති වන්නේ ය.

පළමු අඹ ඇටයේ පරම්පරාවෙහි අඹ ගස් - අඹ මල් - අඹ ගෙඩි - අඹ ඇට ආදියේ ඇතිවීම වෙන වෙනම සිදුවන්නාක් මෙන් අඹ ඇටය නැතිවූ කල්හි අඹගස් - අඹමල් ආදියේ නැතිවීම වෙන වෙන ම සිදුවන්නේ නො වේ. අඹ ඇටයේ නැතිවීමට ඇතුළත්ව, අඹ ඇටයේ නැතිවීම හා එකම නැතිවීමක් වශයෙන් ම අඹ

Non-commercial distribution

පරම්පරාවේ නැතිවීම සිදු වේ. එමෙන්ම මේ සංස්කාර චක්‍රයේ සංසාර විඤ්ඤාණාදි සකල ප්‍රතීත්‍යසමුත්පාදාංගයන් ගේ ම නිරෝධය, අවිද්‍යා නිරෝධයටම ඇතුළත් ව එකම නිරෝධයක් වශයෙන් ම වන බව දත යුතු ය.

මේ අනුත්පාද නිරෝධය වනාහි ඒ ඒ සංස්කාරයන්ගේ අභාවප්‍රාප්ති මාත්‍රය වූ සිස් බව නොව, ශාන්ත සුඛස්වභාවයෙන් විද්‍යමාන එක්තරා පරමාර්ථ ධර්මයකි. ජරා - මරණ - ශෝක - පරිදේවාදි දුඃඛස්කන්ධයෙන් මිදීමට ඇත්තා වූ එකම පිහිට මේ නිරෝධ ස්වභාවය ය. බුද්ධාදි මහෝත්තමයන් වර්ණනා කරන ලෝකෝත්තර නිර්වාණ ධාතුව ද මේ අනුත්පාද නිරෝධයම ය. එය සාමාන්‍ය ජනයාට ලෙහෙසියෙන් දත නො හෙන පරම සූක්ෂම පරම ගම්භීර ධර්මයකි. සාමාන්‍ය ජනයාට දැනෙන සාමාන්‍ය ජනයාගේ සිත්වලට ලෙහෙසියෙන් හසුවන, ලෝකයට අයත් සකල සංස්කාරයෝ ම ඒ ඒ දෙය ඇතිවීමට නිසි හේතූන් නිසා උපදින්නෝ ය. උපදින සියල්ලට ම දිරීම හා බිඳීමක් ඇත්තේ ය. මේ අනුත්පාද නිරෝධ සංඛ්‍යාත නිර්වාණ ධාතුව යම් කිසි හේතුවකින් ප්‍රත්‍යයකින් ඇතිවන්නක් නො වේ. එය හටගැනීමක් නැතිව ම ඇති ධර්මයකි. හට ගැනීමක් නැතිව ඇත්තා වූ ඒ නිරෝධ ස්වභාවයෙහි දිරීමක් බිඳීමක් ද නැත්තේ ය. එය වෙනසක් නො වී සෑම කල්හි එක ලෙසින් ම පවත්නා ධර්මයකි. මේ නිර්වාණ ධාතුව ඒකාන්තයෙන් ඇතත් සිතට හසු කර ගත හැකි රූ සටහනක් එහි නැත්තේ ය.

මේසය -පුටුව - ගෙය යනාදි වචන ඇසෙන කල්හි අසන්නහුගේ සිතට මේස - පුටු ආදියේ රූ සටහන් හසුවන්නේ ය. එයින් ඒ වචනවලින් කියැවෙන අර්ථය අසන්නාට හොඳින් දැනෙන්නේ ය. නිරෝධය - නිවන යනාදි වචන ඇසෙන කල්හි අසන්නාගේ සිතට එන සටහනක් ඒ නිවනෙහි නැති බැවින්, ඒ වචන ඇසෙන කල්හි සාමාන්‍ය ජනයාගේ සිත්වලට හසුවන තරමේ ඖදාරික දෙයක් නිවනෙහි නැති බැවින්, ඔවුනට දැනෙන්නේ ඒ නිවන කිසි වටිනා කමක් නැති සිස් බවක් සේ ය. බිය විය යුත්තක් සේ ය. ඒ නිරෝධ ස්වභාවය වටිනාකම පමණ කළ නො හෙන මහා සුඛයක් බව තේරුම් ගත හැකි වීමට සුඛය පිළිබඳ දැනීමක් ඇතිකර ගත යුතු ය.

Non-commercial distribution

# ද්විවිධ සුඛය

**වේදයිතසුඛය - විමුක්තිසුඛය** කියා සැප දෙවර්ගයක් ඇත්තේ ය. ඇසට හොඳ දේවල් දැකීමෙන් ද, කනට මිහිරි හඬ ඇසීමෙන් ද, නාසයට මිහිරි ගන්ධයන් ආඝ්‍රාණය කිරීමෙන් ද, දිවට හොඳ බොජුන් වැළඳීමෙන් ද, කයට හොඳ පහස් ලැබීමෙන් ද සිතට හොඳ මිලමුදල් - තනතුරු - ගරුනම්බු ආදිය ලැබීමෙන් ද ඇතිවන සොම්නසඃ ප්‍රීති සහිත ආශ්වාදය **වේදයිතසුඛ** නම් වේ. පැමිණ ඇත්තා වූ ද, මතු ඇති විය හැකි වූ ද, දුක්වලින් කරදරවලින් විපත්වලින් මිදීම **විමුක්තිසුඛ** නම් වේ. නිදහස් සුවය යනු එයට නමෙකි.

වේදයිතසුඛ - විමුක්තිසුඛය යන මේ දෙකින් වේදයිත සුඛය හෙවත් විඳින සැපය සුළු කලක් මිස බොහෝ කලක් පවත්නක් නො වේ. හොඳ දේවල් බැලීමෙන් වන සුවය පවත්නේ බලා සිටින තෙක් පමණෙකි. ඉන් පසු ඒ සුවය නැත. එයින් මඳකුදු ඉතිරි වන්නේ නැත. මිහිරි හඬ ඇසීමෙන් වන සුවය පවත්නේත් එය අසමින් සිටිනා තෙක් පමණෙකි. සුවඳ ආඝ්‍රාණය කිරීමේ සුවය පවත්නේ ආඝ්‍රාණය කරමින් ඉන්නා තෙක් ය. මිහිරි බොජුන් වැළඳීමේ සුවය පවත්නේ වළඳමින් ඉන්නා තෙක් ය. කයට හොඳ දේ සැපයීමෙන් වන සුවය පවත්නේ පහස ලබමින් ඉන්නා තෙක් ය. සිතට හොඳ දේවලින් ලැබෙන සුවය පවත්නේත් ඒවා සිහිකරමින් ඉන්නා තෙක් ය. ඒ සුවවලින් පසුවට ඉතිරිවන කිසිවක් නැත්තේ ය.

නින්දෙහි දී පෙනෙන සිහින බඳු වූ මඳ වේලාවක් පවත්නා වූ ඒ සැපවල එතරම් වටිනා කමක් උසස් කමක් නැත. හොඳය යි සලකන දේ බැලීම් ආදියෙන් ලබන සුවය නො ලැබුයේ ද ඉන් අමාරුවක් නැත. පැමිණ ඇති දුකක් සන්සිඳවා නො ගෙන දිගට ම එය විඳීම නම් ඉතා අමාරු කරුණෙකි. එබැවින් පැමිණ ඇති දුක නිවා ගැනීමට - නැතිකර ගැනීමට පැමිණ ඇති දුකින් නිදහස් වීමට හැකිතාක් උත්සාහ කළ යුතු ය.

දුකින් මිදීමේ සැපය කොතෙක් උත්සාහ කොට වුව ද කොතෙක් වියදම් කොට වුව ද ලබාගත යුතු ම ය. ඒ දුකින් මිදීමේ සුවය වේදයිත සුඛය සේ ක්ෂණික සුඛයක් නොවේ. නිවී ගියා වූ

Non-commercial distribution

සංසිඳී ගියා වූ දුක නැවත එනතුරු ඒ සුවය පතන්නේ ය. සන්සිඳුනා වූ දුක නැවත කිසි කලෙක නො එන සේම සන්සිඳී ගියේ නම්, ඒ විමුක්ති සුඛය සැම කල්හි ම පවත්නේ ය. දීඝී කාලයක් පවත්නා බැවින් විමුක්ති සුඛය බොහෝ අගනේ ය. එහි ප්‍රමාණයත් අගයත් ගණන් ගත යුත්තේ සන්සිදෙන්නා වූ දුක්වල ප්‍රමාණය අනුව ය. කුඩා දුකක් නිවීමේ සුවය කුඩාය යි කිය යුතු ය. මහත් දුකක් සන්සිඳීමේ සුවය මහත්ය යි කිය යුතු ය. කුඩා දුකක් සන්සීමේ සුවය මඳක් අගනා බවත්, දීර්ඝ කාලයක් පැවතිය හැකි මහත් දුකක නිවීම් සැපය බොහෝ අගනා බවත් කිය යුතු ය.

හිසරදය එතරම් මහත් දුකක් නොවේ. එහෙත් දීර්ඝ කාලයක් පැවතිය හැකි තද හිසරදයක් ඇති තැනැත්තා සුළු වියදමකින් එය සුවකර ගත නොහැකි වුව හොත් ඒ සඳහා දහසක් වුව ද වියදම් කරන්නේ ය. රෝගියා ධනවතෙක් නම් එය සුවවනතුරු දසදහසක් වුවත් ඊටත් වැඩි ගණනක් වුවත් වියදම් කරන්නේ ය. "හිසරදයේ සුවය එතරම් වටිනා එකක් නො වේය" කියා ධනය ඉතුරු කර ගෙන හිසරදය වූ දුක විඳිමින් නො වෙහෙසෙන්නේ ය. හිසරදයක සන්සිඳීම වූ විමුක්ති සුඛයක එපමණ වටිනා කමක් නැති නම් රෝගීහු එය ලබනු පිණිස එපමණ ධනයක් වියදම් නො කරන්නාහ. වියදම් කරන්නේ ඒ සුවය වටිනා දෙයක් නිසා ය.

මරණයට හසුවිය හැකි - මැරෙන්නට සිදුවිය හැකි කරුණක් පැමිණි කල්හි, ලක්‍ෂයක් හෝ කෝටියක් වියදම් නො කළ හොත් ඒ මරණයෙන් නො ගැලවිය හැකි නම්, ඒ පුද්ගලයාත් ධනවතෙක් නම් මරණයෙන් නිදහස් වීම සඳහා ලක්‍ෂයක් වුවද වියදම් කරන්නේ ය. කෝටියක් වුව ද වියදම් කරන්නේ ය. එපමණ ධනයක් ඒ සඳහා වැය කරන්නේ මරණයෙන් මිදීම වූ විමුක්ති සුඛය ලක්‍ෂයක් කෝටියක් පමණ වටිනා නිසා ය.

ඉදින් රජකෙනෙකුට මැරෙන්නට සිදුවී ඇති විටෙක රාජ්‍යය පරිත්‍යාග කළහොත් එයින් මිදිය හැකි වේ නම්, ඒ රජ රාජ්‍යය පරිත්‍යාග කොට මරණයෙන් නිදහස ලබන්නේ ය. එසේ කරන්නේ ඒ මරණ විමුක්තිය රාජ්‍යය තරම් වටිනා බැවිනි. සත්ත්වයා නිවනට නො පැමිණ සසර සැරිසරතහොත් ඔහුට අනාගතයෙහි මරණයට

Non-commercial distribution

පැමිණෙනන්ට සිදුවන වාර ලක්‍ෂයක් ද නොවේ. කෝටියක් ප්‍රකෝටියක් ද නො වේ. ප්‍රමාණ කළ නොහෙන වාර සංඛ්‍යාවක් ඔහුට මැරෙන්නට සිදු වේ. එක භවයක දී ලබන්නට වන එක මරණයකින් තාවකාලික වශයෙන් මිදීමේ සුවය ම ලක්‍ෂයක් වුව ද, කෝටියක් පමණ වුව ද රාජ්‍යයක් පමණ වුව ද වටිනා කල්හි අනාගතයෙහි පැමිණිය හැකි අප්‍රමාණ මරණයන් ගෙන් නිදහස වූ ලෝකෝත්තර නිර්වාණ සංඛ්‍යාත මහා විමුක්ති සුඛයේ අගය කෙසේ ප්‍රමාණ කළ හැකි වේ ද? නො හැකි වේම ය.

නිවනට නො පැමිණ සසර සැරිසරත හොත් එක් පුද්ගලයකුට අනාගතයෙහි ලබන්නට සිදුවන්නේ මරණ දුක පමණක් නො වේ. ඔහුට අනාගතයෙහිදී ප්‍රමාණ නො කළහැකි තරමටම බොහෝ වූ ජාතිවලදී පොලුවලින්, ගල්වලින්, පිහියාවලින්, කඩුවලින්, කැති - මන්නා - වෑ - පොරෝ - උදලුවලින් පහර කෑමේ දුක් ද ලැබෙන්නේ ය. සොරසතුරන් විසින් ධනය පැහැර ගැනීමේ දුක් ද, දූ - දරුවන් පැහැර ගැනීමේ දුක් ද, බලයෙන් අල්ලාගෙන දිවි ඇතිතාක් වැඩ ගැනීමේ දුක් ද, සිරගෙවල ලෑමේ දුක් ද, දෙතිස්වධ ලැබීමේ දුක් ද, සර්පයන් විසින් දෂ්ට කරනු ලැබීමේ දුක් ද, කඩුවේගන් - පරංගි - ලාදුරු - වණ - පිළිකා - අපස්මාර - කාශ - ශ්වාස - වමන - අතීසාරාදි අනේක රෝගයන් ඇතිවීමේ දුක් ද, ජරා දුක් ද ඇති වන්නේ ය.

ගව ව, අශ්ව ව, ඇත්ව උපදනා අවස්ථාවලදී, තළ තළා කෙවිටි ආදියෙන් ඇණ ඇණ වැඩගැනීමේ දුක් ද, දුබල තිරිසන්ව උපදනා කාලවලදී බලවත් සතුන් විසින් අල්ලාගෙන හඬව හඬවා කැබලි කැබලි කඩා කනු ලැබීමේ දුක් ද, පණ තිබියදීම ගිල දමනු ලැබීමේ දුක් ද, මිනිසුන් විසින් ගින්නේ දවනු ලැබීමේ දුක් ද, ආහාරපාන නො ලබා වියළී මියයන්නට වීමේ දුක් ද, රෝගාතුරව දුබලව ඇදවැටුණු අවස්ථාවලදී කපුටන් විසින් ඇස් ආදියට කොටනු ලැබීමේ දුක් ද, වණ සෑදී පණුවන් කෑමේ දුක් ද, ප්‍රේතව ඉපිද සා පිපාසයෙන් පෙළීමේ දුක් ද, නරකවල ඉපිද ගින්නෙන් දැවීමේ දුක් ද, ලොහොදිය බොන්නට ලොහොගුලි ගිලින්නට වීමේ දුක් ද, තවත් මෙහි නො කී බොහෝ දුක් ද විඳින්නට සිදු වන්නේ ය. සංසාරචක්‍රයට අයත් අවිද්‍යාදීන් ගේ

Non-commercial distribution

අනුත්පාද නිරෝධ සංඛ්‍යාත ලෝකෝත්තර නිර්වාණය වනාහි ඒ සකල දුඃඛයන් පිළිබඳ වූ විමුක්ති සුඛය ය. ඒ සියලු ම දුක්වල නිවීම් සුවය ය. එහි අගය කෙසේ ප්‍රමාණ කළ හැකි ද? නො හැක්කේ ම ය.

ඇතැමෙක්, "අවිද්‍යා සංස්කාරාදීන්ගේ මේ අනුත්පාද නිරෝධය යම්කිසි පරමාර්ථ ධර්මයක් හෝ සුඛස්වභාවයක් නො වේ ය. ක්ෂණික නිරෝධය බඳු හිස් බවක් ය, හිස් බවෙහි කිසි උසස් බවක් වටිනා කමක් නැතය" යි සිතා අනුත්පාද නිරෝධය වරදවා තේරුම් ගෙන අමුතු නිවන් පවසති. බුදුරජාණන් වහන්සේ විසින් දේශිත සිය ගණන් සූත්‍රධර්මවලින් පෙනෙන්නේ අවිද්‍යාදීන් ගේ නිරෝධය ම නිර්වාණය බව ය. **නිදානවග්ග සංයුක්තයේ දුඃඛවර්ගයේ පළමුවන සූත්‍රය** දේශනා කිරීමේදී තථාගතයන් වහන්සේ භික්ෂූන්ගෙන් එකින් එක පටිච්චසමුප්පාදංගයන් ගේ නිරෝධය විචාරා, ඒ භික්ෂූන් විසින් සුදුසු පරිදි පිළිවදන් දුන් කල්හි -

"**සාධු! සාධු!! භික්ඛවෙ! එවමෙතං භික්ඛවෙ! නෙතං අසද්දහථා, සද්ධහථ මේතං භික්ඛවෙ! අධිමුච්චථ, නික්ඛංඛා එත්ථ හොථ, නිබ්බිචිකිච්ඡා එසෙවන්තො දුක්ඛස්ස**."

යනුවෙන් අවිද්‍යාදීන් ගේ නිරෝධයම නිර්වාණය වන බව සහතික කොට වදාළ සේක. "සාධු සාධු මහණෙනි, මහණෙනි! මතු ඉපදීමට හේතු වන සංස්කාරාදිය නැති කල්හි විඤ්ඤාණාදියත් නැතය යන ඒ කාරණය එසේම ය. එය අන් පරිද්දෙකින් නො වේය, මහණෙනි, ඒ කාරණය එසේම විශ්වාස කරව්. එසේ විනිශ්චයට බැස ගනිව්. ඒ කාරණය ගැන නිසැක වව්. දෙ සිතක් නැත්තෝ වව්. එයම, දුඃඛයාගේ කෙළවරය" යනු ඒ පාඨයේ තේරුම ය. ඉහත කී පාඨයෙහි "**ඒසේවන්තෝ දුක්ඛස්ස**" යන වැකිය අටුවාවෙහි වර්ණනා කර තිබෙන්නේ "**ඒසෙවන්තො දුක්ඛස්සාති අයමෙව වට්ටදුක්ඛස්ස අන්තො අයං පරිච්ජේදෝ, යදිදං නිබ්බානං**" කියාය.

අවිද්‍යා සංස්කාරාදීන් ගේ අනුත්පාද නිරෝධයම නිවන නම් එය කොතරම් වටිනා සුවයකැයි කියතත් ඒ නිරෝධයෙහි පඤ්චස්කන්ධයක් නැති කල්හි ඒ මිහිර විඳින කෙනකු නැති බැවින් ඒ නිවන කාහට වත් ප්‍රයෝජනයක් නැති දෙයක් නො වේ ද? යන

Non-commercial distribution

ප්‍රශ්නය මෙහිදී ඉදිරිපත් කළහැකි ය. නිවනෙහි තතු සොයන තැනැත්තා විසින් මේ කියන අනුත්පාද නිරෝධය අතීතයෙහි ඉපිද නිරුද්ධ වුණු නාමරූපයන්ගේ හෝ වර්තමාන නාමරූපයන්ගේ හෝ නිරෝධයක් නොව මතු ඇතිවිය හැකි නාමරූපයන්ගේ නිරෝධය බව සිත්හි තබා ගෙන ම, නිවන ගැන කල්පනා කළ යුතු ය. එසේ නො වුවහොත් කාරණය අවුල් වේ.

නිවන් සුවය විඳින පුද්ගලයන් ගැන කථා කරන්නවුන් ඒ කථාව කරන්නේ ද ආත්මයක් සත්ත්වයෙක් පුද්ගලයෙක් සත්‍යවශයෙන් ඇතැයි යන වැරදි හැඟීම උඩය. නිවනෙන් ප්‍රයෝජනයක් ඇති නැති බව පිළිබඳ වූ ප්‍රශ්නය විසඳාගත හැකි වන්නේ ආත්මයක් ඇත ද? නැත ද? යන මේ කරුණ විසඳ ගැනීමෙනි.

කෙනකු අන්ධකාරයේ සිට ගිනිපෙණෙල්ලක් වේගයෙන් කැරකැවුව හොත් දුරින් බලා ඉන්නා තැනැත්තාට එහි ගිනි වළල්ලක් පෙනේ. ඒ පෙනෙන ගිනිවළල්ල බලා ඉන්නහු ගේ සිතේ මිස, එය පෙනෙන තැන නම් නැත. ගිනි වළල්ල පෙනෙන තැන ඇත්තේ, ගිනි පෙණෙල්ල පමණෙකි. වේගයෙන් ගිනි පෙණෙල්ල කැරකෙන කල්හි එහි නැති ගිනි වළල්ලක් පෙනෙන්නාක් මෙන් වේගයෙන් ඉපද ඉපද බිඳි බිඳී යන නාම රූප පරම්පරාව සත්ත්වයකු පුද්ගලයකු සේ පෙනේ. ඒ නාමරූපයන් අතර හෝ සැපදුක් විඳින මමය කියා සැලකියුතු දෙයක් ඇතුවාක් මෙන් පෙනේ. එහෙත් නාම රූප පරම්පරාව මිස එහි සත්ත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් නැත.

එකම ගිනිපෙණෙල්ල ගිනිවළල්ලක් සේ පෙනෙන්නේ, ගමන් වේගය නිසා එය හොඳට නො පෙනෙන නිසා ය. නාමරූප ධර්ම පරම්පරාව පුද්ගලයකු සේ පෙනෙන්නේත්, එහි පුද්ගලයකු ඇති සැටියට හෝ පෙනෙන්නේත් ඉපදීමේ බිඳීමේ වේගවත් කම නිසා නාම රූපයන් හරියට නො පෙනෙන - නො දැනෙන නිසා ය. පුද්ගලයකු ඇතය යන හැඟීම් මාත්‍රය මිස, සුවදුක් විඳින පුද්ගලයා නම් නාමරූප ධර්ම පරම්පරාව පවත්නා කාලයෙහිත් නැත. එබැවින් නිවනෙහි පුද්ගලයකු නැති කමින් අනුත්පාද නිරෝධ සංඛ්‍යාත සුඛස්වභාවය නිෂ්ඵලය යි නො කිය යුතු ය.

Non-commercial distribution

නාමරූප ධර්ම පරම්පරාව පවත්නා කල්හි ඒ පරම්පරාවෙහි වරින් වර ඇතිවන සුවදුක් දෙක, සත්‍ය වශයෙන් නැතත් ඇතය කියා සලකන ඒ පුද්ගලයා සතු වේ නම්, ඒ නාමරූප පරම්පරාවෙහි ඉදිරියට ඇති විය හැකි නාමරූපයන් ගේ නිරෝධය වූ විමුක්ති සුඛයත් ඒ පුද්ගලයාට ම බව කිය යුතුය. මේ කියන නාමරූප නිරෝධය ඉපද ඉපද බිඳි බිඳී පවත්නා නාමරූප පරම්පරාවන්ට අයත් වූ, එතෙක් නූපන් නාමරූපයන් පිළිබඳ වූවකි. ඉපද ඉපද බිඳි බිඳී යන නාමරූප පරම්පරාවෙහි පරිකල්පිත වශයෙන් ඇති සැටියට සලකන පුද්ගලයා, ඒ පරම්පරාවට අයත් වන එතෙක් නූපන් නාමරූප විෂයෙහි ද ඇති බව කිය යුතුය.

පරිකල්පිත පුද්ගලයා පරම්පරාවට අයත් ව එතෙක් නූපන්, මතු ඉපදිය හැකි නාමරූපයන් පිළිබඳවත් ගත යුතු ය. එසේ ගන්නවා නම්, ඒ පුද්ගලයා අනුත්පාද නිරෝධ සංඛ්‍යාත නිර්වාණයෙහිත් ඇතය යි කිය යුතු ය. නිවනෙහි ඒ විමුක්ති සුඛය විඳින පුද්ගලයකු නැතය කියන්නේ සත්‍ය වශයෙන් පුද්ගලයා නැති බැවිනි. ඒ පුද්ගලයා නිවනෙන් මොබ ලෝකයෙහිත් නැත. එබැවින් නිවන් කථාවට නැත්තා වූ මේ පුද්ගලයා සම්බන්ධ කර ගෙන කාරණය අවුල් නො කර ගත යුතුය.

"ඔය කියන විමුක්තිසුඛය කොපමණ උසස් කොපමණ වටිනා දෙයකැ යි කියතත් ඒ සුවය අපට නම් ඕනෑ නැත. අපට ඕනෑ කරන්නේ ප්‍රිය වස්තූන් ඇතිව, ප්‍රිය පුද්ගලයන් ඇතිව, ජරාවක් - ව්‍යාධියක් - මරණයක් - අප්‍රිය සම්ප්‍රයෝගයක් - ප්‍රිය විප්‍රයෝගයක් නැතිව, සුඛයෙන් සෞමනස්‍යයෙන් ප්‍රීතියෙන් සැම කල්හි ම විසිය හැකි තත්ත්වයකැ"යි ඇතැමුන්ට කිය හැකි ය. මේ ලෝකයේ හෝ අන් ලොවක හෝ ස්ථිර තත්ත්වයක් ඇති එබඳු තැනක් නම් නැත. එබැවින් එබඳු තත්වයක් නො ලැබිය හැකිය. **ඇත්තේ සංසාරචක්‍රයාගේ පැවැත්මය - නැවැත්මය යන දෙක පමණෙකි**. පැවැත්ම කැමති නම් පැවැත්ම ගත හැකි ය. නැවැත්ම කැමති නම් නැවැත්ම වූ නිවන් සුවය ගත හැකි ය.

ප්‍රිය වස්තූන් ඇත්තේ ද ප්‍රිය පුද්ගලයන් ඇත්තේ ද, සුඛ - සෞමනස්‍ය - ප්‍රීතීන් ඇත්තේ ද, සංසාර චක්‍රයෙහි ය. ජරාව ව්‍යාධිය

Non-commercial distribution

මරණය අප්‍රිය සම්ප්‍රයෝගය ප්‍රිය විප්‍රයෝගය ශෝකය පරිදේවය දුඃඛය දෞර්මනස්‍යය උපායාසය ඇත්තේ ද, පණු - උකුණු - මකුණු - බලු - බළල් - ඌරු - කුකුළු ආදි තිරිසන් සතුන් වීම ඇත්තේ ද, ප්‍රේත වීම ඇත්තේ ද, ගින්නේ දැවි දැවී ලොහොගුලි ගිලින, ලෝදිය බොන තිරිසතුන් වීම ඇත්තේ ද සංසාර චක්‍රයෙහි ය.

සංසාර චක්‍රයේ කැරකෙන සත්ත්වයා ප්‍රීති - සුඛ - සෞමනස්‍යයන් ඇති, ප්‍රිය වස්තු ප්‍රිය පුද්ගලයන් ඇති මනුෂ්‍ය භවයක් හෝ දිව්‍ය භවයක් වරක් ලැබූ පසු, දහස් වරක් - දස දහස් වරක් දුඃඛ දෞර්මනස්‍යයෙන් නිතර පෙළෙන අපාය භවයන් ලබන්නේ ය. සංසාර චක්‍රයේ ඇති එක සොම්නසකට ලක්‍ෂය කෝටිය බැගින් දොම්නස් ඇත්තේ ය. නිවනෙහි වනාහි ප්‍රිය වස්තු - ප්‍රිය පුද්ගලයෝ ද නැත. ප්‍රීති - සුඛ - සෞමනස්‍යයෝ ද නැත. ජරා - ව්‍යාධි - මරණ - ශෝක පරිදේව දුඃඛ - දෞර්මනස්‍යයෝ ද නැත. එහි පැමිණි පසු නැවත අපායට යාමකුත් නැත. එහි ඇත්තේ ශාන්ත ස්වභාවයක් පමණෙකි. කල්පනා කොට වඩා හොඳ දෙය තෝරා ගන්න.

ඇතැමකුට විමුක්තිය අප්‍රිය වී සංසාරය ප්‍රිය වන්නේත්, ඇතැමකුට සංසාරය අප්‍රිය වී විමුක්තිය ප්‍රිය වන්නේත් ඒ ඒ අයගේ අදහස් අනුවය. අවිද්‍යාව සත්ත්වයා ගේ සිත කිලිටි කරන - බොර කරන - අඳුරු කරන චෛතසික ධර්මයකි. එය එක්තරා මානසික රෝගයකි. ඒ රෝගයෙන් දුර්වලවූ අඳුරුවූ සිතට පරම්පරාවශයෙන් ඉපද ඉපද බිඳි බිඳී යන නාම රූපයන් ගේ සැබෑ තත්ත්වය නො පෙනේ. නොයෙක් විට නාම රූපයන් සත්ත්වයන් සැටියට මිස, නාමරූප සැටියට ද නො පෙනේ. එයින් සත්කාය දෘෂ්ටිය ඇති වේ. නැවත නැවත සත්කාය දෘෂ්ටිය ඇතිවන කල්හි එය වැඩී තහවුරු වී දෘෂ්ට්‍යාධ්‍යාශය ඇති වේ. එය ද එක්තරා මානසික රෝගයකි.

සත්කාය දෘෂ්ටිය සමග ම ආත්ම වශයෙන් සලකන පඤ්චස්කන්ධය ලොව ඇති ඉතාම හොඳ දෙය ඉතාම උසස් දෙය සැටියට ගන්නා වූ, තෘෂ්ණාව වූ තණ්හාව හා පඤ්චස්කන්ධයට අයත් ව ඇතිවන සුඛ සෝමනස්සයන් හා බාහිර රූපාදියත් හොඳ හැටියට ගන්නා වූ තණ්හාවත් ඇති වේ. ඒවා වැඩී තහවුරු වී

Non-commercial distribution

තෘෂ්ණාධ්‍යාශය ඇති වේ. එය ද එක්තරා මානසික රෝගයෙකි. ධර්මය සේවනය නො කරන ධර්මයෙන් ඈත්ව වෙසෙන ජනයා කෙරෙහි අවිද්‍යා - තෘෂ්ණා - දෘෂ්ටි සංඛ්‍යාත රෝග තුන තදින් පවතින්නේ ය.

බලවත් කැසිල්ලෙන් යුක්ත වන කුෂ්ඨ රෝගයක් ඇතියහුට ගිනි රස්නය ඉතා ප්‍රිය වේ. සිසිල අප්‍රිය වේ. කුෂ්ඨරෝගියාට ගිනිරස්නය ප්‍රියවන්නේ එය හොඳ නිසා නොව රෝගය නිසාය. සිසිල අප්‍රිය වන්නේත් එය නරක නිසා නොව කුෂ්ඨරෝගය නිසාය. ගිනිරස්නය සේවනය කිරීමෙන් කුෂ්ඨරෝගියාට මතුවට වන්නේ නපුරක්මය. කුෂ්ඨරෝගියාට අනර්ථකර වූ ගිනි රස්නය හොඳ වන්නාක් මෙන්, සිසිල අප්‍රිය වන්නාක් මෙන් එකොළොස් වර්ගයක ගිනි දැල්වලින් වෙළී පවත්නා වූ නොයෙක්විට නරකාග්නියට ද හසුවන්නා වූ පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුඃඛස්කන්ධය කෙලෙස් රෝග ඇතියවුන්ට ප්‍රිය වේ. පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුක්ඛස්කන්ධයා ගේ නිරෝධය වූ නිවන අප්‍රිය වේ. එයට බිය වේ. එසේ වන්නේ නිරෝධය නරක නිසා නොව කෙලෙස් රෝගය නිසාය.

ධර්ම නමැති බෙහෙත සේවනය කොට කෙලෙස් රෝගය සුවකර ගෙන සිත පිරිසිදු කරගෙන වෙසෙන්නාවූ සත්පුරුෂයන්ට වනාහි පඤ්චස්කන්ධය පමණ නපුරක් වශයෙන්, බියවිය යුත්තක් වශයෙන් පෙනෙන අනිකක් නැත. නිවන තරමට උසස්ව පෙනෙන අන් සැපයකුත් නැත.

**නිවනේ තතු වැඩිදුරටත් තේරුම් ගත හැකිවීම පිණිස** මෙතැන් පටන් තථාගතයන් වහන්සේ විසින් නන් අයුරින් නිර්වාණ තත්වය දක්වා දේශිත සූත්‍ර කීපයක් දක්වනු ලැබේ.

## නිවන් තතු දැක්වෙන ගාථා පෙළක්

(සළායතන වග්ග සංයුත්තයේ දේවදහ වර්ගයේ රූපාරාම සූත්‍රයෙන්)

(1) රූපා සද්ද රසා ගන්ධා ඵස්සා ධම්මා ච කේවලා,
ඉට්ඨා කන්තා මනාපා ච යාවත්ථීති පවුච්චති.

(2) සදේවකස්ස ලෝකස්ස ඒතේ වෝ සුඛසම්මතා,
යත්ථ චේතේ නිරුජ්ඣන්ති තං තේසං දුක්ඛසම්මතං.

Non-commercial distribution

(3) සුඛන්ති දිට්ඨමරියේහි සක්කායස්ස නිරෝධනං,
පච්චනීකමිදං හෝති සබ්බලෝකේන පස්සතං.

(4) යං පරේ සුඛතෝ ආහු තදරියා ආහු දුක්ඛතෝ,
යං පරේ දුක්ඛතෝ ආහු තදරියා සුඛතෝ විදූ.

(5) පස්ස ධම්මං දුරාජානං සම්මුළ්හෙත්ථ අවිද්දසු,
නිවුතානං තමෝ හෝති අන්ධකාරෝ අපස්සතං.

(6) සතඤ්ච විවටං හෝති ආලෝකෝ පස්සතා මිව,
සන්තිකේ න විජානන්ති මගා ධම්මස්ස අකෝවිද.

(7) භවරාගපරේතේහි භවරාගානුසාරිහී,
මාරධෙය්‍යානුපන්නේහි නායං ධම්මෝ සුසම්බුධෝ.

(8) කෝනු අඤ්ඤත්‍ර මරියේහි පදං සම්බුද්ධමරහති,
යං පදං සම්මදඤ්ඤාය පරිනිබ්බන්ති අනාසවා.

**ගාථාවල තේරුම :-**

1-2. ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ රූපයෝ ද ශබ්දයෝ ද රසයෝ ද ගන්ධයෝ ද ස්ප්‍රෂ්ටව්‍යයෝ ද යම් පමණ ඇතය යි කියනු ලැබේ ද, ඒ සකල රූප ශබ්දාදීහු දෙවියන් සහිත ලෝකයා විසින් සැපය යි සම්මත කරන ලද්දාහුය. යම් තැනෙක්හි ඒ රූප ශබ්දදීහු නිරුද්ධ වෙත් ද, එය ඔවුන් දුක ය යි සම්මත කරන ලද්දේ ය.

3. ආර්‍ය්‍යයන් විසින් පඤ්චස්කන්ධයාගේ නිරෝධය සැපය වශයෙන් දක්නා ලදී. ඒ දර්ශනයට සකල ලෝකය ම විරුද්ධය. (මක්නිසා ද? ආර්‍ය්‍යයන් විසින් අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් දක්නා පඤ්චස්කන්ධය ලෝකයා විසින් නිත්‍ය සුඛ සුභ වශයෙන් දක්නා හෙයිනි.)

4. යම් ඒ පඤ්චස්කන්ධයක් අන්‍යයෝ සැපය යි කියත් ද ඒ පඤ්චස්කන්ධය ආර්‍ය්‍යයෝ දුකකැයි කියති. යම් පඤ්චස්කන්ධ නිරෝධයක් අන්‍යයෝ දුකකැයි කියත් ද ආර්‍ය්‍යයෝ ඒ නිරෝධය විමුක්ති සුඛය යි දනිත්.

Non-commercial distribution

5. දැකීමට දුෂ්කරවූ නිර්වාණ ධර්මය බලව. බාලයෝ ඒ නිර්වාණ ධර්මයෙහි මුළාවූවෝ වෙති. කෙලෙසුන් ගෙන් වැසුනවුන්ට නිවන හෝ ආයර්‍යයන්ගේ නිර්වාණ දර්ශනය හෝ නො දන්නවුන්ට නිවනත් ආයර්‍යයන් ගේ නිර්වාණ දර්ශනයත් අන්ධකාරයෙකි.

6. ප්‍රඥා දර්ශනයෙන් බලන්නා වූ සත්පුරුෂයනට ආලෝකයක් මෙන් ඒ නිර්වාණය විවෘතය. ධර්මය නෝ දන්නා බැවින් මෘගයන් බඳු ජනයෝ ළඟ ම ඇත්තා වූ ද නිවන නො දනිති.

7. භව රාගයෙන් ස්පර්ශ කරන ලද්ද වූ භව රාගය අනුව යන්නා වූ ත්‍රෛභූමක වෘත්ත සංඛ්‍යාත මාරයා ගේ වාසස්ථානයට පැමිණ ඉන්නා වූ සත්ත්වයන් විසින් මේ නිර්වාණ ධර්ම ලෙහෙසියෙන් අවබෝධ කළ හැක්කේ නො වේ.

8. යම් නිර්වාණ ධර්මයක් මනා කොට නුවණින් දැන රහත්හු පිරිනිවෙත් ද ඒ නිර්වාණය ආයර්‍යයන් හැර අන් කවරෙක් අවබෝධ කිරීමට සමත් වෙත් ද? (නොවේම ය.)

Non-commercial distribution

# නිවන දැක්වෙන ගාථා දෙකක්

(දීඝනිකායේ කේවට්ට සූත්‍රයෙන්)

"විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපො ච පඨවී තේජෝ වායෝ න ගාධති

එත්ථ දීඝඤ්ච රස්සඤ්ච අනුං ථූලං සුභාසුභං,
එත්ථ නාමඤ්ච රූපඤ්ච අසේසං උපරුජ්ඣති,
විඤ්ඤාණස්ස නිරෝධෙන එත්ථෙතං උපරුජ්ඣති."

**තේරුම**:-

ලෝකෝත්තර මාර්ගඥාන සංඛ්‍යාත විශිෂ්ට ඥානයෙන් දතයුතු වූ, ඇසින් දැකිය හැකි වර්‍ණයක් හෝ සමාන කොටදැක්විය හැකි දෙයක් හෝ නැත්තා වූ පටන් ගැනීම් පැවතීම් නැතිවීම් වශයෙන් වෙන් කොට දැක්විය හැකි කොන් නැත්තා වූ, හැම පැත්තෙන් ම ඇතුළුවීමට තොටුපල ඇත්තා වූ හෝ සැම පැත්තෙන් ම බැලීම හෝ ඇත්තා වූ නිර්වාණ ධාතුවක් ඇත්තේ ය. ඒ නිර්වාණ ධාතුවෙහි ආපෝධාතුව ද, පඨවී ධාතුව ද, තේජෝ ධාතුව ද, වායෝ ධාතුව ද පිහිටක් නො ලබයි. (ඒ නිර්වාණ ධාතුව නිසා ඒ සියල්ල නිරුද්ධ වේ.)

ඒ නිර්වාණ ධාතුවෙහි දික් බව ද, කෙටි බව ද, කුඩා බව ද, මහත් බව ද, ලස්සන බව ද, කැත බව ද යන සියලු රූ සටහන් නිරුද්ධ වේ. ඒ නිර්වාණ ධාතුවෙහි නාමය රූපය යන දෙක ම මතු කිසි කලෙක ඇති නො වන පරිදි ඉතිරියක් නැතුව නිරුද්ධ වේ. ඒ නිර්වාණ ධාතුවෙහි පරිනිර්වාණච්‍යුති චිත්තය ය, මතු උත්පත්තියට හේතුවන කර්මවිඥානය ය යන විඥාන දෙක්හි නිරෝධයෙන් කියන ලද ඒ උපාදින්නක නාමරූප සියල්ල ම මතු කවර කලෙකවත් මතු වී නො එන පරිදි නිරුද්ධ වේ.

ඉහත දැක් වූ ගාථාවන්හි එන "**විඤ්ඤාණං අනිදස්සනං අනන්තං, සබ්බතෝපහං**" යන වචන විශේෂයෙන් සැලකිය යුතු වචන සතරෙකි. **විඤ්ඤාණං** යන වචනය පිටකත්‍රයේ බොහෝ තැන්වල යෙදී තිබෙන්නේ සිතය යන අර්ථය දැක්වීමටය. මෙහි ඒ වචනය

Non-commercial distribution

යොද තිබෙන්නේ නිවනය යන අර්ථය සඳහා ය. ඤාණ යනු සාමාන්‍යයෙන් ප්‍රඥවට නමෙකි. වි යන්න නොයෙක් අර්ථයන්හි යෙදෙන උපසර්ගයෙකි. මෙහි වි යන උපසර්ගය මුලට යොද ඇති ඤාණ යන්නෙන් කියැවෙන්නේ, නිවන සාමාන්‍ය ඥනයෙන් නොව ලෝකෝත්තර මාර්ගඵල චිත්තයන්හි යෙදෙන විශිෂ්ටඥනයෙන් දත යුත්තක් වන බවය. නිවන පෘථග්ජනයන්ට ඇතිවන සාමාන්‍ය ඥනයට විෂය දෙයක් නො වන බව එයින් කියැ වේ.

**දැනුම වනාහි ප්‍රත්‍යක්ෂඥනය ය. අනුමාන ඥනය ය කියා දෙවැදෑරුම් වේ.** ප්‍රත්‍යක්ෂ ඥනය ය කියනුයේ ඇසින් දැකිය යුත්තක් ඇසින්ම දැක දැන ගැනීම බඳු දැනීම්වලට ය. අනුමාන ඥනය යි කියනුයේ යමක් ගැන අනුන් කියනු ඇසීමෙන් හෝ පොතපත කියවීමෙන් හෝ යම්කිසි ලකුණක් දැකීමෙන් හෝ ඇතිවන දැනුම්වලට ය. ඒ ඒ දෙය ප්‍රත්‍යක්ෂකර ගැනීමට වෙන වෙනම ඉන්ද්‍රිය ඇත්තේ ය, රූපය ප්‍රත්‍යක්ෂකර ගන්නා ඉන්ද්‍රිය ඇස ය. ඒ ඉන්ද්‍රියයෙන් රූපය මුත් අනිකක් දත නො හැකි ය. ශබ්දය ප්‍රත්‍යක්ෂ කරන ඉන්ද්‍රිය කන ය. ගන්ධය ප්‍රත්‍යක්ෂ කරන ඉන්ද්‍රිය නාසය ය. රසය ප්‍රත්‍යක්‍ෂ කරන ඉන්ද්‍රිය දිවය. ස්පර්ශය ප්‍රත්‍යක්‍ෂ කරන ඉන්ද්‍රිය කය ය.

ලෝකෝත්තර නිර්වාණ ධාතුව ප්‍රත්‍යක්‍ෂ කරන ඉන්ද්‍රියය ලෝකෝත්තර ප්‍රඥෙන්ද්‍රිය ය. එය ඉන්ද්‍රිය විභාගයේ දී **අනඤ්ඤතඤ්ඤස්සාමිතින්ද්‍රිය ය - අඤ්ඤින්ද්‍රිය ය - අඤ්ඤාතාවින්ද්‍රිය** ය කියා ඉන්ද්‍රිය තුනක් වශයෙන් දක්වා තිබේ. ඒ සියල්ල ම ආර්‍ය්‍යපුද්ගලයන් තුළ පමණක් ඇති වන ඉන්ද්‍රියයෝ ය. ගාථාවෙහි **විඤ්ඤාණං** යන පදයෙන් දැක්වෙන්නේ නිර්වාණ ධාතුව ලෝකෝත්තර ඥනේන්ද්‍රිය තුනෙන් දත යුත්තක් බව ය.

පෘථග්ජනයන්ට ශ්‍රුතමය ඥනයෙන් නිවන දැනෙන්නේ එංගලන්තයට නො ගිය කෙනකුට අනුන් කියනු ඇසීමෙන් එංගලන්තය දැනෙන්නාක් මෙනි. එංගලන්තය ගැන අසා ඇතියකුට එය පිළිබඳව ඇති දැනීම සම්පූර්ණයෙන් ම වැරදි දැනීමක් නො වතුදු හරියටම හරි දැනුමක් ද නො වේ. සම්පූර්ණ දැනීමක් ද නො වේ. අසම්පූර්ණ වූ ඒ දැනුම් ද නිෂ්ඵල එකක් නො වේ. එමෙන්

Non-commercial distribution

නිර්වාණය පිළිබඳ ශ්‍රැතමය ඥානය සම්පූර්ණ දැනීමක් නො වෙතත්, එය ඒ පුද්ගලයාට මතු නිවන ප්‍රත්‍යක්ෂ කර ගැනීමට උපකාර වේ.

**පෘථග්ජනයන් විසින් නිවන පඤ්චස්කන්ධය අනුව සංසාරය අනුව සිතා ගත යුතු ය**. පඤ්චස්කන්ධයේ ඇති දුක් නුවණැත්තා වූ පෘථග්ජනයන්ට වැඩි අපහසුවක් නැතිව තේරුම් ගත හැකි ය. සංසාර චක්‍රයේ නපුරත් තේරුම් ගත හැකි ය. පඤ්චස්කන්ධය පිළිබඳ වූ හැම දුකකම සන්සිඳීම නිවන ය. ඒ සන්සිඳෙන දුඃඛයන් ගේ වශයෙන් නිවන තේරුම් ගත යුතු ය.

සංසාර චක්‍රයේ පෙරළීමේ නපුර යම් පමණ වේ ද ඒ සියල්ලේ ම සන්සිඳීම නිවන ය. සංසාර චක්‍රයේ ඇති නපුරුකම් අනුව නිවනේ හොඳ බව සලකා ගත යුතු ය. නිවන පිළිබඳ හරි දැනීමක් නැති බව නිවන් ලැබීමට බාධාවක් නො වේ. බාධාව වන්නේ ප්‍රතිපත්තියේ වරද ය. කොළඹ ගැන හරි දැනීමක් ඇතත් නැතත් කොළඹට යන හරි මඟ ගමන් කළහොත් කොළඹට පැමිණෙන්නේ ය. එමෙන් නිවන ගැන හරි දැනීමක් කලින් ඇතත් නැතත් නිවනට පැමිණෙන ප්‍රතිපත්තිය හරියට පිරුව හොත් එයට නො වැරදීම පැමිණෙන්නේ ය.

**අනිදස්සනං** යන පදයෙන් නිවනෙහි ඇසින් දැකිය හැකි යම් කිසි රූ සටහනක් නැති බවත්, නිවන අසවල් වස්තුව වැනිය කියා උපමා කොට දැක්වීමට සුදුසු කිසිම දෙයක් ලෝකයෙහි නැති බවත් දක්වන ලදී. මේ කරුණ ගැන නාගසේන මහ රහතන් වහන්සේ දඃ-

**"අප්පටිභාගං මහාරාජ නිබ්බානං න සක්කා නිබ්බානස්ස රූපං වා සණ්ඨානං වා වයං වා පමාණං වා ඔපම්මේන වා කාරණේන වා හේතුනා වා නයේන වා උපදස්සයිතුං** -"

යනු වදාළ සේක. "මහරජ! නිර්වාණය සමාන දෙයක් නැතියකි. නිවනේ රූපය හෝ සටහන හෝ වයස හෝ ප්‍රමාණය හෝ උපමාවකින් හෝ කාරණයකින් හෝ හේතුවකින් හෝ නය ක්‍රමයකින් හෝ නො දැක්විය හැකි ය" යනු එහි තේරුම ය.

Non-commercial distribution

**අනන්තං** යන පදයෙන් අසංස්කෘත ධාතු සඞ්ඛ්‍යාත නිර්වාණය වෙන් කර දත හැකි වීමට උපකාර වන පර්‍යන්ත පරිච්ඡේද හෙවත් මායිම් ලකුණු නැතියක් බව දැක් වේ. ලෝකයට අයත් ඒ ඒ දේවල් එකිනෙක වෙන් කර ගත හැකිවීමට මායිම් ඇත්තේ ය. ඇති වීම ය, නැති වීම ය, පැවැත්ම ය, පවත්නා ප්‍රදේශය ය, වට පිට ඇති වස්තූහු ය යන මේවා ඒ ඒ දේවල් වෙන් කර දැන ගැනීමට උපකාර වන ඒවා ය.

අසවල් දවසේ ඇති වූ දේය අසවල් කාලයේ අසවල් වේලාවේ ඇති වූ දේය කියා ඇතිවීමෙන් ඒ ඒ දේ වෙන් කර ගත හැකි ය. තිබී අසවල් කාලයේ නැති වූ දෙය ය කියා නැතිවීමෙන් ද ඒ ඒ දේවල් සලකාගත හැකි ය. පවත්නා කාලයෙන් ද ඒ ඒ දේ සලකා ගත හැකි ය. අසවල් තැන සිට අසවල් තැන දක්වා ඇති දෙය ය කියා පර්‍යන්ත පරිච්ඡේදයෙන් ද ඒ ඒ දේවල් දත හැකි ය. අසවල් දෙයට උතුරෙන් ඇති දෙය ය, දකුණෙන් ඇති දෙය ය, උඩින් ඇති දෙය ය, අසවල් දේවල් අතර ඇති දෙය ය කියා වටා පිටාවේ ලකුණුවලින් ද ඒ ඒ දෙය දත හැකි ය. නිවන පිළිබඳව ඒ කිසිම ලකුණක් ඇත්තේ නැත. ඒ නිවන පටන් ගැනීමක් නැති අවසානයක් නැති පිහිටි තැනක් නැති පරම සූක්ෂ්ම ස්වභාවයෙකි. පටන් ගැනීමක් හෙවත් ඇති වීමක් නැතිව නිවනක් තිබිය හැක්කේ කෙසේ ද? යන පැනයට පිළිතුරු මතු අන් තැනක දක්වන්නෙමු.

**"සබ්බතෝ පභං"** යන්නෙන් අර්ථ තුනක් දැක්වේ. **"පභන්ති පන එතං කිර තිත්ථස්ස නාමං"** යනුවෙන් කේවට්ට සූත්‍ර අටුවාවෙහි දැක්වෙන පරිදි "පභ" යන මෙය තොටට නමෙකි. කමටහන් අටතිසෙන් කවර කමටහනකින් වුව ද මේ නිවනට ඇතුළු විය හැකි බැවින් ඒ නිවන සැම තැනින් ම තොට ඇතියක් ය යන අර්ථයෙන් **සබ්බතො පභ** නම් වේ. නිවනට පැමිණීමට උපකාර නො වන කමටහනක් නැත. කවර කර්මස්ථානයකින් වුව ද නිවනට පැමිණිය හැකි ය. එහෙත් විදර්ශනාවෙන් තොරව ද නිවනට නො පැමිණිය හැකි ය. කවර කමටහනක් වුව ද වඩන තැනැත්තා විසින් නිවනට පැමිණිය හැකිවීමට ඒ සමථ කර්මස්ථානයෙන් සිත එකඟ කරගෙන විදර්ශනා වැඩිය යුතු ය.

Non-commercial distribution

**"පභා"** යනු රශ්මියට ද. නමෙකි. **"සබ්බතො පභන්ති"** සබ්බතො පභාසම්පන්නං, නිබ්බානතොහි අඤ්ඤධම්මො සප්පභතරෝ වා ජෝතිමන්තතරෝ වා පරිසුද්ධතරෝ වා, පණ්ඩරතරෝ වා නත්ථි" යනුවෙන් අටුවාවෙහි දැක්වෙන පරිදි "සබ්බතෝ පභං" යනුවෙන් නිර්වාණය සැම පැත්තෙන් ම දීප්තිමත් සැම පැත්තෙන් ම බැබලීම ඇති පරම පාරිශුද්ධ ධර්මයක් බව දැක්වෙන බව කිය යුතු ය. තථාගතයන් වහන්සේ නිර්වාණය පරම පරිශුද්ධ කාන්තිමත් ධර්මයකැයි වදරන්නේ චන්ද්‍ර සූර්‍ය්‍යාදීන් ගෙන් මෙන් නිවනෙන් රැස් විහිදීමක් ඇති නිසා නොව, කිලිටි කරන කිසිවක් ඒ නිර්වාණ ධාතුව හා මිශ්‍ර නො වන බැවින් හා එහි නො තැවරෙන බැවින් ය.

වස්ත්‍රාදියෙහි මෙන් අහසෙහි කිසිම දෙයක් අල්ලාගන්නා ස්වභාවයක් නැත. එබැවින් දැලි ගා අහස කිලිටි නො කළ හැකි ය. ජල ආදිය හා නොයෙක් දේ මිශ්‍රවන්නාක් මෙන් කිසි ම දෙයක් අහස හා මිශ්‍ර නො වන්නේ ය. එබැවින් යම්කිසිවක් මිශ්‍ර කොට ද අහස කිලිටි නො කළ හැකි ය. හැම කල්හි ම ආකාශ ධාතුව පිරිසිදුව පවත්නේ ය. එමෙන් ම නිර්වාණ ධාතුවත් අන් කිසි නාම ධර්මයක් සමග හෝ රූප ධර්මයක් සමග මිශ්‍රවීමක් නැතිව ගෑවීමක් නැතිව ලෝකයෙන් සර්වප්‍රකාරයෙන් වෙන්ව ලෝකෝත්තර ධර්මයක් වශයෙන් පවතී. එබැවින් එය සැමකල්හි ම ශුද්ධය. දීප්තියක් ඇත්තේ බැබලීමක් ඇත්තේ ශුද්ධ වස්තුවල ය. චන්ද්‍ර සූර්‍ය්‍යාදීන් ගේ මෙන් දීප්තිමත් භාවයක් නිවනෙහි නැත ද එය පරිශුද්ධ ධර්මයක් බැවින් දීප්තිමත් ධර්මයක් ලෙස බුද්ධාදීහු වර්ණනා කෙරෙති.

**"සබ්බතෝ පභං"** යනුවෙන් දැක්වෙන තවත් අර්ථයක් නම් නිවන සැමතැන ම ඇතියක් ය යනු යි. **"සබ්බතෝ වා පභූ නමේවා කත්ථචි න නත්ථීති සබ්බතෝ පභා"** යනු අටුවා යි. නිවන සැම තැනම ඇතිය කැයි කියනුයේ කොතැනක වුව ද සිට එය ප්‍රත්‍යක්ෂ කළ හැකි බැවිනි. නිවන ලෝකයට අයත් නො වන බැවින් ද සංස්කාරයන් හා කිසිම සම්බන්ධයක් නැතිව පවත්නා බැවින් ද නිවන පිහිටි තැනක් නැතය යි ද කිය යුතු ය. ඇති තැනක් ද නැති, නැති තැනක් ද නැති මේ නිවන පරම සූක්ෂම ධාතුවෙකි.

Non-commercial distribution

නිවනෙහි කිසිවක් නැතය යි කීමට බිය වන ඇතැම්හු එහි සූක්ෂ්ම විඥානයක් ඇත ය යි ද, තවත් සමහරු එහි සූක්ෂ්ම රූපයක් ඇත ය යි ද කියති. සූක්ෂ්ම වූ හෝ ඖදරික වූ හෝ කිසිම නාම ධර්මයක් හෝ රූප ධර්මයක් හෝ නිවනෙහි නැති බව "එත්ථ නාමඤ්ච රූපඤ්ච අසේසං උපරුජ්ඣති" යන බුදු වදනින් දැක් වේ. ඒ නිවනෙහි නාමයක් රූපයක් ඉතිරිව නැති පරිදි නිරුද්ධ වේය යනු එහි තේරුම යි. සූක්ෂ්ම විඥානයක් හෝ රූපයක් නිවනෙහි ඇතිනම් එහි ඉතිරියක් නැතිවන සැටියට නාමරූපයන් නිරුද්ධ වන බව නො වදාරන්නාහ.

## නිර්වාණ කීර්තන උදානය (1)

**"අත්ථි භික්ඛවේ! තදායතනං. යත්ථ නේව පඨවි න ආපෝ න තේජෝ න වායෝ න ආකාසානඤ්චායතනං න විඤ්ඤාණඤ්චායතනං න ආකිඤ්චඤ්ඤායතනං න නේවසඤ්ඤානාසඤ්ඤායතනං නායං ලෝකෝ න පරලෝකෝ න උභෝ චන්දිම සූරියා. තත්‍රාපාහං භික්ඛවේ! නේව ආගතිං වදාමි. න ගතිං න ඨිතිං න චුතිං න උපපත්තිං අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණ මේවේතං ඒසේවන්තෝ දුක්ඛස්සාති."**

තේරුම :-

"මහණෙනි! ඒ (නිර්වාණ සංඛ්‍යාත) ආයතනයක් ඇත්තේ ය. එහි කර්කශ ලක්‍ෂණ පෘථිවි ධාතුව ද නැත. ආබන්ධන ලක්‍ෂණ ආපෝධාතුව ද නැත. පරිපාචන ලක්‍ෂණ තේජෝධාතුව ද නැත. විස්තම්භන ලක්‍ෂණ වායෝ ධාතුව ද නැත. ආකාසානඤ්චායතන චිත්තය ද නැත. විඤ්ඤාණඤ්චායතන චිත්තය ද නැත. ආකිඤ්චඤ්ඤායතන චිත්තය ද නැත. නේවසඤ්ඤානාසඤ්ඤායතන චිත්තය ද නැත. ඒ නිවන මේ ලෝකය ද නොවේ. පරලොව ද නො වේ, එහි චන්ද්‍ර සූර්‍ය්‍යයෝ දෙදෙන ද නැත, මහණෙනි! මම ඒ නිවන සත්ත්වයන් එන තැනකැයි නො කියමි. සත්ත්වයන් යන තැනකැයි ද නො කියමි. සත්ත්වයන් නැවතී ඉන්නා තැනකැයි ද නො කියමි. සත්ත්වයන් මැරෙන තැනකැයි ද නො කියමි. උපදින තැනකැයි ද නො කියමි. එය සංස්කාරයන් ගේ නැවත නැවත ඉපදීම් වශයෙන්

Non-commercial distribution

පැවැත්මක් නැති ස්වභාවයක් ම ය. නාම ධර්මයක් වුව ද චිත්තචෛතසිකයන් සේ රූපාදි අරමුණු ගැනීමක් නො කරන ධර්මයක් ම ය. දුක්ඛයා ගේ අන්තය ඒ නිර්වාණ ධර්මය ය.”

මේ සූත්‍රයෙන් පඨවි ආපෝ තේජෝ වායෝ යන මහා භූතධාතු සතර නිවනෙහි නැති බව ප්‍රකාශ කිරීමෙන් දක්වන්නේ එහි කාම රූප භව දෙකට අයත් කිසි සංස්කාරයක් නැති බව ය. කාමාවචර රූපාවචර සත්ත්වයන් ගේ ප්‍රතිෂ්ඨාව මහාභූත සතර ය. මාහාභූත ධාතූන් නැති කල්හි ඒවායේ පිහිටා ඇතිවන චක්ෂුරාදි ඉන්ද්‍රිය රූපයෝ ද ඇති නො වෙති. හෘදය රූපය ද ඇති නො වේ. ඉන්ද්‍රිය රූප හා හෘදය රූපය නැති කල්හි චක්ෂුර්විඥනාදි විඥන සය ද ඇති නො වේ. මහාභූත සතර නැති බව දැක් වූ කල්හි කාම රූප භව දෙකට අයත් කිසිම සංස්කාරයක් නැති බව දැක්වූයේ වේ.

ආකාසානඤ්චායතනාදි ධ්‍යාන සතර නිවනෙහි නැති බව පැවසීමෙන් එහි අරූප භවයට අයත් කිසිම සංස්කාරයක් නැති බව දැක් වේ. අරූපාවචර සත්ත්වයන් ගේ ප්‍රතිෂ්ඨාව අරූපධ්‍යාන සතරය. ඒවා නැති කල්හි අරූප භවයට අයත් අන්කිසි අරූප ධර්මයක් ද ඇති නො වේ. එබැවින් අරූපධ්‍යාන නැති බව දැක්වීමෙන් අරූප භවයට අයත් සියලු ම ධර්මයන් ගේ නැති බව දැක්වීම සිද්ධය. මේ සූත්‍රයෙහි මෙලොවය යනුවෙන් අදහස් කරන්නේ වර්තමාන භවය ය, පරලොවය යනුවෙන් අදහස් කරන්නේ අනාගත භව පරම්පරාවය. නිවන මෙලොවත් නො වේ ය, පරලොවත් නො වේ ය යි පැවසීමෙන් දැක්වෙන්නේත්, කාම රූප අරූප සංඛ්‍යාත භවත්‍රයට අයත් කිසිම සංස්කාරයක් එහි නැති බවම ය.

නිවන කිසි රූපධර්මයක් නැති තැනකැ යි කී කල්හි අසන්නවුන්ට සමහර විට එය මහ අඳුරක්ය කියා හෝ අඳුරු තැනක්ය කියා හෝ සිතෙන්නට පිළිවන. මේ සූත්‍රයෙහි නිවනෙහි ඉරසඳ නැතිබව වදරා තිබෙන්නේ එහි අඳුරක් නැති බැවින් පිටතින් ආලෝකයක් එයට වුවමනා නැති බව දැක්වීමට ය.

Non-commercial distribution

# නිවන හා සත්ත්වයා

සත්ත්වයාය - පුද්ගලයාය - මමය - අනිකාය -මිනිසාය - දෙවියාය - තිරිසනාය කියා ව්‍යවහාර කරන්නේ නාම රූපයන්ට ය. නිවන ය යි කියනුයේ නාම රූප නිරෝධයට ය. නාමරූප ඇතිතාක් එතැන නිරෝධය නැත. නිරෝධය ඇතිනම් එතැන නාමරූප නැත. නිවන සත්ත්වයන් යන එන සිටින තැනක් නොවන බව මේ සූත්‍රයෙහි දක්වන්නේ සත්ත්ව වශයෙන් සලකන නාම රූපයන් එහි ඇති නො වන නිසා ය. නැති බැවිහි ඇති බව නො පැවතිය හැකි ය.

## නිවනේ ප්‍රයෝජනය

"නිවන සත්ත්වයන් යන එන සිටින තැනක් නො වේ නම්, එබඳු නිවනකින් ඇති ප්‍රයෝජනය කවරේද?" යන ප්‍රශ්නය මෙහිදී ඇති වේ. නිවනින් ලබන්නට ඇත්තා වූ ප්‍රයෝජනය නම් දුක්ගිනි නිවා ගැනීම ය. සත්ත්වයන් ගේ දුක් ගිනි නිවෙන්නේ ද නිවනට පැමිණ වාසය කිරීමෙන් නොව නිවන් දැකීමෙනි. අන් කවර ධර්මයකට වත් නැති දක්නවුන් ගේ දුක්ගිනි නිවාලන පුදුම ආනුභාවයක් නිවනට ඇත්තේ ය. හරියට ම නිවන දැකීමට සමත් වන ලෝකෝත්තර ඥාන චක්ෂුසින් නිවන දෙස බැලුව හොත් එයින් ඒ තැනැත්තා ගේ දුක්ගිනි මතු කවර කලෙකවත් නූපදනා පරිදි නිවී යන්නේය. නිවන දුටු ඒ පින්වතා ඒ නිවීම් සුවයට හිමියෙක් වන්නේ ය.

නිවන ඇත්තේ පැමිණ වාසය කිරීමට නොව දැකීමට ය. නිවන් දකිනවාය, නිවන් දුටුවාය යන වචන බෞද්ධයන් අතර ව්‍යවහාරයට පැමිණ තිබෙන්නේ එහෙයිනි. නිවනට පිවිසියේ ය, නිවන් ගියේ ය, නිවනට පැමිණියේ ය යන ව්‍යවහාර ඇතත් ඒවා පර්‍යායය කථාය. නිවන් කථාවේදී ව්‍යවහාරයට ඉතා හොඳ වචන නිවන් දකිනවාය, නිවන් දුටුවා ය යන වචනයෝ ය.

කළ යුතු වැඩවලින් ඉතාම අමාරු දෙය නිවන් දැකීමය, එබැවින් තථාගතයන් වහන්සේ විසින් :-

Non-commercial distribution

**"දුද්දසං අනතං නාම නාහි සච්චං සුදස්සනං**
**පටිවිද්ධා තණ්හා ජානතෝ පස්සතෝ නත්ථි කිඤ්චනං"**

යනු වදාරන ලදී. එහි තේරුම :- "නිවන දැකීමට දුෂ්කර ය. නිවන පහසුවෙන් දැකිය හැකි නොවේ ය. නිරෝධ සත්‍යය ප්‍රත්‍යක්ෂ වශයෙන් දන්නා වූ - දක්නා වූ තැනැත්තා විසින් ප්‍රහාණය කිරීම් වශයෙන් තෘෂ්ණාව දක්නා ලද්දේ ය. ඉන් පසු ඔහුට කිසි පළිබෝධයක් නැත්තේ ය" යනුයි. මේ ගාථාවෙහි "**අනතං සච්චං**" යන වචන දෙකෙන්ම කියැවෙන්නේ නිවන ය.

## නිර්වාණ කීර්තන උදානය (2)

**"අත්ථි භික්ඛවේ: අජාතං අභූතං අකතං අසංඛතං, නො චේතං භික්ඛවෙ! අභවිස්ස අජාතං අභූතං අකතං අසංඛතං න යිධ ජාතස්ස භූතස්ස කතස්ස සංඛතස්ස නිස්සරණං පඤ්ඤායේථ. යස්මා ච බෝ භික්ඛවෙ! අත්ථි අජාතං අභූතං අකතං අසංඛතං තස්මා ජාතස්ස භූතස්ස කතස්ස සංඛතස්ස නිස්සරණං පඤ්ඤායතීති."**

තේරුම:-

"මහණෙනි! වේදනාදිය මෙන් හේතූන් නිසා නූපන්නා වූ අහේතුකව හෝ පහළ නො වූ, යම්කිසි හේතුවකින් ඇති නො කළා වූ බොහෝ හේතු ප්‍රත්‍යයන් එකතුව හෝ ඇති නො කළා වූ නිර්වාණ ධාතුව පරමාර්ථ වශයෙන් ඇත්තේ ය. මහණෙනි! ඉදින් ඒ නූපන්නා වූ, නො පහළ වූ, හේතුවකින් ඇති නො කළා වූ, බොහෝ හේතූන් හෝ එක්වී ඇති නො කළා වූ නිර්වාණ ධාතුව නැත්තේ නම්: හේතූන් නිසා උපදනා ස්වභාවය ඇත්තා වූ පහළ වන ස්වභාවය ඇත්තා වූ, හේතුවකින් ඇති කරන ස්වභාවය ඇත්තා වූ, බොහෝ හේතූන් එක්වී ඇතිකරන ස්වභාවය ඇත්තා වූ, පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුක්ඛස්කන්ධයා ගේ නිවීමෙක් නො වන්නේ ය. මහණෙනි: යම්හෙයකින් නූපන් නො හටගත් ප්‍රත්‍යයෙන් ඇති නො කළ, බොහෝ හේතූන් එක්ව හෝ ඇති නො කළ, නිර්වාණ ධාතුව පරමාර්ථ වශයෙන් ඇත්තේ ද, ඒ නිසා ප්‍රත්‍යයන් නිසා උපදනා ස්වභාවය ඇති, පහළ වන ස්වභාවය ඇති, ප්‍රත්‍යයන් ඇති කරන ස්වභාවය ඇති, බොහෝ ප්‍රත්‍යයන්

Non-commercial distribution

එක්ව ඇති කරන ස්වභාවය ඇති පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුඃඛයා ගේ නිවීමක් ඇත්තේ ය."

එක් කලෙක තථාගතයන් වහන්සේ නොයෙක් අයුරින් සංසාරයේ ආදීනවයත් නිවනත් දක්වමින් දහම් දෙසූ සේක. දහම් ඇසූ ඇතැම් භික්ෂූන්ට "බුදුන් වහන්සේ විසින් අවිද්‍යාදි හේතූන් ගේ වශයෙන් සංසාරය සහේතුක කොට වදරන ලද්දේ ය. සංසාර දුඃඛය සන්සිඳුවන නිර්වාණය පිළිබඳව කිසි හේතුවක් ප්‍රත්‍යයක් නො වදරන ලද්දේ ය. නිර්වාණය පිළිබඳ කිසි හේතු ප්‍රත්‍යයක් නො වදරන්නේ එය අහේතුක නිසා විය හැකි ය. අහේතුක වූ නිර්වාණය පරමාර්ථ වශයෙන් ඇති විය හැක්කේ කෙසේ ද? යන කල්පනාවක් ඇති විය.

බුදුන් වහන්සේට ඒ භික්ෂූන්ට ඇති වූ කල්පනාව පෙනී නිවන එක්තරා පරමාර්ථ ධර්මයක් වශයෙන් ඇතියක් බව දැක්වීම පිණිස **"අත්ථි භික්ඛවෙ! අජාතං අභූතං"** යනාදි උදාන පාඨය වදාළ සේක. මේ සූත්‍රයෙන් දක්වන කෙටි අදහස නම්, නිවන හටගැනීමක් ඇති වීමක් නැතිව ම පරමාර්ථ වශයෙන් ඇති ධර්මයක් බව ය.

**නිර්වාණ ධාතුව හට ගැනීමක් නැතිව ඇතය** යන මෙය ගැඹුරු කරුණෙකි. නිර්වාණය හරියට තේරුම් ගැනීමට අපහසු වීමට ඇති කරුණුවලින් මේ හටගැනීමක් නැතිව ඇති බවත් එක් කරුණෙකි. යමක් ඇති නම් එහි හට ගැනීමකුත් තිබිය යුතුයකි. නො හට ගත් දෙයක් සත්‍ය වශයෙන් නො තිබිය හැකිය යනු ද එක්තරා නීතියකි. ලොව ඇති බොහෝ දේවල්වලට ඒ නීතිය සාධාරණ වුවද එය සර්ව සාධාරණ නීතියක් නො වේ. හටගැනීමකුත් නැතුව ඇති ධර්ම ද ඇත්තේ ය. පරමාර්ථ ධර්ම අනුව කථා කරත හොත් ප්‍රඥප්තීන් නැති දේවල් සැටියට කිය යුතු ඒවා ය. එහෙත් ප්‍රඥප්ති ද සර්වප්‍රකාරයෙන් නැති ඒවා නොව ප්‍රඥප්ති භාවයෙන් ඇති ඒවා ය.

**මේසය එක්තරා ප්‍රඥප්තියකි. එය ද හටගැනීමක් නැතිව ඇතියකි**. එයත් ගැඹුරු කරුණෙකි. මේසය කලින් නො තිබී වඩුවකු ගේ ව්‍යායාමයෙන් ඇති වූවක් ය යනු බොහෝ

Non-commercial distribution

දෙනා ගේ පිළිගැනීම ය. එහෙත් එය එසේ නො වේ. මේසය කලින් නො තිබී පසුව ඇති වූවක් ලෙස පිළිගන්නේ මේසය හරියට නො හඳුනන නිසා ය. මේසය හැදීමක් හට ගැනීමක් නැතිව ඇති දෙයක් බව තේරුම් ගත හැකි වන්නේ මේසය කුමක් ද කියා හරියට තේරුම් ගත හොත් ය. මේසයේ හටගැනීමක් නැතිව ඇති බව තේරුම් ගැනීම නිවනෙහි හට ගැනීමක් නැතිව ඇති බව තේරුම් ගැනීමට උපකාර වන්නේ ය.

පා සතරකුත් ඒවා එකිනෙකට සම්බන්ධ කරන ලෑලි කෑබලිසතරකුත් ඒවාට උඩින් ලෑලි තට්ටුවකුත් සාමාන්‍යයෙන් මේසයකට ඇත්තේ ය. මේසය ය යි කියනුයේ ඒ ද්‍රව්‍ය සමූහයට නො වේ. ඒ ද්‍රව්‍ය සමූහය ම මේසය ය කියතහොත් ඒ ලී කෑබලි ටික එක මිටියකට බැඳ තැබුවාමත්, ඒ ලී මිටිය මේසය විය යුතුය. මේසයකට වුවමනා පරිදි ලී කොටය කෑබලි කරන්නට කලින් ඒ ලී කොටයෙහි මේසයට ගත් ලී සියල්ලම ඇති නිසා ඒ නො ඉරූ ලී කොටයමත් මේසය විය යුතු ය. මේසයට ගත් ලී සියල්ල ගසේ තිබුණු බැවින් ගසත් මේසය විය යුතු ය. මේසයට ගන්නා ලී සියල්ල ඇති ගසත්, කොටයත්, එයින් මේසය සඳහා ඉරාගත් ලී කෑබලි ටිකත්, ඒ සියල්ලම ඇති ලී මිටියත් මේසය නො වීමෙන් සාදා නිමකර ඇති මේසයේ ලී කෑබෙලි ටිකත් මේසය නො වන බව තේරුම් ගත යුතු ය.

සැබෑ මේසය නම් පා සතරත් ඒවා එකිනෙකට සම්බන්ධ කරන ලෑලි සතරත් ඒවා මත පිහිටුවන ලෑලි තට්ටුවත් එක්තරා ආකාරයකට සම්බන්ධ කළ කල්හි ඒ ලී කෑබලි ටිකේ පිහිටීම අනුව සිතට පමණක් දැනෙන හසුවන එක්තරා සූක්ෂ්ම ස්වභාවයකි. ඒ සූක්ෂ්ම ස්වභාවය වූ මේසය ඇසට පෙනෙන්නක් නො වේ. අතට හසුවන්නක් ද නො වේ. ඇසට පෙනෙන්නේත් අතට හසුවන්නේත් අර ලී කෑබෙලි ටික ය. පරමාර්ථ සත්‍යය අනුව කථා කරත හොත් කියයුත්තේ ලී කෑබෙලි ටික හැර මේසය කියා දෙයක් නැති බවය. එහෙත් ඒ ආකාරයෙන් පිහිටුවන ලද ලී කෑබෙලිවල අනුසාරයෙන් සිතට ඇති සැටියට දැනෙන මේසය සම්පූර්ණයෙන් නැතියක් ම නො වේ. මේසයය කියා දෙයක් සිතට හසුවන්නේ - සිතට දැනෙන්නේ එබඳු දෙයකුත් එක්තරා

Non-commercial distribution

ආකාරයකින් ඇති නිසා ය. පරමාර්ථ වශයෙන් නො ලැබෙන සිතට පමණක් අසුවන එබඳු දේවලට ප්‍රඥප්තිය යි කියනු ලැබේ.

මේසය වශයෙන් සලකන දරුමය ද්‍රව්‍යය ගෙන ගිනි මැලයකට දැමුවහොත් දැවී හලු වී යන්නේ මේසය නොව ලී කැබලි ටික ය. ඇසට හෝ අතට හසු නො වන ප්‍රඥප්තියක් වූ මේසය ගින්නට හසුවන්නේ නො වේ. එබැවින් ගින්නෙහි ලැමෙන් ලී කැබලි ටික මිස මේසය විනාශ නො වන බව තේරුම් ගත යුතු ය. අන් ක්‍රමයකින් වුවද ලී කැබෙලි ටික ම මිස මේසය විනාශ නො කළ හැකිය. මේසය කිසි කලෙක කවර හේතුවකින් වත් විනාශ වන්නක් නො වේ. උපක්‍රමයෙන් විනාශ කළ නො හෙන්නා වූ ද, ඉබේ වුවද විනාශ වීමක් සිදු නො වන්නා වූ ද, මේසය , කිසිවකුට ඇති කළ හැක්කේ ද නො වේ. වඩුවා කරන්නේ ඔහු ගේ සිතට දැනෙන මේස සටහන ප්‍රකට වන පරිදි ලී කැබෙලි පිහිටු වීම ය. මේසයක් ඔහුට ඇති නො කළ හැකි ය.

වඩුවා පිළියෙල කළ කැබලි සංයෝගය දක්නවුන් ගේ සිතට ද එය අනුව මේස සටහන දැනෙන්නේ ය. මේ සටහන මේස ප්‍රඥප්තිය වඩුවා ගේ ව්‍යායාමය නිසා ඇති වූවක් නොව කලින් ම තුබූ දෙයකි. එය අසවල් කාලයේ ඇති වූවක් ය, ඉන් පෙර තුබුණේ නැත ය කියා දැක්වීමට කාලයක් නැත. එබැවින් මේසය නමැති ප්‍රඥප්තිය පළමුවෙන් ඇතිවීමක් හෙවත් පටන් ගැනීමක් නැතුව ඇතියක් බව දත යුතු ය. පටන් ගැනීමක් නැතිව ඇත්තා වූ එබඳු දේවල විනාශයක් නැති බව ද තේරුම් ගත යුතු ය.

(ප්‍රඥප්තිය හා පරමාර්ථය විස්තර කරන ඇතැම් අභිධර්ම පොත්වල ප්‍රඥප්තියේ වෙනස් වීමක් විනාශයක් ඇති බව පවසා මහ අවුලක් කර තිබේ. එය ඒ ගත් කරුවන්ට වැරදීමකි.)

මේසය පිළිබඳව කියන ලද කරුණත් ගැඹුරු කරුණෙකි. කියවන්නාට එය හොඳින් තේරුණා නම් ඇතිවීමක් නැතුව නිර්වාණ ධාතුවත් තිබිය හැකි බව තේරුම් ගත හැකි වනු ඇත.

මුලින් ඇතිවීමක් නැතුව ඇත්තා වූ මේසය ද්‍රව්‍යයක් නො වන නිසා එයට තිබෙන්නට තැනක් ද වුවමනා නැත. එබැවින් මේස

Non-commercial distribution

නැමති ප්‍රඥප්තිය ඇති තැනක් ද නැති බව කිය යුතු ය. සැම තැනකදී ම එය සිතට හසුවන බැවින් එය සැමතැන ම ඇති දෙයකැ යි ද කිය යුතු ය. එමෙන් ම නිර්වාණ ධාතුවටත් පිහිටීමට තැනක් නුවුවමනා බැවින් එය ඇති තැනකුත් නැත ය යි ද, කොතැනකදී වුවත් ලැබිය හැකි බැවින් සැම තැන ම ඇතය යි ද කිය හැකි ය.

ආකාශය ද පටන් ගැනීමක් නැතුව ඇති එක් දෙයකි. ආකාශය කාහටත් ප්‍රත්‍යක්ෂ දෙයකි. ආකාශයක් ඇති බව කවුරුත් පිළිගනිති. මේ ආකාශය අසවල් කාලයෙන් ඔබ තිබුණේ නැත. ආකාශය ඇත්තේ අසවල් කාලයේ පටන් යයි කිය හැකි කාලයක් නැත. එය මුළු අතීත කාලයේ ම පැවැත්තේ ය. මෙය නුවණින් කල්පනා කරන කාහට වුවත් පිළිගත හැකි කරුණෙකි. පළමුවෙන් ඇතිවීමක් නැතුව ආකාශය සැම කල්හි ම පවත්නාක් මෙන් නිවනත් ඇති වීමක් නැතුව සැමකල්හි පවත්නක් බව තේරුම් ගත යුතු ය.

යම්කිසි හේතුවකින් හෝ ඉබේ ම හෝ හටගැනීමක් නැතිව ඇත්තා වූ **නිවන ආකාශය සේ සිස් බවක් නො වේ. මෙසය බඳු ප්‍රඥප්තියක් ද නො වේ**. එය එක්තරා පරමාර්ථ ධර්මයකි. ඒ බව දත යුත්තේ එහි ඇති ආනුභාවයෙනි. සිස් බවෙහි කිසි ආනුභාවයක් නැත. සියලු කෙලෙස් නැති කිරීමේ, සියලු දුක් නැති කිරීමේ මහානුභාවයක් නිවනෙහි ඇත. නිවන් පසක් කිරීමෙන් හෙවත් නුවණැසින් නිවන දැකීමෙන් දුටු තැනැත්තා ගේ කෙලෙස් මතු නූපදනා පරිදි නැති වී යන්නේත් දුක් නැති වී යන්නේත් නිවනේ ආනුභාවයෙනි. එබඳු ආනුභාවයක් සිස්බවෙහි නැති බැවින් නිර්වාණධාතුව අනුභාවසම්පන්න එක්තරා පරමාර්ථ ධර්මයකැ යි පිළිගත යුතු ය.

Non-commercial distribution

## අභිධර්ම පිටකයේ විභඞ්ගප්‍රකරණයෙහි

# නිර්වාණය විස්තර කර ඇති ආකාරය

**"තත්ථ කතමා අසංඛතා ධාතු? රාගක්ඛයෝ දෝසක්ඛයෝ මෝහක්ඛයෝ. අයං වුච්චති අසංඛතා ධාතු"**

තේරුම:-

"එහි අසංඛත ධාතුව කවරේද? රාගයා ගේ ක්ෂයය, ද්වේෂයා ගේ ක්ෂය ය, මෝහයා ගේ ක්ෂය ය යන මෙය අසංඛත ධාතුව" ය යි කියනු ලැබේ.

නිවනට බොහෝ නම් ඇත්තේ ය. මේ විභංග පාඨයෙහි දැක්වෙන්නේ බොහෝ නිර්වාණ නාමයන් අතුරෙන් අසංඛත ධාතු යන නාමය ය. **ධාතු යන වචනයේ තේරුම සත්ත්ව නොවන පුද්ගල නො වන දෙය යනු** යි. නිවනෙහි ද සත්ත්ව පුද්ගල ස්වභාවයක් නැති බැවින් එයට ද ධාතු යන නාමය යෙදේ. නිර්වාණ ධාතුවෙන් අන්‍ය වූ සකල ධාතුහු ම ප්‍රත්‍යයන් නිසා හට ගන්නාහු ය. එබැවින් ඒ ධාතුන්ට සංඛත ධාතු යන නම කියනු ලැබේ. නිර්වාණය නැමැති මේ එකම ධාතුව පමණක් ප්‍රත්‍යයෙන් හටගැනීමක් නැතිව ඇත්තා වූ ධාතුව ය. එබැවින් එයට අසංඛත ධාතුව ය යි කියනු ලැබේ.

කියන ලද විභංග පාඨයේ අර්ථය ගැඹුරින් නො බලා මතුපිටින් පමණක් බැලුවහොත් රාග ද්වේෂ මෝහයන් ගේ අභාවය වූ සිස් බවම නිවනය කියා වැරදි හැඟීමක් ඇති විය හැකි ය. එසේ වරදවා අර්ථය නො ගනු පිණිස,

**"අසංඛතධාතූති: අසංඛතසභාවං නිබ්බානං, යස්මා පනේතං ආගම්ම රාගාදයෝ ඛියන්ති තස්මා රාගක්ඛයෝ දෝසක්ඛයෝ මෝහක්ඛයෝති වුත්තං"** යි අර්ථකථාවෙහි කීහ.

"අසංඛත ධාතු යනු අසංස්කෘත ස්වභාවය ඇති නිර්වාණය ය. යම් හෙයකින් ඒ නිවන නිසා රාගාදීහු ක්ෂය වෙත් ද එබැවින් එයට අසංඛත ධාතුවය" යි කියනු ලැබේය යනු අටුවා පාඨයේ තේරුම ය.

Non-commercial distribution

විභංග පාඨයෙහි රාගක්ඛය- දෝසක්ඛය - මෝහක්ඛය යන වචන තුනෙන් දක්වන්නේ රාගාදීන් ගේ අභාවය වූ සිස් බව නොව මෙහි ඉහත විස්තර කරන ලද දුඃඛස්කන්ධයා ගේ අනුත්පාද නිරෝධ සංඛ්‍යාත ශාන්ත සුඛස්වභාවය ය. ඉහත කී පාඨයේ අර්ථය වරදවා තේරුම් ගෙන රාගාදීන් ගේ අභාවය වූ සිස් බව ම නිවනය යි ගත්තෝ පෙර ද වූහ. එබැවින් ඒ කාරණය පිළිබඳ සංවාදයක් විභංග අටුවාවේ දක්වා තිබේ. එද නිවන් තතු සොයන්නවුන්ට බොහෝ ප්‍රයෝජන බැවින් මේ ගතට ද ඇතුළත් කරනු ලැබේ.

## අටුවාවේ දැක්වෙන නිර්වාණ වාදය

**"අසංඛත ධාතුති අසංකත සභාවං නිබ්බානං. යස්මා පනේතං ආගම්ම රාගාදයෝ ඛීයන්ති. තස්මා රාගක්ඛයෝ දෝසක්ඛයෝ මෝහක්ඛයෝති වුත්තං. අයමෙත්ථ ආචරියානං සමානත්ථකථා"**

විතණ්ඩවාදි පනාහ. "පාටියෙක්කං නිබ්බානං නාම නත්ථි කිලේසක්ඛයෝ ව නිබ්බාන"න්ති.

සුත්තං ආහරාති ච වුත්තේ "නිබ්බානං නිබ්බානන්ති ආවුසෝ සාරිපුත්ත වුච්චති. කතමං නු බෝ සාරිපුත්ත නිබ්බානන්ති? යෝ බෝ ආවුසෝ රාගක්ඛයෝ දෝසක්ඛයෝ මෝහක්ඛයෝ ඉදං වුච්චති නිබ්බානන්ති" එතං ජම්බුඛාදක සුත්තං ආහරිත්වා ඉමිනා සුත්තේන වේදිතබ්බං පාටියෙක්කං නිබ්බානං නාම නත්ථි කිලේසක්ඛයෝ ව නිබ්බානන්ති" ආහ.

සෝ වත්තබ්බෝ කිම්පන යථා වේ තං සුත්තං තථා අත්ථෝති? අද්ධා වක්ඛති, ආම, නත්ථි සුත්තතෝ මුඤ්චිත්වා අත්ථෝති.

තතෝ වත්තබ්බෝ, ඉදං තාව තේ සුත්තං ආහතං අනන්තර සුත්තං ආහරාති. අනන්තර සුත්තං නාම අරහත්තං අරහත්තන්ති ආවුසෝ සාරිපුත්ත වුච්චති, කතමං නු බෝ ආවුසෝ අරහත්තන්ති? යෝ බෝ ආවුසෝ රාගක්ඛයෝ දෝසක්ඛයෝ මෝහක්ඛයෝ

Non-commercial distribution

ඉදං වුච්චති අරහත්තන්ති. ඉදං තස්සේවානන්තරං ආහතසුත්තං.

ඉමස්මිං පන සුත්තේ ආහතේ ආහංසු නිබ්බානං නාම ධම්මායතන පරියාපන්නෝ ධම්මෝ, අරහත්තං චත්තාරෝ ඛන්ධා, නිබ්බානං සච්ඡිකත්වා විහරන්තෝ ධම්මසේනාපති නිබ්බානං පුච්ඡිතෝපි අරහත්තං පුච්ඡිතෝපි කිලේසක්ඛයමෙව ආහ. කිං පන නිබ්බානඤ්ච අරහත්තඤ්ච ඒකං, උදාහු නානන්ති.

ඒකං වා හෝතු නානං වා. කෝ එත්ථ තයා අතිබහුං චුණ්ණීකරණං කරොන්තේන අත්ථො.

නත්වං ඒකං නානං ජානාසීති නනු සඤ්ඤතේ සාධු හෝතීති. ඒවං පුනප්පුනං පුච්ඡිතෝ වඤ්චේතුං අසක්කොන්තෝ ආහ. රාගාදීනං ඛීනන්තේ ජාතත්තා අරහත්තං රාගක්ඛයෝ දෝසක්ඛයෝ මොහක්ඛ-යෝති වුච්චතීති.

තතෝ නං ආහංසු, මහාකම්මං තේ කතං. ලඤ්ඡං දත්වාපි තං වදපෙන්තෝ ඒතදේව වදපෙය්‍ය. යථෙව තේ ඒතං විභජිත්වා කථිතං ඒවං ඉදම්පි සල්ලක්ඛෙහි, නිබ්බානං ආගම්ම රාගාදයෝ ඛීණාති. නිබ්බානං රාගක්ඛයෝ දෝසක්ඛයෝ මොහක්ඛයෝති වුත්තං. තීනිපි චේතානි නිබ්බානස්සේව වේවචනානීති.
සචේ ඒවං වුත්තේ සඤ්ඤත්තිං ගච්ඡති ඉච්චේතං කුසලං. නෝ චේ බහුනිබ්බානතාය කාරෙතබ්බෝ. කථං? ඒවං තාව පුච්ඡිතබ්බෝ. රාගක්ඛයෝ නාම රංගස්සේවක්ඛයෝ උදාහු දෝස මෝහානම්පි? දෝසක්ඛයො නාම දෝසස්සෙව ඛයො උදාහු රාගමෝහානම්පි? මෝහක්ඛයෝ නාම මෝහස්සේව ඛයෝ උදාහු රාගදෝසානම්පීති?

අද්ධා වක්ඛති. රාගක්ඛයෝ නාම රාගස්සෙව ඛයෝ. දෝසක්ඛයෝ නාම දෝසස්සේව ඛයෝ. මෝහක්ඛයෝ නාම මොහස්සේව ඛයෝති.

Non-commercial distribution

තතෝ වත්තබ්බෝ, තව වාදේ රාගක්ඛයෝ ඒකං නිබ්බානං හෝති, දෝසක්ඛයෝ ඒකං, මෝහක්ඛයෝ ඒකං. තිණ්ණං අකුසල මූලානං ඛයේ තීණි නිබ්බානානි හොන්ති, චතුන්නං උපාදනානං ඛයේ චත්තාරි, පඤ්චන්නං නීවරණානං ඛයේ පඤ්ච, ඡන්නං තණ්හාකායානං ඛයේ ඡ, සත්තන්නං අනුසයානං ඛයේ සත්ත. අට්ඨන්නං මිච්ඡත්තානං ඛයේ අට්ඨ, නවන්නං තණ්හා මූලික ධම්මානං ඛයේ නව, දසන්නං සංයෝජනානං ඛයේ දස, දියඩ්ඪකිලේස සහස්සස්ස ඛයේ පාටියෙක්කං නිබ්බානන්ති බහූනි නිබ්බානානි හොන්ති. නත්ථි තේ නිබ්බානානං පමාණන්ති. ඒවං පන අග්ගහෙත්වා නිබ්බානං ආගම්ම රාගාදයෝ ඛීණාති. ඒකමේව නිබ්බානං රාගක්ඛයෝ දෝසක්ඛයෝ මෝහක්ඛයෝති වුච්චති. තීණිපි චේතානි නිබ්බානස්සේව වේවචනානිතී ගණ්හ."

ධර්මය හරියට තේරුම් නොගෙන නොයෙක් මිථ්‍යාමත ඇති කරගෙන ධර්මවාදීන් හා වාදයට එන පුද්ගලයන්ට අටුවාවල ව්‍යවාහර කර තිබෙන නාමය **විතණ්ඩවාදී** යනුයි. නිවන පිළිබඳව ද විතණ්ඩවාදයක් ඇත්තේ ය. නිර්වාණය කියා අමුතු පරමාර්ථ ධර්මයක් ඇත්තේ නැත. ක්ලේශක්ෂයම නිර්වාණයය යනු විතණ්ඩවාදයි. ඉහත කී අටුවා පාඨයෙන් දැක්වෙන්නේ විතණ්ඩවාදියාගෙන් ප්‍රශ්න අසා ඒ වාදය බිඳ දැමිය යුතු ආකාරය ය. විතණ්ඩවාදය බිඳ දැමීම සඳහා අටුවාවෙහි දක්වා ඇති කරුණු වරදවා තේරුම් ගෙන ඇතමෙක් නිවනය කියා සූක්ෂ්ම රූපයක් හෝ විඤ්ඤාණයක් ඇතය යි ගනිති. එද වැරදි හැඟීමකි. නිවන රූපයක් හෝ විඤ්ඤාණයක් හෝ නො වන බව ඉහත පැහැදිලි කර ඇත්තේ ය.

## ආර්‍ය්‍යසත්‍ය දේශනයේ නිවන

**"ඉදං බෝ පන භික්ඛවෙ! දුක්ඛනිරෝධං අරිය සච්චං. යෝ තස්සායේව තණ්හාය අසේසවිරාග නිරෝධෝ චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ."**

Non-commercial distribution

තේරුම:-

"මහණෙනි! නැවත ඉපදීම ඇති කරන්නා වූ ඒ තෘෂ්ණාවගේ ලෝකෝත්තර මාර්ගය කරණකොට වන යම් නිරවශේෂ නිරෝධයක් වේ ද, ඒ තෘෂ්ණාව අත හැරීමක් වේ ද ඉවතලීමක් වේ ද, තෘෂ්ණාවෙන් මිදීමක් වේ ද, රූපාදියෙහි නො ඇල්මක් වේ ද, මෙය දුඃඛ නිරෝධාර්‍ය්‍ය සත්‍යය නම් වන්නේ ය."

ආර්‍ය්‍ය සත්‍ය දේශනාවෙහි දුඃඛ නිරෝධාර්‍ය්‍ය සත්‍ය නාමයෙන් දැක්වෙන්නේ ද අසංස්කෘතධාතු සංඛ්‍යාත ලෝකෝත්තර නිර්වාණය ය. දේශනා ඥානයෙහි පාරප්‍රාප්ත වූ තථාගතයන් වහන්සේ එකම කරුණ නානා ක්‍රමවලින් ද, නානා වචනවලින් ද දේශනය කිරීමට සමත්වන සේක. එබැවින් එකම නිර්වාණ ධාතුව ප්‍රතීත්‍ය සමුත්පාද දේශනයේදී අවිද්‍යාදි ද්වාදශාංගයන්ගේ නිරෝධය වශයෙන් වදාළ සේක. ආයතන විභංගයේදී හා අසංඛත සංයුක්තයේ සූත්‍ර බොහෝ ගණනකදී ද, රාග ද්වේෂ මෝහයන්ගේ ක්ෂයය නිර්වාණය වශයෙන් වදාළ සේක. ආර්‍ය්‍යසත්‍ය දේශනයේ දී තෘෂ්ණා නිරෝධයාගේ වශයෙන් වදාළ සේක. තවත් සූත්‍රවලදී ද නොයෙක් ආකාරයෙන් නිර්වාණය දක්වා ඇත්තේ ය.

සසර සැරිසරන සත්ත්වයා කොතෙක් වර මළත් තෘෂ්ණාව ඇතිතාක් නැවත නැවතත් උපදනේ ය. ඉපදීම වෙතොත් ජාති ජරා මරණාදි දුඃඛස්කන්ධය ද නැවත නැවත ඇතිවන්නේ ම ය. තෘෂ්ණාව නිරවශේෂයෙන් නිරුද්ධ වුවහොත් නැවත ඉපදීම් වශයෙන් ජාත්‍යාදි දුඃඛස්කන්ධය ඇති නොවේ.

එබැවින් තෘෂ්ණා නිරෝධයට සකල දුඃඛයන්ගේ ම නිරෝධය ඇතුළු වන බව දතයුතු ය. දුඃඛනිරෝධාර්‍ය්‍ය සත්‍ය දේශනයෙහි එන **අසේසවිරාග නිරෝධො, චාගො, පටිනිස්සග්ගො, මුත්ති අනාලයො** යන මේ වචනවලින් එක එකකට ම තෘෂ්ණාව සහිත සකල දුඃඛයන්ගේ ම නිරෝධය ඇතුළත් ය. ඒ සෑම වචනයක් ම තෘෂ්ණා නිරෝධයාගේ වශයෙන් නිර්වාණ ධාතුව දක්වන වචනයෝ ය. ඒ සෑම වචනයක් ම නිර්වාණ නාමයෝ ය. එබැවින් "අසේස විරාග නිරොධො" යනාදි වචනවල අර්ථය තෘෂ්ණාවගේ අභාවය වූ සිස් බව ය යි නොගෙන මතු කිසි කලෙක තෘෂ්ණාව සහිත සකල

Non-commercial distribution

දුඃඛස්කන්ධයාගේ ම අනුත්පත්තියට හේතුවන "අසංඛත ධාතුවය" යි ගත යුතුයි.

## නිවන පිහිටි තැන

නිවන පිහිටි තැන පිළිබඳ ප්‍රශ්නෝත්තර කථාවක් මිළින්දප්‍රශ්නයෙහි එන්නේ ය. ඒ මෙසේය :- ස්වාමීනි, නාගසේනයන් වහන්ස, නැගෙනහිර දිග හෝ දකුණු දිග හෝ බස්නාහිර දිග හෝ උතුරු දිග හෝ උඩ හෝ යට හෝ සරස හෝ නිර්වාණය පිහිටි ප්‍රදේශයක් ඇත්තේදැයි මිලිඳු රජතුමා නාගසේන මහරහතන් වහන්සේගෙන් විචාළේ ය.

එකල්හි නාගසේන තෙරුන් වහන්සේඃ මහරජ! නැගෙනහිරදිග හෝ දකුණුදිග හෝ බස්නාහිරදිග හෝ උතුරුදිග හෝ උඩ යට හෝ සරස හෝ නිවන පිහිටා ඇති පෙදෙසක් නැත ය යි වදාළ සේක.

එකල්හි මිලිඳුරජ කියනුයේ, ස්වාමීනි, නාගසේනයන් වහන්ස! නිවන පිහිටි තැනක් නැතිනම් - නිවනකුත් නැත. යමකු විසින් නිවන සාක්ෂාත් කරන ලද නම් ඔවුන් ගේ ඒ සාක්ෂාත් කරණයද මිථ්‍යා වෙකඃ වැරදීමෙක. එහි කාරණය කියන්නෙමි. ස්වාමීනිඃ නාගසේනයන් වහන්ස! යම් සේ පොළොවෙහි ධාන්‍ය උපදනා කෙත් ඇත්තේ ද, සුවඳ ඇතිවන මල් ඇත්තේද, මල් හටගන්නා ගස් ඇත්තේද, ගෙඩි හටගන්නා ගස් ඇත්තේද, රත්න හට ගන්නා ආකර ඇත්තේද, එමෙන්ම නිර්වාණය පිහිටි තැනක්ද තිබිය යුතු ය. ස්වාමීනිඃ නාගසේනයන් වහන්ස! යම් හෙයකින් නිවන ඇතිවන තැනක් නැත්තේ ද එබැවින් නිවනකුත් නැත ය යි කියමි. යමකු විසින් නිවන සාක්ෂාත් කරන ලද නම් එයත් වැරදීමකැයි කියමියි කීය.

එකල්හි නාගසේන තෙරුන් වහන්සේ - "මහරජ! නිවන පිහිටි තැනක් නම් නැත. එහෙත් නිවන නම් ඇතමය. මනාකොට පිළිපන් තැනැත්තා යෝනිසෝමනස්කාරයෙන් නිර්වාණය සාක්ෂාත් කර ගන්නේ ය. මහරජ! ගින්න නම් ඇත්තේ ය. එහෙත් එය පිහිටි තැනක් නැත්තේ ය. ලී දෙකක් ඇතිල්ලීමෙන් එය ලැබෙන්නේ ය. මහරජ! එපරිද්දෙන් ම නිවන ඇත්තේ ය. එය පිහිටි තැනක් නැත්තේ ය. මනාකොට පිළිපදින්නා වූ තැනැත්තේ යෝනිසෝමනස්කාරයෙන්

Non-commercial distribution

නිර්වාණය සාක්ෂාත් කරන්නේ ය, මහරජ! චක්‍රරත්නය - හස්තිරත්නය - අශ්වරත්නය - මාණික්‍යරත්නය - ස්ත්‍රීරත්නය - ගෘහපතිරත්නය - පරිනායක රත්නය යන සප්තරත්නයෝ ඇත්තාහ. එහෙත් ඒවා පිහිටා ඇති තැනක් නැත. මනාකොට පිළිපන්නා වූ ක්ෂත්‍රියයාහට ප්‍රතිපත්ති බලයෙන් ඒ රත්නයෝ පහළ වන්නාහ. මහරජ! එපරිද්දෙන් නිර්වාණයක් ඇත්තේ ය. එය පිහිටි තැනක් නැත්තේ ය. මනාකොට පිළිපදිනා තැනැත්තේ යෝනිසෝමනස්කාරයෙන් නිර්වාණය සාක්ෂාත් කරන්නේ ය''යි වදාළ සේක.

"ස්වාමීනි: නාගසේනයන් වහන්ස! නිවන පිහිටි තැනක් නැති නම් එසේ වේවා! මනා කොට පිළිපදින්නා වූ යෝගාවචරයා නිර්වාණය සාක්ෂාත් කරන තැනක් හෝ ඇත්තේ ද?

මහරජ! එසේ ය. මනාකොට පිළිපදින යෝගාවචරයා නිවන සාක්ෂාත් කරන තැනක් නම් ඇත්තේ ය.

"ස්වාමීනි: නාගසේනයන් වහන්ස! ඒ කොතැනද?

මහරජ! ඒ තැන නම් ශීලය යි. මහරජ! ශීලයෙහි පිහිටා යෝනිසෝමනස්කාරයෙන් යුක්තවන තැනැත්තේ ස්වකීය යවන දේශයෙහි වුව ද, චීනවිලාත දේශයෙහි වුව ද, අලසන්ද දේශයෙහි වුව ද, නිකුම්බ දේශයෙහි වුව ද, කාශි කෝශල දේශයන්හි වුව ද, කාශ්මීර දේශයෙහි වුව ද, ගන්ධාර දේශයෙහි වුව ද, මහමෙර මුදුනෙහි වුව ද, බ්‍රහ්මලෝකයෙහි වුව ද කොතැනක වුව ද නිර්වාණය සාක්ෂාත් කරන්නේ ය.

මහරජ! යම්කිසි ඇස් ඇති පුරුෂයෙක් ස්වකීය යවන දේශයෙහි වුව ද, චීනවිලාත දේශයෙහි වුව ද, අලසන්ද දේශයෙහි වුව ද, නිකුම්බ දේශයෙහි වුව ද , කාශිකෝශල දේශයන්හි වුව ද, කාශ්මීර ගන්ධාර දේශයන්හි වුව ද, මහමෙර මුදුනෙහි වුව ද, බ්‍රහ්ම ලෝකයෙහි වුව ද, කොතැනකදී වුව ද, අහස දක්නේ ද, මහරජ! එපරිද්දෙන් ශීලයෙහි සිට යෝනිසෝමනස්කාරය පවත්වන තැනැත්තේ ස්වකීය යවන දේශයෙහි වුව ද, චීනවිලාත දේශයෙහි වුව ද, අලසන්ද දේශයෙහි වුව ද, නිකුම්බ දේශයෙහි වුව ද, කාශි කෝශල දේශයන්හි වුව ද, කාශ්මීර ගන්ධාර දේශයන්හි වුව ද, මහමෙර මුදුනෙහි

Non-commercial distribution

වුව ද, බ්‍රහ්ම ලෝකයෙහි වුව ද, කොතැනක වුව ද, නිර්වාණය සාක්ෂාත් කරන්නේ ය.

ආයුෂ්මත් නාගසේන ස්ථවිරයන් වහන්සේ ගේ පිළිතුර මිළිඳු මහරජතුමා ස්තුති පූර්වකව ගෞරවයෙන් පිළිගත්තේ ය.

## නිර්වාණය සාක්ෂාත් කරන ප්‍රශ්නය

ස්වාමීනි, නාගසේනයන් වහන්ස! සම්‍යක් ප්‍රතිපත්තියෙන් නිවන් පසක් කරන තැනැත්තේ ඉපද ඇති නිර්වාණය ම සාක්ෂාත් කරන්නේ ද? නැතහොත් අමුතුවෙන් නිවන උපදවාගෙන සාක්ෂාත් කරන්නේ දැ යි මිළිඳු රජතුමා ඇසීය.

මහරජ! සම්‍යක් ප්‍රතිපත්තියෙන් නිවන් පසක් කරන තැනැත්තේ ඉපද ඇති නිවනක් පසක් කරන්නේ ද නො වේ. නිවනක් උපදවා ගෙන පසක් කරන්නේ ද නො වේ. මහරජ! එහෙත් සම්‍යක් ප්‍රතිපත්තියෙන් සාක්ෂාත් කරන නිවන නම් ඇත්තේම ය යි නාගසේන ස්ථවිරයන් වහන්සේ වදාළ සේක.

ස්වාමීනි, නාගසේනයන් වහන්ස! මේ ප්‍රශ්නය වැසුණක් කොට නො දක්වනු මැනවි. විවෘත කොට ප්‍රකට කොට දක්වන සේක්වා! නුඹ වහන්සේ උගෙන ඇති යමක් වේනම් ඕනෑකමින් උත්සාහයෙන් ඒ සියල්ල මෙහි ම වගුරවනු මැනවි. මේ කාරණයෙහි ජනයෝ මුළා ව ඉන්නාහ. විමති ඇතිව ඉන්නාහ. සැක ඇතිව ඉන්නාහ. මහජනයා ගේ ඒ සැකය නැමති හුල බිඳලුව මැනව.

මහරජ! ශාන්ත වූ සැප වූ ප්‍රණීත වූ ඒ නිර්වාණ ධාතුව ඇත්තේ ම ය. එය මනා කොට පිළිපන් තැනැත්තේ සර්වඥයන් වහන්සේ ගේ අනුශාසනය පරිදි සංස්කාරයන් සම්මර්ශනය කිරීමෙන් සාක්ෂාත් කරන්නේ ය. මහරජ! යම් සේ අතවැසියා ආචාර්යවරයා ගේ අනුශාසනයෙන් විද්‍යාව ප්‍රඥාවෙන් සාක්ෂාත් කෙරේ ද, මහරජ! එපරිද්දෙන් ම මනාකොට පිළිපදින තැනැත්තේ සර්වඥානුශාසනය පරිදි සංස්කාරයන් සම්මර්ශනය කිරීමෙන් නිර්වාණය සාක්ෂාත් කරන්නේ ය.

Non-commercial distribution

මහරජ! නිවන කෙසේ දතයුතු ද? එය ව්‍යසනයන් නැතියක් සැටියට ද, උපද්‍රව නැතියක් සැටියට ද, බියක් නැති තැනක් සැටියට ද, උවදුරු නො එන තැනක් සැටියට ද, ශාන්ත ස්වභාවයක් සැටියට ද, සුඛ ස්වභාවයක් සැටියට ද, ආශ්වාදයක් මිහිරි දෙයක් සැටියට ද, ප්‍රණීත දෙයක් සැටියට ද, පිරිසිදු දෙයක් සැටියට ද, ශීතල ස්වභාවයක් සැටියට ද දත යුතු ය.

මහරජ! මහ ගින්නකට හසු වී දැවෙමින් සිටියෙක් මහත් වූ උත්සාහයෙන් එයින් මිදී ගිනි නැති තැනකට වැද එහි දී යම් සේ මහත් සුවයක් ලබා ද, එපරිද්දෙන් ම යමෙක් මනාකොට පිළිපන්නේ වේ නම් හෙතෙමේ සම්‍යක් මනස්කාරයෙන් ත්‍රිවිධාග්නි සන්තාපයෙන් මිදීමෙන් පරම සුඛය වූ නිර්වාණය සාක්ෂාත් කරන්නේ ය. මහරජ! මේ උපමාවෙහි මහා ගිනි ගොඩ මෙන් ත්‍රිවිධාග්නිය දත යුතුය. ගින්නට හසුව උන් තැනැත්තා මෙන් සම්‍යක් ප්‍රතිපත්තියෙහි පිහිටි තැනැත්තා දත යුතු ය. ගින්න නැති තැන මෙන් නිවන දත යුතු ය. මහරජ! යම්සේ මිනී කුණු - බලු කුණු - මල මූත්‍ර රාශියකට හසු වූ පුරුෂයෙක් මහත් වූ උත්සාහයෙන් එයින් මිදී කුණප විරහිත තැනකට පැමිණ එහි පරම සුඛයක් ලබා ද, මහරජ! එපරිද්දෙන් ම මනා කොට පිළිපදිනා තැනැත්තේ යෝනිසෝමනස්කාරයෙන් ක්ලේශ කුණපයන් නැත්තා වූ පරම සුඛය වූ නිර්වාණය සාක්ෂාත් කරන්නේ ය. මහරජ! මේ උපමාවෙහි කුණප රාශිය මෙන් පඤ්චකාමය දත යුතු ය. කුණප ගොඩට හසුව උන් පුරුෂයා මෙන් මනා කොට පිළිපන් පුද්ගලයා දත යුතු ය. කුණපයන් නැති තැන මෙන් නිර්වාණය දත යුතු ය.

මහරජ! යම් සේ බියපත් වූ තැති ගත්තා වූ වෙවුලන්නා වූ අවුල් වූ සිත් ඇත්තා වූ පුරුෂයෙක් උත්සාහයෙන් එයින් මිදී ශක්තිමත් වූ ස්ථිර වූ ආරක්ෂා ස්ථානයකට පිවිස පරම සුඛයක් ලබා ද: එපරිද්දෙන් මනාකොට පිළිපදිනා තැනැත්තේ යෝනිසෝමනස්කාරයෙන් භය සන්ත්‍රාස විරහිත පරම සුඛය වූ නිර්වාණය සාක්ෂාත් කරන්නේ ය. මහරජ! මේ උපමාවෙහි භය මෙන් ජාති ජරා ව්‍යාධි මරණයන් නිසා වරින් වර වන භය දත යුතු ය. බියපත් පුරුෂයා මෙන් මනා කොට පිළිපන් තැනැත්තා දත යුතු ය. අභය ස්ථානය මෙන් නිවන දත යුතු ය.

Non-commercial distribution

මහරජ! කුණු මඩගොහොරුවකට වැටී ඉන්නා පුරුෂයෙක් මහත් වූ උත්සාහයෙන් එයින් බැහැර ව පිරිසිදු පෙදෙසකට පැමිණ එහි පරම සුඛයක් යම් සේ ලබා ද, මහරජ! එපරිද්දෙන් ම මනා කොට පිළිපන් තැනැත්තේ යෝනිසෝමනස්කාරයෙන් කෙලෙස් මඩින් තොර වූ පරම සුඛය වූ නිර්වාණය සාක්ෂාත් කරන්නේ ය. මහරජ! මේ උපමාවෙහි මඩගොහොරුව මෙන් ලාභ සත්කාර කීර්තීන් දත යුතු ය. මඩෙහි එරුණු පුරුෂයා මෙන් මනාකොට පිළිපන් තැනැත්තා දත යුතු ය. පිරිසිදු පෙදෙස මෙන් නිර්වාණය දත යුතු ය. ඒ නිවන මනා කොට පිළිපන් තැනැත්තේ කුමකැයි කියා සාක්ෂාත් කෙරේ ද යත්? ඒ යෝගාවචරයා සංස්කාරයන් ගේ පැවැත්ම සම්මර්ශනය කරයි. පැවැත්ම සිහි කරන්නා වූ ඔහු එහි ජාතිය දකී. ජරාව දකී. ව්‍යාධිය දකී. මරණය දකී. එහි කිසි සැපයක් නො දකී. මුල මැද අග යන තුනෙහි ම එහි කිසි ගතයුත්තක් නො දකී. මහරජ! දවස මුළුල්ලෙහි ම ගින්නෙන් තැවුණු ගිනියම් වූ ලොහොගුලියෙහි මුල මැද අග යන තුන් තැනෙහි ම ඇල්ලිය හැකි තැනක් නො දකී ද, මහරජ! එපරිද්දෙන් ම සංස්කාරයන් ගේ පැවැත්ම සම්මර්ශනය කරන තැනැත්තේ එහි ජාතිය දකී. ජරාව දකී. ව්‍යාධිය දකී, මරණය දකී. එහි කිසි සුවයක් හොඳක් නො දකී. මුල මැද අග යන තුනෙහි කිසි ගත යුත්තක් නො දකී. ගත යුත්තක් නො දක්නා වූ ඔහු ගේ සිත්හි නො සතුටක් ඇති වේ. ශරීරයෙහි දහයක් ඇති වේ. කිසි පිහිටක් නො දක්නා වූ ඔහු භවය ගැන කල කිරෙයි.

මහරජ! යම් සේ මහ ගිනි ගොඩකට පිවිසි තැනැත්තා එහි අසරණ වූයේ ගින්න ගැන කලකිරේ ද, එපරිද්දෙන් සංස්කාරයන්හි ගතයුත්තක් නො දක්නා වූ ඔහුගේ සිත්හි නො සතුටක් පහළ වේ. කයෙහි දහයක් ඇති වේ. කිසි පිහිටක් නො දක්නා වූ ඔහු භවයෙහි කලකිරෙයි. පැවැත්මෙහි භය දක්නා වූ ඔහුට මේ විද්‍යමාන වූ සංසාර ප්‍රවෘත්තිය ගිනිගෙන ඇතියක. බොහෝ දුක් ඇතියක. බොහෝ සිත්තැවුල් ඇතියක. ඉදින් යම්කිසිවෙක් සංස්කාරයන් ගේ නො පැවැත්මක් ලබානම් ඒ සර්වාසංස්කාරයන් ගේ සන්සිඳීම වූ සකලෝපධීන්ගෙන් මිදීම වූ තෘෂ්ණාක්ෂයය වූ විරාගය වූ නිරෝධය වූ නිර්වාණය ශාන්තය ප්‍රණීතය යන අදහස ඇති වන්නේය. ඔහු ගේ සිත සංස්කාරයන් නො පැවැත්ම වූ නිවනට පැන වදින්නේ ය.

Non-commercial distribution

මාහට පිහිටක් ලැබුණේය යි ඔහු ගේ සිත සතුටු වන්නේ ය. ඔහු ගේ සිත පැහැදෙන්නේ ය.

මහරජ! යම්සේ විදේශයකට පැමිණ, යාමට මගක් නැතිව දුකට පත්ව ඉන්නා තැනැත්තෙක් එයින් මිදී යාමේ මගක් දැක ඒ මගට බසී ද, මෙය මිදීමේ මග ය යි ඔහු ගේ සිත සතුටු වේ ද, මහරජ! එපරිද්දෙන් ම සංසාර ප්‍රවෘත්තියෙහි භය දක්නා වූ තැනැත්තා ගේ සිත සංස්කාරයන් ගේ අප්‍රවෘත්තියට පැන වදින්නේ ය. පිහිටක් ලැබුණේය යි ඔහුගේ සිත සතුටු වන්නේ ය. පහදින්නේ ය. ඔහු නිර්වාණ මාර්ගය සොයයි. නිවන් ලබනු පිණිස සිහියෙන් යුක්ත වෙයි. වීර්‍ය්‍යයෙන් යුක්ත වේයි. නිර්වාණය මෙනෙහි කරන්නා වූ ඔහු ගේ සිත සංස්කාර ප්‍රවෘත්තිය ඉක්මවා අප්‍රවෘත්තිය වූ නිවනට බැසගනී. මහරජ! සංස්කාරයන් ගේ අප්‍රවෘත්තිය වූ නිවනට සිතින් පැමිණෙන මනාකොට පිළිපන් තැනැත්තා නිර්වාණය සාක්ෂාත් කෙරේ යයි කියනු ලැබේ.

මිලිඳුරජ තෙමේ සාධුකාරදීමෙන් ආයුෂ්මත් නාගසේන ස්ථවිරයන් වහන්සේ ගේ දේශනය පිළි ගත්තේ ය.

## නිවන් දක්නා පුද්ගලයා

නිවන් පසක් කොට සිට පිරිනිවන් පානා පුද්ගලයා පිරිනිවීමෙන් පසු නැවත ච්‍යුතවීමක් නැතිව නිවනෙහි ම වෙසෙන්නේ ද? පිරිනිවීමෙන් පසු පුද්ගලයා නැත්තට ම නැති වන්නේ ද? යන මේ ප්‍රශ්නය ගැන බුද්ධ කාලයේ දී ම බොහෝ දෙනා කල්පනා කළහ. සාකච්ඡා කළහ. ඇතැම්හු ඒ ගැන බුදුන් වහන්සේ සමග ද සාකච්ඡා කළහ. මෙකල ද ඒ ගැන කල්පනා කරන්නෝ ඇතහ. කථා කරන්නෝ ඇතහ.

පුද්ගල ව්‍යවහාරය කරන්නේ රූප - වේදනා - සඤ්ඤා - සංඛාර - විඤ්ඤාණ යන මේවාට ය. රූපාදිය හැර පුද්ගලයෙක් පිරිනිවන් පෑමෙන් පෙරත් සත්‍ය වශයෙන් නැත්තේ ය. නැත්තා වූ පුද්ගලයා පිරිනිවීමෙන් පසු කොහි ගියේ දැ යි සොයන්නට යාම නිෂ්ඵල ක්‍රියාවෙකි. නිවන පිළිබඳ කථාවට නැත්තා වූ පුද්ගලයකු ඇද දමා ගෙන, සිතීමෙන් - කථා කිරීමෙන් වන්නේ කාරණය අවුල්

Non-commercial distribution

වීම පමණෙකි. එහෙත් ඒ ගැන සොයන්නවුන් ගේ ප්‍රයෝජනය පිණිස අග්ගිවච්ඡගොත්ත පිරිවැජියාත් බුදුන් වහන්සේත් අතර ඇති වූ සාකච්ඡාවක් මෙහි දක්වනු ලැබේ. ඒ සාකච්ඡාව **අග්ගිවච්ඡගොත්ත සුත්ත** යන නාමයෙන් මජ්ඣිම නිකායේ මජ්ඣිම පණ්ණාසකයේ දක්නා ලැබේ.

තථාගතයන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩවෙසෙන අවස්ථාවක අග්ගිවච්ඡගොත්ත පරිව්‍රාජකයා බුදුන් වහන්සේ වෙත එළඹ පිළිසඳර කථා කොට එකත්පසෙක හිඳ, පින්වත් ගෞතමයන් වහන්ස! නුඹ වහන්සේ "ආත්මය ශාශ්වතය - සැබෑව මෙයමය, අන්‍යදෘෂ්ටි බොරුය" යන මේ දෘෂ්ටිය ඇත්තාහු දැයි විචාළේ ය. වච්ඡය! "මම ඒ දෘෂ්ටිය ඇත්තේ නො වෙමි යි" තථාගතයන් වහන්සේ වදාළ සේක.

ඉක්බිති වච්ඡගොත්ත පිරිවැජියා ආත්මය අශාශ්වතය යන දෘෂ්ටිය ගැන ද, ආත්මය අන්තවත්ය යන දෘෂ්ටිය ගැන ද, ආත්මය අනන්තවත්ය යන දෘෂ්ටිය ගැන ද, ආත්මයත් ශරීරයත් එකය යන දෘෂ්ටිය ගැන ද, ආත්මය අනිකෙක, ශරීරය අනිකෙක යන දෘෂ්ටිය ගැනද, මරණින් මතු ද සත්ත්වයා ඇතය යන දෘෂ්ටිය ගැන ද, මරණින් මතු සත්ත්වයා නැතය යන දෘෂ්ටිය ගැන ද, මරණින් මතු සත්ත්වයා ඇත්තේ ද වේ ය, නැත්තේ ද වේ ය යන දෘෂ්ටිය ගැන ද, මරණින් මතු සත්ත්වයා නැත්තේ ද නැත, ඇත්තේ ද නැත යන දෘෂ්ටිය ගැන ද පිළිවෙළින් තථාගතයන් වහන්සේගෙන් ප්‍රශ්න කෙළේය. තථාගතයන් වහන්සේ ඒ එකම දෘෂ්ටියක් වත් තමන් වහන්සේට නැති බව වදාළ සේක.

එකල්හි වච්ඡගොත්ත "පින්වත් ගෞතමයන් වහන්ස! නුඹ වහන්සේ කිනම් වරදක් නිසා ඒ දෘෂ්ටීන්ගෙන් එකකුත් නො ගන්නා සේක් දැ"යි ඇසී ය.

එකල්හි තථාගතයන් වහන්සේ වදරන සේක් :- වච්ඡය, "ආත්මය ශාශ්වතය යන මෙය දෘෂ්ටියෙක. දෘෂ්ටි ගහනයෙක. දෘෂ්ටි කාන්තාරයෙක. දිට්ඨි විසූකයෙක. දිට්ඨිවිප්ඵන්දිතයෙක. දිට්ඨි සඤ්ඤෝජනයෙක. දුක් ඇතියෙක. පීඩා ඇතියෙක. උපායාස සහිතයෙක. දහ සහිතයෙක. සසර කලකිරීම පිණිස නො වන්නෙක.

Non-commercial distribution

සසරට නො ඇලීම පිණිස නො වන්නෙක. වෘත්තයාගේ නිරෝධය පිණිස නො පවත්නෙක. වෘත්තයාගේ සන්සිඳීම පිණිස නො පවත්නෙක. නිවන දැනගැනීම පිණිස නො පවත්නෙක. ක්ලේශ නිද්‍රාවෙන් පිබිදීම පිණිස නො පවත්නෙක. නිර්වාණය පිණිස නො පවත්නෙකැ''යි වදාළ සේක. ආත්මය අශාශ්වතය යනාදි දෘෂ්ටි ගැනත් එසේ ම වදාළ සේක.

එකල්හි වච්ඡගොත්ත පිරිවැජි තෙමේ පින්වත් ගෞතමයන් වහන්සේට යම්කිසි දෘෂ්ටිගතයක් ඇත්තේ දැයි විචාළේ ය. එකල්හි තථාගතයන් වහන්සේ "වච්ඡය! දෘෂ්ටිගතය යන මෙය තථාගතයන් වහන්සේ විසින් බැහැර කරන ලද්දක. මේ රූපය ය, මේ රූපයා ගේ උත්පත්ති හේතුව ය, මේ රූපයාගේ නිරෝධය ය, මේ වේදනාව ය, මේ වේදනාවගේ උත්පත්ති හේතුව ය, මේ වේදනාවගේ නිරෝධය ය, මේ සංඥාව ය, මේ සංඥාවගේ උත්පත්ති හේතුව ය, මේ සංඥාවගේ නිරෝධය ය, මේවා සංස්කාරයෝ ය, මේ සංස්කාරයන්ගේ උත්පත්ති හේතුව ය, මේ සංස්කාරයන්ගේ නිරෝධය ය, මේ විඥානය ය, මේ විඥානයාගේ උත්පත්ති හේතුව ය, මේ විඥානයාගේ නිරෝධය ය යන මෙය තථාගතයන් වහන්සේ විසින් දක්නා ලද්දේ ය. එබැවින් තථාගතයන් වහන්සේ සකල මඤ්ඤිතයන් සකල අහංකාරමමංකාර මානානුසයන් ක්ෂය වීමෙන් නිරුද්ධ වීමෙන් අත් හැරීමෙන් ඉවත් කිරීමෙන් උපාදනයන් කරණ කොට කිසි සංස්කාරයක් නො ගෙන සියල්ලෙන් මිදුණෝය" යි වදාළ සේක.

එකල්හි වච්ඡගොග්ත පිරිවැජි තෙමේ "පින්වත් ගෞතමයාණෙනි, එසේ සියල්ලෙන් මිදුණා වූ භික්ෂු තෙමේ මරණින් මතු කොහි උපදීදැ" යි විචාළේ ය. එකල්හි තථාගතයන් වහන්සේ "උපදීය යන මෙය ඒ විමුක්ත භික්ෂුව සඳහා නො යෙදෙන්නේය''යි වදාළ සේක. "පින්වත් ගෞතමයාණෙනි! එසේ නම් ඒ භික්ෂුව නූපදින්නේදැ''යි වච්ඡගොත්ත විචාළේ ය. "නූපදීය යන්නත් ඒ භික්ෂුව සඳහා නො යෙදෙන්නේය''යි වදාළ සේක. "එසේ නම් ගෞතමයාණෙනි! උපදින්නේත් නූපදින්නේත් වේ දැ''යි වච්ඡගොත්ත කීයේ ය. "ඒ භික්ෂුව සඳහා උපදින්නේත් නූපදින්නේත් වේ ය" යන කීමත් නො යෙදෙන්නේ

Non-commercial distribution

ය" යි තථාගතයන් වහන්සේ වදාළ සේක. එසේ නම් "පින්වත් ගෞතමයාණෙනි! ඒ භික්ෂුව නූපදින්නේත් නො වේ, උපදින්නේත් නො වේ දැ"යි විචාළේය. ඒ භික්ෂුව සඳහා "නූපදින්නේත් නො වේ ය, උපදින්නේත් නො වේ ය" යන්නත් නො යෙදෙන්නේ ය යි තථාගතයන් වහන්සේ වදාළ සේක.

එකල්හි වච්ඡගොත්ත පරිව්‍රාජක කියනුයේ "පින්වත් ගෞතමයන් වහන්ස! පළමු කථාව ඇසීමෙන් මාහට නුඹ වහන්සේ ගැන මඳ පැහැදීමක් ඇති වූයේ ය. විමුක්ති පුද්ගලයා ගැන කළ මේ කථාව ඇසීමෙන් මාගේ ඒ පැහැදීමත් නැති වී ගියේ ය" යි කීයේ ය.

එකල්හි තථාගතයන් වහන්සේ වදරන සේක්: "වච්ඡය! මාගේ මේ ධර්මය ගැඹුරු ය, දුර්දශය, දුරනුබෝධය, ශාන්තය, ප්‍රණීතය, අතර්කාවචරය, සූක්ෂ්මය, පණ්ඩිත වේදනීයය, අන්‍ය දෘෂ්ටියක් ඇත්තා වූ අන්‍ය ධර්මයක් පිළිගන්නා වූ, අන්‍ය ධර්මයක් කැමති වන්නා වූ, අන්‍ය ධර්මයක යෙදෙන්නා වූ, අන්‍යයකු ගුරු කොට ඇත්තා වූ තට මුළාවීමට මේ ධර්මය ප්‍රමාණවත් ය" යි වදරාඃ "වච්ඡය, මම නුඹෙන් ම ප්‍රශ්න කරමි. නුඹට වැටහෙන සැටියට ඒවාට පිළිතුරු දෙව. 'ඉදින් තාගේ ඉදිරියෙහි ගින්නක් ඇවිලේ නම්, මා ඉදිරියේ ගින්නක් ඇවිලේය' යි නුඹ දන්නෙහි දැ" යි ඇසූහ.

"පින්වත් ගෞතමයන් වහන්ස! ඉදින් මා ඉදිරියේ ගින්නක් ඇවිලේ නම්, මා ඉදිරියේ මේ ගින්න ඇවිලේ ය යි දනිමි" යි වච්ඡගොත්ත පිරිවැජි කීය.

"වච්ඡය! තා ඉදිරියේ ඇවිලෙන මේ ගින්න කුමක් නිසා කුමක් ඇසුරු කොට ඇවිලේ දැ යි ඇසුව හොත් එයට නුඹ කෙසේ පිළිතුරු දෙන්නෙහිද?"

"පින්වත් ගෞතමයන් වහන්ස! නුඹ ඉදිරියේ ඇවිලෙන මේ ගින්න කුමක් නිසා කුමක් ඇසුරු කොට දැල්වේදැ යි ඇසුව හොත් 'දර නිසා දර ඇසුරු කොට මේ ගින්න ඇවිලේය'යි කියමි."

"වච්ඡය! ඉදින් තා ඉදිරියේ ඇවිලෙන ගින්න නිවී ගිය හොත් එකල්හි 'මා ඉදිරියේ ඇවිලුණු ගින්න නිවී ගියේය'යි නුඹ දන්නෙහිද?"

Non-commercial distribution

“පින්වත් ගෞතමයන් වහන්ස! ඉදින් මා ඉදිරියේ ඇවිලුණු ගින්න නිවී ගියේ නම් ‘මා ඉදිරියේ ඇවිලුණු ගින්න නිවී ගියේය’යි මම දනිමි.”

“වච්ඡය ‘ඉදින් තා ඉදිරියේ ඇවිළී තිවුණා වූ ගින්න කොහි ගියේ ද? පෙර දිගට හෝ ගියේ ද? අවර දිගට හෝ ගියේ ද? උතුරට හෝ ගියේ ද? දකුණට හෝ ගියේදැ’යි විචාළ හොත් එකල්හි නුඹ කෙසේ පිළිතුරු දෙන්නෙහිද?”

“හිතවත් ගෞතමයන් වහන්ස! එසේ ඇසීම නුසුදුසු ය. පින්වත් ගෞතමයන් වහන්ස! දර නිසා ඇවිලුණු ඒ ගින්න තුබූ දර ඉවර වීමෙන් අලුත් දර නො ලැබීමෙන් ආහාරයක් නැතිව තිවුණේය’ යි ම කිය යුතු වන්නේ ය.”

එකල්හි තථාගතයන් වහන්සේ මෙසේ වදාළ සේක:- වච්ඡය! යම් රූපයක් කරණකොට ගෙන උස් තැනැත්තාය මිටි තැනැත්තාය කුඩා තැනැත්තාය මහත් තැනැත්තාය යනාදීන් සත්ත්වයකු ගැන කථා කෙරෙත් ද ඒ රූපය තථාගතයන් වහන්සේ විසින් ප්‍රහාණය කරන ලද්දේ ය. ඒ රූපයාගේ මුල් සිඳින ලද්දේ ය. ඒ රූපය අග සුන්කළ තල්ගසක් මෙන් කරන ලද්දේ ය. නැවත ඇති නො වන්නක් කරන ලද්දේ ය. මතු නූපදනා ස්වභාවයට පමුණුවන ලද්දේ ය.

වච්ඡය! එබැවින් තථාගත තෙමේ රූපය නිසා කරන ව්‍යවහාරයෙන් මිදුණේක. මහා සාගරය සේ ගැඹුරු වූවෙක. ප්‍රමාණ කිරීමට දුෂ්කර වූවෙක. බැස ගැනීමට දුෂ්කර වූවෙක. තථාගත තෙමේ මතු උපදී ය යි කීම ද නුසුදුසු ය. නූපදී ය යි කීම ද නුසුදුසු ය. උපදින්නේත් වේ ය, නූපදින්නේත් වේ ය යි කීමට ද නුසුදුසු ය. නූපදින්නේත් නැත, උපදින්නේත් නැත යයි කීමට ද නුසුදුසු ය.

යම් වේදනාවක් කරණ කොට ගෙන සැප විඳින තැනැත්තාය දුක් විඳින තැනැත්තාය කියා සත්ත්ව ව්‍යවහාරය කරනු ලැබේ ද, ඒ වේදනාව තථාගතයන් වහන්සේ විසින් ප්‍රහාණය කරන ලද්දේ ය.

Non-commercial distribution

යම් සංඥවක් කරණ කොට ගෙන සිංහල දත් තැනැත්තාය, දෙමළ දත් තැනැත්තාය, වෙදකම් දත් තැනැත්තාය, නැකැත් දත් තැනැත්තාය යනාදීන් සත්ත්ව ව්‍යවහාරය කෙරේද: ඒ සංඥව තථාගතයන් වහන්සේ විසින් ප්‍රහාණය කරන ලද්දේ ය.

යම් සංස්කාරයක් නිසා ලෝභියාය, නපුරාය, ඊර්ෂ්‍යා කාරයාය, කරුණාවන්තයාය, දෙන තැනැත්තාය, මරන තැනැත්තාය යනාදීන් සත්ත්ව ව්‍යවහාරය කෙරේද: ඒ සංස්කාරයෝ තථාගතයන් වහන්සේ විසින් ප්‍රහාණය කරන ලද්දෝ ය.

යම් විඤ්ඤාණයක් කරණ කොට ගෙන බලන තැනැත්තාය, අසන තැනැත්තාය යනාදීන් සත්ත්ව ව්‍යවහාරය කෙරේද: ඒ විඤ්ඤාණය තථාගතයන් වහන්සේ විසින් ප්‍රහාණය කරන ලද්දේ ය. වච්ඡය! ඒ නිසා තථාගත තෙමේ වේදනාදිය නිසා කරන සත්ත්ව ව්‍යවහාරයෙන් මිදුනෙක. මහා සාගරය සේ ගැඹුරු වූවෙක. ප්‍රමාණ නො කළ හැකි වූවෙක. බැස ගැනීමට දුෂ්කර වූවෙක. එබැවින් තථාගත තෙමේ මතු උපදීය යි කීම ද නුසුදුසු ය. නූපදීය යි කීම ද නුසුදුසු ය. උපදින්නේත් නූපදින්නේත් වේය යි කීම ද නුසුදුසු ය. උපදින්නේත් නැත, නූපදින්නේත් නැතය යි කීම ද නුසුදුසු ය.

බුදුන් වහන්සේ විසින් මෙසේ වදාළ කල්හි වච්ඡගොත්ත පිරිවැජි තෙමේ පැහැදී: පින්වත් ගෞතමයන් වහන්ස! නුඹ වහන්සේ ගේ ධර්මය අතුපතර නැති ව, පොතු නැති ව, එලය නැති ව, ශුද්ධ සාරයෙහි ම පිහිටියක. පින්වත් ගෞතමයන් වහන්ස! නුඹ වහන්සේ ගේ ධර්මය ඉතා හොඳ ය. ඉතා හොඳ ය. "අද පටන් මා නුඹ වහන්සේ සරණගිය උපාසකයෙකැ යි දැන ගනු මැනැව " යි සැල කෙළේ ය.

## දුඃඛස්කන්ධයෙන් මිදීමේ ප්‍රතිපත්ති ක්‍රමය

**"අවිජ්ජායත්වේව අසේසවිරාගනිරෝධා සංඛාර නිරොධෝ"** යනාදි ප්‍රතිලෝම ප්‍රතීත්‍ය සමුත්පාද දේශනාවෙහි දැක්වෙන නිරෝධයන් අතුරෙන් අවිද්‍යා නිරෝධය ම ප්‍රධාන බව, සංස්කාර විඥානාදි අන්‍ය ප්‍රතීත්‍යසමුත්පාදංගයන්ගේ නිරෝධය අවිද්‍යා

Non-commercial distribution

නිරෝධය අනුව සිදුවන බව ඉහත දක්වා ඇත. අවිද්‍යා නිරෝධයෙන් ම සංස්කාරාදීන්ගේ නිරෝධය සිද්ධවන බැවින් ඒවායේ නිරෝධය සඳහා අමුතුවෙන් කළ යුත්තක් නැත. දුඃඛස්කන්ධයෙන් මිදෙනු කැමැතියකු විසින් ඒ සඳහා කළ යුතු එකම දෙය අවිද්‍යාව නැතිකර ගැනීමම ය. අවිද්‍යාව නැති කිරීම සඳහා කළයුතු යමක් වේ නම් ඒ දෙය කිරීම ය.

යම් කිසිවක් නැති කළ හැක්කේ ඒ දෙය නසන ඒ දෙයට විරුද්ධ දෙය ඇති කිරීමෙනි. අඳුරට විරුද්ධ අඳුර නැති කරන එකම දෙය ආලෝකය ය. ආලෝකය ඇති කිරීමෙන් මිස අන් කිසිම ක්‍රමයකින් අඳුර නැති කළ නො හැකි ය. එමෙන් අවිද්‍යාවට විරුද්ධ අවිද්‍යාව නැති කරන එකම දෙය විද්‍යාව ය. විද්‍යාව තමාගේ සන්තානයෙහි ඇති කිරීමෙන් මිස අන් කිසිම ක්‍රමයකින් අවිද්‍යාව නැති නො කළහැකි ය. දන් දීමෙන් හෝ සිල් රැකීමෙන් හෝ විද්‍යාව උපදවන භාවනා හැර, අනික් භාවනාවලින් හෝ අවිද්‍යාව නැති කළ නො හැකි ය.

**විද්‍යාව යනු ඥානය ය**. දුඃඛ සත්‍ය ප්‍රතිච්ඡාදක අවිද්‍යාවය, සමුදය සත්‍ය ප්‍රතිච්ඡාදක අවිද්‍යාවය, නිරෝධ සත්‍ය ප්‍රතිච්ඡාදක අවිද්‍යාවය, මාර්ග සත්‍ය ප්‍රතිච්ඡාදක අවිද්‍යාවය කියා අවිද්‍යා සතරක් ඇති බව ඉහත අනුලෝම ප්‍රතීත්‍යසමුත්පාද විස්තරයේ දක්වා ඇත. **"දුක්ඛෙ ඤාණං, දුක්ඛ සමුදයෙ ඤාණං, දුක්ඛ නිරොධෙ ඤාණං, දුක්ඛ නිරොධගාමිනියා පටිපදය ඤාණං, අයං වුච්චති භික්ඛවේ! විජ්ජා"** යන දේශනාවෙන් දැක්වෙන පරිදි දුඃඛ සත්‍යය දක්නා විද්‍යාවය, සමුදය සත්‍යය දක්නා විද්‍යාවය, නිරෝධ සත්‍යය දක්නා විද්‍යාවය, මාර්ග සත්‍යය දක්නා විද්‍යාවය යි විද්‍යා සතරක් ද ඇත්තේ ය.

දුඃඛ සත්‍ය ප්‍රතිච්ඡාදක අවිද්‍යාව නසන එකම දෙය දුඃඛ සත්‍යය දක්නා විද්‍යාවම ය. සමුදය සත්‍ය ප්‍රතිච්ඡාදක අවිද්‍යාව නසන එකම දෙය සමුදය සත්‍යය දක්නා විද්‍යාව ය, නිරෝධ සත්‍ය ප්‍රතිච්ඡාදක අවිද්‍යාව නසන එකම දෙය නිරෝධ සත්‍යය දක්නා විද්‍යාව ය. මාර්ග සත්‍ය ප්‍රතිච්ඡාදක අවිද්‍යාව නසන එකම දෙය මාර්ග සත්‍යය දක්නා විද්‍යාව ය.

Non-commercial distribution

සංසාර දුඃඛය නිවාගනු කැමති සංසාර දුඃඛයෙන් එතරවනු කැමති තැනැත්තා විසින් ඒ සඳහා කළයුතු දෙය නම් සතර වැදෑරුම් වූ විද්‍යාව සම්පාදනය කිරීම ය. විද්‍යා සතරෙන් ද ප්‍රධාන, දුඃඛ සත්‍යය දක්නා විද්‍යාව ය. එය සම්පාදනය කර ගත හොත් ඉතිරි ආර්‍ය්‍යසත්‍ය තුන පිළිබඳ විද්‍යා තුන ඉබේම වාගේ ලෙහෙසියෙන් ම ඇති වන්නේ ය.

ආර්‍ය්‍යසත්‍යඥාන සංඛ්‍යාත ආර්‍ය්‍ය විද්‍යාව ඇති කර ගත හැක්කේ දහම් ඇසීමෙන් හා දහම් පොත් කියැවීමෙන් ද ගුරුන් වෙතින් බුදුදහම උගෙනීමෙන් ද ආර්‍ය්‍ය සත්‍යයන් පිළිබඳ සාමාන්‍ය ඥානය ඇති කර ගෙන පසුව විදර්ශනා භාවනාවෙහි යෙදීම් වශයෙන් ඒ ඥානය දියුණු කිරීමෙනි. ආර්‍ය්‍ය විද්‍යාව පිළිබඳ අවබෝධයක් ඇති කර ගනු කැමතියන් ගේ ප්‍රයෝජනය පිණිස මෙහි චතුරාර්‍ය්‍ය සත්‍යය විස්තර කළ යුතු ය. එහෙත් ඒ ආර්‍ය්‍ය සත්‍ය විස්තරය අප විසින් කලින් සම්පාදනය කර ඇති **"චතුරාර්‍ය්‍ය සත්‍යය"** නමැති පොතෙහි ඇති බැවින් මෙහිදී ආර්‍ය්‍ය සත්‍යයන් පිළිබඳ කෙටි හැඳින්වීමක් පමණක් කරනු ලැබේ.

**සැබෑ දුකය. දුක් ඇතිවීමේ සැබෑ හේතුව ය. සැබෑ සැපය ය. සැපයට පැමිණීමේ සැබෑ මාර්ගය ය යන මේ කරුණු සතර බුදු සමයේ උගන්වන චතුරාර්‍ය්‍ය සත්‍යය ය.**

චතුරාර්‍ය්‍ය සත්‍යය ගැන සොයන තැනැත්තකු විසින් පළමු කොට සැපදුක් දෙක ගැන කල්පනා කළ යුතු ය. එය සත්‍ය සතර පහසුවෙන් කොටින් තේරුම් ගැනීමේ ක්‍රම ය. සැප වශයෙන් සලකන යමක් කිසි කලෙක වෙනසකට නො පැමිණ, සැම කල්හි ම සැපයක් වශයෙන් ම පවතී නම්, සැබෑ සැපය සැටියට සැලකිය යුත්තේ ඒ සැපය ය. යම් කිසිවක් මඳ කලක් පැවතී නැවතී යේ නම් එය සැපවත් වුවත් සැබෑ සැපයක් සැටියට නො සැලකිය හැකිය. එබඳු සැප අනුන්ගෙන් තාවකාලික වශයෙන් ගත් දෙයක් වැනි ය. මායාවක් බඳු ය.

තාවකාලික වශයෙන් අනුන්ගෙන් ගත් දෙයින් කෙනෙක් ධනවතකු සැටියට නො කියනු ලැබේ. මක්නිසා ද? අනුන්ගෙන් ගත් දෙය අයිතිකරුට ආපසු දෙන්නට සිදු වී, නැවත නිර්ධනයකු

Non-commercial distribution

වන බැවිනි. එමෙන් මඳ කලක් පවත්නා සැපයක් ලැබීමෙන් කෙනෙක් සැපවතෙක් නො වේ. මක්නිසා ද? එය මඳ කලකින් ඔහුට අහිමි වන බැවිනි. එබැවින් මඳ කලක් පැවතී නැති වන, පුද්ගලයා සැබෑ සැපවතකු නො කරන, පුද්ගලයා සැපවතෙක් වී යයි කීමට තරම් නො වන සැප එකක්වත්, සැබෑ සැප නො වන බව දත යුතු ය.

කවර සැපයක් වුවත් නැති වේ නම් සැපයේ ඒ නැතිවීම දුකෙකි. සැපයම දුකට පෙරළීමකි. තාවකාලික වූ සෑම සැපයක් ම නැතිවීම් වශයෙන් දුකට පෙරළෙන බැවින් ඒ තාවකාලික සැප එකකුදු සැබෑ සැප නො වේ. සැප ය යි සලකන දෙයක මුල මැද අග යන තුනෙන් කොතැනකට වුව ද දුක මිශ්‍ර වී ඇති නම් ඒ දෙය ද සැබෑ සැපයක් නො වේ. මුල මැද අග යන තුන් තැන ම දුක මිශ්‍ර වී ඇති සැපය ගැන කියනුම කිම?

මේ මිනිස් ලොව මිනිසකු වී ජීවත්වීම සැපයක් වශයෙන් සලකන දෙයකි. සිටුවරයකුව - රජකුව ජීවත් වීම මහ සැපයක් හැටියට සලකනු ලැබේ. මහ සැපයක් කොට සලකන සිටු සැපත - රජ සැපත සැබෑ සැපයක් දැ යි සිතා බලන්න. එය සැබෑ සැපයක් වන්නට නම්, සැම කල්හි ම එසේ ම තිබිය යුතු ය. එය සැම කල්හි ම පවත්නක් නො වේ. මඳ කලකින් මරණයට පැමිණීමෙන් සිටු කමත් රජ කමත් කෙළවර වන්නේ ය. මරණින් පසු සිටුකමත් රජකමත් ඔහුට නැත. එසේ නැතිවන්නා වූ සැපය සිහිනයක් බඳුය. අනුන්ගෙන් මඳ වේලාවකට ඉල්ලා ගත් දෙයක් බඳුය. ණයට ගත් දෙයක් බඳුය. එබැවින් සිටුකම හෝ රජකම සැබෑ සැපයක් නො වේ.

මිනිස් සැපයට වඩා උසස් කොට සලකන දෙව් සැපයත් ඒ දෙකට ම වඩා උසස් කොට සලකන බඹ සැපයත් කියන ලද සිටු සැපය රජ සැපය සේ ම මරණින් කෙළවර වෙන ඒවා ය. එබැවින් දෙව් සැපයත් සැබෑ සැපයක් නොවේ. බඹ සැපයත් සැබෑ සැපයක් නො වේ. සිටුවරයාත් රජුත් දෙවියාත් බ්‍රහ්මයාත් ඒ තත්ත්ව වලින් පහවීමෙන් පසු, බලු පැටවකුදු විය

Non-commercial distribution

හැකි ය. බළල් පැටවකුදු විය හැකි ය. වඳුරු පැටවකුදු විය හැකි ය. ඌරු පැටවකුදු විය හැකි ය. කුකුළු පැටවකුදු විය හැකි ය. මැඩි පැටවකුදු විය හැකි ය. මහා ප්‍රේතයකුදු විය හැකි ය. මහා නරකයක නිරිසතකුදු විය හැකි ය. සිටුවරයාත් රජුත් දෙවියාත් බ්‍රහ්මයාත් බලු පැටවකු වූකල්හි අනික් බලු පැටවුන් සේ ම එකෙකි. සිටුකමවත් රජකමවත් ඒ බලුපැටවාට ගැළපීලාවත් නැත. සිටුකම හෝ රජකම සත්ත්වයා සැබැවට ම සැපවත් කරන්නක් නම් එය සැම කල්හිම තිබිය යුතු ය. සැම කල්හි සත්ත්වයා සැපවත් කරන්නක් නො වන බැවින් ඒ සිටුකමත් රජකමත් සැබෑ සැප නො වේ.

මේ මිනිස් ලොව මිනිසකු උපදින්නේ දුකිනි. උපන්දා පටන් මේ මිනිස් කය නිතරම මැරෙන්න හදන එකකි. මැරෙන්න යන එකකි. නොමැරී පැවැත්වීමට නම් ආහාර පාන වස්ත්‍රාදි ප්‍රත්‍යයෙන් එය නිතර ම ආරක්‍ෂා කළ යුතු ය. ආරක්‍ෂා නො කළ හැකි වූ දිනයේ දී එය මැරෙන්නේ ය. නිරන්තරයෙන් ආහාර පානාදි ප්‍රත්‍යය සපයමින් ආරක්‍ෂා කරන්නට වීමත් මහ දුකෙකි. ආරක්‍ෂා කරන්නට බැරිවී මරණයට පත්වීමත් දුකෙකි. එසේ බලන කල්හි මේ පඤ්චස්කන්ධය මුල මැද අග යන සැම තැනම දුකින් මිශ්‍ර දෙයකි. එබැවින් සැබෑ සැපයක් නො වේ.මනුෂ්‍ය දේව බ්‍රහ්ම යන කාහටත් අයත් වූ මේ පඤ්චස්කන්ධය රාග ද්වේෂ මෝහ සංඛ්‍යාත කෙලෙස් ගිනිවලින් ද ජාති - ජරා - මරණ - ශෝක - පරිදේව - දුඃඛ - දෞර්මනස්‍ය - උපායාස සංඛ්‍යාත දුක් ගිනිවලින් ද දැවෙමින් ඇතියකි. ගිනි මැද ගිනිවලින් වෙළී පවත්නා බැවින් මේ පඤ්චස්කන්ධය සැබෑ ම දුකෙකි. සැබෑ දුක පඤ්චස්කන්ධය ම ය.

අවිද්‍යා සංස්කාරාදි දුඃඛස්කන්ධයා ගේ නිරෝධය වූ ශාන්ත ස්වභාවය කොතැනකවත් දුක් මිශ්‍ර වී නැති බැවිනුත් කවර කලෙකවත් නැති නො වන බැවිනුත් එය පසක් කර ගත් තැනැත්තා නැවත කිසි කලෙක දුඃඛිතයකු නො වන බැවිනුත් සැබෑ සැපය ය.

දුක් ඇතිවීමේ සැබෑ හේතුව තණ්හාව ය. තණ්හාවය කියනුයේ ඕනෑ කම ය. මේ සත්ත්වයනට තම තමන්ගේ

Non-commercial distribution

පඤ්චස්කන්ධය පවත්වා ගැනීමේ මහත් වූ ඕනෑ කමක් ඇත්තේ ය. ජීවත්වීමේ ආශාවය යි කියනුයේ ද ඒ ඕනෑ කමට හෙවත් තණ්හාවටම ය. සත්ත්වයනට ඇත්තා වූ තණ්හාවලින් සියල්ලට ම ප්‍රධාන වූ ද, සියල්ලට ම බලවත් වූ ද, කවදාවත් නො පිරෙන්නා වූ ද තණ්හාව එය ය. පඤ්චස්කන්ධය නැතිවන්නට යනවා නම් හෙවත් මැරෙන්නට යනවා නම් සත්ත්වයනට මහා භයක් ඇති වන්නේ ඒ තණ්හාව නිසා ය. මැරෙන්න යනවාය කියා හෝ මරණවාය කියා හෝ කියනවා නම් එයින් ඇතිවන්නා වූ භය තරම් මහත් භයක් අන් කුමකින් වත් සත්ත්වයනට ඇති නො වේ. එය ඉතාම මහත් වන්නේ ජීවත්වීම පිළිබඳ වූ තණ්හාව ඉතා බලවත් නිසා ය.

සත්ත්වයා උපන්දා පටන් ම මැරෙන්න යන්නේ ය. එය පඤ්චස්කන්ධයේ ස්වභාවය ය. ජීවත්වීමේ ආශාව වූ මහා තණ්හාවත් ඒ පඤ්චස්කන්ධයට ම අයත් ව පඤ්චස්කන්ධයේ ම එක් කොටසක් ව පඤ්චස්කන්ධය හා බැඳී පවත්නා බැවින් ඒ තණ්හාව මැරෙන්න යන පඤ්චස්කන්ධයට මැරෙන්නට නො දෙයි. ආහාර පානාදි ප්‍රත්‍යයන් ළහා කර දෙමින් පඤ්චස්කන්ධයට නැතිවන්නට මැරෙන්නට නො දී පඤ්චස්කන්ධය පවත්වයි. ජීවත්වීමට නිතරම උත්සාහ කරයි. එයින් අලුත් අලුත් වෙමින් පඤ්චස්කන්ධය නො සිඳී පවතී. මැරෙන්නේ ද ජීවත් වීමේ ඕනෑකම ජීවත් වීමේ උත්සාහය තිබියදී ය. එබැවින් සත්ත්වයා මළත් ඉවරයක් වන සැටියට නො මැරෙයි. මැරෙනු සමගම අලුත් පඤ්චස්කන්ධයක් ඇති වෙයි. අලුත් පඤ්චස්කන්ධයක් ඇතිවීමය කියන්නේ නැවත ඉපදීම ය.

කොතෙක් කල් ජීවත් වුවත් ජීවත්වීම ඇති වී ඒ තණ්හාව පිරෙන්නේ නො වේ. අද එක් එක් සත්ත්වයකුට ඒ ජීවත්වීමේ ආශාව යම් පමණකට ඇත්තේ ද කල්ප ලක්‍ෂයක් ඉදිරියට ගිය තැනදීත් ඔහුට ඒ ආශාව අද මෙන් ම ඇත්තේ ය. කල්ප කෝටියක් ගතවූ පසුත් අද මෙන් ම වෙනසක් නැතුව ඒ තණ්හාව ඇත්තේ ය. ජීවත්වීම ඇති වී තණ්හාව සම්පූර්ණවීමක් කවර කලෙක වත් නො වන්නේ ය. තණ්හාව ඇති තාක් පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුක්ඛය පවත්වා ගැනීමට උත්සාහ කරයි. ඒ නිසා ඒ පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුඃඛය නො සිඳී නැවත නැවතත් ඇති වේ.

Non-commercial distribution

පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුඃඛය ඉවර වන්නේ නැවත නැවත ඇති නො වන්නේ එය නැවත නැවත ඇති කරන පවත්වන තණ්හාව නැති වුවහොත් ය. තණ්හාව ඇති තාක් දුඃඛස්කන්ධය නැවත නැවත ඇතිවන බැවින් දුඃඛස්කන්ධය ඇති වීමේ සැබෑ හේතුව තණ්හාව බව බුදුන් වහන්සේ වදාළ සේක.

අතීතයෙහි බොහෝ බුදුවරයෝ ඇති වූහ. එබැවින් දනට ඉන්නා එක් එක් සත්ත්වයකුට අතීතයේ බොහෝ බුදුවරයන් මුණ ගැසෙන්නට ඇතුවාට සැකයක් නැත. බොහෝ බුදුවරයන් ගෙන් බණ අසන්නට ලැබෙන්න ඇතුවාට සැකයක් නැත. බොහෝ බුද්ධ ශ්‍රාවකයන් මුණ ගැසෙන්නට ඇතුවාට සැකයක් නැත. බොහෝ බුද්ධ ශ්‍රාවකයන් ගෙන් බණ අසන්න ලැබෙන්නට ඇතුවාටත් සැකයක් නැත. සත්පුරුෂයන් සේවනය කරන්නට ලැබීමෙන් සද්ධර්මය අසන්නට ලැබීමෙන් දුකින් මිදීමේ කැමැත්ත ඇති වී ඒ සඳහා අතීතයේ නොයෙක් වාරවල ප්‍රතිපත්ති පුරන්න පටන්ගන්න ඇතිවාට ද සැකයක් නැත. එහෙත් බොහෝ සත්ත්වයෝ තවමත් සසරම ය. කොතෙක් වර ආරම්භ කළත් සම්පූර්ණ වන තෙක් දුකින් මිදීමේ ප්‍රතිපත්තිය පුරන්නට ඔවුනට ඉඩක් ලැබී නැත. ඉඩ ලැබී නැත්තේ තණ්හාව එයට බාධා කළ නිසා ය.

දුකින් මිදීමේ ප්‍රතිපත්තිය පිරීමට සිත යොමු කළ ගිහියා "තවම ඕවා කරන්නට ඉඩක් නැත, කුමක් කරන්නටත් ජීවත් වන්නට ඕනෑය, ඒ නිසා රස්සාව නො කර බැරිය, ගේදොර රැක බලා ගන්නේ නැතිව බැරිය, දූ දරුවන් ගේ වැඩ ඉවර නැත, විකල් බොජුනෙන් වැළකී විසීමට තරම් සනීපයක් ශක්තියක් නැත, භාවනාවෙහි යෙදෙන්නට සනීපයක් නැත, ශක්තියක් නැත" යනාදිය සිතමින් කියමින් පසු බසී. ප්‍රතිපත්තියට නො බසී. ප්‍රතිපත්තියට බට තැනැත්තා ද "අසවල් වැඩේ කරන්නට තිබෙනවාය අසවල් වැඩේ කරන්නට තිබෙනවාය මෙලොව ඉන්නාතාක් ඒ වැඩත් නො කර බැරිය" කියා දුකින් මිදීමේ ප්‍රතිපත්තිය අත පසු කරයි. තණ්හාව විසින් යොදවන වැඩ කරයි.

පැවිද්ද ද "දයකයන් ගේ වැඩ තිබෙනවාය, ගෝලබාලයන් ගේ වැඩ තිබෙනවාය, ලෙඩට ප්‍රතිකාර ගන්නට තිබෙනවාය,

Non-commercial distribution

විහාර සාද ගන්න චෛත්‍යය සාද ගන්න ආවාසය සාද ගන්න තිබෙනවාය'' කියා දුකින් මිදීමේ ප්‍රතිපත්තියට නො බසී. බටුයේ ද ඉහත කී කරුණු ඉදිරිපත් කරගෙන සම්පූර්ණ වන පරිදි ඒ ප්‍රතිපත්තිය නුපුරයි. ඒ බාධා සියල්ලම කෙරෙන්නේ තණ්හාවෙනි. තණ්හාව ප්‍රතිපත්තියට බැසගන්නට නො දී නවත්වයි. බට තැනැත්තා ප්‍රතිපත්තියෙන් පහකර දමයි. දුකින් මිදීමේ ප්‍රතිපත්තියට බැසීම වළක්වන නිසා ද, බැසගත් තැනැත්තා එයින් පහකර දමන නිසාද තණ්හාව ම දුක් ඇති කිරීමේ දුක පැවැත් වීමේ සැබෑ හේතුව බව දත යුතු ය.

සැබෑ සැපයට පැමිණීම, දුක් නැවත නැවත උපදවන තණ්හාව නැති වීමෙන් ම සිදු වන්නකි. එබැවින් යමක් කිරීමෙන් තණ්හාව නැති වේ නම් ඒ දෙය කිරීම සැපයට පැමිණීමේ සැබෑ මාර්ගය ය. සමහරු 'දීම තණ්හාව නැති කිරීමේ උපාය' සැටියට සලකති. එහි ද එක්තරා සත්‍යයක් තිබේ. දුන් වස්තුව පිළිබඳ වූ තණ්හාව එයින් නැති වේ. එහෙත් නැවත රැස් කිරීමේ තණ්හාව එයින් නැති නො වේ. සමහර විට වස්තු රැස් කිරීමේ තණ්හාව දීමෙන් තවත් වැඩි වේ. දෙන තැනැත්තේ තමා ගේ පරිභෝගයටත් දීමටත් දෙකටම වඩ වඩා වස්තු සොයන බව පෙනේ. එයින් කිය යුත්තේ දීමෙන් ඒ තැනැත්තාගේ තණ්හාව තවත් වැඩි වූ බව ය.

දීමෙන් තණ්හාව අඩු වුවත් ඒ වස්තු තණ්හාව අඩු වීමෙන් හෝ නැති වීමෙන් හෝ නිවනට පැමිණෙන්නේ නො වේ. නැවත නැවත පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුඃඛය ඇති කරන්නේ ආත්ම වශයෙන් සලකන පඤ්චස්කන්ධය පිළිබඳ වූ තණ්හාව ය, බාහිර වස්තු දන් දීමෙන් පඤ්චස්කන්ධය පිළිබඳ තණ්හාව නැති වන්නේ නො වේ. සැබෑ සැපය වූ නිවනට පැමිණීමේ මාර්ගය වන්නේ පඤ්චස්කන්ධය පිළිබඳ වූ තණ්හාව නැති කිරීමේ ප්‍රතිපත්තිය ය.

ඇත්ත වශයෙන් කියත හොත් මේ පඤ්චස්කන්ධය ඇලුම් කළ යුත්තක් නොව බිය විය යුත්තකි. දුක්ය කියා යමක් ඇති නම් ඒ සියල්ල ම ඇති වන්නේ මේ පඤ්චස්කන්ධයෙහි ය. බියවිය යුතු පඤ්චස්කන්ධය ගැන තණ්හාවක් ඇති වන්නේ

Non-commercial distribution

එහි සැබෑ තත්ත්වය නො වැටහීම නිසා ය, පඤ්චස්කන්ධයේ සැබෑ තත්ත්වය හරියට පෙනුන හොත් එය එකෙණෙහි ම එපා වේ. තණ්හාව නිරුද්ධ වේ. මතු ඇති නො වේ.

එක්තරා පුරුෂයකුට ලස්සන තරුණ බිරියක් සිටී. ඈ ප්‍රිය කථාවෙන් ද වැළඳ ගැනීම් ආදියෙන් ද නිතර ඒ පුරුෂයා සන්තෝෂ කරවන්නී ය. එහෙත් ඈ ඒ පුරුෂයා ගේ සැතිරියකි. ඈ අන් හිමියකු පතමින් ඉඩක් ලද විටෙක මේ පුරුෂයා මරා දමා ඔහුගේ ධනය හිමි කර ගන්නා බලාපොරොත්තුවෙන් හිමියා සතුටු කරවන තැනැත්තියකි. ඒ බව නො දත් පුරුෂයා ඒ ස්ත්‍රියට තදින් ඇලුම් කරයි. ඇය කියන සෑම දෙයක් ම කෙසේ හෝ සපයා දෙයි. දසයකු සේ ඇගේ මෙහෙවර කරයි. මහත් ආදරයෙන් පෝෂණය කරන ඒ ස්ත්‍රිය ගේ සැබෑ තත්ත්වය යම් කිසි දිනක ඒ පුරුෂයා තේරුම් ගත හොත් එද ඒ ස්ත්‍රිය ගැන තුබූ ආදරය කෙළවර වෙයි. එතැන් පටන් පුරුෂයා සොයන්නේ ඒ ස්ත්‍රිය හැර දැමීමට ඒ ස්ත්‍රිය ගෙන් වෙන් වීමට මගකි.

තමා මරා දැමීමට අවස්ථාවක් සොයමින් උපායක් සොයමින් සිටින බිරියට ඇගේ සැබෑ තත්ත්වය නො දන්නා නිසා ඇලුම් කරන සැමියා මෙන්, මේ සත්ත්වයෝ සැබෑ තත්ත්වය නො දන්නා නිසා වධක පඤ්චස්කන්ධය උසස් කොට සලකා එයට ඇලුම් කරමින් එය පවත්වා ගැනීමට සෑම උත්සාහයක් කරමින් හැසිරෙති. සතුරු බිරියගේ සැබෑ තත්ත්වය තේරුම් ගත් කල්හි ඒ ස්ත්‍රිය ගැන පුරුෂයා ගේ තුබූ මෝඩ ආලය සම්පූර්ණයෙන් ම නැති වන්නාක් මෙන් පඤ්චස්කන්ධයේ සැබෑ තත්ත්වය දුටු කල්හි එය කෙරෙහි පවත්නා තෘෂ්ණාව නිරුද්ධ වේ.

තණ්හාව නැති කිරීම හැර මේ පඤ්චස්කන්ධ සංඛ්‍යාත දුඃඛයෙන් මිදී සැබෑ සැපයට පැමිණීමේ අන් ක්‍රමයක් නැත්තේ ය. එබැවින් තණ්හාව නැති කිරීමේ ප්‍රතිපත්තිය ම සැපයට පැමිණීමේ සැබෑ මාර්ගය ය යි කියනු ලැබේ. ප්‍රතීත්‍යසමුත්පාද දේශනය අනුව කථාකරන කල්හි අවිද්‍යාව නැති කිරීම සඳහා පිරිය යුතු ප්‍රතිපත්තිය සැපයට පැමිණීමේ සැබෑ මාර්ගය සැටියටත්, ආර්‍යසත්‍ය

Non-commercial distribution

දේශනය අනුව කථා කරන කල්හි තණ්හාව නැති කිරීම සඳහා පැවැත්විය යුතු ප්‍රතිපත්තිය සැපයට පැමිණීමේ සත්‍ය මාර්ගය සැටියටත් කියනු ලැබේ.

එයින් සැපයට පැමිණීමේ සත්‍ය මාර්ග දෙකක් ඇතය යි වරදවා නො ගත යුතු ය. අවිද්‍යාව නැති කරන්නට පිරිය යුත්තේ ද, තණ්හාව නැති කරන්නට පිරිය යුත්තේ ද, එකම ප්‍රතිපත්ති ක්‍රමයකි. එබැවින් සැපයට පැමිණීමේ සත්‍ය මාර්ගය එකක් ම බව දත යුතු ය. ඒ ප්‍රතිපත්තියෙන් අවිද්‍යා තෘෂ්ණා දෙක්හි ම නිරෝධය වේ. මේ සංක්ෂේපයෙන් චතුරාර්‍ය්‍ය සත්‍යය තේරුම් ගත යුතු ආකාරය ය.

අවිද්‍යාව නසා සංසාර චක්‍රයෙන් මිදී නිවන් සුවය ලබනු කැමැති තැනැත්තා විසින් කියන ලද පරිදි චතුරාර්‍ය්‍ය සත්‍යය පිළිබඳ සාමාන්‍ය දැනුමක් හා පඤ්චස්කන්ධයට අයත් නාම රූපයන් පිළිබඳ සාමාන්‍ය දැනුමක් ද ඇති කරගෙන චතුස්සත්‍යයන් දැකිය හැකි වන විද්‍යා සතර උපදවා ගැනීමට භාවනා කළ යුතු ය. විද්‍යාව සම්පූර්ණ කර ගත හැක්කේ විදර්ශනා භාවනාවෙනි. විදර්ශනාව පැවැත්විය යුත්තේ දුඃඛ සත්‍යයට අයත් ධර්ම විෂයෙහි ය. එය කරන තැනැත්තා විසින් අනිත්‍ය විද්‍යාවය, දුඃඛ විද්‍යාවය, අනාත්ම විද්‍යාවය, ශ්‍රෝතාපත්ති මාර්ග විද්‍යාවය, සකෘදගාමි මාර්ග විද්‍යාවය, අනාගාමි මාර්ග විද්‍යාවය, අර්හත් මාර්ග විද්‍යාවය යන මේවා පිළිවෙළින් සම්පාදනය කෙරෙමින් මතු කවර කලෙකවත් ඇති නො වන පරිදි අවිද්‍යාව දුරු කිරීමට සමත් ආර්‍ය්‍ය විද්‍යාව සම්පූර්ණ කර ගත යුතු ය.

විද්‍යාව ඇතිකර ගැනීමේ ප්‍රතිපත්ති ක්‍රමය අප විසින් සම්පාදිත **විදර්ශනා භාවනා ක්‍රමය** නමැති පොතෙහි හා **සතිපට්ඨාන භාවනා ක්‍රමය** නමැති පොතෙහි විස්තර කර ඇත්තේ ය. ඒ පොත් දෙකෙහි ඇත්තේ එකිනෙකට වෙනස් භාවනා ක්‍රම දෙකකි. ඉක්මනින් විද්‍යාව ඇතිකර ගනු කැමති වීර්‍ය්‍යවත් පුද්ගලයන්ට සතිපට්ඨාන භාවනා ක්‍රමය නමැති පොතෙහි දැක්වෙන භාවනා ක්‍රමය හොඳ ය. මෙලොවදී ම විද්‍යාව පහළ වන සැටියට ඒ භාවනාව කරත හොත් කළ යුත්තේ සති ගණනක් හෝ මාස ගණනක් හෝ ඒ සඳහා

Non-commercial distribution

වෙන් කරගෙන ඒ වෙන් කරගත් සම්පූර්ණ කාලයෙහි ම අනිකක් නො කොට භාවනාවෙහි යෙදීමෙනි.

අවකාශ ඇති ඇති සැටියට සෙමින් භාවනාවෙහි යෙදෙනු කැමතියන්ට විදර්ශනා භාවනා ක්‍රමය නමැති පොතේ දක්වෙන භාවනා ක්‍රමය යෝග්‍ය ය. ඒ පොත් දෙක මෙහි සඳහන් කළ නුමුත් භාවනා ක්‍රම දක්වා ඇත්තේ ඒ පොත් දෙක්හි පමණක් නොවේ. තවත් නොයෙක් පොත්වල නොයෙක් ආචාර්‍ය්‍ය පරම්පරාවල බොහෝ භාවනා ක්‍රම ඇත්තේ ය. කැමති භාවනාවක් පුරුදු කළ යුතු ය.

## විද්‍යාව ඉපදවීමේ කාලය.

අවිද්‍යාන්ධකාරය දුරුකිරීමට සමත් වන ආර්‍ය්‍ය විද්‍යාලෝකය උපදවා ගත හැක්කේ බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය පවත්නා කාලයේ දී පමණෙකි. මේ බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය පවත්නා කාලයෙකි. එබැවින් ආර්‍ය්‍ය විද්‍යාව නමැති ආලෝකය උපදවාගෙන අවිද්‍යාන්ධකාරය දුරුකර සංසාර දුක්ඛයෙන් මිදීමට උත්සාහ කිරීමට මේ ඉතාම සුදුසු කාලය ය. උත්සාහ කළත් මේ කාලයේදී මගපලවලට නො පැමිණිය හැකි ය යි ඇතැම්හු කියතත් එබන්දක් බුදුන් වහන්සේ විසින් වදරා නැත. **ඉමේ ච සුභද්ද භික්ඛූ සම්මා විහරෙය්‍යුං අසුඤ්ඤො ලෝකෝ අරහන්තේහි අස්ස**" යනුවෙන් මහා පරිනිර්වාණ සූත්‍රයෙහි බුදුරජාණන් වහන්සේ විසින් වදරා ඇත්තේ මේ භික්ෂූහු මනාකොට වාසය කරන්නාහු නම් ලොව රහතුන්ගෙන් සිස් වන්නේ නැතය කියා ය. කොතෙක් උත්සාහ කළත් වර්තමාන ජාතියේදී මාර්ගඵලවලට පැමිණිය නොහෙන අභව්‍ය පුද්ගලයෝ ද ඇතහ.

**"තිරච්ඡානගතස්ස මහාරාජ! සුපටිපන්නස්සාපි ධම්මාභිසමයො න හොති. පෙත්තිවිසයූපපන්නස්ස මිච්ඡාදිට්ඨිකස්ස කුහකස්ස මාතුඝාතකස්ස පිතුඝාතකස්ස අරහන්තඝාතකස්ස සංඝභේදකස්ස ලෝහිතුප්පාදකස්ස ථෙය්‍යසංවාසකස්ස තිත්ථියපක්කන්තස්ස භික්ඛුනී දූසකස්ස තෙරසන්නං ගරුකාපත්තීනං අඤ්ඤතරං ආපජ්ජිත්වා අවුට්ඨිතස්ස පණ්ඩකස්ස උභතොබ්‍යඤ්ජනකස්ස සුපටිපන්නස්සාපි ධම්මාභිසමයෝ න හෝති. යෝපි මනුස්සදහරකෝ**

Non-commercial distribution

**ඌනකසත්තවස්සිකෝ තස්ස සුපටිපන්නස්සාපි ධම්මාභිසමයෝ න හෝති. ඉමේසං ඛෝ මහාරාජ! සෝළසන්නං පුග්ගලානං සුපටිපන්නානම්පි ධම්මාභිසමයෝ න හෝති"**

යනුවෙන් නාගසේන මහරහතන් වහන්සේ විසින් වදළ පුද්ගලයන් සොළොස් දෙනා හැර සෙස්සන්ට බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය උගෙන ඒ ධර්මයේ සැටියට ආයඍවිද්‍යා සංඛ්‍යාත ලෝකෝත්තර මාර්ග ඥනය වර්තමාන භවයේදී උපදවන්නට බැරිය කියා නියමයක් නැත. මගපල ලබා අවිද්‍යාව දුරුකරගත හැකිවීමට ප්‍රමාණවත් උත්සාහයකින් ක්‍රමානුකූලව භාවනාවෙහි යෙදුනහොත් කාහට වුවත් මේ ජාතියේදී උසස් තත්ත්වයකට පැමිණිය හැකි නො වේය යි නො කිය හැකි ය. එක ජාතියකදී කරන උත්සාහයෙන් භාවනාව සම්පූර්ණ වී ධර්මාභිසමය නුවුවහොත් ඒ තැනැත්තාට ඒ කුශලයෙන් දෙවන ජාතියේ දෙව්ලොව ඉපද එහිදී මගපල ලබා නිවන් දැකිය හැකි වන බව තථාගතයන් වහන්සේ විසින් මෙසේ වදරා තිබේ.

**"ඉධ භික්ඛවෙ! භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදනං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. තස්ස තේ ධම්මා සෝතානුගතා හොන්ති වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. සෝ මුට්ඨස්සති කාලං කුරුමානෝ අඤ්ඤතරං දේවනිකායං උපපජ්ජති. තත්ථ තත්ථ සුඛිනො ධම්මපදා ප්ලවන්ති. දන්ධෝ භික්ඛවේ! සතුප්පාදො. අථ සො සත්තෝ ඛිප්පමේව විසේසභාගී හෝති."**

"මහණෙනි! මේ සස්නෙහි මහණ තෙමේ සූත්ත ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදන ඉතිවුත්තක ජාතක අබ්භුතධම්ම වේදල්ල යන කොටස් නවයට අයත් බුද්ධ ධර්මය පුහුණු කෙරේ ද ඒ ධර්මයෝ ඒ භික්ෂුව ගේ කනට වැටුණාහු වෙත් ද, සජ්ඣායනා කිරීම් වශයෙන් වචනයෙන් පුරුදු කරන ලද්දහු වෙත් ද, සිතින් නැවත නැවත සිහි කරන ලද්දහු වෙත් ද, අර්ථ වශයෙන් කාරණා වශයෙන් නුවණින් මනා කොට තේරුම් ගන්නා ලද්දහු වෙත් ද, ඒ භික්ෂු තෙමේ සිහි මුළාවෙන් පෘථග්ජන කාලක්‍රියාවෙන් කාලක්‍රියා කෙළේ නම් එක්තරා දේවනිකායක උපදින්නේ ය. එහි සුවපත් වූ ඔහුට තමා අතීත භවයේ පුහුණුකළ ධර්මයෝ වැටහෙත්.

Non-commercial distribution

මහණෙනි! ඔහුට බුද්ධ ධර්මය මතක් වීමට කල් පසු වේ. මතක් වූ කල්හි ඒ සත්ත්ව තෙමේ වහා (මගපල ලබා) නිවනට යන්නේ වේ ය" යනු එහි තේරුම ය.

ඒ සූත්‍ර පාඨයෙන් දක්වෙන්නේ මේ කාලයේ දී මිනිස් ලොව බුදු දහම උගෙන භාවනාවෙහි යෙදීම් වශයෙන් ඒ ධර්මය අනුව පිළිපදින තැනැත්තා හට ඒ ජාතියේ දී ම නිවන් දක්නට නුපුලුවන් වුවහොත් දෙවන ජාතියේ දෙව් ලොව ඉපද එහි දී පහසුවෙන් නිවන් දැකිය හැකි වන බව ය. (ඉහත දක් වූ සූත්‍ර පාඨය අංගුත්තරනිකායේ චතුෂ්ක නිපාතයේ මහා පණ්ණාසකයේ පඤ්චම වර්ගයේ ප්‍රථම සූත්‍රයෙන් උපුටා ගන්නා ලද්දකි.)

මෙකල බොහෝ දෙනා මේ බුදුසසුනේ දී මගපල ලබා නිවන් දැකීමේ බලාපොරොත්තු සම්පූර්ණයෙන් ම හැර දමා **මෛත්‍රෙය බුදුන් ගේ සස්න ගැන බලාපොරොත්තු වෙති**. එය ඔවුනට කෙසේ පුරුදු වූවක්ද යි නො දනිමු. අද අද ම නිවන් දැකීමට උත්සාහ කිරීමට බුදුන් වහන්සේ අනුශාසනය කර ඇති තැන් මිස, මෙතේ බුදුන් ගැන බලාපොරොත්තු වන ලෙස අනුශාසනය කළ තැන් පිටකත්‍රයෙහි දක්නට නැත. අප බුදුරජාණන් වහන්සේ චතුරසංඛ්‍ය කල්පලක්ෂයක් පෙරුම් පුරා බොහෝ දුක් ගෙන ලොව්තුරා බුදුබවට පැමිණ වදාළේ උන්වහන්සේ විසින් ම උන්වහන්සේ ගේ සස්නෙහි දී ම නිවන් දක්වීමට මිස මෛත්‍රෙය බුදුන් වහන්සේ වෙත යැවීමට පිරිසක් සූදනම් කිරීමට නො වන බව ද සැලකිය යුතු ය.

**මෙතෙකින් ප්‍රතිලෝම ප්‍රතීත්‍යසමුත්පාද**
**විස්තරය නිමියේ ය.**

Non-commercial distribution

## සංසාරයේ මුල

**මේ ප්‍රතීත්‍යසමුත්පාද දේශනය සංසාරයේ මුල දක්වන දේශනාවක් නොව සංසාරය පවත්නා සැටි දක්වන දේශනයකි**. චක්‍ර මාර්ගයක ගමන් කරන කෙනකුට පසු කළ මාර්ගය ම නැවත නැවත ඉදිරියට එන බැවින් මාර්ගය නැති වී අවසන් වී කවදාවත් ගමන කෙළවර නො වන්නේ ය. එමෙන් ප්‍රතීත්‍යසමුත්පාදයට අයත් ද්වාදශාංගයන් අතුරෙන් පසු පසු වූ අංග නැවත නැවත ඉදිරියට එන බැවින් ඒවා උපායෙන් නැතිකර නො ගත හොත් සංසාර චක්‍රයාගේ පැවැත්ම කවදාවත් කෙළවර නො වේ.

මේ සංසාර චක්‍රයේ අනාගත කෙළවරක් නැතුවාක් මෙන් ම අතීත කෙළවරක් හෙවත් මුල පටන් ගැනීමක් ද නැත්තේ ය. බොහෝ දෙනා "යමක් ඇති නම් එහි පටන් ගැනීමකුත් තිබිය යුතු ය. පටන් ගැනීමක් නැති දෙයක් තිබිය නො හැකිය" යන මතය දැඩි කොට ගෙන ලෝකයේත් සත්ත්වයාගේත් පටන් ගැනීම සොයන්නට උත්සාහ කෙරෙති. පටන් ගැනීමේ මුල් හේතුවක් සොයන්නා වූ ඔවුහු එයට සෑහෙන කරුණක් නො දැක දෙවි කෙනකු ඇද ගනිති. දෙවි කෙනකු ඇදගන්නා ඔවුන්ට, පොළවට විරුද්ධ වී පොළොවෙන් ඉවත්වීම පිණිස උඩ පනින්නා වූ සාවා නැවත නැවතත් පොළොවට ම වැටෙන්නාක් මෙන් කලින් ප්‍රතික්ෂේප කළ පටන් ගැනීමක් නැති දෙයක් නො තිබිය හැකිය යන නීතිය දෙවියා සම්බන්ධයෙන් පිළිගන්නට සිදු වේ. දෙවියා සම්බන්ධයෙන් එය නො පිළිගන්නවා නම් ඔවුනට තවත් දෙවියකු ඇද ගන්නට සිදු වේ. කොතෙක් දෙවිවරුන් ඇද ගත්තත් අන්තිමට ඔවුනට සිදු වන්නේ පටන් ගැනීමක් නැතිව ඇති බව පිළිගැනීමට ය.

**"යමක් ඇති නම් එහි පටන් ගැන්මකුත් තිබිය යුතුය**." යන නීතිය සෑම තැනකට ම ගැලපෙන්නේ නො වේ. ආකාශය ඇත, එහෙත් මෙයින් පෙර මේ ආකාශය තුබුණේ නැත, ආකාශය තිබෙන්නේ අසවල් කාලයේ පටන් ය කියා අහසේ මුල් පටන් ගැනීමක් නො දැක්විය හැකි ය. අහස සෑම කල්හි ම ඇතියකි. සෑම කල්හි ම ඇති දෙයෙහි පටන් ගැනීමක් නැත. කාලයත් ආකාශය

Non-commercial distribution

සේම පටන් ගැනීමක් නැතිව ඇතියකි. සංසාරය ද පටන් ගැනීමක් නැතිව ඇතියකි. එබැවින් තථාගතයන් වහන්සේ "**පුරිමා භික්ඛවේ! නපඤ්ඤායති කෝටි අවිජ්ජාය ඉතෝ පුබ්බේ අවිජ්ජා නාහෝසි අථ පච්ඡා සම්භවීති. අථ ච පන පඤ්ඤායති ඉදප්පච්චයා අවිජ්ජාති**" යනු වදළ සේක. මහණෙනි! මෙයින් පෙර අවිද්‍යාව නො තුබුණේ ය. පසුව අවිද්‍යාව ඇති වූයේ ය කියා අවිද්‍යාව ගේ මුල් කොණක් නො පෙනේ ය. එහෙත් මේ ප්‍රත්‍යයෙන් අවිද්‍යාව ඇති වේය කියා පෙනේ ය" යනු එහි තේරුම ය. තව ද "**අනමතග්ගෝයං භික්ඛවේ! සංසාරෝ පුබ්බාකෝටි න පඤ්ඤායති**" යි ද වදළ සේක. "මහණෙනි! මේ සංසාරය නො දන්නා ලද අග ඇතියක. එහි පෙර කොණ නො පෙනේ ය" යනු එහි තේරුම ය.

ඉහත දක්වූ අවිද්‍යාවගේ පූර්ව කෝටිය නැතය යන බුද්ධවචනය බලා සංස්කාරාදිය නැතුව අවිද්‍යාව පමණක් තුබුණු කාලයක් විය. සංස්කාරාදිය පසු කලෙක ඇතිවීය යි නො ගත යුතුය. අන් කිසිවක් නැතිව අවිද්‍යාවට පමණක් තිබිය හැකි බවක් නැත. අවිද්‍යාව තිබෙන්නට නම් සංස්කාරාදියත් තිබිය යුතු ය. එබැවින් අවිද්‍යාව තුබූ සැම කාලයේ ම අවිද්‍යාදිය නිසා ඇති වන සංස්කාරාදියත් පැවතුණු බව පිළිගත යුතු ය.

බුදුරජාණන් වහන්සේ විසින් "**පුබ්බා කෝටි නත්ථි**. පූර්ව කෝටිය නැතය" යි කෙළින්ම කාරණය නො වදරා "**පුබ්බා කෝටි න පඤ්ඤායති**. පූර්ව කෝටිය නො පෙනේය" යි වදරා තිබෙන්නේ "**සංසාරයෙහි ඇත්තා වූ පටන් ගැනීම උන් වහන්සේට නො පෙනෙන නිසාදෝ**" යි ඇතැම්හු සැක කෙරෙති. බුදුන් වහන්සේ විසින් "පුබ්බා කෝටි න පඤ්ඤායති" යි වදරා තිබෙන්නේ උන් වහන්සේට සංසාරයේ පූර්ව කෝටිය නො පෙනීම නිසා නොව එහි පූර්ව කෝටියක් නැති නිසා ය. **පෙනීමය දැකීමය යන අර්ථ ඇති වචන, ඇති- නැති බව දැක්වීමට යෙදීම පාළි භාෂාවේ සැටියකි**. ඒ බව මතු දැක්වෙන වගන්ති අනුව සිතා බැලුවාම තේරුම් ගත හැකි වනු ඇත.

"තීණිමානි භික්ඛවෙ! සංඛතස්ස සංඛතලක්ඛණානි. කතමානි තීණි? උප්පාදෙ **පඤ්ඤායති** වයෝ **පඤ්ඤායති**, ඨිතස්ස අඤ්ඤථත්තං **පඤ්ඤායති**: ඉමානි ඛො භික්ඛවෙ! තීණි සංඛතස්ස සංඛතලක්ඛණානි."

Non-commercial distribution

"මහණෙනි! මේ තුන ප්‍රත්‍යයෙන් හටගත් ධර්මයාගේ ප්‍රත්‍යයෙන් හටගත් බැව්හි ලකුණු ය. කවර තුනක් ද යත් ? ඉපදීමක් පෙනේය, විනාශයක් පෙනේ ය, පැවැත්මෙහි අන් අයුරකට පැමිණීමක් හෙවත් ජරාවක් පෙනේය, මහණෙනි! මේ තුන ප්‍රත්‍යයෙන් හටගත් ධර්මයාගේ ප්‍රත්‍යයෙන් හටගත් බැව්හි ලකුණු ය" යනු එහි තේරුම ය, එහි **පඤ්ඤායති** යන වචනයෙන් දක්වන තියම තේරුම නම්, **ඇති බවය**. ඒ සූත්‍රයෙන් දක්වන්නේ ඉපදීම ඇති බවය. **බිඳීම ඇති බවය**, **ජරාව ඇති බවය** යන මේ තුන ප්‍රත්‍යයෙන් හට ගත් ධර්මයාගේ ලකුණු බවය.

"තීණිමානි භික්ඛවෙ! අසංඛතස්ස අසංඛතලක්ඛණානි, කතමානි තීණි? උප්පාදෙ **න පඤ්ඤායති**, වයො **න පඤ්ඤායති** ඨිතස්ස අඤ්ඤථත්තං **න පඤ්ඤායති**, ඉමානි ඛෝ භික්ඛවෙ! තීණි අසංඛතස්ස අසංඛතලක්ඛණානි."

මේ සූත්‍රයෙන් දක්වන්නේ ඉපදීමක් නැති බවය, බිඳීමක් නැති බවය, ජරාවක් නැති බවය යන මේ කරුණු තුන අසංස්කෘත ධර්මයාගේ ලකුණු බවය. **න පඤ්ඤායති** යන වචනය එහි යොද තිබෙන්නේ නැති බව දැක්වීමට ය.

"ඉමස්සා ච මහා පඨවියා සිනේරුස්ස ච පබ්බතරාජස්ස ඣායමානානං ඩය්හමානානං නෙව ඡාරිකා **පඤ්ඤායති** න මසී."

**පඤ්ඤයති**. යන වචනය යෙදී ඇති මේ සූත්‍ර පාඨයේ අදහස මහා පෘථිවියත් මහාමේරුපර්වත රාජයාත් දන කල්හි අළු හා දැලි නැතය යනුයි. පුබ්බා කෝටි න පඤ්ඤායති යන පාඨය නෙත්තිප්‍රකරණ අටුවාවෙහි වර්ණනා කර තිබෙන්නේ මෙසේ යඃ–

"**පුබ්බාකෝටි න පඤ්ඤායති**, ති අමුකස්ස නාම බුද්ධස්ස භගවතෝ අමුකස්ස වා චක්කවත්තිනෝ කාලෙ අවිජ්ජා භවතණ්හා ච උප්පන්නා. තතෝ පුබ්බේ නාහොසීති. ඒවං අවිජ්ජා භවතණ්හානානං න කාචි පුරිමා මරියාද උපලබ්භති."

"පුබ්බා කෝටි න පඤ්ඤායති යනු අසවල් බුදුන්ගේ හෝ අසවල් චක්‍රවර්ති රජු ගේ හෝ කාලයෙහි අවිද්‍යාවත් භවතණ්හාවත්

Non-commercial distribution

උපන්නාහු ය. එයින් පෙර ඒවා නො වීය කියා අවිද්‍යා භවතෘෂ්ණාවන් ගේ යම්කිසි පූර්ව කාල පරිච්ඡේදයක් නො ලැබේය" යනු එහි තේරුම ය. අටුවාවෙහි ඒ පාඨය මෙසේ වර්ණනා කරන ලදුයේ **"න පඤ්ඤායති"** යන්නෙන් දක්වෙන "අදහස" **නැති බව** නිසා ය.

## අනේකප්‍රකාර
## ප්‍රතීත්‍ය සමුත්පාද දේශනා

එකින් එකට ප්‍රත්‍යය වීම් වශයෙන් චක්‍රයක් වන මේ පටිච්චසමුප්පාදය කොතැනකින් වුව ද පටන් ගෙන දේශනය කළ හැකි යි. මෙතෙකින් මේ ග්‍රන්ථයෙහි අප විසින් විස්තර කරන ලදුයේ අවිද්‍යා මූලික ප්‍රතීත්‍ය සමුප්පාදයෙකි. බුදුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් නොයෙක් තැන්වලින් පටන් ගෙන දේශනය කර ඇති ප්‍රතීත්‍ය සමුත්පාද දේශනා බොහෝ ගණනක් පිටකත්‍රයෙහි ඇත්තේ ය. මේ ග්‍රන්ථය කියවන්නවුන්ට ප්‍රතීත්‍ය සමුත්පාද ඥානය වැඩිදුරටත් දියුණු කරගත හැකිවනු සඳහා මෙතැන් පටන් විශේෂ ප්‍රතීත්‍ය සමුත්පාද දේශනා කීපයක් දක්වනු ලැබේ.

Non-commercial distribution

# දසබල සූත්‍රය

(මෙය නිදනවග්ග සංයුත්තයේ දශබල වර්ගයේ
දෙවන සූත්‍රය ය)

(1) ඒවං මේ සුතං, ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. තත්‍ර බෝ භගවා භික්ඛු ආමන්තේසි. භික්ඛවෝති. භදන්තේ.' ති තේ භික්ඛු භගවතෝ පච්චස්සෝසුං. භගවා ඒතදවෝච.

(2) දසබලසමන්නාගතෝ භික්ඛවේ! තථාගතෝ චතූහි ච වේසාරජ්ජේහි සමන්නාගතෝ ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති. බ්‍රහ්මචක්කං පවත්තේති.

(3) ඉති රූපං, ඉති රූපස්ස සමුදයෝ, ඉති රූපස්ස අත්ථංගමෝ. ඉති වේදනා, ඉති වේදනාය සමුදයෝ, ඉති වේදනාය අත්ථංගමෝ. ඉති සඤ්ඤා, ඉති සඤ්ඤාය සමුදයෝ, ඉති සඤ්ඤාය අත්ථංගමෝ. ඉති සංඛාරෝ, ඉති සංඛාරානං සමුදයෝ, ඉති සංඛාරානං අත්ථංගමෝ. ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයෝ, ඉති විඤ්ඤාණස්ස අත්ථංගමෝ. ඉති ඉමස්මිං සති ඉදං හෝති, ඉමස්සුප්පාද ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හෝති. ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති, යදිදං අවිජ්ජාපච්චයා සංඛාරා, සංඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සෝ, ඵස්සපච්චයා වේදනා, වේදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදනං, උපාදනපච්චයා භවෝ, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සෝකපරිදේවදුක්ඛදෝමනස්සුපායාසා සම්භවන්ති. ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති.

(4) අවිජ්ජායත්වේව අසේසවිරාගනිරෝධා සංඛාර නිරෝධෝ, සංඛාරනිරෝධා විඤ්ඤාණ නිරෝධෝ, විඤ්ඤාණනිරෝධා නාමරූප නිරෝධෝ, නාමරූප නිරෝධා සළායතන නිරෝධෝ, සළායතනනිරෝධා ඵස්ස නිරෝධෝ, ඵස්සනිරෝධා

Non-commercial distribution

වේදනානිරෝධො, වේදනා නිරෝධා තණ්හානිරෝධො, තණ්හා නිරෝධා උපාදනනිරෝධො, උපාදන නිරෝධා භවනිරෝධො, භවනිරෝධා ජාති නිරෝධො, ජාතිනිරෝධා ජරා මරණසෝක පරිදේව දුක්ඛදෝමනස්සුපායාසා නිරුජ්ඣන්ති. ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධො හෝති.

(5) ඒවං ස්වාක්ඛාතෝ භික්ඛවේ! මයා ධම්මෝ උත්තානෝ විවටෝ පකාසිතෝ ඡින්නපිලෝතිකෝ. ඒවං ස්වාක්ඛාතේ බෝ භික්ඛවේ! මයා ධම්මේ උත්තානේ විවටේ පකාසිතේ ඡින්නපිලෝතිකෙ අලමේව සද්ධාපබ්බජිතේන කුලපුත්තේන විරියං ආරභිතුං "කාමං තචෝ ච නහාරු ච අට්ඨී ච අවසිස්සතු සරීරෙ උපසුස්සතු මංසලෝහිතං, යං තං පුරිසථාමේන පුරිසපරක්කමේන පත්තබ්බං, න තං අපත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතීති."

(6) දුක්ඛං භික්ඛවේ! කුසීතෝ විහරති වෝකිණ්ණෝ පාපකේහි අකුසලේහි ධම්මේහි, මහන්තං ච සදත්ථං පරිහාපේති. ආරද්ධවිරියෝ ච බෝ භික්ඛවේ! සුඛං විහරති පවිවිත්තෝ පාපකේහි අකුසලේහි ධම්මේහි මහන්තං ච සදත්ථං පරිපූරේති.

(7) න භික්ඛවේ! හීනේන අග්ගස්ස පත්ති හෝති. අග්ගේන ච බෝ භික්ඛවෙ! අග්ගස්ස පත්ති හෝති.

(8) මණ්ඩපෙය්‍යමිදං භික්ඛවේ! බ්‍රහ්මචරියං සත්ථා සම්මුඛීභූතෝ. තස්මා තිහ භික්ඛවේ! විරියං ආරභථ අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. "එවං නෝ අයං අම්හාකං පබ්බජ්ජා අවඤ්ඣා භවිස්සති සඵලා සඋද්‍රයා. යෙසඤ්ච මයං පරිභුඤ්ජාම චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්පච්චයභේසජ්ජ පරික්ඛාරං, තේසං තේ කාරා අම්හේසු මහප්ඵලා භවිස්සන්ති මහානිසංසා' ති.

(9) ඒවං හි චෝ භික්ඛවේ! සික්ඛිතබ්බං අත්තත්ථං වා භික්ඛවේ! සම්පස්සමානේන අලමේව අප්පමාදේන සම්පාදේතුං. පරත්ථං වා භික්ඛවේ! සම්පස්සමානේන අලමේව අප්පමාදේන

Non-commercial distribution

සම්පාදේතුං. උභයත්ථං වා භික්ඛවේ! සම්පස්සමානේන අලමේව අප්පමාදෙන සම්පාදේතුන්ති.

## දශබල සූත්‍රයේ භාවය

(1) මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු මහ සිටුහු විසින් කරවන ලද ජේතවනාරාම විහාරයෙහි වැඩ වෙසෙන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’ යි කියා භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු ‘ස්වාමීනි’ කියා භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

(2) මහණෙනි! තථාගතයන් වහන්සේ දශබලයෙන් යුක්ත වූවාහු චතුවෛශාරද්‍යඥනයෙන් යුක්ත වූවාහු තමන් වහන්සේ උත්තමස්ථානයෙහි ඉන්නා බව ප්‍රතිඥ කරන්නාහ. පිරිස්හි සිංහනාද කරන්නාහ. බ්‍රහ්මචක්‍රය පවත්වන්නාහ.

(3) මේ රූපයය, රූපය උපදින්නේ මෙසේ ය, රූපය නිරුද්ධ වන්නේ මෙසේ ය, මේ වේදනාවය, වේදනාව උපදින්නේ මෙසේ ය, වේදනාව නිරුද්ධ වන්නේ මෙසේ ය, මේ සංඥවය, සංඥව උපදින්නේ මෙසේ ය, සංඥව නිරුද්ධ වන්නේ මෙසේ ය, මොහු සංස්කාරයෝය, සංස්කාරයන් උපදින්නේ මෙසේ ය, සංස්කාරයන් නිරුද්ධ වන්නේ මෙසේ ය, මේ විඥනයය, විඥනය උපදින්නේ මෙසේ ය, විඥනය නිරුද්ධ වන්නේ මෙසේ ය, මෙය ඇති කල්හි මෙය වේය, මෙය ඉපදීමෙන් මෙය උපදී ය, මෙය නැති කල්හි මෙය නො වේය, මෙය නිරෝධයෙන් මෙය නිරුද්ධ වේය. අවිද්‍යාව ප්‍රත්‍යය කොට සංස්කාරයෝ උපදිති, සංස්කාරයන් ප්‍රත්‍යය කොට විඥනය උපදී, විඥානය ප්‍රත්‍ය කොට නාමරූප උපදී, නාමරූපයන් ප්‍රත්‍ය කොට ෂඩායතනය උපදී, ෂඩායතනය ප්‍රත්‍යය කොට ස්පර්ශය උපදී, ස්පර්ශය ප්‍රත්‍යය කොට වේදනාව උපදී, වේදනාව ප්‍රත්‍යය කොට තණ්හාව උපදී, තණ්හාව ප්‍රත්‍යය කොට උපාදනය උපදී, උපාදනය ප්‍රත්‍යය කොටගෙන භවය උපදී, භවය ප්‍රත්‍යය කොට ජාතිය වේ. ජාතිය ප්‍රත්‍යය කොට ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ වෙත්. මෙසේ මේ සකල දුඃඛස්කන්ධයාගේ පහළ වීම වේ.

Non-commercial distribution

(4) අවිද්‍යාවගේ ම නිරවශේෂ නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ. සංස්කාර නිරෝධයෙන් විඥාන නිරෝධය වේ. විඥාන නිරෝධයෙන් නාමරූප නිරෝධය වේ. නාමරූප නිරෝධයෙන් ෂඩායතන නිරෝධය වේ. ෂඩායතන නිරෝධයෙන් ස්පර්ශ නිරෝධය වේ. ස්පර්ශ නිරෝධයෙන් වේදනා නිරෝධය වේ. වේදනා නිරෝධයෙන් තණ්හා නිරෝධය වේ. තණ්හා නිරෝධයෙන් උපාදාන නිරෝධය වේ. උපාදාන නිරෝධයෙන් භව නිරෝධය වේ. භව නිරෝධයෙන් ජාති නිරෝධය වේ. ජාති නිරෝධයෙන් ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ නිරුද්ධ වෙති. මෙසේ මේ සකල දුඃඛස්කන්ධයා ගේ නිරෝධය වේ.

(5) මහණෙනි! මා විසින් මෙසේ ධර්මය මනා කොට කියන ලද්දේ ය. උඩුකුරු කරන ලද්දේ ය. විවෘත කරන ලද්දේ ය. පැහැදිලි කරන ලද්දේ ය. අඩුවක් නැති කොට සම්පූර්ණ කොට පවසන ලද්දේ ය. මහණෙනි! මා විසින් මෙසේ ධර්මය මනාකොට පවසා ඇති කල්හි උඩුකුරු කොට ඇති කල්හි වැසුම් හැර ඇති කල්හි පැහැදිලි කොට ඇති කල්හි සැදැහැයෙන් පැවිදි වූ කුලපුත්‍රයා විසින් "සමත් නහරත් ඇටත් ඉතිරි වෙතොත් ඉතිරි වේවා. ශරීරයේ ලේ මස් වියළී යතොත් වියළී යේවා, පුරුෂ වීර්‍ය්‍යයෙන් පුරුෂ පරාක්‍රමයෙන් යම් අර්හත්වයකට පැමිණිය යුතු ද එයට නො පැමිණ වීර්යය නැවැත්වීමක් නො වන්නේ ය" යි වීර්‍ය්‍ය කරන්නට සුදුසු ය.

(6) මහණෙනි! අලසයා ලාමක වූ අකුශල ධර්‍මයන්ගෙන් යුක්ත ව දුකින් වෙසෙන්නේ ය. අර්හත්ඵල සංඛ්‍යාත මහත් වූ අර්ථය පිරිහෙවා ගන්නේ ය. මහණෙනි! පටන් ගන්නා ලද වීර්‍ය්‍යය ඇත්තේ ලාමක වූ අකුශල ධර්මයන් ගෙන් වෙන් වූයේ සැපයෙන් වෙසෙන්නේ ය. අර්හත්ඵල සංඛ්‍යාත මහත් වූ අර්ථය සම්පූර්ණ කරන්නේ ය.

(7) මහණෙනි! ලාමක වූ ශ්‍රද්ධාදියෙන්, අග්‍ර වූ අර්හත්වයට පැමිණීමක් නො වන්නේ ය. අග්‍ර වූ ශ්‍රද්ධාදියෙන් ම අග්‍ර ඵලයට පැමිණීම වන්නේ ය.

(8) මහණෙනි! මේ ශාසන ධර්මය පැදුණා වූ බිමෙකි. ශාස්තෘවරයා සම්මුඛව ඇත්තේ ය. එහෙයින් මහණෙනි! "මෙසේ

Non-commercial distribution

කිරීමෙන් අපගේ පැවිද්ද වඳ නො වන්නේ ය, සඵල වන්නේ ය. දියුණු වන්නේ ය. අපි යමකුගේ චීවර පිණ්ඩපාත සේනාසන ගිලාන ප්‍රත්‍යයන් පරිභෝග කරමුද අපට උපකාර කරන්නවුන්ගේ ඒ දීමනා මහත්ඵල මහානිසංස වන්නාහ''යි නො පැමිණියා වූ ලෝකෝත්තර මාර්ගාදියට පැමිණීම පිණිසත් නො ලැබූ ලෝකෝත්තර මාර්ගාදිය ලබනු පිණිසත් ප්‍රත්‍යක්‍ෂ නො කළ ධර්ම ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිසත් උත්සාහ කළ යුතු ය.

(9) මහණෙනි! තොප විසින් මෙසේ හික්මිය යුතු ය. මහණෙනි! ආත්මාර්ථය හෝ දක්නහු විසින් අප්‍රමාදයෙන් යුක්ත වීමට සුදුසුම ය. පරාර්ථය හෝ දක්නහු විසින් අප්‍රමාදයෙන් යුක්ත වීමට සුදුසු ය. උභයාර්ථය ම හෝ දක්නහු විසින් අප්‍රමාදයෙන් යුක්ත වීම සුදුසු ය.

## දශබල සූත්‍රයේ විස්තරය

ලොව වෙසෙන ලාමක අදහස් ඇති බොරුකාරයන් මායාකාරයන් සේ බුදුවරයන් වහන්සේලා ආත්ම වර්ණනාවට කැමැත්තෝ නො වෙති. බුදුන් වහන්සේ විසින් මහත් වූ ආත්ම වර්ණනාවකින් යුක්ත කොට මේ සූත්‍රය දේශනය කර තිබෙන්නේ ශ්‍රාවකයන්ගේ සිතට මේ අනුශාසනය තදින් ඇතුළු කිරීම සඳහා ය. **මෙය පැවිද්දන් විසින් නිතර භාවිත කළ යුතු - නිතර සිහිකළ යුතු සූත්‍රයෙකි**. සසර දුකින් මිදෙනු කැමති ගිහියන් විසින් ද එසේම භාවිත කළයුතු සිහි කළ යුතු සූත්‍රයෙකි. මෙය පාඩම් තිබීම යෝගාවචරයන්ට ඉතා ප්‍රයෝජන ය.

බුදුරජාණන් වහන්සේ විසින් දනගෙන ඇති ධර්ම අතුරෙන් සමහරක් කරුණු ලොව වෙසෙන අන්‍ය ප්‍රාඥයන් විසින් ද දනගෙන ඇති ඒවා ය, පරම ගම්භීර වූ මේ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය බුදුරජාණන් වහන්සේ හැර කිසිම අන්‍ය ශාස්තෘවරයකු විසින් සොයාගෙන - දනගෙන තුබූ දෙයක් නො වේ. එය බුදුන් වහන්සේ විසින් දීර්ඝ කාලයක් මුළුල්ලෙහි පෙරුම් පුරා ලබාගත් විශිෂ්ඨ ඥනයෙන් අවබෝධ කරගන්නා ලද්දකි. ඒ ධර්මය පිළිබඳ තථාගතයන් වහන්සේ ගේ දනුමෙහි කිසිදු දුබල බවක් හෝ අඩු කමක් හෝ නැත. ඒ ධර්මයෙහි අල්පමාත්‍ර වූ වරදක් ද

Non-commercial distribution

නැත්තේ ය. එබැවින් මනුෂ්‍යයකුට තබා දේව බ්‍රහ්මයකුට වුව ද ඒ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයෙහි අඩුවක් හෝ වරදක් දක්වා ඒ ධර්මය නො පෙරළිය හැකි ය. අවලංගු නො කළ හැකි ය. එබැවින් තථාගතයන් වහන්සේ ඕනෑම පිරිසක් මැද අභීතව ඒ ධර්මය දේශනය කරන සේක. ඒ අභීත දේශනය තථාගතයන් වහන්සේ ගේ සිංහනාදය ය.

ප්‍රතීත්‍යසමුත්පාදය දක්වන්නා වූ මේ සූත්‍රය තථාගතයන් වහන්සේ ගේ සිංහනාදය ය. මේ සූත්‍රයට **"සිංහනාද සූත්‍රය"** යන නම ඉතාම උචිත ය. එහෙත් මෙයට ඒ නම සංගීත කාරක මහරහතන් වහන්සේලා විසින් නො තබන ලදුයේ තවත් එබඳු දේශනා ඇති හෙයිනි. මෙයට දශබල සූත්‍රය යන නාමය තබා ඇත්තේ සූත්‍රය පටන් ගැනීමේ දී ම දශබලය සඳහන් වී ඇති බැවිනි. මේ සූත්‍රය පදයක් පාසා විස්තර කළහොත් මහා ග්‍රන්ථයක් වන්නේ ය. මේ සූත්‍රයෙහි එන ප්‍රධාන කරුණුවලින් අනුලෝම පටිලෝම පටිච්චසමුප්පාද දෙක මේ ග්‍රන්ථයේ විස්තර කර ඇත්තේ ය. **දශබලඥානය චතුවෛශාරද්‍ය ඥානය පඤ්චස්කන්ධය** යනාදිය මේ සූත්‍රයෙහි විස්තර කළ යුතු කරුණු ය.

## දශබල ඥාන.

බලඥාන නාමයෙන් හඳුන්වන විශේෂ ඥාන දශයක් තථාගතයන් වහන්සේට ඇත්තේ ය. ඒ ඥානයන් නිසා තථාගතයන් වහන්සේට ලෝකයේ උසස් ම තැන හිමි වී තිබේ.

**දශබල ඥානයෝ නම් :-**

(1) ඨානාඨානකෝසල්ල ඤාණය,
(2) විපාක ඤාණය,
(3) සබ්බත්ථගාමිනීපටිපද ඤාණය,
(4) අනේකධාතු නානාධාතු ඤාණය,
(5) නානාධිමුත්තික ඤාණය,
(6) ඉන්ද්‍රියපරෝපරියත්ති ඤාණය,
(7) ඣානවිමොක්ඛසමාධිසමාපත්ති ඤාණය,

Non-commercial distribution

(8) පුබ්බේනිවාසානුස්සති ඤාණය,
(9) දිබ්බචක්ඛු ඤාණය,
(10) ආසවක්ඛය ඤාණය,

යන මොවුහු ය.

**දශබල ඥානය දක්වෙන**
**ගාථා දෙකක් මෙසේ ය :-**

"ඨානා ඨානේ විපාකේ ච - මග්ගෙ සබ්බත්ථ ගාමිනං,
නානාධාතුම්හි ලෝකස්මිං - අධිමුත්තිම්හි පාණිනං,

පරෝපරියත්තෙ ඤාණං - ඉන්ද්‍රියානඤ්ච ජන්තුනං,
ඣානාදීසු ඤාණං - පුබ්බේ නිවාසේ දිබ්බචක්ඛු ච,
ආසවක්ඛයඤාණන්ති - දසඤාණබලං මතං."

මේ බලඥාන දශය පිළිබඳ ව දීර්ඝ විස්තරයක් විභංගප්පකරණයේ ඤාණවිභංගයේ හා එහි අටුවාවෙහි එන්නේ ය.

(1) "ඉධ තථාගතෝ ඨානඤ්චඨානතෝ අට්ඨානඤ්ච අට්ඨානතෝ යථාභූතං පජානාති ඉදම්පි තථාගතස්ස තථාගතබලං හෝති. යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තෙති"යි.

විභංග පාළියෙහි දක්වෙන පරිදි "මේ මේ දේ සිදුවීමට හේතු ඇත්තේ ය, මේ මේ දේ සිදුවීමට හේතු නැත්තේ ය, මේ හේතුවෙන් මෙය සිදුවන්නේ ය මේ හේතුවෙන් මෙය සිදු නො වන්නේ ය යි සියල්ල පිළිබඳ වූ ම හේතු අහේතූන් තථාගතයන් වහන්සේ තත්ත්වාකාරයෙන් දන්නාහ. හේතු අහේතු පිළිබඳ දැනුමෙහි අඩුවක් උන්වහන්සේට නැත. ඒ හේතු අහේතු දන්නා නුවණ තථාගතයන් වහන්සේ ගේ පළමුවන බලය ය. ඒ බලය නිසා තථාගතයන් වහන්සේ ලෝකයේ ශ්‍රේෂ්ඨස්ථානයේ ඉන්නා සේක. පිරිස්හි සිංහනාදය පවත්වන සේක. බ්‍රහ්මචක්‍රය පවත්වන සේක".

(2) "පුන ච පරං තථාගතෝ අතීතානාගත-පච්චුප්පන්නානං කම්මසමාදනානං ඨානසෝ හේතුසෝ විපාකං යථාභූතං පජානාති, යම්පි තථාගතෝ අතීතානාගත පච්චුප්පන්නානං

Non-commercial distribution

කම්මසමාදනානං ඨානසෝ හේතුසෝ විපාකං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගත බලං හෝති. යං බලං ආගම්ම තථාගතෝ ආසභං ඨානං පටිජානාති පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තෙති”යි.

විභංග පාළියෙහි දක්වෙන පරිදි “මේ මේ කර්මයෙන් මෙබඳු විපාකයක් ඇත්තේය යි අතීතානාගත වර්තමාන යන කාලත්‍රයට අයත් කර්මයන් ගේ විපාක තථාගතයන් වහන්සේ නිවැරදි ලෙස අඩුපාඩුවක් නැතිව හොඳින් ම දන්නා සේක. ඒ කර්ම විපාක දන්නා ඥානය තථාගතයන් වහන්සේ ගේ දෙවන මහා බලය ය. ඒ බලය නිසා ද තථාගතයන් වහන්සේ ලෝකයේ ශ්‍රේෂ්ඨ-ස්ථානයෙහි ඉන්නා සේක. පිරිස්හි සිංහනාදය පවත්වන සේක. බ්‍රහ්මචක්‍රය පවත්වන සේක.”

(3) “පුන ච පරං තථාගතෝ සබ්බත්‍ථගාමිනි පටිපදං යථාභූතං පජානාති, යම්පි තථාගතෝ සබ්බත්‍ථ ගාමිනි පටිපදං යථාභූතං පජානාති ඉදම්පි තථාගතස්ස තථාගත බලං හොති, යං බලං ආගම්ම තථාගතෝ ආසභං ඨානං පටිජානාති පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තේති” යි.

විභංග පාළියෙහි දක්වෙන පරිදි තථාගතයන් වහන්සේ “මේ සත්ත්වයා නරකයට පමුණුවන ප්‍රතිපත්ති ය ය, මේ තිරිසන් බවට පමුණුවන ප්‍රතිපත්තිය ය, මේ ප්‍රේතත්‍වයට පමුණුවන ප්‍රතිපත්තිය ය, මේ මිනිස් ලොවට පමුණුවන ප්‍රතිපත්තිය ය, මේ දෙව්ලොවට පමුණුවන ප්‍රතිපත්තිය ය, මේ නිවනට පමුණුවන ප්‍රතිපත්තිය ය කියා සැමතැනට ම පමුණුවන පිළිවෙත් දන්නා සේක. ඒ සැමතැනට ම යන පිළිවෙත් දන්නා නුවණ තථාගතයන් වහන්සේ ගේ තුන්වන තථාගත බලය ය. ඒ බලයෙන් තථාගතයන් වහන්සේ ලෝකයෙහි ශ්‍රේෂ්ඨස්ථානයෙහි ඉන්නා සේක. පිරිස්හි සිංහනාද පවත්වන සේක. බ්‍රහ්මචක්‍රය පවත්වන සේක.

(4) “පුන ච පරං තථාගතෝ අනේකධාතු නානා ධාතු ලෝකං යථාභූතං පජානාති, යම්පි තථාගතෝ අනේකධාතු නානාධාතු ලෝකං යථාභූතං පජානාති. ඉදම්පි තථාගතස්ස තථාගතබලං හෝති. යං බලං ආගම්ම තථාගතෝ ආසභං

Non-commercial distribution

ඨානං පටිජානාති පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තේති''යි.

විභංග පාළියෙහි දක්වෙන පරිදි "මේ රූපය මේ වේදනාවය යනාදීන් ස්කන්ධයන්ගේ නානත්වය දන්නාහ, ආයතනයන්ගේ නානත්වය දන්නාහ, ධාතූන්ගේ නානත්වය දන්නාහ, මෙසේ අනේකධාතු නානාධාතු ලෝකයේ නානත්වය දන්නාහ. මේ අනේකධාතු නානාධාතු ලෝකයේ නානත්වය දන්නා නුවණ තථාගතයන් වහන්සේ ගේ සතරවන තථාගත බලය ය. ඒ බලය නිසා තථාගතයන් වහන්සේ ලෝකයෙහි ශ්‍රේෂ්ඨ ස්ථානයෙහි ඉන්නා සේක. සිංහ නාදය කරන සේක. බ්‍රහ්මචක්‍රය පවත්වන සේක."

(5) "පුන ච පරං තථාගතෝ සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති, යම්පි තථාගතෝ සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හෝති. යං බලං ආගම්ම තථාගතෝ ආසභං ඨානං පටිජානාති පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තේති" යි.

දක්වෙන පරිදි "ලාමක අදහස් ඇත්තෝ ද ඇත, උසස් අදහස් ඇත්තෝ ද ඇත, ලාමක අදහස් ඇතියෝ ලාමක අදහස් ඇතියවුන් භජනය කරන්නාහ. උසස් අදහස් ඇතියෝ උසස් අදහස් ඇතියවුන් භජනය කරන්නාහ යනාදීන් සත්ත්වයන් ගේ අදහස් දන්නා නුවණ තථාගතයන් වහන්සේ ගේ පස්වන තථාගත බලය ය. ඒ බලය නිසා තථාගතයන් වහන්සේ ලෝකයෙහි ශ්‍රේෂ්ඨස්ථානයෙහි ඉන්නා සේක. පිරිස්හි සිංහනාද කරන්නාහ. බ්‍රහ්මචක්‍රය පවත්වන්නාහ."

(6) "පුන ච පරං තථාගතෝ පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරෝපරියත්තං යථාභූතං පජානාති යම්පි තථාගතෝ පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රිය පරෝපරියත්තං යථාභූතං පජානාති ඉදම්පි තථාගතස්ස තථාගතබලං හෝති. යං බලං ආගම්ම තථාගතෝ ආසභං ඨානං පටිජානාති පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තේති."

යනුවෙන් දක්වෙන පරිදි "තථාගතයන් වහන්සේ මොවුන් ගේ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ තරුණ අවස්ථාවෙහි පවත්නාහ.

Non-commercial distribution

මොවුන්ට මේරූ දියුණු වූ ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයෝ ඇත්තාහ යි සත්ත්වයන් ගේ ඉන්ද්‍රියයන් මෝරා ඇති නැති බව තත් වූ පරිද්දෙන් දන්නාහ. තථාගතයන් වහන්සේ ගේ ඒ පරසත්ත්වයන් ගේ ඉන්ද්‍රිය තත්ත්වය දක්නා ඥානය සවන තථාගත බලය ය. ඒ බලය නිසා තථාගතයන් වහන්සේ ලෝකයෙහි ශ්‍රේෂ්ඨස්ථානයෙහි ඉන්නා සේක. පිරිස්හි සිංහනාද කරන සේක. බ්‍රහ්මචක්‍රය පවත්වන සේක.

(7) "පුන ච පරං තථාගතො ඣානවිමොක්ඛ සමාධි-සමාපත්තීනං සංකිලේසං වෝදනං වුට්ඨානං යථාභූතං පජානාති, යම්පි තථාගතෝ ඣානවිමොක්ඛ සමාධිසමාපත්තීනං සංකිලේසං වෝදනං වුට්ඨානං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හෝති. යං බලං ආගම්ම තථාගතෝ ආසභං ඨානං පටිජානාති පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තේති."

යනුවෙන් දැක්වෙන පරිදි "තථාගතයන් වහන්සේ ප්‍රථමධ්‍යානාදි ධ්‍යාන චතුෂ්කයා ගේ ද අෂ්ට විමෝක්ෂ යන් ගේ ද සවිතර්ක සවිචාර සමාධ්‍යාදි ත්‍රිවිධ සමාධිය ගේ ද නව වැදෑරුම් අනුපූර්වසමාපත්තීන් ගේ ද පිරිහෙන අතට වැටී ඇති බව ද දියුණුවන බව ද ධ්‍යානාදියෙන් නැඟී සිටීම ද තත් වූ පරිදි දන්නාහ. තථාගතයන් වහන්සේ ගේ ඒ ධ්‍යානය ගැන දන්නා නුවණ සත්වන තථාගත බලය ය. ඒ බලය නිසා තථාගතයන් වහන්සේ ලෝකයෙහි ශ්‍රේෂ්ඨස්ථානයෙහි ඉන්නා සේක. පිරිස්හි සිංහනාද කරන සේක. බ්‍රහ්ම චක්‍රය පවත්වන සේක.

(8) "පුන ච පරං තථාගතෝ පුබ්බේනිවාසානුස්සතිං යථාභූතං පජානාති, යම්පි තථාගතෝ පුබ්බේනිවාසානුස්සතිං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගත බලං හෝති යං බලං ආගම්ම තථාගතෝ ආසභං ඨානං පටිජානාති පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තේති."

යනුවෙන් දැක්වෙන පරිදි "තථාගතයන් වහන්සේ තමන් වහන්සේ ගේ පෙර උපන් ජාති පිළිවෙළ මැනවින් දක්නාහ. ඒ පෙර උපන් ජාති පිළිවෙළ දක්නා ඥානය තථාගතයන් වහන්සේ ගේ අටවන තථාගත බලය ය. ඒ බලය නිසා තථාගතයන් වහන්සේ

Non-commercial distribution

ලෝකයෙහි ශ්‍රේෂ්ඨස්ථානයෙහි ඉන්නා සේක. පිරිස්හි සිංහනාද කරන්නාහ. බ්‍රහ්මචක්‍රය පවත්වන්නාහ."

(9) "පුන ච පරං තථාගතෝ සත්තානං චුතූපපාතං යථාභූතං පජානාති. යම්පි තථාගතෝ සත්තානං චුතූපපාතං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගත බලං හෝති, යං බලං ආගම්ම තථාගතෝ ආසභං ඨානං පටිජානාති. පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තේති."

යනුවෙන් දක්වෙන පරිදි තථාගතයන් වහන්සේ අසවල් සත්ත්වයා චුතව අසවල් තැන උපන්නේ ය යි සත්ත්වයන් ගේ ච්‍යුති උත්පත්ති දෙක තත් වූ පරිදි දන්නාහ. තථාගතයන් වහන්සේ ගේ ඒ පරසත්ත්වයන් ගේ ච්‍යුති උත්පත්ති දන්නා නුවණ නව වන තථාගත බලය ය. ඒ බලය නිසා තථාගතයන් වහන්සේ ලෝකයෙහි ශ්‍රේෂ්ඨස්ථානයෙහි ඉන්නා සේක. පිරිස්හි සිංහනාද පවත්වන සේක. බ්‍රහ්මචක්‍රය පවත්වන සේක."

(10) "පුන ච පරං තථාගතෝ ආසවානං ඛයං යථාභූතං පජානාති, යම්පි තථාගතෝ ආසවානං ඛයං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගත බලං හොති. යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති පරිසාසු සීහනාදං නදති බ්‍රහ්මචක්කං පවත්තේති."

යනුවෙන් දක්වෙන පරිදි තථාගතයන් වහන්සේ කාමාදි සකලාශ්‍රවයන් ක්ෂයකොට අර්හත්ඵල සමාධිය ලබා සිටින සේක. නිර්වාණය දක්නා වූ ඒ අර්හත්ඵල ඥනය තථාගතයන් වහන්සේ ගේ දසවන තථාගත බලය ය. ඒ බලය නිසා තථාගතයන් වහන්සේ ලෝකයෙහි ශ්‍රේෂ්ඨස්ථානයෙහි ඉන්නා සේක. පිරිස්හි සිංහනාද කරන්නාහ. බ්‍රහ්මචක්‍රය පවත්වන්නාහ."

මේ දශබලඥනය සංක්ෂේපයෙන් දක්වීම ය. විස්තර දනුකැමැත්තෝ මජ්ඣිම නිකායේ මහාසීහනාද සූත්‍රයෙන් හා අභිධර්ම පිටකයේ විභංගප්‍රකරණයෙන් ද අප විසින් සම්පාදිත **"සූවිසි මහ ගුණය"** පොතෙන් ද බලාගත යුතු ය. තථාගතයන් වහන්සේට නොයෙක් ඥන ඇත්තේ ය. ඇතමෙක් "දශබලඥනයය

Non-commercial distribution

කියා අමුතු ඥාන දශයක් නැත. ඒවාත් සර්වඥතාඥානයේ ප්‍රභේදමය" යි කියති. එය වැරදි මතයෙකි. සර්වඥතාඥානය අනෙකකි. දශබලඥානය එයින් අන්‍ය ඥාන දශයෙකි. ඒ ගැන වැඩිදුර කරුණු විභංග අටුවාවෙන් බලාගත යුතු.

## බ්‍රහ්මචක්‍රය

**"බ්‍රහ්මචක්කං පවත්තේති"** යන තැන බ්‍රහ්මචක්‍රයයි කියනුයේ ධර්ම චක්‍රයට මය. බ්‍රහ්මචක්ක යන්නෙහි තේරුම ශ්‍රේෂ්ඨචක්‍රය යනුයි. බ්‍රහ්ම ශබ්දය ශ්‍රේෂ්ඨාර්ථයෙහි ය. කැරකෙන කල්හි එයට හසුවන සැමදෙයම කැපී යන රෝදයකට චක්‍රායුධය ය යි කියනු ලැබේ. එය පැරණි ආයුධයකි. තථාගතයන් වහන්සේ ගේ චතුරාර්‍ය්‍ය සත්‍යය දක්නා ඥානයත් කෙලෙස් සතුරන් විනාශ කරන්නක් බැවින් චක්‍රායුධයක් වැනි ය. තථාගතයන් වහන්සේ ගේ ඒ ඥානය ප්‍රතිවේධඥාන - දේශනාඥාන වශයෙන් දෙවැදෑරුම් වේ.

**ප්‍රතිවේධ ඥානය** එක් ධර්ම චක්‍රයෙකි. එයින් තථාගතයන් වහන්සේ ගේ සන්තානයෙහි වූ කෙලෙස් කැපී විනාශ වී ගියේ ය. **දේශනා ඥානය** මෙහෙයා දහම් දෙසන කල්හි එය අසන්නා වූ ජනයාගේ සන්තානයෙහි කෙලෙස් කැපී නැසී වැනසී යන්නේ ය. විනේයජනයන් ගේ සන්තානයෙහි කෙලෙස් නැසෙන වැනසෙන පරිදි දේශනාඥානයෙන් ධර්මය දේශනය කිරීම ධර්මචක්‍රය පැවැත්වීම ය. කරකැවීම ය. සෙස්සනට ද ප්‍රතිවේධ ඥාන දේශනාඥාන ඇතද බ්‍රහ්මචක්ක - ධම්මචක්ක යන නම් ඒවාට නො කියනු ලැබේ. ඒ නම් ව්‍යවහාර වන්නේ තථාගතයන් වහන්සේ ගේ ඥානයට පමණෙකි.

## චතුර්වෛශාරද්‍ය ඥානය

තථාගතයන් වහන්සේ ගේ වෛශාරද්‍ය ඥාන සතර මහාසීහනාද සූත්‍රයෙහි මෙසේ වදාරා තිබේ.

(1) "සම්මාසම්බුද්ධස්ස තේ පටිජානතෝ ඉමේ ධම්මා අනභිසම්බුද්ධාති, තත්‍ර වත මං සමණෝ වා බ්‍රාහ්මණෝ වා දේවෝ වා මාරෝ වා බ්‍රහ්මා වා කෝචි වා ලෝකස්මිං සහධම්මේන

Non-commercial distribution

පටිචෝදෙස්සතීති නිමිත්ත මේතං සාරිපුත්ත! න සමනුපස්සාමි. ඒතම්පාහං සාරිපුත්ත! නිමිත්තං අසමනුපස්සන්තෝ ඛේමප්පත්තෝ වේසාරජ්ජප්පත්තෝ විහරාමි.

(2) ඛීණාසවස්ස තේ පටිජානතෝ ඉමේ ආසවා අපරික්ඛීණාති, තත්‍ර වත මං සමණෝ වා බ්‍රාහ්මණෝ වා දෙවෝ වා මාරෝ වා බ්‍රහ්මා වා කෝචි වා ලෝකස්මිං පටිචෝදෙස්සතීති නිමිත්තමේතං සාරිපුත්ත! න සමනුපස්සාමි. ඒතම්පාහං සාරිපුත්ත! නිමිත්තං අසමනුපස්සන්තෝ ඛේමප්පත්තො අභයප්පත්තෝ වෙසාර-ජ්ජප්පත්තෝ විහරාමි.

(3) යේ ඛෝ පන තේ අන්තරායිකා ධම්මා වුත්තා තේ පටිසෙවතෝ නාලං අන්තරායාති, තත්‍ර වත මං සමණෝ වා බ්‍රාහ්මණෝ වා දේවෝ වා මාරෝ වා බ්‍රහ්මා වා කෝචි වා ලෝකස්මිං සහධම්මේන පටිචෝදෙස්සතීති නිමිත්තමේතං සාරිපුත්ත! න සමනුපස්සාමි. ඒතම්පාහං නිමිත්තං සාරිපුත්ත! අසමනුපස්සන්තෝ ඛේමප්පත්තෝ අභයප්පත්තෝ වේසාරජ්ජප්පත්තෝ විහරාමි.

(4) යස්ස ඛෝ පන තේ අත්ථාය ධම්මෝ දේසිතෝ සෝ න නියාාති තක්කරස්ස සම්මාදුක්ඛක්ඛයාති. තත්‍ර වත මං සමණෝ වා බ්‍රාහ්මණෝ වා දේවෝ වා මාරෝ වා බ්‍රහ්මා වා කෝචි වා ලෝකස්මිං සහධම්මේන පටිචෝදෙස්සතීති නිමිත්ත-මේතං සාරිපුත්ත! න සමනුපස්සාමි. ඒතම්පාහං සාරිපුත්ත! නිමිත්තං අසමනුපස්සන්තෝ ඛේමප්පත්තෝ අභයප්පත්තෝ වේසාරජ් ජප්පත්තෝ විහරාමි.

(1) තථාගතයන් වහන්සේ තමන් වහන්සේ සියල්ල ම මනාකොට දන සිටින්නාහ යි ප්‍රතිඥ කෙරෙති. "නුඹ වහන්සේ සියල්ල දනිම්හ යි ප්‍රතිඥ කරතත් අසවල් කරුණ දන ගෙන නැතය කියා" ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ අන් කවරකු විසින් හෝ කරුණු සහිතව චෝදනා කරනු ඇතය කියා කිසි බියක් තථාගතයන් වහන්සේට නැත. තමන් වහන්සේ ගේ සර්වඥත්වය පිළිබඳව කිසි අඩුවක් නැති බව දන්නා උන්වහන්සේ ගේ ඥනය එක් වෛශාරද්‍ය ඥනයකි.

Non-commercial distribution

(2) තථාගතයන් වහන්සේ කාමාදි සකලා ශ්‍රවයන් ක්ෂය කර සිටිම්හ යි ප්‍රතිඥ කරන්නාහ. “සකලාශ්‍රවයන් ක්ෂය කර සිටිම්හ යි ප්‍රතිඥ කරන ඔබ තවම අසවල් ආශ්‍රවය ක්ෂය කර නැතය” යි හේතු සහිතව කිසිවකු විසින් චෝදනා කරනු ඇතය යන බියක් උන් වහන්සේට නැත. තමන් වහන්සේ ගේ ආශ්‍රවක්ෂයෙහි කිසි අඩුවක් පාඩුවක් නැති බව දන්නා ඥනය එක් වෛශාරද්‍ය ඥනයෙකි.

(3) “තථාගතයන් වහන්සේ විසින් අන්තරායික ධර්ම සැටියට ප්‍රකාශ කර ඇති යම්කිසි කරුණක් අන්තරායික නො වේය” යි හේතු සහිතව දක්වා යම්කිසි කෙනකුන් විසින් චෝදනා කරනු ඇතය කියා බියක් උන් වහන්සේ ට නැත. තථාගතයන් වහන්සේ ගේ ඒ බව දක්නා ඥනය එක් වෛශාරද්‍ය ඥනයෙකි.

(4) “තථාගතයන් වහන්සේ විසින් දේශනය කරන ධර්මය අනුව පිළිපදින්නාහට ඒ පිළිවෙතින් දුක් කෙළවර කළ නො හේය” යි යම් කිසිවකු විසින් හේතු සහිතව චෝදනා කරනු ඇතය කියා බියක් උන් වහන්සේට නැත. තථාගතයන් වහන්සේ ගේ ඒ බව දක්නා ඥනය එක් වෛශාරද්‍ය ඥනයෙකි. මෙසේ වෛශාරද්‍ය ඥන සතරක් ඇත්තේ ය.

බල ඥන දශය, වෛශාරද්‍ය ඥන සතරය යන මේ ඥන තුදුස යමකුට ඇත්තේ නම් ඒ තැනැත්තා ලෝකයෙහි ආශ්චර්‍ය්‍ය පුද්ගලයෙකි. එබඳු පුද්ගලයකුට කිසි විටෙක වැරදීමක් නො විය හැකි ය. යම්කිසි දේශනයක් අසන්නහුට අවබෝධ වේ නම් එය ගැන අසන්නහුට සැකයක් ඇති නො වේ. එකෙණෙහි ම එය පිළිගැනේ. යම් දේශනයක් අසන්නහුට අවබෝධ නො වේ නම් එය ගැන සැක ඇති වේ. වාද ඇති වේ. පරම ගම්භීර ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය අසන්නහුට ලෙහෙසියෙන් අවබෝධ වන්නේ නො වේ. එබැවින් එය ගැන සැක ඇති වේ. වාද ඇති වේ. අවබෝධ නො වන දෙයක් පිළිගන්නවා නම් පිළිගැනෙන්නේ දේශකයා කෙරෙහි ඇති විශ්වාසය උඩය.

ගැඹුරු ධර්මයක් දේශනය කරන කල්හි ශ්‍රාවකයන් කෙරෙහි ශ්‍රද්ධාව නො තුබුණ හොත් ඔවුහු “ඕවා අපට තේරෙන්නේ

Non-commercial distribution

නැත" කියා ඒ ධර්මය අහක දමනවා මිස එය ගැන සැලකිල්ලක් නො දක්වති. ශ්‍රද්ධාව ඇත්තෝ නො තේරෙන ධර්මය වුවද ඇසූ කල්හි "මෙය නො තේරෙන්නේ අපේ දුබලකම නිසා ය. මෙය තේරුම් ගැනීමට අප උත්සාහ කරන්නට ඕනෑය"යි සිතා ඒ ධර්මය මතක තබා ගන්නටත් අවබෝධකර ගන්නටත් උත්සාහ කෙරෙති. ධර්මය ගැන සැලකිල්ල දක්වති. ඒ සැලකිල්ල නිසා ශ්‍රාවකයෝ ඒ ධර්මය මතක තබා ගෙන එයට අනුව පිළිපැද කවද හෝ ඒ ධර්මය අවබෝධ කර ගෙන නිවන් පසක් කර ගනිති. තථාගතයන් වහන්සේ මේ සූත්‍රයේ දී දශබලඥාන චතුවෛශාරද්‍ය ඥානයන් දක්වීමෙන් ආත්ම වර්ණනාවක් හා ධර්ම වර්ණනාවක් කරන ලදුයේ භික්ෂූන්ට ශ්‍රද්ධාව ඇතිකරනු පිණිස ය.

## පඤ්චස්කන්ධය

මේ දශබල සූත්‍රයේදී තථාගතයන් වහන්සේ විසින් පඤ්චස්කන්ධය පළමුකොට දක්වා වදාරා, පසුව පටිච්චසමුප්පාදය දක්වා තිබෙන්නේ පටිච්චසමුප්පාදය හොඳින් තේරුම් ගත හැකි වීමට පඤ්චස්කන්ධය පිළිබඳ දැනුම ඉතා ප්‍රයෝජන බැවිනි. පඤ්චස්කන්ධයට අයත් නාමරූපයන් වෙන් වෙන් වශයෙන් අභිධර්ම පොත්වල විස්තර කර ඇති සැටියට දනගෙන ඉන්නා අයට ප්‍රතීත්‍යසමුත්පාද දේශනය ඇසූ කල්හි එය හොඳින් වටහාගත හැකි ය. ඒ පරමාර්ථ ධර්මයන් ගැන නො දත් කෙනකු පටිච්චසමුප්පාදය ගැන කොතෙක් ඇසුවත් කොතෙක් එය ගැන පොතපත කියෙව්වත් ඔහුට පටිච්චසමුප්පාදය පිළිබඳ හොඳ අවබෝධයක් නො වේ. එබැවින් නාමරූප ධර්ම ටික බුදුදහම තේරුම් ගනු කැමති සැමදෙනා විසින් ම පළමුකොට උගත යුතු ය.

මෙය පඤ්චස්කන්ධය ගැන සෑහෙන විස්තරයක් කිරීමට සුදුසු තැනක් නො වේ. මෙහි එය ගැන සාමාන්‍ය හැඳින්වීමක් පමණක් කරනු ලැබේ. අප විසින් සම්පාදිත **චතුරාර්ය සත්‍යය** නමැති පොතෙහි පඤ්චස්කන්ධය පිළිබඳ තරමක විස්තරයක් ඇත. පඤ්චස්කන්ධයට අයත් නාමරූප ධර්මයන් පිළිබඳ විස්තරයක් අප විසින් සම්පාදිත **අභිධර්මයේ මූලික කරුණු** නමැති පොතෙහි ද

Non-commercial distribution

ඇත්තේ ය. පඤ්චස්කන්ධය ගැන දනුම ඇතිකර ගැනීමට ඒ පොත් කියවීම ප්‍රයෝජන වන බව මතක් කරමු.

මිනිසාය - ඇතාය - අශ්වයාය - ගවයාය - බල්ලාය - බළලාය යනාදි නම් තබාගෙන පුද්ගලයන් සත්ත්වයන් සැටියට සලකන්නේ ධාතු සමූහයන් ය. මිනිසාය කියනුයේ එක් ධාතු සමූහයකට ය. ඇතාය කියනුයේ තවත් ධාතු සමූහයකට ය. අශ්වයාය කියනුයේ තවත් ධාතු සමූහයකට ය. ඇත්ත වශයෙන් මිනිසකු ඇතිනම් ඒ මිනිසා එක් දෙයක් විය යුතු ය. ඇතකු ඇති නම් ඒ ඇතාත් එක් දෙයක් විය යුතු ය. මිනිසාය කියා සලකන දෙය විභාගකර බැලුවහොත් එතැන ඇත්තේ ධාතු බොහෝ ගණනකි. ඒ ධාතුහු ද නිතරම ඇත්තාහු නො වෙති.

ගලායන ගංගාවක් දෙස යම් තැනක සිට බලන්නකුට ජලස්කන්ධයක් පෙනේ. අද ගඟ දෙස බලා නැවත හෙට බැලුවාමත් අනිද්දා බැලුවාමත් වෙනසක් නැතිව ජලස්කන්ධය පෙනෙන්නට තිබේ. බැලූ තැනැත්තා අද දුටුයේත් ඊයේ දුටුයේත් පෙරෙයිදා දුටුයේත් එකම ජලස්කන්ධය ය යි සිතයි. එහෙත් අද ගඟ බලා හෙට ඇවිත් බලන කල්හි ඔහුට අද දුටු ජලයෙන් බිඳක්වත් හෙට දක්නට නො ලැබේ. හෙට ඔහු පැමිණ බලන්නට කලින් අද එතැන තුබූ ජලය සම්පූර්ණයෙන් ම බැස යන්නේ ය. ඉහළින් තුබූ ජලය එතැනට පැමිණෙන්නේ ය. හෙට ඔහුට දක්නට ලැබෙන්නේ අද නුදුටු ඒ අලුත් ජලය ය. ඒ අලුත් ජලය දක ඔහු ගිය පසු ඒ සියල්ල පහළට යන්නේ ය. අනිද්දා ඔහු ඇවිත් බැලුවාම ඔහුට දක්නට ලැබෙන්නේ ඊයේ දුටු ජලය නොව පසුව එහි පැමිණි ජලයෙකි.

එක් එක් සන්තානයක අවිද්‍යාසංස්කාරාදි හේතූන් නිසා හටගන්නා වූ නාමරූප ධාතු සමූහයන් ගංගා ජලය මෙන් සලකාගත යුතු ය. ගඟෙහි හෙට දක්නට ලැබෙන ජලය අද දුටු ජලය නො වන්නාක් මෙන් අනිද්දා දක්නට ලැබෙන්නේ හෙට දක්නා ජලය නො වන්නාක් මෙන් පුද්ගලයකු වශයෙන් සලකන නාම රූප ධාතු සමූහයක අද ඇති ඒවායින් ස්වල්පයකුදු හෙට නැත. හෙට ඇති ඒවායින් ස්වල්පයකුදු අනිද්දාට නැත. උදේ තුබූ ධාතූන්ගෙන් ස්වල්පයකුදු සවස නැත. එක් පැයක තුබූ

Non-commercial distribution

ධාතුන්ගෙන් ස්වල්පයකුදු ඊළඟ පැයෙහි නැත. එක් විනාඩි-යකදී තුබූ ඒවායින් ස්වල්පයකුදු ඊළඟ විනාඩියේදී නැත. ගඟෙහි පෙනෙන ජලය මෙන් නිතරම ඇත්තේ අලුත් නාම රූප ජාතීන් ය.

පුද්ගලයාය කියනුයේ අදත් හෙටත් අනිද්දත් මේ සතියේදීත් මේ මාසයේදීත් ලබන මාසයේදීත් මේ වර්ෂයේදීත් ලබන වර්ෂයේදීත්, එක් කෙනකු වශයෙන් මැරෙන තුරු ඉන්නා කෙනෙකි. සමහරුන් සලකන සැටියට මැරෙන්නේත් නැතිව දෙවන තුන්වන ජාතිවලටත් යන දෙයකි. මේ නාම රූප ජාති පරම්පරාවෙහි එබඳු කල් පවත්නා කිසිම දෙයක් නැත. ඒ පුද්ගලයා, ඉබිලොම් - කවුඩුදත් - සා අං යනාදිය මෙන් සිතෙන් මවාගෙන ඇති සැටියට සලකන දෙයකි. ඇති සැටියට සලකන පුද්ගලයා ඇත්තටම නැතත් ඒ සැලකීමෙන් ඒ වැරදි හැඟීමෙන් ඇතිවන නපුර නම් සත්‍ය වශයෙන් ම ඇතියකි.

අවිද්‍යා සංස්කාරාදි ද්වාදශාංගයෙන් යුක්ත වන මේ දුඃඛස්-කන්ධයා ගේ නො සිඳී පැවැත්මට, නැති පුද්ගලයකු ඇතය යන ඒ වැරදි හැඟීම බලවත් හේතුවකි. සත්කාය දෘෂ්ටියය කියනුයේ ද එයටම ය. අවිද්‍යාදි හේතුඵල ධර්ම පරම්පරාව වූ නාමරූප ධාතු සමූහය නිසා පවත්නා වූ සත්කාය දෘෂ්ටි සංඛ්‍යාත ඒ වැරදි හැඟීම් දුරුකර ගැනීම පහසු වනු පිණිස තථාගතයන් වහන්සේ විසින් ඒ නාම රූප ධාතු සමූහය **රූපස්කන්ධය**, **වේදනාස්කන්ධය**, **සඤ්ඤාස්කන්ධය**, **සංස්කාරස්කන්ධය**, **විඤ්ඤාණස්කන්ධය** කියා ඖදරික වශයෙන් කොටස් පසකට බෙදා තිබේ.

**රූපස්කන්ධය** යනු පඨවි ආපෝ තේජෝ වායෝ යන ධාතු සතර හා ඒ සතර නිසා හටගන්නා වූ වර්ණ ගන්ධ රසාදි රූප සමූහය ය. රූපස්කන්ධය යි වෙන්කර ඇත්තේ පුද්ගලයා වශයෙන් සලකන ධාතු සමූහයෙහි ඉතා ඖදරික වූ කොට්ඨාශය ය. අභිධර්ම ක්‍රමයේ සැටියට වෙන් වෙන් වශයෙන් කියත හොත් රූප අටවිස්සක් ඇත්තේ ය. රූප අටවිස්සක් ඇතත් සෑම ශරීරයක ම රූප අටවිස්සක් නැත්තේ ය. අංග සම්පූර්ණ වූ එක් ශරීරයක තිබිය හැකි වැඩිම රූප ගණන සත්විස්සකි. අටවිස්ස යන මේ ගණන ශරීරවල තිබිය හැකි සියලුම රූප එක්කළ කල්හි ලැබෙන ගණන ය.

Non-commercial distribution

බඹයක් පමණ උසට වැඩී ඇති මිනිස් සිරුර රූපස්කන්ධය ය. අනිකුත් සත්ත්වයන් ගේ ශරීරත් රූපස්කන්ධ ම ය. රූපස්කන්ධයට දැනීමක් නැත. ක්‍රියා කිරීමේ සමත් බවකුත් නැත. රූපස්කන්ධය ක්‍රියා කරන්නාක් මෙන් පෙනෙන්නේ කාරක ශක්තියක් එහි ඇති නිසා නොව විඥ්ඥාණ ධාතුවේ බලයෙන් විඥ්ඥාණ ධාතුව අනුව එහි යාම් ඊම් ආදි සෙලවීම් සිදුවන බැවිනි.

රූපස්කන්ධය කරත්තයක් වැනි බව කිය යුතු ය. යා හැකි ශක්තියක් කරත්තයට නැත, තුබූ තැනම දිරා යනවා මිස කරත්තය කවදවත් නො යන්නේ ය. කිසි කලෙක යන්නට සිතෙන්නේ නැත. කරත්තය සෙලවෙන්නේ කරත්තය තැනින් තැන යන්නේ, ගොනකු විසින් හෝ මිනිසකු විසින් ඇද්දහොත් ය. එමෙන් රූපස්කන්ධය ද තුබූ තැන ම තිබෙන්නකි. සෙලවෙන්නේ විඥ්ඥාණ ධාතුව විසින් සෙලවුව හොත් පමණෙකි. කිසි ක්‍රියාවක් කිරීමට සමත් කමක් නැති කිසි ක්‍රියාවක් කවදවත් නො කරන රූපස්කන්ධය හැමදෙයම කරන සුවදුක් විඳින පුද්ගලයකු විය හැකි ද? නො විය හැකිම ය.

**වේදනාස්කන්ධය** මෙසේ දත යුතු ය. වස්තු දෙකක් එකට සැපුණාම පෙර නො තුබූ හඬක් පහළ වන්නාක් මෙන්, ගිනි පෙට්ටියෙහි ගිනිකූර ඇතිල්ලූනාම නො තුබූ ගින්නක් පහළ වන්නාක් මෙන්, චක්ඛු-සෝත-ඝාණ-ජිව්හා-කාය-මන යන මේ ඉන්ද්‍රියයන්හි රූපාදි අරමුණක් සැපුණාම සුඛස්වභාවයක් හෝ දුඃඛ ස්වභාවයක් හෝ ඒ අරමුණ පිළිබඳව මධ්‍යස්ථ ස්වභාවයක් හෝ ඒ සන්තානයෙහි ඇති වේ. මේ ධර්මයන්හි වේදනා නාමයෙන් හඳුන්වන්නේ ඒ ස්වභාව තුන ය.

සාමාන්‍ය ජනයා අතර රිදීමට හෙවත් ඉවසිය නො හෙන ස්වභාවයට වේදනාව ය යි කියනු ලැබේ. වේදනාස්කන්ධ ය යි කියනුයේ ඒ රිදීමට ය කියා වරදවා නො ගත යුතු ය. බුදු දහමෙහි උගන්වන වේදනා ස්කන්ධයට ඒ රිදීමත් ඇතුළත් ය. දුඃඛ වේදනාව ය - දෝමනස්ස වේදනාවය කියනුයේ ඒ රිදීමට ය. බුදු දහමේ දැක්වෙන වේදනා ස්කන්ධයට සනීපයත් අයිති ය. සුඛ වේදනාවය - සෝමනස්ස වේදනාවය යන නම්

Non-commercial distribution

කියනුයේ සාමාන්‍ය ජනයා විසින් සනීපයය - සැපයය කියා සලකන දෙයට ම ය.

සැප සනීප කෙසේ දැයි ඇසුව හොත් සැප දුක් දෙකම නැති කල්හි එයට දෙන පිළිතුර වරදක් නැතය කියා ය. එයින් අදහස් කරන්නේ මධ්‍යස්ථ භාවය ය. බුදු දහමෙහි උපේක්‍ෂා වේදනාවය යන නාමය ව්‍යවහාර කරන්නේ ඒ වරදක් නැතය කියන ස්වභාවයට ය.සුඛ වේදනාවය දුඃඛ වේදනාවය උපේක්‍ෂා වේදනාවය කියා එක් ක්‍රමයකින් වේදනා තුනක් ද, සුඛ- වේදනාවය, සෝමනස්ස වේදනාවය, දුඃඛ වේදනාවය, දෝමනස්ස වේදනාවය, උපේක්‍ෂා වේදනාවය කියා තවත් ක්‍රමයකින් වේදනා පසක් ද තථාගතයන් වහන්සේ විසින් වදාරා තිබේ. ඒවායේ විස්තර වුවමනා නම් අභිධර්ම පොත්වලින් උගත යුතු ය. වේදනා ස්කන්ධය යි කියනුයේ ඒ වේදනා රාශියට ය.

දුඃඛ වේදනාවක් ඇතිකරවන අනිෂ්ටාරම්මණයක් ඉන්ද්‍රියයන්හි ගැටුණාම දුඃඛ වේදනාවක් ඇතිවීම වැළැක්වීමේ ශක්තියක් කාහටවත් නැත්තේ ය. කාගේවත් විධානයක් නැතිව දුඃඛ වේදනාවට හේතුවන අරමුණ ඉන්ද්‍රියයන්හි ගැටුණාම දුඃඛ වේදනා ඉපිද නිරුද්ධ වන්නේ ය. සුඛ වේදනාව ඇති කරන අරමුණක් ඉන්ද්‍රියයන්හි ගැටුණාම ද කාගේවත් විධානයක් නැතිව සුඛ වේදනාවක් ඇති වී නිරුද්ධ වන්නේ ය. සුඛ වේදනාව හොඳය කියා එය නිරුද්ධ වන්නට නොදී කල් පවත්වා ගැනීමේ ශක්තියක් කාහටවත් නැත්තේ ය.

ඒ ඒ අරමුණු ගැටීම හේතු කොට ගෙන මේ නාම රූප ධර්ම පරම්පරාවෙහි ඒ ඒ වේදනා ඇතිව නැතිව යනවා මිස ඒවා පාලනය කරන පවත්වන කිසිවකු ඒ නාම රූප ධර්ම අතර නැත. වේදනාව ඇතිව නැතිව යනවා මිස, විඳින පුද්ගලයෙක් නැත. හේතුන් ගේ සංයෝගයෙන් ඉපිද බිඳී යන ඒ වේදනා රාශිය ද පුද්ගලයකු නො විය හැකි ය.

**සංඥාස්කන්ධය** මෙසේ දතයුතු. චක්ෂුරාදි ද්වාර සයට රූපශබ්දාදි අරමුණු පැමිණෙන කල්හි, රූපශබ්දාදි අරමුණු ද්වාරයන්හි ගැටෙන කල්හි, ඒ අරමුණු නිසා සැපදුක් ඇතිවන්නාක්

Non-commercial distribution

මෙන් ම, නිලය - රතය - සුදය - උස් දෙයය - මිටි දෙයය - කුඩා දෙයය - මහත් දෙයය - වට දෙයය - සතරැස් දෙයය - මිනිසාය - සිංහලයාය - දෙමළාය - ගැහැනියය - පිරිමියාය - ළමයාය - තරුණයාය - මහල්ලාය - මවය - පියාය - සහෝදරයාය - සහෝදරිය - ගවයාය - එළුවාය - බල්ලාය - බළලාය - ඉරය - සඳය - තාරකාවය - පොළොවය - කන්දය - ගසය - ගලය - ගෙයය - ඇඳය - පුටුවය යනාදි හැඟීම් ඇති වේ. එසේ ඇති වන්නා වූ හැඟීම් රාශියට සංඥාස්කන්ධය යි කියනු ලැබේ.

ස්කන්ධ පස අතුරෙන් සංඥාස්කන්ධය විශාල ම ස්කන්ධය සැටියට කිය යුතු ය. ලෝකයෙහි බොහෝ භාෂා ඇත්තේ ය. එක් එක් භාෂාවක වචන ද බොහෝ ගණනක් ඇත්තේ ය. භාෂාවල ඇති ඒ වචන ගණනාවට එක එක සංඥාව බැගින් ඇත්තේ ය. ලෝකයෙහි අප්‍රමාණ සත්ත්වයෝ ඇතහ. සත්ත්ව ගණනට ම සංඥා ද ඇත්තේ ය. ලෝකයෙහි ප්‍රමාණයක් නො කළ හැකි තරමට ද්‍රව්‍ය ද ඇත්තේ ය. ඒ සියලුම ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් ද්‍රව්‍ය ගණනට ම සංඥා ද ඇත්තේ ය. ද්‍රව්‍යයන්ගේ චලනයන් වූ ක්‍රියා ද බොහෝ ඇත්තේ ය. ක්‍රියා ගණනට සංඥා ද ඇත්තේ ය. මෙසේ බලන කල්හි ප්‍රමාණය නො කළ හැකි තරමට සංඥා ඇති බව තේරුම් ගත හැකි ය.

ලෝකයෙහි ඇති තාක් සංඥා සියල්ල ම එක් සන්තානයක ඇති වන්නේ නොවේ. සංඥාස්කන්ධයට අයත් අප්‍රමාණ සංඥාවන්ගෙන් යම් කිසි ප්‍රමාණයක් එක් සන්තානයක ඇති වේ. ඉගෙනීම ය යි කියනුයේ ද සංඥාස්කන්ධ මහත් කිරීම ය. දියුණු කිරීම ය. උගතුන් ගේ සන්තානයෙහි බොහෝ සංඥා ඇත්තේ ය. නූගතුන් ගේ සන්තානයෙහි ඇත්තේ සංඥා ස්වල්පයකි. තිරිසන් සතුන් ගේ පටන් සැමදෙනා කෙරෙහි ම සංඥා එක්තරා ප්‍රමාණයක් ඇත්තේ ය. තිරිසනුන්ට ආහාර පානාදිය සපයා ගැනීමටත් ආත්මය ආරක්‍ෂා කර ගැනීමටත් උපකාර වන්නේ මේ සංඥාව ම ය.

කිසිවකු ගේ සංවිධානයක් නැතිව ද්වාරයන්හි අරමුණු ගැටීමෙන් ඒ අරමුණේ සැටියට යම් කිසි වේදනාවක් ඇති වන්නාක් මෙන් ම සංඥාව ද ද්වාරයන්හි අරමුණු ගැටීම නිසා කිසිවකු ගේ

Non-commercial distribution

සංවිධානයක් නැතිව ම ගැටීමට පැමිණි අරමුණුවල සැටියට ම ඇති වන්නකි. ඕනෑ සැටියට සංඥවන් ඇති කරවන්නා වූ සංඥ කෙරෙහි අධිපති කම පවත්වන සංඥවන් ගේ අයිතිකාරයකු වූ පුද්ගලයෙක් මේ නාමරූප ධර්ම අතර නැත. ඉන් පිටත ද නැත. ද්වාරයන්හි අරමුණු ගැටීම නිසා වේදනාව සේ ම ඉපද ඉපද බිඳි බිඳී යන සංඥව සත්ත්වයෙක් පුද්ගලයෙක් නො වේ. ධාතු මාත්‍රයෙකි.

**සංස්කාරස්කන්ධය මෙසේය** :- රූපාදි අරමුණු චක්ෂුරාදි ද්වාරයන්හි ගැටුණු කල්හි වේදනාව හා සංඥ ඇතිවීමෙන් පමණක් නවත්නේ නො වේ. ඒවායින් සමහරක් ගැන හොඳය කියා තණ්හාව ඇති වේ. සමහරක් ගැන නරකය කියා ද්වේෂය ඇති වේ. එබැවින් ද්වාරයන්හි ගැටුණු ඒ රූපාදිය නිමිත්තෙන් ඒවා ඇති කිරීම් - රැස්කිරීම් - පරෙස්සම් කිරීම් - විනාශ කිරීම් - ඉවත් කිරීම් - ඉවත්වීම් - භුක්තිවිඳීම් ආදිය සම්බන්ධයෙන් යාම් - ඊම් - දීම් - ගැනීම් - කෑම් - පීම් - අනුබල දීම් - පීඩා කිරීම් - බොරු කීම් - කේළාම් කීම් - ඵරුෂ වචන කීම් - සාමාන්‍යයෙන් කතා කිරීම් ආදි බොහෝ කායික වාචසික මානසික ක්‍රියා සිදු වේ. ඒ ක්‍රියා සිදුකරන ශක්තිය වූ චේතනාව ප්‍රධාන වශයෙන් සංස්කාර නම් වේ.

සිදු කරන්නා වූ ක්‍රියාවන්ගේ නානත්වයෙන් බොහෝ චේතනා ඇත්තේ ය. ඒ චේතනා සමූහය එක්කොට සියල්ලට ම සංස්කාරස්කන්ධ ය යි කියනු ලැබේ. චේතනාව හා එක්වන ලෝභ - ද්වේෂ - මාන - දෘෂ්ටි - ඊෂ්‍යා - මාත්සය්‍ය - ශ්‍රද්ධා - ප්‍රඥ - මෛත්‍රී - කරුණාදි තවත් ධර්ම රාශියක් ඇත්තේ ය. ඒ සියල්ල ද සංස්කාරස්කන්ධයට ම අයත් ය. සංස්කාරස්කන්ධයට අයත් චෛතසික ධර්ම පනසක් ඇත්තේ ය. ඒවා වුවමනා නම් අභිධර්ම පොත්වලින් උගත යුතු ය.

**සංඛාර** යන වචනය පිටකත්‍රයෙහි නොයෙක් තැන්වල යෙදී ඇත්තේ ය, ඒ වචනයේ අර්ථ කීපයක් ඇත්තේ ය. මේ ස්කන්ධ කථාවෙහි එන සංස්කාර යන පදයේ අර්ථය වශයෙන් ගත යුත්තේ දෙපනස් චෛතසිකයන්ගෙන් වේදනා - සඤ්ඤා යන චෛතසික දෙක හැර ඉතිරි චෛතසික පනස ය. අනික් තැන්වල එන සංඛාර

Non-commercial distribution

යන වචනයෙන් ඒ ඒ තැනට සුදුසු අර්ථය ගත යුතු ය. සෑම තැනදීම එකම අර්ථය ගන්නට ගොස් ධර්මය අවුල් කර නො ගත යුතු ය.

සාමාන්‍යයෙන් බලන කල්හි ගමනාදි ක්‍රියා ශරීරය විසින් සිදු කරන්නාක් මෙන් පෙනේ. ශරීරයට ක්‍රියා කළ හැකි ශක්තියක් නැත. ඒ ඒ ක්‍රියා සිදු කිරීමේ උත්සාහය වූ චේතනාව සිත හා බැඳී උපදින චෛතසික ධර්මයකි. චේතනාව උපදනා කල්හි එයට අනුව සිත ද තවත් චෛතසික ද ඇති වේ. ඒ චිත්ත චෛතසික ධර්ම රාශිය නිසා උත්සාහ කරන ක්‍රියාව සිදුවීමට සුදුසු පරිදි අත්පා ආදිය සොලවන එහා මෙහා යවන වායුවක් ශරීරය තුළ ඇති වේ. එයින් ගමනාදිය සිදු වේ. එය සිදු කරන ප්‍රධාන ධර්මය එකම චේතනාවය. එබැවින් එයට සංඛාර ය යි කියනු ලැබේ.

චේතනාව නිසාම ගමනාදි ඒ ඒ ක්‍රියා සිදු වෙනවා මිස සත්ත්වයා ලෙස සලකන මේ නාමරූප ධාතු පුඤ්ජයෙහි ගමනාදි ක්‍රියා සිදු කරන පුද්ගලයෙක් නැත. ආත්මයක් නැත. වේදනා සංඥවන් සේ ද්වාරයන්ට අරමුණු පැමිණීම නිසා ඉපද ඉපද ඒ ඒ මොහොතේ ම නැතිවී යන ඒ චේතනාද පුද්ගලයකු නො විය හැකි ය. ආත්මයක් නො විය හැකි ය.

**විඥනස්කන්ධය මෙසේය** :- ඇසට රූපයක් එළඹ සිටින කල්හි ඒ දෙය පෙනේ. පෙනීමය යි කියනුයේ ඒ රූප දක්නා සිත ඇතිවීමට ය. විඥනය යි කියනුයේ සිතට ය.

ඇසට රූපයක් එළඹ සිටි කල්හි ඇතිවන, දක්නා සිතට චක්ඛුවිඤ්ඤාණය යි කියනු ලැබේ. කනට ශබ්දයක් පැමිණි කල්හි ඇසීම සිදු වේ. ඒ ඇසීම කෙරුණු සිත සෝත විඤ්ඤාණ නම් වේ. නැහැයට ගන්ධයක් පිවිසි කල්හි ගඳ දැනීමක් සිදු වේ. ගඳ දැනගන්නා වූ ඒ සිත ඝාණවිඤ්ඤාණ නම් වේ. දිවට රසය ඇති දෙයක් පැමිණි කල්හි රස දැනීම සිදු වේ. රසය දැන ගන්නා වූ සිත ජිව්හාවිඤ්ඤාණ නම් වේ. ශරීරයෙහි යම් කිසිවක් සැපුණු කල්හි ඒ සැපීම දැනේ. සැපීම දන්නා වූ සිත කායවිඤ්ඤාණ නම් වේ. මනෝද්වාරය යම් කිසිවකට යොමු වූ විට ඒ දෙය දැනගැනීම් වශයෙන් සිතක් උපදී. ඒ සිත මනෝවිඤ්ඤාණ නම් වේ. චක්ඛුවිඤ්ඤාණ සෝතවිඤ්ඤාණ ඝාණවිඤ්ඤාණ ජිව්හා

Non-commercial distribution

විඤ්ඤාණ කායවිඤ්ඤාණ මනෝවිඤ්ඤාණ යන මේ සියල්ලට විඥනස්කන්ධ ය යි කියනු ලැබේ.

විඥනස්කන්ධයට අයත් සිත් එක් ක්‍රමයකින් අසූනවයක් ද තවත් ක්‍රමයකින් එකසිය විසිඑකක් ද වේ. ඒවා දනු කැමති නම් අභිධර්ම පොත්වලින් උගත යුතු ය. චක්ඛුවිඤ්ඤාණ නම් වූ සිත ඇසෙහි රූපච්ඡායාව ගැටීම නිසා ඇතිවන්නකි. එය අන්කිසි හේතුවකින් ඇතිවන්නේ නො වේ. කිසිවකු විසින් ඇති කළ හැකි දෙයක් ද නො වේ. එබැවින් තමාගේ කැමැත්ත අනුව චක්ඛුවිඤ්ඤාණය උපදවන චක්ඛුවිඤ්ඤාණය කෙරෙහි අධිපතිකම පවත්වන පුද්ගලයෙක් නැත.

ඇසෙහි රූපච්ඡායාව ගැටීම සිදුවුවහොත් චක්ඛු විඤ්ඤාණයේ ඉපදීම වැළැක්වීමට සමත් පුද්ගලයෙක් ද නැත. ඇසෙහි රූප-ච්ඡායාව ගැටීම නිසා ඉපද එකෙණෙහි බිඳී යන චක්ඛු විඤ්ඤාණය ද පුද්ගලයෙක් නො වේ. චක්ඛු විඤ්ඤාණය මෙන් ම සෝත-විඤ්ඤාණාදි විඤ්ඤාණ පස ද පුද්ගලයකු නො වන බව ආත්ම නො වන බව තේරුම් ගත යුතු ය.

රූපස්කන්ධාදි වශයෙන් පස් කොටසකට බෙද තිබෙන්නේ ද සංසාර චක්‍රයට අයත් අවිද්‍යා - සංස්කාර - විඥන - නාමරූප - සළායතන - ස්පර්ශ - වේදනා - තෘෂ්ණා - උපාදන - භව - ජාති ජරා මරණ යන ප්‍රතීත්‍යසමුත්පාදඞ්ග දොළොසම ය. ඒවා කොටස් පසකට බෙද තිබෙන්නේ සත්ත්වයාය පුද්ගලයාය ආත්මය කියා වරදවා ගැනීමේ දී විශේෂයෙන් අල්ලා ගන්නා ධර්මයන් ඒ ඒ කොටස්වලට ඇතුළු කිරීමෙනි. සත්ත්වයාය, පුද්ගලයාය, මමය කියා වරදවා ගන්නෝ වරින් වර එක එක දෙය ආත්මය කොට ගනිති. වරකට රූප සමූහය ආත්ම වශයෙන් ගනිති. වරකට වේදනාව ආත්මය වශයෙන් ගනිති. වරකට සංඥව ආත්මය වශයෙන් ගනිති. වරකට සංස්කාරයන් ආත්මය වශයෙන් ගනිති. වරකට විඤ්ඤාණය ආත්මය වශයෙන් ගනිති.

රූපය ප්‍රධාන කර ගෙන සිතන කථා කරන අවස්ථාවලදී සන්තානයෙහි ඇතිතාක් රූප එකක් කොට සත්ත්වයා පුද්ගලයා

Non-commercial distribution

වශයෙන් ගෙන, මම කුඩාය - මම මහත්ය - මම උස්ය - මම මිටිය - මම කළුය - මම රතුය යනාදීන් කථා කරති. අසවලා කුඩාය - මහත්ය - උස්ය - මිටිය - කළුය - රතුය යනාදි පර - සන්තානගත රූප පුද්ගලයා කොට සිතති, කථා කරති.

වේදනාවත් උසස්කොට සලකන එක්තරා ධර්මයක් වන බැවින් වේදනාව ගෙන මම සැප විඳිමිය, දුක් විඳිමිය, අසවලා සැප විඳීය, දුක් විඳීය කියා වේදනාව පුද්ගලයා කොට සිතති. කථා කරති. වේදනාව හැර සුවදුක් විඳින අනිකකු නැති බැවින් මම සැප විඳිමියි කියන කල්හි මම යනුවෙන් ගැනෙන්නේ වේදනාස්කන්ධය ය.

සංඥාව ගැන සිතන කියන අවස්ථාවලදී මම මේ මේ කරුණු දනිමිය, අසවලා මේ මේ දේ දන්නේ ය යි සංඥාව පුද්ගලයා වශයෙන් ගෙන සිතති. කථා කරති. ඒ ඒ දෙය හැඳිනීම සංඥාව මිස හඳුනන පුද්ගලයකු නැති බැවින් මම දනිමියි කියන කල්හි මම යනුවෙන් ගැනෙන්නේ සංඥාස්කන්ධය ය.

සංස්කාරයන් ගැන සිතන කථා කරන අවස්ථාවලදී මම යමිය - එමිය - දෙමිය - ගනිමිය - අසවලා යන්නේ ය - එන්නේ ය - ගන්නේ ය - දෙන්නේ ය කියා සිතන කියන කල්හි පුද්ගලයා කොට ගන්නේ සංස්කාරස්කන්ධය ය.

මම දකිමිය අසමිය යනාදීන් විඥානය ප්‍රධාන කොට සිතන කියන කල්හි මම යනුවෙන් අදහස් කරන්නේ විඥානස්කන්ධය ය. බොහෝ සෙයින් ආත්මසංඥාව ඇති වන්නේ මේ රූපාදි කොටස් පසෙ සම්බන්ධයෙනි. ඒවා වෙන් වශයෙන් තේරුම් ගත්තාම ආත්ම සංඥාව - ආත්මදෘෂ්ටිය දුරුකර ගැනීම පහසු වේ. එබැවින් තථාගතයන් වහන්සේ සංසාර චක්‍රයට අයත් අවිද්‍යාදි ධර්ම සමූහය මෙසේ පස් කොටසක් කොට වදාළ සේක. විස්තර කළයුතු තවත් කරුණු ඇතත් ග්‍රන්ථය මහත් වන බැවින් දශබල සූත්‍ර විස්තරය මෙපමණකින් නවත්වනු ලැබේ.

Non-commercial distribution

# ආහාර සූත්‍රය

(නිදාන වග්ගසංයුක්තයේ ආහාර වර්ගයෙන්)

1. එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර බො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො' ති 'භදන්තෙ' ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

2. චත්තාරොමෙ භික්ඛවෙ! ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය, කතමෙ චත්තාරො? කබලිංකාරො ආහාරො ඔළාරිකො වා සුඛුමො වා: ඵස්සො දුතියො, මනොසඤ්චෙතනා තතියා, විඤ්ඤාණං චතුත්ථං. ඉමෙ බො භික්ඛවෙ! චත්තාරො ආහාරා භූතානං වා සත්තානං ඨිතියා, සම්භවෙසීනං වා අනුග්ගහාය.

3. ඉමෙ බො භික්ඛවෙ! චත්තාරො ආහාරා කිං නිදානා කිං සමුදයා කිං ජාතිකා කිං පභවා?

4. චත්තාරො ආහාරා තණ්හා නිදානා තණ්හා සමුදයා තණ්හා ජාතිකා තණ්හා පභවා.

5. තණ්හාචායං භික්ඛවෙ! කිං නිදානා කිං සමුදයා කිං ජාතිකා කිං පභවා?

6. තණ්හා, වේදනා නිදානා වේදනා සමුදයා වේදනා ජාතිකා වේදනා පභවා.

7. වේදනා චායං භික්ඛවෙ! කිං නිදානා කිං සමුදයා කිං ජාතිකා කිං පභවා?

8. වේදනා, ඵස්ස නිදානා ඵස්ස සමුදයා ඵස්ස ජාතිකා ඵස්ස පභවා.

9. ඵස්සො චායං භික්ඛවෙ! කිං නිදානො කිං සමුදයො කිං ජාතිකො කිං පභවො?

10. ඵස්සො, සළායතනනිදානො සළායතන සමුදයො සළායතන ජාතිකො සළායතන පභවො.

Non-commercial distribution

11. සළායතනඤ්චිදං භික්ඛවෙ! කිං නිදානං කිං සමුදයං කිං ජාතිකං කිං පභවං?

12. සළායතනං නාමරූපනිදානං නාමරූපසමුදයං නාමරූපජාතිකං නාමරූප පභවං.

13. නාමරූපඤ්චිදං භික්ඛවෙ! කිං නිදානං කිං සමුදයං කිං ජාතිකං කිං පභවං?

14. නාමරූපං, විඤ්ඤාණනිදානං විඤ්ඤාණසමුදයං විඤ්ඤාණජාතිකං විඤ්ඤාණ පභවං.

15. විඤ්ඤාණඤ්චිදං භික්ඛවෙ! කිං නිදානං කිං සමුදයං කිං ජාතිකං කිං පභවං?

16. විඤ්ඤාණං, සඞ්ඛාරනිදානං සඞ්ඛාරසමුදයං සඞ්ඛාරජාතිකං සඞ්ඛාර පභවං.

17. සංඛාරාචිමෙ භික්ඛවෙ! කිං නිදානා කිං සමුදයා කිං ජාතිකා කිං පභවා?

18. සංඛාරා, අවිජ්ජානිදානා අවිජ්ජාසමුදයා අවිජ්ජා ජාතිකා අවිජ්ජා පභවා.

ඉති ඛො භික්ඛවෙ! අවිජ්ජාපච්චයා සංඛාරා, සංඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වේදනා, වේදනාපච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණං සොකපරිදේව දුක්ඛ දෙමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සංඛාරනිරොධො, සංඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරෝධා සළායතන නිරොධො, සළායතන නිරොධා ඵස්ස නිරොධො, ඵස්ස නිරොධා වෙදනා නිරොධො, වේදනා නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො. උපාදාන නිරොධා භව නිරොධො. භව

Non-commercial distribution

නිරොධා ජාති නිරොධො, ජාති නිරොධා ජරාමරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සු පායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## ආහාර සූත්‍රයේ තේරුම

(1) මා විසින් මෙසේ අසන ලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනයෙහි අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩවෙසෙන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන්ට කථාකළ සේක. භික්ෂූහු 'ස්වාමීනි' යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

(2) මහණෙනිː උපන්නා වූ සත්ත්වයන් ගේ ජීවත් වීම පිණිස ද, ඉපදීම සොයන්නා වූ සත්ත්වයනට අනුග්‍රහය පිණිස ද, මේ ආහාරයෝ සතරදෙනෙක් වෙති. කවර සතරදෙනෙක් ද යත්? ඖදරික වූ ද සූක්ෂ්ම වූ ද කබලිංකාර ආහාරය ය, දෙවෙනි වූ ඵස්ස ආහාරය ය, තුන්වැනි වූ මනෝසඤ්චේතනා ආහාරය ය, සතරවෙනි වූ විඤ්ඤාණ ආහාරය ය යන මොහුය. මහණෙනි! ආහාරයෝ සතරදෙන උපන් සත්ත්වයන් ගේ පැවැත්මට ද ඉපදීම සොයන්නා වූ සත්ත්වයන් හට අනුග්‍රහය පිණිස ද පවත්නාහ.

(3) මහණෙනි! මේ ආහාරයෝ සතරදෙන කුමක් හේතු-කොට ඇත්තාහු ද?

(4) ආහාරයෝ සතරදෙන තණ්හාව හේතු කොට ඇත්තෝ ය.

(5) මහණෙනි! මේ තණ්හාව කුමක් හේතු කොට ඇත්තේ ද?

(6) තණ්හාව වේදනාව හේතුකොට ඇත්තේ ය.

(7) මහණෙනි! මේ වේදනාව කුමක් හේතුකොට ඇත්තේ ද?

(8) වේදනාව ස්පර්ශය හේතු කොට ඇත්තේ ය.

Non-commercial distribution

(9) මහණෙනි! මේ ස්පර්ශය කුමක් හේතුකොට ඇත්තේ ද?

(10) ස්පර්ශය ෂඩායතනය හේතුකොට ඇත්තේ ය.

(11) මහණෙනි! මේ ෂඩායතන කුමක් හේතු කොට ඇත්තේ ද?

(12) ෂඩායතන නාමරූපය හේතු කොට ඇත්තේ ය.

(13) මහණෙනි! මේ නාමරූපය කුමක් හේතුකොට ඇත්තේ ද?

(14) නාමරූපය විඥානය හේතු කොට ඇත්තේ ය.

(15) මහණෙනි! මේ විඥානය කුමක් හේතු කොට ඇත්තේ ද?

(16) විඥානය සංස්කාරයන් හේතු කොට ඇත්තේ ය.

(17) මහණෙනි! මේ සංස්කාරයෝ කුමක් හේතු කොට ඇත්තෝ ද?

(18) සංස්කාරයෝ අවිද්‍යාව හේතුකොට ඇත්තෝ ය.

මහණෙනි! මෙසේ අවිද්‍යාව නිසා සංස්කාරයෝ වන්නාහ. සංස්කාරයන් නිසා විඥානය උපදනේ ය, විඥානය නිසා නාමරූපය උපදනේ ය, නාමරූපය නිසා ෂඩායතනය උපදනේ ය, ෂඩායතනය නිසා ස්පර්ශය උපදනේ ය, ස්පර්ශය නිසා වේදනාව උපදනේ ය, වේදනාව නිසා තණ්හාව උපදනේ ය, තණ්හාව නිසා උපාදනය උපදනේ ය, උපාදනය නිසා භවය උපදනේ ය. භවය නිසා ජාතිය ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාශයෝ වන්නාහ. මෙසේ මේ සකල දුඃඛස්කන්ධයා ගේ පහළ වීම වන්නේ ය.

අවිද්‍යාවගේ ම ලෝකෝත්තර මාර්ගඥනයෙන් නිරවශේෂයෙන් නිරුද්ධවීම හේතු කොට සංස්කාරයන්ගේ නිරෝධය වේ. -පෙ- මෙසේ මේ සකල දුක්ඛස්කන්ධයාගේ නිරෝධය වේ.

**මෙතෙකින් ආහාර සූත්‍රයේ භාවය නිමි.**

Non-commercial distribution

මේ සූත්‍රයෙහි එන "කිං නිදනා - කිං සමුදයා - කිං ජාතිකා - කිං පභවා" යන වචන සතර එක ම අර්ථයක් දෙන වචන සතරකි. එකම අර්ථයක් දෙන වචන සතරක් මෙසේ එකතැන යෙදීම තථාගතයන් වහන්සේ ගේ දේශනා විලාශයේ සැටියට නම් ශෝභන ය. එක අර්ථය දෙන වචන සතර එකතැන යෙදීමෙන් අසන්නහු ගේ සිතට කාරණය තදින් කා වැදේ. එසේ ම අසන්නහුට කාරණය හොඳින් අවබෝධ වේ. වචන සතර යෙදීමෙන් අසන්නවුන්ට දේශනය අප්‍රිය නො වේ.

තථාගතයන් වහන්සේ ගේ දේශනා විලාශයේ සැටියට එක අර්ථය කියවෙන වචන සතර එක තැන යෙදීම හොඳ වුව ද සිංහල භාෂා ශෛලියේ සැටියට එබඳු යෙදුම් අශෝභන ය. සිංහල වාක්‍යයක එසේ යෙදුව හොත් එය කියවන්නවුන්ට - අසන්නවුන්ට අප්‍රිය වාක්‍යයක් වේ. එබැවින් අප විසින් මේ සූත්‍රයේ භාවය ලිවීමේදී "කිං නිදනා කිං සමුදයා කිං ජාතිකා කිං පභවා" යන වචන සතර වෙනුවට "කුමක් හේතුකොට ඇත්තාහු ද" කියා එක වචනයක අර්ථය පමණක් යොදන ලදී.

## ආහාර සතර

කබලිංකාරාහාරය, ඵස්සාහාරය, මනෝසඤ්චේතනාහාරය, විඤ්ඤාණාහාරය යන ආහාර සතර මේ සූත්‍රයෙහි දක්වෙන විශේෂ කරුණෙකි. **"ආහරීයති අජ්ඣෝහරීයතීති ආහාරෝ"** යන විග්‍රහයේ සැටියට "අනුභව කරනු ලබන දෙයට ආහාරය"යි කියනු ලැබේ. මෙහි ඒ සතරට ආහාර යන නම කියනුයේ ඒ අර්ථය අනුව නො වේ. ඵස්ස චේතනා යන දෙක චෛතසික දෙකකි. විඤ්ඤාණය නම් සිත ය. ඒවා අනුභව කරන්නට ගිලින්නට පිළිවන් දේ නො වේ. **කබලිංකාරාදි සතරට ආහාරය යි කියනුයේ ඵලය ඇති කරන දෙයය යන අර්ථයෙනි**.

**"ආහාර"** යනු යම්කිසි ඵලයක් ඇති කරන හේතුවට ද නමෙකි. එබැවින් අටුවාවෙහි **"ආහාරාති පච්චයා. පච්චයා හි ආහාරන්ති අත්තනො ඵලං තස්මා ආහාරාති වුච්චන්ති"** යි කීහ. අවිජ්ජා පච්චයා සංඛාරා යනාදි ප්‍රතීත්‍යසමුත්පාද දේශනාවේ සැටියට සංසාර

Non-commercial distribution

චක්‍රයට අයත් සෑම ධර්මයක් ම ප්‍රත්‍යයෙකි. හෙවත් යම් කිසිවක් ඇති කරන හේතුවකි. "**හේතු පච්චයො ආරම්මණපච්චයො**" යනාදි ප්‍රස්ථාන දේශනාවේ සැටියට ද සෑම ධර්මයක් ම ප්‍රත්‍යයෙකි. ප්‍රත්‍යය නො වන, හේතුවක් නො වන කිසිම ධර්මයක් නැත.

යම් කිසිවකට හේතු වීමේ - ප්‍රත්‍ය වීමේ සැටියට නම තබනවා නම්, සියලු ම ධර්මයන්ට ආහාර යන නාමය කිය යුතු ය. එසේ තිබියදී කබලිංකාරාහාරාදි සතරට පමණක් ආහාර යන නම තථාගතයන් වහන්සේ විසින් තබන ලදුයේ කවර හේතුවකින් ද? යන ප්‍රශ්නය මෙහිදී උපදී. තථාගතයන් වහන්සේ මේ සතරට පමණක් විශේෂයෙන් ආහාර නාමය තබන ලදුයේ, ඒ සතර සංසාර චක්‍රයාගේ පැවැත්මට, තවත් ක්‍රමයකින් කියතහොත් පඤ්චස්කන්ධයා ගේ පැවැත්මට විශේෂයෙන් හේතුවන බැවිනි.

සංසාර චක්‍රයට අයත් ධර්මයන් ගෙන් අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යය වේ. විඥාන නාමරූපාදීන්ට ප්‍රත්‍යය නො වේ. විඥානය නාමරූපයන්ට ප්‍රත්‍යය වේ. ෂඩායතනාදියට ප්‍රත්‍යය නො වේ. ආහාරයන් ගේ ප්‍රත්‍යය වීම එසේ එකකට දෙකකට නොව සියල්ලටම ය. එබැවින් තථාගතයන් වහන්සේ විසින් "**සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා**" යි ද වදරන ලදී. සකල සත්ත්වයෝ ම ආහාරය නිසා පවත්නෝය, ජීවත් වන්නෝය යනු එහි තේරුම ය. එහි සත්ත්වයෝය යි කියා තිබෙන්නේ අවිද්‍යාදි ධර්ම පරම්පරාවට ය. තවත් ක්‍රමයකින් කියතහොත් ස්කන්ධ පරම්පරාවට ය.

ආහාර සතරෙන් **කබලිංකාර ආහාරය** යනු අනුභව කරන ආහාරයෙහි ඇති ඕජාව ය. අනුභව කරන ආහාරය කුසට පිවිසි කල්හි එයින් කොටසක් ආමාශය ඇසුරු කොට වෙසෙන පණුවෝ කති. එක් කොටසක් පාචකාග්නියෙන් දැවී යයි. එක් කොටසක් මළ වෙයි. එක් කොටසක් මුත්‍ර වෙයි. ආහාරයෙහි හොඳම කොටස රස ධාතුව වී ආහාර ගෙන යන නහර දිගේ ගමන් කොට ශරීරය සැම තැනම පැතිරේ. ඒ ආහාරයේ ප්‍රධාන කොටසට ආහාර රූපය යි ද, ඕජා රූපය යි ද කියනු ලැබේ.

ඕජාරූප ඇත්තේ අනුභව කරන ආහාරයෙහි ම නො වේ. ශරීරයේ පිහිටි ලේ මස් ආදි සියල්ලෙහිත් ඒවා ඇත්තේ ය.

Non-commercial distribution

ශරීරයෙහි ඇති ඕජාරූප ඒ ඒ තැන ම තිබෙනවා මිස අනුභව කරන ආහාරයේ ඕජාව මෙන් ශරීරයේ ගමන් නො කරයි. එහෙත් සත්ත්ව ශරීරයට ආහාරයෙන් කෙරෙන උපකාරය ප්‍රධාන වශයෙන් කෙරෙන්නේ ශරීරයෙහි ඇති ඕජා රූපවලිනි. පිටතින් ශරීරයට පැමිණෙන ඕජාරූපයන් ගෙන් ලැබෙන උපස්ථම්භනයෙන් ශාරීරික ඕජාරූප බලවත් වී ඒවායින් ආහාරජ රූප නම් වූ රූප කොට්ඨාශයක් උපදවනු ලැබේ. ශරීරය පවත්වන්නේත් මලානික නො වී තිබෙන්නේත් බලවත් වන්නේත් වැඩෙන්නේත් ඒ ආහාරජ රූපවල උපස්ථම්භනයෙනි.

අඹ ඇටයකට ශක්තිය ඇත්තේ කුඩා අඹ පැළයක් ඇති කිරීමට පමණකි. ඒ අඹ පැළය බොහෝ අතුපතර ඇති අඹ ගසක් වී මල්පල හටගන්වමින් දීර්ඝ කාලයක් පවත්නේ මුල් අඹ ඇටයේ අනුභසින් නොව පෘථිවි රස ආපෝ රසයන් ගේ අනුභසයෙනි. ඒවා නො ලද හොත් අඹ ගස නැසේ. එමෙන් කර්මයට ශක්තිය තිබෙන්නේ භවයෙහි ප්‍රථමයෙන් සත්ත්වයා ඉපදවීමට පමණකි. ඉපදීමෙන් පසු සත්ත්වයා වැඩෙන්නේත් ජීවත් වන්නේත් ආහාරයේ අනුභසිනි. ආහාරය නො ලදහොත් සත්ත්වයා වියළී මිය යන්නේ ය. ඉපදීමෙන් පසු සත්ත්වයා ජීවත් කරවීම ආහාරයේ කෘත්‍යය ය. සත්ත්වයා ජීවත් කරවීමය යි කියනුයේ නාමරූප ෂඩායතන ස්පර්ශ වේදනාදි හේතුඵල ධර්ම පරම්පරාව චිරකාලයක් පැවැත්වීමට ය. සංසාර චක්‍රයට අයත් හේතුඵල පරම්පරාවට ම ප්‍රත්‍ය වන බැවින් කබලිංකාරාහාරය විශේෂ ප්‍රත්‍යයෙකි.

තණ්හාව සංසාර ප්‍රවෘත්තියට ප්‍රධාන හේතුවකි. තණ්හාව නැතහොත් සංසාරයක් නො පවතී. තණ්හාව ඇති වන්නේ ද වේදනාව නිසා ය. වේදනාවය කියා දෙයක් ලෝකයේ නැති නම්, කවරෙකුටවත් තණ්හාවක් ඇති නො වේ. ඵස්සය නො මැති නම් කිසි කලෙක වේදනාවක් ඇති වන්නේ ද නැත. වේදනාව ඇති වන කල්හි තණ්හාව ඇති වීමෙන් සංසාර චක්‍රය නො සිඳී පවතී. එබැවින් වේදනාව ඇති කර, තණ්හාව ඇති වීමට උපකාර වන ඵස්සය අවිද්‍යා සංස්කාරාදි හේතුඵල ධර්ම පරම්පරාවේ ම චිරකාලයක් පැවැත්වීමට උපකාරයෙකි. එබැවින් ඒ ඵස්සය යම්කිසි එකකට - දෙකකට පමණක් ප්‍රත්‍යය වන අන්‍යධර්මයන්

Non-commercial distribution

සේ නොව සකල සංසාරයාගේ ම ප්‍රවෘත්තියට උපකාර වන්නක් බැවින් විශේෂ ප්‍රත්‍යයක් වේ.

මරණින් පසු සත්ත්වයා ගේ ස්කන්ධ පරම්පරාව සිඳී නො යන පරිදි යම් කිසි තැනක අභිනව ප්‍රතිසන්ධියක් ඇති කරවන්නේ කුශලාකුශල කර්ම සංඛ්‍යාත මනෝසඤ්චේතනා ආහාරයෙනි. ඉදින් කුශලාකුශල චේතනාවක් නැති නම් ප්‍රතිසන්ධියක් ඇති නො වන්නේ ය. ප්‍රතිසන්ධි විඥනය ඇති නො වුව හොත් නාමරූප සළායතන ඵස්ස වේදනාදි හේතුඵල පරම්පරාව ද ඇති නො වන්නේ ය. ස්කන්ධ පරම්පරාව සිඳී යන්නේ ය. ප්‍රතිසන්ධි විඥනය පහළ වීම නිසා ම නාමරූප ෂඩායතනාදි හේතුඵල පරම්පරාව නො සිඳී පවත්නේ ය. ප්‍රතිසන්ධි විඥනය ඇති කරන කුශලාකුශල චේතනාව එකකට දෙකකට පමණක් නොව ස්කන්ධ පරම්පරාවට ම ප්‍රත්‍යය වන බැවින් විශේෂ ප්‍රත්‍යයෙකි. විශේෂ හේතුවකි.

සංසාර චක්‍රයට අයත් ධර්මයන් ගෙන් බොහෝ ගණනක් ම විඥනය ඇසුරු කොට විඥනය හා බැඳී උපදින ධර්මයෝ ය. විඥනයක් නැතහොත් අවිද්‍යාවකුත් නැත. සංඛාරයකුත් නැතඃ නාමරූපයකුත් නැතඃ ඵස්සයකුත් නැතඃ වේදනාවකුත් නැතත තණ්හාවකුත් නැතඃ කර්ම භවයකුත් නැතඃ ඒ ධර්මයන් ගේ ඉපදීමටත් පැවැත්මටත් විඥනය තිබිය යුතුම ය. එබැවින් ඒ විඥනයත් ධර්ම එකකට දෙකකට පමණක් ප්‍රත්‍යය වන්නක් නො ව හේතුඵල වශයෙන් පවත්නා සම්පූර්ණ සංසාර චක්‍රයට ම උපකාරක ධර්මයක් වන බැවින් විශේෂ ප්‍රත්‍යයෙකි.

මේ සූත්‍රයෙන් තථාගතයන් වහන්සේ සත්ත්වයන් ගේ උත්පත්තියට හා පැවැත්මට ආහාර සතර හේතුවන බව දක්වා අනතුරුව ආහාර සතර ඇතිවීමටත් යම් කිසි හේතුවක් තිබිය යුතු බැවින් ඒ ප්‍රශ්නය තමන් වහන්සේ විසින් ම මතු කොට තෘෂ්ණාව ආහාර ඇති වීමේ හේතුව ය යි වදළ සේක.

**“තෘෂ්ණාව නිසා ආහාර ඇතිවන්නේ කෙසේද?”** යනු මෙහිදී විසඳ ගත යුතු ය. සත්ත්වයකු භවයෙහි ප්‍රථමයෙන් උපදින්නේ - පිළිසිඳ ගන්නේ අතීත භවයෙහි වූ තණ්හාව නිසා ය. පරිපූර්ණආයතන ඇති සත්ත්වයකු භවයෙහි උපදනා කල්හි ඒ සත්ත්වයාහට

Non-commercial distribution

ප්‍රතිසන්ධිචිත්තය සමග ම චක්ෂුර්දශකය - ශ්‍රෝත්‍රදශකය - ඝ්‍රාණ දශකය - ජිහ්වාදශකය - කායදශකය - භාවදශකය - වස්තු දශකය යන රූප කලාප සත පහළ වේ. ආයතන සම්පූර්ණ නො වන ප්‍රතිසන්ධි ඇතියවුන්ට එයට අඩු ගණනක් රූප කලාපයෝ ප්‍රතිසන්ධි චිත්තය සමග උපදිති. ඒ සෑම රූප කලාපයක ම කබලිංකාරාහාරය යි කියනු ලබන ඕජා රූපය ඇත්තේ ය. එය අතීත භවයේ පැවති තෘෂ්ණාව උපනිඃශ්‍රය කොට ඇතිවන කර්මජ කබලිංකාරාහාරය ය. ප්‍රතිසන්ධි චිත්තය අතීත භවයට අයත් තණ්හාව හේතු කොට ඇති වන විඥානාහාරය ය. ප්‍රතිසන්ධි චිත්තය සමඟ ඇති චේතනාව මනෝසඤ්චේතනාහාරය ය. ප්‍රතිසන්ධි චිත්තය සමග උපදනා ඵස්ස චෛතසිකය ඵස්සාහාරය ය.

මෙසේ ජීවිත කාලය මුළුල්ලෙහි ම අතීත භවයට අයත් තණ්හා ප්‍රත්‍යය වී ආහාර සතර සංසාර චක්‍රයේ ම අංග වී ඇති වන සැටි තේරුම් ගත යුතු ය. අභිධර්මය උගත් අයට මෙය පහසුවෙන් වැටහෙනු ඇත. ආහාරයේ හේතුව දක්වා අනතුරුව තෘෂ්ණාදියේ හේතුන් ද වදරා ඇත්තේ ය. බොහෝ තැන්වල තථාගතයන් වහන්සේ ප්‍රතීත්‍ය සමුත්පාදය දේශනය කොට තිබෙන්නේ දේශනය අනාගතයට යොමු කොට ය. මේ සූත්‍රයෙහි ප්‍රතීත්‍ය සමුත්පාදය දක්වා තිබෙන්නේ අතීතයෙන් ය.

මේ සූත්‍රයෙහි දක්වෙන ආහාර මූලික පටිච්චසමුප්පාදයට ඇත්තේ **ආහාර, තණ්හා, වේදනා, ඵස්ස, සළායතන, නාමරූප, විඤ්ඤාණ, සංඛාර, අවිජ්ජා** යන අංග නවය ය.

එහි ආහාර වශයෙන් ගනු ලබන්නේ වර්තමාන පඤ්චස්කන්ධය ය. තෘෂ්ණාවය යනු වර්තමාන භවය ඇති කළ කර්මය ය. වේදනා ඵස්ස සළායතන නාම රූප විඤ්ඤාණ යන අංගවලින් දක්වන්නේ වර්තමාන උත්පත්තියට හේතු වූ කර්මය කළ අතීතානන්තර භවය ය. සංඛාර අවිජ්ජා යන අංග දෙකින් ගනු ලබන්නේ අනන්තරාතීත භවය ඇති කළ කර්මය ය. මෙසේ මේ සූත්‍රයෙහි ස්ථාන දෙකක භවයත් ස්ථාන දෙක්හි උප්පත්තියට හේතු වූ කර්මයත් දක්වීම් වශයෙන් සංක්ෂේපයෙන් කර්මවෘත්ත විපාකවෘත්තයන්ගේ වශයෙන් සංසාර ප්‍රවෘත්තිය දක්වා ඇත්තේ ය.

Non-commercial distribution

මෙහි ද පෙර දක් වූ පටිච්චසමුප්පාදයෙහි මෙන් ම සන්ධි තුනක් ඇත්තේ ය. ආහාර - තණ්හා දෙදෙනා ගේ අතර එක් සන්ධියකි. තණ්හා - වේදනාවන් අතර එක් සන්ධියකි. විඥාණ - සංඛාරයන් අතර එක් සන්ධියෙකි. සන්ධි තුනක් වන කල්හි කොටස් සතරක් ඇත්තේ ය. මේ චක්‍රයට භව තුනක් සම්බන්ධ වී ඇත්තේ ය. මෙසේ අතීතයට යොමු කොට සංසාර ප්‍රවෘත්තිය දක් වූ කල්හි ඒ නයින් අනාගත සංසාර ප්‍රවෘත්තිය දත හැකි ය. මෙතෙකින් ආහාර සූත්‍ර විස්තරය අවසන් කරන ලදී.

## ඥාතික සූත්‍රය

(1) එවං මෙ සුතං, එකං සමයං භගවා ඤාතිකෙ විහරති ගිඤ්ජකාවසථෙ. අථ ඛො භගවා රහොගතො පටිසල්ලීනො ඉමං ධම්මපරියායං අභාසි.

(2) චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං. තිණ්ණං සංගති ඵස්සො. ඵස්සපච්චයා වේදනා, වේදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදනං, උපාදනපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙව-දුක්ඛදෝමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හොති.

(3) සොතඤ්ච පටිච්ච සද්දෙ ච -පෙ- ඝාණඤ්ච පටිච්ච ගන්ධෙ ච -පෙ- ජිව්හඤ්ච පටිච්ච රසෙ ච -පෙ- කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනො විඤ්ඤාණං, තිණ්ණං සංගති ඵස්සො. ඵස්සපච්චයා වේදනා, වේදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදනං, උපාදන පච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදෝමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

(4) චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං. තිණ්ණං සංගති ඵස්සො. ඵස්ස පච්චයා වේදනා, වේදනාපච්චයා තණ්හා. තස්සා යෙව තණ්හාය අසෙසවිරාගනිරොධා උපාදන නිරොධො, උපාදන නිරොධා භවනිරොධො. භවනිරොධා ජාති

Non-commercial distribution

නිරොධො, ජාති නිරොධා ජරාමරණං සොකපරිදෙව දුක්ඛදෙම-නස්සුපායාසා නිරුජ්ඣන්ති. ඒවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

(5) සොතඤ්ච පටිච්ච සද්දෙ ච - පෙ - මනඤ්ච පටිච්ච ධම්මේ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං, තිණ්ණං සංගති ඵස්සො. ඵස්සපච්චයා වේදනා, වේදනාපච්චයා තණ්හා. තස්සායෙව තණ්හාය අසෙස විරාග නිරොධා උපාදනනිරොධො, උපාදනනිරොධා භව නිරොධො, භවනිරොධා ජාති නිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසා නිරුජ්ඣන්ති. ඒවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධෝ හොතීති.

(6) තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු භගවතො උපස්සුති ඨිතො හොති. අද්දසා ඛො භගවා තං භික්ඛුං උපස්සුති ඨිතං. දිස්වාන තං භික්ඛුං එතදවොච. අස්සොසි නො ත්වං භික්ඛු ඉමං ධම්මපරියායන්ති? එවං භන්තෙති. උග්ගණ්හාහි ත්වං භික්ඛු ඉමං ධම්ම පරියායං. පරියාපුණාහි ත්වං. භික්ඛු ඉමං ධම්මපරියායං. ධාරෙහි ත්වං භික්ඛු ඉමං ධම්මපරියායං. අත්ථසංහිතොයං භික්ඛු ධම්මපරියායො ආදිබ්‍රහ්මචරියකොති.

## ඥතික සූත්‍රයේ භාවය

(1) මා විසින් මෙසේ අසන ලදී.එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ නෑ ගමෙහි ගඩොළින් කළ පහයෙහි වැඩ වෙසෙන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ විවේකස්ථානයට පැමිණියාහු හුදකලාව වැඩ වෙසෙන සේක් මේ ධර්මකාරණය වදළ සේක.

(2) ඇස ද රූපය ද නිසා චක්ෂුර්විඥනය උපදී. (චක්ෂුඃප්‍රසාද රූප චක්ෂුර්විඥන යන) තිදෙනා ගේ එක් වීමෙන් ස්පර්ශය වේ. ස්පර්ශය ප්‍රත්‍යය කොට වේදනාව උපදී, වේදනාව ප්‍රත්‍යය කොට තෘෂ්ණාව උපදී. තෘෂ්ණාව ප්‍රත්‍යකොට උපාදනය උපදී. උපාදනයන් ප්‍රත්‍යකොට භවය උපදී. භවය ප්‍රත්‍යකොට ජාතිය වේ. ජාතිය ප්‍රත්‍යය කොට ජරාමරණය ද ශෝක පරිදේව

Non-commercial distribution

දුඃඛදෞර්මනස්‍ය උපායාසයෝ ද වෙති. මෙසේ මේ සකල දුඃඛස්කන්ධයාගේ හටගැනීම වේ.

(3) ශ්‍රෝත්‍රය ද ශබ්දය ද නිසා -පෙ- ඝ්‍රාණය ද ගන්ධය ද නිසා -පෙ- දිව ද රසය ද නිසා -පෙ- කය ද ස්ප්‍රෂ්ටව්‍යය ද නිසා -පෙ- මනස ද ධර්මයන් ද නිසා මනෝ විඥානය උපදී. තිදෙනා ගේ එක්වීමෙන් ස්පර්ශය උපදී. ස්පර්ශය ප්‍රත්‍යය කොට වේදනාව උපදී. වේදනාව ප්‍රත්‍යය කොට තෘෂ්ණාව උපදී. තෘෂ්ණාව ප්‍රත්‍යය කොට උපාදනය උපදී. උපාදනය ප්‍රත්‍යය කොට භවය උපදී. භවය ප්‍රත්‍යය කොට ජාතිය වේ. ජාතිය ප්‍රත්‍යය කොට ජරාමරණ සෝක පරිදේව දුඃඛ දෝමනස්ස උපායාසයෝ වෙති. මෙසේ මේ සකල දුඃඛස්කන්ධයා ගේ පහළවීම වේ.

(4) ඇස ද රූපය ද නිසා චක්ෂුර්විඥනය උපදී. තිදෙනා ගේ එක්වීමෙන් ස්පර්ශය උපදී. ස්පර්ශය ප්‍රත්‍යය කොට වේදනාව උපදී. වේදනාව ප්‍රත්‍ය කොට තෘෂ්ණාව උපදී. ලෝකෝත්තර මාර්ගය කරණ කොට ඒ තෘෂ්ණාවගේ නිරවශේෂ නිරෝධයෙන් උපාදන නිරෝධය වේ. උපාදන නිරෝධයෙන් භව නිරෝධය වේ. භව නිරෝධයෙන් ජාති නිරෝධය වේ. ජාති නිරෝධයෙන් ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ නිරුද්ධ වෙති. මෙසේ මේ සකල දුඃඛස්කන්ධයාගේ නිරෝධය වේ.

(5) ශ්‍රෝත්‍රය ද ශබ්දය ද නිසා -පෙ- මනස ද ධර්මයන් ද නිසා මනෝවිඥනය උපදී. තිදෙනා ගේ එක්වීමෙන් ස්පර්ශය උපදී. ස්පර්ශය නිසා වේදනාව උපදී. වේදනාව නිසා තෘෂ්ණාව උපදී. ලෝකෝත්තර මාර්ගඥනය කරණකොට ඒ තෘෂ්ණාවගේ නිරවශේෂ නිරෝධයෙන් උපාදන නිරෝධය වේ. උපාදන නිරෝධයෙන් භව නිරෝධය වේ. භව නිරෝධයෙන් ජාති නිරෝධය වේ. ජාති නිරෝධයෙන් ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ නිරුද්ධ වෙති. මෙසේ මේ සකල දුඃඛස්කන්ධයාගේ නිරෝධය වේ.

(6) එසමයෙහි එක්තරා භික්ෂුවක් භාග්‍යවතුන් වහන්සේ ගේ හඬ ඇසෙන මානයේ සිටියේ වේ. ඇසෙන මානයේ උන් ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ දුටු සේක. දැක මෙසේ වදාළ සේක. මහණ! “තුඹ මේ ධර්ම කාරණය ඇසුවෙහිද”? “එසේය ස්වාමීනි”

Non-commercial distribution

යි භික්ෂුව පිළිතුරු දිනිඃ. මහණෙ! මේ ධර්ම කාරණය උගෙන ගන්න. මහණෙ! මේ ධර්ම කාරණය නුඹ පුරුදුකර ගන්න. මහණෙ මේ ධර්මපර්‍යායය අර්ථය පිණිස පවත්නකි. මෙය ලෝකෝත්තර මාර්ගය පිණිස පිරියයුතු ප්‍රතිපත්තියේ ආදිය වන්නේ ය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

## මේ ඥතික සූත්‍රයේ භාවය ය.

මේ සූත්‍රයට ඥතික සූත්‍රය යන නම තබා ඇත්තේ නෑයන් ගේ ගමෙහි දේශනය කළ හෙයිනි. බුදුරජාණන් වහන්සේ විසින් ම නම් තැබූ සූත්‍ර ඇත්තේ ඉතා ස්වල්පයෙකි. බොහෝ සූත්‍රයන්ට නම් තබා ඇත්තේ සංගීතිකාරකයන් වහන්සේලා විසිනි. මේ සූත්‍රයට නම තැබීමේදී පටිච්චසමුප්පාදය යන නම සඳහන් නො වන්නේ පටිච්චසමුප්පාද සූත්‍ර බොහෝ ඇති බැවිනි. මේ සූත්‍රයෙහි ප්‍රතීත්‍යසමුත්පාදය දක්වා තිබෙන්නේ ස්පර්ශය මුල්කොට ය. ස්පර්ශය මුල්කොට ගන්නා කල්හි ද ජාතිය ඇතිවන කල්හි ඉන්ද්‍රියයන් ඇති වීමෙන් නැවත ද ස්පර්ශය ලැබීමෙන් සංසාරචක්‍රය සෑදේ. සාමාන්‍යයෙන් පටිච්චසමුප්පාද දේශනාව පටන්ගෙන තිබෙන්නේ අතීත භවයෙනි, එහි දක්වෙන අවිද්‍යා සංස්කාර නමැති අංග දෙක අතීත භවයට අයත් ය.

**මේ සූත්‍රයේ පටිච්චසමුප්පාද දේශනාව** පටන්ගෙන ඇත්තේ වර්තමාන භවයට අයත් ස්පර්ශාදියෙනි. සාමාන්‍ය ප්‍රතීත්‍යසමුත්පාද දේශනයන් ඇත්තේ භව තුනක් සම්බන්ධ කොට ය. මෙහි ඇත්තේ වර්තමාන අනාගත භව දෙක පමණෙකි. අන්‍ය සූත්‍රයන්හි ප්‍රතිලෝම ප්‍රතීත්‍යසමුත්පාද දේශනය "අවිජ්ජායත්වෙව අසේස විරාග නිරෝධා සංඛාර නිරෝධො" යනාදීන් නිරෝධයෙන් ම පටන්ගෙන තිබේ. මේ සූත්‍රයෙහි ප්‍රතිලෝම ප්‍රතීත්‍යසමුත්පාදය පටන්ගෙන තිබෙන්නේ උත්පාදයෙන්ම ය. නිරෝධය දක්වා තිබෙන්නේ තෘෂ්ණාවෙහි පටන් ය. මැදදී නිරෝධය පටන් ගැනීම මේ සූත්‍රයෙහි ඇති විශේෂ කරුණෙකි.

"ඵස්ස නිරොධා වේදනා නිරොධො" යනාදීන් ඵස්ස නිරෝධයේ පටන් ම නිරෝධය නො වදළේ යම්කිසි කරුණක් නිසා ය. ඒ කරුණ නම්: ඵස්ස නිරෝධයට විශේෂ ප්‍රතිපත්තියක් නැති

Non-commercial distribution

බවයි. යම්කිසි ප්‍රතිපත්තියකින් ඵස්සය ප්‍රහාණය නො කළ හැකි ය. මේ සූත්‍රයෙහි එන ප්‍රතීත්‍යසමුත්පාදංගවලින් ප්‍රතිපත්තියෙන් ප්‍රහාණය කළ හැකි අංග ඇත්තේ තෘෂ්ණා උපාදන දෙක ය. එබැවින් තෘෂ්ණා නිරෝධයෙන් ම මේ සූත්‍රයෙහි සංසාර චක්‍රයාගේ නිරෝධය වදරා තිබේ.

අවිද්‍යාව ප්‍රහාණය නො කොට සංසාර චක්‍රයෙන් මිදිය හැකිද? යන ප්‍රශ්නය මෙහිදී මතුකළ හැකි ය. අවිද්‍යාව තිබියදී දුඃඛස්කන්ධය නිරුද්ධ නො වන බව එසේම ය. අවිද්‍යාව ඉතිරි වන සැටියට තෘෂ්ණාව ප්‍රහාණය නො කළ හැකි ය. තෘෂ්ණාව ප්‍රහාණය කළහොත් ඒ සන්තානයෙහි අවිද්‍යාව ඉතිරි නො වේ. අවිද්‍යා ප්‍රහාණය තෘෂ්ණා ප්‍රහාණයෙන් ම සිද්ධ ය. අවිද්‍යා තෘෂ්ණා දෙක ප්‍රහාණය කිරීමට වෙන වෙන ම ප්‍රතිපත්ති ක්‍රම දෙකක් ද නැත්තේ ය. එක ම ප්‍රතිපත්තියෙන් ඒ දෙක්හි ම ප්‍රහාණය සිදු වේ.

පටිච්චසමුප්පාදය ධර්මස්වාමි වූ බුදුරජාණන් වහන්සේ විශේෂයෙන් ගරුකරන ධර්මයෙකි. ඒ ධර්මය උන්වහන්සේ දිනපතා ම මෙනෙහි කරන සේක. මේ සූත්‍රදේශනය කළ දිනයේ තථාගතයන් වහන්සේ ඤාතිකයෙහි උළුවා පහයෙහි වැඩ වෙසෙමින් පටිච්චසමුප්පාදය මෙනෙහි කර ගෙන ගිය කල්හි උන්වහන්සේට භවාග්‍රය දක්වා ලෝකය එක මිදුලක් සේ පෙනෙන්නට විය. එකල්හි උන්වහන්සේ පටිච්ච සමුප්පාදය මෙනෙහි කිරීමෙන් ම තෘප්තියට නො පැමිණ ශ්‍රී මුඛය විවෘත කොට මධුර ස්වරය විහිදුවමින් ඒ ධර්මය සජ්ඣායනා කරන්නට වූහ.

ගඳකිළි මිදුල හැමදීම සඳහා එහි ගිය එක් භික්ෂුවකට පමණක් තථාගතයන් වහන්සේ ගේ ඒ ධර්ම සජ්ඣායනය අසන්නට ලැබිණ. සූත්‍රය සජ්ඣායනා කොට අවසානයේ දී මේ ධර්මයට කන් දුන් යම්කිසිවකු ඇද්දෝයි මෙනෙහි කළා වූ තථාගතයන් වහන්සේට ඒ භික්ෂුව පෙනිණ. එකල්හි තථාගතයන් වහන්සේ ඒ භික්ෂුව අමතා ඒ ධර්මයෙහි අගය වදරා එය භාවිත කරන ලෙස ඒ භික්ෂුවට අනුශාසනයක් කළ සේක.

Non-commercial distribution

# චේතනා සූත්‍රය

(නිදන වග්ග සංයුත්තයේ කාළාරක්ඛත්තිය වග්ගයෙන්)

(1) යඤ්ච භික්ඛවෙ! චෙතෙති, යඤ්ච පකප්පෙති, යඤ්ච අනුසෙති, ආරම්මණමෙතං හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ සති පතිට්ඨා හොති. තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ නාමරූපස්ස අවක්කන්ති හොති. නාමරූපපච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්සපච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදනං, උපාදන පච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරා මරණං සොක පරිදෙවදුක්ඛදෙමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

(2) නො චෙ භික්ඛවෙ! චෙතෙති, නො ච පකප්පෙති. අථ චෙ අනුසෙති. ආරම්මණමෙතං හොති විඤ්ඤාණස්ස ඨිතියා, ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති, තස්මිං පතිට්ඨිතෙ විඤ්ඤාණෙ විරූළ්හෙ නාමරූපස්ස අවක්කන්ති හොති, නාමරූප පච්චයා සළායතනං, - පෙ - එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

(3) යතො ච ඛො භික්ඛවෙ! නො චෙ චේතෙති, නො ච පකප්පෙති, නො ච අනුසෙති ආරම්මණමෙතං න හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ අසති පතිට්ඨා විඤ්ඤාණස්ස න හොති, තදප්පතිට්ඨිතෙ විඤ්ඤාණෙ නාමරූපස්ස අවක්කන්ති න හොති. නාමරූපනිරොධා සළායතන නිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## චේතනා සූත්‍රයේ අදහස

(1) මහණෙනි! යම් ලෞකික කුශල චේතනාවක් පවත්වා ද, තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් යම් කල්පනාවක් කෙරේ ද, යම් අනුශාසනයක් වේ ද, එය කර්ම විඥානයා ගේ පැවැත්මට හේතුව ය. ඒ හේතුව ඇති කල්හි එය කර්ම විඥානයට පිහිටක් වන්නේ ය. ඒ කර්ම විඥනය ඇති වූ කල්හි විපාක දනයට ශක්තිය ලැබීම්

Non-commercial distribution

වශයෙන් දියුණු වූ කල්හි නාමරූපයට බැස ගැනීම වේ. නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතනය වේ. ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේ. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනාව වේ. වේදනා ප්‍රත්‍යයෙන් තණ්හාව වේ. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදනය වේ. උපාදන ප්‍රත්‍යයෙන් භවය වේ. භව ප්‍රත්‍යයෙන් ජාතිය වේ. ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ වෙති. මෙසේ මේ සකල දුඃඛස්කන්ධයා ගේ හට ගැනීම වේ.

(2) මහණෙනි! ඉදින් ලෞකික කුශලාකුශල චේතනා නො පවත්වා ද, තෘෂ්ණා දෘෂ්ටි කල්පනා නො කෙරේ ද, එහෙත් අනුශය පවතී ද, එය කර්ම විඥානය ඇතිවීමට හේතු වෙයි. හේතුව ඇති කල්හි එය කර්මවිඥානයට පිහිටක් වේ. කර්මවිඥානය ඇති වූ කල්හි දියුණු වූ කල්හි නාමරූපයට බැස ගැනීම වේ. නාමරූපය නිසා ෂඩායතනය වේ. -පෙ- මෙසේ මේ සකල දුඃඛස්කන්ධයා ගේ පහළ වීම වේ.

(3) මහණෙනි! ඉදින් ලෞකික කුශල චේතනා නො පවත්වා ද, තෘෂ්ණා දෘෂ්ටි කල්පනා නො කෙරේද, ඉදින් අනුශය නැත්තේ ද එය කර්මවිඥානයට හේතු නො වේ. හේතුවක් නැති කල්හි කර්මවිඥානයට පිහිටක් නැත. කර්ම විඥානයට පිහිටක් නැති කල්හි නාමරූපයට බැස ගැනීම නො වේ. නාමරූප නිරෝධයෙන් ෂඩායතන නිරෝධය වේ. -පෙ- මෙසේ මේ සකල දුඃඛස්කන්ධයා ගේ නිරෝධය වේ.

## චේතනා සූත්‍රයේ විස්තරය

ඇතැම් සූත්‍ර ධර්ම සිංහලට පරිවර්තනය කිරීම දුෂ්කරය. සූත්‍රවල එන සමහර පාළි වචන වෙනුවට යෙදීමට සුදුසු සිංහල වචන නැත. එබැවින් පරිවර්තනය කරන්නා වූ ඇතැම්හු ඒ වචන වෙනුවට සංස්කෘත වචන යොදති. ඒ පාළි වචනවල අඩු කඩා සාදගත් සිංහල වචන යොදති. එසේ කළ අනුවාදයකින් කියවන්නාට කාරණය තේරුම් නො ගත හැකි ය. අද තිබෙන බොහෝ බණ පොත් මහජනයාට අප්‍රිය වී තිබෙන්නේ ඒ තේරුම් ගත නො හෙන වචන නිසා ය. මේ චේතනා සූත්‍රයේ මුල් වගන්ති

Non-commercial distribution

කිහිපයත් සිංහලට පෙරළීම ඉතා දුෂ්කර ය. ඒ නිසා පාළි වචනවලින් කියවෙන අදහස තරමකටවත් කියවන්නවුන්ට තේරුම් ගත හැකි වේය යි සිතෙන වෙන වචන යොද සූත්‍රයේ මුල් වගන්ති කීපය අපේ බසට පෙරළන ලදී.

මේ සූත්‍රයෙහි **"යඤ්ච චෙතෙති"** යනුවෙන් දක්වෙන්නේ කාමාවචර කුශලචේතනා අටය, රූපාවචර කුශල චේතනා පසය, අරූපාවචර කුශල චේතනා සතරය යන ලෞකික කුශලචේතනා සතළොස ය. **"යඤ්ච පකප්පෙති"** යනුවෙන් කියැවෙන්නේ ලෝභ මූල සිත් අටෙහි තෘෂ්ණා - දෘෂ්ටි දෙක ය. **"යඤ්ච අනුසෙති"** යනුවෙන් දක්වෙන්නේ අකුශල චේතනා දෙළොස ය. බොහෝ තැන්වල ආරම්මණ යන වචනය යෙදී තිබෙන්නේ අරමුණය යි කියනු ලබන සිතට හසුවන දෙය දක්වීමට ය. මේ සූත්‍රයෙහි එන ආරම්මණ යන වචනය යොද තිබෙන්නේ ප්‍රත්‍යයය - හේතුවය යන අර්ථය සඳහා ය.

ලෞකික කුශලය සඳහා උත්සාහය ඇති කල්හි, තෘෂ්ණා දෘෂ්ටි අනුව කෙරෙන කල්පනාව ඇති කල්හි, අකුශලය පිළිබඳ උත්සාහය ඇති කල්හි ඒවා නිසා ඉදිරියට තවත් කුශලාකුශලයෝ ඇති වෙති. ඒවා දියුණු වීමෙන් මතු ඉපදීමට හේතුවන කර්ම ඇති වේ. මේ සූත්‍රයෙහි **විඤ්ඤාණ** යන වචනයෙන් දක්වන්නේ අනික් පටිච්චසමුප්පාද පාඨවල සංඛාර යන වචනයෙන් කියන මතු උත්පත්තියට හේතු වන කුශලා කුශල කර්මය ය. අනික් පටිච්චසමුප්පාද පාඨවල විඤ්ඤාණ යනුවෙන් දක්වන ප්‍රතිසන්ධි චිත්තය මේ සූත්‍රයෙහි නාමරූප යන්නට ම සංග්‍රහ කර තිබේ.


**"විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදන, භව, ජාති, ජරාමරණය"** යි-

මේ සූත්‍රයෙහි දක්වෙන්නේ පටිච්චසමුප්පාදංග දශයෙකි. **විඤ්ඤාණ** යනුවෙන් ගැනෙන දෙය **කර්මය බව** අවුල් නො වීම පිණිස විශේෂයෙන් සිතේ තබා ගන්න. මෙහි විඤ්ඤාණය අතීත භවයට අයත් ය. නාමරූප - සළායතන - ඵස්ස - වේදනා - තණ්හා - උපාදන - භව යන මේ අංග සත වර්තමාන භවයට අයත් ය. ජාති, ජරාමරණ යන අංග දෙක අනාගත භවයට අයත් ය. මෙහි

Non-commercial distribution

විඤ්ඤාණ නාමරූප දෙකට අතර එක් සන්ධියෙකි. වේදනා - තණ්හා දෙකට අතර එක් සන්ධියෙකි. භව - ජාති දෙකට අතර එක් සන්ධියෙකි. විඤ්ඤාණය අතීත හේතුව ය. නාමරූප සළායතන ඵස්ස යන තුන වර්තමාන ඵල ය. වේදනා - තණ්හා - උපාදාන - භව යන සතර වර්තමාන හේතු ය. ජාති - ජරා මරණ යන දෙක අනාගත ඵල ය. මෙසේ සන්ධි තුන හා කොටස් සතර වේ.

## චේතනා සූත්‍රයේ සැටියට
## සංසාර චක්‍රය



Non-commercial distribution

# උපාදාන සූත්‍රය

(නිදාන වග්ග සංයුක්තයේ දුක්ඛ වර්ගයෙන්)

(1) උපාදානියෙසු භික්ඛවෙ, ධම්මෙසු අස්සාදානු පස්සී විහරතො තණ්හා පවඩ්ඪති. තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාති පච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදෝමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

(2) සෙය්‍යථාපි භික්ඛවෙ! දසන්නං වා කට්ඨවාහානං, වීසාය වා කට්ඨවාහානං, තිංසාය වා කට්ඨවාහානං, චත්තාළීසාය වා කට්ඨවාහානං මහා අග්ගික්ඛන්ධො ජලෙය්‍ය. තත්‍ර පුරිසො කාලෙන කාලං සුක්ඛානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය, සුක්ඛානි ච ගොමයානි පක්ඛිපෙය්‍ය, සුක්ඛානි ච කට්ඨානි පක්ඛිපෙය්‍ය. එවං හි සො භික්ඛවෙ! මහා අග්ගික්ඛන්ධො තදාහාරො තදුපාදානො චිරං දීඝමද්ධානං ජලෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ! උපාදානියෙසු ධම්මෙසු අස්සාදානුපස්සිනො විහරතො තණ්හා පවඩ්ඪති. තණ්හාපච්චයා උපාදානං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

(3) උපාදානියෙසු භික්ඛවෙ! ධම්මෙසු ආදීනවානුපස්සී විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හා නිරොධා උපාදාන නිරොධො -පෙ- ජරාමරණං සොකපරිදෙව දුක්ඛදෝමනස්සු-පායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

(4) සෙය්‍යථාපි භික්ඛවෙ! දසන්නං වා කට්ඨවාහානං වීසාය වා කට්ඨවාහානං තිංසාය වා කට්ඨවාහානං චත්තාළීසාය වා කට්ඨවාහානං මහා අග්ගික්ඛන්ධො ජලෙය්‍ය. තත්‍ර න පුරිසො කාලෙන කාලං සුක්ඛානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය න සුක්ඛානි ච ගොමයානි පක්ඛිපෙය්‍ය න සුක්ඛානි ච කට්ඨානි පක්ඛිපෙය්‍ය. එවං හි සො භික්ඛවෙ! මහා අග්ගික්ඛන්ධො පුරිමස්ස ච උපාදානස්ස පරියාදානා අඤ්ඤස්ස ච අනුපහාරා අනාහාරො නිබ්බායෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ! උපාදානියෙසු ධම්මෙසු ආදීනවානුපස්සී

Non-commercial distribution

විහරතො තණ්හා නිරුජ්ඣති. තණ්හා නිරොධා උපාදාන නිරොධො, -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතීති.

## උපාදාන සූත්‍රයේ තේරුම

(1) මහණෙනි! උපාදානයන් ගේ වැඩීමට ස්ථානය වන කාම රූප අරූප යන භවත්‍රයට අයත් සංස්කාරයන් ගේ ආස්වාද පක්‍ෂය බලන්නා වූ තැනැත්තාහට තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණාව නිසා උපාදානය වේ. උපාදානය නිසා භවය වේ, භවය නිසා ජාතිය වේ. ජාතිය නිසා ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ වෙත්. මෙසේ මේ සත්ත්ව පුද්ගල ස්වභාවය නැති දුඃඛස්කන්ධයා ගේ පහළවීම වේ.

(2) මහණෙනි! උපමාවක් කියනු ලැබේ. කරත්ත දශයක් පමණ වූ හෝ කරත්ත විස්සක් පමණ වූ හෝ කරත්ත තිසක් පමණ වූ හෝ කරත්ත සතළිසක් පමණ වූ හෝ දර ගොඩකින් මහ ගිනිකඳක් ඇවිලෙන්නේ නම්, මිනිසෙක් ඒ ගිනිගොඩට වරින්වර වියළි තණපත් දමා නම්, වියළි ගොම දමා නම්, වියළි දර දමා නම්, ඒ ගින්න ඒවා ආහාර කොට දීර්ඝ කාලයක් මුළුල්លෙහි ඇවිලෙන්නේ ය. මහණෙනි! එපරිද්දෙන් උපාදානයන් ගේ වැඩීමට ස්ථානය වන ත්‍රෛභූමික සංස්කාරයන් ගේ ආස්වාද පක්‍ෂය බලමින් වාසය කරන්නහුට තෘෂ්ණාව වැඩේ. තෘෂ්ණාව නිසා උපාදානය වේ. උපාදානය නිසා භවය වේ. -පෙ- මෙසේ මේ සකල දුඃඛස්කන්ධයා ගේ පහළ වීම වේ.

(3) උපාදානයා ගේ වැඩීමට ස්ථාන වන ත්‍රෛභූමික සංස්කාරයන්ගේ ආදීනව පක්‍ෂය බලමින් වෙසෙන්නහුට තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණා නිරෝධයෙන් උපාදාන නිරෝධය වේ. -පෙ- ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාසයෝ නිරුද්ධ වෙති. මෙසේ මේ සකල දුඃඛස්කන්ධයා ගේ නිරෝධය වේ.

(4) උපමාවක් කියනු ලැබේ. මහණෙනි! කරත්ත දශයක් පමණ වූ හෝ කරත්ත විස්සක් පමණ වූ හෝ කරත්ත තිසක් පමණ වූ හෝ කරත්ත සතළිසක් පමණ වූ හෝ දරවලින් මහ ගිනිකඳක්

Non-commercial distribution

ඇවිලෙන්නේ ය. එයට මිනිසෙක් කලින් කල වියළි තණපත් ද නො දමන්නේ ය. වියළි ගොම ද නො දමන්නේ ය, වියළි දර ද නො දමන්නේ ය, මහණෙනි! එසේ ඒ ගිනිකඳ පළමු දර ඉවර වීමෙන් අලුත් දර නො දැමීමෙන් නිරාහාරව නිවී යන්නේ ය, මහණෙනි! එපරිද්දෙන් උපාදනයන් ගේ වැඩීමට ස්ථාන වන ත්‍රෛභූමික සංස්කාරයන් ගේ ආදීනව පක්‍ෂය බලමින් වෙසෙන්නහුට තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණා නිරෝධයෙන් උපාදන නිරෝධය වේ. -පෙ- මෙසේ මේ සකල දුඃඛස්කන්ධයා ගේ නිරෝධය වේ.

## උපාදන සූත්‍රය ගැන දතයුතු කරුණු

උපාදන සතර කලින් විස්තර කර ඇත. උපාදනයන් ඇති වන්නේ ද වැඩෙන්නේ ද ලෞකික නාම රූප ධර්මයන්හි ය. ලෞකික නාම රූපය යි කියනුයේ ලෝකෝත්තර සිත් සතරත් නිවනත් හැර කාම රූප අරූප සංඛ්‍යාත ලෝක තුනෙහි සත්ත්වයන් පුද්ගලයන් වශයෙන් හා ගස්වැල් ආදි වස්තු වශයෙන් ද ඇත්තා වූ සියල්ල ය. විඤ්ඤාණය ඇති නැති වස්තු දෙවර්ගය අතුරෙන් උපාදනයන් වඩාත් වැඩෙන්නේ සත්ත්ව පුද්ගල සංඛ්‍යාත සවිඤ්ඤාණක වස්තු විෂයෙහි ය.

ලෞකික නාම රූපයන්හි ආස්වාදය - ආදීනවය කියා කරුණු දෙකක් ඇත්තේ ය. රූපශබ්දදිය නිසා සත්ත්ව සන්තානයෙහි උපදනා සුඛ සෝමනස්ස දෙක ලෞකික ධර්මයන්ගේ ආස්වාද පක්‍ෂය යි. ජරා මරණ ශෝක පරිදේවාදිය ලෞකික ධර්මයන් ගේ ආදීනව පක්‍ෂය ය. ලෞකික ධර්මයන් ගේ ආස්වාද පක්‍ෂය ඉතා සුලු ය. ආදීනව පක්‍ෂය ඉතා මහත් ය. ලෞකික ධර්මයන් ගෙන් ලැබිය හැකි ආස්වාදය සොයන ආස්වාදය ලබන්නට උත්සාහ කරන අයට ඒ ලෞකික ධර්ම සමූහය අරමුණු කොට ඒ ධර්මයන් කෙරෙහි මහත් ආශාවක් ඇති වේ. "උපාදනියෙසු භික්ඛවෙ! ධම්මෙසු අස්සාදනුපස්සී විහරතො තණ්හා පවඩ්ඪති" යි වදළේ එහෙයිනි.

Non-commercial distribution

මේ සූත්‍රයෙන් දක්වන්නේ ද තෘෂ්ණා මූලික ප්‍රතීත්‍යසමුත්පාදයෙකි. තෘෂ්ණාව මුල්කොට උපදනා උපාදාන භව ජාති ජරා මරණ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍ය උපායාස සංඛ්‍යාත දුඃඛස්කන්ධය මහ ගිනි කඳක් වැනි ය. මහ ගිනි කඳට වියළි තණපත් ආදිය දමතහොත් ඒතාක් එය ඇවිලෙන්නේ ය. උපාදානය ධර්මය යි කියනු ලබන ලෞකික නාමරූපයන් ගේ ආස්වාදය නැවත නැවත සෙවීම නැවත නැවත ලබන්නට විඳින්නට උත්සාහ කිරීම දුඃඛස්කන්ධ සංඛ්‍යාත ගිනිමැලයට දර දැමීම ය. ඒ දර දැමීම කරන තෙක් ම සංසාර දුඃඛසංඛ්‍යාත ගිනිමැලය නො නිවී ඇවිලෙන බව මේ සූත්‍රයෙන් දක්වන අදහස ය. මේ සූත්‍රයෙහි දක්වන පටිච්චසමුප්පාදයට ඇත්තේ තණ්හා - උපාදාන - භව - ජාති - ජරාමරණ යන අංග පස පමණෙකි.

## දෘෂ්ටි නිවාරණ දේශනා

දෙවියන් සහිත ලෝකයා විසින් සත්ත්වයා ගැනත් බාහිර ලෝකයා ගැනත් අනේකප්‍රකාර මිථ්‍යාදෘෂ්ටි ඇති කර ගෙන තිබෙන්නේ මේ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය නො දැනීම නිසා ය. යමෙක් පටිච්චසමුප්පාදය හරියට ම තේරුම් ගත්තේ නම් ඒ තැනැත්තා හට **"ලෝකය දෙවියකු විසින් මවන ලද්දක්ය. ඉබේම ඇතිවූවක්ය"** යනාදීන් පවත්නා එකම මිථ්‍යාදෘෂ්ටියකුදු ඇති නො වේ. පටිච්ච- සමුප්පාදය තේරුම් ගත් තැනැත්තා නැවත කිසිවකුට මිථ්‍යාදෘෂ්ටිකයකු නො කළ හැකි ය. පටිච්චසමුප්පාදය ඉගෙන ගැනීම තේරුම් ගැනීම - පිරිසිදු සම්‍යග්දෘෂ්ටිකයකු වීමට ඇති හොඳම උපාය ය. දෘෂ්ටිගතිකයන් එයින් මුදළීමටත් ඇති හොඳම උපාය, ඔවුනට පටිච්චසමුප්පාදය අවබෝධ කරවීම ය.

ආත්මය ශරීරය යන දෙකම එකය කියා ද, ආත්මය අනිකෙක ශරීරය අනිකෙක කියා ද, පින් පව් කළහුට එහි විපාකය ලැබෙනවාය කියා ද, එකකු කළ කර්මයේ විපාකය අනිකකුට හිමි වෙනවාය කියා ද ලෝකයෙහි ඇති අනේකප්‍රකාර දෘෂ්ටීන් ගත් අය පැමිණි කල්හි ඔවුන් ගේ දෘෂ්ටි නැති කිරීම සඳහා තථාගතයන් වහන්සේ විසින් ඒ ඒ අයට දේශනා කළ සූත්‍ර ගණනක් ද ඇත්තේ ය.

Non-commercial distribution

මේ පටිච්චසමුප්පාද විවරණය අංග සම්පූර්ණ වීම පිණිස ඒ සූත්‍රත් මෙහි දැක්විය යුතු ය. පළමු මෙහි දක් වූ සූත්‍ර සේ ම දික් වූ ඒ සූත්‍ර, පාළියත් සමග සම්පූර්ණ කොට දක්වන්නට ගිය හොත් ග්‍රන්ථය මහත් වන බැවින් දෘෂ්ටි නිවාරණ සූත්‍ර කීපයක කරුණු පමණක් මෙහි දක්වනු ලැබේ.

## ප්‍රතීත්‍යසමුත්පාද සූත්‍රය

(නිදානවග්ග සංයුත්ත කාලාරක්ඛත්තියවග්ග)

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ "අවිජ්ජා පච්චයා සංඛාරා" යනාදීන් පටිච්චසමුප්පාදය දේශනය කළ සේක. එකල්හි එක් භික්ෂුවක් "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස! ජරාමරණය යනු කුමක් ද? මේ ජරා මරණය කාගේද" යි විචාළේ ය. එකල්හි තථාගතයන් වහන්සේ "මහණ! තාගේ ප්‍රශ්නය හොඳ නැතය" යි වදරා මෙසේ වදාළ සේක.

**"කතමං ජරාමරණං කස්ස ච පනිදං ජරාමරණන්ති ඉති වා භික්ඛු යො වදෙය්‍ය, අඤ්ඤං ජරාමරණං අඤ්ඤස්ස ච පනිදං ජරාමරණන්ති ඉති වා භික්ඛු යො වදෙය්‍ය, උභයමෙතං එකත්ථං, බ්‍යඤ්ජනමෙව නානං. තං ජීවං තං සරීරන්ති වා දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා භික්ඛු දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො න හොති. එතෙ තෙ භික්ඛු උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති ජාතිපච්චයා ජරාමරණන්ති."**

එහි තේරුම මෙසේ ය :– "මහණ! ජරාමරණය කවරේද? මේ ජරාමරණය කාගේ දැයි යමෙක් කියා ද, මහණ! ජරා මරණය අනිකෙක, මේ ජරා මරණය අන්කෙනකු ගේ ය යි යමෙක් කියා ද, ඒ දෙකම අර්ථ වශයෙන් එකම ය. වෙනස් වන්නේ වචනය පමණ ය. ආත්මයත් එය ය, ජීවිතයත් එය ය යන දෘෂ්ටිය ඇති කල්හි බඹසර විසීම සිදු නො වන්නේ ය. ආත්මය අනිකෙක, ජීවිතය අනිකෙක යන දෘෂ්ටිය ඇති කල්හි ද බඹසර විසීම සිදු නො වේ ය. මහණ! තථාගත තෙමේ ඒ අන්ත දෙකට ම නො ගොස් ජාතිය නිසා ජරා මරණය වේය" යි දහම් දෙසන්නේ ය.

Non-commercial distribution

ඒ භික්ෂුව විසින් ඇසූ ජරා මරණය කුමක් ද? මේ ජරා මරණය කාගේ ද? යන මේ ප්‍රශ්න දෙකින් "ජරා මරණය කුමක් ද?" යන ප්‍රශ්නය වනාහි නො ඇසිය යුතු නො මනා ප්‍රශ්නයක් නො වේ. තථාගතයන් වහන්සේ ඒ ප්‍රශ්නය ප්‍රතික්ෂේප කරන ලද්දේ එයට එකතු කර ඇති "ජරා මරණය කාගේ ද" යන දෙවෙනි ප්‍රශ්නය නිසා ය. ධර්ම පරම්පරාව මිස පරමාර්ථ වශයෙන් පුද්ගලයකු නැති බැවින් "ජරා මරණය කාගේ ද" යන ප්‍රශ්නය නො ඇසිය යුතු ප්‍රශ්නයෙකි. "ජරා මරණය කුමක් ද, ඒ ජරා මරණය කාගේ ද" යන මේ කීමත් "ජරා මරණය අනිකක, ඒ ජරා මරණය අනිකකුගේ ය" යන මේ කීමත් අර්ථයෙන් එකම ය යි තථාගතයන් වහන්සේ විසින් වදාරන ලදුයේ ඒ දෙකින් ම පරමාර්ථ වශයෙන් නැති පුද්ගලයා කියැවෙන හෙයිනි.

බඹසර විසීමය යනු ලෝකෝත්තර මාර්ගයට පැමිණෙනු පිණිස කළ යුතු දේ කිරීම ය. ආත්මයත් ශරීරයත් එකය යන දෘෂ්ටිය ඇති තැනැත්තේ ජීවය යි සලකන ආත්මය නැසෙන කල්හි ශරීරය නැසේ ය, ශරීරය නැසෙන කල්හි ආත්මය නැසේය යි ගන්නේ ය. ඒ දෘෂ්ටියේ සැටියට ම මරණින් සත්ත්වයා කෙළවර වේ. උච්ඡේද දෘෂ්ටිය ය කියනුයේ ඒ දෘෂ්ටියට ය. සංස්කාරයෝ ම උපදිත් ය, සංස්කාරයෝ ම නිරුද්ධ වෙත්ය යි ගැනීම ශාසනික සම්‍යක් දෘෂ්ටිය ය. ලෝකෝත්තරමාර්ග චිත්තය වනාහි සංසාරය යි කියනු ලබන උපදිමින් බිඳෙමින් පවත්නා නාමරූප ධර්ම පරම්පරාව නිරෝධයට පමුණුවන සිඳ දමන ධර්මයකි. ඉබේම මරණින් ඒ සංස්කාර ධර්ම පරම්පරාව සිඳෙනවා නම්, මතු ඉපදීමක් නො වෙනවා නම් ලෝකෝත්තර මාර්ග භාවනාවෙන් පලක් නැත. ආත්මය ශරීරය යන දෙක ම එකය යන දෘෂ්ටිය ඇති කල්හි බඹසර වස් විසීම හෙවත් මාර්ග භාවනාව සිදු නො වේ ය යි වදළේ එහෙයිනි.

ආත්මය අනිකෙක, ශරීරය අනිකෙකැ යි ගන්නා තැනැත්තේ ශරීරය මෙහි ම විනාශ වන්නේ ය, එහෙත් ආත්මය නො මැරෙන්නේ ය. ශරීරය නැසුණු කල්හි එය තුළ පවත්නා ආත්මය, පක්ෂියකු කූඩුවකින් ඉගිළ යන්නාක් මෙන් ශරීරයෙන් පිට වී යන්නේ ය යි ගනී. ශාශ්වතදෘෂ්ටිය කියනුයේ ඒ දෘෂ්ටියට ය.

Non-commercial distribution

මේ ලෝකෝත්තර මාර්ග චිත්තය වනාහි සකල සංස්කාරයන් ම නිරෝධයට පමුණුවමින් සංසාර ප්‍රවෘත්තියේ නැවැත්වීම කරමින් උපදනා ධර්මයෙකි. නිත්‍ය වූ නො නැසෙන්නා වූ එකම සංස්කාරයකුදු ඇති නම් සංසාර ප්‍රවෘත්තිය සිඳලිය නො හේ. සංසාර ප්‍රවෘත්තිය නැවැත්විය නො හෙන කල්හි ලෝකෝත්තර මාර්ග භාවනාවෙන් පලක් නැත. ආත්මය හෙවත් ජීවය අනිකක, ශරීරය අනිකකැ" යි ගන්නා දෘෂ්ටිය ඇති කල්හි බඹසරවස් විසීම (මාර්ගභාවනාව) සිදු නො වන්නේය යි වදළේ එහෙයිනි.

තථාගතයන් වහන්සේ සත්ත්වයා දිරන්නේ ය, මැරෙන්නේ ය යි ද නො වදරන්නාහ. නො දිරන්නේ ය නො මැරෙන්නේ ය යි ද නො වදරන්නාහ. ඒ අන්ත දෙකට ම නො ගොස් උන් වහන්සේ ජාතිය නිසා ජරා මරණය වන බව පමණක් වදරන්නාහ.

මෙසේ තථාගතයන් වහන්සේ ඒ භික්ෂුවට පිළිතුරු දුන්පසු ඒ භික්ෂුව එපමණකින් නො නැවතී "ජාතිය කුමක් ද? මේ ජාතිය කවරෙකුගේ ද"යි නැවත ද විචාළේය. තථාගතයන් වහන්සේ එයට ද පළමු පැනයට සේම පිළිතුරු දුන් සේක. ඒ භික්ෂුව එපමණකින් නො නැවතී පටිච්චසමුප්පාදාංග සියල්ලම ගැන එසේ ම ප්‍රශ්න කෙළේ ය. තථාගතයන් වහන්සේ ද පළමු ප්‍රශ්නයන්ට පිළිතුරු දුන් අයුරින් ඒ සියල්ලට ම පිළිතුරු දුන් සේක. අවසාන ප්‍රශ්නයට තථාගතයන් වහන්සේ දුන් පිළිතුර මෙසේය.

කතමෙ සංඛාරා? කස්ස ච පනිමෙ සංඛාරාති? ඉති වා භික්ඛු යො වදෙය්‍ය, අඤ්ඤෙ සංඛාරා අඤ්ඤස්ස ච පන් මෙ සංඛාරාති ඉති වා භික්ඛු යො වදෙය්‍ය, උභයමෙතං එකත්ථං, බ්‍යඤ්ජනමෙව නානං තං ජීවං තං සරීරන්ති වා භික්ඛු දිට්ඨියා සති බ්‍රහ්ම-චරියවාසො න හොති. අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා භික්ඛු දිට්ඨියා සති බ්‍රහ්ම චරියවාසො න හොති. එතෙ තෙ භික්ඛු උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති අවිජ්ජා පච්චයා සංඛාරාති.

ඉක්බිති අවිද්‍යාව ගේ නිරවශේෂ නිරෝධයෙන් "ජරාමරණය කවරේ ද? ඒ ජරාමරණය කාගේ ද? ජරාමරණය අනිකෙක, ඒ ජරාමරණය අනිකකුගේ ය, ආත්මයත් ශරීරයත් එක ය, ආත්මය

Non-commercial distribution

අනිකෙක, ශරීරය අනිකෙක" යනාදි සකල දෘෂ්ටීහු මතු කිසි කලෙක නූපදනා පරිදි නිරුද්ධ වන්නාහ යි වදාළ සේක.

# අචේලකාශ්‍යප සූත්‍රය

(නිදානවග්ග සංයුක්තයේ ආහාර වර්ගයෙන්)

එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි වැඩ වෙසෙන සේක්, රජගහ නුවර පිඬු සිඟා වැඩි සේක. අචේලකාශ්‍යප නමැති තීර්ථකයෙක් දුරදී ම තථාගතයන් වහන්සේ වැඩම කරනු දැක, උන්වහන්සේ කරා එළඹ, පිළිසඳර කථා කොට එකත්පසෙක සිට, "පින්වත් ගෞතමයන් වහන්ස! පැනයක් විචාරීමට අවසර දුන මැනව" යි කී ය. එකල්හි තථාගතයන් වහන්සේ "කාශ්‍යපය! පිඬුසිඟා වඩනා මේ වේලාව ප්‍රශ්න ඇසීමට අවස්ථාව නො වේ ය" යි වදාළ සේක. අචේලකාශ්‍යප එපමණකින් නො නැවතී දෙවනුවත් තෙවනුවත් ප්‍රශ්න ඇසීමට අවසර ඉල්ලා සිටියේ ය. තථාගතයන් වහන්සේ ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක.

කාශ්‍යප එයින් ද නො නැවතී " පින්වත් ගෞතමයන් වහන්ස! නුඹ වහන්සේ ගෙන් බොහෝ ප්‍රශ්න ඇසීමේ අදහසක් නැත ය" යි කීය. එකල්හි තථාගතයන් වහන්සේ "කාශ්‍යපය! නුඹ කැමති කරුණක් අසව" යි වදාළ සේක. ඉන්පසු අචේලකාශ්‍යපයන් හා තථාගතයන් වහන්සේ අතර වූ කථාව මෙසේ ය.

පින්වත් ගෞතමයාණෙනි, මේ දුක තමා ම ඇති කර ගන්නා දෙයක් ද? කාශ්‍යපය! එසේ නො කියව! දුක තමා ම ඇතිකර ගන්නේ ය යි නො කිය යුතු ය.

පින්වත් ගෞතමයාණෙනි! එසේ නම් මේ දුක අනුන් විසින් ඇති කරනු ලබනවා ද? කාශ්‍යප! එසේ නො කියනු. දුක අනුන් විසින් ඇති කරනු ලබන්නේ ය යි නො කිය යුතු ය.

පින්වත් ගෞතමයාණෙනි! එසේ නම් මේ දුක තමා විසිනුත් අනුන් විසිනුත් ඇති කරන්නේ ද? කාශ්‍යපය! එසේ නො කියව. දුක තමා විසිනුත් අනුන් විසිනුත් ඇති කරන්නකැයි නො කිය යුතු ය.

Non-commercial distribution

පින්වත් ගෞතමයාණනි, එසේ නම් මේ දුක කාගේවත් සංවිධානයක් නැතිව ඉබේ ම ඇති වේ ද? කාශ්‍යපය! එසේ නො කියනු. දුක ඉබේ ම ඇති වන්නේ ය යි නො කිය යුතු ය.

පින්වත් ගෞතමයාණෙනි! දුකය කියා දෙයක් ඇත්තේම නැති ද? කාශ්‍යප, දුක නැත්තේ නො වේ. දුක ඇත්තේ ය.

පින්වත් ගෞතමයෝ දුක නො දනිත් ද? නො දකිත් ද? කාශ්‍යපය! මම දුක නො දන්නෙම් නො වෙමි. නො දක්නෙම් නො වෙමි. මම දුක දනිමි. දුක දකිමි.

අචේලකාශ්‍යප එක්තරා නග්න පැවිද්දෙකි. ආත්ම වාදියෙකි. ඔහු ගේ ඉල්ලීමට තථාගතයන් වහන්සේ එකවරට ම අවසර නො දී දෙතුන් වරක් ඉල්ලන තුරු බලා සිටියේ උන්වහන්සේ ගේ දේශනය ඔහු ලවා ගෞරවයෙන් ඇස්වීම පිණිස ය. මේ තීර්ථකයෝ ඇසූ සැටියේ ම කියුව හොත් ඒ ගැන ගරු නො කරති. සැලකිල්ලක් නො දක්වති. පමා කොට අගය වැඩි කොට කියන කල්හි ඔවුහු එයට සැලකිල්ලෙන් ඇහුන් කන් දෙති. අචේලකාශ්‍යප ඒ ප්‍රශ්න ඇසූයේ ආත්ම දෘෂ්ටියෙහි පිහිටා ය.

බුද්ධ කාලයේ දී දඹදිව සත්ත්වයා ගැනත් ලෝකය ගැනත් නා නා මත දරූ නා නා දෘෂ්ටි ගත් බොහෝ ශ්‍රමණයෝ වූහ. ඇතමෙක් දුක මම ය කියා පුද්ගලයා ය සත්ත්වයා ය කියා සලකන ආත්මය විසින් ම ඇති කරන දෙයකැ යි ගත්හ. ඇතමෙක් මැවුම්කාර දෙවිවරුන් විසින් ඇති කරන ලද්දකැ යි ගත්හ. ඇතමෙක් තමා ය අනුන් ය යන දෙපක්ෂය විසින් ම ඇති කරන්නක් ය යි ගත්හ. ඇතමෙක් කාගේවත් සංවිධානයක් නැතිව ඉබේම ඇතිවන දෙයක් ලෙස පිළිගත්හ. අචේලකාශ්‍යප මේ ප්‍රශ්න ඇසීම කෙළේ බුදුන් වහන්සේ ගේ ලබ්ධිය දැන ගැනීම පිණිස ය.

මේ සූත්‍රයෙහි දුක යනුවෙන් අදහස් කරන්නේ දුඃඛ වේදනාව නොව සංසාර දුඃඛය ය. පඤ්චස්කන්ධය ය. තමන් වහන්සේ ප්‍රකාශ කරන කරුණ සැමට ම තේරෙන පරිදි

Non-commercial distribution

අවබෝධ වන පරිදි දහම් දෙසන තථාගතයන් වහන්සේ අචේලකාශ්‍යපට තේරුම් ගත නො හෙන පරිදි කාරණය ඔහුට හොඳට ම අවුල් වන පරිදි ඔහු ගේ ප්‍රශ්නවලට පිළිතුරු දී වදාළේ ඔහු මෙල්ල කරනු පිණිස ය.

අචේලකාශ්‍යපට තථාගතයන් වහන්සේ වදාළ දෙයින් කිසිවක් අල්ලාගත නො හී ඔහු මෙල්ල විය. පළමු මෙන් "ගෞතමය! ගෞතමය!" කියා තථාගතයන් වහන්සේට කථා කළ අචේලකාශ්‍යප හොඳට ම මෙල්ල වී "ආචික්ඛතු මෙ භන්තේ! භගවා දුක්ඛං, දෙසෙතු මෙ භන්තෙ භගවා" යි ඉතා ගෞරවයෙන් ස්වාමීනී! භාග්‍යවතුන් වහන්ස! මා හට දුක දේශනය කරන සේක්වා! යි ආරාධනා කෙළේ ය. බුදුන්වහන්සේ ඔහුට මෙසේ ධර්ම දේශනා කළ සේක.

**සෝ කරෝති සෝ පටිසංවේදයතීති ඛෝ කස්සප! ආදිතෝ සතෝ සයං කතං දුක්ඛන්ති ඉති ඉදං වදං සස්සතං ඒතං පරේති. අඤ්ඤෝ කරෝති අඤ්ඤෝ පටිසංවේදියතීති ඛෝ කස්සප! වේදනාභිතුන්නස්ස සතෝ පරං කතං දුක්ඛන්ති ඉති ඉදං වදං උච්ඡේදං ඒතං පරේති. ඒතේ තේ කස්සප! උභෝ අන්තේ අනුපගම්ම මජ්ඣේන තථාගතෝ ධම්මං දේසේති. අවිජ්ජා පච්චයා සංඛාරා සංඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හෝති. අවිජ්ජායත්වේව අසේසවිරාග නිරෝධා සංඛාර නිරෝධෝ, සංඛාරනිරෝධා විඤ්ඤාණ-නිරෝධෝ -පෙ- ඒවමේතස්ස කේවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරෝධෝ හෝතීති.**

"කාශ්‍යපය! කරන තැනැත්තේ ම විපාකය විඳීය කියා පළමුකොට ගත් කල්හි සංසාර දුඃඛය තමා විසින් ම ඇති කරන ලද්දකැ යි කියමින් පසුව ශාශ්වත දෘෂ්ටියට එළඹෙන්නේ ය. කාශ්‍යපය! අනිකෙක් කෙරේය අනිකෙක් එහි විපාකය විඳීය කියා පළමු කොට ගත් කල්හි පසුව කළ තැනැත්තේ මරණයෙන් සිඳී යන්නේ ය. අනිකෙක් විපාක විඳින්නේ ය යන උච්ඡේද දෘෂ්ටියට එළඹෙන්නේ ය. එය හා යුක්ත වන වේදනාවෙන් මඩනා ලද තැනැත්තේ සංසාර දුක්ඛය අනුන් ඇතිකරන ලද්දක් ය යි කියමින් උච්ඡේදයට බැසගන්නේ ය.

Non-commercial distribution

කාශ්‍යපය! තථාගත තෙමේ ඒ අන්ත දෙකට ම නො ගොස් මෙසේ ධර්මය දේශනය කෙරේ. කෙසේද යත්? අවිද්‍යාව නිසා සංස්කාරයෝ වෙති, සංස්කාරයන් නිසා විඥානය ඇති වේ. -පෙ- මෙසේ මේ දුඃඛස්කන්ධයාගේ හටගැනීම වේ. අවිද්‍යාව නිරුද්ධ වීමෙන් සංස්කාර නිරෝධය වේ. සංස්කාර නිරෝධයෙන් විඥාන නිරෝධය වේ. -පෙ- මෙසේ මේ සත්ත්ව පුද්ගල භාවයක් නැති දුඃඛස්කන්ධයා ගේ නිරෝධය වේ. මෙසේ තථාගත තෙමේ දහම් දෙසන්නේ ය යි වදාළ සේක. තථාගතයන් වහන්සේ ගේ ප්‍රතීත්‍යසමුත්පාද දේශනය ඇසීමෙන් අචේලකාශ්‍යප ගේ දෘෂ්ටිය බිඳී ගියේ ය. හෙතෙමේ බුදු සස්නෙහි පැහැදී පැවිද්ද ලබා පසු කලෙක සියලු කෙලෙසුන් නසා රහත් විය.

Non-commercial distribution

අර්හත්වය පිළිබඳ පටිච්චසමුප්පාදය.

# උපනිසා සූත්‍රය

(නිදානවග්ග සංයුත්තයේ දසබල වග්ගයෙන්)

එක් සමයෙක්හි තථාගතයන් වහන්සේ මෙසේ වදාළ සේක. මහණෙනි, මම දන්නහු ගේ දක්නහු ගේ ආශ්‍රවක්ෂය ය කියමි. නො දන්නහු ගේ නො දක්නහු ගේ ආශ්‍රවක්ෂයයක් නො කියමි. මහණෙනි! කුමක් දන්නහු ගේ කුමක් දක්නහු ගේ ආශ්‍රවයන් ගේ ක්ෂයය වේ ද? මේ රූපය ය, රූපයා ගේ පහළවීම මෙසේ ය, රූපයා ගේ නිරෝධය මෙසේ ය. මේ වේදනාව ය, වේදනාව ගේ පහළවීම මෙසේ වේ ය, වේදනාව ගේ නිරෝධය මෙසේ වේ ය. මේ සංඥවය, සංඥවගේ පහළවීම මෙසේ වේ ය, සංඥවගේ නිරෝධය මෙසේ වේ ය. මේ සංස්කාරයෝ ය, සංස්කාරයන් ගේ පහළ වීම මෙසේ වේ ය, සංස්කාරයන් ගේ නිරෝධය මෙසේ වේ ය. මේ විඥ්ඥාණය ය, විඥ්ඥාණයේ පහළවීම මෙසේ වේ ය, විඥ්ඥාණයා ගේ නිරෝධය මෙසේ වේ ය කියා දන්නහු ගේ දක්නහු ගේ ආශ්‍රවක්ෂය ය වේ.

මහණෙනි! ඔහුගේ ආශ්‍රවක්ෂය සංඛ්‍යාත අර්හත් ඵලය ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ යම් ඥනයක් වේ ද, එය ද ප්‍රත්‍යයෙන් හටගත් එකක් බව කියමි. ප්‍රත්‍යයන් නැතියෙකැ යි නො කියමි. මහණෙනි! අර්හත්ඵල ප්‍රත්‍යවේක්ෂා ඥනයාගේ ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය අර්හත්ඵල සංඛ්‍යාත විමුක්තිය ය. මහණෙනි! ඒ විමුක්තිය ද ප්‍රත්‍යය සහිතය යි කියමි. මහණෙනි! ඒ විමුක්තිය ගේ ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය විරාග සංඛ්‍යාත අර්හත්-මාර්ගය යි කිය යුතු ය. මහණෙනි! මම ඒ විරාගය ද ප්‍රත්‍යය සහිතය යි කියමි.

මහණෙනි! විරාගයේ ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය නිබ්බිදඥාණ නම් වූ විදර්ශනා ඥනය ය. මහණෙනි! ඒ නිබ්බිදව ද මම ප්‍රත්‍යය සහිතය යි කියමි. මහණෙනි! නිබ්බිදවෙහි ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය යථාභූත ඥාණ නම් වූ සංස්කාරයන් ගේ සැටි තත් වූ පරිදි දන්නා තරුණ විදර්ශනාඥනය ය. මහණෙනි! ඒ යථාභූත ඥාණයද ප්‍රත්‍යය සහිතයැ යි කියමි. මහණෙනි, ඒ

Non-commercial distribution

යථාභූත ඥාණයේ ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය සමාධිය යි කිය යුතු ය. මහණෙනි! මම සමාධිය ද ප්‍රත්‍යය සහිතය යි කියමි.

මහණෙනි! සමාධිය ගේ ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය සුඛයය යි කිය යුතු ය. මහණෙනි! මේ සුඛය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. මහණෙනි! සුඛයේ ප්‍රත්‍යය කවරේ ද? පස්සද්ධිය ය යි කිය යුතු ය. මහණෙනි! මම පස්සද්ධිය ද ප්‍රත්‍යය සහිතය යි කියමි. පස්සද්ධිය ගේ ප්‍රත්‍යය කවරේ ද? ප්‍රීතිය ය යි කිය යුතු ය. මහණෙනි! ප්‍රීතිය ද ප්‍රත්‍යය සහිතය යි කියමි. ප්‍රීතියේ ප්‍රත්‍යය කවරේ ද? පාමොජ්ජ නම් වූ දුර්වල ප්‍රීතිය යි කිය යුතු ය. මහණෙනි! ඒ දුර්වල ප්‍රීතිය ද ප්‍රත්‍යය සහිතය යි කියමි. ඒ දුර්වල ප්‍රීතියේ ප්‍රත්‍යය කවරේ ද? ශ්‍රද්ධාව ය යි කිය යුතු ය.

මහණෙනි! ශ්‍රද්ධාව ද ප්‍රත්‍යය සහිතය යි කියමි. එහි ප්‍රත්‍යය කවරේ ද? මහණෙනි! ශ්‍රද්ධාවේ ප්‍රත්‍යය දුකය යි කිය යුතු ය. මහණෙනි! දුඃඛය ද ප්‍රත්‍යය සහිතය යි කියමි. එහි ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය ජාතියය යි කිය යුතු ය. මහණෙනි! ජාතිය ද ප්‍රත්‍යය සහිතය යි කියමි. එහි ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය භවයය යි කිය යුතු ය. මහණෙනි! භවය ද ප්‍රත්‍යය සහිතය යි කියමි. එහි ප්‍රත්‍ය කවරේ ද? එහි ප්‍රත්‍යය උපාදනයය යි කිය යුතු ය.

මහණෙනි! උපාදනයා ගේ ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය තණ්හාවය යි කිය යුතු ය. මහණෙනි! තණ්හාව ද ප්‍රත්‍යය සහිතය යි කියමි. එහි ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය වේදනාවය යි කිය යුතු ය. මහණෙනි! වේදනාව ද ප්‍රත්‍යය සහිතය යි කියමි. වේදනාවේ ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය ස්පර්ශය යි කිය යුතු ය. මහණෙනි! ස්පර්ශය ද ප්‍රත්‍යය සහිතය යි කියමි, එහි ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය ෂඩායතන ය යි කිය යුතු ය. මහණෙනි! ෂඩායතනය ද ප්‍රත්‍යය සහිතය යි කියමි. එහි ප්‍රත්‍යය කවරේ ද? නාමරූපය යි කිය යුතු ය. මහණෙනි! නාමරූපය ද ප්‍රත්‍යය සහිත ය යි කියමි. එහි ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය විඥ්ඥාණය ය යි කිය යුතු ය. මහණෙනි! විඥ්ඥාණය ද ප්‍රත්‍යය සහිතය යි කියමි. එහි ප්‍රත්‍යය කවරේ ද? එහි ප්‍රත්‍යය සංස්කාරය යි කිය යුතු ය. මහණෙනි! සංස්කාරයෝ ද ප්‍රත්‍යය සහිතයෝය යි කියමි.

Non-commercial distribution

මහණෙනි! සංස්කාරයන් ගේ ප්‍රත්‍යය කවරේ ද? සංස්කාරයන් ගේ ප්‍රත්‍යය අවිද්‍යාවය යි කිය යුතු ය.

මහණෙනි! මෙසේ සංස්කාරයෝ අවිද්‍යාව ප්‍රත්‍යය කොට ඇත්තාහ. විඤ්ඤාණය සංස්කාරයන් ප්‍රත්‍යය කොට ඇත්තේ ය. නාමරූපය විඤ්ඤාණ ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ෂඩායතනය නාමරූපයන් ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ඵස්සය ෂඩායතනය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. වේදනාව ඵස්සය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. තණ්හාව වේදනාව ප්‍රත්‍යය කොට ඇත්තේ ය. උපාදනය තණ්හාව ප්‍රත්‍යය කොට ඇත්තේ ය. භවය උපාදනයන් ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ජාතිය භවය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. දුඃඛය ජාතිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ශ්‍රද්ධාව දුඃඛය ප්‍රත්‍යය කොට ඇත්තේ ය, පාමොජ්ජය (දුර්වල ප්‍රීතිය) ශ්‍රද්ධාව ප්‍රත්‍යය කොට ඇත්තේ ය, බලවත් ප්‍රීතිය පාමොජ්ජය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ප්‍රශ්‍රබ්ධිය බලවත් ප්‍රීතිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. සුඛය ප්‍රශ්‍රබ්ධිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. සමාධිය සුඛය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. යථාභූතඤාණදස්සන නම් වූ තරුණ විදර්ශනාඥනය සමාධිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. නිබ්බිදඤාණ නම් වූ විදර්ශනාඥනය තරුණ විදර්ශනාඥනය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. විරාග නම් වූ අර්හත් මාර්ගය නිබ්බිදඤාණ නම් වූ විදර්ශනා ඥනය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. විමුත්ති නම් වූ අර්හත් ඵලය විරාගය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. ඛයේඤාණ නම් වූ අර්හත් ඵලය ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ ඥනය විමුක්තිය ප්‍රත්‍යය කොට ඇත්තේ ය.

මහණෙනි! පර්වත මුදුනෙහි මහවැසි වට කල්හි ඒ ජලය පහත් පහත් තැන්වලට ගලා යන්නේ ය. පර්වතවල ජලයෙන් සෑරීගිය තැන්, වියළීමෙන් පැලුණු තැන් කුඩා ඇලවල් පුරවන්නේ ය. පිරුණා වූ කඳුරැළි බිම්පැලුම් කුඩා ඇලවල් කුඩා වළවල් පුරවන්නාහ. පිරුණා වූ කුඩා වළවල් මහ වළවල් පුරවන්නාහ. පිරුණා වූ මහ වළවල් කුඩා ගඟවල් පුරවන්නාහ. පිරුණා වූ කුඩා ගඟවල් මහා ගංගා පුරවන්නාහ. පිරුණා වූ මහා ගංගාවෝ සමුද්‍රය පුරවන්නාහ. මහණෙනි! එපරිද්දෙන් සංස්කාරයෝ අවිද්‍යාව හේතුකොට ඇත්තෝ ය. විඤ්ඤාණය සංස්කාරයන් ප්‍රත්‍යය කොට ඇත්තේ ය. -පෙ- විමුක්ති සංඛ්‍යාත

Non-commercial distribution

අර්හත්ඵලය විරාග සංඛ්‍යාත මාර්ග ඥානය ප්‍රත්‍යය කොට ඇත්තේ ය. අර්හත්ඵල ප්‍රත්‍යවේක්ෂා ඥානය අර්හත්ඵලය ප්‍රත්‍යය කොට ඇත්තේ ය.

මේ සූත්‍රයෙන් දක්වෙන පටිච්චසමුප්පාදංග මෙසේ යː–

**අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, දුක්ඛ, සද්ධා, පාමොජ්ජ, පීති, පස්සද්ධි, සුඛ, සමාධි, යථාභූතඤාණදස්සන, නිබ්බිද, විරාග, විමුත්ති, ඛයෙඤාණ** මෙසේ තෙවිස්සෙකි.

පටිච්චසමුප්පාදයකැ යි කියනුයේ හේතුඵල පරම්පරාවක් නිසා ය. ඉහත කී පටිච්චසමුප්පාදය සේ මෙය චක්‍රයක් නො වේ. මේ පටිච්චසමුප්පාදයෙන් සංසාරය කෙළවර වේ.

## ධර්මකථික සූත්‍රය

එක්තරා භික්ෂුවක් බුදුන් වහන්සේ වෙත එළඹ, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ධර්මකථිකයාය ධර්ම කථිකයාය යි කියනු ලැබේ. කොපමණකින් ධර්ම කථිකයෙක් වේද යි විචාළේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

**ජරාමරණස්ස චෙ භික්ඛු! නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති ධම්මකථිකො භික්ඛූති අලං වචනාය. ජරාමරණස්ස චෙ භික්ඛු! නිබ්බිදාය විරාගාය නිරෝධාය පටිපන්නො හොති, ධම්මානු ධම්මපටිපන්නො භික්ඛූති අලං වචනාය, ජරා මරණස්ස චෙ භික්ඛු! නිබ්බිදා විරාගා නිරෝධා අනුපාද විමුත්තො හොති දිට්ඨධම්මං නිබ්බානප්පත්තෝ භික්ඛූති අලං වචනාය.**

**ජාතියා චෙ භික්ඛු! -පෙ-**

**භවස්ස චෙ භික්ඛු! -පෙ-**

**උපාදානස්ස චෙ භික්ඛු! -පෙ-**

**තණ්හාය චෙ භික්ඛු! -පෙ-**

**වෙදනා චෙ භික්ඛු! -පෙ-**

**ඵස්සස්ස චෙ භික්ඛු! -පෙ-**

**සළායතනස්ස චෙ භික්ඛු! -පෙ-**

Non-commercial distribution

**නාමරූපස්ස වෙ භික්ඛු! -පෙ-**

**විඤ්ඤාණස්ස වෙ භික්ඛු! -පෙ-**

**සංඛාරානං වෙ භික්ඛු! -පෙ-**

**අවිජ්ජාය වෙ භික්ඛු! නිබ්බිදය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති "ධම්මකථිකො භික්ඛු" ති අලං වචනාය. අවිජ්ජාය වෙ භික්ඛු නිබ්බිදය විරාගාය නිරෝධාය පටිපන්නො හොති. "ධම්මානුධම්මපටිපන්නො භික්ඛු" ති අලං වචනාය. අවිජ්ජා වෙ භික්ඛු නිබ්බිද විරාගා නිරෝධා අනුපාද විමුත්තො හොති "දිට්ඨධම්ම නිබ්බානප්පත්තො භික්ඛු! ති අලං වචනාය.**

එහි තේරුම මෙසේ ය :-

ඉදින් මහණ තෙමේ ජරාමරණයට කලකිරීම පිණිස නො ඇලීම පිණිස ජරාමරණයා ගේ නිරෝධය පිණිස දහම් දෙසා නම් ඒ මහණ ධර්මකථික භික්ෂුවකැයි කීමට සුදුසු ය. ඉදින් මහණ තෙමේ ජරාමරණයට කලකිරීම පිණිස නො ඇලීම පිණිස ජරාමරණයා ගේ නිරෝධය පිණිස පිළිපන්නේ වේ නම්, ඒ භික්ෂු තෙමේ නිර්වාණ ධර්මයට අනුකූල ප්‍රතිපත්තිය පුරන්නේ ය යි කිය යුතු ය. ඉදින් මහණ තෙමේ ජරාමරණයට කලකිරී ජරා මරණයෙහි නො ඇලීමෙන් ජරාමරණය නිරුද්ධ කිරීමෙන් උපාදනයන් කරණකොට කිසි ධර්මයක් නො ගෙන මිදුණේ වේ ද ඒ භික්ෂුව ඉහාත්මයෙහි නිවනට පැමිණි භික්ෂුවකැ යි කීමට සුදුසු ය.

ඉදින් මහණ තෙමේ ජාතියට -පෙ-

ඉදින් මහණ තෙමේ භවයට -පෙ-

ඉදින් මහණ තෙමේ උපාදනයට -පෙ-

ඉදින් මහණ තෙමේ තණ්හාවට -පෙ-

ඉදින් මහණ තෙමේ වේදනාවට -පෙ-

ඉදින් මහණ තෙමේ ඵස්සයට -පෙ-

ඉදින් මහණ තෙමේ ෂඩායතනයට -පෙ-

ඉදින් මහණ තෙමේ නාමරූපයට -පෙ-

ඉදින් මහණ තෙමේ විඤ්ඤාණයට -පෙ-

ඉදින් මහණ තෙමේ සංස්කාරයන්ට -පෙ-

Non-commercial distribution

ඉදින් මහණ තෙමේ අවිද්‍යාවට කලකිරීම පිණිස නො ඇලීම පිණිස අවිද්‍යාව ගේ නිරෝධය පිණිස දහම් දෙසා නම් ඒ භික්ෂුව ධර්මකථිකයෙකැ යි කීමට සුදුසු ය. ඉදින් මහණ තෙමේ අවිද්‍යාවට කලකිරීම පිණිස නො ඇලීම පිණිස අවිද්‍යාව ගේ නිරෝධය පිණිස පිළිපන්නේ වේ නම් ඒ භික්ෂු තෙමේ නිර්වාණ ධර්මයට අනුකූල ප්‍රතිපත්තිය පුරන්නේ ය යි කිය යුතු ය. ඉදින් මහණ තෙමේ අවිද්‍යාවට කලකිරී අවිද්‍යාවෙහි නො ඇලී අවිද්‍යාව නිරෝධ කිරීමෙන් උපාදනයන් කරණ කොට කිසි ධර්මයක් නො ගෙන මිදුණේ වේ ද, ඒ භික්ෂුව ඉහාත්මයෙහි ම නිවනට පැමිණි භික්ෂුවකැ යි කීමට සුදුසු ය. මේ ඉහත දක් වූ ධර්මපාඨයේ තේරුම ය.

යමක් ගැන කලකිරීමට ධර්මයක් වුවමනා වන්නේ ඒ දෙයට ඇලුම් කරන අය ඇතහොත් ය. ජරා මරණ දෙකට ඇලුම් කරන කෙනකු නැත. එබැවින් ජරා මරණය ගැන කලකිරීමට දහම් දෙසන්නෙක් කුමට ද? යන ප්‍රශ්නය මේ සූත්‍ර ධර්මය සම්බන්ධයෙන් ඇතිවිය හැකි ය. ජරා මරණ දෙකට කැමති කෙනකු නැති බව සත්‍යයකි. එහෙත් මේ සත්ත්වයා අවිද්‍යාදි ද්වාදශාංගයක් ඇති මේ සංසාරයට, තවත් ක්‍රමයකින් කියත හොත් මේ පඤ්චස්කන්ධයට තදින් ඇලුම් කරයි. ජරා මරණයත් මේ පඤ්චස්කන්ධයට අයත් නැති, මේ පඤ්චස්කන්ධයෙන් පිටත් දෙයක් නො වේ. එබැවින් පඤ්චස්කන්ධයට ඇලුම් කරන තැනැත්තේ එයට ඇලුම් කිරීම් වශයෙන් ජරාමරණයටත් ඇලුම් කරන්නේ වේ.

එබැවින් සංසාර චක්‍රයට අයත් ධර්ම වෙන් වශයෙන් ගෙන එකින් එක ගෙන කියන කල්හි ජරා මරණය ගැන කලකිරීමට දහම් දෙසීමත් වුවමනා ය. මේ සංසාර චක්‍රයේ ඇති වඩා නපුරු තැන ජරාමරණය ය. එයට හැම සත්ත්වයෝ ම බිය වෙති. එහෙත් සත්ත්වයෝ එය අමතක කර දමා පඤ්චස්කන්ධයට ඇලුම් කරගෙන නො යෙක් පව් කම් කරමින් ප්‍රීති වෙති. ඒ නිසා ම ඔවුහු නො කැමති වන ජරාමරණයෙන් නො මිදෙති. ඔවුන් සංසාර චක්‍රයෙන් මිදීමට සසර කලකිරවීමට ඇති හොඳ ම උපාය ජරාමරණය මතුකොට දක්වා එහි ඇති භයානකත්වය පෙන්වීම ය. එබැවින් ජරාමරණය ගැන කලකිරීම පිණිස

Non-commercial distribution

දහම් දෙසීම නිරර්ථක දෙයක් නොව, ඉතාම සාර්ථක වැඩක් බව කිය යුතු ය.

මේ සූත්‍රයෙහි පටිච්චසමුප්පාදාංග දෙළොස ගැනම වෙන වෙනම දක්වා ධර්මකථික ලක්‍ෂණ වදරා තිබෙන හෙයින් එහි අදහස තරමක් දුරට වැසී තිබේ. මේ සූත්‍රයෙන් දක්වෙන කෙටි අදහස නම් අවිද්‍යාදි ද්වාදශාංගයක් ඇති මේ සංසාර චක්‍රය කෙරෙහි කලකිරෙන පරිදි සංසාරයට ඇති ආශාව දුරුවන පරිදි සංසාරචක්‍රය සිඳ නිවනට පැමිණෙන පරිදි දහම් දෙසන භික්ෂුව ධර්මකථිකයා ය යනුයි. **ඛන්ධවග්ගසංයුක්තයේ චූල පණ්ණාසකයේ ධර්මකථික වර්ගයේ සූත්‍ර දෙකක ම -**

"රූපස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරෝධාය ධම්මං දෙසෙති, ධම්මකථිකො භික්ඛූති අලං වචනාය. වේදනාය චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති, ධම්ම-කථිකො භික්ඛූති අලං වචනාය. සඤ්ඤාය චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති, ධම්මකථිකො භික්ඛූති අලං වචනාය. සංඛාරානං චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති. ධම්ම කථිකො භික්ඛූති අලං වචනාය. විඤ්ඤාණස්ස චෙ භික්ඛු නිබ්බිදාය විරාගාය නිරොධාය ධම්මං දෙසෙති, ධම්මකථිකො භික්ඛූති අලං වචනාය" යි

වදරා තිබේ. ඒ දේශනයෙන් දක්වෙන්නේ පඤ්චස්කන්ධය ගැන කලකිරීම පිණිසත්, පඤ්චස්කන්ධයෙහි නො ඇලීමට හා පඤ්චස්කන්ධයෙන් බැහැර වී නිවනට පැමිණීම පිණිසත් දහම් දෙසන භික්ෂුව ධර්මකථිකයා බව ය. තථාගතයන් වහන්සේ විසින් මෙසේ දෙතැනක දෙයාකාරයකින් ධම්කථිකයා හඳුන්වා තිබීමෙන් ධර්ම කථිකයන් දෙවර්ගයක් උන් වහන්සේ වදරා ඇතය යි නො සිතිය යුතු ය. පටිච්චසමුප්පාදාංග දෙළොසත් පඤ්චස්කන්ධයම ය. පඤ්චෝපාදනස්කන්ධයත් පටිච්චසමුප්පාදයම ය. විභාග කර ඇති ක්‍රමයේ මිස ධර්ම වශයෙන් ඒ දෙක්හි වෙනසක් නැත.

ගොවිකමත් උපාසකකමත් යන දෙක ම කරන මිනිසකුට ගොවි මහතාය යි ද උපාසක මහතාය යි ද කිය හැකි ය. ඒ වචන දෙකින් කෝක කීවත් ගැනෙන්නා එකම මනුෂ්‍යයා ය. එමෙන්

Non-commercial distribution

අවිද්‍යාදි පටිච්චසමුප්පාදංගයෝය කීවත් රූප වේදනාදියය කීවත් ඒ කීම් දෙකින් ගැනෙන්නේ එකම දෙයකි. ඒ නිසා ඒ සූත්‍ර දෙක්හි දක්වෙන ධර්මකථිකයා ගේ වෙනසක් නැති බව දත යුතු ය.

ධර්මකථික ලක්‍ෂණය පිළිබඳව සැලකිය යුතු කරුණක් ඇත. ධනය සපයන සැටි - ලැබූ ධනය පරිස්සම් කරගන්නා සැටි - පවුල දියුණු කරගන්නා සැටි - දූ දරුවන් හද ගන්නා සැටි - බිරිය සතුටු කරවන සැටි- සැමියා සතුටු කරවන සැටි -නෑ මිතුරන් සතුටු කරවන සැටි - අසල් වැසියන් සතුටු කරවන සැටි - කන බොන සැටි - අඳින පළඳින සැටි - පමණ දැන වියදම් කරන සැටි - මාපියන්ට සැලකිය යුතු සැටි - වැඩිහිටියන්ට සැලකිය යුතු සැටි - දන්දීමේ අනුසස් - දෙව්ලොව සැටි - දෙව්ලොව යන සැටි යනාදි කරුණු ව්‍යක්ත අන්දමින් මිනිසුන් ගේ සිත්වලට කාවදින අන්දමින් මිනිසුන් පහදින අන්දමින් දේශනය කරන භික්ෂුව ධර්මකථිකයා ය යි නො වදරා, සසර කලකිරීමට - තණ්හාව දුරු කිරීමට - පඤ්චස්කන්ධයෙන් මිදීමට දහම් දෙසන භික්ෂුවම ධර්මකථිකයාය යි වදළේ කුමක් හෙයින් ද? යනු කල්පනා කළ යුතු කරුණු ය.

ලෝකයෙහි බුදුවරයන් වහන්සේලා චතුරසංඛ්‍ය කල්ප ලක්‍ෂය ආදි වශයෙන් ඉතා දීර්ඝ කාලයක් මුළුල්ලෙහි පෙරුම් පුරා ලොවුතුරා බුදු බවට පැමිණෙන්නේ මේ මිනිසුන්ට පොහොසත් වෙන සැටි උගැන්වීමට වත්, දූ දරුවන් හදගන්නා අන්දම උගැන්වීමටවත්, බිරිය හා සමගියෙන් වෙසෙන සැටි උගැන්වීමටවත්, අසල්වැසියන් සමග හොඳ හිතින් වෙසෙන සැටි උගැන්වීමටවත්, රට ජාතිය දියුණු කරගන්නා සැටි උගැන්වීමටවත්, දෙව් ලොවට යන සැටි උගැන්වීමටවත් නො වේ. මහාබෝධි සත්ත්ව සුමේධ තාපසයන් වහන්සේ එදා දීපංකර බුද්ධපාද මූලයේ දී සසරින් එතර වන්නට උත්සාහ නො කොට සසර රැඳුනේ :–

“ඉමිනා මෙ අධිකාරෙන කතෙන පුරිසුත්තමෙ,
සබ්බඤ්ඤුතං පාපුණාමි තාරෙමි ජනතං බහුං,
සංසාරසොතං ඡින්දිත්වා විධංසෙත්වා තයො භවෙ.
ධම්මනාවං සමාරුය්හ සන්තාරෙස්සං සදෙවකෙ.”

Non-commercial distribution

යතුවෙන් වදරා ඇති පරිදි සංසාර ශ්‍රෝතස (සංසාර චක්‍රය) සිඳ, කාම රූප අරූප සංඛ්‍යාත භවත්‍රය නැති කොට දහම් නැවට නැඟ දෙවියන් සහිත ලෝකයා සංසාර සාගරයෙන් එතරට පමුණුවන්නෙමිය යන අදහසිනි.

බුදුරජාණන් වහන්සේ ගේ අදහස සත්ත්වයන් සංසාරයෙන් එතර කරවීම ය, එබැවින් උන්වහන්සේ සත්ත්වයන් සංසාර සාගරයෙන් එතර කරවනු පිණිස ස්කන්ධාදි ධර්ම පිළිබඳ වූ, සසර කලකිරවන්නා වූ, තෘෂ්ණාව නැති කරන්නා වූ, නිවනට පමුණුවන්නා වූ, ධර්මයක් ම බොහෝ සෙයින් දේශනය කළ සේක. සමහර අවස්ථාවලදී ධනය සැපයීම්, ධනය රැකීම් ආදි මෙලොව ජීවත්වීමට ප්‍රයෝජනවත් ධර්ම ද උන්වහන්සේ දේශනය නො කළේ නො වේ. එසේ කළ අවස්ථා ඇත්තේ ඉතා ස්වල්පයෙකි. එබඳු ධර්මයක් දේශනය කිරීම බුද්ධත්වයේ පරමාර්ථය නො වේ. උන්වහන්සේ විසින් දේශනය කළ සසරට කලකිරවන ධර්මය සැමදෙනාට ම ගැලපෙන්නක් නො වේ. “**පසන්නස්සායං ධම්මෝ නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස**” යි වදළේ එහෙයිනි.

එද ද බුදුන් වහන්සේ ගේ ඒ නෛර්‍යාණික (සසරින් එතර කරවන) ධර්මයට බොහෝ දෙනා විරුද්ධ වූහ. ඒ ධර්මය දේශනය කරන නිසා ඇතමුන් උන්වහන්සේ සැලකුවේ ලෝකපාළුවකු ලෙසට ය. ඒ ධර්මය නිසා උන්වහන්සේට අප්‍රිය කළ තරම **මාගන්දිය** පිරිවැජියා ගේ කථා ප්‍රවෘත්තියෙන් තේරුම් ගත හැකි ය.

එක් අවස්ථාවක දී තථාගතයන් වහන්සේ කුරුරට **කම්මාසදම්ම** නම් නියම්ගමෙහි **භාරද්වාජ** නම් බ්‍රාහ්මණයකු ගේ ගිනිහල් ගෙයි තණ ඇතිරියක සැතපී සිට ඒ ඇතිරිය එසේ ම තිබෙන්නට හැර වැඩම කළ සේක. එද **මාගන්දිය** නමැති පිරිවැජියා ද පා ගමනින් ඇවිදිනුයේ භාරද්වාජ ගේ ගිනිහල් ගෙට පැමිණියේ ය. ඔහු තථාගතයන් වහන්සේ සැතපුණු තණ ඇතිරිය දක “භාරද්වාජය! ශ්‍රමණයකුට යෝග්‍ය වන මේ තණ ඇතිරිය කවරකු උදෙසා පනවන ලද්දේද” යි ඇසීය. පින්වත් මාගන්දියය! ශාක්‍ය කුලයෙන් පැවිදි වූ ශාක්‍ය පුත්‍ර වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේට මෙය පනවන ලද්දේය යයි භාරද්වාජ කීය.

Non-commercial distribution

එකල්හි මාගන්දිය **"දුද්දිට්ඨං වත භෝ භාරද්වාජ අද්දසාම යෙ මයං තස්ස භොතෝ ගෝතමස්ස භූනහුනෝ සෙය්‍යං අද්දසාම"** භාරද්වාජය! මිනිසා ගේ දියුණුව නසන ශ්‍රමණ භවත් ගෞතමයා නිදගත් තැන දකීමෙන් අපි නො දැකිය යුත්තක් දුටුවෙමු" යි කී ය. කියන ලද පාඨයෙහි භූනහු යන වචනයේ තේරුම 'දියුණුව නැති කරන තැනැත්තාය' යනු යි. ඒ වචනයෙන් බුදුන් වහන්සේට ගර්හා කළේ මිල මුදල් ආදි කාමවස්තූන් රැස්කිරීමට නොව ඒවා අතහැරීමට ඒවාට ආලය නො කිරීමට දහම් දෙසන නිසා ය.

චතුරසංඛ්‍ය කල්පලක්‍ෂයක් පෙරුම් පුරා උන්වහන්සේ බුදු වූයේ ලෝකයෙන් වෙන් වී නිවනට පැමිණීමට දහම් දෙසනු සඳහා ය. එබැවින් උන්වහන්සේ කාමයන්ට කලකිරීමට - කාමයන් හැර දැමීමට දහම් දෙසන සේක. ධන සැපයීම් පවුල් දියුණු කිරීම් ආදිය පිණිස දේශනය කරන ධර්මය තණ්හාව දුරු කරන ධර්මයක් නොව තණ්හාව වඩන ධර්මයකි. නිවනට පමුණුවන ධර්මයක් නොව සසර දිගු කරන ධර්මයකි. එබැවින් ඒ ධර්මය බුදුවීමේ පරමාර්ථයට විරුද්ධ ය. එබැවින් තථාගතයන් වහන්සේ එබඳු ධර්මයක් දේශනය කරන භික්ෂුව ධර්මකථිකයකු වශයෙන් ගණන් නො ගත් සේක.

තව ද පොහොසත්වීමේ මාර්ග - දූ දරුවන් දියුණු කිරීමේ මාර්ග යනාදිය සෙවීම පිණිස චතුරසඞ්ඛ්‍ය කල්පලක්‍ෂයක් පෙරුම් පිරුවාය කියත හොත් එය මහ විහිළුවකි. ධන සැපයීම් ආදිය පිළිබඳ නුවණ ලෝකයේ බොහෝ දෙනාට ඇත්තේ ය. ලෝකයාට ඒවා උගැන්වීමට බොහෝ දුක් ගෙන බුදුවන්නට වුවමනාවක් නැත. එසේ ම ලෝකයාට ඒවාට උපදෙස් දීමට බුදුසස්නක් පිහිටවන්නට උවමනාවක් ද නැත. තථාගතයන් වහන්සේ විසින් මේ බුදුසස්න පිහිටුවා තිබෙන්නේ ලෝකයාට නිවන් මඟ දැක්වීමට ය. එබැවින් මේ ශාසනයෙහි පොහොසත්වීම් ආදියට ම දහම් දෙසන තැනැත්තා සමාජ සංවර්ධකයකු වශයෙන් මිස ධර්මකථිකයකු වශයෙන් ගණන් ගැනීමට සුදුසු නැත.

තථාගතයන් වහන්සේ විසින් පවුල් දියුණුකර ගැනීම් ආදිය සඳහා දහම් දෙසන වියතුන් ධම්මකථිකයන් ගේ සංඛ්‍යාවට ඇතුළත් කොට නො වදළේ මේ කරුණු නිසා ය. ධන සැපයීම්

Non-commercial distribution

ආදියට උපදෙස් දක්වන බුද්ධ දේශනා ද නැත්තේ නො වේ. ධන සැපයීම් ආදි වැඩවලට උපදෙස් දීම තථාගතයන් වහන්සේ විසින් කර තිබෙන්නේ අප්‍රධාන වශයෙන් කලාතුරකින් පමණකි. තථාගතයන් වහන්සේ ගේ ඒ ධර්ම දේශනය කිරීම ලියන මහත්මයකු ගේ උදලු ගෑමක් සේ දත යුතු ය.

අවිද්‍යා තෘෂ්ණාදි ක්ලේශයන්ගෙන් බොර වී ගිය සිත් ඇති පඤ්චකාමය ම ලොව ඇති උසස් දෙය සැටියට සලකාගෙන පඤ්චකාමය නමැති මඩවගුරෙහි එරී ඉන්නා බොහෝ ජනයාට, මාගන්දිය පිරිවැජියාට මෙන් ප්‍රතීත්‍යසමුත්පාදදි ගැඹුරු කරුණු පිළිබඳ වූ ද, සංසාරයේ ආදීනවය දක්වන්නා වූ ද, තෘෂ්ණාව දුරු කිරීමේ අනුසස් දක්වන්නා වූ ද, කාමයන්ගෙන් වෙන්වීම උගන්වන්නා වූ ද, ධර්ම දේශනය අප්‍රිය ය. එබැවින් තථාගතයන් වහන්සේ වදාළ ධර්මකථික ලක්‍ෂණයෙහි පිහිටා දහම් දෙසීමත් අද එක්තරා ප්‍රශ්නයක් වී තිබේ.

ධර්මදේශකයා තථාගතයන් වහන්සේ වදාළ ධර්මකථික ලක්‍ෂණයෙහි පිහිටා ප්‍රතීත්‍යසමුත්පාදදි උසස් ධර්ම දේශනය කරත හොත්, අද ඇතැමෙක් 'ඔය අභිධර්මවලින් අපට වැඩක් නැත' කියා දහම්හල්වලින් ද පිට වී යති. එසේ දහම් දෙසන භික්ෂුවට වර්තමාන ලෝකයේ තැනක් නැත. ඒ භික්ෂුවට ආහාර ටිකවත් නිසිසේ නො ලබා මුළුගැන් වී ඉන්නට සිදු වේ. අද රටේ තත්ත්වයක් ලැබිය හැක්කේ - උසස් ධර්ම කථිකයෙක් ය යන කීර්තිය ලැබිය හැක්කේ - මහජනයාගෙන් ගරු බුහුමන් ලැබිය හැක්කේ දහම් දෙසනවාය කියා එක එක්කෙනා ගේ ගුණ වර්ණනා කරන, ඇතමුන්ට ගර්හා කරන, ධනය සැපයීමේ - ධනය ආරක්‍ෂා කිරීමේ උපදෙස් දේශනය කරන, අසන්නවුන්ට විනෝදය ඇතිවන දේ එකතු කොට දේශනය කරන දේශකයන්ට ය.

හොඳ බණක් කියා මිනිසුන් පැහැදවිය නො හෙන බැවින් අද බොහෝ ධර්මකථිකයෝ ද ඒ මග ගෙන සිටිති. එයින් බෞද්ධයෝ ධර්මය නො හඳුනන ධර්මරසය නො ලබන පිරිසක් වී සිටිති. සමාජ සංවර්ධනයට අවශ්‍ය වූ දුශ්චරිතයන්ගෙන් දුරුවන සැටි හා සුචරිත වර්ධනයට හේතුවන බෞද්ධ සිරිත්-විරිත්,

Non-commercial distribution

ගති-පැවතුම් පිළිබඳව දේශනා කරන අතර, බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මකථික ලක්‍ෂණයෙහි පිහිටා ප්‍රතීත්‍යසමුත්පාදාදි උසස් ධර්ම දේශනා කිරීමෙන් බෞද්ධ ලෝකයාට ධර්ම රසය ලබාදීමට දේශකයන් වහන්සේලා උත්සාහ කෙරෙත්වා! බෞද්ධයෝ ද එබඳු ගැඹුරුධර්ම ප්‍රිය කරන්නෝ වෙත්වා!

පොහොසත් වන සැටි - පවුල පාලනය කරගන්නා සැටි - පවුල දියුණු කරගන්නා සැටි - දැනගැනීමට ම නම් බොහෝ දුර සිට බොහෝ වියදම් දරා බොහෝ වෙහෙසී ධර්මකථිකයකු පමුණුවා ගන්නට වුවමනා නැත. ඒවා ගැන දන්නෝ රටේ බොහෝ ය. බුද්ධාගමෙන් බලාපොරොත්තු විය යුත්තේ සසර දුකින් මිදීමේ ක්‍රමයක් සොයා ගැනීම ය. බුදුරජාණන් වහන්සේ විසින් වදරා ඇත්තේ පොහොසත්වන සැටි - පවුල පාලනය කරගන්නා සැටි - උගන්වන අනුශාසකයකු සොයා ගැනීමට නොව, සසර දුකින් එතරවීමේ මඟ පෙන්වන අනුශාසකයකු සොයා ගැනීමට ය. ඒ බව මතු දැක්වෙන ශාස්තෘපයෝෂණ සූත්‍රයෙන් දත යුතු ය.

Non-commercial distribution

# ශාස්තෘපයෙ‍ෂ්ෂණ සූත්‍රය

ජරාමරණං භික්ඛවෙ! අජානතා අපස්සතා යථාභූතං ජරාමරණෙ යථාභූතං ඤාණාය සත්ථා පරියෙසිතබ්බො, ජරාමරණසමුදයං අජානතා අපස්සතා යථාභූතං ජරාමරණ සමුදයෙ යථාභූතං ඤාණාය සත්ථා පරියෙසිතබ්බො. ජරාමරණ නිරොධං අජානතා අපස්සතා යථාභූතං ජරාමරණනිරොධෙ යථාභූතං ඤාණාය සත්ථා පරියෙසිතබ්බො. ජරාමරණනිරොධ ගාමිනිං පටිපදං අජානතා අපස්සතා යථාභූතං ජරාමරණ නිරොධගාමිනියා පටිපදය යථාභූතං ඤාණාය සත්ථා පරිසෙිතබ්බො.

තේරුම :–

"මහණෙනි! ජරාමරණය නො දන්නා- නො දක්නා තැනැත්තා විසින් ජරාමරණය හරියට දත ගැනීම පිණිස අනුශාසකයෙක් සෙවිය යුතු ය. ජරාමරණයේ හේතුව නො දන්නා - නො දක්නා තැනැත්තා විසින් ජරාමරණයේ හේතුව හරියට දනගැනීම පිණිස අනුශාසකයෙක් සෙවිය යුතු ය. ජරාමරණ නිරෝධය නො දන්නා - නො දක්නා තැනැත්තා විසින් ජරාමරණ නිරෝධය හරියට දන ගැනීම පිණිස අනුශාසකයෙක් සෙවිය යුතු ය. ජරාමරණ නිරෝධයට යන ප්‍රතිපදව නො දන්නා - නො දක්නා තැනැත්තා විසින් ජරාමරණ නිරෝධයට යන ප්‍රතිපදව හරියට දනගැනීම පිණිස අනුශාසකයෙක් සෙවිය යුතු ය" යනු සූත්‍රයේ තේරුම ය.

මේ සූත්‍රයෙහි දක්වා ඇත්තේ පටිච්චසමුප්පාදයේ අවසානාංගය ය. ජාති භව උපාදනාදි පටිච්චසමුප්පාදංගයන් පිළිබඳව ද කියන ලද නයින් සලකා ගත යුතු ය. මෙය ප්‍රතීත්‍යසමුත්පාදයත් චතුරාර්‍ය්‍යසත්‍යයත් එක් කොට දේශිත සූත්‍රයකි. මේ සූත්‍රයෙන් උගන්වන්නේ නිවන්මග සෙවීම සඳහා බුදුකෙනකුම සොයා ගැනීම නොව, මාර්ගඵල ලැබිය හැකිවන පරිදි අනුශාසනා කිරීමට දත් බුදු වූ හෝ බුද්ධශ්‍රාවක වූ හෝ අනුශාසකයකු සොයා ගැනීමය. සොයා ගන්නා අනුශාසකයා ගිහියකු වුව ද වරදක් නැත.

ධනය සපයන සැටි, පරෙස්සම් කරන සැටි, පවුල් දියුණු කරන සැටි, ගමරට දියුණු කරන සැටි කියා දෙන අනුශාසකයන්ගෙන් නම් සංසාර දුඃඛයෙන් මිදීමට ලැබිය හැකි ප්‍රයෝජනයක් නැත. සංසාර දුඃඛයෙන් මිදීමට උපකාර ලැබිය හැක්කේ ඉහත දක් වූ

Non-commercial distribution

ධර්ම කථික සූත්‍රයෙහි වදරා ඇති ධර්මකථික ලක්‍ෂණයෙහි පිහිටා දහම් දෙසන අනුශාසකයකුගෙන් පමණෙකි. එබැවින් දුකින් මිදෙනු කැමති පින්වතුන් විසින් එබඳු අනුශාසකයන් සොයා ඔවුන් භජනය කළ යුතු ය.

ධනය සැපයීම, පවුල් පෝෂණය කිරීම, ගෙවල් තැනීම, දූ දරුවන් හදවඩා ගැනීම යනාදිය ලෝකයෙහි බුදුසස්න ඇති නැති සැම කාලයේ ම කළ හැකි ය. අති දීර්ඝ වූ අතීත සංසාරයෙහි එක් එක් අයකු විසින් සපයා ඇති ධනය මෙතෙකැ යි කියා කවර ආකාරයකින්වත් ප්‍රමාණ නො කළ හැකි ය. සාදන ලද ගෙවල්, පෝෂණය කළ පවුල්, ඇතිදැඩි කළ දූ දරුවන් මෙතෙකැ යි කියා කවර ආකාරයකින්වත් ප්‍රමාණ නො කළ හැකි ය. ඒ අයට අද ඒ ධනයෙන් ඉතිරිව ඇති දෙයක් නැත. අනාගතයෙහි සපයන ධනයට වන්නේත් සාදන ගෙවල්වලට - ඇති දැඩිකරන දූ දරුවන්ට වන්නේත් ඒ ටිකම ය.

සැපය යි සලකා කොතෙක් කල් කළත් ඉවරයක් නැති ඉතිරියක් නැති ධන සැපයීම් ආදි වැඩ පිළිවෙළෙහි කිසිම හරයක් නැත. එබැවින් ඒවා නුවණැතියන් විසින් උසස් කොට නො සලකනු ලැබේ. සසර දුකින් මිදී නිවනට පැමිණීමට දතමනා ධර්මය දැන ගැනීමට ඉඩ ඇත්තේ බුද්ධෝත්පාද කාලයේ පමණෙකි. එබැවින් මේ බුද්ධෝත්පාද කාලයේ දී ප්‍රතීත්‍යසමුත්පාදදි ධර්මයන් දැන උගෙන, නො නැසෙන සැපය වූ නිවන් සුවය ලබා ගැනීමට උත්සාහ කෙරෙත්වා!!

**මහාචාර්‍ය්‍ය**

## රේරුකානේ චන්දවිමල
## මහානායක ස්ථවිරපාදයන් වහන්සේ

විසින් සම්පාදිත

**පටිච්චසමුප්පාද විවරණය**

**නිමි.**

## චිරං තිට්ඨතු සද්ධම්මෝ.

Non-commercial distribution

## පටිච්චසමුප්පාදය

## හා

# අන්තරා භවය

සංසාරයෙහි සත්ත්වයන් නැවත නැවත මැරෙමින් උපදිමින් ගමන් කරන්නා වූ ක්‍රමය දක්වන බුද්ධ දේශනාව පටිච්චසමුප්පාද නම් වේ. එය බුදු දහමෙහි ඉතා උසස් තැනක් ගන්නා වූ ධර්මයකි. තථාගතයන් වහන්සේ ලොවුතුරා බුදුබව ලැබූ දින රාත්‍රියේ පශ්චිම යාමයෙහි මේ පටිච්චසමුප්පාද ධර්මය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කළ බවත්, පසුදින රාත්‍රියේ තුන්යාමයේදී ම එය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කර උදන් ඇනූ බවත් දහම් පොත්වල දක්වා ඇත්තේ ය. බුදුවීමෙන් පසුත් එය අනේකාකාරයෙන් දේශිත සූත්‍ර බොහෝ ගණනක් සංයුත්ත නිකායේ නිදානවග්ගයෙහි එන්නේ ය. දීඝ නිකාය මජ්ඣිම නිකාය දෙක්හි ද, විනය පිටකයේ මහාවග්ගපාලියෙහි ද, අභිධර්ම පිටකයේ විභංග ප්‍රකරණයේ ද අනේකාකාරයෙන් දේශිත බොහෝ පටිච්චසමුප්පාද ඇත්තේ ය. පටිච්චසමුප්පාදය බුදු දහමෙහි උසස් තැනක් ගන්නා ධර්මයකැ යි කියන ලදුයේ එහෙයිනි.

ඒ පටිච්චසමුප්පාද දේශනයන්හි **සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං** ය යි ද **භවපච්චයා ජාති** ය යි ද දෙතැනක සත්ත්වයා ගේ ප්‍රතිසන්ධිය හෙවත් නැවත භවයෙහි උත්පත්තිය දක්වා ඇත්තේ ය. ඒ කිසිම පටිච්චසමුප්පාද දේශනයක අන්තරා භවයක් සඳහන් නො වේ. ඒ දේශනයන්හි දක්වෙන්නේ මළහු ගේ සිරුර තුළින් යම්කිසිවක් ගොස් අන් තැනක පිළිසිඳ ගන්නා බවක් නොව, අතීත භවයේ කළ කර්මය හේතුකොට පසු භවයේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය ඇතිවන බව ය. මරණින් පසු මළහු ගේ ශරීරයෙන් අමුතු ශරීරයක් පිටවී එය අහසේ පාවෙමින් තිබී යම්කිසි දිනක මවුකුසයට පිවිසීමෙන් උත්පත්තිය සිදුවන බවක් කීම තථාගතයන් වහන්සේ ගේ පටිච්චසමුප්පාද ධර්මය අවුල් කිරීමකි. අවලංගු කිරීමකි.

අහසේ පාවෙනවාය කියන ඒ ශරීරය අපේ ඇස්වලින් දකිය නොහෙන, අත් පා ඇති සියලු ඉන්ද්‍රියයන් ඇති සියුම් මනෝමය

Non-commercial distribution

කයකැ යි කියති. එයට අන්තරාභවය ය යි කියති. මැරෙන්නහු ගේ ශරීරයේ තිබී ඉන් බැහැරව කලක් අහසේ පාවී මවු ගැබකට පිවිසෙනවාය කියන ඒ මනෝමය කයට අන්තරාභවය ය යි කීම සුදුසු නැත. එබඳු භවයක් ඇති නම් එයට කිය යුත්තේ සදාකාලික භවය කියා ය. මළ අයගේ ශරීරයෙන් බැහැර වූ අහසේ පාවෙන මනෝමය කයක් ඇති නම් දෙව්ලොව බොහෝ දුර බැවින් එහි යාමට දිගු කලක් ගතවිය හැකි ය. සමහර විට මංමුළා වුවහොත් එහි යා නොහැකි වී අතරමං විය හැකි ය. පාවී යාමට අහස්මගක් නැති බැවින් පව් කළ සත්ත්වයන් අපායට ගෙන යාමට කර්මයට බැරිවිය හැකි ය. අපායට පාවන්නේ පා කරවා ගෙන හෝ යන්නේ කෙසේ දැයි සිතා බැලිය යුතු ය.

රූපාරූප ධර්මයන්ගේ තතු හරියට තේරුම් ගැනීමට අසමත් වූ බොහෝ ශාස්තෘවරයෝ සත්ත්වයන් තුළ ජාතියෙන් ජාතියට යන ස්ථිර වූ යම්කිසිවක් ඇත ය යි සිතූහ. ඔවුහු එයට ආත්ම යන නම ව්‍යවහාර කළහ. නොයෙක් ආගම්වල උගන්වන්නේ ඒ ආත්මය මරණින් පසු අන් සිරුරකට පැමිණේය කියා ය. එය එක්තරා මිථ්‍යා දෘෂ්ටියකි. භවයෙන් භවයට යන අන්තරා භවයක් ඇත ය යි පිළිගන්නවුන්ට ඇත්තේ ද ඒ දෘෂ්ටියම ය. බුද්ධධර්මය අනාත්ම වාදයක් බැවින් බුදුසසුනෙහි පැවිදි වී සිටගෙන ආත්මයක් ඇත යයි කීමට ඇති බිය නිසා භවයෙන් භවයට යන්නේ ය යි සලකන දෙයට අන්තරාභවය කියා හෝ විඤ්ඤාණ කයය කියා හෝ කියති.

අන්තරාභවයක්, භවයෙන් භවයට යන මනෝමය කයක් ඇත ය යි කියන පින්වතුන්ට එය ඔප්පු කිරීම සඳහා ඉදිරිපත් කිරීමට ඒ කාරණය පැහැදිලි ලෙස දක්වා ඇති බුඩ දේශිත සූත්‍රයක් නැත. ඒ පින්වතුන් ඒ කාරණය තථාගතයන් වහන්සේ විසින් පිළිගන්නා ලද්දක් බව ඔප්පු කරන්නට තැත් කරන්නේ සූත්‍රවල දක්වෙන ඇතැම් වචන හා ඇතැම් සූළු කොටස් ඉදිරිපත් කර ඒවා තමන්ගේ අදහසේ හැටියට තමන්ගේ වාසියේ හැටියට තේරුම් කරමිනි.

ලෝකයෙහි දුකින් පෙළෙන අසරණ සත්ත්වයන් කෙරෙහි කරුණාව ඇත්තා වූ වීර්‍ය්‍යවත් වූ උත්තම පුරුෂයන් කල්ප ගණන්

Non-commercial distribution

බොහෝ දුක් විඳ ලොවුතුරා බුදුබව ලබා ගන්නේ මුළා වී සිටින සත්ත්වයනට දහම් දෙසීම පිණිස ය. තමන් වහන්සේලා ගේ ධර්මය අන්‍යයන්ට පහසුවෙන් තේරුම් නො ගත හැකිවන පරිදි ගැටළු තබා උන්වහන්සේලා දහම් නො දෙසන සේක. ඇතැම් සාස්තෘ-වරයන් ඇතැම් ආචාර්යවරයන් මෙන් තමාගේ ධර්මය, ශාස්ත්‍රය සම්පූර්ණයෙන් අන්‍යයන්ට ප්‍රකාශ කළහොත් තමන්ගේ තත්ත්වය පහත් වේය යන බියෙන් ගුරුමුෂ්ටිය වශයෙන් යමක් ඉතිරි කර ගෙන දහම් දෙසීමක් බුදුවරයන්ගේ නැත. ඒ බව,

**"දෙසිතො ආනන්ද මයා ධම්මො අනන්තරං අබාහිරං කත්වා, නත්ථානන්ද තථාගතස්ස ධම්මේසු ආචරියමුට්ඨි"**

යනුවෙන් මහාපරිනිර්වාණ සූත්‍රයෙහි වදරා ඇත්තේ ය. මහජනයා විසින් අවශ්‍යයෙන් දතයුතු එකම කරුණ වුව ද තථාගතයන් වහන්සේ විසින් නොයෙක් සූත්‍රවල නොයෙක් ආකාරයෙන් පැහැදිලි කර දේශනය කර ඇත්තේ ය. සමහර කරුණු සිය ගණන් සූත්‍රවල දේශනය කර ඇත්තේ ය. මැරෙන සත්ත්වයන් කොහි හෝ නැවත උපදිනවා ද? නැත ද? උපදිතහොත් එය සිදු වන්නේ කෙසේ ද? යන මේ කරුණ සැම දෙනාම දැනගැනීමට කැමති කරුණකි. එබැවින් තථාගතයන් වහන්සේ අන් නොයෙක් කරුණු නොයෙක් සූත්‍රවල නැවත නැවත දේශනය කර ඇතිවාක් මෙන් මැරෙන්නහු ගේ ශරීරයේ පැවැති විඥ්ඥාණය ඉන් පිට වී ගොස් අන් තැනක උපත ලබනවාය කියා හෝ සියුම් ශරීරයක් (උපාදන ස්කන්ධයක්) පිටවී ගොස් කලක් අහසේ තිබී මවු ගැබකට පිවිසෙනවාය කියා හෝ දෙව්ලොවට අපායට යනවාය කියා හෝ කාහටත් තේරුම් ගතහැකි පරිදි වාද විවාද ඇති නො වන පරිදි දේශනය කරනවා ඇත. එබඳු දේශනයක් පිටකත්‍රයෙහි කොතැනකවත් සඳහන් වී නැත. ඒ කාරණයෙන් තථාගතයන් වහන්සේ ගන්ධබ්බයාය, අන්තරාභවිකයාය කියා කිසිවක් මැරෙනවුන් ගේ ශරීරවලින් පිටවී භවාන්තරයට යන බව නො පිළිගන්නා බව, දේශනා නො කරන බව දත යුතු ය.

මේ මිනිස් සිරුර තුළ භවයෙන් භවයට යන මනෝමය ආත්මභාවයක් ඇති බව **පොට්ඨපාද** සූත්‍රයේ වදරා ඇති බවක්

Non-commercial distribution

අන්තරාභව වාදීහු කියති. මනෝමය ආත්මභාවයක් ගැන පොට්ඨපාද සූත්‍රයේ වදරා ඇති බව නම් සත්‍යයෙකි. එහි ආත්මභාව තුනක් වදරා ඇත්තේ ය. එහි එය දක්වා ඇත්තේ බුද්ධමතය දක්වීමක් වශයෙන් නොව ලෝකයේ ඇති ව්‍යවහාර දැක්වීමට ය. ඒ බව ඒ සූත්‍රයේ අග කොටසෙහි "ඉමා ඛො චිත්ත ලොකසමඤ්ඤා ලොකනිරුත්තියො ලොක වොහාරා ලොකපඤ්ඤත්තියො යාහි තථාගතො වොහරති අපරාමසන්ති" යයි දක්වා ඇත්තේ ය. කරන ලද පින් පව් අනුව මැරී සුගති දුර්ගතිවල උපන් අය පිළිබඳ බොහෝ කථා බෞද්ධ පොත්වල ඇත්තේ ය. ඒ එකම කථාවකවත් කලක් අන්තරා භවයේ රැඳී සිට කල් පසුවී යම්කිසි තැනක උපන් බව කියන කථාවක් ද නැත්තේ ය.

මැරෙන්නවුන් ගේ ශරීරවලින් ඒවායේ ඇති සියුම් ශරීරයක් හෝ විඤ්ඤාණය හෝ පිටවී භවාන්තරයට යන්නේය යන මේ කරුණ, නවීන පඬිවරයන් විසින් අලුතින් සොයා ගන්නා ලද්දක් නොව, පුනරුත්පත්තිය පළිගන්නා අය විසින් බුදුරදුන් ලෝ පහළ වන්නටත් පෙර සිට පටන් ම පිළිගෙන තිබූ කරුණකි. බුද්ධ කාලයේ විසූ **සාති** නම් භික්ෂුවක් ද ඒ ලබ්ධිය ඇති කර ගෙන විසූ බව **මහාතණ්හක්ඛය** සූත්‍රයෙහි සඳහන් වී ඇත්තේ ය. සාති භික්ෂුව ගැඹුරු ධර්ම නො දත් අල්පශ්‍රැත ජාතක-භාණකයෙකි. බුදුරජාණන්වහන්සේ ජාතක දේශනා අවසානයන්හි එද වෙස්සන්තර රජු නම් මමය, මහෞෂධ පණ්ඩිතයෝ නම් මමය, විධුර පණ්ඩිතයෝ නම් මමය යනාදීන් වදරනු අසා ඒ අය බුදුන් වන්නට නම් ඔවුන් තුළ පැවති විඤ්ඤාණය බුද්ධ ශරීරයට පැමිණ තිබිය යුතුය යන මතය ඇති කර ගත්තේ ය. රූප, වේදනා සඤ්ඤා, සංඛාර යන ස්කන්ධයෝ ඒ ඒ තැනම නිරුද්ධ වන්නාහ. විඤ්ඤාණස්කන්ධය නො නැසී ජාතියෙන් ජාතියට යන්නේය යි තථාගතයන් වහන්සේ විසින් ධර්ම දේශනා කර ඇත්තේය යි කියන්නට විය. භික්ෂූන් වහන්සේලා ඒ කරුණ තථාගතයන් වහන්සේට සැලකළ කල්හි උන්වහන්සේ සාති භික්ෂුව තමන් වහන්සේ ඉදිරියට ගෙන්වා කරුණු විමසා "ත්වං මොඝ පුරිස අත්තනා දුග්ගහිතෙන අම්හේ ච අබ්භාචික්ඛසි. අත්තානං ච ඛණසි. බහුං ච අපුඤ්ඤං පසවසි. තං හි තෙ මොඝ පුරිස භවිස්සති දීඝරත්තං අහිතාය දුක්ඛාය"

Non-commercial distribution

යනුවෙන් සාති භික්ෂුවට නිග්‍රහ කොට මහාතණ්හක්ඛය සූත්‍රය දේශනා කළ සේක.

## අන්තරා භව වාදය

තථාගත පරිනිර්වාණයෙන් පසු පුබ්බසේලිය, සම්මිතිය යන නිකායවල භික්ෂූහු "අන්තරාපරිනිබ්බායී" යන සූත්‍ර පදය වරදවා තේරුම් ගෙන අන්තරා භවයක් ඇති බව පැවසූහ. මැරෙන සත්ත්වයෝ ඉපදීමට තැනක් බලාපොරොත්තුවෙන් සතියක් හෝ එයට අධික කාලයක් හෝ අන්තරාභවයෙහි සිටිතිය යනු ඔවුන් ගේ පිළිගැනීම ය. මළවුන් උදෙසා සත් වන දිනයේ දන්දීම පුරුදු වී ඇත්තේ ඒ වාදය නිසා ය යි සිතිය හැකි ය. තුන්වන ධර්මසංගායනාවේ දී මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ විසින් කථාවස්තුප්‍රකරණය දේශනය කිරීමේ දී ඒ වාදය නිරාකරණය කරනු පිණිස අන්තරාභව කථාවක් දේශනය කර ඇත්තේ ය. ඇතැම් වර්තමාන පඬිවරුන් අන්තරා භවයක් ඇති බව කියතත් "අන්තරාභව" යන වචනයවත් සඳහන් වන සූත්‍රයක් සූත්‍රපිටකයෙහි දක්නට නැත.

සච්චං සත්තෝ පටිසන්ධි පච්චයාකාරමෙව ච
දුද්දසා චතුරෝ ධම්මා දෙසෙතුං ච සුදුක්කරා.

මේ බුදුගොස් හිමියන් අටුවා ලිවීමට ද පෙර ලෝකයෙහි විසූ මහා ධර්මධරයන් වහන්සේලා ගේ ප්‍රකාශනයෙකි. එහි තේරුම මෙසේ ය. "චතුස්සත්‍යය, සත්ත්වයා ගේ තත්ත්වය, සත්ත්වයන් ගේ ප්‍රතිසන්ධිය, පටිච්චසමුප්පාදය යන කරුණු සතර ගැඹුරු ය. තේරුම් ගැනීම දුෂ්කර ය. තේරුම් ගෙන ඇතියකුට වුව ද අන්‍යයන්ට අවබෝධ වන පරිදි කියාදීමට දුෂ්කරය" යනුයි.

## සූත්‍රපිටකය හා අභිධර්ම පිටකය

මේ ගැඹුරු කරුණු සූත්‍රවල විස්තර කර නැත. මේවා තේරුම් කර දිය හැක්කේ ද තේරුම් ගත හැක්කේ ද අභිධර්මය අනුව ය. බුදුන්වහන්සේ ගේ උසස් ධර්මය, නියම ධර්මය අභිධර්මය ය. ස්කන්ධ පඤ්චකය, ආයතන දොළස, ධාතු අටළොස, චතුරාර්‍ය්‍ය

Non-commercial distribution

සත්‍යය, පටිච්චසමුප්පාදය, බෝධ්‍යංග සත, මාර්ගාංග අට, ආහාර සතර, කර්මය හා කර්මඵලය යනාදි ධර්ම පිළිබඳ විස්තර ඇත්තේ අභිධර්ම පිටකයෙහි ය. ඒ ධර්ම සූත්‍රවල දක්වෙන්නේ නාම මාත්‍රයෙනි. බොහෝ ධර්ම අභිධර්ම පිටකයෙහි සූත්‍ර ක්‍රමය අභිධර්ම ක්‍රමය ප්‍රශ්නෝත්තර ක්‍රමය යන ක්‍රම තුනෙන් විස්තර කර ඇත්තේ ය. සත්ත්වයන් ගේ නැවත නැවත ඉපදීමේ ක්‍රම විස්තර වන්නේ ද අභිධර්ම ග්‍රන්ථවල ය. මළ කෙනකු ගේ ශරීරයෙන් කිසිවක් නො ගොස් අන් භවයක ප්‍රතිසන්ධිය ඇතිවීම, එසේ පිළිසිඳ ගත් තැනැත්තා මළ තැනැත්තාත් නො වන බව අනිකකු ද නො වන බව යනාදි ප්‍රතිසන්ධිය පිළිබඳ කරුණු ඉතා ගැඹුරු ය. ඒවා තේරුම් ගත හැක්කේ අභිධර්මය අනුව ය. අභිධර්මය නො දතුවන්ට කවර ආකාරයකින්වත් ඒවා තේරුම් ගත නො හැකිය. නිවැරදි ලෙස දහම් දෙසිය හැක්කේ ද අභිධර්මය දත් අයට පමණකි. අභිධර්මය නොදන සූත්‍රවලින් පමණක් දහම් දෙසන ප්‍රසිද්ධ මහා ධර්මකථිකයන් නැත්තේ නොවේ. ඔවුනට ගැඹුරු ධර්ම පිරිසිදු ලෙස නිවැරදි ලෙස නො දෙසිය හැකි ය. ඒවායේ වැරදි ඒ කථිකයන්ට හා අසන්නන්ට නො දැනේ. දැනෙන්නේ අසාගෙන සිටින ආභිධම්මිකයන්ට පමණකි. නියම ධර්ම කථිකයකු වීමට නම් අභිධර්මය උගත යුතුමය.

**"ආභිධම්මික භික්ඛුයෙව කිර ධම්මකථිකා නාම අවසේසා ධම්මකථං කථෙන්තාපි න ධම්මකථිකා."**

යනුවෙන් දම්සඟුණු අටුවාවෙහි "ආභිධර්මික භික්ෂූහු ම ධර්මකථිකයෝය, සෙස්සෝ බණ කියන්නාහු ද ධර්මකථිකයෝ නො වෙති"යි කියා ඇත්තේ ය. අභිධර්මය නො දන්නවුන් ධර්මකථිකයන් නො වන්නේ ඔවුහු ධර්මය නො වරදවා කීමට අසමත් බැවිනි. ආභිධර්මිකයා බණ නො කියුවත් ධර්මකථිකයකු වන්නේ, යම්කිසි කරුණක් විචාළ විටෙක දී එය නො වරදවා නිරවුල් කොට කියන බැවිනි. 'භවයෙන් භවයට යන ආත්මයක් ඇත, විඥානයක් ඇත, සියුම් කයක් ඇත, අන්තරාභවයක් ඇත' යන විපරීත අදහස් පහළ වන්නේ ද අභිධර්මය නො දන සත්ත්වෝත්පත්තිය ගැන කල්පනා කිරීම නිසා ය. මරණින් සත්ත්වයා කෙළවර වන්නේය යන උච්ඡේද දෘෂ්ටිය ඇති වන්නේ

Non-commercial distribution

ද ඒ නිසා ය. අභිධර්මය නො දන සූත්‍ර ටිකක් හා වෙනත් දේවල් පමණක් දන එයින් මත්වී සිටින ඇතැම්හු තමන්ගේ තත්ත්වය රැක ගැනීම සඳහා අභිධර්මය බුද්ධ දේශනාවක් නො වේය කියා එය අවලංගු කරන්නට තැත් කරති. එය බරපතල පාපයකි.

## ධර්මය අවලංගු කිරීමේ පාපය

**ධර්මය අවලංගු කිරීම බලවත් පාපයකි. එහි බරපතල බව බුදුන්වහන්සේ විසින් දේශනය කර ඇත්තේ මෙසේ ය.**

"යෙ තෙ භික්ඛවෙ භික්ඛූ භාසිතං ලපිතං තථාගතෙන ආභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්ති. තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනහිතාය පටිපන්නා බහුජනසුඛාය. බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දේවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ අපුඤ්ඤං පසවන්ති. තෙපිමං ධම්මං අන්තරධාපෙන්ති."

"මහණෙනි, යම් ඒ භික්ෂූහු තථාගතයන් වහන්සේ විසින් දේශනය කළ ධර්මයක් තථාගතයන් වහන්සේ විසින් නො දෙසන ලද්දේ ය යි කියත් ද, ඒ භික්ෂූහු බොහෝ ජනයාට අහිත පිණිස පිළිපන්නෝ ය. බොහෝ ජනයාට දුක පිණිස බොහෝ ජනයාට අනර්ථය පිණිස පිළිපන්නෝ ය. දෙවි මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නෝය. මහණෙනි, ඒ භික්ෂූහු බොහෝ අකුසල් රැස් කර ගන්නාහ. ඔවුහු මේ සද්ධර්මය (ශාසනය) නසන්නෝ ය." යනු එහි තේරුම ය.

**අභිධර්මය අවලංගු කිරීමේ** බරපතල බව දම්සඟුණු අටුවාවෙහි දක්වෙන්නේ මෙසේය:

"අභිධම්මං පටිබාහෙන්තො ඉමස්මිං ජිනචක්කෙ පහාරං දෙති, සබ්බඤ්ඤුතඤාණං පටිබාහති, සත්ථු වේසාරජ්ජඤාණං පටිනිවත්තේති, සොතුකාමං පරිසං විසංවාදෙති. අරියමග්ගෙ ආවරණං බන්ධති, අට්ඨාරසසු භේදකරවත්ථූසු එකස්මිං සන්දිස්සති, උක්ඛෙපනිය කම්ම නියස්සකම්ම තජ්ජනියකම්මාරහො

Non-commercial distribution

හොති. තං තං කම්මං කත්වා උයොාපෙතබ්බො. ගච්ඡ විසාසාදො හුත්වා ජීවිස්සති"

"අභිධර්මය අවලංගු කරන තැනැත්තේ බුද්ධ ධර්මයට පහර දෙන්නේය, සර්වඥතාඥනය අවලංගු කරන්නේය, ශාස්තෲන් වහන්සේ ගේ වෛශාරද්‍ය ඥනය නවත්වන්නේය, දහම් අසනු කැමති ජනයා රවටන්නේය, ආර්‍යමාර්ගය හරහා වැටක් බඳින්නේය, අටළොස් භේදකර වස්තුන්ගෙන් එකක පෙනී සිටින්නේය. භික්ෂූන්ට දඬුවම් කරන උක්ෂේපනීයකර්ම නියස්සකර්ම තර්ජනීයකර්ම යන විනයකර්මයන්ට සුදුස්සෙක් වන්නේ ය. දඬුවම් පිණිස ඒ විනය කර්මයක් කොට විසාසාදයෙක් (හිඟන්නෙක්) වී ජීවත් වෙවයි සඳුනෙන් නෙරපිය යුත්තෙක් වන්නේය" යනු එහි තේරුම ය.

බුද්ධධර්මයේ සාරවත් කොටස ප්‍රධාන කොටස අභිධර්ම පිටකය ය. උපමාවකින් කියතහොත් එය වෛද්‍ය ශාස්ත්‍රය වැනිය යි කිය යුතු ය. සූත්‍ර ධර්ම වනාහි වෛද්‍යශාස්ත්‍ර උගත් වෛද්‍යයකු විසින් රෝගීන් පරීක්‍ෂාකර ඒ ඒ රෝගියාට සුදුසු පරිදි ලියන ලද බෙහෙත් වට්ටෝරු සමූහයක් වැනිය. එසේ ලියන ලද බෙහෙත් වට්ටෝරු බලා නියම වෛද්‍යයකු නො විය හැකි ය. එසේ ම සූත්‍ර දේශනා පමණක් දත් කෙනකුට ගැඹුරු ධර්මයන් නිවැරදි ලෙස දේශනය කළහැකි ධර්මධරයකු ධර්මකථිකයකු නො විය හැකි ය.

බුදුරදුන් ජීවමාන කාලයේ භික්ෂූන් අතර පැතිර තුබූ ධර්මය අභිධර්ම පිටකය විය යුතු ය. එය දේශනය කරන ලද්දේ බුදුවීමෙන් සත්වන වසරෙහි ය. එය ඒ වස්කාලයේදී ම සැරියුත් මහතෙරුන් වහන්සේ භික්ෂූන් පන්සියයකට උගැන්වූහ. එයින් භික්ෂූන් අතර අභිධර්මය පැතිර තිබෙන්නට ඇත. ඒ කාලයේ තිබෙන්නට ඇත්තේ සූත්‍රවලින් ස්වල්පයක් විය යුතු ය. සූත්‍රවලින් වැඩි ගණනක් අභිධර්මය දේශනය කිරීමෙන් පසු දේශනය කළ ඒවාය. ඒවා නිකාය වශයෙන් වර්ග වශයෙන් පිළියෙළ වන්නට ඇත්තේ ප්‍රථම ධර්මසංගායනාවේදී ය. විනය පිටකය ඇතිවූයේ බුදුවී වසර විස්සකින් පසුව ය. දඹදිව නොයෙක් ශාස්තෘවරයන් විසින් නානාප්‍රකාර ධර්ම පතුරුවා තුබූ ඒ කාලයේ බෞද්ධ භික්ෂූන්ට උසස් තත්ත්වයක් තිබෙන්නට ඇත්තේ ද අභිධර්මය නිසා

Non-commercial distribution

විය යුතු ය. තීර්ථකයන් මථනය කිරීම සඳහා යමා මහ පෙළහර පෑම, තුන් පියවරකින් දෙව්ලොව වැඩම කිරීම, එහි අභිධර්මය දේශනා කිරීම, සංකස්ස නගරද්වාරයට දෙව්ලොවින් බැසීම යන මේ කරුණු බුද්ධශාසනයේ අතිප්‍රසිද්ධය. එබැවින් අභිධර්මය බුද්ධ දේශනයක් නො වේය කියා සැක නො කළ හැකි ය.

## සුවාසූ දහසක් ධර්මස්කන්ධය

තථාගතයන් වහන්සේ විසින් දේශිත ධර්මස්කන්ධය සුවාසූ දහසක් ඇතය යනු ද බුදුසසුනේ ප්‍රසිද්ධ කරුණකි.

ද්වාසීතිං බුද්ධතො ගණ්හිං - ද්වේසහස්සානි භික්ඛුතො,
චතුරාසීති සහස්සානි - යේ මේ ධම්මා පවත්තිතෝ.

මෙය සූත්‍රපිටකයේ ඛුද්දක නිකායට අයත් ථෙරගාථා පාලියේ එන ආනන්ද ස්ථවිරයන් වහන්සේ ගේ ප්‍රකාශනයකි. ඒ ගාථාවෙන් දක්වෙන්නේ ආනන්ද ස්ථවිරයන් වහන්සේ ධර්මස්කන්ධ සුවාසූ දහසක් දන සිටින බව ය, දරාගෙන සිටින බව ය.

අභිධර්ම පිටකය බුද්ධ ධර්මයට ඇතුළත් නො වේ නම් ධර්මස්කන්ධ සුවාසූ දහසක් නැත්තේ ය. අභිධර්ම පිටකය සූත්‍ර විනය දෙපිටකය තරම් විශාල ය. ලිඛිත මුද්‍රිත පොත්වලින් එය කුඩා පිටකයක් සේ පෙනෙන්නේ පේයාල ක්‍රමයෙන් කෙටිකොට ලියා ඇති බැවිනි. සූත්‍ර පිටකයට හා විනය පිටකයට ධර්මස්කන්ධ විසි එක් දහස බැගින් ය යි ද අභිධර්ම පිටකයට ධර්මස්කන්ධ දෙසාළිස් දහසකැයි ද කියා ඇත්තේ ය.

## ධර්ම සංගායනා.

අභිධර්ම පිටකයක් පළමුවන දෙවන සංගායනා වලදී සංගායනා කර නැත ය යි ද එය තුන්වන සංගායනාවේදී බුද්ධ ධර්මයට එකතු කරන ලද්දකැයි ද ඇතැම් අභිධර්ම විරෝධීහු පවසති. එහෙත් ඒ බව ඔප්පු කිරීමට සෑහෙන කිසිම සාක්ෂියක් නැත. පළමු වන දෙවන සංගායනාවලදී දෙපිටකයක් නොව ත්‍රිපිටකය ම සංගායනා කළ බව විනය අටුවාව, දීඝ නිකාය

Non-commercial distribution

අටුවාව, දම්සඟුණු අටුවාව යන පොත්වල පැහැදිලි ලෙස ම දක්වා ඇත්තේ ය. විනය පිටකයට අයත් චුල්ලවග්ග පාලියේ අගට ද ඒ සංගායනා දෙක ගැන විස්තරයක් එකතු කොට ඇත්තේ ය. එහි කියා ඇත්තේ ද ත්‍රිපිටකය ම සංගායනා කළ බව ය. එහි එය දක්වා ඇත්තේ සැමට ම පහසුවෙන් තේරුම් ගැනීම අපහසු ලෙස ය. පළමුවන දෙවන සංගායනා වලදී අභිධර්ම පිටකය නො තිබුණේ ය යි කියන්නේ ඒ සංගායනා විස්තර වරදවා තේරුම් ගැනීම නිසා විය හැකි ය.

එය තේරුම් ගතහැකි වීමට බුද්ධ දේශනය කොටස්වලට බෙද ඇති සැටි තේරුම් ගත යුතු ය. බුද්ධදේශනාව ධර්මය - විනයය කියා කොටස් දෙකකට බෙදනු ලැබේ. එයින් විනය යනුවෙන් අදහස් කරන්නේ විනය පිටකයට අයත් පාරාජිකාපාලි, පාචිත්තියපාලි, මහාවග්ගපාලි, චුල්ලවග්ගපාලි, පරිවාරපාලි යන ප්‍රකරණ පසය. ධර්ම යනුවෙන් අදහස් කරන්නේ ඉතිරි බුද්ධ දේශනා සියල්ල ය. එනම් සූත්‍රපිටකය අභිධර්මපිටකය යන දේශනා දෙකොටස ය. ධර්මය යන වචනයෙන් සූත්‍ර අභිධර්ම යන දෙකොටස ම කියවේ. ධම්මසංගණී ආදි ප්‍රකරණ සතට විශිෂ්ට ධර්මය වන බැවින් අභිධර්ම යන නාමය දී තිබේ. බුද්ධදේශනය තුනට බෙදීමේ දී විනය පිටකය සූත්‍ර පිටකය අභිධර්ම පිටකය යි පිටක නාමයෙන් තුන් කොටසකට බෙද තිබේ. නිකාය වශයෙන් ධර්මය දීඝ නිකාය මජ්ඣිම නිකාය සංයුත්ත නිකාය අංගුත්තර නිකාය ඛුද්දක නිකායය යි කොටස් පහකට බෙදනු ලැබේ. එයින් ඛුද්දක නිකායය යි කියනුයේ දීඝ මජ්ඣිම සංයුත්ත අංගුත්තර නිකාය සතර හැර ඉතිරි ධර්ම සියල්ලට ය. එයට කුඩාමහත් ග්‍රන්ථ රාශියක් ඇතුළත්ය. අභිධර්ම පිටකයට අයත් ප්‍රකරණ සත ද ඛුද්දක නිකායට ම අයත් ය.

ඨපෙත්වා චතුරොපෙතෙ - නිකායෙ දීඝ ආදිකෙ
තදඤ්ඤං බුද්ධවචනං - නිකායෝ ඛුද්දකො මතො.

(විනයට්ඨකථා)

චූලවග්ග පාලියේ සංගායනා කථාවේ "හන්ද මයං ආවුසො ධම්මංච විනයංච සංගායාම, පුරෙ අධම්මො දිප්පති" යනුවෙන්

Non-commercial distribution

මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සංගායනා කිරීමට යෝජනා කළ පාඨයේ ධම්මඤ්ච විනයංච යනුවෙන් දක්වෙන්නේ දෙපිටකයක් නොව තුන් පිටකයමය. ඒ සංගායනා විස්තරයේ බ්‍රහ්මජාල සූත්‍රය සංගායනා කළසැටි දක්වා "ඒතෙනෙව උපායෙන පඤ්චපි නිකායෙ පුච්ඡි, පුට්ඨො පුට්ඨො ආයස්මා ආනන්දෝ විස්සජ්ජේසි" යනුවෙන් නිකාය පසම සංගායනා කළ බව දක්වා තිබේ.

එයින් දක්වෙන්නේ අභිධර්ම පිටකයත් සංගායනා කළ බව ය. සංගායනා විස්තරය අවසානයේ සංගායනාව කළ සැටි කෙටියෙන් දක්වෙන ගාථා පෙළක් එහි ඇත්තේ ය. එයින් එක් ගාථාවක් මෙසේ ය.

"උපාලිං විනයං පුච්ඡි - සුත්තන්තානන්ද පණ්ඩිතං
පිටකං තීණි සංගීතිං - අකංසු ජින සාවකා"

මේ ගාථාවෙන් පිටක තුනක් සංගායනා කළ බව කියැවේ. අභිධර්ම පිටකය සංගායනා නො කළා නම් පිටක තුනක් වීමට ගත් අනික් පිටකය කුමක්ද? කියා අභිධර්ම පිටකය සංගායනා නො කළේය කියන පඬිවරුන් විසින් දක්විය යුතු ය. කරුණු මෙසේ හෙයින් අභිධර්ම පිටකය පළමුවන දෙවන සංගායනා වලදී සංගායනා නො කළේය කියන ඒ පඬිවරුන් ගේ කථාව සංගායනා විස්තරය තේරුම් ගැනීමට නො හැකිවීම නිසා කියන හිස් කතාවක් හෝ තමන්ගේ ගෞරවය රැක ගැනීමට කියන කතාවක් බව අපගේ පිළිගැනීම ය.

තථාගත පරිනිර්වාණයෙන් සිය වසකට පසු වේසාලීපුරයෙහි විසූ වජ්ජිපුත්තක භික්ෂූන් විසින් අවිනය කරුණු දසයක් විනය පිටකයට ඇතුළු කිරීමට තැත් කිරීම නිසා ඒවා බැහැර කොට විනය පිටකය පිරිසිදු කිරීම පිණිස වේසාලී පුරයේ වාළුකාරාමයේ ත්‍රිපිටකධර සිව්පිළිසිඹියාපත් සත් සියයක් රහතන් වහන්සේ විසින් දෙවන ධර්ම සංගායනාව කරන ලදී. චුල්ලවග්ගයේ එන සංගීති වර්තාවෙහි දක්වෙන්නේ එය විනය සංගීතියක් සේය. සූත්‍රාභිධර්ම පිටක ගැන එහි සඳහන් නොවේ. චුල්ලවග්ග පාළිය විනය පොතක් නිසා විනය සංගීතියක් වශයෙන්

Non-commercial distribution

එය දක්වූවා විය හැකි ය. සමන්තපාසාදිකාව ආදි අන් ග්‍රන්ථවල දක්වා ඇත්තේ එයත් ත්‍රිපිටක සංගායනාවක්ය කියා ය.

පළමුවන දෙවන සංගායනාවලට ඇතුළත් වූයේ අභිධර්ම පිටකයෙන් ධම්මසංගණී විභංග ධාතුකථා පුග්ගලපඤ්ඤත්ති යමක පට්ඨාන යන ප්‍රකරණ සය පමණකි. කථාවස්තුප්‍රකරණය අභිධර්ම පිටකයට එකතු වූයේ තෙවන සංගායනාවේදී ය. සූත්‍ර විනය පිටක දෙක්හි නොයෙක් තැන්වල අභිධර්මය ගැන සඳහන් වේ. එසේ සඳහන් වන්නේ සූත්‍ර පිටකය සම්පූර්ණ වන්නට හා විනය පිටකය ඇතිවන්නට කලින් ම අභිධර්මය බුදු සසුනෙහි බැබළුණු බැවිනි. සූත්‍ර විනය දෙපිටකයෙහි අභිධර්මය සඳහන් වන තැන් ඉදිරිපත් කළ කල්හි කර කියා ගතහැකි දෙයක් නැති අභිධර්මවිරෝධීහු සූත්‍ර විනය දෙපිටකයෙහි සඳහන් වන්නේ දනට ඇති මේ අභිධර්ම පිටකය නොවේ ය යි කියා ඇඟ බේරා ගැනීමට තැත් කරති. සූත්‍ර විනය පිටක දෙක්හි සඳහන් වන අභිධර්මය මෙය ය කියා දක්වීමට ඔවුන්ට වෙනත් අභිධර්මයක් නම් නැත. සර්වඥයන් වහන්සේ ගේ ශ්‍රේෂ්ඨ ධර්මය අවලංගු කරන්නට තැත් කර මහා පාපයක් සිදුකර ගන්නා වූ ඔවුනට අනුකම්පා කළ යුතු ය.

Non-commercial distribution

## තෙවන ධර්ම සංගායනාව

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය අටළොස් වන වර්ෂයේදී දඹදිව රජ කළ ධර්මාශෝක අධිරාජයා ගේ කාලයේදී මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ ප්‍රමුඛ ප්‍රතිසම්භිදප්‍රාප්ත ත්‍රිපිටකධර දහස් නමක් රහතන් වහන්සේලා විසින් තුන්වන ධර්ම සංගායනාව කරන ලද්දේ ය. අභිධර්ම විරෝධීන් පවසන්නේ අභිධර්මය තුන්වන ධර්ම සංගායනාවේ දී බුදු දහමට එකතු කරන ලද්දක් ය කියා ය. එය සංගායනා කිරීමේ තේරුම වත් නො දන කියන මෝඩ කථාවකි. කටපාඩමින් ම බුද්ධධර්මය පැවැත් වූ, ධර්මය ලියා නො තිබූ අතීත කාලයේ එයට අන්‍ය ශාස්තෘවරයන් ගේ, පණ්ඩිතයන් ගේ වදන් ඇතුළු වන්නට ඉඩ ඇත. සංගායනා කරනුයේ එසේ ඇතුළුව තිබුණ හොත් ඒවා බැහැර කිරීමටත් අවුල් වී අපිරිසිදු වී ඇති තැන් ඇත්නම් ඒවා සකස් කිරීමටත් අඩු තැන් ඇත්තේ නම් ඒ තැන් පිරවීමටත් ය. බුදුදහමට අන්‍යයන් ගේ දහම් අන්‍යයන් ගේ කියුම් ඇතුළු වී ඇති නම් ඒවා බැහැර කිරීම සඳහා කරන සංගායනාවේ දී බුදු දහම් නො වන මහා විශාල පිටකයක් අලුතින් ඇතුළු කළේ යැයි කීම කොතරම් මෝඩ කතාවක්ද? ධර්ම සංගායනාවේදී ම අභිධර්ම පිටකය තනා ඇතුළු කළාය කියනවා නම් එයත් මෝඩ කතාවෙකි. සුවාසූ දහසක් ධර්මස්කන්ධයෙන් දෙකෙන් කොටසක් එනම් ධර්මස්කන්ධ හතළිස් දෙදහසක් ම අභිධර්ම පිටකය ය. එතරම් විශාල ධර්මයක් සංගායනා කළ සුළු කාලයේ ගොතන්නට නුපුළුවන් බව යම්තමකටවත් නුවණැතියකුට වැටහිය යුතු ය. යම් කිසිවකු විසින් කලින් අභිධර්ම පිටකය ස්වශක්තියෙන් පිළියෙල කරගෙන සිට සංගායනාවේ දී බුදු දහමට ඇතුළු කළේ ය යි කියනවා නම් එයත් මෝඩ කතාවෙකි. යම් කිසිවකු විසින් අභිධර්ම පිටකය කලින් තනාගෙන සිට සංගායනාවේ දී ඉදිරිපත් කළහොත් පිළිසිඹියාපත් ඒ රහතන් වහන්සේ පෙර කිසිකලෙක නො ඇසූ විරූ ඒ ධර්මය බුද්ධධර්මයක් ලෙස පිළිගනිත්ද? ඉදිරිපත් කරගෙන ආ තැනැත්තා එළවා දමනවා මිස ඒ ධර්මය පිළිගනිත් ද? නොපිළිගන්නාහුම ය. මේ කතාව

Non-commercial distribution

ධර්ම සංගායනා කළ රහතන් වහන්සේලා මෝඩයන් කිරීමක් නො වේ ද? අභිධර්ම පිටකය නූගත්තෝ එහි තත්ත්වය නො දනිති. එබැවින් ඔවුන් සිතනු ඇත්තේ අභිධර්ම පිටකය නවකථාවක් ගොතන්නාක් මෙන් යම්කිසිවකුට ගෙතිය හැකියක්ය කියාය. අභිධර්මය ඉතා ගැඹුරු වූ ද සියුම් වූ ද ප්‍රමාණයෙන් සූත්‍ර විනයපිටකවලට වඩා විශාල වූ ද නුවණ මඳ අයට තේරුම් ගැනීම දුෂ්කර වූ ද ධර්මයකි. එබැවින් අභිධර්ම අටුවාවෙහි **"අභිධම්මො නාම න අසඥ්ඤෙය්‍යසං විසයො. සබ්බඤ්ඤු බුද්ධානං යෙව විසයො"** යනුවෙන් අභිධර්මය සර්වඥ බුදුවරයන්ට මිස සෙස්සන්ට අවිෂය ධර්මයක් බව කියා ඇත්තේය. ගැඹුරු වූ ද සියුම් වූ ද ඒ ධර්මය නවකතා ගොතන්නාක් මෙන් නො ගෙතිය හැකි ය.

## බරපතල පාපයක්

සංගායනාව කළ රහතන් වහන්සේලා "අබුද්ධ ධර්මයක් සංගායනාවේ දී බුදුදහම ය කියා එයට ඇතුළු කළහ" යි කීම උන්වහන්සේලාට කරන බරපතල චෝදනාවකි. රහතන් වහන්සේ නමකට තබා සෝවාන් වූ ගෘහස්ථ ආර්‍ය්‍ය පුද්ගලයකුට වුව ද දුෂ්ට සිතින් චෝදනාවක් එල්ල කිරීම බරපතල පවෙකි. එයට කියනුයේ .'ආර්‍ය්‍යොපවාද' අකුශල කර්මය කියා ය. දහසක් රහතුන් වහන්සේලාට චෝදනා කිරීමේ පාපයෙහි මහත් බව කියනුම කවරේ ද? **"අතිභාරියං කම්මං සග්ගාවරණං මග්ගාවරණඤ්ච"** යනුවෙන් එය ස්වර්ගාවරණයත් මාර්ගාවරණයත් කරන ඉතා බරපතල පාපකර්මයකැ යි විනය අටුවාවේ කියා ඇත. ස්වර්ගාවරණය යන්නෙහි තේරුම: එය කොතෙක් පින් කළත් මරණින් මතු ස්වර්ගයට යා නොහෙන ස්වර්ගද්වාරය වැසෙන පාපයක්ය යනුයි. ඔවුනට ඇරී පවත්නේ අපාය දෙරය. සංගායනා ගැන හා ධර්මය ගැන තමන් කිසිවක් නො දන තමන් විසින් පඬිවරයන් ලෙස සලකන අන්‍යයන් ගේ බස් අසා රහතන් වහන්සේලාට හා ධර්මයටත් නිගා කොට ඇතැම්හු තමන් විසින් ම තමන් නසා ගනිති. එසේ තමන් විසින් ම තමා නො නසා ගන්නා ලෙස මෙය කියවන පින්වතුන්ට කරුණාවෙන් දන්වමු.

Non-commercial distribution

# බුදුරැස් විහිදීම

අභිධර්මය මෙනෙහි කිරීමෙන් තථාගතයන් වහන්සේ ගේ ශ්‍රී දේහයෙන් සවණක් රැස් විහිදීම ආරම්භ වූ සැටි දම්සඟුණු අටුවාවෙහි මෙසේ දක්වා ඇත්තේ ය. අප මහාබෝධිසත්ත්වයන් වහන්සේ ඒ වෙසක් පුණුපොහෝ දිනයෙහි මහාබෝධි මූලයේ වජ්‍රාසනයෙහි වැඩ හිඳ රාත්‍රියේ පශ්චිම යාමයේ එක්දහස් පන්සීයක් කෙලෙසුන් නසා සර්වඥත්වයට පැමිණ ඒ ප්‍රීතියෙන් තමන්වහන්සේ විසින් ප්‍රතිවේධ කළ ධර්‍මයන් සිහි කරමින් ඒ පළඟ නො බිඳ එහි ම සතියක් වැඩහුන් සේක. ඉක්බිති ඒ පර්‍යඞ්කයෙන් නැඟී බෝධිය සමීපයේ අන් තැනක මා මේ අසුනෙහි හිඳ සර්වඥත්වයට පැමිණියෙමි යි ඒ දෙස ඇසිපිය නො හෙළා බලමින් සතියක් හුන්සේක. උන්වහන්සේ පර්‍යඞ්කය දෙස බලා සිටිනු දුටු ඇතැම් දෙවියෝ සිද්ධාර්ථ කුමාරයන් මේ පර්‍යඞ්කයේ ආලය නො හැර තවමත් බලා සිටින්නේ උන්වහන්සේ ගේ වැඩ තවම නො නිම වී තවත් ඉදිරියට කළයුතු දෑ ඇති නිසා ය යි සිතූහ. ඒ දෙවියන් ගේ සැකය දුරලනු පිණිස අහසට නැඟී යමාමහපෙළහර දක්වා ඔවුන් ගේ සැක දුරු කොට බෝධිපර්‍යඞ්කයටත් සිටි තැනටත් අතරට අහසින් බැස සක්මන් කළ සේක. බුදු වී විසි එක් දිනක් ගතවිය. එතෙක් උන්වහන්සේ ගේ දේහයෙන් රශ්මියක් නො නික්මිණි. උන්වහන්සේ බුදුවීමෙන් සතරවන සතියෙහි ශ්‍රී මහා බෝධියෙන් වයඹදිග රුවන්ගෙයි වැඩ හිඳ බෝධිමූලයේ දී ලද සර්වඥතාඥනය මෙහෙයා අභිධර්මය මෙනෙහි කරන්නට වූහ. අභිධර්මය මෙනෙහි කළා වූ තථාගතයන් වහන්සේ අනන්ත නය සමන්වාගත පට්ඨාන මහාප්‍රකරණය මෙනෙහි කරන්නට වන් කල්හි ඉතා තියුණු වූ ද, ශක්තිමත් වූ ද, වේගවත් වූ ද, සර්වඥතාඥනය රිසි සේ හසුරුවන්නට අවකාශ ලැබිණ. ධම්මසංගණී ආදි අභිධර්ම ප්‍රකරණ සර්වඥතාඥනය රිසි සේ හසුරුවන්නට ප්‍රමාණවත් නො වීය. සර්වඥතාඥනය රිසි සේ හසුරුවන්නට පට්ඨානප්‍රකරණයෙහි දී අවකාශ ලැබීමෙන් තථාගතයන් වහන්සේ ගේ සිත අතිශයින් ප්‍රීතිමත් විය. පෙර කිසිකලෙක නො ලැබූ තරමේ ප්‍රීතියක් උන්වහන්සේට ඇතිවිය. ඒ ප්‍රීතියේ බලයෙන් උන්වහන්සේ ගේ ශරීරයත් අතිශයින් දීප්තිමත් විය.

Non-commercial distribution

දීප්තිමත් වූ බුද්ධ දේහයෙන් ඒ ඒ තැන්වලින් නීල පීත ලෝහිත ඕදත මාඤ්ජේෂ්ඨ ප්‍රභාෂ්වර යන ෂට්වර්ණ රශ්මීන් විහිදෙන්නට විය. බුදුරැස් විහිදීම ආරම්භ වූයේ අභිධර්මය නිසා ය. බුද්ධ දේහයෙන් රැස් විහිදෙන බව සැමදෙන ම පිළිගන්නා කරුණකි. බුදුපිළිමවලට රැස්වළල්ලක් තනන්නේ ඒ නිසා ය. අභිධර්මපිටකය බුද්ධදේශනයක් නො වේය කියා එය අවලංගු කරන්නෝ බුද්ධචරිතයේ ඉතා වැදගත් කොටසක් වන සතරවන සතිය පිළිබඳ වූ බුද්ධචරිතය අවලංගු කරන්නෝ ය. එය ඉමහත් පාපයෙකි. පට්ඨානපකරණය මෙනෙහි කිරීමෙන් බුදුරැස් විහිදීම ආරම්භ වූ බව අභිධර්ම අටුවාවෙහි පමණක් නොව සූත්‍රපිටකයේ මජ්ඣිම නිකායේ **පාසරාසි** සූත්‍ර අටුවාවෙහි ද විස්තර කර ඇත්තේ ය.

මෙහි දක්වා ඇත්තේ අන්තරාභවය පිළිබඳව කාහටත් පහසුවෙන් තේරුම් ගත හැකි කරුණු ස්වල්පයකි. මේ පිළිබඳ ගැඹුරු කරුණු කිසිවක් මෙයට ඇතුළත් නො කළ බව ද සැලකිය යුතු ය.

Non-commercial distribution